පටුන

මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ
භාවිතයට පහසු යුනිකේත අකුරු ක්‍රමයට සකසා
http://pitaka.lk වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# සංයුත්ත නිකාය

# 1

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.		http://pitaka.lk

# අනුශාසක මණ්ඩලය

පැලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යොදය පිරිවෙනේ B.A., PH.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

පින්වත්තේ සද්ධර්මාකර පරිවෙණාධිපති ශ්‍රී විසුද්ධාචාර්ය ධර්මකීර්ති ශ්‍රී පෝහද්දරමුල්ලේ ඤාණානන්දාභිධාන අමරපුර සිරි සද්ධම්මවංස නිකායේ මහා නායක ස්ථවිරයන්වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ සංඝරාජ විහාරස්ථ ශික්ෂාලංකාර පරිවෙණාධිපති බලපිටියේ පණ්ඩිත විසුධාලොක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්‍ය්‍ය ආර්‍ය්‍යරත්න පේරුකාන මහතා

# සංයුත්ත නිකාය

# 1

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**
**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1956
දෙවැනි මුද්‍රණය - 2012

**ත්‍රිපිටකය**

**සංයුත්ත නිකාය** 1

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැගීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත්

යොමු කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඤාණවිමල මහානායක ස්ථවිර**

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය

කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මඟ පෙන්වූ මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඤාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මඟ පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2012 දෙසැම්බර්

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන


| | පිට |
|---|---|
| **සගාථ වර්ගය** | |
| **1. දෙවතා සංයුත්තය** | |
| (1) නළ වර්ගය | 1 |
| (2) නන්දන වර්ගය | 9 |
| (3) සත්ති වර්ගය | 21 |
| (4) සතුල්ලපකායික වර්ගය | 30 |
| (5) ආදිත්ත වර්ගය | 47 |
| (6) ජරා වර්ගය | 57 |
| (7) අන්ව වර්ගය | 63 |
| (8) ඣත්වා (හෙවත් ජෙත්වා) වර්ගය | 69 |
| **2. දෙවපුත්ත සංයුත්තය** | |
| (1) සූරිය වර්ගය | 78 |
| (2) අනාථපිණ්ඩික වර්ගය | 88 |
| (3) නානාතිත්ථිය වර්ගය | 97 |
| **3. කොසල (හෙවත් රාජ) සංයුත්තය** | |
| (1) බන්ධන වර්ගය (ප්‍රථම වර්ගය) | 115 |
| (2) අපුත්තක වර්ගය (දෙවැනි වර්ගය) | 129 |
| (3) නන්දන වර්ගය (තුන්වැනි වර්ගය) | 149 |
| **4. මාර සංයුත්තය** | |
| (1) ආයු වර්ගය | 164 |
| (2) රජ්ජ වර්ගය | 173 |
| (3) මාර වර්ගය | 185 |
| **5. භික්ඛුණී සංයුත්තය** | |
| (1) භික්ඛුණී වර්ගය | 201 |
| **6. බ්‍රහ්ම සංයුත්තය** | |
| (1) කොකාලික වර්ගය | 213 |
| (2) පරිනිබ්බාණ (හෙː පඤ්චක) වර්ගය | 236 |

**7. බ්‍රාහ්මණ සංයුත්තය**

(1) අරහන්ත වර්ගය 245

(2) උපාසක වර්ගය 268

**8. වඞ්ගීස (ථෙර) සංයුත්තය**

(1) වඞ්ගීස වර්ගය 289

**9. වන සංයුත්තය**

(1) වන වර්ගය 307

**10. යක්ඛ සංයුත්තය**

(1) ඉන්දක (හෙවත් යක්ඛ) වර්ගය 319

**11. සක්ක (හෙවත් වාසව) සංයුත්තය**

(1) සුවීර වර්ගය 334

(2) සත්තවත වර්ගය 353

(3) සුජෙත්වා වර්ගය (සක්ක පඤ්චකය) 367

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# සංඥාපනය

සිංහල ත්‍රිපිටක ධර්ම පොත් පෙළේ නවවෙනිවූ මේ පොතට සංයුත්ත නිකායෙ සගාථ වර්ගය අන්තර්ගත කළෙමි. මහ සඟි පහ අතුරෙන් මෙම නිකාය එක සඟියකි. පළමුවෙනි සඞ්ගායනාවේදී සංයුත්ත නිකාය භාරකරන ලද්දේ මහා කාශ්‍යප ශ්‍රාවක තෙරුන්වහන්සේට වේ. මේ නිකාය සගාථ වර්ගය, නිදාන වර්ගය, ඛන්ධක වර්ගය, සළායතන වර්ගය, මහා වර්ගයයි කොටස් පහකට බෙදා තිබේ. එහි ඇති සංයුත්ත පනස් හතරෙහි සූත්‍ර 7762 ක් වෙත්. සගාථ වර්ගයට සූත්‍ර 271 ක් ඇතුළත් වේ.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම්වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, ශාසන ආලයෙන් ආචාර්ය ආයඹීරත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයඹීරත්න රේරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, අහුන්ගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේද, තල්පාවිල රත්නසිරි ස්ථවිරයන් වහන්සේද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

6 - 8 - 54

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# මේ පොත ලිවීමට ආධාර වූ පොත්

(1) සාරත්‍ථප්පකාසිනි - වැලිතර වජිරසාර නායක ස්ථවිරයන් වහන්සේ ද, ගණාචාර්‍ය්‍ය ඥාණින්ද ස්ථවිරයන් වහන්සේ ද සහ සිරි සුධම්මාලඞ්කාර ස්ථවිරයන් වහන්සේ ද විසින් සංශෝධිතයි.

(2) සංයුත්ත නිකාය (1 වෙනි කාණ්ඩය) - බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය ස්ථවිරපාදයන් වහන්සේ විසින් කරන ලද සිංහල අනුවාදය

(3) සංයුත්ත නිකාය (1 වෙනි කාණ්ඩය) - බණ්ඩරමුල්ලේ අමරසීහ මහා ස්ථවිරයන් වහන්සේ විසින් සංශෝධිතයි.

(4) සංයුත්ත ප්‍රදීපිකා - කිරිඇල්ලේ ඥාණවිමල ස්ථවිරයන් වහන්සේ සහ මාරාජසිංහ උගන්ඕවිට මහතා විසින් සම්පාදිතයි.

(5) සංයුත්ත නිකාය ගාථා සන්නය - සූරියගොඩ සුමඞ්ගල ස්වාමීන් වහන්සේ විසින් සම්පාදිතයි.

(6) සිංහල සංයුත් සඟිය - අම්බලන්ගොඩ පඤ්ඤාවංස ස්ථවිරයන් වහන්සේ විසිනි.

(7) සංයුත්ත නිකාය - රත්ගම ආයර්‍ය්‍යවංශ ස්ථවිරයන් වහන්සේ සහ මාතර ඥානාරාම ස්ථවිරයන් වහන්සේ විසිනි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

# සංයුත්ත නිකාය

## සගාථ වර්ගය

## දෙවතා සංයුත්තය

(නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස)

## නළ වර්ගය

### 1. ඕඝ සූත්‍රය.

1. **මා** විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර වර්ණය ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එකත්පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේට "නිදුකානන් වහන්ස, කෙසේ නම් ඔබ (සංසාර සාගරය) මහාජලය පිහිනා ගොඩ වූවෝදැ"යි කීය.

"ඇවැත්නි, මම පිහිටාද නොසිට පැදීමද නොකොට පිහිනා එතර වූයෙමි."

"නිදුකාණනි, ඔබ, කෙසේ නම් පිහිටාද නොසිට පැදීම්ද නොකොට මහාජලය තරණය කළෝද?"

"ඇවැත්නි, යම්විටක මම පිහිටා සිටින්නෙම්ද, එකල ගිලා බසින්නෙමි. ඇවැත්නි, යම් කලෙක මම පදින්නෙම්ද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

එකල පාවී යන්නෙමි"යි ඇවැත්නි, මෙසේ වනාහි මම පිහිටා නොසිට නොපැද (සංසාර සාගරය) මහාජලය එතෙර කෙළෙමි."

"පිහිටා සිටීමත් නොකොට, පැදීමත් නොකොට ලොකයෙහි තණ්හාව එතර කළාවූ, එහෙයින්ම කෙලෙස් පිරිනිවීමෙන් පිරිනිවියාවූ බ්‍රාහ්මණයෙකු (පව් නැසූ කෙනෙකු) බොහෝ කලෙකින් පසු දැක්කෙමි"යි

මෙසේ ඒ දෙවිතෙම කීය. ශාස්තෲන් වහන්සේ එය අනුමත කළසේක. එකල වනාහි ඒ දෙවිතෙම ශාස්තෲන් වහන්සේ මගේ වචනය අනුමත කළසේකැයි සතුටුව, භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණුකොට එහිම අතුරුදහන් විය.

---

## 2. නිමොක්ඛ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර වර්ණ ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එකත්පසෙක සිටි ඒ දෙවිතෙම "නිදුකාණනි, ඔබ සත්වයන්ගේ නිමොක්ඛයත් (ආර්‍ය්‍ය මාර්ගය), පමෝක්ඛයත් (ආර්‍ය්‍ය ඵලය), විවේකයත් (නිර්වාණය) දන්නෝදැ?"යි (ඇසීය).

"ඇවැත්නි, මම වනාහි සත්ත්වයන්ගේ නිමෝක්ඛයත්, පමෝක්ඛයත්, විවේකයත් දනිමි."

"නිදුකාණනි, සත්ත්වයන්ගේ නිමෝක්ඛය, විමෝක්ඛය, විවේකය, කුමකැයි ඔබ දන්නෝද?"

“තණ්හාව මුල්කොට ඇති භවය සර්වප්‍රකාරයෙන් ක්ෂය බවට පැමිණීමෙන්ද, සංඥාස්කන්ධ විඥානස්කන්ධයන්ගේ ක්ෂය බවට පැමිණීමෙන්ද, වේදනාවන්ගේ නිරුද්ධවීමෙන්, සංසිඳී යෑමෙන්ද මෙසේ සත්ත්වයන්ගේ නිමෝක්ඛය, පමෝක්ඛය, විවේකය වේයැයි මෙසේ, ඇවැත්නි, මෙය මම දනිමි”යි (භාග්‍යවතුන් වහන්සේ වදාළසේක).

---

## 3. උපනෙය්‍ය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර වර්ණ ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

ඉක්බිති ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීයඃ

“ජීවිතය ගෙවෙයි. ආයුෂ ස්වල්පය. ජරාව කරා එළඹියාහට පිහිටවිය හැකි කෙනෙක් නැත්තාහ. මේ මරණ භය දක්නා තැනැත්තේ සැප ගෙන දෙන පින් කරන්නේය.”

(එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදහළසේකඃ-)

“ජීවිතය ගෙවෙයි. ආයුෂ ස්වල්පය. ජරාවට පැමිණියාහට පිහිට විය හැකි කෙනෙක් නැත්තාහ. මේ මරණ භය උතුම් නිවන් දක්නා තැනැත්තේ බලාපොරොත්තු වන්නෙක්ව ලෞකික සම්පත් හැරදමන්නේය.”

---

## 4. අච්චෙන්ති සූත්‍රය.

මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර වර්ණ ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ දේවතාවා භාග්‍යවතුන් වහන්සේට ගාථාවකින් (මෙසේ) කීයඃ

"කාලයෝ ඉක්ම යෙත්. රාත්‍රීහු (මරණය කරා) පමුණුවත්. වයස් රාශීහු පිළිවෙළින් හැර යත්. මේ මරණ භය දක්නා තැනැත්තේ සැප ගෙන දෙන පින් කරන්නේය."

"කාලයෝ ඉක්මෙත්. රාත්‍රීහු (මරණය කරා) ගෙනයත්. වයස් රාශීහු පිළිවෙළින් හැර යෙත්. මේ මරණ භය දක්නා තැනැත්තේ උතුම් නිවන බලාපොරොත්තුවෙන් ලෞකික සම්පත් හැර දමන්නේය." (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.)

---

## 5. කතිඡින්ද සූත්‍රය.

මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර වර්ණ ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේට ගාථාවකින් (මෙසේ) කීය.

"කීයක් සිඳ ලන්නේද? කීයක් දුර ලන්නේද? මත්තෙහි කීයක් වඩන්නේද? බන්ධන කීයක් ඉක්මවූ භික්ෂුතෙම ඔඝයයන් එතරකළ තැනැත්තේයයි කියනු ලැබේද?"

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක)

("කෙලෙස්) බැඳුම් පසක් සිඳ ලන්නේය. (කෙලෙස්) බැඳුම් පසක් දුරලන්නේය. මත්තෙහි (ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය) පසක් වඩන්නේය. (බන්ධන) පසක් ඉක්මවූ භික්ෂු තෙම ඔඝයයන් එතරකළ තැනැත්තේයයි කියනු ලැබේ"

---

## 6. ජාගර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර වර්ණ ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එක් පසෙක සිටි ඒ දේවතාවා භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය:

"කීදෙනෙකුන් පිබිද සිටින කල්හි කීදෙනෙක් නින්දට පැමිණියෝද? කීදෙනෙකුන් නිදාගත් කල්හි කීදෙනෙක් පිබිද ඉන්නාහුද? කීයෙකින් (කෙලෙස්) ධූලි අල්ලාගනීද? කීයෙකින් පිරිසිදු වේද?"

"පස්දෙනෙකුන් (පඤ්චෙන්ද්‍රියධර්මයන්) පිබිද සිටින කල පස්දෙනෙක් (පඤ්චනීවරණයෝ) නිදා ඉන්නාහුය. පස් දෙනෙකුන් (පඤ්චනීවරණයන්) නිදිගත් කල පස් දෙනෙක් (පඤ්චෙන්ද්‍රිය ධර්මයෝ) පිබිද සිටින්නාහ. පස්

දැයෙකින් (පඤ්චනීවරණයන් නිසා) කෙලෙස් ධූලි අල්ලා ගනී. කරුණුපසක් කරණ කොටගෙන (ශ්‍රද්ධාදී පඤ්චෙන්ද්‍රියයන් නිසා) පිරිසිදුවේ.” (භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.)

---

## 7. අප්පටිවිදිත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර වර්ණ ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එක් පසෙක සිටි ඒ දේවතාවා භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීයඃ

“යම් කෙනෙකුන් විසින් ධර්මයෝ හාත්පසින් අවබෝධ නොකරන ලද්දෝද, ඔවුහු මිථ්‍යාදෘෂ්ටීන් කරා ගෙනයනු ලැබෙත්. (සංසාරයෙහි) නිදිගත් ඔවුහු නොපුබුදිත්. ඔවුන්ට පිබිදෙන්නට (දැන්) කාලයයි.”

“යම් කෙනෙකුන් විසින් ධර්මයෝ හාත්පසින් අවබෝධ කරන ලද්දෝද, ඔවුහු මිථ්‍යාදෘෂ්ටීන් කරා ගෙනයනු නොලැබෙත්. මනාකොට දැන අවබොධ කළ උතුමෝ (බුදුවරයෝ) විෂමයෙහි සමව හැසිරෙත්.”

---

## 8. සුසම්මුට්ඨ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශොභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එක් පසෙක සිටි ඒ දේවතාවා භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීයඃ

"යම් කෙනෙකුන් විසින් (සත්‍යයෝ) ධර්මයෝ හාත්පසින් අවබොධ නොකරන ලද්දෝද, ඔවුහු මිථ්‍යාදෘෂ්ටීන් කරා ගෙනයනු ලැබෙත්. නිදාගත් ඔවුහු නොපුබුදිත්. ඔවුන්ට (දැන්) පිබිදෙන්නට කාලයයි."

(බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළසේකඃ)

"යම් කෙනෙකුන් විසින් (සත්‍යයෝ) ධර්මයෝ හාත්පසින් අවබොධ කරන ලද්දෝද, ඔවුහු මිථ්‍යාදෘෂ්ටීන් කරා ගෙනයනු නොලැබෙත්. මනාව දැන අවබොධ කළාවූ (බුදුවරයෝ) විෂමයෙහි සමව හැසිරෙත්."

---

## 9. මානකාම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එක් පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේට මේ ගාථාව කීයඃ

"මේ ලොකයෙහි මානය කැමැත්තහුට සිතෙහි දමනයක් නැත. (එහෙයින්ම) සමාධියට නොපැමිණි (එකඟ නොවූ) සිතැත්තහුට මුනි බවෙක් නැත. (එසේවූ) ප්‍රමාදව හුදෙකලාව වෙනෙහි වසන්නේ නමුදු, මරහු සිටින තැනින් (සසරින්) එගොඩ යාගත නොහෙන්නේය."

"මානය දුරලා මොනොවට එකඟවූ සිතැත්තේ ප්‍රඥායෙන් යුක්තවූයේ, විශෙෂයෙන් මිදුණේ, හුදෙකලාව වෙනෙහි පමා නොවී වසනුයේ, ඔහු (සසර) ඉක්මවා එගොඩ (නිවනට) පැමිණෙන්නේය"යි (භාග්‍යවතුන් වහන්සේ කීසේක.)

---

## 10. අරඤ්ඤ සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දේවතාවෙක් රෑ පෙරයම ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එක් පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය.

"වනයෙහි වසන, එක් වේලක් පමණක් වළඳන, ශාන්තවූ බ්‍රහ්මචාරීන්ගේ (ශරීර) වර්ණය කවරහෙයෙකින් ප්‍රසන්න වේද?"

"වනයෙහි වසන (ඒ භික්ෂූහු) ගිය දේ ගැන ශෝක නොකෙරෙත්. අනාගත (නොපැමිණි ආහාරාදී) ප්‍රත්‍යයක් ගැන කථා නොකෙරෙත්. (නොපතත්) දැන් ලත් දෙයකින් යැපෙත්. එහෙයින් ඔවුන්ගේ (ශරීර) වර්ණය ප්‍රසන්න වේ."

"නොපැමිණි දේ පැතීමෙන්ද, ගිය දේ ගැන ශෝක කිරීමෙන්ද, අනුවණයෝ රත්වූ ගලක් මත්තෙහි කපා දැමූ

ළා බට දණ්ඩක් සේ වියලෙත්" (භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.)

(පළමුවන නළවර්ගයයි.)

---

## 2. නන්දන වර්ගය.

### 1. නන්දන සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි" කියා භික්ෂූන්ට කථා කළසේක.

"පින්වතුන් වහන්සැ"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

"මහණෙනි, පෙර වූවක් කියමි. තව්තිසා දෙව්ලෝ වැසි එක්තරා දෙවියෙක් නන්දන වනයෙහි දෙවඟනන් සමූහයා විසින් පිරිවරන ලද්දේ, දිව්‍යමයවූ පඤ්චකාම සම්පත්තීන් යුක්තවූයේ, සමන්විත වූයේ, රූප ශබ්දාදියෙන් විනොදවනුයේ ඒ වේලායෙහි මේ ගාථාව කීයඃ

"පරිවාර සම්පත් ඇති තව්තිසා දෙවියන්ගේ වාසස්ථානයවූ නන්දනවනය යම් කෙනෙක් නොදකිත් නම්, ඔව්හු සැප නම් කිමෙක්දැයි නොදක්නාහ" යනුයි.

මෙසේ කී කල වෙනත් දෙවියෙක් ඒ දෙවියාටඃ

"අනුවණය, රහතුන්ගේ වචනය යම් සේ නම් එසේ තෝ නොදන්නෙහිය. සියලු සංස්කාරයෝ අනිත්‍යයහ. (ඔහු) ඉපැද්ම හා නැස්ම ස්වභාවයකොට ඇතියහ. ඒ සියල්ල

ඉපිද නැසෙත්. ඒ සංස්කාරයන්ගේ සංසිඳීම (නිවන) ම සැප වේයැ'යි ගාථාවෙකින් පෙරළා කීය."

---

## 2. නන්දති සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එකත් පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීයඃ

"දරුවන් ඇත්තේ දරුවන් කරණකොට සතුටු වේ. ගවයන් ඇත්තාද එසේම ගවයන් කරණකොට සතුටු වේ. උපධීන් (කාමසැප) කරණකොට සත්වයාට සතුට ඇතිවේ යමෙක් උපධි නැත්තේද (පස් කම් සැප නැත්තෙක් වේද) ඔහු නොම සතුටු වේ."

"දරුවන් ඇත්තේ දරුවන් කරණකොට ශෝක කෙරේ. ගවයන් ඇත්තාත් එසේම ගවයන් කරණකොට ශෝක කෙරේ. උපධීන් (කාම සැප) කරණකොට සත්ත්වයාට ශෝක ඇති වේ. යමෙක් උපධි (කාම සැප) නැත්තේද ඔහු ශෝක නොකෙරේ"ය (යි කී සේක.)

---

## 3. නත්ථිපුත්තසම සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එක් පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය:

"පුත්‍රප්‍රේමය බඳු අන් ප්‍රේමයෙක් නැත. ගවසම්පත වැනි වෙන සම්පතෙක් නැත. හිරුට සමවූ වෙන එළියෙක් නැත. මුහුද බඳුවූ අන් විලක් නැත."

(එවිට භාග්‍යවතුන් වහන්මේ මෙසේ වදාළසේක:)

"තමා කෙරෙහි ප්‍රේමය බඳු ප්‍රේමයෙක් වෙන නැත. ධාන්‍ය හා සමාන ධනයෙක් නැත. ප්‍රඥාව හා සමාන ආලෝකයෙක් නැත. වැස්ස හා සමාන විලක් නැත."

---

## 4. ඛත්තිය සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එක් පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය:

"දෙපා ඇතියන්ගෙන් ක්ෂත්‍රියයා ශ්‍රෙෂ්ඨය. සිව්පාවුන්ගෙන් ගවයා ශ්‍රෙෂ්ඨය. අඹුවන්ගෙන් බාල

වයසෙහි සිටි බිරින්දෑ ශ්‍රෙෂ්ඨය. පුතුන්ගෙන් පළමුව උපන් පුතා ශ්‍රෙෂ්ඨය."

(එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක:)

"සම්‍යක් සම්බුදු තෙමේ දෙපා ඇතියන්ගෙන් ශ්‍රෙෂ්ඨය. සිවුපාවුන්ගෙන් ආජානීයයා (කී දේ තේරුම් ගන්නා සතා) ශ්‍රෙෂ්ඨය. අඹුවන්ගෙන් කියන දේ අසන කීකරු භාර්‍යාව ශ්‍රෙෂ්ඨය. පුතුන්ගෙන් මවුපියන්ට කීකරු පුතා ශ්‍රෙෂ්ඨය."

---

## 5. සකමාන (සන්නිකාය) සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එක් පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය:

"ඉර මුදුන් වේලෙහි පක්ෂීන් එකතුව විවේක ගෙන හුන් කලැ මහ වනය (ගස් එකට ගැටීමෙන් ඇතිවූ නාදය) මහ හඬින් හඬන්නාක් මෙනි. එය මට බියෙක්ව වැටහේ."

(භාග්‍යවතුන් වහන්සේ:) "ඉර මුදුන් වේලෙහි පක්ෂීන් එක්ව රැස්ව හුන් කල්හි මහ වනය හඬන්නා සේ ශබ්ද කෙරේ. එය මට සැපයෙක්ව වැටහේ"

---

## 6. නිද්දාතන්දි සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එක් පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීයඃ

"නින්ද, මැලිබව, බඩගිනි හෝ සීත ආදිය නිසා ඇඟමැලිකැඩුම, කුසල්හි නොඇල්ම, බත් මත යන මේ උපක්ලෙශ (සිත කිලිටිකරණ කාරණයන්) නිසා මෙහි සත්ත්වයන්ට ආර්‍ය්‍ය මාර්ගය නොපැනේ."

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේකඃ)

"නින්දා, මැලිබව, ඇඟමැලිකැඩුම, කුසල්හි නොඇල්ම, බත් මත යන මේ දේ වීර්‍ය්‍යයෙන් පලවා හැරීමෙන් ආර්‍ය්‍යමාර්ගය පිරිසිදුවේ."

---

## 7. දුක්කර (කුම්ම) සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට

පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එක් පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය:

"බාලයා විසින් මහණදම කළ නොහැක්ක, ඉවසිය නොහැක්ක. යම් ඒ මහණදමෙක්හි අව්‍යක්තයා පසුබසීද, එහිලා ඔහුට සම්බාධකයෝ බොහෝ වෙත්.

"ඉදින්, (නොමගින් උපන්) සිත නොවළක්වන්නේ නම්, ඔහු කී දිනක් මහණ කම් කරන්නේද? ඔහු පාප විතර්කයන්ට වසඟවූයේ අරමුණක් පාසා පසුබස්නේය."

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක:)

"අවයවයන් සිය කබල තුළ බහා ගන්නා ඉදිබුවාසේ මහණතෙම සිතේ උපන් විතර්කයන් භාවනාලම්බන නමැති කබලෙහි එක්කොට බහාලන්නේ, තෘෂ්ණාදෘෂ්ටි ආදීන්ගේ ආශ්‍රයෙන් තොරවූයේ, අනුන් නොවෙහෙසන්නේ: කෙලෙස් පිරිනිවනින් පිරිනිවියේ කිසිවෙකුටත් නින්දා නොකරන්නේය"

---

## 8. හිරි සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එක් පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීයඃ

"ආජානීය අශ්වයා කසය තමා මත හෙනු නොදී වළක්වන්නා සේ යමෙක් තමහට නින්දා ඇතිවනු නොදී වළක්වාද, (එසේවූ) ලජ්ජා හේතුයෙන් පව් දුර ලා සිටින කිසි පුරුෂයෙක් ලොවැ ඇත්තේද?"

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේකඃ)

"යම් කෙනෙක් ලජ්ජායෙන් පව් නොකොට ඉන් වැළැක හැම කල්හි සිහි ඇතිව හැසිරෙත්ද, දුක් කෙළවරට පැමිණ, විෂමවූ ලොව සමව හැසිරෙත්ද, එසේවූ පුද්ගලයෝ ස්වල්ප දෙනෙක් ඇත්තාහුය."

## 9. කුටිකා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එක් පසෙක සිටි ඒ දේවතාවා භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය.

"ඔබට කුටියක් නැද්ද? ඔබට කුඩුවක් නැද්ද? ඔබට වැළක් නැද්ද? ඔබ බැම්මෙන් මිදුණේද?"

"මට කුටියක් කිසිසේත් නැත. කිසි ලෙසිනුත් කුඩුවක් නැත. වැළකුත් කිසිසේත් නැත. ඒකාන්තයෙන් බැම්මෙන් මිදුනෙමි.

"මම ඔබට කුමක් නම් කුටියකැයි කීයෙම්ද? කුමක් නම් ඔබට කුඩුවකැයි කීයෙම්ද? ඔබට කුමක් නම් වැළක් යයි කීයෙම්ද? කුමක් නම් ඔබට බැම්ම යයි කීයෙම්ද?"

'මව කුටිය යයි කීයෙහිය. භාර්‍යාව කුඩුව යයි කීයෙහිය. දරුවන් වැළයයි කීයෙහිය. තණ්හාව බැඳුම යයි මට කීයෙහිය."

(දෙවියා.) "ඔබට කුටියක් නැතිසේ යහපත. කුඩුවකුත් නැතිසේ යහපත. වැලුත් නැතිසේ යහපත. බන්ධනයෙන් මිදුණුසේ යහපත"

---

## 10. සමිද්ධි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහිවූ තපෝදාරාමයෙහි වැඩ වෙසෙන සේක. එකල්හි වනාහි ආයුෂ්මත් සමිද්ධි භික්ෂුතෙම රෑ අලුයම නැගී සිට තපෝදා දියවිල යම්තැනෙකද එතැනට ඇඟ සේදීම පිණිස පැමිණියේය. තපෝදායෙහි ඇඟ සෝදා ගොඩ අවුත්, එක් සිවුරක් පමණක් ඇතිව ඇඟ තෙත සිඳුවමින් සිටියේය.

2. එකල්හි එක්තරා දෙවියෙක් රෑ පෙරයම ගෙවුණු කල්හි බබළන පැහැ ඇත්තේ, සියලු තපෝදා පෙදෙස බබුළුවා, ආයුෂ්මත් සමිද්ධි භික්ෂුතෙම යම් තැනෙකද එතැන්හි එළඹියේය. එළඹ අහසෙහි සිට ආයුෂ්මත් සමිද්ධි භික්ෂුහට ගාථායෙන් (මෙසේ) කීවේය

"භික්ෂූන් වහන්ස, ඔබ (කම් සැප) නොවලඳා සිඟා කති. ඔබ (කම් සුව) වලඳා සිඟා නොකති. භික්ෂූන් වහන්ස, (පස් කම් සුව) වලඳා (පසුව) සිඟාකන්න. (තරුණ) කාලය ඔබ ඉක්මවා නොයේවා."

(එවිට ආයුෂ්මත් සමිද්ධි තෙම මෙසේ කීය.)

"(මැරෙන) කාලය නම් මම් නොදනිමි. වැසුණු කාලය නොපෙනේ. එබැවින් (කම් සුව) නොවලඳා සිඟා වලඳමි. කාලය මා ඉක්මවා නොයේවා."

3. එවිට ඒ දෙවිතෙම පොළොවෙහි සිට ආයුෂ්මත් සමිද්ධි භික්ෂුහට මෙසේ කීය.

"භික්ෂූන් වහන්ස, ඔබ ළදරු වියෙහිම පැවිදිවූ කෙනෙක, තරුණය, ඉතා කළු කෙස් ඇත්තෝය. යහපත් තරුණ භාවයෙන් ප්‍රථම වයසින් සමන්විතයෝය. කාම ක්‍රීඩා නොකළ කෙනෙක. භික්ෂූන් වහන්ස, මනුෂ්‍යයන්ට අයත් කම් සැප වැළඳුව මැනව. මෙහි මේ ආත්මයෙහිම වැළඳිය හැකි කම් සැප හැරදමා කල්ගතව ලැබෙන කාම සම්පත් අනුව නොදුවනු මැනව."

4. "ඇවැත්නි, මම වනාහි මේ ආත්මයෙහි වින්ද හැකි සැපයක් හැරදමා කල්ගතව ලැබෙන සැපයක් පස්සේ නොදුවමි. ඇවැත්නි, මම වනාහි කල්ගතව ලැබෙන සැප හැරදමා මේ ආත්මයෙහිම ලැබිය හැකි සැප පස්සේ දුවමි. ඇවැත්නි, කාමයෝ වූකලී කාලිකයෝය, (කලින්කල ලැබිය යුත්තෝය) බොහෝ දුක් පමුණුවන්නෝය, බොහෝ දැඩි වෙහෙස ගෙනදෙන්නෝය. එහි දෝෂයෝ නම් බොහෝයයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මේ ධර්මය වනාහි මේ ආත්මයෙහිම තමා ඇස් හමුයෙහි ඵල ඇත්තේය. අකාලිකය, (කල් නොයවා පල දෙන්නේය.) එහිපස්සිකය (එව බලවයි අන්‍යයන් තමා වෙතට කැඳවන්නට සුදුසුය.) ඔපනේයකය (වහා තම සිතට පැමිණවීමට සුදුසුය.) නුවණැත්තන් විසින් තම තමා කෙරෙහි දතයුතුයයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේයයි" (කීය.)

5. "භික්ෂූන් වහන්ස, කෙසේ නම් කාමයෝ කාලිකයෝය, බොහෝ දුක් සලසන්නෝය, බොහෝ දැඩි වෙහෙස ගෙන දෙන්නෝය, එහි දොස් බොහෝයයි, භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදද? කෙසේ නම් (ඔබ කියන) මේ ධර්මය අකාලිකයයි, එහිපස්සිකයයි, ඔපනේයකයයි, නුවණැත්තන් විසින් තම තමා කෙරෙහි දතයුතුයයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදද?"

6. "ඇවැත්නි, මම වනාහි ළඟදී පැවිදිවූයෙක්මි. මේ ධර්ම විනයට අළුත ආයෙක්මි. (එබැවින්) විස්තරකොට කියන්නට නොහැක්කෙමි. අර්හත් සම්‍යක්සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි තපෝදාරාමයෙහි වෙසෙති. ඒ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ මේ කරුණ විචාරව. යම්සේ ඔබට භාග්‍යවතුන් වහන්සේ (මෙය තෝරා දෙන සේක්ද, එසේ එය සිතෙහි දරාගනු මැනවැ"යි කීය.

7. "භික්ෂුන් වහන්ස, අන් මහේශාක්‍ය දේවතාවන් විසින් පිරිවරනලද ඒ භාග්‍යවතුන් වහන්සේ කරා අප වැන්නවුන්ට පැමිණීම පහසු නොවේ. ඉදින් භික්ෂූන් වහන්ස, ඔබ ඒ භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණ මේ කරුණ අසන්නෙහි නම් අපිත් බණ අසන්නට එන්නෙමු."

8 "එසේය ඇවැත්නි"යි ආයුෂ්මත් සමිද්ධි මහණ තෙමේ ඒ දෙවියාට උත්තරදී භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙක ඉඳගත්තේය. එක් පසෙක උන් ආයුෂ්මත් සමිද්ධිතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

9. "ස්වාමීනි, මම රෑ අළුයම්හි නැගී සිට තපෝදා විල යම් තැනෙකද එතැනට ඇඟ සෝදා ගන්නට ගියෙමි. තපෝදායෙහි ඇඟ සෝදා ගොඩවුත් එක් සිවුරක් ඇතිව ඇඟ තෙත සිඳුවමින් සිටියෙමි. ස්වාමීනි, එකල එක්තරා දෙවියෙක් රෑ (පෙරයම) ගෙවුන කල්හි දිලිසෙන පැහැ ඇත්තේ මුලු තපෝදා විල් පෙදෙස බබුලුවමින් මම යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, අහසෙහි සිටඃ

'භික්ෂූන් වහන්ස, ඔබ නොකා භිඟති. කා නොසිඟති. භික්ෂූන් වහන්ස, කා ඉන්පසු සිඟන්න. කාලය ඔබ ඉක්මවා නොයේවා'යි ගාථායෙන් කීවේය.

10. "එසේ කීකල, ස්වාමීනි, මම ඒ දෙවියාට ගාථාවෙකින් 'කාලය මම් නොදනිමි. වැසුණු කාලය නොපැනේ. එබැවින් නොකා සිඟමි. කාලය මා නොඉක්මවා' යි පෙරළා කීමි.

11. "ස්වාමීනි, එවිට ඒ දෙවියා පොළොවට බැස සිට, භික්ෂූන් වහන්ස, ඔබ ළදරු වියෙහිම පැවිදිවූ කෙනෙක, තරුණය, ඉතා කළු කෙස් ඇත්තෝය, යහපත් තරුණ භාවයෙන්, ප්‍රථම වයසින් යුක්තයෝය, කාමක්‍රීඩා නොකළ කෙනෙක. භික්ෂූන් වහන්ස, මනුෂ්‍යයන් අයත් කම් සැප වැළඳුව මැනව. මේ ආත්මයෙහි වින්දයුතු සැප හැර දමා කල් පසුව ලැබෙන කම් සැප පස්සේ නොදුවන්නැ'යි මට කීවේය.

12. "මෙසේ කීකල, ස්වාමීනි, මම් ඒ දෙවියාට 'ඇවැත්නි, මම් වනාහි මේ ආත්මයෙහිම වින්දහැකි සැප හැරදමා කල්ගතව ලැබෙන සැප පස්සේ නොදුවමි. මම කාලික සැප හැරලා මේ ආත්මයෙහිම වින්දහැකි සැප පස්සේ නම් දුවමි. ඇවැත්නි, කාමයෝ වූකලී කාලිකයහ, බොහෝ දුක් පමුණුවන්නෝය, බොහෝ දැඩි වෙහෙස ගෙන දෙන්නෝය, එහි දොස් බොහෝයයිද, එහෙත් මේ ධර්මය තමා ඇස් හමුවෙහි ඵල ඇත්තේය, කල් නොයවා පල දෙන්නේය, එව බලවයි අන්‍යයන් තමා වෙතට කැඳවන්නට සුදුසුය, වහා තම සිතට පැමිණ වීමට සුදුසුය, නුවණ ඇත්තන් විසින් තම තමන් කෙරෙහි ලා දතයුතුයයිද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදැ'යි කීමි.

13. "ස්වාමීනි, මෙසේ මා කී විට, ඒ දෙව් තෙමේ 'කෙසේ නම් කාමයෝ කාලිකය, බොහෝ දුක් පමුණුවන්නෝය, බොහෝ දැඩි වෙහෙස ගෙනදෙන්නෝය, එහි දොස් බොහෝ යයිද, එහෙත් මේ ධර්මය තමා ඇස් හමුවෙහි ඵල ඇත්තේය. කල් නොයවා පල දෙන්නේය. එව, බලවයි අන්‍යයන් තමා වෙතට කැඳවන්නට සුදුසුය. වහා තම සිතට පැමිණවීමට සුදුසුය. නුවණ ඇත්තන් විසින් තම තමන් කෙරෙහි ලා දතයුතුයයිද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදැයි" ඇසුවේය.

14. "ස්වාමීනි, මෙසේ ඔහු කී කල, මම් 'ඇවැත්නි, මම් නවක වෙමි, ළඟදී පැවිදිවූයෙකිමි, මේ සස්නට අළුත ආයෙකිමි, විස්තරයෙන් කීමට නොහැක්කෙමි. අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි තපෝදාරාමයෙහි වෙසෙති. උන්වහන්සේ වෙත එළඹ, මේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

කරුණු විචාරන්න. භාග්‍යවතුන් වහන්සේ යම් සේ ඔබට මෙය තෝරා දෙන සේක්ද එසේ සිත දරාගන්නැ'යි කීමි.

15. "ස්වාමීනි, මෙසේ කී කල, 'අන් මහේශාක්‍ය දෙවතාවන් විසින් පිරිවරනලද ඒ භාග්‍යවතුන් වහන්සේ කරා අප වැන්නවුන් පැමිණීම පහසු නොවේ. ශ්‍රමණයන් වහන්ස, ඉදින් ඔබ ඒ භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණ, මේ කරුණු අසන්නෙහි නම්, අපිත් බණ අසන්නට එන්නම්හ'යි ඒ දෙවියා කීවේය. ස්වාමීනි, ඉදින් ඒ දෙවියාගේ කීම සැබෑ නම් ඒ දෙවියා මෙහි ළඟම ඇතැ"යි කීයේය.

16. මෙසේ කී කල ඒ දෙවියා "භික්ෂුන් වහන්ස, විචාරන්න. භික්ෂුන් වහන්ස, විචාරන්න. මේ මම පැමිණියෙමි"යි මේ වචන සමිද්ධි ආයුෂ්මතුන්ට කීවේය.

17. එවිට භාග්‍යවතුන්වහන්සේ ඒ දෙවියාට ගාථායෙන් මෙසේ කීහ:

> "සත්ත්වයෝ උපාදානස්කන්ධ පසෙහි සත්ත්ව පුද්ගල ආදී වශයෙන් වරදවා හඳුනනසුලු වෙත්. පඤ්චඋපාදාන ස්කන්ධයෙහි පිහිටියාහු වෙත්. ඔව්හු ඒ උපාදාන ස්කන්ධයන් පිරිසිඳ නොදැන්මෙන් මරහුගේ වශගයට පැමිණෙත්.
>
> "එහෙත් (යමෙක්) උපාදානස්කන්ධයන් පිරිසිඳ දැන්මෙන් නම් කළ යුතු කිසිවකු නොදක්නේද, එසේවූ ඔහුට 'රාගාදී යමෙකින් මෙතෙම මැඬුණේය'යි කිසිවෙක් ඔහුට දොස් කිය හැක්කේ නම් එබන්දක් ඔහුට නැත. ඔහුට දොස් කිය හැකි නොවේ. යක්ෂය, එසේවූ තැනැත්තකු දන්නෙහි නම් කියව."

18. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදාළ මේ වචනයේ අදහස විස්තර වශයෙන් නොදනිමි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කොටින් වදාළ මේ වචනයේ අදහස යම් සේ විස්තරයෙන් මම් දැනගත හැකි වන්නෙම්ද, එසේ මට භාග්‍යවතුන් වහන්සේ වදාරනසේක්වා" (යි කීවේය.)

19. "යමෙක් මම 'සමයෙමි' කියා හෝ 'විශෙෂ වන්නෙමි' කියා හෝ නැතහොත් 'හීනයෙමි' කියා හෝ තමා සලකාද, ඔහු එයින් අනුන් හා විවාද කරන්නේය. යමෙක් ඒ මානයන්හි නොසැලෙන්නේද, (මාන නැසූ) ඔහුට මම 'සමයෙමි' කියා හෝ 'විශෙෂවෙමි' කියා හෝ 'හීනයෙමි' කියා හෝ හැඟීමෙක් නැත. යක්ෂය, එවැන්නකු දන්නෙහි නම් කියව"යි (වදාළසේක.)

20. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ සැකෙවින් වදාළ මෙහිද අදහස විස්තරයෙන් නොදනිමි. යහපත, ස්වාමීනි, සැකෙවින් වදාළ එහි අදහස විස්තරයෙන් මට දැනගත හැකි වන සේ භාග්‍යවතුන් වහන්සේ එය වදාරනසේක්වා" (යි කීවේය.

21. "ක්ෂීණාශ්‍රව තෙමේ පැණවීම් හැරදැමූයේය. මානයට නොබටුයේය. මේ නාමරූපයෙහි ඇල්ම දුරු කෙළේය. ගැට නැසූ, දුක් නැති, තණ්හා නැති ඒ රහතුන් දෙවියෝත් මිනිස්සුත් මෙහි හෝ අන් ලොවක හෝ ස්වර්ගයන්හි හෝ සියලු සත්වාවාසයන්හි හෝ සොයන්නාහු නුමුත් නොදක්නාහ. එසේවූ පුඟුලකු දන්නෙහි නම්, යක්ෂය, කියව"(යි වදාළසේක.)

22. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ සැකෙවින් වදාළ මේ වචනයේ අර්ථ විස්තර වශයෙන් මෙසේ දනිමි."

"වචනයෙන් හෝ සිතින් හෝ කයින් හෝ කිසි පවක් හැම වේලෙහි නොකරන්නේය (නොකළ යුතුය.) කාමයන් දුරුකොට, සිහි ඇත්තේ, මනා නුවණැත්තේ, අවැඩ ඇසුරු කළ දුකද සේවනය නොකරන්නේය"යි (කීයේය.)

දෙවෙනි නන්දන වර්ගයයි.

---

# 3. සත්ති වර්ගය.

## 1. සත්ති සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එක් පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීයේයඃ

"හුලකින් අනින ලද්දකු මෙන්ද, හිස ගිනි ඇවිල ගත්තකු මෙන්ද, මහණ තෙමේ කාමරාගය නසනු පිණිස සිහි ඇතිව වසන්නේය."

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේකඃ)

"හුලකින් අනින ලද්දකුසේත්, හිස ගිනි ඇවිලගත්තකු සේත් මහණ තෙමේ සක්කායදෘෂ්ටිය නසනු පිණිස සිහි ඇතිව (අප්‍රමාදව) වසන්නේය."

---

## 2. ඵුසති සූත්‍රය

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එක් පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීයේයඃ

"කර්මය ස්පර්ශ නොකරන්නා ස්පර්ශ නොකෙරේ. (කර්ම නොකරන්නාට විපාක නොලැබේ.) කර්මය ස්පර්ශ

කරන්නහුම විපාකතෙමේ ස්පර්ශ කෙරේ (කර්ම කරන්නාහටම විපාකය වේ.) එහෙයින් නොකිපුණාවූ පුද්ගලයන්ට ද්වෙෂ කරන, පාප කර්ම ස්පර්ශ කරන්නහු (පව් කම් කරන්නා) එහි නපුරු විපාකය තෙමේ ස්පර්ශ කරයි. (ඔහුට ඒ පව්කම්හි විපාක ලැබේ.)"

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක:)

"කිසිවෙකුට වරද (ද්වෙෂ) නොකළ, නිරපරාධ (පිරිසිදු) වූ, කෙළෙස් නැති සත්ත්වයකුට (යමෙක්) වරද කෙරේද, ඒ පාපයම උඩුසුළඟට දැමූ සියුම් දූවිල්ල සේ දුක් විපාක වශයෙන් ඒ අඥානයා කරාම පෙරළා එයි."

---

## 3. ජටා සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එකත්පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීයේය:

"ඇතුළතද අවුල්ය. පිටතද අවුල්ය. සත්ත්ව සමූහයා අවුලෙන් බැඳුණේය. ගෞතමයන් වහන්ස, කවරෙක් මේ අවුල බේරිය හැකි වන්නේද? එය ඔබ අතින් විචාරමි."

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක:)

"නුවණැති යම් කෙනෙක් ශීලයෙහි පිහිටා, චිත්තයත් (සමාධියත්), ප්‍රඥාවත් (විදර්ශනාවත්) වඩන්නේද, කෙළෙස්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

තවන වීර්‍ය්‍යය ඇති, ස්ථානොචිත ප්‍රඥාවෙන් යුක්තවූ (සසර බිය දක්නා ගති ඇති) ඒ භික්ෂු තෙම මේ අවුල බේරිය හැකි වන්නේය

"රාගයත්, ද්වෙෂයත්, අවිද්‍යාවත් යම් කෙනෙකුන් විසින් දුරලන ලද්දාහුද, ඔව්හු ආශ්‍රව (කෙලෙස්) දුරලූ රහත්හු වෙති. ඔවුන් විසින් මේ අවුල ලිහන ලදී.

"යම් තැනෙක නාමයත්, රූපයත් නොඉතිරිවම නිරුද්ධ වේද, කාම භවයත්, රූප භවයත් අරූප භවයත් නැසේද එතැනදී මේ අවුල සිඳීයයි."

---

## 4. මනො නිවාරණ සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එකත්පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීයේයඃ

"යමෙකින් යමෙකින් සිත වළක්වා ගන්නේ නම්, ඒ ඒ දෙයින් ඔහුට දුකෙක් නොපැමිණේ. එබැවින් සියල්ල කෙරෙන්ම සිත වළක්වා ලන්නේ නම් ඔහු සියලු දුකින් මිදේ."

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.)

"සිත සියල්ලෙන්ම නොවළකන්නේය (වැළකිය යුතු නොවේ), සංයත බවට පැමිණි සිත නොම වළකන්නේය.

යමෙකින් යමෙකින් අකුසල් උපදනේ නම්, ඒ ඒ දෙයින් සිත වළක්වා රැකගන්නේය.

---

## 5. අරහන්ත සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එක් පසෙක සිටි ඒ දේවතාවා භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථා කීයඃ

"සිවු මගින් කළ යුතු දේ කොට නිමවූ, කෙලෙස් නැසූ, අන්තිම ආත්ම බව දරන යම් රහත් භික්ෂුවක් වේනම්, ඔහු 'මම කියමි' කියාත් කියන්නේද? '(ඔව්හු) මට කියති' කියාත් කියන්නේද?"

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.)

"කළ යුතු දේ කොට නිමවූ, කෙලෙස් නැසූ, අන්තිම ආත්ම බව දරන්නාවූ, යම් රහත් භික්ෂුවක් වේ නම්, ඔහු 'මම කියමි' කියාත් කියන්නේය. 'මට කියත්ය' කියාත් කියන්නේය. නුවණැති ඔහු ලෝක ව්‍යවහාරයද දැන ව්‍යවහාර මාත්‍රයෙන් ('මම කියමි', 'මට කියති' යනාදිය) ව්‍යවහාර කරන්නේය."

"කළයුතු දේ කොට නිමවූ, කෙලෙස් නැසූ, අන්තිම ආත්ම බව දරන, යම් රහත් භික්ෂුවෙක් වේනම්, ඔහු මානය නිසා හෝ 'මම කියමි' කියාත් 'මට කියති'යි කියාත් කියන්නේද?"

"ඔහුගේ මානය ප්‍රහීණය. මාන (ගැට) ඔහුට නැත. ඔහු විසින් සියලු මාන ගැට හාත්පසින් නසනලදී. මනා නුවණැති ඔහු තණ්හා ඉක්මවූයෙක. (එසේවූ) ඔහු 'මම කියමි' කියාද, 'මට කියති' කියාද කියන්නේය. නුවණැති ඔහු ලෝක ව්‍යවහාරයද දැන හුදෙක් ව්‍යවහාර වශයෙන් ('මම', 'මට' යන ආදිය) කියන්නේය.

---

## 6. පජ්ජොත සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එක් පසෙක සිටි ඒ දේවතාවා භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථා කීයඃ

"යමෙකින් ලොව බබළා නම්, ඒ ලොව එළිය කරන දේ කොතෙක්ද? භාග්‍යවතුන් වහන්සේ වෙතින් විචාරන්නට අවුත් සිටිමු. අපි එය කෙසේ නම් දැන ගනිමුද?"

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.)

"ලොව එළිය කරන දේ සතරෙකි. මෙහි පස්වැන්නෙක් නැත. දහවල් හිරු බබළයි. රෑ සඳු බබළයි. තවද දිවා රෑ දෙක්හි ගින්න ඒ ඒ තැන බබළයි. සම්බුද්ධයන් වහන්සේ බබළන්නවුන් අතුරෙහි ශ්‍රේෂ්ඨය. මේ හැමටම වැඩි තරම්වූ ආලෝකයයි."

---

## 7. සර සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එක් පසෙක සිටි ඒ දේවතාවා භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය.

"(සංසාර) කඳුරැළි කොතන්හි නවතීද? (සංසාර) දියසුලිය කොතැනදී නවත්නේද? නාමයත් රූපයත් කොතැනදී නොයිතිරිව නැතිවේද?"

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක)

"යම් තැනෙක ආපෝ ධාතුවත්, පඨවි ධාතුවත්, තේජෝ ධාතුවත්, වායො ධාතුවත් නොපිහිටාද, (ඒ මේ නිවනෙහි) සසර කඳුරැළි නවතී. (ඒ මේ නිවනෙහි) සසර දිය සුලිය නොපෙරළෙයි. (ඒ මේ නිවනෙහි) නාමයත් රූපයත් මුළුමනින් නැතිවේ."

---

## 8. මහද්ධන සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය

බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එක් පසෙක සිටි ඒ දේවතාවා භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීය.

"මහත් ධන ඇති, මහත් වස්තු ඇති, රටවල් අයිති රජහු පවා කාමයන්හි තෘප්තියට නොපැමිණියාහු එකෙක් අනෙකකුගේ වස්තුව පතත්. ඔවුන් සසර මහ වතුර අනුව යන්නන්ව උත්සාහීවූ කල්හි මෙහි (ලොව) කවුරු නම් තණ්හාව දුරැලුවෝද? ලොව කවුරු නම් උත්සාහ නැත්තෝද?"

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.)

"ගිහි ගෙය හැර ප්‍රියවූ දුරුවන්ද, ගව මහිෂාදී සිවුපා සමූහයාද හැර පැවිදිවූ, රාගයත් ද්වේෂයත් දුරලා අවිද්‍යාවත් පහකොට සිටි, කෙලෙස් නැසූ ඒ රහත්හු ලොව නාමයන් සෙවීම් ආදියෙහි උත්සාහ නැත්තෝය."

## 9. චතුචක්ක සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එක් පසෙක සිටි ඒ දේවතාවා භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීය.

"මහා වීරයන් වහන්ස, රෝද සතරක් ඇති, දොර නවයක් ඇති, අසුචියෙන් පිරුණු, ලෝභයෙන් යුක්තවූ, මඩෙන් උපන් ශරීරයාගේ එතරවීම කෙසේ වන්නේද?"

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.)

"බද්ධ වෛර නමැති ලනුවද, (කෙලෙස් නමැති) වරපටද, (නොලත් දේ පැතුමනම්) ලාමකවූ ඉච්ඡාවද, ලත් දැයෙහි ඇල්මද, සිඳ දමා, (අවිද්‍යා නමැති) මුල සහිත තණ්හාව උදුරා දැමීමෙන් මෙසේ ශරීරයාගේ එතරවීම වන්නේය."

---

## 10. ඒණිජඞ්ග සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එකත්පසෙක සිටි ඒ දේවතාවා භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීයඃ

"ඒණි මුවෙකුගේ බඳු වට කෙණ්ඩා ඇති, කෘශවූ, ස්වල්පාහාර ඇති, ලොල් බැව් නැති, හුදෙකලාව හැසිරෙන සිංහයෙකු බඳු, ඇතකු බඳු, කාම අපෙක්ෂා නැති, වීරයන් වහන්සේ කරා එළඹ විචාරම්හඃ දුකින් කෙසේ මිදෙමුද?"

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.)

"ලොව මනස සවැනි කොට ඇති පඤ්චකාම බන්ධන ප්‍රසිද්ධයහ. මෙහි ඇල්ම දුරලීමෙන් මෙසේ දුකින් මිදේ."

තෙවැනි සත්ති වර්ගයයි.

---

# 4. සතුල්ලපකායික වර්ගය.

## 1. සබ්භි සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි පිහිටි අනේපිඬු සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල සතුල්ලපකායික නමින් දන්නාලද බොහෝ දෙවි කෙනෙක් රෑ පළමු දසපැය ඉක්මුණු කල මනා පැහැ ඇත්තාහු සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමුණුනාහ. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, පසෙක සිටියහ.

2. පසෙක සිටි එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය:

"සත්පුරුෂයන් හාම එක්ව විසිය යුතුය. සත්පුරුෂයන් හාම මිත්‍ර සමාගමය කළ යුතුය. සත්පුරුෂයන්ගේ සද්ධර්මය දැනගැන්මෙන් වැඩිදියුණුව වෙයි. පිරිහීමෙක් නොවෙයි."

3. එවිට අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය:

"සත්පුරුෂයන් හාම එක්ව විසිය යුතුය. සත්පුරුෂයන් හාම මිත්‍ර සමාගමය කළ යුතුය. සත්පුරුෂයන්ගේ සදහම් දැනගැන්මෙන් ප්‍රඥාව ලැබෙයි. අන් පරිද්දෙකින් නොලැබෙයි."

4. එවිට අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය.

"සත්පුරුෂයන් හාම එක්ව විසිය යුතුය. සත්පුරුෂයන් හාම මිත්‍ර සමාගමය කළ යුතුය. සත්පුරුෂයන්ගේ සත්දහම් දැන්මෙන් ශෝක කරන්නන් මැද ශෝක නොකෙරෙයි."

5. එවිට අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය:

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"සත්පුරුෂයන් හා ම එක්ව විසිය යුතුය. සත්පුරුෂයන් හා ම මිත්‍ර සමාගමය කළ යුතුය. සත්පුරුෂයන්ගේ සත්දහම් දැනගැන්මෙන් නැයන් මැද වෙසෙයින් බබළයි."

6. එවිට අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය:

"සත්පුරුෂයන් හා ම එක්ව විසිය යුතුය. සත්පුරුෂයන් හා ම මිත්‍ර සමාගමය කළ යුතුය. සත්පුරුෂයන්ගේ සත් දහම් දැනගැන්මෙන් සත්වයෝ සුගතියට යෙත්."

7. එවිට අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය:

"සත්පුරුෂයන් හා ම එක්ව විසිය යුතුය. සත්පුරුෂයන් හා ම මිත්‍ර සමාගමය කළ යුතුය. සත්පුරුෂයන්ගේ සත්දහම් දැනගැන්මෙන් නිරතුරුව සැපසේ සිටිත්."

8. එවිට අන් දෙවියෙක් මෙසේ කීවේය: "භාග්‍යවතුන් වහන්ස, කාගේ කීම මනාකොට කීමද?"

(එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක:)

"තොප සියල්ලන්ම කී දේ එකි එකී කාරණා වශයෙන් යහපත් කීම්ය. එතෙකුදු වුවත් මගේ වචන අසවු:

"සත්පුරුෂයන් හා ම එක්ව විසිය යුතුය. සත්පුරුෂයන් හා ම මිත්‍ර සමාගමය කළ යුතුය. සත්පුරුෂයන්ගේ සත්දහම් අවබොධ කරගැන්මෙන් සියලුම දුකින් මිදේ."

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. සතුටු සිත් ඇති ඒ දෙවියෝ භාග්‍යවතුන් වහන්සේට වැඳ පැදකුණු කොට, එහිම අතුරුදන් වූහ.

---

## 2. මච්ඡරි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි පිහිටි අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

එකල්හි සතුල්ලපකායික නමින් දන්නාලද බොහෝ දෙවි කෙනෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල බබළන පැහැ ඇත්තාහු සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියෝය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියහ.

2. එකත්පසෙක සිටි එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීයඃ

"මෙසේ මසුරු බවත්, පමාවත්, කරණකොට ගෙන දන් දෙනු නොලැබේ. (දීමෙහි ඵල ඇතැයි) දන්නා පින් කැමැත්තහු විසින් දන් දියයුතු වෙයි."

3. ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ මේ ගාථා කීයඃ

"යමකට බියෙන් මසුරා දන් නොදේද, නොදෙන ඔහුට ඒ බියම වේ.

"බඩගින්නද පිපාසාවද යන යමකට මසුරා බිය වේද, එයම මෙලොවද පරලොවද ඒ දන් නොදෙන අනුවණයා වෙතම පැමිණෙයි.

"එබැවින් මසුරු බව දුරලා මසුරුමළ මැඩලන්නෙක්ව දන් දෙන්නේය. පින් පරලොවෙහිදී සත්නට පිහිටවේ."

4. ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථා කීයඃ

"යම් කෙනෙක් මහ කතරෙක යන්නාහු, මඟ දෙයක් ඇති කලද, එය (තමා) සමග යන්නවුන්ට බෙදා දෙන්නාහු නම්, ඔවුහු මළවුන් අතුරෙහි නොමැරෙත්. මේ පුරාණ ධර්මයෙකි.

"ඇතැම් කෙනෙක් වස්තුව ස්වල්පව ඇතිකල්හිද දෙත්. ඇතැම්හු බොහෝ වස්තුයෙන් යුක්තව ඉඳත් දන් නොදෙත්. ස්වල්පයක් ඇතියහු ඒ ස්වල්ප දෙයින් දුන් දන දහසක් ධනයෙන් දුන් දනක් හා සමයැයි ප්‍රමාණ කරණ ලදී."

5. එකල අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථා කීයः

"දීමට දුෂ්කරවූ දානය දෙන, කරන්නට අමාරුවූ පින්කම් කරන, තැනැත්තවුන් අනුව අසත්පුරුෂයෝ ක්‍රියා නොකෙරෙත්. සත්පුරුෂයන්ගේ ධර්මය අසත්පුරුෂයන් විසින් අනුගමනය කළ නොහැක්ක. එබැවින් සත්පුරුෂයන්ගේද අසත්පුරුෂයන්ගේද මෙයින් මතු පරලොව ගතිය වෙනස් වෙයි. අසත්පුරුෂයෝ නිරයට යෙත්. සත්පුරුෂයෝ සුගතියට යත්."

6. එවිට අන් දෙවියෙක්, "භාග්‍යවතුන්වහන්ස, මොවුන්ගෙන් කාගේ කියුම මැනැවින් කියන ලද්දෙක්දැ?"යි භාග්‍යවතුන් වහන්සේගෙන් ඇසුවේය.

"තොප හැම කී දේ ඒ ඒ කාරණයේ සැටියෙන් මනා කොට කියන ලද්දේය. එතෙකුදු වුවත් මගේ කීමද අසවුः

"යමෙක් දුකසේ අඹු දරුවන් රකිමින් වෙසෙන්නේද, ඔහු ස්වල්ප වස්තුවක් ඇති කල්හි එයින් දන් දෙමින් කුසල් කරන්නේද, එසේ වූවහුගේ ඒ දානයේ සියයෙන් කොටසක් පමණටවත් වරකට දහසක් වියදම් කොට, ලක්ෂයක් දෙනෙකුට දන් දුන්නවුන්ගේ දාන සිය දහස නොවටනේය.

7. එවිට අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙසේ කීය.

"මහත්වූ, උදාර බවට පත් මේ දානය කවර කරුණෙකින් (දිළින්දා) ඒ දැහැමෙන් උපයා දුන් දානයාගේ අගයට (ළංව) නොපැමිණේද? දහස් ගණන් දන්දෙන්නහුගේ ඒ දාන (දිළින්දා දුන්) එබඳු දානයාගේ සියෙන් පංගුවටත් කවර හෙයින් නොඅගිත්ද?"

8. එවිට භාග්‍යවතුන් වහන්සේ ඒ දෙවියාට ගාථාවෙකින් (මෙසේ) වදාළසේක.

"ඇතැම්හු විෂම කර්මයන්හි පිහිටියාහු අනුන් ශෝකයට පත්කොට දන් දෙත්. ඒ ශෝකයට පත්කර දුන් දඬු මුගුරුවලින් අනුන් බියගන්වා තළාපෙළා දුන් දානය දැහැමෙන් දිළින්දා දුන් දානයේ වටිනාකමට නොඑයි. මෙසේ වරකට ලක්ෂයක් දෙනෙකුට දහසක් බැගින් දුන් ඒ දානයෝ දිළින්දා අනුන් නොරිදුවා සපයාගත් දෙයින් දුන් එබඳු දානයේ සියෙන් කොටසකටද නොවටිනේය."

---

## 3. සාධු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල්හි සතුල්ලපකායික නමින් දන්නාලද බොහෝ දෙවි කෙනෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල මනා වර්ණ ඇත්තාහු සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා එළඹුනාහ. එළඹ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියහ.

2. "එක් පසෙක සිටි එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ප්‍රීති වාක්‍යය පහළ කෙළේය.

"නිදුකාණන් වහන්ස, දන් දීම යහපති.

"මසුරු බව නිසාත්, ප්‍රමාදය නිසාත් මෙසේ දන් දෙනු නොලැබේ. පින් පල දන්නා, පින් කැමැත්තහු දන් දියයුතු."

3. එවිට වෙනත් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයේ මේ ප්‍රීතිවාක්‍යය පහළ කෙළේය.

"නිදුකාණන් වහන්ස, සැබව; දීම යහපත. තවද දාන වස්තු ස්වල්පයක් ඇති කලද දීම යහපත.

"ඇතැම්හු මද දෙයක් ඇති කලද දෙත්. ඇතැම්හු බොහෝ වස්තුව ඇතිවද නොදෙත්. මඳ දෙයින් දුන් දන,

දහසක් ධන විසඳා දුන් දනට සමකොට ප්‍රමාණ කරන ලදී.”

**5.** එවිට අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කෙළේය.

“නිදුකාණන් වහන්ස, දීම යහපත. මඳ දෙයක් ඇති කල වුවද දීම යහපති. තවද ශ්‍රද්ධාවෙන් දීම යහපති.

“දානයද, යුද්ධයද සමාන කොට කියත්. යුද්ධයෙහි ටික දෙනෙක්වම බොහෝ (සතුරන්) දිනත්ද, එමෙන්ම මඳ දෙයක් වුවද කම්පල අදහමින් දෙන්නේද, ඒ හේතුයෙන්ම ඔහු පරලෙව්හිදී සැප ඇතියෙක් වෙයි.”

**6.** එවිට අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ප්‍රීති වාක්‍යය පහළ කෙළේය.

“නිදුකාණන් වහන්ස, දීම යහපත. මඳක් ඇතිකලද දීම යහපත. ශ්‍රද්ධායෙන් දීමද යහපත. එහෙත් දැහැමින් ලත් වස්තුව ආර්‍ය්‍ය පුද්ගලයකුට දීමම යහපත.”

“යම් සත්වයෙක් නොපසුබට වීර්‍ය්‍යයෙන් සැපයූ, දැහැමින් ලත් වස්තුව දන්දේද, හෙතෙම යමයාගේ වෙතරණී නිරය ඉක්මවා ගොස් දිව්‍යලෝකයට පැමිණේ.”

**7.** එවිට අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත මේ ප්‍රීති වාක්‍යය පහළ කෙළේය.

“නිදුකාණන් වහන්ස, දීම යහපත. මඳ දෙයක් ඇති කල දීමද යහපත. ශ්‍රද්ධාවෙන් දීමද යහපත. දැහැමින් සැපයූ දෙයින් දීමද යහපත. එහෙත් දෙන දෙයක් සොයා බලා දීම යහපති.”

“පරික්ෂා කොට බලා දීම බුද්ධාදී උතුමන් විසින් පසස්නාලදී. මේ සත්ත්ව ලොකයෙහි දෙන දේ ලබන්නට සුදුසු පුද්ගල කෙනෙක් වෙත්ද, ඔවුන්ට දුන් දන් මහත් ඵලය, සරු කෙතක වැපුරූ ධාන්‍ය මෙනි.”

**8.** එවිට අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ප්‍රීති වාක්‍යය පහළ කෙළේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"නිදුකාණන් වහන්ස, දීම යහපත්මය. මඳ දෙයක් ඇති කල එයින් දීමද යහපත්මය. සැදැහැයෙන් දීමද යහපත්මය. දැහැමින් ලත් දැයින් දීමද යහපත්මය. විමසා බලා දීමද යහපත්මය. තවද ප්‍රාණවධයෙන් වැළැක්මද යහපත.

"යමෙක් සතුන් කෙරේ හිංසා නොකොට හැසිරෙනුයේ අනුන්ගෙන් ලැබෙන චෝදනාවට බියෙන් ප්‍රාණඝාත ආදී පව් නොකෙරේද, ඒ බිය තැනැත්තා (නුවණැත්තෝ) පසසත්. එහි (පවට) බියනැති ප්‍රාණ වධයෙහි දක්ෂයා ඔවුහු නොපසසත්. සත්පුරුෂයෝ (පවට) බියෙන් පව් නොකෙරෙත්."

9. එවිට අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේට, "භාග්‍යවතුන් වහන්ස," (මොවුන්ගෙන්) කාගේ නම් කීම මැනැවින් කියන ලද්දේදැ"යි කීය.

(එවිට භාග්‍යවතුන් වහන්සේ) "තොප හැම කී දේම ඒ ඒ කාරණය අනුව යහපත්ය. එහෙත් මාගේ වචනද අසවු.

"සැදැහැයෙන් දීම බොහෝ ලෙස පසස්නා ලදී. එහෙත් දානයට වඩා ධර්මපදය (නිවන) උතුම්. පෙර සිටියාවූද වඩාත් පෙර සිටියාවූද නුවණ ඇති සත් පුරුෂයෝ නිර්වාණයම ලැබූහ"යි (වදාළ සේක)

---

## 4. න සන්ති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල්හි සතුල්ලපකායික නමින් දන්නා ලද බොහෝ දෙවි කෙනෙක් රෑ පෙරයම ඉක්මුණුකල මනා පැහැ ඇත්තාහු සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමුණුනාහ. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක් පසෙක සිටියහ.

2. එක් පසෙක සිටි එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය.

"මිනිසුන් කෙරෙහි නිත්‍ය කාමවස්තූහු නැත්තාහ. යම් කාමවස්තූන් කෙරෙහි බැඳුණු තැනැත්තේ, යම් කාමවස්තූන්හි පමාවූ තැනැත්තේ භවයෙන් (නික්ම) නිවණට නොයන්නේ වේද, එසේවූ, සිත් අදනා, රූපාදී ආරම්මණයෝ නම් මෙහි (ලෝකයෙහි) ඇත්තාහ.

(පඤ්චස්කන්ධ) දුක තණ්හාවෙන් උපදනේය. සසර දුක තණ්හායෙන් හටගැනේ. තණ්හාව නිරුද්ධ කිරීමෙන් (පඤ්ච) ස්කන්ධ නිරෝධය වේ. ස්කන්ධ නිරෝධයෙන් (සංසාර) දුක්ඛනිරෝධයවේ."

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "ලොව විසිතුරු රූපාදී යම් අරමුණු කෙනෙක් වෙත්ද, ඔව්හු කාමයෝ නොවෙති. පුරුෂයාගේ ඇලීම නම්වූ රාගය කාම නමි. ලොව විසිතුරු රූපාදීහු තමන් සිටි ලෙසම සිටිත්. එතෙකුදුවුවත් නුවණ ඇත්තෝ එහි ඇල්ම දුරලත්.

"ක්‍රෝධය දුරලන්නේය. මානය හාත්පසින් බැහැර ලන්නේය. සියලු සංයෝජනයන් ඉක්මවන්නේය. නාම රූප දෙක්හි නොඇලෙන්නාවූ, ලොව කිසිත් (ඇලුම්) නැති, ඔවුන් අතර දුක්ඛයෝ කඩා නොවැටෙත්."

"යමෙක් සත්තවාදී ප්‍රඥප්තිය දුරලීද, නැවත ඉපදීම් වශයෙන් මවුකුස නමැති විමානයට නොපැමිණියේද, මේ නාම රූප දෙකෙහි තණ්හාව දුරලීද, සිඳලූ සියලු පළිබොධ ඇති, දුක් නැති, ආශා නැති, ඒ රහතුන් දෙවියෝත් මිනිස්සුත් මෙහි හෝ පරලොව හෝ ස්වර්ගයන්හි හෝ සියලු සත්වාවාසයන්හි හෝ සොයන්නාහු නුමුත් දැක්ක නොහැක්ක."

4. ආයුෂ්මත් මෝඝරාජ තෙම මෙසේ කීය. "ඉදින් දෙවියෝත් මිනිස්සුත් මෙලොවෙහිත් අන් තන්හිත් සොයන්නාහු, එසේ මිදුණු රහතුන් නොදක්නාහු නම්, නරෝත්තමවූ, සත්නට

හිත වැඩ සලසන, එසේවූ බුදුරදුන් යම් කෙනෙක් නමදිත් නම් ඔව්හු පැසසුම් ලැබිය යුත්තෝය.”

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක) “මොඝ රාජය, එසේ මිදුණු රහතුන් යම් කෙනෙක් නමදිත්ද, ඒ භික්ෂූහු පැසසුම් ලද යුත්තෝය. ඒ භික්ෂූහු දහම් දැන, සැක දුරලා, රාගාදී බැමි ඉක්මවූවෝ වෙත්.”

---

## 5. උජ්ඣානසඤ්ඤී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල්හි වනාහි බොහෝ උජ්ඣානසඤ්ඤීක දේවතා කෙනෙක් රෑ පෙරයම ඉක්මුණු පසු බබළන ශරීර ශෝභා ඇත්තාහු මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියාහ. පැමිණ, අහසෙහි සිටියාහ.

2. අහසෙහි සිටි එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය.

> “යමෙක් අන් සැටියෙන්වූ තමා ඉන් වෙනස් සැටියෙකින් ලොවට පෙන්වන්නේ නම්, ඔහුගේ ඒ සිවුපසය වැළඳීම-ළිහිණි වැද්දා වංචායෙන් ළිහිණි මස් කෑම මෙන්- සොරා කෑමෙකි.”
>
> “යමක් කරන්නේ නම්, එයම කියයුතු. යමක් නොකරන්නේ නම්, එය නොකිය යුතු. නොකරන දේ කියන තැනැත්තා නුවණැති අය හඳුනත්.”

3. (එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) “ස්ථිරවූ මේ යම් ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙක් වේද, යමෙක උපකාරයෙන් නුවණ ඇත්තෝ මර බැම්මෙන් මිදෙත්ද, ඒ ප්‍රතිපත්තිය පිළිපැදීමට කීම හෝ ඇසීම පමණින් නොහැක්ක.”

"නුවණ ඇත්තෝ ලෝක ස්වභාවය දැන රැවැටිලි නොම කෙරෙත්. (සිවුසස්) දැන තිවුණු ඒ නුවණ ඇත්තෝ ලොව ඇල්ම ඉක්මවූවෝය."

**4.** එවිට ඒ දේවතාවෝ පොළොවෙහි පිහිටා භාග්‍යවතුන් වහන්සේගේ පා මුල හිසින් වැඳ වැටී භාග්‍යවතුන් වහන්සේට මෙබස් කීහ. "ස්වාමීනි, යම් බඳුවූ බාලයන්සේ, මෝඩයන්සේ, අඥානයන්සේ, භාග්‍යවතුන් වහන්සේ වචනයෙන් චෝදනා කළයුත්තකු කොට ඇනුම් බසින් භාග්‍යවතුන් වහන්සේ වෙහෙසවන්නට සිතූයෙමුද, ඒ අප මැඩගෙන වරද පැවැත්තේය, අපෙන් වරද විය. ස්වාමීනි, මින් මතු මෙවැනි වරද නොකරනු පිණිස, භාග්‍යවතුන් වහන්සේ වරද වරද සේ පිළිගන්නා සේක්වා."

**5.** එවිට භාග්‍යවතුන් වහන්සේ මඳ සිනහ පහළ කළ සේක.

**6.** එකල ඒ දේවතාවෝ වඩාලාත් දොස් නගමින් (කලකිරී) අහස නැංගහ.

**7.** එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීය.

"වරද දෙසන්නවුන්ගේ වරද යමෙක් නොපිළිගනී නම්, ඇතුළත කෝපය ඇති, ද්වේෂය ගරුකොට ගෙන හැසිරෙන හෙතෙම වෛරය (තමා සිතෙහි) බැඳගනී."

"ඉදින් දෝෂයෙක් නොවේනම්, වරදකුත් නො මැත්තේ නම්, වෛරයෝත් සන්සිඳෙන්නාහු නම්, ඒ කරුණෙන් මෙහි කුශලයෙක් වන්නේය."

"දොස් නැත්තේ කාගේද? වරද නැත්තේ කාගේද? කවරෙක් (මුළාවට) නොපැමිණෙන්නේද? කවරනම් නුවණ ඇත්තෙක් හැමවිටම එළඹ සිටි සිහි ඇත්තෙක් හෝ වේද? (නොවේමය.)"

**8.** (එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "සියලු සත්වයින්ට අනුකම්පා කරන ඒ තථාගත සම්‍යක්

සම්බුද්ධයාගේ දොස් නැත. ඕහුගේ වරදෙක් නැත. හෙතෙම (කිසිවිටෙකත්) මුළාවට නොපැමිණියේය. හෙතෙමේම හැමකල්හි එළඹ සිටි සිහි ඇති නුවණ ඇත්තාය."

"වරද දෙසන්නවුන්ගේ වරද ඉදින් යමෙක් නොපිළිගන්නේ නම් සිත තුළ කෝපය ඇති, ද්වේෂය ගරු කොට ගෙන හැසිරෙන ඕහු වෛරය (සිත) බැඳගනී (යයි තොප කීවා සරිය.) එහෙත් මම් වනාහි ඒ වෛරය නොකැමැත්තෙමි. තොපගේ වරද පිළිගනිමි. (තොපට කමා කෙරෙමි.)"

---

## 6. ශ්‍රද්ධා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල්හි වනාහි බොහෝ සතුල්ලපකායික දෙවියෝ රෑ පෙරයම ඉක්මුණු පසු බබළන ශරීර ප්‍රභායෙන් සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියාහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙක සිටියහ.

2. එක් පසෙක සිටි එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය.

"ලෞකික ලොකොත්තර සැප කරා යන පුරුෂයාට ශ්‍රද්ධාව (ඕහු සමග යන) දෙවැන්නා වෙයි. ඕහු අශ්‍රද්ධායෙහි බැස නොසිටී නම් ඒ හේතුයෙන් ඕහුට පිරිවරද, කීර්තියද වෙයි. මේ ශරීරය හැර ඕහු ස්වර්ගයටද යෙයි."

3. එකල අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාවන් කීය.

"ක්‍රොධය නසන්නේ නම්, මානය දුරු කරන්නේ නම්, සියලු සංයොජන ඉක්මවා ලන්නේ නම්, නාම රූප දෙක්හි

නොඇලෙන, හිරිහැර නැති, ඒ පුද්ගලයා කරා සංයෝගයෝ (බැම්) නොපැමිණෙත්.”

4. (එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.) “අනුවණ මෝඩ ජනයෝ ප්‍රමාදයෙහි යෙදෙත්. නුවණැත්තෝ අප්‍රමාදය ශ්‍රෙෂ්ඨ ධනයක් මෙන් රකී.

“ප්‍රමාදයෙහි නොයෙදෙවු; කාම රතිය හා එක්වීමෙහි නොයෙදෙවු. ධ්‍යාන වඩන, නොපමා තැනැත්තාම පරම සැපයට පැමිණේ.

---

## 7. සමය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සියල්ලන්ම රහතුන්වූ, භික්ෂූන් පන්සියයක් පමණවූ මහද් භික්ෂු සමූහයා හා ශාක්‍ය රටෙහි කපිලවස්තු නගරය සමීපයේ මහා වනයෙහි වාසය කරන සේක. භාග්‍යවතුන් වහන්සේත්, භික්ෂු සංඝයාත් දැකීම පිණිස දසදහසක් සක්වළින් දේවතාවෝ බොහෝසෙයින් රැස්වූවාහුය.

2. එකල්හි වනාහි ශුද්ධාවාස බ්‍රහ්මලෝක වාසී දෙවියන් සතරදෙනෙකුන්ට මේ සිත විය. “මේ භාග්‍යවතුන් වහන්සේ වනාහි සියල්ලන්ම රහතුන්වූ භික්ෂූන් පන්සියයක් පමණවූ මහද් භික්ෂු සමූහයා හා සමගව ශාක්‍ය රටෙහි කිඹුල්වත් පුර සමීපයෙහිවූ මහ වනයෙහි වාසය කරන සේක. භාග්‍යවතුන් වහන්සේත් භික්ෂු සංඝයාත් දැකීම පිණිස දසසහස්‍ර ලෝක ධාතුවෙහි දේවතාවෝ බොහෝසෙයින් රැස් වූවාහු වෙත්. අපිත් භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණෙන්නමෝ නම්, පැමිණ, භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි වෙන වෙනම ගාථාවක් (බැගින්) කියන්නමෝ නම් ඉතා යෙහෙක.”

3. ඉක්බිති ඒ දේවතාවෝ ශක්තිමත් පුරුෂයෙක් යම්සේ හැකුළුණු අතක් දික් කරන්නේද, දික් කළ අතක් හකුළන්නේද,

එමෙන්ම ශුද්ධාවාස බ්‍රහ්ම ලොකයෙහි අතුරුදහන් වූවාහු, භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි පහළවූහ.

**4.** ඉක්බිති ඒ දේවතාවෝ භාග්‍යවතුන් වහන්සේ වැඳ, පසෙක සිටියහ. පසෙක සිටි එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය.

"වනයෙහි මහා සමූහයෙකි. දේව සමූහයෝ එක් රැස්වූවාහ. අපිදු කිසිවකු විසිනුදු පැරදවිය නොහෙන, සංඝයා දැකීම සඳහා මේ ධර්ම සමාගමයට ආවෙමු."

**5.** එවිට අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය.

"ඒ මේ ධර්ම සමාගමයෙහි භික්ෂූහු තමන් සිත් සමාධියෙහි යෙදූහ. ඍජු කළහ. යොත් අල්ලාගෙන ඉන්නා රියැදුරන් මෙන් නුවණ ඇත්තෝ ඉන්ද්‍රියයන් රකිත්."

**6.** එවිට අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය.

"පසැස් ඇති ශාස්තෲන් වහන්සේ විසින් මනාකොට හික්මවනලද, තරුණ ඇතුන් බඳුවූ, (රාග, ද්වෙෂ, මෝහ නමැති) කණුව සිඳ, (රාග, ද්වෙෂ, මෝහ නමැති) අගුල සිඳ, (රාග, ද්වෙෂ, මෝහ නමැති) එළිපත උදුරා, තණ්හා කම්පන රහිත වූවාහු, උප ක්ලෙශ නැත්තෝව, නිර්මලව හැසිරෙත්."

**7.** එවිට අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය.

"යම් කෙනෙක් බුදුන් සරණ ගියෝ නම්, ඔවුහු අපාය භූමියට නොයන්නාහ. ඔවුහු මිනිසත් බව හැර දෙව් පිරිස පුරාලන්නාහ."

---

## 8. සකලික සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි මද්දකුච්ඡි නම් මුව වෙනෙහි වැඩවසන සේක. එසමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේගේ පාදයෙහි ගල් පතුරක් වැදුණේය. (එයින්) භාග්‍යවතුන් වහන්සේට දුක්වූ, දැඩිවූ, රළුවූ, කටුකවූ, අමිහිරිවූ, අමනාපවූ, බලවත් කායික දුක් වේදනාවෝ උපන්හ. භාග්‍යවතුන් වහන්සේ වනාහි එළඹ සිටි සිහි ඇති සේක්, නුවණ ඇති සේක්, එහෙයින් නොපෙළන්නාහු ඒ වේදනාවන් ඉවසන සේක.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සඟළ සිවුර සතර පටක් කොට පණවාගෙන දකුණු පය පිට වම් පය මඳක් ඉක්මවා තබා සිහිනුවණැතිව දකුණු ඇලයෙන් (සිංහයෙකුගේ නිදීමට බඳු) ශයනය කළ සේක.

3. එකල්හි වනාහි සත්සියයක් සතුල්ලපකායික දෙවියෝ රෑ පෙරයම ඉක්මුණු පසු බබළන ශරීර ශෝභා ඇත්තාහු සියලු මද්දකුච්ඡි වනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියහ. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක සිටියහ.

4. එවිට එක් පසෙක සිටියාවූ එක් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ප්‍රීතිවාක්‍ය පහළ කෙළේය.

> "ස්වාමීනි, පුදුමයෙකි! ශ්‍රමණ ගෞතම තෙම හස්තියෙකි. එසේ ඇතෙකු බැවින්ම තමහට ඇතිවූ දුක්වූ, දැඩිවූ, රළුවූ, කටුකවූ, අමිහිරිවූ, අමනාපවූ, ශරීරගත වේදනාවන් සිහිනුවණ ඇතිව පීඩා නොවිඳිමින් ඉවසයි."

5. ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ප්‍රීති වාක්‍යය පහළ කෙළේය.

> "ස්වාමීනි, පුදුමයෙකි! ශ්‍රමණ ගෞතම තෙම සිංහයෙක. සිංහයකු නිසාම, ඇතිවූ දුක්වූ, දැඩිවූ, රළුවූ, කටුකවූ, අමිහිරිවූ, අමනාපවූ, ශරීරගත වේදනාවන් සිහි නුවණ ඇතිව නොපෙළෙමින් ඉවසයි."

**6.** ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කෙළේය.

"ස්වාමීනි, පුදුමයෙකි! ශ්‍රමණ ගෞතම තෙම ආජානීයයෙක" ආජානීය බැවින්ම හටගත් දුක්වූ, දැඩිවූ, රළුවූ, කටුකවූ, අමිහිරිවූ, අමනාපවූ, ශාරීරික වේදනාවන් සිහි නුවණ ඇතිව නොපෙළෙමින් ඉවසයි.'

**7.** ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කෙළේය.

"පින්වත්නි, පුදුමයකි! ශ්‍රමණ ගෞතම තෙම (ගවයන් ලක්ෂයකට අධිපතිවූ නිසභයෙක) අප්‍රතිසමයෙක. (සමාන කිරීමට අනිකෙක් නැත්තෙක). අප්‍රතිසම බැවින්ම හටගත් දැඩිවූ, රළුවූ, කටුකවූ, අමිහිරිවූ, අමනාපවූ, ශාරීරික වේදනාවන් සිහිනුවණින් යෙදී පීඩා නොලබමින් ඉවසා"යි.

**8.** ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කෙළේය.

"පින්වත්නි, පුදුමයකි! ශ්‍රමණ ගෞතම තෙම බර උසුලන්නෙකි. බර උසුලන්නෙකු හෙයින්ම හටගත් ශාරීරිකවූ, දුක්වූ, දැඩිවූ, රළුවූ, කටුකවූ, අමිහිරිවූ, අමනාපවූ, වේදනාව සිහිනුවණින් යෙදී පීඩා නොලබමින් ඉවසා"යි.

**9.** ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කෙළේය.

"ස්වාමීනි, පුදුමයකි! ශ්‍රමණ ගෞතම තෙම දැමුණු කෙනෙක, දැමුණු බැවින්ම ශාරීරිකවූ දුක්වූ, දැඩිවූ, රළුවූ, කටුකවූ, අමිහිරිවූ, අමනාපවූ, වේදනාවන් සිහි නුවණින් යෙදී පීඩා නොලබමින් ඉවසා"යි.

**10.** ඉක්බිති අන් දෙවියෙක් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ප්‍රීතිවාක්‍යය පහළ කෙළේය.

"බලන්න, හොඳින් වඩනාලද සමාධියක්! නොනැමුණු, අරමුණින් ඉවතට නොනැමුණු, අනුන්ගේ මෙහෙයීමෙන්

කෙලෙසුන් මැඩ, ඔවුන් වළක්වාලීම් නැති තැන්පත්වූ සිතක්! මෙබඳුවූ පුරුෂ ඇතෙකු, පුරුෂ සිංහයකු, පුරුෂාජානීයකු, අසම පුරුෂයකු, පුරුෂ ධෝරය්හයකු, පුරුෂදාන්තයකු, පෙළියයුත්තකු කොට යමෙක් සිතන්නේ නම්, එය ඔහුගේ අඥාන බව විනා අන් කිමෙක්ද?"

"වේද පහ දරන්නාවූ අවුරුදු සියයක් තවුස්දම් රකිමින් හැසිරෙන බමුණෝ වෙද්ද, ඉදින් ඔවුන්ගේ සිත මනාකොට නොමිදුනේ නම්, හීන බව (මාර්ගඵල නොලත් බව) ස්වභාව කොට ඇති ඔවුහු නිවන් කරා යන්නෝ නොවෙත්.

"තණ්හාවෙන් මැඩුණු ව්‍රත හා ශීලයෙන් බැඳුණු තැනැත්තෝ අවුරුදු සියයක් රූක්ෂ තපස් කරන්නෝ නමුත්, ඔවුන්ගේ සිත මනාව නොමිදුණේ නම් පිරිහුණු බව ස්වභාවකොට ඇති ඔවුහු නිවන් වෙත යන්නෝ නොවෙත්.

"මෙලොව මානය පතන්නහුගේ සිතේ දමනයක් නැත. එකඟ නොවූ සිතැති ඔහුගේ චතුරාර්‍ය්‍ය සත්‍යය දැනීමෙක් නැත. පමා තැනැත්තේ හුදෙකලාව වනයෙහි වසන්නේ නමුදු සසරින් පරතෙරට යාගත නොහැක්කේය."

(එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.)

"මානය දුරලා මනාව එකඟ කර ගත් සිතැත්තේ, නුවණින් යුක්තවූයේ, සියලු ලෙසින් මිදුණු තැනැත්තේ හුදෙකලාව අප්‍රමාදව වනයෙහි වසන්නේ, ඔහු සසරින් එගොඩට යන්නේය."

---

## 9. පළමුවන පජ්ජුන්නධීතු සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවර සමීපයෙහිවූ මහවනයෙහි කූටාගාර ශාලා විහාරයෙහි වසන සේක. එකල්හි වනාහි පජ්ජුන්න

දෙවිහුගේ දූ වූ කෝකනදා දෙවඟන රෑ පෙරයම ඉක්මුණු පසු බබළන ශරීරප්‍රභා ඇත්තී සියලු මහාවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියාහ. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක සිටියාය. එක්පසෙක සිටි පජ්ජුන්න දෙවියාගේ දූවූ කෝකනදා දෙව්දූ තොම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථා කීවාය.

("වහන්ස,) විසාලාමහනුවර සමීපයෙහි මහවනයෙහි වසන සත්ත්ව සමූහයාට අග්‍රවූ සම්බුද්ධයන් වහන්සේ කෝකනදා නම්වූ මම හොඳින් වඳිමි. පජ්ජුන්නගේ දූවූ කෝකනදා මම වෙමි.

"පසැස් ඇති තථාගතයන් වහන්සේ විසින් ධර්මය අවබෝධ කරන ලදැයි පෙර මවිසින් අසනලද පමණක්ම විය. ඒ මම් දැන් දහම් දෙසන සුගත් මුනිහුගේ ධර්මය ප්‍රත්‍යක්ෂයෙන් දනිමි. යම් අනුවණ කෙනෙක් ආර්‍ය්‍ය ධර්මයට නින්දා කෙරෙමින් හැසිරෙත්ද, ඔවුහු දරුණුවූ නපුරු නරකයට පැමිණෙත්. (එහි) බොහෝ කාලයක් දුක් විඳිත්.

"යම් කෙනෙක් වනාහි ආර්‍ය්‍ය ධර්මයෙහි ක්ෂාන්තියෙන්ද, කෙලෙස් සන්සිඳීමෙන්ද යුක්ත නම්, ඔවුහු මනුෂ්‍යාත්මය හැර දෙව් පිරිස පුරාලන්නාහ. (දෙව්ලොව උපදනාහ.)"

---

## 10. දෙවෙනි පජ්ජුන්නධීතු සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ විසාලාමහනුවර සමීපයෙහි මහවනයෙහි කූටාගාර ශාලා විහාරයෙහි වසනසේක. එකල පජ්ජුන්න දෙවිහුගේ (බාල) දූවූ චුල්ල කොකනදා තොම රෑ පෙරයම ඉක්ම ගිය පසු මනා වර්ණ ඇත්තී මුළු මහවනය බබුලුවා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියාය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ,

එක්පසෙක සිටියාය. එක්පසෙක සිටි පජ්ජුන්නගේ දූවූ චුල්ල කෝකනදා තොම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථා කීවාය.

"පජ්ජුන්නගේ දූවූ විදුලිය පැහැ බඳු වර්ණ ඇති කොකනදා බුදුන්ද, දහම්ද, වඳින්නී (දැන්) මෙහි ආවාය. (ඕ තොමෝ අර්ථවත්වූ මේ ගාථා කීය.)

"ධර්මය විස්තර කරන්නෙම් නම් බොහෝ ආකාරයෙන් විස්තර කළ යුත්තකි (එහෙත්) යම්තාක් මවිසින් සිතින් පුහුණු කරන ලද නම් කොටින් එපමණක් කියන්නෙමි.

"වචනයෙන් හෝ සිතින් හෝ කයින් හෝ මුළු ලොව කිසිදු පවක් නොකට යුතුයි. සිහි නුවණැත්තේ පඤ්චකාම සම්පත් (විඳීම) ද හැර, අනර්ථය පිණිස පවත්නා කයට දුක් දීමද සේවනය නොකරන්නේය.

සිවු වන සතුල්ලපකායික වර්ගයයි."

---

# 5. ආදිත්ත වර්ගය.

## 1. ආදිත්ත සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ ජේතවනයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවනලද ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු එක් දෙවියෙක් බබළන වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන්වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථා කීය.

"ගෙයක් ගිනිගත් කල යම් භාජනයක් එයින් පිටතට ගනියිද, එය ඔහුට වැඩ පිණිස වේ. යමක් එහි දැවේ නම් එය වැඩ පිණිස නොවේ.

"එසේම ලොව ජරායෙනුත් මරණයෙනුත් ඇවිල ගත්තේ වේ. දීමෙන්ම පිටතට ගතයුතු. දෙනලද දේ මැනැවින් පිටත්කරන ලද්දේ නම් වේ.

"දුන් දේ සැප විපාක ඇති කරන්නේ වේ. නොදුන් දේ එසේ සැප විපාක නොදේ. එය සොරු හැරගෙන යත්. රජහු හෝ හැර ගනිත්. ගින්න හෝ දවයි. නැසී හෝ යන්නේය.

"තවද, වස්තු සහිත ශරීරය මරණයෙන් හැර දමයි. නුවණැත්තේ මෙය දැන තම වස්තුව ප්‍රයෝජනයට ගැනීමද කරන්නේය, දීමද කරන්නේය. එසේ ශක්ති පරිදි සම්පත් අනුභවයද කොට, දීමද කොට, නින්දා නොලබන්නෙක්ව දිව්‍ය ලෝකයට (සැප ඇති තැනට) පැමිණෙයි"

---

## 2. කිංදද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ ජේතවනයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවනලද ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්මගිය කල්හි එක් දෙවියෙක් බබළන වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන්වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

2. "කුමක් දෙන තැනැත්තේ ශක්තිය දෙන්නේ වේද? කුමක් දෙන තැනැත්තේ පැහැය දෙන්නේ වේද? කුමක් දෙන තැනැත්තේ සැප දෙන්නේ වේද? කුමක් දෙන තැනැත්තේ ඇස් දෙන්නේ වේද? සියල්ල දෙන

තැනැත්තෙක් වේ නම් කවරෙක්ද? මවිසින් විචාරණලද ඔබ මට (මේ) කියාදෙනු මැනවි.

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක)

"ආහාර දෙන තැනැත්තේ ශක්තිය දෙන්නේ වේ. වස්ත්‍ර දෙන්නා වර්ණය දෙන තැනැත්තේ වේ. යාන වාහන දෙන තැනැත්තේ සැප පහසු දෙන තැනැත්තේ වේ. එලිය දෙන තැනැත්තේ ඇස් දෙන තැනැත්තේ වේ. යමෙක් වාසස්ථාන දේ නම් ඔහුම සියල්ල දෙන තැනැත්තා නම් වේ. යමෙක් ධර්මානුශාසනා කෙරේ නම් ඔහු අමෘතදානය දෙන තැනැත්තේ නම් වේ."

## 3. අන්න සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ ජේතවනයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවනලද ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු එක් දෙවියෙක් බබළන වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන්වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

2. "දෙවියෝත් මිනිස්සුත් යන දෙකොටස ආහාර පතත්මය. එසේවූ කල කවර නම් සත්වයෙක් ආහාරයට සතුටු නොවේද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "යම් කෙනෙක් සද්ධායෙන්, වෙසෙසින් පහන්වූ සිතින්, (ආහාර) දෙත්ද, ඒ දානයාගේ විපාකයම මෙලොවත් පරලොවත් ඔහු අනුව යෙයි.

"එබැවින් මසුරු බව දුරලිය යුතු. මසුරුමළ දුරලා දන් දෙන්නේය. දන් දිය යුතු සත්ත්වයන්ට පරලොවදී පුණ්‍යයෝ පිහිට වෙත්."

# 4. ඒකමූල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ ජේතවනයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවනලද ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙර යම ඉක්ම ගිය කල්හි එක් දෙවියෙක් බබළන වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන්වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

2. "එක් මුලක් (තණ්හාව) ඇති, දියසුළි (දෘෂ්ටි) දෙකක් ඇති, මල (රාග, ද්වේෂ, මෝහ) තුනක්, ශාස්වත උච්ඡේද ඇති, පැතිරීම් (කාම වස්තු) පසක් ඇති, ආවර්ත (අධ්‍යාත්මික බාහිර ආයතන) දොළොසක්ද ඇති, පතුළක් නැති සමුද්‍රය (බුද්ධ) මහ ඉර්ෂීතෙම එතර කෙළේය."

---

# 5. අනොමය (හෙවත් අනොමනාම) සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ ජේතවනයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවනලද ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙර යම ඉක්ම ගිය පසු එක් දෙවියෙක් බබළන වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන්වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

"සම්පූර්ණ නම් ඇති, සියුම් අර්ථ දක්නාවූ, (අන්‍යයන්ටද) ප්‍රඥාව දෙන්නාවූ, කාමවස්තුන්හි නොඇලුණු, සියල්ල දන්නා, මනා නුවණ ඇති, ආර්ය මාර්ගයෙහි ගිය ඒ (බුද්ධ) මහා ඉර්ෂීහු බලවු"

## 6. අච්ඡරා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ ජේතවනයෙහි අනේපිඩු සිටාණන් විසින් කරවනලද ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු එක් දෙවියෙක් බබළන වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන්වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

2. "දිව්‍ය ස්ත්‍රී සමූහයාගේ ඝොෂා සහිතවූ, දිව්‍ය ස්ත්‍රී නමැති පිශාච සමූහයා විසින් සේවනය කරනලද, ඒ උයන මෝහන නම්. මෙයින් නික්මීම කෙසේ නම් වන්නේද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. "ඒ මාර්ගය, ඍජු මාර්ගයකි, එයින් යන ඒ දිශාව (භය නැති) දිශාවකි, ධර්ම චක්‍ර දෙකින් යුත් ඒ රථය (බර වැඩිවීමෙන් හෝ තෙල් නොදැමීමෙන් හෝ) හඬ නොනගන්නේ වෙයි.

"හිරි ඔතප්දෙක (හේත්තුවන) පුවරුවය, සිහිය එහි පිරිවර උපකරණය. ධර්මය රියැදුරායයි මම කියමි. විදර්ශනා සම්‍යග්දෘෂ්ටිය (රජු යන රථයට පෙරටුව යන පුරුෂයා මෙන් මාර්ග සම්‍යක්දෘෂ්ටියට) පෙරටුව යන්නාය.

"ස්ත්‍රියකට හෝ පුරුෂයකුට හෝ යමකුහට මෙබඳු රථයක් වේ නම්, ඒකාන්තයෙන් හෙතෙම ඒ රථයෙන් නිවන් වෙතම යෙයි."

---

## 7. වනරෝප සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

රෑ පෙරයම ඉක්ම ගිය පසු එක් දෙවියෙක් බබළන වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක උන්නේය. එක් පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

2. "දහවලුත් රෑත් හැමවිටම කවුරුන්ගේ පින් වැඩේද? සුගතියට යන ධර්මස්ථයෝ (ධර්මයෙහි පිහිටියෝ) නම් කවුරුද? සිල්වත්තු නම් කවුරුද?

3. (භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළ සේක.) "යම් ජනයෝ මල්වතු පලතුරු වතු (ආරාමයන්) වවන්නෝද, වන ලැහැබ් වවන්නෝද, හේදඬු පාලම් ආදිය කරවන්නෝද, යම් කෙනෙක් පැන්හලුත් වැව් පොකුණුත් කරවන්නෝද, වාසස්ථාන දෙන්නෝද, දිවා රෑ හැම විටම ඔවුන්ගේ පින් වැඩේ. මරණින් පසු ස්වර්ගයට යන, දහම්හි පිහිටි, සිල්වතුන් ඒ ජනයෝයි."

---

## 8. ජේතවන (නොහොත් ඉදඤ්හි) සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ ජේතවනයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවනලද ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු 'අනාථපිණ්ඩික දෙව්පුත්' බබළන වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි අනාථපිණ්ඩික දෙව්පුත් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

"භික්ෂු සමූහයා විසින් නිතර සෙවුනා ලද, ධර්ම රාජයන් වහන්සේ විසින් වාසය කරන ලද මේ ජේතවනය වනාහි මට ප්‍රීතිය උපදවන්නේය."

"කර්මයද (මාර්ග චෙතනාවද), විද්‍යාවද (මාර්ග ප්‍රඥාවද), (සමාධිපාක්ෂික) ධර්මයද, ශීල සම්පන්න උතුම් ජීවිතයද, යන මෙයින් සත්ත්වයෝ ශුද්ධවෙත්. ගෝත්‍රයෙන් හෝ ධනයෙන් ශුද්ධ නොවෙත්."

"එබැවින්ම තමාගේ දියුණුව දක්නා නුවණ ඇති පුරුෂ තෙම නිසි මගින් ධර්ම සෙවිය යුතු. මෙසේ ඒ ආර්‍ය්‍ය මාර්ගයෙහි හෙතෙම පිරිසිදු වෙයි."

"ප්‍රඥායෙන්ද, ශීලයෙන්ද, කෙලෙස් සංසිඳුවීමෙන්ද, ශාරීපුත්‍රයන් වහන්සේම උතුම්හ. පරතෙර පැමිණි යම් භික්ෂුවෙක් වේනම් හේ මේ සැරියුත් තෙරුන් පරම කොට ඇත්තේම වන්නේය."

---

## 9. මච්ඡෙර (නොහොත් මච්ඡරී) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ ජේතවනයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවනලද ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු එක් දෙවියෙක් බබළන වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

2. "දැඩි මසුරුකම් ඇති, ක්‍රොධ කරන, අනුන් දන්දෙන කල්හි එයට අන්තරාය කරන, යම් මසුරු කෙනෙක් මෙලොව වෙත් නම්, ඔවුන්ට විපාකය කෙබඳුද? ඔවුන්ගේ පරලොව ගතියත් කෙසේද? ඔබවහන්සේගෙන් මෙය විචාරා දැනගන්නට අවුත් සිටුම්හ. එය අපි කෙසේ දැන ගනුමෝද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක) "දැඩි මසුරුවූ, සිඟන්නන්ට නින්දා කරන, දන් දෙන අන්‍යයන්ගේ

ඒ දානයට අන්තරාය කරන, යම් මසුරු කෙනෙක් මෙලොව වෙත්ද, ඔවුහු මරණින් මතු නිරයට හෝ තිරිසන් යෝනියට හෝ යමලෝකයට හෝ පැමිණෙන්නාහ."

"ඉදින් ඔවුහු (පසු) මිනිස් බවට එන්නාහු නම්, යම් කුලයෙක රෙදිපිළි, ආහාරපාන, කම්සැප හා ක්‍රීඩා දුකසේ ලැබේ නම් එබඳු දිළිඳු කුලයෙහි උපදනාහ."

("ඒ) අඥානයෝ අනුන්ගෙන් යමක් පතන්නාහු නම්, එයද ඔවුන්ට නොලැබේ. මේ ඔවුන්ට මේ ආත්මයෙහි ලැබෙන විපාකයයි. ඔවුන්ට මරණින් පසු දුගතියෙහි උත්පත්තියද වේ."

4. (දෙවිතෙම මෙසේ කීවේය.) "ගෞතමයන් වහන්ස, මෙය මෙසේ දැනගතිමු. දැන් අන් කරුණක් විචාරමු. යම් කෙනෙක් මිනිස් බව ලද්දාහුද ඔව්හු තමන් වෙත පැමිණියවුන්ගේ වුවමනා වටහාගෙන දෙන පහවූ මසුරු බව ඇත්තාහු, බුදුන් කෙරෙහිත් ධර්මයෙහිත් සංඝයා කෙරෙහිත් පැහැදුණු දැඩි ගෞරව ඇත්තාහු වෙත් නම්, ඔවුනට (වන) විපාකය කෙබඳුද? ඔවුන්ගේ පරලොව ගතිය කෙබඳුවේද? භවතුන්ගෙන් විචාරන්නට අවුත් සිටිමු. එය අපි කෙසේ දැන ගනිමුද?"

5. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.) "මෙහි මිනිස් බව ලත් යම් කෙනෙක් තමන් වෙත පැමිණියවුන්ගේ වුවමනා වටහා ගෙන දන් දෙත්ද, මසුරුකම පහකළෝ වෙත්ද, බුදුන් කෙරෙහි ධර්මය කෙරෙහි සංඝයා කෙරෙහි පැහැදුණාහු දැඩි ගෞරව ඇත්තාහුද, ඔවුහු යම් ඒ (ස්වර්ගයෙක උපදනාහු) ද, එහි බබළත්."

"ඉදින් ඔවුහු මිනිසත් බවට එන්නාහු නම්, යම් තැනෙක වස්ත්‍රාභරණ, ආහාරපාන, කම් සැප හා ක්‍රීඩා නිරායාසයෙන් ලැබේද, එසේවූ උසස් කුලයක උපදිත්."

"එසේ උසස් කුලයෙහි උපන් ඔවුහු අනුන් රැස් කොට තැබූ වස්තුව එහි අයිතිකාරයන් මෙන් බුත්ති විඳිත්. මේ

මේ ආත්මයෙහි ලැබෙන විපාකයි. ඔවුන්ට මරණින් පසු වනාහි සුගතියෙහි උත්පත්තිය වේ.”

---

## 10. ඝටීකාර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ ජේතවනයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවනලද ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු ඝටීකාර බ්‍රහ්මතෙම බබළන වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඝටීකාර බ්‍රහ්මතෙම භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථා කීය.

2. “භික්ෂූන් සත් නමක් අවිහ බඹලොවට (උත්පත්ති වශයෙන්) පැමිණියාහු, කෙලෙසුන්ගෙන් මිදුණෝ, රාග ද්වෙෂයන් නැසුවෝ, ලොව ඇල්ම (තෘෂ්ණාව) තරණය කළහ.”

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.) “කෙලෙස් මඩ ඇති, තරණයට දුෂ්කරවූ, සංසාර සාගරය ඒ කවර කෙනෙක් නම් තරණය කළෝද? කවුරු නම් මිනිස් කය (ඔරංභාගිය සංයොජන) හැර දිව්‍යයෝගය (උද්ධංභාගිය සංයොජන) ඉක්මවැලූවෝද?”

4. (ඝටීකාර බ්‍රහ්මයා මෙසේ කීය.) “උපකද, පලගණ්ඩද, පුක්කුසාතිද යන ඔවුහු තුන්දෙනාත්, භද්දියද, ඛණ්ඩදෙවද, බාහුරග්ගිද, පිඞ්ගියද යන මොවුහුත් (සත්දෙන) මනුෂ්‍ය දේහය හැර, දිව්‍යයෝගයද ඉක්මවූහ.”

5. (භග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.) “මරහුගේ මළපුඩුව දුරලූ ඔවුන්ගේ ගුණ පණ්ඩිතවූ ඔබ කීයෙහිය. ඔවුහු කාගේ ධර්මයක් දැනගෙන සසර බැම්ම සිඳලූහුද?”

6 (ඝටීකාර බ්‍රහ්මයා මෙසේ කීය.) "ස්වාමීනි, ඔවුහු යමෙකුගේ ධර්මය දැන සසර බැම්ම සින්දෝ නම්, ඒ භාග්‍යවතුන්ගේ මිස අනෙකෙකුගේ නොවේ. ඔබගේ ශාසනය මිස අනෙකක් නොවේ."

"යම් තැනෙක්හි (නිවනෙක්හි) සියලු නාමයත්, සියලු රූපයත් නිරුද්ධ වේද, ඒ (නිර්වාණ) ධර්මය ඔවුහු මේ සස්නෙහි දැන සසර බැම්ම සින්දහ."

7. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.) "දුකසේ දතයුතු අර්ථ ඇති, දුකසේ අවබෝධ කටයුතු අර්ථ ඇති, ගැඹුරු බසක් කීයෙහි. යුෂ්මත් තෙම කාගේ ධර්මයක් දැනගෙන මෙබඳු බසක් කීයෙහිද?"

8. (ඝටීකාර බ්‍රහ්මතෙම මෙසේ කීය.) "ස්වාමීනි, මම් පෙර වේහලිඞ්ග ගම වළන් සාදන (ඝටීකාර නම්) කුඹලෙක් වීමි. මව් පියන් රක බලා ගන්නා ඒ මම් කාශ්‍යප ශාස්තෲන් වහන්සේගේ උපාසකයෙක් වීමි."

"මෛථුන සේවනයෙන් වැළකුණෙක් වීමි. නිරාමිෂ බ්‍රහ්මචාරී (අනාගාමි) වීමි. ඔබ හා එකම ගම වසන්නෙක් වීමි. ඒ පෙර ආත්මයෙහි ඔබගේ යහළුවා වීමි. "ඒ මම රාග ද්වෙෂ ක්ෂය කළ, ලොව තණ්හාව ඉක්මවූ, අර්හත් භාවයෙන් (කෙලෙසුන්ගෙන්) මිදුණු මේ භික්ෂූන් සත්දෙනම දනිමි."

9. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.) "කුම්භකාරය, ඔබ යම්සේ කීයෙහිද එසේම එය විය. පෙර ඔබ වේහලිඞ්ග ගම වළන් සාදන කුඹලෙක් වූයෙහි. මවුපියන් රක්නෙක් වූයෙහි. කාශ්‍යප ශ්‍රාවකවූ උපාසක වූයෙහි.

"මෛථුන ධර්මයෙන් වැළකුණු, නිරාමිෂ බ්‍රහ්මචාරී වූයෙහි. මගේ ගමෙහි වැසියෙක් වූයෙහි. පෙර මගේ මිත්‍රයා වූයෙහි."

10. "මෙසේ භාවනාවෙන් වැඩූ සිතැති, අන්තිම සිරුරු දරන, පැරැණි යහළුවන් දෙදෙනාගේ මේ සංගමය විය."

පස්වන ආදිත්ත වර්ගයයි.

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# 6. ජරා වර්ගය.

## 1. ජරා (හෙවත් කිංසුජරා) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු එක් දෙවියෙක් බබළන ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

2. "මහලු බව දක්වාම කිමෙක් නම් යහපත්ද? කිමෙක් (සිතෙහි) පිහිටීම යහපත්ද? කිමෙක් නම් මිනිසුන්ට රත්නයක් වේද? කිමෙක් නම් සොරුන් විසින් හැරගෙන යා නොහැකිද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.) "මහලුබව දක්වාම සිල් රැක්ම යහපති. ශ්‍රද්ධාව ස්ථිරව පිහිටීම මැනවි. ප්‍රඥාව මිනිසුන්ට රත්නය වේ. පින සොරුන් විසින් හැරගත හැකි නොවේ."

---

## 2. අජරසා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු එක් දෙවියෙක් බබළන ශරීර ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. "නොදිරා යැමෙන් කිමෙක් මනාප වේද? කුමක් නම් පිහිටියේ මනාප වේද? මිනිසුන්ට කිමෙක් නම් රත්න වේද? කුමක් නම් සොරුන් විසින් හැරගත නොහැකිද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.) "ශීලය නොදිරා යැමෙන් මනාප වේ. ශ්‍රද්ධාව පිහිටියේ මනාප වේ. ප්‍රඥාව මිනිසුන්ට රත්නය වෙයි. පින සොරුන් විසින් හැරගත නොහැක්ක."

---

## 3. මිත්ත (හෙවත් කිංසුමිත්ත සූත්‍රය)

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු එක් දෙවියෙක් බබළන ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

2. "පිටරට යන්නහුගේ මිත්‍රයා කවරේද? සිය ගෙයි වසන්නහුගේ මිතුරා කවරේද? උපන් කටයුත්තක් ඇත්තහුට මිත්‍රයා කවරේද? පරලොව යන්නහුට හිතවූ මිතුරා කවරේද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.) "පිටරට යන්නහුගේ මිත්‍රයා ගැල් රංචුව හෝ තවලමයි. සිය ගෙහිදී මිතුරා මවුයි. උපන් වැඩක් ඇත්තහුට යලි යලිත් මිතුරා යහළුවායි. තමා කළ යම් පින් ඇත්ද, ඒ පරලොවට හිතවූ මිතුරායි."

---

## 4. වත්ථු (හෙවත් කිංසුවත්ථු) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු එක් දෙවියෙක් බබළන ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක සිටියේය. එක්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

2. "මිනිසුන්ට පිහිට කිමෙක්ද? මේ ලොකයෙහි උතුම් යහළුවා කවරේද? යම් ප්‍රාණී කෙනෙක් පොළොවෙහි වෙත්ද ඒ සත්ත්වයෝ කුමක් ඇසුරුකොට ජීවත් වෙද්ද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "දරුවෝ මිනිසුන්ට පිහිටයි. භාර්‍ය්‍යාවම උතුම් යහළුවායි. යම් ප්‍රාණීහු පොළොවෙහි වෙත් නම් ඒ සත්හු වැස්ස ඇසුරුකොට ජීවත් වෙත්."

---

## 5. පළමුවන ජන (හෙවත් ජනෙති) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු එක් දෙවියෙක් බබළන ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය

2. "කිමෙක් නම් සත්ත්වයා උපදවාද? ඔහුගේ කිමෙක් නම් ඒ මේ අත දිවේද? කිමෙක් නම් සසර වැදුණේද? කිමෙක් නම් ඔහුට (වූ) මහත්ම භය වේද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "තණ්හාව සත්ත්වයා උපදවයි. ඔහුගේ සිත ඒ මේ අත දිවෙයි. සත්ත්වයා සසර වැදුණේය. ජාති ජරාදී දුක ඔහුටවූ මහත් භයයි."

---

## 6. දෙවෙනි ජන (හෙවත් ජනෙති) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු එක් දෙවියෙක් බබළන ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක් පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

2. "කිමෙක් නම් සත්ත්වයා උපදවාද? ඔහු පිළිබඳ කිමෙක් නම් ඈත මෑත දුවයිද? කිමෙක් නම් සසර වැදුණේද? ඔහු නොමිදෙනුයේ කුමකින්ද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක) "තණ්හාව සත්ත්වයා උපදවයි. ඔහුගේ සිත ඒ මේ අත දිවෙයි. සත්ත්වයා සසර වැදුණේය. ඔහු (නිසි මග යන තෙක්ම) නොමිදෙනුයේ දුකිනි."

---

## 7. තුන්වෙනි ජන (හෙවත් ජනෙති) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු එක් දෙවියෙක් බබළන ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා

භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

2. "කිමෙක් නම් සත්ත්වයා උපදවාද? ඔහු පිළිබඳ කිමෙක් නම් ඈත මෑත දිවේද? කිමෙක් නම් සසර වැදුණේද? කිමෙක් නම් ඔහුගේ ඉපදීමට පිහිට වේද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "තණ්හාව සත්ත්වයා උපදවයි. ඔහුගේ සිත ඈත මෑත දිවෙයි. සත්ත්වයා සසරට වැදුණේය. කර්මය ඔහුට පිහිටය."

---

## 8. උප්පථ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු එක් දෙවියෙක් බබළන ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

2. "කිමෙක් නම් නොමඟයයි කියන ලදද? කිමෙක් නම් රෑ දාවල්හි ගෙවේද? බ්‍රහ්මචර්‍ය්‍යාවට කිලුට කිමෙක්ද? දිය නොමැති නෑම කිමෙක්ද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "රාගය නොමඟ යයි කියන ලදී. දිවා රෑ දෙක්හිම ගෙවෙන්නේ වයසය. බ්‍රහ්මචර්‍ය්‍යාවට කිලුට ස්ත්‍රියයි. (මේ සත්ත්ව සමූහයා මෙහි ඇලේ) තපසත් බඹසරත් යන යමෙක් ඇද්ද, එය දිය නැති නෑමයි."

---

## 9. දෙවෙනි උප්පථ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු එක් දෙවියෙක් බබළන ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

2. "පුරුෂයාට කිමෙක් නම් දෙවැන්නී (දුතියිකා) වේද? ඔහුට කවරෙක් නම් අනුශාසන කෙරේද? කුමක විශෙෂයෙන් ඇලුණු සත්ත්වයා සියලු දුකින් මිදේද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "ශ්‍රද්ධාව පුරුෂයාට දෙවැන්නීය. ප්‍රඥාව ඔහුට අනුශාසනා කෙරේ. නිවනෙහි විශෙෂයෙන් ඇලුණු සත්වතෙම සැම දුකින් මිදේ."

---

## 10. කවි (හෙවත් ගාථා නිදාන) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු එක් දෙවියෙක් බබළන ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

2. "ගාථාවන්ගේ මුල කිමෙක්ද? ඔවුන්ගේ අර්ථ උපදවන්නේ කවරෙක්ද? ගාථාවෝ කුමක් ඇසුරුකොට පවත්නෝද? කිමෙක් ගාථාවන්ට ආධාර ස්ථානද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "ඡන්දස ගාථාවන්ගේ මුලය. අකුරු ඔවුන් උපදවන්නේය. ගාථාවෝ නාමයන් ඇසුරුකොට ඇත්තෝය. කවි තෙම (පණ්ඩිතයා) ගාථාවන්ට ස්ථානයයි."

සවන ජරා වර්ගයයි.

---

# 7. අන්ව වර්ගය.

## 1. නාම (හෙවත් නාමද්ධභවන) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු එක් දෙවියෙක් බබළන ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

2. "කිමෙක් නම් සියල්ල යටපත් කොට සිටියේද? කිමෙකින් වැඩි දැයෙක් නැද්ද? කිනම් එක් දැයකට සියල්ලම වසඟ වූවෝද?"

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.) "නාමය සියල්ල යට කොට ගෙන සිටියේය. නාමයට වැඩියෙන් දෙයෙක් නැත. නාම නමැති එකම දැයකට සියල්ලෝ වසඟ වූවාහු වෙත්."

---

## 2. චිත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින්

කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු එක් දෙවියෙක් බබළන ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක් පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

2. "කිමෙකින් ලෝවැස්සා (අරමුණු දෙසට) පමුණුවනු ලැබේද? කිමෙකින් (ඒ මේ අතට) අදිනු ලැබේද? කවර නම් එකම දෙයක වසඟයට සියලු සත්ත්වයෝම ගියෝද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.) "ලෝවැසි තෙම සිතින් (අරමුණු දෙසට) පමුණුවනු ලැබේ. සිතින් (ඒ මේ අතට) අදනා ලැබේ. සියලු සත්හුම සිත නමැති එකම දෙයක වසඟයට ගියෝය."

---

## 3. තණ්හා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු එක් දෙවියෙක් බබළන ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

2. "කිමෙකින් ලෝවැස්සා අරමුණු අතට යැවේද? කිමෙකින් ඒ මේ අතට ඇදේද? කවරනම් එක්දෙයකට සියල්ලෝම වසඟ වූවෝද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.) "ලෝ වැසි තෙම තණ්හායෙන් අරමුණු අතට යැවේ.

තණ්හායෙන් ඒ මේ අතට ඇදේ. තණ්හා නම් එකම ධර්මයට සියල්ලෝ වසඟ වූවෝ වෙත්."

---

## 4. සංයොජන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු එක් දෙවියෙක් බබළන ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

2. "ලොව කුමක් බැඳුම් කොට ඇත්තේද? එහි ඇවිදින පාදයෝ කවරහුද? කුමක් නම් වෙසෙසින් පහකිරීමෙන් නිවන වේයයි කියනු ලැබේද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක) "ලොව රාගය බැඳුම් කොට ඇත්තේය. (කාමාදී) විතර්කයෝ එහි ඇවිදින පාදයෝයි. තණ්හාව වෙසෙසින් නැසීමෙන් නිවන වේයයි කියනු ලැබේ."

---

## 5. බන්ධන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

එක් පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීය:

2. "ලොව කුමක් බන්ධන කොට ඇත්තේද? එහි යන පාදයෝ නම් කවරහුද? කුමක් නම් වෙසෙසින් දුර ලීමෙන් සත්ත්ව තෙම සියලු බැඳුම් සිඳීද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක) "ලොව රාගය බැඳුම් කොට ඇත්තේය. (කාමාදී) විතර්කයෝ එහි යන පාදයෝයි. තණ්හාව හාත්පසින් දුරලීමෙන් සත්ත්ව තෙම සියලු බැම්ම සිඳලයි."

---

## 6. අබ්භාහත (හෙවත් මච්චුනබ්භාහත) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර වර්ණ ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීය:

2. "ලොව කවරක්හු විසින් ලුහුබඳනා ලදද? කිමෙකින් වට කරන ලදද? කවර නම් හුලෙකින් ඇණ බැස ගන්නා ලදද? කිමෙකින් හැම කල්හි ඇවිලුණේද?

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක:) ලොව මරහු විසින් ලුහුබඳනා ලද්දේය. ජරායෙන් වට කරන ලද්දේය. තෘෂ්ණා නමැති හුලෙන් ඇනුම් ලද්දේය. ලාභ ආශායෙන් ඇවිලගන්නා ලද්දේය."

---

## 7. උඩ්ඩිත (හෙවත් තණ්හාඋඩ්ඩිත) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එක් පසෙක සිටි ඒ දේවතාවා භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීය:

2. "ලෝවැසි තෙම කිමෙකින් එල්ලන ලදද? කිමෙකින් පිරිවරන ලද්දේද? කිමෙකින් වැසුණේද? ලොව කිමෙක පිහිටියේද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "ලෝවැසි තෙම තන්හායෙන් එල්ලුනේය. ජරායෙන් පිරිවරන ලද්දේය. ලෝවැසිතෙම මරණයෙන් වැසුණේය. ලෝවැසි තෙම දුකෙහි පිහිටියේය."

---

## 8. පිහිත (හෙවත් මච්චුපිහිත) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එක් පසෙක සිටි ඒ දේවතාවා භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීය:

2. "ලොව කවරෙකු විසින් වසා ගන්නා ලදද? ලොව කිමෙක පිහිටියේද? ලොව කවරකු විසින් එල්ලන ලදද? ලොව කවරකු විසින් වටකර ගන්නා ලදද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "ලොව මරහු විසින් වසාගන්නා ලදී. ලොව දුකෙහි පිහිටියේය. ලොව තණ්හාව විසින් එල්ලන ලදී. ජරාව විසින් වට කර ගන්නා ලදී."

---

## 9. ඉච්ඡා (හෙවත් ඉච්ඡාබද්ධ) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත් පසෙක සිටියේය. එක් පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේට මේ ගාථාව කීයඃ

2. "ලෝවැසි තෙම කිමෙකින් බැඳේ ද? කුමක් දුරලීමෙන් මිදේද? කුමක් නම් විශෙෂයෙන් පහකිරීමෙන් සියලු බැමි සිඳේ ද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක) "ලෝවැසි තෙම ආශායෙන් බැඳේ. ආශාව දුරැලීමෙන් මිදේ. ආශාව විශේෂයෙන් පහකර දැමීමෙන් සියලු බැමි සිඳේ."

---

## 10. ලොක (හෙවත් ජස්සුලොක) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල වනාහි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

එක්තරා දේවතාවෙක් රෑ පෙරයම ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එක් පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීය.

2. "කුමක් උපන් කල්හි ලෝවැසි තෙම උපන්නේ නම් වේද? කිමෙක සඞ්ගමය කෙරේද? ලෝවැසි තෙම කුමක් ප්‍රත්‍යය කොට ගෙන කිමෙක පෙළේද (වෙහෙසේද)?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "(අධ්‍යාත්මික ආයතන) සය උපන් කල්හි ලොව උපන්නේ නම් වේ. (රූපාදී බාහිර ආයතන) සයෙහි සඞ්ගමය කෙරෙයි. (අධ්‍යාත්මික ආයතන) සයම ප්‍රත්‍යය කොටගෙන (බාහිර ආයතන) සයෙහි ලෝවැසි තෙම පෙළෙයි (වෙහෙසයි)."

සත්වන අන්ව වර්ගයයි.

---

# 8. ඡේත්වා වර්ගය.

## 1. ඡේත්වා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එක් පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය:

2. "කුමක් නම් නසා සුවසේ වෙසේද? කුමක් නම් නසා ශෝක නොකෙරේද? ගෞතමයන් වහන්ස, කවර නම් ධර්මයක්හුගේ නැසීම කැමැත්තහුද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "ක්‍රෝධය නැසීමෙන් සුවසේ වෙසෙයි. ක්‍රෝධය නසාලීමෙන් ශෝක නොකෙරේ. දෙවිය, මිහිරිවූ අක් ඇති, විෂ සහිත මුල් ඇති, ක්‍රෝධයාගේ වැනසීම ආර්‍ය්‍යයෝ පසසත්. එය නැසීමෙන් ශෝක නොකෙරේ."

---

## 2. රථ (හෙවත් රථපඤ්ඤාණ) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එක් පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීය:

2. "රිය සලකුණ කිමෙක්ද? ගින්නට සලකුණ කිමෙක්ද? රටට සලකුණ කිමෙක්ද? භාර්‍ය්‍යාවට සලකුණ කිමෙක්ද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "රථය දැනගන්නා ලකුණ කොඩියයි. ගින්න ඇති බවට ලකුණ දුමයි. රටට ලකුණ රජයි. භාර්‍ය්‍යාව දැනගැනීමට ලකුණ සැමියායි."

---

## 3. චිත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර වර්ණ ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. ඉක්බිති ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීයඃ

> 2. "මෙහි (මෙලොව) පුරුෂයාගේ ශ්‍රේෂ්ඨ ධනය නම් කිමෙක්ද? කුමක් නම් මනාව පුරුදු කරන ලද්දේ සුව ගෙන දේද? රස අතුරෙන් ඉතා මිහිරි රසය නම් කිමෙක්ද? කෙසේ නම් ජීවත්වන්නහුගේ ජීවිතය ශ්‍රේෂ්ඨයයි කියත්ද?"
>
> 3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක) "මෙහි ශ්‍රද්ධාව (මෙලොව) පුරුෂයාගේ ශ්‍රේෂ්ඨ ධනයයි. හොඳින් පුරුදු කළ ධර්මය සැප ගෙන දෙයි. රස අතුරෙන් ඒකාන්තයෙන් ඉතා මිහිරි රසය නම් සත්‍ය රසයයි. ප්‍රඥායෙන් ජීවත්වන්නහුගේ ජීවිතය ශ්‍රේෂ්ඨයයි කියත්"

---

## 4. වුට්ඨි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර වර්ණ ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එක් පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීයඃ

2. "නැගෙන්නවුන්හට කිමෙක් නම් ශ්‍රෙෂ්ඨද? පහතට බසින්නවුන්හට කිමෙක් නම් ශ්‍රෙෂ්ඨද? පයින් යන්නවුන්හට කිමෙක් නම් ශ්‍රෙෂ්ඨද? කියන්නන්හට කිමෙක් නම් ශ්‍රෙෂ්ඨද?"

3. (අන් දෙවියෙක් මෙසේ කීවේය.) "නැගෙන්නවුන් අතුරෙන් ධාන්‍ය බීජය ශ්‍රෙෂ්ඨය. පහත බසින්නවුන් අතුරෙන් වැස්ස ශ්‍රෙෂ්ඨය. පයින් යන්නන් අතුරෙන් ගවයා ශ්‍රෙෂ්ඨය. කියන්නන් අතුරෙන් පුත්‍රයා ශ්‍රෙෂ්ඨය."

4. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "නැගෙන්නවුන් අතුරෙන් ප්‍රඥාව ශ්‍රෙෂ්ඨය. වැටෙන්නවුන් අතුරෙන් අවිද්‍යාව ප්‍රධානය. පයින් යන්නවුන් අතුරෙන් සඞ්ඝයා ශ්‍රෙෂ්ඨය. කියන්නවුන් අතුරෙන් බුදු රජ ශ්‍රෙෂ්ඨය."

---

## 5. භීත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර වර්ණ ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එක් පසෙක සිටි ඒ දේවතාවා භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීයඃ

2. "මහා ප්‍රාඥවූ ගෞතමයන් වහන්ස, ඔබ විසින් මාර්ගයද නොයෙක් කරුණු වශයෙන් වදාරණලදී. ඔබගෙන් විචාරමි. මෙහි නොයෙක් සත්ව සමූහයා කුමකට බියගත්තේද? කිමෙක පිහිටි තැනැත්තේ පරලොවට යන්නේ බිය නොවන්නේද?"

3 (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "බොහෝ කෑම බීම ඇති ගෘහයෙහි වසන තැනැත්තේ

වචනයද, සිතද නිසි පරිදි පිහිටුවා, කයින් පව් නොකරන්නේ, ශ්‍රද්ධාව, මොළොක් බව, බෙදා වැළඳීම, ත්‍යාගවත් බව යන සතර ධර්මයන්හි සිටියේ වේද, (එබඳු) ධර්මයෙහි පිහිටි තැනැත්තේ පරලොවට බිය නොවන්නේය.”

---

## 6. න ජීරති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්මගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන්වහන්සේගේ ඉදිරියෙහි මේ ගාථා කීය.

2. “කිමෙක් නම් දිරාද? කිමෙක් නොදිරාද? කිමෙක් නම් නොමගයයි කියනු ලැබේද? කිමෙක් නම් ධර්මයන්හට උපද්‍රවද? කිමෙක් නම් රෑ දාවල් ගෙවන්නේද? බඹසරට කිලුට කිමෙක්ද? දිය නැති නෑම කිමෙක්ද? යමෙක සිත නොසිටී නම් ලොව එසේවූ සිදුරු කීයෙක්ද? භාග්‍යවතුන් වහන්සේගෙන් විචාරන්නට ආම්හ. එය අපි කෙසේ දැන ගන්නමුද?”

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) “සත්ත්වයන්ගේ රූපය දිරයි. නම් ගොත් නොදිරයි. රාගය නොමග යයි කියන ලදී. ලෝභය ධර්මයන්ට උවදුරය. වයස රෑ දාවල් ගෙවන්නේය. ස්ත්‍රිය පුරුෂයන්ගේ බඹසරට කිලුටෙකි. මෙහි මේ සත්ත්ව සමූහයා ඇලේ. “තපසද බඹසරද යන යමෙක් ඇද්ද, එය දිය නැති නෑමයි. කුශීත (අලස) බවද, ප්‍රමාදයද, වීර්‍ය්‍ය නැති බවද, ශීල සංයමය

නැති බවද, නිදි බහුල බවද, ආගන්තුක අලස බවද යන මොහු ලොව සිත නොසිටිනා සිදුරු සයයි. ඒ සිදුරු සය සර්වප්‍රකාරයෙන් දුරලන්නේය."

---

## 7. ඉස්සර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එක්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථා කීයඃ

2. "ලොව අධිපති බව කිමෙක්ද? බඩු අතුරෙන් කිමෙක් උතුම්ද? ලොව ශාස්ත්‍රයට මලකඩ කිමෙක්ද? ලොව විනාශකාරී කවරේද?

"ගෙන යන කවරකු (මිනිස්සු) වළක්වත්ද? ගෙන යන කවරෙක් වනාහි ප්‍රිය වේද? නුවණැත්තෝ නැවත නැවත එන කවරකු පිළිගනිත්ද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "අණ පැවැත්වීම ලොව අධිපති බවයි. භාණ්ඩ අතුරෙන් ස්ත්‍රී උතුම්. ක්‍රෝධය ලොව ශාස්ත්‍රයට මලකඩයි. සොරු ලොව විනාශකාරීහුයි.

"බඩු ආදිය යමක් ගෙන යන සොරා (මිනිස්සු) වළක්වත්. තමාගෙන් යමක් ගෙන යන මහණ තෙම ප්‍රිය වේ. නුවණැත්තෝ නැවත නැවත එන මහණහු සතුටින් පිළිගනිති."

## 8. කාම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර වර්ණ ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේට ගාථාවකින් (මෙසේ) කීය.

2. "වැඩ කැමැත්තේ කුමක් නොදන්නේද? කුමක් (අනුන්ගේ ප්‍රයෝජනයට) හැර නොදමන්නේද? යහපත්වූ කුමක් නම් මුදන්නේද? ලාමකවූ කුමක් නම් නොමුදන්නේද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "කිසි පුරුෂයෙක් තමා (අන්හට දාස කොට) නොදෙන්නේය. (බෝසතුන් හැර අන්) කිසිවෙක් තමා (සිංහ ව්‍යාඝ්‍රාදීන්ට) හැර නොදමන්නේය. යහපත් වචන මුදා ලන්නේය. ලාමක වචන නොමුදා ලන්නේය."

---

## 9. පාථෙය්‍ය සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එක්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි මේ ගාථා කීයඃ

2. "කිමෙක් නම් මගට වුවමනා දේ බඳීද? භෝගයන් රැස් වන තැන නම් කිමෙක්ද? කිමෙක් නම් සත්ත්වයා ඒ මේ අතට අදීද? ලොව කිමෙක් නම් අපහසුවෙන් දුරලිය යුතුද? මලපුඩුවෙන් (බැඳුණු) කිරිල්ලක සෙයින් කිමෙක්හි බොහෝ සත්ත්වයෝ බැඳුණාහු වෙත්ද?"

3 (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "ශ්‍රද්ධාව සසර මගට වුවමනාදේ බඳී. (සපයයි.) ඓශ්චර්‍ය්‍ය භෝග රැස්වන තැනය. ආසාව සත්ත්වයා ඒ මේ අතට අදී. ආසාව ලොව අපහසුවෙන් දුරලිය යුතු දෑය. මලපුඩුවෙන් (බැඳුණු) කිරිල්ලක සෙයින් බොහෝ සත්ත්වයෝ ආසායෙන් බැඳුණාහු වෙති"

---

## 10. පජ්ජොත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ දෙවියා භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි මේ ගාථා කීයඃ

2. "ලොව පහනක් වැනි වූයේ කිමෙක්ද? ලොව නොනිදා සිටින්නා නම් කවරේද? කර්මයෙහි එක්ව ජීවත්වෙන්නා කවරේද? ජීවිකා වෘත්තිය නම් කිමෙක්ද?"

"මව පුතකු රක්නා සේ අලසයාත් අනලසයාත් කවරෙක් නම් රැකගනීද? යම් ප්‍රාණී කෙනෙක් පොළොව ඇසුරු කළාහු නම්, කුමක් උපකාර කොට ගෙන සත්ත්වයෝ ජීවත් වෙත්ද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක:) "ප්‍රඥාව ලොව පහනක් වැනිය. සිහිය ලොව නොනිදා සිටින්නායි. *කර්මාන්ත ආදියෙහි සහායව ජීවත් වන්නෝ ගවයෝයි. සීසෑම (ගොයිතැන) ජීවිකා වෘත්තියයි. ධනය මව පුතකු රක්නා සේ අලසයාත් අනලසයාත් රකී. පොළොව ඇසුරු කළාවූ යම් සත්ත්වයෝ වෙත්ද ඔවුහු වැස්ස නිසා ජීවත් වෙත්.

---

## 11. අරණ සූත්‍රය.

මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල වනාහි එක්තරා දෙවියෙක් රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි, බබළන ශරීර වර්ණ ඇත්තේ, සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ දේවතාවා භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි මේ ගාථා කීය:

2. "මෙලොව කවුරු නම් කෙලෙස් නැත්තේද? කවුරුන් වුසූ වාසය නොනැසේද? මෙහි කවුරු තණ්හාව පිරිසිඳ දනිත්ද? කාගේ නම් හැම කල්හිම නිදහස් බව වේද? සිල්හි පිහිටි කවරකු මවත් පියාත් සොහොයුරාත් වඳිත්ද? මෙහි ජාතියෙන් පහත්වූ කාට නම් රජහු ආදරයෙන් නමස්කාර කෙරෙත්ද?"

---

* මෙහි පෙළේ වචනය 'ගාවෝ' නොව 'භවෝ' නම් එහි අර්ථය මෙසේ විය යුතුයි. කර්මයෙහි එක්ව ජීවත්වෙන්නා භවයයි. දිවි පවත්වන මාර්ගය (සීහෑම ආදි ක්‍රමයෙන් ලැබෙන) ආහාරයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) “මහණහු මෙලොව කෙලෙස් නැත්තෝය, මහණුන් වුසූ (ආර්‍යමාර්ග) වාසය නොනැසේ. මහණහු (තණ්හාව) පිරිසිඳ දනිත්. හැම කල්හි මහණහුගේ නිදහස් බව වේ. ශීලයෙහි පිහිටි මහණහුට මවත් පියාත් සොහොයුරාත් ආදරයෙන් නමස්කාර කෙරෙති. මෙහි ජාතියෙන් පහත්වූ නමුත් මහණහට රජහුද ආදරයෙන් නමස්කාර කෙරෙත්.”

අටවන ක්ඛත්වා වර්ගයයි.
(දෙවතා සංයුත්තය සමාප්තයි.)

---

## 2. දෙවපුත්ත සංයුත්තය.

## 1. (ප්‍රථම) සුරිය වර්ගය.

### 1. කස්සප සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල කාශ්‍යප දේවපුත්‍රතෙම රෑ පෙරයම ඉක්මගිය පසු බබළන ශරීර වර්ණ ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේය.

එක්පසෙක සිටි කාශ්‍යප දෙව්පුත් තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. “භාග්‍යවතුන් වහන්සේ භික්ෂුව (මෙසේයයි) පැවසූසේක. එහෙත් භික්ෂුවට අනුශාසනය නොපැවසූසේක.”

2. භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේක. “කාශ්‍යපය, එසේ නම් එය ඔබටම වැටහේවා.”

3. (දෙව්පුත් තෙම මෙසේ කීය: “වාක් සුචරිතය පුරුදු කරන්නේය. මහණුන් විසින් වැඩිය යුතුවූ කමටහන්ද

වඩන්නේය. නොහොත් බහුශ්‍රැත මහණුන් ඇසුරු කිරීමද කළයුතු. හුදකලාව ඒකාසනිකාංගයද පුරුදු කරන්නේය. අෂ්ට සමාපත්ති වශයෙන් සිත සංසිඳීමද පුරුදු කරන්නේය.

4. කාශ්‍යප දෙව්පුත් මෙය කීය. භාග්‍යවතුන් වහන්සේ එය මැනවයි අනුමත කළසේක. ඉක්බිති කාශ්‍යප දෙව්පුත් තෙම, "ශාස්තෲන් වහන්සේ මාගේ කීම අනුදත්සේකැ"යි සතුටුව භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණුකොට එහිම අතුරුදහන් වීය.

---

## 2. (දෙවැනි) කස්සප සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි පිහිටි අනේපිඬු සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල කාශ්‍යප දෙව්පුත් තෙම රෑ පළමු දසපැය ඉක්මුණු කල මනා පැහැ ඇත්තාහු සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන්වහන්සේ කරා පැමිණුනාහ. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි කාශ්‍යප දෙව්පුත් තෙම භාග්‍යවතුන් වහන්සේ ඉදිරියේ මේ ගාථාව කීයඃ

2. "රහත් බව කැමැත්තේ නම්, මහණ තෙම ධ්‍යාන කරන්නෙක් විය යුතු (කර්මස්ථාන විමුක්තියෙන්) මිදුණු සිතැත්තෙක් විය යුතු. (සංස්කාර) ලෝකයේ හටගැන්මත් විනාශයත් දැන, මනා සිතැත්තේව, තණ්හා දෘෂ්ටීන් ඇසුරු නොකෙළෙක්ව, ඒ රහත් බව අනුසස් කොට ඇත්තෙක් විය යුතු."

---

## 3. මාස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි මාඝ

(ශක්‍ර) දෙව්පුත් රෑ පෙරයම ඉක්මගිය පසු බබළන ශරීර ශෝභා ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක සිටියේය. එක්පසෙක සිටි මාඝ දෙව්පුත් භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙය කීයඃ

2. "කුමක් නම් නසා සුවසේ සැතපේද? කුමක් නම් නසා ශෝක නොකෙරේද? ගෞතමයන් වහන්ස, කවර නම් එක් දැයෙක විනාශයට සතුටුවහුද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේකඃ) "ක්‍රෝධය නසා සුවසේ සැතපෙයි. ක්‍රෝධය නසා ශෝක නොකෙරේ. ශක්‍රය, දුඃඛ විපාක විෂමූලයක් ඇති, මිහිරිවූ අගක් ඇති, ක්‍රෝධයාගේ විනාශය ආර්‍ය්‍යයෝ ප්‍රශංසා කරත්. එය නසා ශෝක නොකෙරේ."

---

## 4. මාගධ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල වනාහි මාගධ දෙව් පුත් තෙම රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ මාගධ දෙව්පුත් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි ගාථායෙන් (මෙසේ) කීයඃ

2. "යමෙකින් ලොව ආලෝකවත් වේ නම්, එසේවූ පහන් කීයෙක් ලොව වෙත්ද?

භාග්‍යවතුන් වහන්සේගෙන් විචාරන්නට අවුත් සිටිමු. එය අපි කෙසේ දැනගත හැක්කෙමුද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "ලොව පහන් සතරෙකි. මෙහි පස්වැන්නෙක් නැත. දහවල් හිරු බබළයි. රෑ සඳු බබළයි. තවද ගින්න රෑ දවල් දෙක්හිම ඒ ඒ තැන බබළයි. බබළන්නවුන් අතුරෙන් සම්‍යක් සම්බුද්ධ තෙම ශ්‍රෙෂ්ඨයි. මෙම නිරුත්තර ආලෝකයයි."

---

## 5. දාමලි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල වනාහි දාමලි දෙව් පුත් තෙම රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක සිටියේය. එක්පසෙක සිටි ඒ දාමලි දෙව් පුත් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීයඃ

2. "මෙහි (මේ සස්නෙහි) බ්‍රාහ්මණයා (රහත්හු) විසින් අකුසීතව (ප්‍රධන්) වීර්‍ය්‍යය කටයුතුය. කාමයන් දුරලීමෙන් ඔහු භවය නොපතයි."

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "දාමලිය, බ්‍රාහ්මණයා විසින් (රහත්හු විසින්) නැවත කළ යුත්තෙක් නැත. බ්‍රාහ්මණතෙම (රහත් තෙම) ඒකාන්තයෙන් කොට නිමවූ කටයුතු ඇත්තේය. සත්ත්ව තෙමේ ගංගාවෙහි ස්ථිරව සිටීමට තැනක් නොලබන තෙක්ම සියලු ශරීර අවයවවලින් (ගොඩනගින්නට) තැත් කෙරේ. ඔහු ස්ථිරව සිටීමට තැනක් ලැබ බිම සිටගත්තේ (ඉන්පසු) උත්සාහ නොගනී. කවර හෙයින්ද යත්ඃ ඔහු එගොඩ වූයේය, එබැවිනි. දාමලිය, ප්‍රඥා ඇති, ධ්‍යානයෙහි ඇලුණු, ආශ්‍රව නැසූ, පව් බැහැර කළාහට මේ උපමාවෙකි. ඔහු ජාති

මරණ දෙකේ කෙළවරට පැමිණ, ඒකාන්තයෙන් (භව සාගරයේ) පරතෙරට ගියේ, උත්සාහ නොකෙරේ.”

---

## 6. කාමද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල වනාහි කාමද දෙව් පුත්තෙම රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එක් පසෙක සිටි ඒ දෙව් පුත් තෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීයේයඃ

2. එක්පසෙක සිටි කාමද දෙව්පුත් භාග්‍යවතුන් වහන්සේට, “භාග්‍යවතුන් වහන්ස, දුෂ්කරය, අතිශයින් දුෂ්කරය”යි කීය.

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) “කාමදය, ශීලයෙන් යුක්තවූ ස්ථිර සිත් ඇති, ශෛක්ෂයෝ දුෂ්කරවූද මහණදම් කරත්. ගිහිගෙන් වෙන්වූ බවට පැමිණියාහටම සැප ගෙන දෙන ලද දැයෙහි සතුට වෙයි.”

4. “භාග්‍යවතුන් වහන්ස, මේ ලද සිවුපසයෙහි සතුටය යන යමෙක් ඇද්ද, එයද දුර්ලභ දෙයකි.”

5. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) “කාමදය, දිවා රෑ දෙක්හි යම් කෙනෙකුන්ගේ සිත (භාවනායෙහි) ඇලුණේද, සිත සන්සිඳීමෙහි ඇලුණු ඔවුහු දුර්ලභවූ නමුදු ඒ සතුට ලබත්.”

6. “භාග්‍යවතුන් වහන්ස, මේ සිත නම්වූ යමක් ඇද්ද, එය එකඟකිරීම දුෂ්කරය.”

7. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "කාමදය, (චක්ෂුරාදී) ඉන්ද්‍රියයන් සන්සිඳුවීමෙහි ඇලුණෝ එකඟකිරීමට දුෂ්කරවූ නමුදු (සිත) එකඟ කරත්. ඒ ආර්‍ය්‍යයෝ මරහුගේ දැල (කෙලෙස් දැල) සිඳදමා යෙත්."

8. "භාග්‍යවතුන් වහන්ස, මාර්ගය දුකසේ යා යුතුය, විෂමය."

9. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "කාමදය, ආර්‍ය්‍යයෝ දුකසේ යායුතුවූද මාර්ගයෙහි යෙත්. අනාර්‍ය්‍යයෝ යටිකුරුවූ හිස ඇත්තෝ විෂම මාර්ගයෙහි වැටෙත්. මාර්ගය ආර්‍ය්‍යයන්ට සමය. ආර්‍ය්‍යයෝ සම නුවූයෙහි සම වූවෝයි."

---

## 7. පඤ්චාලචණ්ඩ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල වනාහි පඤ්චාලචණ්ඩ දෙව් පුත් තෙම රෑ පළමු දසපැය ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ පඤ්චාල චණ්ඩ දෙව් පුත් තෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීයඃ

2. "මානය දුරු කළවුන්හට ශ්‍රෙෂ්ඨවූ යම් බුද්ධ මුනිවරයෙක් ධ්‍යානය අවබෝධ කෙළේද, මහත් ප්‍රඥා ඇති හෙතෙම අවහිරයෙහි ඉඩ ලැබීය."

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.) "පඤ්චාලචණ්ඩය, නුවණැත්තෝ අවහිරයෙහි පවා (නිවන් පිණිස) ධ්‍යාන ලබත්. යම් කෙනෙක් නිවන් ලබනු පිණිස

සිහිය ලැබුවාහුද, ඔහු හොඳින් (ලෝකෝත්තර) සමාධියෙන් සමාහිත වූවෝය."

---

## 8. තායන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. ඉක්බිත්තෙන් පෙර අත්බැව්හි තීර්ථංකවර සිටි තායන දෙව්පුත් තෙම රෑ මැදුම්යම්හි බබළන ශරීර ප්‍රභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එක්පසෙක සිටි ඒ තායන දෙව්පුත් තෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථා කීය.

2. "බ්‍රාහ්මණය, වීර්‍ය්‍යකොට තණ්හා දියපහර සිඳලව. කාමයන් දුර ලව. මුනිතෙම කාමයන් නොදුරලා ඒකත්වය (ධ්‍යානය) නොලබයි.

3. "ඉදින් කරතොත් මෙය කටයුතුය. මෙය දැඩිකොට කටයුතුය. ඒ එසේමැයි. ලිහිල්කොට ගත් පැවිද්ද වඩ වඩා මත්තෙහි කෙලෙස් දූවිලි විසුරුවයි.

4. "පව් නොකළේ මැනවි. පාපය එය කළාහු පසුව තවයි. යමක් කොට නොපසු තැවේද, එසේවූ පිනම කරන ලදුයේ මැනවි.

5. "වරදවා අල්ලා ගන්නා ලද කුස තණ පත (එය ගත්) අතම යම්සේ සිඳීද, එසේම වරදවා ගත් මහණකම (පැවිද්ද) නිරයට ඇද දමයි.

6. "යම් ලිහිල් මහණකමක් වේද, කිලිටුවූ යම් සීලයක් වේද, යම් සැක කටයුතු බ්‍රහ්මචාරියාවකුත් වේද, එය මහත් ඵල ඇත්තේ නොවේ"

7. තායන දෙව්පුත් මෙය කීය. මෙය කියා භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට එහිම අතුරුදහන් විය.

8. එවිට භාග්‍යවතුන් වහන්සේ ඒ රැය ඉක්ම ගිය පසු භික්ෂූන්ට කථාකළ සේක.

"මහණෙනි, මේ (ගතවූ) රැයෙහි පුරාණ තීර්ථංකරවූ තායන නම් දෙව්පුත් රෑ පෙරයම ඉක්මුණුකල බබළන ශරීරය ඇත්තේ සියලු ජේතවනය බබුළුවා මම් යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ මා වැඳ එක් පසෙක සිටියේය. එක් පසෙක සිටි තායන දෙව්පුත් මා සමීපයෙහි,

"බ්‍රාහ්මණය, වීර්‍ය්‍යකොට තණ්හා දියපහර සිඳ ලව කාමයන් දුරලව. මුනිතෙම කාමයන් නොදුරලා ඒකත්වය ධ්‍යානය නොලබයි.

"ඉදින් කරතොත් මෙය කටයුතුය. මෙය දැඩිකොට කටයුතුය. ඒ එසේමැයි. ලිහිල්කොට ගත් පැවිද්ද වඩ වඩා මත්තෙහි කෙලෙස් දූවිලි විසුරුවයි.

"පව් නොකරන ලද්දේ මැනවි. පාපය එය කළාහු පසුව තවයි. යමක් කොට නොපසු තැවේද, එසේවූ පිනම කරන ලදුයේ මැනැවි.

"වරදවා අල්ලා ගන්නා ලද කුසතණ පත (එය ගත්) අතම යම්සේ සිඳීද, එසේම වරදවා ගත් මහණකම (පැවිද්දා) නිරයට ඇද දමයි.

"යම් ලිහිල් කොට ගත් මහණ කමක්වේද, කිලිටුවූ යම් (ධූතාඞ්ග) ව්‍රතයක්වේද, යම් සැක කටයුතු බ්‍රහ්මචරියාවකුත් වේද, එය මහත්ඵල ඇත්තේ නොවේ"යි කීය.

"මහණෙනි, තායන දෙව්පුත් මෙය කීය. මෙය කියා මා වැඳ පැදකුණු කොට එහිම අතුරුදහන් විය.

"මහණෙනි, තායන දෙව්පුත්ගේ ගාථා උගනිවු. මහණෙනි, තායන ගාථාවන් පුහුණු කරවු. මහණෙනි, තායන ගාථා යහපත

පිණිස වෙති. මාර්ග බ්‍රහ්මචර්‍යාවට ආදිය (මුල) වේයයි” වදාළසේක.

---

## 9. චන්දිම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි චන්දිම *දේවපුත්‍ර තෙම රාහු අසුරිඳු විසින් අල්ලා ගන්නා ලද්දේ විය. එකල චන්දිම දෙව්පුත් තෙම භාග්‍යවතුන් වහන්සේ සිහිකෙරෙමින් ඒ වේලායෙහි මේ ගාථාව කීය.

“බුද්ධවීරයන් වහන්ස, ඔබට නමස්කාර වේවා. ඔබ සියලු තන්හී මිදුණෝය. (මම) පීඩාවට පැමිණියෙම් වෙමි, එසේවූ මට පිහිට වන්න”

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ චන්දිම දෙව්පුත්‍ර අරභයා රාහු අසුරිඳුට (මෙසේ) ගාථායෙන් වදාළහ.

“එම්බා රාහු, චන්දිම තෙම අර්හත්වූ තථාගතයන් සරණ ගියේය. ඒ චන්දිම දෙව්පුත්‍ර අතහරුව. බුදුවරු ලොවට අනුකම්පා කරන්නෝය.”

3. එවිට රාහු අසරිඳු චන්දිම දෙව්පුත්‍ර අතහැර ඉක්මන් ස්වභාව ඇත්තේ වේපචිත්ති අසරිඳු යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, කැළඹුණු සිතැත්තේ, හටගත් ලොමු දහගැනුම් ඇත්තේ, එක් පසෙක සිටියේය. එක් පසෙක සිටි රාහු අසුරිඳුට වේපචිත්ති අසුරිඳු ගාථායෙන් (මෙසේ) කීය.

“එම්බා රාහු, කවර හෙයින් ඉක්මන්ව මෙන් චන්දිම දෙව්පුත්‍ර අත්හැරියෙහිද? කවර හෙයින් කැලැඹුණු ස්වභාව ඇතිව, බියගත්තකු මෙන් සිටින්නෙහිද?”

---

* මෙයින් අදහස් කරන්නේ චන්ද්‍ර මණ්ඩලය නොව චන්දිම නම් දිව්‍ය පුත්‍රයෙකි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. (එවිට රාහු අසුරිඳු මෙසේ කීය:) "බුදුරජුන් විසින් ගාථායෙන් ආමන්ත්‍රණය කරණලද්දෙමි. (ඒ මම) ඉදින් චන්දිම දෙව්පුතු නොමිදුයෙම් නම් මා හිස සත්කඩෙක්ව පැලෙන්නේය. ජීවත්වූවද සැපක් නම් නොලබන්නෙමි."

---

## 10. සූරිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එසමයෙහි සූර්‍ය්‍යදෙව්පුත්* තෙම රාහු අසුරිඳු විසින් අල්ලා ගන්නා ලද්දේ විය. එකල සූර්‍ය දෙව්පුත් තෙම භාග්‍යවතුන් වහන්සේ සිහි කරනුයේ, මේ ගාථාව කීය.

"බුද්ධ වීරයන් වහන්ස, ඔබට නමස්කාර වේවා. ඔබ හැමතන්හි මිදුණෝය. මම පීඩාවට පැමිණියෙම් වෙමි. එසේවූ මට පිහිට වන්න."

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සූර්‍ය්‍ය දෙව්පුතු අරබයා රාහු අසුරිඳුට (මෙසේ) ගාථායෙන් වදාළහ:

"එම්බා රාහු, සූර්‍ය්‍ය දෙව්පුත් තෙම අර්හත්වූ තථාගතයන් සරණ ගියේය. එබැවින් සූර්‍ය්‍ය දෙව්පුතු අතහරුව, බුදුවරු ලොවට අනුකම්පා කරන්නෝය.

"එම්බා රාහු, අන්ධකාරයෙහි යමෙක් එලිය කරන්නේද, බබළන්නේද, මඬුලු සටහන් ඇත්තේද, උග්‍ර තේජස් ඇත්තේද, එසේවූ අහස හැසිරෙන සූර්‍ය්‍යයා නොගිලුව. මගේ ශ්‍රාවක බවට පැමිණි සූර්‍ය්‍යයා අතහරුව"

3. එකල රාහු අසුරිඳු සූර්‍ය්‍ය දෙව්පුතු අත්හැර ඉක්මන් ස්වභාවය ඇත්තේ වේපචිත්ති අසුරිඳු වෙත පැමිණියේය. පැමිණ,

---

* මෙයින් අදහස් කරන්නේ සූර්‍ය්‍ය මණ්ඩලය නොව සූරිය නම් දිව්‍යපුත්‍රයෙකි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කැලැඹුණේ ලොමු දැහැගැනුම් ඇත්තේ එක්පසෙක සිටියේය. එක්පසෙක සිටි රාහු අසුරිඳුට ගාථායෙන් මෙසේ කීය:

"එම්බා රාහු, ඉක්මන්ව මෙන් කවර හෙයින් හිරු දෙව්පුතු අතහැරියෙහිද? කවර හෙයින් කැලඹුණු, ස්වභාවය ඇතිව අවුත් බිය ගත්තකු මෙන් සිටිනෙහිද?'

4. (එවිට රාහු අසුරිඳු මෙසේ කීයේය.) "බුදුන් විසින් ගාථායෙන් ආමන්ත්‍රණය කරණ ලදුයෙමි. ඒ මම ඉදින් සූර්‍ය්‍ය දෙව්පුතු නොමුදාලීම් නම්, මා හිස සත් කඩකට පැළෙන්නේය. ජීවත් වන්නෙම් නම් සැපයක් නම් නොලබන්නෙමි."

ප්‍රථම වර්ගයයි.

---

# 11. අනාථපිණ්ඩික වර්ගය.

## 1. චන්දිමස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි චන්දිමස දෙව්පුත්* තෙම රෑ පෙරයම ඉක්මගිය පසු බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත් පසෙක සිටියේය.

2. එක් පසෙක සිටි ඒ චන්දිමස නම් දෙව්පුත් තෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීයේය:

3. "යම් කෙනෙක් ධ්‍යානයනට පැමිණ, එකඟ සිතැතිව, ප්‍රඥා ඇතිව, සිහි ඇතිව වෙසෙත්ද, ඔහු වනාහි පර්වත දැලක හෝ ගංගා දැලක හෝ වසන මුවන් මෙන් සැපයට පැමිණෙන්නාහ."

4. (එවිට භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේක.)

"යම් කෙනෙක් ධ්‍යාන ලැබ නොපමාව කෙලෙස් නසන්නේද, ඔහු තුමූ නූල් දැලක් බිඳ ගෙන මිදී යන මාලුවෙකු මෙන් පරතෙරට (නිවනට) යන්නාහ."

---

## 2. වෙණ්හු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු වෙණ්හු දිව්‍යපුත්‍ර තෙම බබළන ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක් පසෙක සිටියේය.

2. එක්පසෙක සිටි වෙණ්හු දිව්‍යපුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය.

3. "යම් කෙනෙක් සුගතයන් වහන්සේ ආශ්‍රය කොට නොපමාව ගෞතම ශාසනයෙහි යෙදී ශික්ෂා පුරත්ද, ඒ මනුෂ්‍යයෝ ඒකාන්තයෙන් සැප ඇත්තෝම වෙත්."

4. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.)

"වෙණ්හුවෙනි, යම් කෙනෙක් ධ්‍යානයෙහි ඇලුණෝව මා කී අනුශාසන පදයත් අනුව හික්මෙත්ද, සුදුසු කාලයෙහි නොපමා වන ඔවුහු මරහුට වසඟ නොවන්නාහ."

---

## 3. දීඝලට්ඨි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කලන්දක නිවාප නම්වූ වේළුවනයෙහි වසනසේක. එසමයෙහි දීඝලට්ඨි නම් දිව්‍යපුත්‍ර තෙම රෑ පෙරයම ඉක්මගිය පසු බබළන ශරීර පැහැ ඇත්තේ

සියලු වේළුවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක සිටියේය. එක්පසෙක සිටි දීඝලට්ඨී දේවපුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් (මෙසේ) කීයඃ

2. "මේ රහත් බව අනුසස් කොට ඇති මහණතෙම (ශාසනයෙහි) හෘදය යයි කියනලද රහත් බව පතන්නේ නම්, ධ්‍යානයෙහි ඇලුණෙක් වන්නේය. කෙලෙසුන්ගෙන් මිදුණු සිත් ඇති වන්නේය. සංස්කාරයන්ගේ පහළවීමත්, නැසීයාමත් විදර්ශනා ඥානයෙන් දැන, තණ්හා දෘෂ්ටීන් ඇසුරු නොකෙළෙක් වන්නේය. යහපත් සිත් ඇතියෙක්ද වන්නේය."

---

## 4. නන්දන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි කලන්දක නිවාප නම්වූ වේළුවනයෙහි වසනසේක. එසමයෙහි නන්දන නම් දිව්‍යපුත් තෙම රෑ පෙරයම ඉක්ම ගිය පසු බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු වේළුවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක් පසෙක සිටියේය. එක් පසෙක සිටි ඒ නන්දන දිව්‍යපුත් තෙම භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් (මෙසේ) කීයඃ

2. "මහත් නුවණ ඇති ගෞතමයන් වහන්ස, භගවත්වූ ඔබගේ ඥානදර්ශනය ආවරණ රහිතය. එසේවූ ඔබ අතින් විචාරමි. කෙබන්දකු සිල්වතකුකොට කියත්ද? කෙබන්දකු ප්‍රඥාවන්තයෙකු කොට කියත්ද? කෙබන්දෙක් දුක් ඉක්මවා වෙසේද? කෙබන්දකු දෙවියෝ පුදත්ද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.)

"යමෙක් සිල් ඇත්තේද, නුවණ ඇත්තේද, වඩන ලද සිත ඇත්තේද, සමාධියට පැමිණියේද, ධ්‍යානයෙහි

ඇලුණේද, එළඹ සිටි සිහි ඇත්තේද, ඔහුගේ සියලු ශෝක පහව ගියේද, ප්‍රහීණවීද, (කාමාදී) ආශ්‍රවයන් නැසුයේද, අන්තිම ආත්මය දරන්නේද, එබඳු පුද්ගලයා සිල්වතායයි කියත්, ප්‍රඥාවන්තයා යයි කියත්. එබඳු පුද්ගලයා දුක් ඉක්මවා වෙසේ. එසේවූ තැනැත්තහු දෙවියෝ පුදත්."

---

## 5. චන්දන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි කලන්දක නිවාප නම්වූ වේළුවනයෙහි වසනසේක. එසමයෙහි චන්දන නම් දෙව්පුත් තෙම රෑ පෙරයම ඉක්ම ගිය කල්හි බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු වේළුවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක සිටියේය.

2. එක්පසෙක සිටි චන්දන දෙව්පුත් තෙම භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙසේ කීයඃ

'මෙහි කවරෙක් නම් රෑ දාවල් අනලස්වූයේ සතර ඔඝය (කාමාදී ජලස්කන්ධ සතර) තරණය කොට හැක්කේද? යටින් පය ගසන්ට ආධාරයක් නැති' උඩින් එල්බ ගන්ටද කිසිත් නැති, ගැඹුරු (සතර ඔඝයන්හි) මහවතුරෙහි කවරෙක් නම් කිඳා නොබස්නේද?'

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.)

"හැම කල්හි සම්පූර්ණවූ සිල් ඇති, ප්‍රඥා ඇති, යහපත් සමාධියෙන් යුක්තවූ, සම්පූර්ණකළ වීර්‍ය ඇති, නිවන් කරා යවන ලද සිත් ඇති මහණතෙම තරණයට (ඉක්ම වන්නට) දුෂ්කරවූ (සතර ඔඝය) මහවතුරු ඉක්මවයි."

"යමෙක් කාමසංඥායෙන් පහවූයේද, රූපාරූප සංයෝජන ඉක්මවූයේද, ක්ෂය කළ නන්දිරාගයයි කියන

ලද ත්‍රිවිධ කර්මාභිසංස්කාරයන් ඇත්තේද, එසේවූ (රහත්) පුද්ගල තෙම (ගැඹුරු සතර) මහවතුරෙහි නොකිඳෙයි”

---

## 6. සුදත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කලන්දක නිවාප නම්වූ වේළුවනයෙහි වසන සේක. එසමයෙහි සුදත්ත නම් දෙව්පුත් තෙම රෑ පෙරයම ඉක්ම ගිය පසු බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු වේළුවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියහ. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක් පසෙක සිටියේය.

2. එක්පසෙක සිටි සුදත්ත දෙව්පුත් තෙම භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙසේ කීයඃ

“හුලකින් අනිනු ලැබුවෙකු හුල ගලවා දැමීමට උත්සාහ කරන්නාක් මෙන්ද, ඉසගිනි ගත්තකු නිවා ගැනීමට උත්සාහ කරන්නාක් මෙන්ද, මහණ තෙම කාමරාගය දුරලනු පිණිස සිහි ඇතිව උත්සාහ කරන්නේය.”

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.)

“හුලකින් අනිනු ලැබුවෙකු හුල ගලවා දැමීමට උත්සාහ කරන්නාක් මෙන්ද, ඉස ගිනි ගත්තකු නිවා ගැනීමට උත්සාහ කරන්නාක් මෙන්ද, මහණතෙම සිහි ඇතිව සත්කාය දෘෂ්ටිය වනසනු පිණිස (උත්සාහීව) වසන්නේය.”

---

## 7. සුබ්‍රහ්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි කලන්දක නිවාප නම්වූ වේළුවනයෙහි වැඩවසන සේක. එසමයෙහි සුබ්‍රහ්ම නම් දෙව්පුත්

තෙම රෑ පෙරයම ඉක්ම ගිය පසු බබළන ශරීර ශෝභා ඇත්තේ සියලු වේළුවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක සිටියේය.

2. එක්පසෙක සිටි සුබ්‍රහ්ම දෙව්පුත් තෙම භාග්‍යවතුන් වහන්සේට ගාථායෙකින් මෙසේ කීයඃ

"නූපන් දුක් අරමුණු කොටද, උපන් දුක් අරමුණු කොටද, (මගේ) මේ සිත නිතරම තැති ගත්තේය, මේ සිත නිතර බියෙන් සැලූණේ වෙයි. ඉදින් නොතැතිගත් සිතෙක් ඇත්නම් මවිසින් විචාරන ලද ඔබ එය මට වදාරන්න."

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.)

"(සප්ත) බෝධ්‍යංග වැඩීමෙන් වෙන්ව, තපෝගුණයෙන් වෙන්ව, ඉන්ද්‍රිය සංවරයෙන් (ශීලයෙන්) වෙන්ව, නිවනින් වෙන්ව, සත්නට සුවයක් නොදකිමි."

---

## 8. කකුධ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සාකේත නුවර සමීපයෙහිවූ අඳුන්වන නම් මුව වනයෙහි වැඩ වෙසෙන සේක. එකල්හි වනාහි කකුධ නම් දෙව්පුත් තෙම රෑ පෙරයම ඉක්ම ගිය පසු බබලන්නාවූ ශරීර පැහැ ඇත්තේ සියලු අඳුන්වන බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක් පසෙක සිටියේය.

2. එක්පසෙක සිටි කකුධ දෙව්පුත් භාග්‍යවතුන් වහන්සේගෙන් "ශ්‍රමණය, සතුටු වෙහිදැ?"යි ඇසීය. "ඇවැත්නි, කුමක් ලැබීමෙන්දැ?"යි (භාග්‍යවත්හු ඇසූහ) "එසේනම් ශ්‍රමණය, ශෝක කෙරෙහිදැ?"යි (දෙව්පුත් ඇසීය.) "ඇවැත්නි, ශෝකවන්නට කුමක් දිරාගියේදැ?"යි (භාග්‍යවත්හු ඇසූහ.) "එසේ නම් ශ්‍රමණය, සතුටුත් නොවෙහිද? ශෝකීත්

නොවෙහිදැ?”යි (දෙව්පුත් ඇසී.) “ඇවැත්නි, එසේය”යි (භාග්‍යවතුන් වහන්සේ වදාළහ.)

3. “මහණ, කිම, ඔබ නිදුක්ද? කිම, ඇල්මෙක් නොවේද? කිම, හුදෙකලාව ඉන්නා ඔබ වෙත කලකිරීම නොපැමිණේද?” (දෙව්පුත් ඇසීය.)

4. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.)
“මම් ඒකාන්තයෙන් නිදුක්වෙමි. එසේම ඇල්මෙක්ද මට නැත. එතෙකුදු වුව කලකිරීමද මා නොමැඩලයි.”

5. “මහණ, ඔබ කෙසේ නම් නිදුක්වහුද? ඇල්ම කෙසේ නම් නැත්තෝද? කලකිරුම හුදෙකලාවූ ඔබ කෙසේ නම් නොමැඩලාද?” (දෙව්පුත් ඇසීය.)

6. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.)
“සසර දුකෙහි සිටියාහට තණ්හාව ඒකාන්තයෙන් වෙයි. උපන් තණ්හා ඇත්තහුට ඒකාන්තයෙන් දුක් ඇතිවෙයි. මම්වූ කලී තණ්හා නැති, එහෙයින්ම දුක්ද නැති භික්ෂුවක් වෙමි. ඇවැත්නි, මෙය මෙසේ දැනගන්න”

7. “පව් දුරලූ, කෙළෙස් පිරිනිවනින් නිවුණු, තණ්හාව නැති, දුක් නැති, ලොව ඇල්ම ඉක්මවූ, භික්ෂුවරයකු බොහෝ කලකින් දුටිමි”යි දෙව්පුත් කීයේය.

## 9. උත්තර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි කලන්දක නිවාප නම්වූ වෙළුවනයෙහි වැඩවසන සේක. එසමයෙහි උත්තර නම් දෙව්පුත් තෙම රෑ පෙරයම ඉක්මගිය පසු බබළනා ශරීර ශෝභා ඇත්තේ සියලු වෙළුවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක සිටියේය. එක් පසෙක සිටි උත්තර දෙව්පුත් තෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය.

2. "ජීවිතය ගෙවෙයි. ආයු මඳය. ජරාවට එළඹියා හට එය වළකාලිය හැකි රැකවරණෙක් නැත. මේ මරණ භය සලකා සුව ගෙනදෙන පින් කටයුතු."

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.)

"ජීවිතය ගෙවෙයි. ආයු මඳය. ජරාවට පැමිණියාහට රැකවරණය නැත. මේ මරණ භය සලකා නිවන් කැමැත්තේ ලෞකික ආශාව දුරු කටයුතුය."

---

## 10. අනාථපිණ්ඩික සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු අනේපිඬු දෙව්පුත් බබළන ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය.

2. එක්පසෙක සිටි අනේපිඬු දෙව්පුත් තෙම භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථා කීය.

"ඍෂි සමූහයා විසින් නිතර සෙවනය කරන ලද ධර්ම රාජයන් වහන්සේ විසින් විසුම් ගත් මේ ජේතවනය මට ප්‍රීති උපදවන්නේය.

"කර්මයද, ප්‍රඥාවද, සමාධියද, උතුම්වූ සිල්වත් ජීවිතයද යන මෙයින් සත්ත්වයෝ ශුද්ධ වෙති. ගෝත්‍රයෙන් හෝ ධනයෙන් හෝ ශුද්ධවීමෙක් නැත.

"එබැවින් නුවණැති, තමාගේ දියුණුව දක්නා පුරුෂයා ධර්මය නුවණින් විමසා බැලියයුතු. මෙසේ එහිලා ඔහු පිරිසුදු වේ.

"ප්‍රඥායෙනුත්, ශීලයෙනුත්, කෙලෙස් සංසිඳුවීමෙනුත්, සැරියුත් තෙරණුවෝම ශ්‍රාවකයන් අතුරෙහි වැඩී සිටියෝය.

පරතෙර පත් (නිවන් ලත්) යම් භික්ෂුවරයෙක් වේ නම් ඔවුන් අතුරෙන් මේ සැරියුත් තෙරුන්වහන්සේම උතුම්.”

3. අනේපිඬු දෙව්පුත් තෙම මෙය කීය. මෙය කියා භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට එහිම නොපෙනී ගියේය.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රැය ඇවෑමෙන් භික්ෂූන් ඇමතූසේක. “මහණෙනි, මේ රෑ එක්තරා දිව්‍ය පුත්‍රයෙක් රැය බොහෝ ගතවූ පසු බබළන ශරීර ප්‍රභා ඇත්තේ මුළු ජේතවනය බබුළුවා මා වෙත පැමිණියේය. පැමිණ, මා වැඳ, එක්පසෙක සිටියේය. එක්පසෙක සිටියේම ඔහු මා සමීපයෙහි,

“ඍෂි සමූහයා විසින් නිතර සේවනය කරන ලද ධර්මරාජයන් වහන්සේ විසින් විසූම් ගත් මේ ජේතවනය මට ප්‍රීති උපදවන්නේය.

“කර්මයද, ප්‍රඥාවද, සමාධියද, උතුම්වූ සිල්වත් ජීවිතය යන මෙයින් සත්වයෝ ශුද්ධ වෙති. ගෝත්‍රයෙන් හෝ ධනයෙන් හෝ ශුද්ධවීමෙක් නැත.

“එබැවින් නුවණැති, තමාගේ දියුණුව දක්නා පුරුෂයා ධර්මය නුවණින් විමසා බැලිය යුතු. මෙසේ එහි ලා ඔහු පිරිසිදු වේ.

“ප්‍රඥායෙනුත්, ශීලයෙනුත්, කෙලෙස් සංසිඳුවීමෙනුත්, සැරියුත් තෙරුණුවෝම ශ්‍රාවකයන් අතුරෙහි වැඩි සිටියෝය. පරතෙර පත් (නිවන් ලත්) යම් භික්ෂුවරයෙක් වේ නම් ඔවුන් අතුරෙන් මේ සැරියුත් තෙරුන් වහන්සේම උතුම්යයි කීය.

5. මහණෙනි, ඒ දෙව්පුත් මෙසේ කීය. මෙසේ කියා මා වැඳ, පැදකුණු කොට එහිම නොපෙනී ගියේය.”

6. මෙසේ වදාළවිට ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම “ස්වාමීනි, ඒකාන්තයෙන් ඔහු අනේපිඬු දෙව්පුතු විය යුතුය.

අනේපිඬු ගෘහපති තෙමේ ආයුෂ්මත් සැරියුත් තෙරුන් වහන්සේ කෙරෙහි වෙසෙසින් පැහැදුණෙක් විය, එබැවිනි”යි කීයේය.

7. “ආනන්දය, මැනවි, මැනවි. ඔබ විසින් සිතීමෙන් යම්තාක් පැමිණිය යුතු නම්, ඒතාක්ම පැමිණිණ. ආනන්දය, ඒ දෙව්පුත් අනාථපිණ්ඩිකමය”යි (භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.)

දෙවෙනි අනාථපිණ්ඩික වර්ගයයි.

---

## 3. නානාතිත්ථීය වර්ගය.

### 1. සිව සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු සිව දිව්‍යපුත්‍ර තෙම බබළන ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඒ සිව දේවපුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථා කීය.

2. “සත්පුරුෂයන් සමගම විසිය යුතුයි. සත්පුරුෂයන් හාම මිතුරුකම් කළ යුතුයි. සත්පුරුෂයන්ගේ ධර්මය දැන එය පිළිපදින්නාහට අභිවෘද්ධිය වෙයි. කිසිදු අවැඩෙක් නොවෙයි.

“සත්පුරුෂයන් සමගම විසිය යුතුයි. සත්පුරුෂයන් සමග මිතුරුකම් කළ යුතුයි. සත්පුරුෂයන්ගේ ධර්මය දැන පිළිපදින්නහුට ප්‍රඥාව ලැබේ. අන් කෙනෙකුන්ගෙන් ප්‍රඥාව නොලැබේ.

“සත්පුරුෂයන් සමගම විසිය යුතුයි. සත්පුරුෂයන් සමගම මිතුරුකම් කළ යුතුයි. සත්පුරුෂයන්ගේ සද්ධර්මය දැන පිළිපදනේ ශෝක වස්තු මැද ශෝක නොකෙරේ.

"සත්පුරුෂයන් සමගම මිතුරුකම් කළ යුතුයි. සත්පුරුෂයන්ගේ ධර්මය දැන පිළිපදින්නේ නැයන් මැද බබළයි.

"සත්පුරුෂයන් සමගම විසිය යුතුයි. සත්පුරුෂයන් හාම මිතුරුකම් කළ යුතුයි. සත්පුරුෂයන්ගේ ධර්මය දැන සත්වයෝ ස්වර්ගයට යෙත්.

"සත්පුරුෂයන් සමගම විසිය යුතුයි. සත්පුරුෂයන් හාම මිතුරුකම් කළයුතුයි. සත්පුරුෂයන්ගේ ධර්මය දැන පිළිපැදීමෙන් සත්ත්වයෝ බොහෝ කල් සුවසේ සිටිත්."

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සිව දිව්‍යපුත්‍රයාට මෙසේ පෙරළා වදාළසේක:

"සත්පුරුෂයන් සමගම විසිය යුතුයි. සත්පුරුෂයන් හාම මිතුරුකම් කළ යුතුයි. සත්පුරුෂයන්ගේ සදහම් දැන පිළිපදනේ සියලු දුකින් මිදේ."

---

## 2. ඛෙම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු ඛෙම දෙව්පුත් බබළන ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය.

2. එක්පසෙක සිටි ඒ ඛෙම දෙව්පුත් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථා කීය:

"යම් කර්මයෙක් නපුරු විපාක ඇත්තේද අනුවණ බාලයෝ එසේවූ පව්කම් කරන්නාහු තමන්ට සතුරකු වැනි ආත්මභාවයෙන් යුතුව හැසිරෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"යමක් කිරීමෙන් පසුතැවේද, කඳුළු පෙරෙන මුහුණ ඇතිව යම් කර්මයෙක නපුරු විපාකය විඳීද, එසේවූ පාප කර්මය නොකිරීම යහපති.

"යමක් කිරීමෙන් එය කළ තැනැත්තේ නොපසු තැවේද, පිනා ගියෙක්ව සතුට ඇතිව යමෙක විපාක සැපය විඳීද, එසේවූ කුසල් කිරීම යහපති

"යමක් තමහට වැඩ සලසතැයි දන්නේද, එය පළමුවෙන්ම කළයුතු ඥානවන්තයා ගැල් පදවන්නා මෙන් නොදැගලිය යුතු.

'ගැල් පදවන්නා සම මාර්ගයවූ මහාමාර්ගය හැර විෂම මඟට නැග ගොස් කැඩුණු කඩඇණය ඇතියේ යම්සේ සිතිවිලි සිතාද, එපරිද්දෙන් අඥානතෙම දහමින් වෙන්ව අදහම් අනුව ගොස්, මරුමුවට පැමිණියේ කඩඇණය සුන් ගැල්කරු සේ සිතිවිලි සිතයි."

---

## 3. සේරී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු සේරී දිව්‍යපුත්‍ර තෙම බබළන ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක සිටියේය.

2. එක්පසෙක සිටි ඒ සේරී දිව්‍යපුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙසේ කීය.

"දෙව් මිනිස් දෙකොටසම ඒකාන්තයෙන් ආහාර කැමති වෙත්. එසේ කල්හි ආහාර කැමති නොවනුයේ කුමන යකෙක්ද?

3. (දෙව් පුත්:) ස්වාමීනි පුදුමයි, ස්වාමීනි ඉතා පුදුමයි, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් කොතරම් මනාකොට වදාරණ ලද්දේ ද?

(එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.)

"යම් කෙනෙක් ශ්‍රද්ධාවෙන්, හොඳින්, පැහැදුන සිතින් ආහාර දෙද්ද. ඒ ආහාරයේ විපාකය මෙලොවදීත් පරලොවදීත් එය දුන් දායකයන් කරාම පැමිණේ.

"එබැවින් මසුරු මල දුර ලන්නේය. (දුර ලියයුතු) මසුරු මල දුරුකළ කෙනෙක්ව දන් දෙන්නේය. පරලොවදී සත්වයාට පිහිට නම් පින්ය."

4. ස්වාමීනි, පෙරවූවක් කියමි. මම (පෙර) දන් දෙන (දායක්වූ) දානපතිවූ, දීමෙහි ගුණ කියන, සේරී නම් රජෙක් වීමි. ස්වාමීනි, ඒ මගේ (නුවර) සතර දොරෙහි මහණ, බමුණු, දුගී, මගී, පුලන්නන්, යාචක යන මොවුන්ට දන් දෙනු ලැබීය.

5. ස්වාමීනි, ඉක්බිති ස්ත්‍රී නිවාසයෙහි වසන ස්ත්‍රීහු මා කරා පැමිණ 'දේවයන් වහන්සේගේ දානය නම් දෙනු ලැබේ. අපගේ දානයෙක් නොදෙනු ලැබේ. අපිත් දේවයන්වහන්සේ නිසා දන් දෙන්නට ලබන්නමෝ නම්, පින් කරන්නට ලබන්නමෝ නම්, ඒ යහපතැ'යි කීවාහුය.

6. ස්වාමීනි, ඒ (ඇසූ) මට මේ සිත විය: 'මම් දායකයෙක්මි, දීමේ ගුණ කියන්නෙමි, දන් දෙන්නෙමුයි කියන්නවුන්ට කුමක් නම් කියම්ද? ස්වාමීනි. ඒ මම් (නුවර) පළමු දොර ස්ත්‍රී නිවාසයෙහි ස්ත්‍රීන්ට පැවරීමි. ස්ත්‍රී නිවාසයෙහි ස්ත්‍රීන්ගේ දානය දෙන ලද්දේය. මගේ දානය නැවතිණ.

7. ඉක්බිති, ස්වාමීනි, සේවක ක්ෂත්‍රියයෝ මා වෙත පැමිණ, 'දේවයන්වහන්සේගේ දානය නම් දෙනු ලැබේ. ස්ත්‍රී නිවාසයේ ස්ත්‍රීන්ගේද දන් දෙනුලැබේ. අපගේ වූකලී දානයෙක් නොදෙනු ලැබේ. අපිදු දේවයන්වහන්සේ ඇසුරු කොට දන් දියහැකි වන්නමෝ නම් පින් කළ හැකි වන්නමෝ නම් යහපතැ'යි මෙ බස් කීහ.

"ස්වාමීනි, එය ඇසූ මට මේ සිත විය: 'මම් වූ කලී දායකයෙක්මි, දානපතියෙමි, දීමේ ගුණ කියන සුල්ලෙමි. දන් දෙන්නෙමුයි කියන්නවුන්ට කෙසේ නම් කියන්නෙම්ද? ස්වාමීනි, ඒ මම් වනාහි දෙවෙනි දොර සේවක ක්ෂත්‍රියයන්ට දිනිමි. (එවිට) එහි සේවක ක්ෂත්‍රියයන්ගේ දානය දෙන ලදී. මගේ දානය නැවතිණ.

8. "ස්වාමීනි, ඉක්බිති බලසෙනග මා වෙත පැමිණ දේවයන් වහන්සේගේ නම් දානය දෙවේ. ස්ත්‍රීනිවාස ස්ත්‍රීන්ගේත් දානය දෙනු ලැබේ. අපේ දානයක් නොදෙනු ලැබේ. අපිත් දේවයන් වහන්සේ නිසා දන්දෙනු හැකිවන්නමෝ නම් පින්කළ හැකිවන්නමෝ නම් යහපතැ'යි මෙබස් කීහ.

"ස්වාමීනි, ඒ මට මෙසේ සිත් විය: 'මම් වූකලී දායකද, දානපතිද, දීමේ ගුණ කියන්නෙක්ද වෙමි. දන් දෙන්නෙමුයි කියන කල්හි කුමක් නම් කියන්නෙම්ද?' ස්වාමීනි, ඒ මම තෙවෙනි දොර බලසෙනඟට දිනිමි. එහි බලසෙනඟගේ දන දෙන ලදී. මගේ දන නැවතිණ.

9. "ස්වාමීනි, එයින් පසු බමුණෝත් ගෘහපතියෝත් මා වෙත පැමිණ, දේවයන් වහන්සේගේ නම් දන දෙනු ලැබේ. ස්ත්‍රීනිවාස ස්ත්‍රීන්ගේත් දන දෙනු ලැබේ. සේවක ක්ෂත්‍රියයන් ගේත් දනද දෙනු ලැබේ. බලසෙනඟගේත් දන දෙනු ලැබේ. අපේ දනෙක් නොදෙනු ලැබේ. යහපත, අපිත් දේවයන් වහන්සේ නිසා දන් දෙනු හැකිවන්නමෝ නම් පින් කළ හැකිවන්නමෝ නම් යහපතැ'යි මෙබස් කීහ.

"ස්වාමීනි, ඒ මට මේ සිත විය. 'මම් වූකලී දායකද, දානපතිද, දානයේ ගුණ කියන්නෙක්ද වෙමි. ඒ මම් 'දන් දෙන්නෙමු' යි කියන්නවුන්ට කුමක් නම් කියන්නෙම්ද?' ස්වාමීනි, ඒ මම් සතරවන දොර බමුණන්ටත් ගෘහපතීන්ටත් දුනිමි. එහි බමුණන්ගේත් ගැහැවියන්ගේත් දන දෙන ලදී. මගේ දන නැවතිණ.

10. "ස්වාමීනි, ඉක්බිති (මගේ) රාජපුරුෂයෝ මා වෙත පැමිණ, 'දැන් වනාහි දේවයන් වහන්සේගේ දනෙක් කිසිම තැනෙකත් නොදෙනු ලැබේ' යයි කීහ.

"මෙසේ කියනු ලැබූ මම 'ස්වාමීනි, ඒ රාජපුරුෂයින්ට මෙසේ කීවෙමි. 'එසේ නම් බැහැර දනව්වල යම් ආදායමෙක් උපදීද, එයින් හරි අඩක් ඇතුළු නුවරට ඇතුල්කරව්. අඩකින් එහිම මහණ, බමුණු, දුගී, මගී, යදියනට දන්දෙවු' යයි කීමි.

11. "ස්වාමීනි, ඒ මම පින් මෙතෙකැයි කියා හෝ, පින්පල මෙතෙකැයි කියා හෝ, ස්වර්ගයෙහි මෙතෙක් කල් සිටිය යුතුයයි කියා හෝ, මෙසේ දික් කලක් කළ පින්වල, මෙසේ දික් කලක් කළ කුසල්වල කෙළවරකට නොපැමිණෙමි.

12. "ස්වාමීනි, පුදුමයි! ස්වාමීනි, ඉතා පුදුමයි! හොඳින් පැහැදුන ශ්‍රද්ධා සිතින් ආහාර දෙද්ද, එහි විපාක මෙලොවදීත් පරලොවදීත් එය දුන් දායකයන් කරාම පැමිණේ.

'එබැවින් මසුරුමල දුරලන්නේය. (දුරලිය යුතුය.) මසුරු මල දුරුකළ කෙනෙක්ව දන් දිය යුතුය. පරලොවදී සත්වයාට පිහිට වනුයේ පින්ය.'

---

## 4. සටිකාර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ ජේතවනාරාමයෙහි වැඩවසනසේක. එකල්හි වනාහි සටීකාර දිව්‍යපුත්‍ර තෙම රෑ පෙරයම ගෙවුණුපසු බබළන ශරීර පැහැ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක සිටියේය. එක්පසෙක සිටි ඒ සටීකාර දේවපුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථා කීය.

2. ස්වාමීනි, භික්ෂූන් සත් නමක් අවිහ බඹලොවට (උත්පත්ති වශයෙන්) පැමිණියාහු. කෙලෙසුන්ගෙන් මිදුණෝ, රාග ද්වෙෂයන් නැසුවෝ, ලොව ඇල්ම තරණය කළහ."

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.)

"කෙලෙස් මඩ ඇති, තරණයට දුෂ්කරවූ, සංසාරවර්තය ඒ කවර කෙනෙක් නම් තරණය කළෝද? කවුරු නම් මිනිස් කය හැර දිව්‍යයෝගය ඉක්මවාලූවෝද?"

4. (ඝටීකාර බ්‍රහ්මයා මෙසේ කීය.) "උපක ද, පලගණ්ඩ ද, පුක්කුසාති ද යන මොවුන් තුන්දෙනාත්, භද්දිය ද, ඛණ්ඩදේව ද, බාහුරග්ගි ද, පිඞ්ගිය ද යන මොවුන් මනුෂ්‍ය දේහය හැර, දිව්‍යයෝගය ඉක්මවූහ."

5. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.)

"මරහුගේ මළපුඩුව දුරලූ ඔවුන්ගේ ගුණ ඔබ කීයෙහිය. ඔවුහු කාගේ ධර්මයක් දැනගෙන සසර බැම්ම සිඳලූහුද?"

6. "ඔවුහු යමෙකුගේ ධර්මය දැන සසර බැම්ම සින්දෝ නම්, ඒ භාග්‍යවතුන්ගේ මිස අනෙකෙකුගේ නොවේ. ඔබගේ ශාසනය මිස අනෙකක් නොවේ.

"යම් තැනෙක්හි සියලු නාමයත්, සියලු රූපයත් නිරුද්ධ වේද, ඒ (නිර්වාණ) ධර්මය ඔවුහු මේ සස්නෙහි දැන සසර බැම්ම සින්දහ"යයි ඝටීකාර බ්‍රහ්මයා කීය.

7. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.)

"දුකසේ දතයුතු අර්ථ ඇති, දුකසේ අවබෝධ කටයුතු අර්ථ ඇති, ගැඹුරු වචනයක් කීයෙහි. ඔබ කාගේ ධර්මයක් දැනගෙන මෙබඳු වචනයක් කීයෙහිද?"

8. (ඝටීකාර බ්‍රහ්මයා මෙසේ කීය) "මම පෙර වේහලිඞ්ග ගම වළන්සාදන (ඝටීකාර නම්) කුඹලෙක් වීමි. මවුපියන් රැක බලා ගන්නා ඒ මම් කාශ්‍යප ශාස්තෲන් වහන්සේගේ උපාසකයෙක් වීමි.

"මෛථුන සේවනයෙන් වැළකුණෙක් වීමි. නිරාමිෂ බ්‍රහ්මචාරී (හෙවත් අනාගාමි) වීමි. ඔබ හා එකම ගම වසන්නෙක්වීමි. ඒ පෙර ආත්මබවයේ ඔබගේ යහළුවාවීමි.

"ඒ මම රාග, ද්වෙෂ, මොහ ක්ෂය කළ ලොව තණ්හාව ඉක්මවූ, කෙලෙසුන්ගෙන් මිදුණු මේ භික්ෂූන් සත්දෙනම දනිමි."

**9.** (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.)

"කුම්භකාරය, ඔබ යම්සේ කීයෙහිද එසේම එය විය. පෙර ඔබ වේහලිඞ්ග ගම වළන් සාදන (ඝටීකාර නම්) කුඹලෙක් වූයෙහි. මවුපියන් රක්නෙක් වූයෙහි. කාශ්‍යප ශ්‍රාවකවූ උපාසක වූයෙහි.

"මෛථුන ධර්මයෙන් වැළකුණු, නිරාමිෂ බ්‍රහ්මචාරී වූයෙහි. මගේ ගමෙහි වැසියෙක් වූයෙහි. පෙර මගේ මිත්‍රයා වූයෙහි"

**10.** (මෙසේ භාවනාවෙන් වැඩූ සිතැති, අන්තිම සිරුරු දරන යහළුවන් දෙදෙනාගේ මේ සංගමය විය.)

---

## 5. ජන්තු සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක කොසොල් රට හිමවත් පෙදෙස ආරණ්‍ය කුටියෙක බොහෝ භික්ෂූහු උඩගුව, ඔසවාගත් මාන නළ ඇතිව, චපලව, පාත්‍රසිවුරු සැරසීමෙහි යෙදුණෝව, මුඛරිව, කටට ආ ආවක් දොඩනසුලුව, මුළාවූ සිහි ඇතිව, ප්‍රඥායෙන් වෙන්ව, නොඑකඟ සිතැතිව, වෙසෙති.

**2.** එකල්හි වනාහි ජන්තු නම් දෙව්පුත් ඒ පසළොස්වක් පොහෝදා ඒ භික්ෂූන් කරා පැමිණියේය. පැමිණ, ඒ භික්ෂූන්ට ගාථාවලින් මෙසේ කීයඃ

"පෙර ගෞතම ශ්‍රාවකවූ භික්ෂූහු තණ්හාව නැතිව පිඬු සොයන්නාහු, තණ්හාව නැතිව සෙනසුන් සොයන්නාහු, සුවසේ දිවි පවත්වන්නෝ වූහ. ලොව අනිත්‍යතාව දැන ඔවුහු දුක් කෙළවර කළහ.

'එහෙත් දැන් ඇතැම් භික්ෂූහු තමන් දායකයන් විසින් ලෙහෙසියෙන් පෝෂිත කළ නොහැක්කවුන් කොට ගෙන ගමෙහි ගම්දෙටුවන් සේ අන් ගෙවල්හි කකා මුළාව නිදත්.

"සංසයාට ඇඳිලි කොට (වැඳ) කියමි. මෙහි ඇතැම් පැවිදි කෙනෙක් ඈතට තුමූම නෙරපුණේ (එහෙයින්) අනාථවූයේ, සොහොනෙහි දමා ගිය මළසිරුරු බඳු වෙත්.

"යම් කෙනෙක් වනාහි පමාව වෙසෙත්ද, ඔවුන් සඳහා මෙය මා විසින් කියනලදී. යම් කෙනෙක් නොපමාව වෙසෙත්ද, ඔවුන් හැමට මම නමස්කාර කෙරෙමි."

---

## 6. රොහිතස්ස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ ජේතවනයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවනලද ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු රොහිතස්ස දෙව්පුත්තෙම බබළන ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක උන්නේය. එක් පසෙක සිටි රොහිතස්ස දෙව්පුත්තෙම භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මෙසේ කීය.

2. "ස්වාමීනි, යම් තැනෙක නොඋපදී නම්, මහළු නොවේ නම්, චුත නොවේ නම්, නැවත නොඋපදී නම්, එසේවූ ඒ ලෝක කෙළවර දැනගන්නට හෝ දැකගන්නට හෝ එහි යාගන්නට හෝ හැකිද?"

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.)
"ඇවැත්නි, යම් තැනෙක්හි ඉපැද්මෙක් නැද්ද, ජරාවෙක් නැද්ද, මරණයෙක් නැද්ද, චුතවීමක් නැද්ද, මැරී නැවත ඉපදීමෙක් නැද්ද, ඒ ලෝකාන්තය ගමනෙකින් දත හැක්කැයි, දැක්ක හැක්කැයි, එහි යාගත හැක්කැයි මම් නොකියමි."

4. "ස්වාමීනි, 'යමෙක්හි ඉපදීමෙක්, ජරායෙක්, මරණයෙක්, චුතවීමෙක්, නැවත ඉපදීමෙක් නැත්නම් එය ගමනින් දතහැක්කැයි නොකියමි'යි මෙය භාග්‍යවතුන් වහන්සේ විසින්

කොතරම් හොඳින් වදාරණ ලදද? ස්වාමීනි, ආශ්චර්යයි! ස්වාමීනි, පුදුමයි!

5. "ස්වාමීනි, පෙර මම් ඍද්ධිමත්, අහසින් යත හැකි, භෝජපුත්‍රවූ රෝහිතස්ස නම් ඍෂියෙක් වීමි. දුනු ශිල්පය උගත්, විදීමෙහි මනා පුරුදු බව ඇති, අන් දුනුවායන් හා කළ ද්වන්ද්ව යුද්ධ ඇති, රාජාදීන් හමුයෙහි දැක්වූ ශිල්ප ඇති, මහත්ම දුන්නක් අතගත් දුනුවායෙක් හැල්ලු ඊයෙකින් ගැහැටක් නැතිවම යම්සේ තල්ගසෙක සෙවනැල්ල ඉක්මවාලිය හැකි වන්නේද, එබඳුවූ ගමන් වේගයෙක් මට විය.

6. 'පෙරදිග මුහුදින් අවරදිග මුහුද යම් පමණ දුරද, ඒ මගේ එපමණ දුරින් පිය ඔසවා තැබීමෙක් වීය. ඒ මට ලොව කෙළවරට ගමනින් පැමිණෙන්නෙමියි' ආශාවෙක් විය.

7. "ස්වාමීනි, ඒ මම් මෙබඳු ජවයෙන්ද, මෙබඳු පිය ඉක්මවා තැබීමෙන්ද, සමන්විත වූයෙමි, කන බොන වේලාවල් හැර, මලමූත්‍ර පහකරන වේලාවල් හැර, නිදාගන්නා විඩා දුරු කරනා වේලාවල් හැර, හවුරුදු සියයක් ආයු ඇත්තෙම්, අවුරුදු සියක් ජීවත්වන්නෙම්, අවුරුදු සියක්ම ඍද්ධිමය ගමනින් ගොස්ද ලොව කෙළවරට නොපැමිණ අතර (මග) දීම මැරුණෙමි.

8. 'පුදුමයි! ස්වාමීනි, ඉතා පුදුමයි! ස්වාමීනි, 'යමෙක ජාතියෙක්, ජරාවෙක්, මරණයෙක්, චුතවීමෙක්, මැරී නැවත ඉපදීමෙක් නැත්නම් ඒ ලෝක කෙළවර ගමනින් දතහැක්කැයි, දැක්කහැක්කැයි, පැමිණිය හැක්කැයි නොකියමි'යි භාග්‍යවතුන් වහන්සේ වදාළා කොතරම් සරිද!"

9. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.)

"එතෙකුදු වුවත් ඇවැත්නි, ලොවේ කෙළවරට නොපැමිණ, දුක් කෙළවර කිරීමක් මම් නොකියමි. තවද ඇවැත්නි සංඥා සහිතවූ, සිත සහිතවූ, බඹයක් තරම්වූ මේ ආත්ම භාවයෙහිම ලෝකයත්, ලෝකසමුදයයත්, ලෝකනිරෝධයත්, ලෝක නිරෝධගාමී ප්‍රතිපත්තියත් පණවමි."

10. "ලොව කෙළවරට ගමනෙකින් කිසි කලෙකත් පැමිණිය නොහැක්ක. ලොව කෙළවරට නොපැමිණත් දුකින් මිදීමෙක් නැත.

"එබැවින් ලොව දන්නා, මනා නුවණැති, (සංස්කාර) ලෝකයේ කෙළවරට ගිය, වැස නිමවූ මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යාව ඇති, කෙලෙසුන් සංසිඳුවාලූ (රහත්) පුද්ගලතෙමේ (සංස්කාර) ලෝකයේ කෙළවර දැන, මෙලොවද, පරලොවක්ද නොපතයි.

---

## 7. නන්ද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්මගිය පසු නන්ද දෙව්පුත්තෙම බබළන ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඒ දෙව්පුත් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

2. "කාලයෝ ඉක්මයෙත්. රාත්‍රීහු මරණයට පමුණුවත්. වයස් රාශීහු පිළිවෙළින් හැර යෙත්. මේ භය මරණ ලා දක්නේ සැප ගෙන දෙන පින්කරන්නේය."

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.)

"කාලයෝ ඉක්මෙත්. රාත්‍රීහු මරණයට පමුණුවත්. වයස් රාශීහු පිළිවෙළින් හැර යෙත්. මේ මරණ භය සලකන්නේ පරම ශාන්තිය පතා ලෞකික ආශාව දුරලන්නේය."

---

## 8. නන්දිවිසාල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවනයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවනලද ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි රෑ පෙරයම ඉක්ම ගිය පසු නන්දිවිසාල දෙව්පුත් තෙම බබළන ශරීර වර්ණ ඇත්තේ මුළු ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්නේය. එක්පසෙක සිටි ඒ නන්දිවිසාල දෙව්පුත් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි මේ ගාථාව කීය.

> 2. "මහා වීරයන්වහන්ස, රෝද සතරක් ඇති, දොර නවයක් ඇති, අසූචියෙන් පිරුණු ලෝභයෙන් යුක්තවූ, මඩෙන් උපන් ශරීර යානයාගේ මිදී යෑම කෙසේ වන්නේද?"
>
> 3. (භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේක.) "බද්ධ වෛර නමැති ලනුවද, (සෙසු කෙලෙස් නමැති) වරපටද, නොලත් දෙයෙහි ආශාවද, ලත් දැයෙහි ආශාවද සිඳ දමා (අවිද්‍යා නමැති) මුල සහිත තණ්හාව උදුරා දැමීමෙන් මෙසේ ශරීර යානයාගේ මිදීයෑම වන්නේය."

---

## 9. සුසිම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. ඉක්බිත්තෙන් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියහ.

3 පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක ඉඳගත්තේය. එක්පසෙක උන් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්

වහන්සේට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. "ආනන්දය, ශාරීපුත්‍ර තෙම තොපටත් රුස්නේද?"

4. "ස්වාමීනි, බාල නොවූ දුෂ්ට නොවූ මූඪ නොවූ නොපෙරළුණු සිතැති කාහට නම් ආයුෂ්මත් ශාරීපුත්‍රයාණෝ නොරුස්නෝද? ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයාණෝ පණ්ඩිතයහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ මහාප්‍රාඥයහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ විශාල (පළල්) ප්‍රාඥයහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ බහුල ප්‍රඥාවෙන් යුක්තයහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ ජවන (වේලාවත්) ප්‍රඥාවෙන් යුක්තයහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ තීක්ෂණ ප්‍රාඥයහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ නිර්වෙධි (සංස්කාරයන්හි කළකිරීම් බහුලවූ) ප්‍රඥාවෙන් යුක්තයහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ (ත්‍රිවිධ) විවේකයෙන් තනිවූහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ කුලයන් හා නොගැටුණහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ සම්පූර්ණ කළ වීර්‍ය්‍ය ඇත්තෝය. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ දක්ෂ කථිකයහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයාණෝ අවවාද ඉවසන සුල්ලෝය. ස්වාමීනි, ආයුෂ්මත් ශාරිපුත්‍රයෝ දොස් පෙන්වන්නාහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ පාපය පිළිකුල් කරන්නාහ. ස්වාමීනි, බාල නොවූ දුෂ්ට නොවූ මූඪ නොවූ නොපෙරළුණු සිත් ඇති, කාට නම් ශාරීපුත්‍රයෝ නොරුස්නෝද?"

5. (එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "ආනන්දය, ඒ එසේය. ආනන්දය, ඒ එසේය. ආනන්දය, බාල නොවූ, දුෂ්ට නොවූ, මූඪ නොවූ, විපර්‍ය්‍යාසවූ සිත් නැති කාට නම් ශාරීපුත්‍රයෝ නොරුස්නෝද? ආනන්දය, ආයුෂ්මත් ශාරීපුත්‍ර තෙම පණ්ඩිතය. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ මහා ප්‍රාඥයහ. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ විශාල (පළල්) ප්‍රාඥායහ. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ බහුල ප්‍රඥාවෙන් යුක්තයහ. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ ජවන (වේලාවත්) ප්‍රඥාවෙන් යුක්තයහ. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ තීක්ෂණ ප්‍රාඥයහ. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ නිර්වෙධි (සංස්කාරයන්හි කළකිරීම් බහුලවූ) ප්‍රඥාවෙන් යුක්තයහ.

ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ (ත්‍රිවිධ) විවේකයෙන් තනිවූහ. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ කුලයන් හා නොගැටුණහ. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ සම්පූර්ණකළ වීර්‍ය්‍ය ඇත්තෝය. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ දක්ෂ කථිකයහ. ආයුෂ්මත් ශාරීපුත්‍රයාණෝ අවවාද සුල්ලෝය. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ දොස් පෙන්වන්නාහ. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ පාපය පිළිකුල් කරන්නාහ. ආනන්දය බාල නොවූ, දුෂ්ට නොවූ, මූඪ නොවූ විපර්‍ය්‍යාසවූ සිත් නැති කාට නම් ශාරීපුත්‍රයෝ නොරුස්නෝද?"

**6.** එසෙමෙහි සුසීම දෙව්පුත් ආයුෂ්මත් ශාරීපුත්‍රයන් වහන්සේගේ ගුණ කියවෙන කල්හි මහ දෙව් පිරිසෙයින් පිරිවැරුණේ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියේය. පැමිණ වැඳ එක්පසෙක සිටියේය.

**7.** එක් පසෙක සිටි සුසීම දෙව්පුත් භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "භාග්‍යවතුන් වහන්ස, ඒ එසේමය. සුගතයන් වහන්ස, ඒ එසේමය. ස්වාමීනි, බාල නොවූ, දුෂ්ට නොවූ, මූඪ නොවූ, නොපෙරළුණු සිතැති, කාහට නම් ආයුෂ්මත් ශාරීපුත්‍රයන් වහන්සේ නොරුස්නෝද? ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයන් වහන්සේ පණ්ඩිතයහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ මහාප්‍රාඥයහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ විශාල (පළල්) ප්‍රාඥයහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ බහුල ප්‍රඥාවෙන් යුක්තයහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ ජවන (වේලාවන්) ප්‍රඥාවෙන් යුක්තයහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ තීක්ෂණ ප්‍රාඥයහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ නිර්වෙධි (සංස්කාරයන්හි කළකිරීම් බහුලවූ) ප්‍රඥාවෙන් යුක්තයහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ (ත්‍රිවිධ) විවේකයෙන් තනිවූහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ කුලයන් හා නොගැටුණහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ සම්පූර්ණ කළ වීර්‍ය්‍ය ඇත්තෝය. ස්වාමීනි, ආයුෂ්මත් ශාරිපුත්‍රයෝ දක්ෂ කථිකයහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයාණෝ අවවාද සුල්ලෝය ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ දොස් පෙන්වන්නාහ. ස්වාමීනි, ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ පාපය පිළිකුල් කරන්නාහ. ස්වාමීනි, බාල නොවූ,

දුෂ්ට නොවූ, මූඪ නොවූ, නොපෙරළුණු සිතැති, කාහට නම් ආයුෂ්මත් ශාරීපුත්‍රයන් වහන්සේ නොරුස්නෝද?"

"ස්වාමීනි, මමත් යම් යම් දෙව්පුත් පිරිසක් කරා පැමිණෙම්ද ඒ හැම තැනදීම "ආයුෂ්මත් ශාරීපුත්‍රයන් වහන්සේ පණ්ඩිතයහ. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ මහාප්‍රාඥයහ. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ විශාල (පළල්) ප්‍රාඥයහ. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ බහුල ප්‍රඥාවෙන් යුක්තයහ. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ ජවන (වේලාවන්) ප්‍රඥාවෙන් යුක්තයහ. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ තීක්ෂණ ප්‍රාඥයහ. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ නිර්වෙධි (සංස්කාරයන්හි කළකිරීම් බහුලවූ) ප්‍රඥාවෙන් යුක්තයහ. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ (ත්‍රිවිධ) විවේකයෙන් තනිවූහ. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ කුලයන් හා නොගැටුණහ. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ සම්පූර්ණ කළ වීර්‍ය්‍ය ඇත්තෝය. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ දක්ෂ කථිකයහ. ආයුෂ්මත් ශාරීපුත්‍රයාණෝ අවවාද සුල්ලෝය. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ දොස් පෙන්වන්නාහ. ආයුෂ්මත් ශාරීපුත්‍රයෝ පාපය පිළිකුල් කරන්නාහ." යන මේ ශබ්දයම බොහෝ සෙයින් අසමි. ස්වාමීනි, බාලනොවූ, දුෂ්ට නොවූ, මුළා නොවූ, විපර්‍ය්‍යාසවූ සිත් නැති කාහට නම් ආයුෂ්මත් ශාරීපුත්‍රයන් වහන්සේ නොරුස්නෝද?"

8. එකල්හි සුසීම දෙව්පුතුගේ දෙව්පුත් පිරිස ආයුෂ්මත් ශාරීපුත්‍රයන් වහන්සේගේ ගුණ කියවෙන කල්හි සතුටුවූ සිත් ඇත්තාහු, ප්‍රීති වූහු, හටගත් ප්‍රීති සොම්නස් ඇත්තාහු, නොයෙක් වර්ණයන් පහළ කෙරෙත්.

9. සුන්දරවූ, ජාතිසම්පන්නවූ, සේදීම් ආදියෙන් හොඳින් පිරියම් කළ, රතු පළසෙක තබනලද, අටැස් වෙරළුම්ණෙක් යම්සේ බබළාද, දිලිසේද, ප්‍රභා විහිදුවාද, එසේම ආයුෂ්මත් ශාරීපුත්‍රයන් වහන්සේගේ ගුණ කියවෙන කල්හි සුසීම දෙව්පුතුගේ දෙව්පුත් පිරිසද සතුටුවූ සිතැත්තෝ, ප්‍රීති ඇත්තෝ, ප්‍රීති සොම්නස් ඇත්තෝ, නොයෙක් වර්ණයන් පහළ කෙරෙති.

10. දක්ෂ කර්මකාර පුත්‍රයකු විසින් කෝවෙහි පිස මොනවට ශුද්ධකැරුණු දඹරන්මුවා නිකෙක් රතු පළසෙක තබන ලද්දේ

යම්සේ බබළාද, දිලිසේද, ප්‍රභා විහිදුවාද එසේම සුසීම දෙව්පුතුගේ දෙව්පුත් පිරිසිද සතුටුවූ සිතැත්තෝ, ප්‍රීති ඇත්තෝ, ප්‍රීති සොම්නස් ඇත්තෝ, නොයෙක් වර්ණයන් පහළ කෙරෙති.

11. රෑ අලුයම්හි පහන් තරුව යම්සේ ප්‍රභා විහිදුවාද, දිලිසේද, බබළාද, එසේම සුසීම දෙව්පුතුගේ දෙව්පුත් පිරිස සතුටුවූ සිතැත්තෝ, ප්‍රීති ඇත්තෝ, ප්‍රීති සොම්නස් ඇත්තෝ, නොයෙක් වර්ණයන් පහළ කෙරෙති.

12. සරත් කාලයෙහි අහස පහවූ වළාකුළු ඇතිව පැහැදිලිවූ කල්හි හිරුතෙම ඉහළ නගින්නේ අහසෙහිවූ සියලු අඳුර දුරලා රැස් විහිදුවාද, දිලියේද, බබළාද, එපරිද්දෙන්ම සුසීම දෙව්පුතුගේ දෙව්පුත් පිරිස සතුටුවූ සිතැත්තෝ, ප්‍රීති ඇත්තෝ, ප්‍රීති සොම්නස් ඇත්තෝ, නොයෙක් වර්ණයන් පහළ කෙරෙති.

13. එවිට සුසීම දෙව්පුත් ආයුෂ්මත් ශාරීපුත්‍රයන් වහන්සේ ගැන භාග්‍යවතුන් වහන්සේ ගැන භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීයඃ

> "ශාරීපුත්‍ර ඉර්ෂිතෙම පණ්ඩිතයයි, ක්‍රොධ නොකරන සුළුයයි, මෘදු මොළොක්යයි, හිත දමනයවූ තැනැත්තෙකැයි ප්‍රකටය. (හෙතෙම) ශාස්තෘන් වහන්සේ විසින් ගෙනහැර දැක්වුණු ගුණ ඇත්තෙක."

14. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ශාරීපුත්‍රයන් වහන්සේ ගැන සුසීම දෙව්පුතුට ගාථායෙන් මෙසේ පෙරළා වදාළසේක.

> "ශාරීපුත්‍රතෙම පණ්ඩිතයයි, ක්‍රොධ නොකරන්නෙකි, වුවමනාසුළුයි, මෘදු මොළොක්යයි. හිත දමනයවූ තැනැත්තෙකැයි ප්‍රකටය. ඉතා දැමුණු හෙතෙම දිනපතා මෙහෙකරුවකු සෙයින් (පිරිනිවනට) කල් බලා සිටී."

---

## 10. නානාතිර්ථක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි කලන්දක නිවාප නම්වූ වේළුවනයෙහි වැඩවසන සේක.

2. එකල්හි වනාහි අසම දෙව්පුත්ද, සහලී දෙව්පුත්ද, නිංක දෙව්පුත්ද, ආකෝටක දෙව්පුත්ද, වේටම්බරී දෙව්පුත්ද, මානවගාමික දෙව්පුත්ද යන නොයෙක් තිර්ථක ශ්‍රාවකවූ බොහෝ දෙව්පුත්හු රෑ පෙරයම ඉක්මුණු පසු බබළන ශරීර ප්‍රභා ඇත්තාහු සියළු වේළුවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියහ. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක සිටියාහ.

3. එක්පසෙක සිටි අසම දෙව්පුත් තෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පූරණ කාශ්‍යප (තිර්ථංකරයා) ගැන මේ ගාථාව කීය.

> "මෙලොව අත් පා ආදිය සිඳීමෙහිත්, ප්‍රාණ නැසීමෙහිත්, පුද්ගලයාට පිනක් හෝ පවක් කාශ්‍යපයෝ නොදකිති. ඒ ශාස්තෲන් වහන්සේ (මෙසේ) විශ්වාස්‍යය වදාරති. ඒ ශාස්තෲන් වහන්සේ බුහුමනට සුදුසු සේක."

4. ඉක්බිති සහලී දෙව්පුත් තෙම මක්ඛලීගෝසාලයන් ගැන භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය.

> "(පව් පිරිහෙලන තපසින් හෙවත් කය තැවීමෙන්) හොඳින් වසාගත් ආත්ම ඇති, විවාද හැර ජනයා හා සමවූ පැවතුම් ඇති, වැරැදි දෙයින් වැළකුණු, සත්‍යවාදීවූ, ශ්‍රෙෂ්ඨවූ ඔහු ඒකාන්තයෙන් පව් නොම කෙරෙති."

5. ඉක්බිති නිංක දෙව්පුත්තෙම නිඝණ්ඨනාථපුත්‍රයන් ගැන භාග්‍යවතුන් වහන්සේ වෙත මේ ගාථාව කීය.

> "කයට දුක් දෙමින් කෙලෙසුන් පිරිහෙලන, පණ්ඩිතවූ, සතර සංවරයෙන් (චාතුයාම සංවරයෙන්) වැසුනාවූ, දුටු දේත්, ඇසූ දේත්, නොසඟවා කියන, සසර භය දක්නා

නිඝණ්ඨනාථපුත්‍රයන් වහන්සේ පව් ඇතියෝ නම් නොවන්නාහුමය.”

**6.** ඉක්බිති ආකෝටක දෙව්පුත් නානා තීර්ථකයන් ගැන භාග්‍යවතුන් වහන්සේ වෙත්හි මේ ගාථාව කීය.

“පකුධ (කත්‍යායනයන්) වහන්සේද, නිගණ්ඨ (නාතපුත්‍රයන්) වහන්සේද, මක්ඛලී, පූරණ යන යම් කෙනෙක් වෙත්නම් ඒ මේ දෙදෙනා වහන්සේද යන ශ්‍රාවකගණයාගේ අනුශාසකවූ, මහණදමෙහි කෙළවරට පැමිණි ඒ ශාස්තෘහු ඒකාන්තයෙන් සත්පුරුෂයන් කෙරෙන් දුර නොවෙත්.”

**7.** එවිට වේටම්බරී දෙව්පුත් තෙම ආකෝටක දෙව්පුතුට ගාථායෙන් (මෙසේ) පෙරළා කීය.

“නීචවූ කළු සිවලා සිංහයාට බඳු (ආචාරයෙනුත්) පැවතුම්වලින් කිසිම කලෙක සිංහයාට සම නොවන්නේය. (එසේම) නිර්වස්ත්‍රවූ, බොරු තෙපලන ගති ඇති, කසලට බඳු නින්දිත හැසුරුම් ඇති, ගණශාසකයා බුද්ධාදී සත්පුරුෂයන් හා සම නොවන්නේය.”

**8.** එකල පව්කාර මාරතෙම වේටම්බරී දෙව්පුතුට වැහී (ආවේසව) භාග්‍යවතුන් වහන්සේ වෙත මේ ගාථාව කීය.

“යම් කෙනෙක් තපෝජුගුප්සායෙන් යුක්තවූවෝ, (චතුර්විධ) ප්‍රවිවේකය (කෙස් සිඳීම, නිර්වස්ත්‍රව සිටීම, බල්ලන් මෙන් කෑම කෑම, කටු ඇඳන්වල නිදීම) රක්නාහු, තෘෂ්ණාදෘෂ්ටීන්ගේ වශයෙන් රූපයෙහි බැඳී සිටියාහු, දෙව්ලොව පතන්නෝ වෙත්ද, ඒ සත්හු පරලොව යහපත පිණිස හොඳින් අනුශාසන කෙරෙත්මය.”

**9.** එකල භාග්‍යවතුන් වහන්සේ ‘මේ පව්කාර මාරයා’යි දැන මෙසේ ගාථායෙන් ඔහුට පෙරළා වදාළ සේක.

“මෙහි හෝ අන් ලොවෙක හෝ අහසෙහි හෝ ප්‍රභාසම්පන්න යම් රූපයක් වෙත්ද, මාරය, ඒ සියලු රූපයෝ මසුන් මරන්නට දැම්මාවූ ඇමක් වැන්න.”

10. ඉක්බිති මානවගාමිය දෙව්පුත්තෙම භාග්‍යවතුන් වහන්සේ ගැන උන්වහන්සේ ළඟ මේ ගාථා කීය.

"රජගහ නුවරවූ පර්වතයන් අතුරෙහි වෛපුල්‍යගිරිය ශ්‍රෙෂ්ඨයයිද, හිමවත් වැටියේ කඳු අතුරෙහි කෛලාශය ශ්‍රෙෂ්ඨයයිද, අහස හැසිරෙන්නවුන් අතුරෙහි හිරු ශ්‍රෙෂ්ඨයයිද කියනු ලැබේ."

"ජලාධාරයන් අතුරෙහි මුහුද ශ්‍රෙෂ්ඨයයිද, නකත් තරු අතුරෙහි සඳු ශ්‍රෙෂ්ඨයයිද, දෙවියන් සහිත ලොවෙහි බුදුරජ ශ්‍රෙෂ්ඨයයිද කියනු ලැබේ."

තුන්වෙනි නානාතිත්ථිය වර්ගයයි.
(දෙවපුත්ත සංයුත්තය නිමි.)

---

# 3. කොසල සංයුත්තය.

## 1. ප්‍රථම වර්ගය.

### 1. දහර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි අනේපිඩු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක.

2. එකල පසේනදි කොසොල් රජ භාග්‍යවතුන්වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, සතුටු විය. සතුටු වියයුතු, සිහි කටයුතු කථා පවත්වා එක්පසෙක හුන්නේය.

3. එක්පසෙක හුන් පසේනදි කොසොල්රජ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. "භවත් ගෞතමයන් වහන්සේත් 'අනුත්තර සම්‍යක් සම්බෝධිය ලදුම්හ'යි ප්‍රතිඥා කෙරෙත්ද?"

4. "මහරජ, සරිලෙස කියන තැනැත්තේ 'මේ තෙම සම්‍යක් සම්බෝධියට පැමිණියේය'යි යමකු ගැන කියන්නේ නම්, ඒ නිවැරැදි සේ කියන තැනැත්තා එය මා ගැනම කියන්නේය.

මහරජ, මම් වනාහි ඉතා උතුම් සම්‍යක් සම්බෝධියට පැමිණියෙක්මි"යි (භාග්‍යවතුන් වහන්සේ පිළිතුරු දුන්සේක.)

**5.** "භවත් ගෞතමයන් වහන්ස, පූරණකස්සප, මක්ඛලිගොසාල, නිගණ්ඨනාථපුත්ත, සඤ්ජය බෙල්ලට්ඨපුත්ත, පකුධකච්චායන, අජිත කෙසකම්බල යන පැවිදි සමූහයා ඇති, පැවිදිගණයා ඇති, ගණාචාර්‍ය්‍යවූ, ප්‍රකටවූ යසස් ඇති, ලබ්ධි ඇති කරන්නාවූ, බොහෝදෙනා විසින් යහපත්යයි සම්මත කරණ ලද යම් ඒ මහණ බමුණු කෙනෙක් වෙත්ද, ඔව්හුත් අනුත්තර සම්මා සම්බෝධිය ලදුම්හයි ප්‍රතිඥා කරනුදැයි මවිසින් ප්‍රශ්න කරන ලද්දෝ අනුත්තර සම්මා සම්බොධිය අවබොධ කෙළෙමුයි ප්‍රතිඥා නොකරති උත්පත්තියෙන් තරුණවූත් පැවිද්දෙන් ආධුනිකවූත් අළුත පැවිදිවූ භවත් ගෞතමයන් වහන්සේ කෙසේ නම් ප්‍රතිඥා කරණසේක්ද?"

**6.** "මහරජ, මේ සතරදෙනෙක් තරුණයයි හෙවත් ළදරුයයි ලඝු කොට සැලකිය යුතු නොවෙති. පරිභව කටයුතු නොවෙති. එනම්:- ක්ෂත්‍රිය රජකුමරා ළදරුයයි සැහැල්ලු කොට සිතිය යුතු නොවේ. සර්පයා ළදරුයයි සැහැල්ලුව කොට සිතිය යුතු නොවේ. ගින්න කුඩායයි නොසැලකිය යුතු නොවේ. භික්ෂුව තරුණයයි පහත්සේ සිතිය යුතු නොවේ. මහරජ, මේ සතරදෙන තරුණයයි අවමන් නොකටයුතු වෙති. පරිභව නොකටයුතු වෙති."

**7.** භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සුගතයන් වහන්සේ මෙය වදාරා නැවත මේ ගාථා වදාළසේක.

> 8. "නුවණැති මිනිස්තෙමේ ජාති සම්පන්නවූ උසස් කුලයෙහි උපන්නාවූ යසස් ඇති ක්ෂත්‍රිය රාජකුමාරයාට ළදරුයයි අවමන් නොකරන්නේය. පරිභව නොකරන්නේය. ඊට කරුණු ඇත්තාහ. මනුජෙන්ද්‍රවූ ඒ ක්ෂත්‍රිය තෙමේ රජකම ලබාගෙන තමන්ට අවමන් කළ තැනැත්තා කෙරෙහි කිපියේ බෙහෙවින් ඔහුට රාජ දඬුවම් කරන්නේය. එහෙයින් තම දිවි රකින්නා ඒ ක්ෂත්‍රිය (උතුම්) කුමරුන් නොගටා ඈත්වන්නේය.

9. "නුවණැති මිනිසා ගමෙහි හෝ වෙනෙහි හෝ යම්කිසි තැනෙක සර්පයෙක් දකීද, ඒ සර්පයා කුඩායයි සැහැල්ලුකොට නොසිතන්නේය. අවමන් නොකරන්නේය. තෙදින් යුත් සර්පයා උස් පහත් නොයෙක් වෙසින් හැසිරෙන්නේය. ඒ සර්පයා තමහට ගැහැට කළ අඥාන මිනිසා හෝ ගැහැනිය වෙත පැමිණ දෂ්ට කරන්නේය. එහෙයින් තම දිවිරකින්නේ ඒ සර්පයා වෙත නොයන්නේය.

10. 'බොහෝකොට කන, ගිනිදැල් ඇති, ගිය මග කළුකරණ ගින්න නුවණැති මිනිසා කුඩායයි ලඝුකොට නොසිතන්නේය. පරිභව නොකරන්නේය. ඒ ගින්න ඇවිලීමට උපකරණ ලැබ මහත්වී ඒ අවමන් කළ අඥාන මිනිසා හෝ ගැහැනිය වෙත පැමිණ දවන්නේය. එහෙයින් තම දිවිරකින්නා ඒ ගින්න ඈත් කරන්නේය.

11. "ගිය මග කළුකරන්නාවූද, පච් දවන්නා යන අර්ථයෙන් පාවක නම්වූද ගින්න යම් වනයක් දවානම් එහි කලකට පසු පැල හටගනිති. නමුත් සිල්වත් භික්ෂු සිල් තෙදින් යමෙකුන් දවා නම් ඔහුට පුත්තු නැති වෙති. ගෙරි සරක් නැති වෙති. ඔහුගේ දායාදයෝ හෙවත් ධනයට හිමිකම් ඇති නෑදෑයෝ ඔහුගේ ධනය නොලබති. ඔව්හු දූ දරුවන් නැත්තෝව, ධනයට හිමි නෑයන් නැත්තෝව කරටියෙන් කැඩූ තල්ගස් මෙන් වෙති.

12. "එහෙයින් තමන්ට යහපත බලාපොරොත්තු වන නුවණැති මනුෂ්‍යයා සර්පයාද, ගින්නද, කීර්තිමත් උතුම් කුමරාද, සිල්වත් භික්ෂුවද යන මොවුන් කෙරෙහි යහපත්ව හැසිරෙන්නේය."

13. මෙසේ වදාළ කල්හි පසෙනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. "ස්වාමීනි, ඉතා රම්‍යයි, ඉතා මනොඥයි. ස්වාමීනි, යටිකුරු වූවක් යම්සේ උඩුකුරු කරන්නේද, වැසුනු දෙයක් යම්සේ මතු කරන්නේද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි අඳුරේ තෙල් පහනක් දල්වන්නේ යම්සේද, එමෙන්ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක්

ආකාරයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලදී. ස්වාමීනි, මේ මම බුදුන්, දහම්, සංඝයා සරණ යමි. භාග්‍යවතුන් වහන්සේ මා අද පටන් දිවිහිමි කොට සරණ ගිය උපාසකයෙකු ලෙස සලකන සේක්වා”

---

## 2. පුරිස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල්හි පසේනදි කොසොල් රජතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, වැඳ, එකත්පසෙක හුන්නේය. එක්පසෙක හුන් පසේනදී කෝසල රජතෙමේ “ස්වාමීනි, තමන් තුළ උපදින කෙතෙක් දේ පුරුෂයෙකුට අහිත පිණිස, දුක් පිණිස, අපහසුවෙන් වසනු පිණිස උපදිත්දැ”යි භාග්‍යවතුන් වහන්සේගෙන් ඇසීය.

3. “මහරජ, පුරුෂයෙකුට තමන් තුළ උපදිනා කරුණු තුනක් අහිත පිණිස, දුක් පිණිස, අපහසුවෙන් වසනු පිණිස උපදිති. කවර කරුණු තුනක්ද? මහරජ, ලොභය තමන් තුළ උපදින්නේ පුරුෂයාට අහිත පිණිස, දුක් පිණිස, අපහසුවෙන් වසනු පිණිස උපදියි. මහරජ, ද්වෙෂය තමන් තුළ උපදින්නේ පුරුෂයාට අහිත පිණිස, දුක් පිණිස, අපහසුවෙන් වසනු පිණිස උපදියි. මහරජ, මොහය තමන් තුළ උපදින්නේ පුරුෂයාට අහිත පිණිස, දුක් පිණිස, අපහසුවෙන් වසනු පිණිස උපදියි. මහරජ, මේ කරුණු තුන තමන් තුළ උපදින්නේ පුරුෂයාට අහිත පිණිස, දුක් පිණිස, අපහසු විහරණය පිණිස උපදිත්.

5. “තමන්ගේ සන්තානයෙහි උපන් ලොභ, දොෂ, මොහ යන අකුශල් මුල් ලාමක සිත් ඇති පුරුෂයාම පෙළති. කුමක් මෙන්ද යත්? (හුණ, බට, කෙසෙල් ආදි) පොත්තම හරය කොට ඇති ගසක ඇතිවන ඵලය එබඳු ගසක් නසන්නාක් මෙනි.”

---

## 3. රාජ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල්හි පසේනදි කොසොල් රජතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැනට පැමිණියේය. පැමිණ, වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් පසේනදි කොසොල් රජතෙමේ "ස්වාමීනි, උපන් තැනැත්තාට ජරා මරණ දෙකින් ගැළවීමක් ඇත්තේදැ"යි භාග්‍යවතුන්වහන්සේ ගෙන් ඇසීය.

3. "මහරජ, උපන් තැනැත්තාට ජරා මරණ දෙකින් ගැළවීමක් නැත. මහරජ, මහාසාර කුලවල උපන් යම් ඒ ක්ෂත්‍රියයෝ ධනයෙන් ආඪ්‍යවූ, මහත් ධන ඇත්තාවූ, බොහෝ සම්පත් ඇත්තාවූ, බොහෝ රන්රුවන් ඇත්තාවූ, මන පිනවන බොහෝ දේ ඇත්තාවූ, බොහෝ ධන ධාන්‍ය ඇත්තාවූ වෙත්ද, ඔවුන්ටද, ජරා මරණ දෙකින් ගැළවීමෙක් නැත. මහාසාර කුලවල උපන් බ්‍රාහ්මණයෝ ධනයෙන් ආඪ්‍යවූ, මහත් ධන ඇත්තාවූ, බොහෝ සම්පත් ඇත්තාවූ, බොහෝ රන් රුවන් ඇත්තාවූ, මන පිනවන බොහෝ දේ ඇත්තාවූ, බොහෝ ධන ධාන්‍ය ඇත්තාවූ වෙත්ද, ඔවුන්ටද ජරා මරණ දෙකින් ගැළවීමෙක් නැත. මහාසාර කුලවල උපන් ගෘහපතියෝ ධනයෙන් ආඪ්‍යවූ, මහත් ධන ඇත්තාවූ, බොහෝ සම්පත් ඇත්තාවූ, බොහෝ රන් රුවන් ඇත්තාවූ, මන පිනවන බොහෝ දේ ඇත්තාවූ, බොහෝ ධන ධාන්‍ය ඇත්තාවූ වෙත්ද ඔවුන්ටද ජරා මරණ දෙකින් ගැළවීමෙක් නැත. මහරජ, කෙලෙස් නැසූ, මග බඹසර වැස නිමවූ, සතර මගින් කටයුතු කොට නිමවූ කෙලෙස් බර බහා තැබූ, රහත් බවට පැමිණි, භව බන්ධන නැසූ සතර සත්‍යයන් තතුසේ දැන කෙලෙසුන් ගෙන් මිදුනාවූ, යම් ඒ රහත් භික්ෂු කෙනෙක් වෙත්ද, ඔවුන්ගේත් මේ කය බිඳෙන ස්වභාව ඇත්තේය, ඉවත දැමිය යුතු ස්වභාව ඇත්තේය."

"විසිතුරු කරණලද රජුන්ගේ රථද දිරති. එසේම ශරීරයද දිරීමට පැමිණෙයි. එහෙත් බුද්ධාදී උත්තමයන්ගේ

සද්ධර්මය දිරුමට නොපැමිණේ. එහෙයින් ඒ උත්තමයෝ ඒ සද්ධර්මය (නිවන) ඒකාන්ත පිහිට ලෙස ඔවුනොවුන්ට ප්‍රකාශ කරති."

---

## 4. පිය (නොහොත් පිය අත්ත) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි පසේනදි කොසොල් රජතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ වැඳ එකත්පසෙක හුන්නේය.

2. එකත්පසෙක හුන් පසෙනදි කොසොල්රජ භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, තනිව විවේකීව හුන් මට මෙබඳු විතර්කයක් පහළවිය. එනම්:- 'කවුරුන්ට නම් තමා ප්‍රියද? කවුරුන්ට තමා අප්‍රියද? කියායි. ස්වාමීනි, ඒ මට මේ සිත විය.

3. 'යම්කිසි කෙනෙක් කයින් දුසිරිතෙහි හැසිරෙත්ද, වචනයෙන් දුසිරිතෙහි හැසිරෙත්ද, සිතින් දුසිරිතෙහි හැසිරෙත්ද, ඔවුන්ට තමා අප්‍රියය. අපගේ ආත්මය හෙවත් තමා තමන්ට ප්‍රිය යයි යම් ලෙසකින් ඔවුන් කියතත් ඔවුන්ට තමා අප්‍රියමය. ඊට හේතු නම්:- අප්‍රියයෙක් අප්‍රියයෙකුට යමක් කෙරේනම්, ඔව්හු එය තමන්ටම කෙරෙති. එහෙයින් ඔවුන්ට තමා අප්‍රියය.

4. 'යම්කිසි කෙනෙක් කයින් සුචරිතයෙහි හැසිරෙත්ද, වචනයෙන් සුචරිතයෙහි හැසිරෙත්ද, සිතින් සුචරිතයෙහි හැසිරෙත්ද, ඔවුන්ට තමා ප්‍රියය. අපට තමා අප්‍රිය යයි කිසිලෙසකින් ඔවුන් කියතත් ඔවුන්ට තමා ප්‍රියමය. ඊට හේතු නම්:- ප්‍රියයෙක් ප්‍රියයෙකුට යමක් කෙරේනම්, ඔව්හු එය තමන්ටම කරති. එහෙයින් ඔවුන්ට තමා ප්‍රියයි."

5. "මහරජ, ඒ එසේය. මහරජ, ඒ එසේය. මහරජ යම්කිසිවෙක් කයින් දුසිරිතෙහි හැසිරෙත්ද, වචනයෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දුසිරිතෙහි හැසිරෙත්ද, සිතින් දුසිරිතෙහි හැසිරෙත්ද, ඔවුන්ට තමා අප්‍රියය. මහරජ, යමෙක් කයින් සුසිරිතෙහි හැසිරෙද්ද, වචනයෙන් සුසිරිතෙහි හැසිරෙද්ද, සිතින් සුසිරිතයෙහි හැසිරෙද්ද, ඔවුන්ට තමා ප්‍රියය."

"ඉදින් යමෙකුට තමා ප්‍රියයයි දන්නේ නම් ඒ තමා පවෙහි නොයෙදන්නේය. (සුසිරිත් කිරීමෙන් ලද හැකි සැප) දුසිරිත් කරන්නා විසින් පහසුවෙන් ලද හැකි නොවේ. (එහෙයිනි.)

"මාරයා විසින් යටපත් කර ගන්නා ලද්දාවූ, මිනිස් සිරුර හැර දමන්නාවූ ඔහුට කුමක් නම් තමන් සතු වේද, ඔහු කුමක් රැගෙණ (පරලොව) යයිද, තමන් පසුපස යන සෙවනැල්ල මෙන් කුමක් නම් ඔහු අනුව යයිද?"

"මිනිසා මෙලොවදී යම් පිනක් හෝ පවක් කරයිද, ඒ ඔහුට තමන් සතු වෙයි. ඔහු එය රැගෙණ (පරලොව) යයි. තමන් පසුපස යන සෙවනැල්ල මෙන් ඒ ඔහු අනුව යයි."

"එහෙයින් පරලොවට හිත සැප පිණිස දේ රැස් කරන්නා කුසල් කරන්නේය. කුසල් පරලොවදී සත්වයන්ට පිහිට වෙති."

---

## 5. අත්තරක්ඛිත (රක්ඛිතත්ත) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි පසේනදි කොසොල් රජ තෙමේ භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ වැඳ එකත්පසෙක හුන්නේය.

2. එකත්පසෙක හුන් පසේනදි කොසොල්රජ භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, හුදකලාව විවේකීව හුන්

මට මේ විතර්කය පහළවිය. එනම්:- කවුරුන් විසින් තමා නොරක්නා ලදද, කවුරුන් විසින් තමා රක්නා ලදද?" යනුයි

3. "ස්වාමීනි, ඒ මට මේ සිත විය. 'යම්කිසි කෙනෙක් කයින් දුසිරිතෙහි හැසිරෙද්ද, වචනයෙන් දුසිරිතෙහි හැසිරෙද්ද, සිතින් දුසිරිතෙහි හැසිරෙද්ද, ඔවුන් විසින් තමා නොරක්නා ලද්දේය. සමහරවිට ඇත් සෙනග හෝ ඔවුන් රකී. අස් සෙනග හෝ ඔවුන් රකී. රිය සෙනග හෝ ඔවුන් රකී. පාබල සෙනග හෝ ඔවුන් රකී. එසේ වුවත් ඔවුන්ගේ ආත්මය (තමා) නම් නොරක්නා ලද්දේමය. ඊට හේතු නම්:- මේ ආරක්ෂාව බාහිර එකක් බැවිනි. මේ ආරක්ෂාව තමන් තුළ නොපවත්නක් බැවිනි. එහෙයින් ඔවුන් විසින් තමා නොකරන ලද්දේය. යමෙක් කයින් සුසිරිතෙහි හැසිරෙද්ද, වචනයෙන් සුසිරිතෙහි හැසිරෙද්ද, සිතින් සුසිරිතෙහි හැසිරෙද්ද, ඔවුන් විසින් තමා රක්නා ලද්දේය. සමහරවිට ඇත් සෙනග හෝ ඔවුන් නොරකී, අස් සෙනග හෝ ඔවුන් නොරකී, රිය සෙනග හෝ ඔවුන් නොරකී, පාබල සෙනග හෝ ඔවුන් නොරකී. එසේ වුවත් ඔවුන්ගේ (ආත්මය) තමා රක්නා ලද්දේමය. ඊට හේතු නම්:- මේ ආරක්ෂාව තමන් තුල පවත්නා බැවිනි. මේ ආරක්ෂාව බාහිර නොවූවක් බැවිනි. එහෙයින් ඔවුන් විසින් තමා රක්නා ලද්දේමය"

4. "මහරජ, ඒ එසේය. මහරජ, ඒ එසේය. මහරජ, යම්කිසි කෙනෙක් කයින් දුසිරිතෙහි හැසිරෙත්ද, වචනයෙන් දුසිරිතෙහි හැසිරෙත්ද, සිතින් දුසිරිතෙහි හැසිරෙත්ද, ඔවුන් විසින් තමා නොකරන්නා ලදී. සමහරවිට ඇත් සෙනග හෝ, අස් සෙනග හෝ, රිය සෙනග හෝ, පාබල සෙනග හෝ ඔවුන් රකී. එසේ නමුදු ඔවුන් විසින් තමා නොරක්නා ලද්දේය. ඊට හේතු නම්:- මහරජ, මේ ආරක්ෂාව බාහිර වූවක් බැවිනි. මේ ආරක්ෂාව තමන් තුළ නොවූවක් බැවිනි. එහෙයින් ඔවුන්ගේ ආත්මය (තමා) නොරක්නා ලද්දේය. මහරජ, යම්කිසි කෙනෙක් කයින් සුසිරිතෙහි හැසිරෙත්ද, වචනයෙන් සුසිරිතෙහි හැසිරෙත්ද, සිතෙන් සුසිරිතෙහි හැසිරෙත්ද, ඔවුන් විසින් තමා රක්නා ලදී. ඇතැම්විට ඇත් සෙනඟ හෝ, අස් සෙනඟ හෝ, රිය සෙනඟ

හෝ, පාබල සෙනඟ හෝ ඔවුන් නොරකී. එහෙත් ඔවුන්ගේ (ආත්මය) තමා රක්නා ලද්දේමය. ඊට හේතු නම්:- මහරජ, මේ ආරක්ෂාව පිටත්තර වූවක් නොවීමයි. මේ ආරක්ෂාව තමන් තුළ වූවක් වීමයි. එහෙයින් ඔවුන් විසින් තමා රක්නා ලද්දේමය"

"කයින් සංවරවීම හෙවත් තමන් රැක ගැනීම යහපත්ය. වචනයෙන් සංවරවීම යහපත්ය සිතින් සංවරවීම යහපත්ය. ඒ සියල්ලෙන්ම සංවරවීම යහපත්ය. ඒ හැමතන්හිම සංවරිතවූ පවට ලජ්ජා භය ඇති තැනැත්තා රැකුනේයයි කියනු ලැබේ."

---

## 6. අප්පකා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි පසේනදී කොසොල් රජතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ වැඳ, එකත් පසෙක හුන්නේය.

2. එකත්පසෙක හුන් පසේනදි කොසොල්රජ භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, තනිව විවේකව හුන් මට මේ විතර්කය පහළ විය. එනම්:- 'මහත් මහත් භොග සම්පත් ලැබ මාන මදයෙන් මත් නොවන්නාවූද, පමා නොවන්නාවූද, කාමයන්හි ගිජු බවට නොපැමිණෙන්නාවූද, සතුන් කෙරෙහි වරදවා නොපිළිපදින්නාවූද සත්වයෝ ලෝකයෙහි ඉතා ස්වල්ප දෙනෙක්ය. එහෙත් වැඩි කොටසක් සත්වයෝ මහත් මහත් භෝග සම්පත් ලැබ මානාදි මදයෙන් මත්වෙති, පමාවෙති, කාමයන්හි ගිජුවෙති, සත්වයන් කෙරෙහි වැරදිසේ පිළිපදිති." යනුයි.

3. "මහරජ, ඒ එසේය. මහරජ, ඒ එසේය. මහරජ, මහත් මහත් භොග සම්පත් ලැබ මත් නොවන්නාවූ, පමානොවන්නාවූ,

කාමයන්හි ගිජු නොවන්නාවූ, සත්ත්වයන් කෙරෙහි වරදවා නොපිළිපදින්නාවූ, සත්වයෝ ලෝකයෙහි ඉතා ස්වල්ප දෙනෙක් වෙති. වැලිදු මහත් මහත් භොග සම්පත් ලැබ යමෙක් මත්වෙත්ද පමාවෙත්ද, කාමයන්හි ගිජු වෙත්ද, සතුන් කෙරෙහි වැරදි සේ පිළිපදිත්ද, මෙබඳු සත්වයෝම ලෝකයෙහි ඉතා බොහෝ වෙති."

"කාම සම්පතෙහි ඇලුනාවූ, ගිජුවූ, කාමයන්හි මුළාවූ සත්වයෝ තමන් කුශල සීමාව ඉක්මවා යන බව තේරුම් නොගනිති. මුවන් වැද්දන් විසින් දමන ලද උගුල තේරුම් නොගන්නාක් මෙනි. ඔවුන්ට පසුව කටුක දුක් වෙයි. එහි විපාකයද ඒකාන්තයෙන්ම දරුණුය."

---

## අත්ථකරණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි පසේනදි කොසොල් රජතෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, වැඳ එකත් පසෙක හුන්නේය.

2. එකත්පසෙක හුන්නාවූ පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය "ස්වාමීනි, විනිශ්චය ශාලාවෙහි නඩු විසඳීමෙහි යෙදී හුන් මම ධනයෙන් ආඪ්‍යවූද මහත් ධන ඇත්තාවූද, බොහෝ සම්පත් ඇත්තාවූද, බොහෝ රන් රුවන් ඇත්තාවූද, මනපිනවන බොහෝ දේ ඇත්තාවූද, බොහෝ ධන ධාන්‍ය ඇත්තාවූද, මහාසාර කුලවල උපන් ක්ෂත්‍රියන්ද, මහාසාර කුලවල උපන් බමුණන්ද, මහාසාර කුලවල උපන් ගෘහපතීන්ද, කාම වස්තූන් නිසාම, කාමවස්තූන් මුලකාරණ කොටම, කාම වස්තූන් කරණ කොට ගෙණම, දැන දැන බොරු කියන්නවුන් දිටිමි. ස්වාමීනි, ඒ මට දැන් මේ සිත විය. එනම්:- මට දැන් මේ නඩු හලෙන් කම් නැත. මින්මතු භද්‍රමුඛ නම් තැනැත්තේ නඩුහලෙහි පෙණී සිටීය" යනුයි.

3. "මහරජ, ධනයෙන් ආඪ්‍යවූද, මහත් ධන ඇත්තාවූද, මහත් වස්තු ඇත්තාවූද, බොහෝ රන්රුවන් ඇත්තාවූද, මන වඩන බොහෝ වස්තු ඇත්තාවූද, බොහෝ ධන ධාන්‍ය ඇත්තාවූද, මහාසාර කුලවල උපන් යම් ඒ ක්ෂත්‍රියයෝද, බ්‍රාහ්මණයෝද, ගෘහපතියෝද, කාම වස්තු නිසාම කාම වස්තු මුල් කොට ගෙණම, කාම වස්තු කරණකොට ගෙණම, දැන දැන බොරු කියත්ද, ඒ ඔවුන්ට බොහෝ කලක් අහිත පිණිස දුක් පිණිස වන්නේය."

4. කාම වස්තුන්හි ඇලුනාවූ, එහිම ගිජුවූ, කාමයන්හි මුළාවූ සත්වයෝ කුසල් ඉම පැනයාම නොදකිත්. මත්ස්‍යයෝ තමන් ඇල්ලීමට බහාතිබෙන කෙමන යම්සේ නොදකිත්ද, එමෙනි. පසුව ඔවුන්ට කටුක දුකවෙයි. එහි විපාකයද ඉතා දරුණුය."

---

## 8. මල්ලිකා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල්හි පසේනදි කොසොල් රජ මල්ලිකාදේවිය සමග ප්‍රාසාදයෙහි මතුමහලට නැග සිටියේ වෙයි. එවිට කොසොල් රජ, "මල්ලිකාවෙනි, තමන්ට වඩා ප්‍රිය කරණ අන් කිසිවෙක් ලොව ඇත්තේදැ"යි මල්ලිකා දේවියගෙන් ඇසීය.

3. "මහරජ, මට නම් තමන්ට වඩා ප්‍රියවූ අන් කිසිවෙක් ලොවම නැත. ඔබට තමන්ට වඩා ප්‍රියවූ අන් කිසිවෙක් සිටීදැ"යි ඇසීය.

4. "මල්ලිකාවෙනි, මටත් තමන්ට වඩා ප්‍රියවූ අනිකෙක් නැතැ"යි රජතෙම කීයේය.

5. ඉන්පසු කොසොල් රජ පහයෙන් බැස, භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ,

භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක්පසෙක හුන්නේය. එකත්පස්ව හිඳ, මෙය කීයේය.

**6.** "ස්වාමීනි, මම මල්ලිකාදේවිය සමග පහයේ මතු මහලෙහි සිටියෙමි. 'මල්ලිකාවෙනි, ඔබට තමන්ට වඩා ප්‍රියවූ අන් කිසිවෙක් ඇත්තේදැ'යි ඇසීමි. මෙසේ අසනු ලැබූ මල්ලිකා දෙවි තොමෝ 'මහරජ, මට තමන්ට වඩා ප්‍රිය අන් කිසිවෙක් නැත. ඔබට තමන්ට වඩා ප්‍රියවූ අන් කිසිවෙක් නැත. ඔබට තමන්ට වඩා ප්‍රියවූ අන් කිසිවෙක් ඇත්තේදැ'යි ඇසුවාය. ස්වාමීනි, මෙසේ අසනු ලැබූ මම 'මල්ලිකාවෙනි, තමන්ට වඩා ප්‍රියවූ අන් කිසිවෙක් මටත් නැත්තේය'යි මල්ලිකා දේවියට කීයෙමි"යි කීයේය.

**7.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය දැන, එවේලෙහි මේ ගාථාව වදාළේය.

"ලොව හැම දිසාවන්ම සෝදිසිකර බැලුවේ වී නමුත් තමන්ට වඩා ප්‍රියවූ අන් කිසිවෙක් ලොවම හමුනොවන්නේය. අනුන්ටද වෙන් වශයෙන් මෙසේ තමාම ප්‍රිය වෙයි. එහෙයින් තමන්ට හිත කැමති තැනැත්තේ අනුන්ට හිංසා නොකරන්නේය."

---

## 9. යඤ්ඤ සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

**2.** එකල්හි පසේනදි කොසොල් රජුගේ මහායාගයක් එළඹ සිටියේ වෙයි. පන්සියයක් ගොන්නුද, පන්සියයක් ලොකු වස්සෝද, පන්සියයක් ලොකු වැස්සියෝද, පන්සියයක් එළුවෝද, පන්සියයක් බැටළුවෝද, යාගය පිණිස යාග කණුව වෙත පමුණුවන ලද්දාහු වෙති.

3. රජුගේ යම් ඒ දාසයෝ හෝ, දූත මෙහෙවර කරන්නෝ හෝ, කම්කරුවෝ හෝ වෙත්ද, ඔව්හුත් දණ්ඩනයෙන් තැතිගත්තෝ, භයින් තැතිගත්තෝ, කඳුළු වැකුණු මුහුණු ඇත්තෝ හඬමින් වැඩ කරති.

4. එකල බොහෝ භික්ෂූහු පෙරවරු කාලයෙහි හැඳ පොරවා, පාත්‍ර සිවුරු ගෙණ පිණ්ඩපාතය පිණිස සැවැත් නුවරට පිවිස බතින් පසු පිණ්ඩපාතයෙන් පෙරළා අවුත් භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැනට පැමිණියෝය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්හ. එක්පසෙක උන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය කීය.

5. "ස්වාමීනි, මෙහි කොසොල් රජුගේ මහා යාගයක් එළඹ සිටියේ වෙයි. පන්සියයක් ගොන්නුද, පන්සියයක් ලොකු වස්සෝද, පන්සියයක් ලොකු වැස්සියෝද, පන්සියයක් එළුවෝද, පන්සියයක් බැටළුවෝද, යාගය පිණිස යාග කණුව වෙත පමුණුවන ලද්දාහු වෙති. රජුගේ දාසයෝද, පණිවුඩකරුවෝද, කම්කරුවෝද දණ්ඩනයෙන් තැතිගත්තෝ, භයින් තැතිගත්තෝ, කඳුළු වැකුණු මුහුණු ඇත්තෝ, අඬමින් වැඩ කෙරෙති," යනුයි.

6. එවිට බුදුරජාණන් වහන්සේ මේ කාරණය දැන එවේලෙහි මේ ගාථා වදාළසේක.

> "මහත්වූ ක්‍රියාරම්භ ඇති අශ්වමෙධ නම්වූද, පුරිසමෙධ නම්වූද, සම්මාපාස නම්වූද, වාජපෙය්‍ය නම්වූද, නිරග්ගල නම්වූද, ඒ මහා යාගයෝ මහත්ඵල ඇත්තෝ නොවෙති. නානාප්‍රකාරවූ එළු, බැටළු, ගවයන් මරණ ඒ යාග පොළවලට යහපත් මග ගිය (බුද්ධාදී) මහර්ෂීහු නොපැමිණෙති. මහත් ක්‍රියාරම්භ නැති යම් යාග කෙනෙක් හැම කල්හි ගෙයක් පාසා යාග කරණු ලබත්ද, එළු බැටළුවෝත්, ගෙරිත් යම් යාගයෙක්හි මරණු නොලබත්ද, මෙබඳු යාගවලට යහපත් මග ගිය (බුද්ධාදී) මහර්ෂීහු පැමිණෙති. නුවණැති මනුෂ්‍ය තෙමේ මේ යාගය කරන්නේය. මේ යාගය මහත්ඵල ඇත්තේ වේ. මේ යාගය

කරන්නාට උතුම් අභිවෘද්ධිය වේ. අයහපතක් නොවේ. යාගයද මහත් වූවක් වේ. දෙවියෝද පහදිති.

---

## 10. බන්ධන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල්හි පසේනදි කොසොල් රජ විසින් මහා ජන සමූහයක් බන්දවන ලද්දේ වෙයි. සමහරු රැහැණින්ද, සමහරු දම්වැලින්ද, සමහරු විලංගුවෙන්ද බන්දවන ලද්දෝය.

3. එකල්හි බොහෝ භික්ෂූහු පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙණ පිඬු පිණිස සැවැත් නුවරට ගොස් පස්වරුයෙහි පිණ්ඩපාතයෙන් පෙරළා අවුත් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක්පසෙක උන්හ. එකත්පස්ව හිඳ මෙය කීහ. "ස්වාමීනි, කොසොල් රජ විසින් බොහෝ දෙනා බන්දවන ලදහ සමහරු රැහැණින්ද, සමහරු දම්වැලින්ද, සමහරු විලංගුවලින්ද බන්දවන ලද්දෝය" යනුයි.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන එවේලෙහි මේ ගාථා වදාළසේක.

"යකඩින් කළාවූද, ලීයෙන් කළාවූද, බබ්බජ නම් තෘණ විශෙෂයෙන් කළාවූද, බැම් තද බැමියයි නුවණැත්තෝ නොකියති. මිණිකොඬොල් ආදි ආභරණයෙහි ඇලීමද, අඹු දරුවන් කෙරෙහි අපෙක්ෂාවද යන මෙය දැඩි තද බැම්මයයි (බුද්ධාදී) නුවණැත්තෝ කියති. මේ බැම්ම අපායාදි පහත් බිමට අදින්නක්ද, බුරුල්වූවක්ද, එහෙත් ලෙහෙසියෙන් මිදෙනු නොහැක්කක්ද වේ. කාමයෙහි ඇළුම් නැත්තෝ මේ බැම්මද සිඳ බිඳ දමා කම් සැප හැර නිවන් මගට යෙති."

---

# 1. දෙවෙනි වර්ගය.

## 1. ජටිල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර මිගාරමාතුපාසාද නම් පූර්වාරාමයෙහි වැඩවසන සේක. එකල්හි භාග්‍යවත් තෙමේ සවස්වරුවෙහි ඵලසමවතින් නැගිට දොරටුවෙන් පිටත වැඩහුන්නේ වේ. පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක හුන්නේය.

2. එවේලෙහි ඉතා දික්ව වැඩුනු කිසිලි ලොම් නිය ඇති ජටිලයෝ සත්දෙනෙක්ද, නිගණ්ඨයෝ සත්දෙනෙක්ද, දිගම්බරයෝ (නිර්වස්ත්‍ර තාපසයෝ) සත්දෙනෙක්ද, ඒක සාටකයෝ (එක සළුවක් පමණක් ඇති තාපසයෝ) සත් දෙනෙක්ද, පරිව්‍රාජකයෝ සත්දෙනෙක්ද, නොයෙක් ආකාර තවුස් පිරිකර රැගෙණ භාග්‍යවතුන් වහන්සේට නුදුරින් එපෙදෙස පසුකර යති.

3. එකල්හි කොසොල්රජ අස්නෙන් නැගිට උතුරුසළුව එකාංශකොට දකුණු දණමඬල පොළොවෙහි ඔබා ඒ සත් ජටිලයන්, සත් නිගණ්ඨයන්, සත් දිගම්බරයන්, සත් ඒකසාටකයන් හා සත් පරිව්‍රාජකයන් දෙසට ඇදිලිබැඳ වැඳීම කොට "වහන්ස, මම පසේනදි කොසොල් රජ වෙමි"යි තුන් විටක් තම නම කීය.

4. ඉක්බිති කොසොල් රජ ඒ ජටිලයන් සත්දෙනද, නිගණ්ඨයන් සත්දෙනද, අචේලකයන් සත්දෙනද, එකසාටකයන් සත්දෙනද, පරිව්‍රාජකයන් සත්දෙනද ගිය නොබෝ වේලාවකින් භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, වැඳ, එකත්පස්ව හිඳ, "ස්වාමීනි, ලොකයෙහි රහත්වූ හෝ රහත් මගට පිළිපන්නාවූ හෝ යමෙක් වෙත් නම් මොව්හුද ඔවුන් අතරමවූ සමහරු වෙති"යි භාග්‍යවතුන් වහන්සේට කීයේය.

**5.** "මහරජ, පස්කම් සැප අනුභව කරණ, දූ දරුවන්ගෙන් පීඩිත, සයනයක හොවින, කසී සඳුන් ගල්වන, මල් ගඳ විලවුන් දරණ, රන් රිදී ඉවසන ගිහියෙක්වූ ඔබ විසින් මොව්හු රහත්හුයයි කියා හෝ මොව්හු රහත්මගට පිළිපන්නාහුයයි කියා හෝ දැනගැන්ම දුෂ්කරය (අපහසුය.)

**6.** 'මහරජ, එකට විසීමෙන් ශීලය දතයුතුයි. එයද බොහෝ කලකිනි. සුළු කලකින් නොවේ. නුවණින් සලකා බලන්නෙක් විසින්මය. මෙනෙහි නොකරන්නෙක් විසින් නොවේ. නුවණැත්තෙක් විසින්මය. මෝඩයෙක් විසින් නොවේ. මහරජ, පිරිසිදු බව කථා ව්‍යවහාරයෙන්ම දතයුතුය. එයද බොහෝ කලකිනි. සුළු කලකින් නොවේ. නුවණින් සලකා බලන්නෙක් විසිනි. මෙනෙහි නොකරන්නා විසින් නොවේ. නුවණැත්තෙක් විසින්මය. මෝඩයා විසින් නොවේ මහරජ, විපත්තියෙහිදී ශක්තිය දතයුතුයි. එයද බොහෝ කලකිනි. සුළු කලකින් නොවේ. නුවණින් සලකා බලන්නෙක් විසින්මය. මෙනෙහි නොකරන්නා විසින් නොවේ. නුවණැත්තා විසින්මය. මෝඩයා විසින් නොවේ. මහරජ, සාකච්ඡා කිරීමෙන් ප්‍රඥාව දතයුතුයි. එයද බොහෝ කලකිනි. සුළු කලකින් නොවේ නුවණින් සලකා බලන්නෙක් විසින්මය. මෙනෙහි නොකරන්නා විසින් නොවේ. නුවණැත්තා විසින්මය. මෝඩයා විසින් නොවේ.'

**7.** "ස්වාමීනි, පුදුමයි. ස්වාමීනි, බොහෝ පුදුමයි. මහරජ, පස්කම් සැප අනුභව කරණ, දූ දරුවන්ගෙන් පීඩිත සයනයක හොවින, කසී සඳුන් ගල්වන, මල් ගඳ විලවුන් දරණ, රන් රිදී ඉවසන, ගිහියෙක්වූ ඔබ විසින් මොව්හු රහත්හුයයි කියා හෝ මොව්හු රහත් මඟට පිළිපන්නාහුයයි කියා හෝ දැනගැන්ම දුෂ්කරය (අපහසුය)

'මහරජ, එකට විසීමෙන් ශීලය දතයුතුයි. එයද බොහෝ කලකිනි. සුළු කලකින් නොවේ. නුවණින් සලකා බලන්නෙක් විසින්මය. මෙනෙහි නොකරන්නෙක් විසින් නොවේ. නුවණැත්තෙක් විසින්මය. මෝඩයෙක් විසින් නොවේ. මහරජ,

පිරිසිදු බව කථා ව්‍යවහාරයෙන්ම දතයුතුය. එයද බොහෝ කලකිනි. සුළු කලකින් නොවේ. නුවණින් සලකා බලන්නෙක් විසිනි. මෙනෙහි නොකරන්නා විසින් නොවේ. නුවණැත්තෙක් විසින්මය. මෝඩයා විසින් නොවේ. මහරජ, විපත්තියෙහිදී ශක්තිය දතයුතුයි. එයද බොහෝ කලකිනි. සුළු කලකින් නොවේ. නුවණින් සලකා බලන්නෙක් විසින්මය. මෙනෙහි නොකරන්නා විසින් නොවේ. නුවණැත්තා විසින්මය. මෝඩයා විසින් නොවේ. මහරජ, සාකච්ඡාකිරීමෙන් ප්‍රඥාව දතයුතුයි. එයද බොහෝ කලකිනි. සුළු කලකින් නොවේ. නුවණින් සලකා බලන්නෙක් විසින්මය. මෙනෙහි නොකරන්නා විසින් නොවේ. නුවණැත්තා විසින් මය. මෝඩයා විසින් නොවේ.' භාග්‍යවතුන් වහන්සේ විසින් කෙතරම් හොඳට මෙය වදාරණ ලදද?

8. "ස්වාමීනි, මොව්හු මාගේ චෞරයෝය. චරපුරුෂයෝය. ඒ ඒ ජනපදවල කරුණු විමසා ඇවිද එන්නාහුය. ඔවුන් විසින් පළමුකොට සෝදිසි කළ තැනට මම පසුව යන්නෙමි. ස්වාමීනි, දැන් ඔව්හු ඒ දැලිකුණු සෝදා හැර හොඳින් නා, විලවුන් ගල්වා, කෙස් රැවුල් කපා හැර, සුදු පිළි හැඳ, පස්කම් ගුණයෙන් යුක්තව පස් ඉඳුරන් පිනවන්නාහුය."

9. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන එවේලෙහි මේ ගාථා වදාළසේක.

"පාටින් හා සටහනින් මිනිසා දතහැකි නොවේ දැකීම් පමණින් මිනිසකු විශ්වාස නොකරන්නේය. හොඳට සංවර වූවන්ගේ විලාසයෙන් හික්මීම නැත්තෝ මෙලොව හැසිරෙති. රනින් කරණ ලද්දකට සමානවූ මැටියෙන් කළ කුණ්ඩලයක් මෙන්ද, පිටත රන් ගෑමෙන් රනින් වැසුනු ලෝහ අඩමස්සක් මෙන්ද, සමහරු පිටත්තර පරිෂ්කාරයෙන් වැසුනෝව ඇතුළත අපරිශුද්ධයෝව පිටතින් පමණක් ශෝභාමානව හැසිරෙති."

---

## 2. පඤ්චරාජ සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එසමයෙහි පඤ්චකාම වස්තූන් හා යුක්තවූ ඉඳුරන් හසුරුවන්නාවූ කොසොල් රජ ප්‍රධාන රජුන් පස්දෙනෙක් අතර මේ කථාව පහළ විය. එනම්:- 'පඤ්චකාමයන් අතුරෙන් කුමක් නම් ශ්‍රෙෂ්ඨදැයි' කියායි.

එහි සමහරු 'කාමවස්තූන්ගෙන් රූපයෝ අග්‍රවෙත්යයි කීහ. සමහරු කාම වස්තූන්ගෙන් ශබ්දයෝ අග්‍රවෙත්යයි කීහ. සමහරු කාම වස්තූන්ගෙන් ගන්ධයෝ අග්‍රවෙත්යයි කීහ. සමහරු කාම වස්තූන්ගෙන් රසයෝ අග්‍රවෙත්යයි කීහ. සමහරු කාම වස්තූන්ගෙන් ස්පර්ශයෝ අග්‍රවෙත්යයිද කීවාහුය.

එයින් ඒ රජවරු තමන් ගත් මතය ඔවුනොවුන්ට අවබොධ නොකට හැකි වූහ.

3. එවිට පසේනදි කොසොල් රජ "පින්වත්නි, අපි භාග්‍යවතුන් වහන්සේ වෙත යමු. ගොස් මේ කරුණ භාග්‍යවතුන් වහන්සේගෙන් විචාරමු. භාග්‍යවතුන් වහන්සේ යම් ලෙසකින් විසඳයිද, එලෙසින් අපි බාරගන්නෙමුයි' ඒ රජවරුන්ට කීය. ඒ රජවරුද "පින්වත්නි, එසේය"යි කොසොල් රජුට පිළිතුරු දුන්හ.

4. ඉක්බිති කොසොල් රජ ප්‍රධාන ඒ රජවරු පස්දෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියෝය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පස්ව හිඳගත්හ. එකත්පසෙක හුන් කොසොල් රජ "ස්වාමීනි, පස්කම් ගුණෙහි පිහිටා එයින්ම යුක්තව ඉඳුරන් හසුරුවන රජවරුන් පස්දෙනා අතර කාමයන්ගෙන් කුමක් අග්‍රද යන මේ කථාව උපන.

'එහි සමහරු කාමවස්තූන්ගෙන් රූපයෝ අග්‍රවෙත්යයි කීහ. සමහරු කාමවස්තූන්ගෙන් ශබ්දයෝ අග්‍රවෙත්යයි කීහ. සමහරු කාමවස්තූන්ගෙන් ගන්ධයෝ අග්‍රවෙත්යයි කීහ. සමහරු

කාමවස්තූන්ගෙන් රසයෝ අග්‍රවෙත්යයි කීහ. සමහරු කාමවස්තූන්ගෙන් ස්පර්ශයෝ අග්‍රවෙත්යයිද' භාග්‍යවතුන් වහන්සේට කීයේය. ස්වාමීනි, කාමවස්තූන් අතරෙන් කුමක් නම් ප්‍රධානවේද?

5. "මහරජ, කාමවස්තූන් අතරෙන් යමක් යමෙකුට වඩා මනාපද, ඒ මනාපය සීමාකොට ඇති දේ අග්‍රයයි කියමි. මහරජ, ඇතැමෙකුට මනාපවූ එම රූපයෝම ඇතැමෙකුට මනාප නොවෙති. යමෙක් යම් රූපවලින් සතුටට පත්වේද, පිරිසිදු අදහස් ඇත්තේ වේද, ඔහු ඒ රූපවලට වඩා උසස්වූද ප්‍රණීතවූද අනික් රූපයක් නොපතයි. ඔහුට ඒ රූපයෝ අන් හැමටම වඩා උතුම් වෙති. ඒ රූපයෝ ඔහුට නිරුත්තර හැමවිටම වඩා උසස් වෙත්.

6. "මහරජ, ඇතැමෙකුට මනාපවූ ඒ ශබ්දයෝම ඇතැමෙකුට මනාප නොවෙති යමෙක් යම් ශබ්දවලින් සතුටට පත්වේද, පිරිසිදු අදහස් ඇත්තේ වේද, ඔහු ඒ ශබ්දවලට වඩා උසස්වූද, ප්‍රණීතවූද අනික් ශබ්දයක් නොපතයි. ඔහුට ඒ ශබ්දයෝ අන් හැමටම වඩා උතුම් වෙති.

7. "මහරජ, ඇතැමෙකුට මනාපවූ ඒ ගන්ධයෝම ඇතැමෙකුට මනාප නොවෙති. යමෙක් යම් ගන්ධවලින් සතුටට පත්වේද, පිරිසිදු අදහස් ඇත්තේ වේද, ඔහු ඒ ගන්ධවලට වඩා උසස්වූද, ප්‍රණීතවූද අනික් ගන්ධයක් නොපතයි. ඔහුට ඒ ගන්ධයෝ අන් හැමට වඩා උසස් වෙති.

8. "මහරජ, ඇතැමෙකුට මනාපවූ ඒ රසයෝම ඇතැමෙකුට මනාප නොවෙති. යමෙක් යම් රසවලින් සතුටට පත්වේද, පිරිසිදු අදහස් ඇත්තේ වේද, ඔහු ඒ රසවලට වඩා උසස්වූද, ප්‍රණීතවූද අනික් රසයක් නොපතයි. ඔහුට ඒ රසයෝ අන් හැමටම වඩා උතුම් වෙති.

9. "මහරජ, ඇතැමෙකුට මනාපවූ ඒ ස්පර්ශයෝම ඇතැමෙකුට මනාප නොවෙති. යමෙක් යම් ස්පර්ශවලින් සතුටට පත්වේද, පිරිසිදු අදහස් ඇත්තේවේද, ඔහු ඒ ස්පර්ශවලට වඩා

උසස්වූද, ප්‍රණීතවූද අනික් ස්පර්ශයක් නොපතයි. ඔහුට ඒ ස්පර්ශයෝ අන් හැමටම වඩා උතුම් වෙති”යි වදාළේය.

10. එකල්හි චන්දනඞ්ගලික නම් උපාසකයා ඒ පිරිසෙහි හුන්නේ වෙයි. ඉක්බිති චන්දනඞ්ගලික උපාසක තෙමේ අසුනෙන් නැගිට උතුරුසළුව එකාංශකොට ඇඳිලිබැඳ භාග්‍යවතුන් වහන්සේ වැඳ, “ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මට කරුණක් වැටහේ. සුගතයන් වහන්ස, මට කරුණක් වැටහේ” යයි භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

“චන්දනඞ්ගලිකය, ඒ ඔබට වැටහේවා, වැටහුන දේ කියාවා”යි භාග්‍යවතුන් වහන්සේ වදාළේය.

11. එකල්හි චන්දනඞ්ගලික උපාසකතෙමේ භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි තම වැටහීමට එකඟවූ ගාථාවකින් ප්‍රශංසා කෙළේය.

> “කොකනද නම් රත් පියුම අළුයම පිපුණේ යම් සේ සුවඳින් යුක්තවේද, එමෙන් ගුණ සුවඳින් යුක්තවූද අහසෙහි බබළන හිරු මෙන් දිලිසෙන්නාවූ අංගීරසයන් (ශරීරයෙන් කාන්ති විහිදුවන්නාවූ බුදුරජානන්වහන්සේ) දෙස බලන්න.”

12. එවිට ඒ රජවරු පස්දෙන චන්දනඞ්ගලික උපාසකයාට උතුරුසළු පසක් තෑගි කළහ. එවිට චන්දනඞ්ගලික උපාසක ඒ උතුරුසළු පස භාග්‍යවතුන්වහන්සේට පිදුවේය.

---

## 3. දොණපාක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එසමයෙහි පසේනදි කොසොල් රජ සහල් ද්‍රොණයක පිසූ බත (ද්‍රොණයක් නම් නැළි හතරකි) කෑම කරයි. දිනක් කොසොල් රජ බත් කෑමෙන් පසු මහන්සියෙන් ආශ්වාස ප්‍රශ්වාස

කරමින් භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පස්ව හිඳගත්තේය.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බොහෝකොට අනුභව කිරීමෙන් මහන්සියෙන් හුස්ම ගන්නාවූ පසේනදි කොසොල් රජ දැක එවේලෙහි මේ ගාථාව වදාළසේක.

> "හැම වේලෙහි සිහියෙන් යුක්තවූද, ලද ආහාරයෙහි පමණ දැන කෑම කන්නාවූද මිනිසාගේ දුක් වේදනා තුනී වෙති. ඒ ආහාරයද ආයුෂ පාලනය කරමින් වහා දිරවනු ලැබේ."

4. එකල සුදස්සන නම් මානවකයා රජ පිටිපස සිටියේ වේ. ඉක්බිති කොසොල් රජ සුදස්සන මානවකයාට කථාකර 'දරුව, සුදස්සනය, නුඹ මේ ගාථාව භාග්‍යවතුන් වහන්සේගෙන් ඉගෙණගෙණ, මා බත් කන තැනදී කියන්න. මම නුඹට දිනපතා කහවණු සියය බැගින් නිති වැටුපක් පවත්වන්නෙමි'යි කීයේය. 'දෙවයන් වහන්ස, එසේය'යි සුදස්සන මානවකයා පසේනදි කොසොල් රජුට පිළිතුරුදී, භාග්‍යවතුන් වහන්සේ වෙත මේ ගාථාව පුහුණුකොට, පසේනදි කොසොල් රජ බත් කන තැනදී නොවරදවා කියයි.

> "හැම වේලෙහි සිහියෙන් යුක්තවූද, ලද ආහාරයෙහි පමණ දැන කෑම කන්නාවූද, මිනිසාගේ දුක් වේදනා තුනී වෙති. ඒ ආහාරයද ආයුෂ පාලනය කරමින් වහා දිරවනු ලැබේ."

5. ඉන්පසු පසේනදි කොසොල් රජ ක්‍රමයෙන් (අඩු කොට) සහල් නැළියක බත් වැඩියම කන තරම්හි සිටියේය. එකල කොසොල් රජ ඉන්පසු සැහැල්ලු ශරීර ඇත්තේ අත්ලෙන් ශරීරාවයව පිරිමදිමින් එවේලෙහි මේ ප්‍රීති වාක්‍යය පහළ කෙළේය. "ඒ භාග්‍යවතුන් වහන්සේ මට මෙලෝ පරලෝ යන දෙලොවම වැඩෙන් අනුකම්පා කළසේක."

---

## 4. සඞ්ගාමවත්ථු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල්හි මගධරට රජවූ වේදෙහිපුත්ත අජාසත් රජ සිවුරඟ සෙනඟ සරහා කොසොල් රජුට විරුද්ධව යුද පිණිස කසීරට වෙත ගියේය. පසේනදි කොසොල් රජද මගධාධිපති අජාසත් රජ සිවුරඟ සෙනඟ සරසාගෙණ මට විරුද්ධව කසීරට වෙත ආයේයයි ඇසීය.

3. පසේනදි කොසොල් රජද සිවුරඟ සෙනග සරසා ගෙණ අජාසත් රජුට විරුද්ධව සටන් පිණිස කසීරටට ගියේය. ඉන්පසු මගධරට රජවූ වේදෙහිපුත්ත අජාසත් රජද, පසේනදි කොසොල් රජද යුද්ධ කළාහුය. ඒ යුද්ධයෙහිදී මගධරට රජවූ වේදෙහිපුත්ත අජාසත් රජ පසේනදි කොසොල් රජුන් පැරදවිය. පැරදී පසේනදි කොසොල් රජ සිය රාජධානියවූ සැවැත් නුවරට පසුබැස ගියේය.

4. එකල බොහෝ භික්ෂූහු පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙණ පිඬු පිණිස සැවැත් නුවරට වැඩ පසුබත් කල්හි පිණ්ඩපාතයෙන් පෙරළා ආවාහු භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැනට පැමිණියෝය. පැමිණ, වැඳ, එකත්පස්ව හිඳ භාග්‍යවතුන් වහන්සේට මෙය කීහ.

"ස්වාමීනි, මෙහි මගධරට රජවූ වේදෙහිපුත්ත අජාසත් රජ සිවුරඟ සෙනග සරසාගෙණ පසේනදි කොසොල් රජුට විරුද්ධව සටන් පිණිස කසීරටට ගියේය. පසේනදි කොසොල් රජද 'මගධරට වේදෙහිපුත්ත අජාසත් රජ සිවුරඟ සෙනග සරහාගෙන මට විරුද්ධව යුද පිණිස කසීරටට ආවේයයි' ඇසීය. ඉක්බිති පසේනදි කොසොල් රජද සිවුරඟ සෙනග සරසාගෙන මගධරට රජවූ වේදෙහිපුත්ත අජාසත් රජුට විරුද්ධව යුද පිණිස කසීරටට ගියේය. ඒ දෙදෙන එහි යුද කළහ. ඒ යුදෙහි මගධරට රජවූ වේදෙහිපුත්ත අජාසත් රජ පසේනදි කොසොල් රජ පැරදවිය. ස්වාමීනි, පැරදුනාවූ පසේනදි කොසොල් රජ සිය රාජධානියවූ සැවැත් නුවරට පසුබැස ආවේය" යනුයි.

5. "මහණෙනි, මගධරට රජවූ වේදෙහිපුත්ත අජාසත් රජ පව්කාර මිත්‍රයන් ඇති, පව්කාර යහළුවන් ඇති, පව්කාරයන්ටම නැමුණු කෙනෙක. එහෙත් මහණෙනි, පසේනදි කොසොල් රජ කල්‍යාණ මිත්‍රයන් ඇති, කල්‍යාණ යහළුවන් ඇති, යහපතටම නැමුණු කෙනෙක. මහණෙනි, අද මේ රැය පැරදුනු පසේනදි කොසොල් රජ දුකසේ සයනය කරන්නේය.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාරා මේ ගාථාවද වදාළේය.

"දිනන තැනැත්තේ වෛරය (සතුරන්) රැස් කරන්නේය. පැරදුන තැනැත්තේ දුකසේ වසන්නේය. දිනුම් පැරුදුම් දෙකම හැරදමා (කෙලෙස් දුරලීමෙන්) සන්සුන් තැනැත්තේ සැපසේ වසන්නේය."

---

## 5. සඞ්ගාමවත්ථු සූත්‍රය. ii

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල්හි මගධරට රජවූ වේදෙහිපුත්ත අජාසත් රජ සිවුරඟ සෙනග සරහාගෙන පසේනදි කොසොල් රජුට විරුද්ධව කසීරටට ගියේය. පසේනදි කොසොල් රජද මගධ රට රජවූ වේදෙහිපුත්ත අජාසත් රජ සිවුරඟ සෙනඟ ගෙන මට විරුද්ධව කසී රටට ආවේය'යි ඇසීය.

3. ඉක්බිති පසේනදි කොසොල් රජද සිව්රඟ සෙනග සරහා ගෙන මගධරට රජවූ වේදේහපුත්ත අජාසත් රජුට විරුද්ධව කසීරටට ගියේය. එකල මගධරට රජවූ වේදේහ පුත්ත අජාසත් රජද, පසේනදි කොසොල් රජද යුද්ධ කළාහුය. ඒ යුද්ධයෙහිදී පසේනදි කොසොල් රජ මගධරට වේදේහපුත්ත අජාසත් රජුන් පැරද වීය. ඒ අජාසත් රජ පණපිටින් අල්වාගත්තේද වේ

4. එවිට කොසොල් රජුට මේ සිත විය. මේ මගධ රට රජවූ වේදේහ පුත්ත අජාසත් රජ ද්‍රෝහ නොකරන්නාවූ මට

ද්‍රෝහ කරන්නේවී නමුත් ඔහු මගේ බෑනා වෙයි. එහෙයින් මම මේ මගධරට රජවූ වේදේහපුත්ත අජාසත් රජුගේ මුළු ඇත් සෙනඟද අල්වාගෙන, අස් සෙනඟද අල්වාගෙන, රිය සෙනඟද අල්වාගෙන, පාබල සෙනඟද අල්වාගෙන, ඒ අජාසත් රජ පමණක් පණපිටින් මුදාහරින්නෙමි නම් මැනවැයි' කියායි.

**5.** ඉක්බිති පසේනදි කොසොල් රජ මගධරට රජවූ වේදෙහපුත්ත අජාසත් රජුගේ මුළු ඇත්සෙනඟද අල්වාගෙන, අස් සෙනඟද අල්වාගෙන, රිය සෙනඟද අල්වාගෙන, පාබල සෙනඟද අල්වාගෙන, අජාසත්රජ පණපිටින් මුදාහැරියේය.

**6.** එකල බොහෝ භික්ෂූහු පෙරවරු කාලයෙහි හැඳ පොරවා පා සිවුරු ගෙණ, පිඬු පිණිස සැවැත් නුවරට පිවිස බතින් පසු පිණ්ඩපාතයෙන් පෙරළා ආවාහු, භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියෝය. පැමිණ වැඳ, එකත්පස්ව හිඳ භාග්‍යවතුන් වහන්සේට මෙය කීහ.

"ස්වාමීනි, මෙහි මගධරට රජවූ වේදේහපුත්ත අජාසත් රජ සිවුරඟ සෙනඟ සරහාගෙණ පසේනදි කොසොල් රජුට විරුද්ධව කසීරටට ගියේය. පසේනදී කොසොල් රජද මගධ රට රජවූ වේදේහපුත්ත අජාසත් රජ සිවුරඟ සෙනඟ ගෙන මට විරුද්ධව කාසියට ආවේයයි' ඇසීය.

**7** ඉක්බිති පසේනදි කොසොල් රජද සිව්රඟ සෙනඟ සරහාගෙන මගධරට රජවූ වේදේහපුත්ත අජාසත් රජුට විරුද්ධව කසීරටට ගියේය. එකල මගධරට රජවූ වේදේහ පුත්ත අජාසත් රජද පසේනදි කොසොල් රජද යුද්ධකළාහුය. ඒ යුද්ධයෙහිදී පසේනදි කොසොල්රජ මගධරට රජවූ වේදේහ පුත්ත අජාසත් රජුන් පැරදවිය. ඒ අජාසත් රජ පණපිටින් අල්වාගත්තේද වේ.

**8.** එවිට කොසොල් රජුට මේ සිත විය: මේ මගධරට රජවූ වේදේහපුත්ත අජාසත් රජ ද්‍රෝහ නොකරන්නාවූ මට ද්‍රෝහ කරන්නේවී නමුත් ඔහු මගේ බෑනා වෙයි. එහෙයින් මම මේ මගධරට රජවූ වේදේහපුත්ත අජාසත් රජුගේ මුළු ඇත් සෙනඟද අල්වාගෙන, අස් සෙනඟද අල්වාගෙන, රිය සෙනඟද

අල්වාගෙන, පාබල සෙනඟද අල්වාගෙන ඒ මගධ රට රජවූ වේදේහපුත්ත අජාසත් රජ පමණක් පණපිටින් මුදාහරින්නෙම් නම් මැනවැයි' කියායි.

**9.** ඉක්බිති පසේනදි කොසොල් රජ මගධරට රජවූ වේදේහපුත්ත අජාසත් රජුගේ මුළු ඇත් සෙනඟ අල්වාගෙන, අස් සෙනගද අල්වාගෙන, රිය සෙනඟද අල්වාගෙන, පාබල සෙනඟද අල්වාගෙන අජාසත් රජ පණපිටින් මුදා හැරියේය" යනුයි.

එවිට භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ දැන එවේලෙහි මේ ගාථාවන් වදාළේය.

"මිනිස් තෙමේ තමහට හැකිතාක් කල් අනුන් පෙළයි. යම් විටක අන්‍යයෝ ඔහු පෙළත්ද, එකල අනුන් විසින් ඔහු පෙළනු ලබන්නේ වේ. යම්තාක් කල් පව පල නොදේද, ඒතාක් අඥානයා එය සතුටට කරුණක් සේ සිතයි. යම් විටක පව විපාක දෙන්ට පටන්ගනීද, එකල ඒ අඥානයා දුකට පැමිණේ. අනුන් පෙළන්නා තමන් පෙළන්නෙකුත් ලබයි. අනුන් පරදවන්නා තමුන් පරදවන්නෙකුත් ලබයි. අනුන්ට බණින්නා තමුන්ට බණින්නෙකුත් ලබයි. අනුන්ට රොස් කරන්නා තමුන්ට රොස් කරන්නෙකුත් ලබයි. නැවත මේ කර්මය පෙරළි පෙරළී මුහුකුරා යාමෙන් ඒ පීඩකයා පීඩිතද වේ.

---

## 6. ධීතු සූත්‍රය

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

**2.** එකල පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැනට පැමිණියේය. පැමිණ වැඳ එකත්පසෙක හුන්නේය. එවිට එක්තරා මිනිසෙක් කොසොල් රජ යම් තැනකද

එතැනට පැමිණියේය. පැමිණ රජුගේ කණට කොඳුරා රහසින්, ‘මල්ලිකා දේවි දුවක් වැදුවා යයි’ කීයේය. මෙසේ කීකල කොසොල් රජ නොසතුටු සිත් ඇත්තේ විය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කොසොල් රජ නොසතුටට පැමිණියවුන් දැන එවේලෙහි මේ ගාථා වදාළේය.

3. “රජතුමනි, ඇතැම් ස්ත්‍රීහු පිරිමින්ට වඩා ශ්‍රෙෂ්ඨවෙති. නුවණැත්තෝද, සිල්වත්ද, සැමියා දේවතාකොට ඇත්තෝද, පතිවත රක්නෝද වෙති. එහෙයින් ඔවුන් පොෂණය කරණු මැන. ඇයට යම් පුතෙක් උපදීද ඔහු ශූරවෙයි, දික්පති (දිසාවට අධිපති) වෙයි. එබඳු වාසනාවන්තියගේ පුත්‍රයා රජකම් පවා කරන්නේය.”

---

## 7. පඨමප්පවාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල පසේනදි කොසොල්රජ භාග්‍යවතුන්වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එකත් පසෙක හුන් පසේනදි කොසොල් රජ “ස්වාමීනි, මෙලොව අභිවෘද්ධියද පරලොව අභිවෘද්ධියද යන දෙයාකාර අර්ථසිද්ධියම ගෙණ දෙන එක් දෙයක් ඇත්තේදැයි” භාග්‍යවතුන් වහන්සේගෙන් විචාළේය.

“මහරජ, මෙලොව අභිවෘද්ධියද, පරලොව අභිවෘද්ධියද යන දෙවැදෑරුම් අභිවෘද්ධියම ඇතිකරණ එක් දෙයක් ඇත්තේය.” “ස්වාමීනි, මෙලොව අභිවෘද්ධියද පරලොව අභිවෘද්ධියද යන දෙවැදෑරුම් අභිවෘද්ධියම ඇති කරණ එක් දෙය කිමෙක්ද?”

3. “මහරජ, අප්පමාදයයි (එළඹසිටි සිහි ඇති බව) නම්වූ එකම දේ මෙලොව අභිවෘද්ධියද පරලොව අභිවෘද්ධියද යන දෙයාකාර අභිවෘද්ධියම ගෙනදෙන එක දෙයයි. මහරජ, ඇවිදින

කොයි සතුන්ගේත් පියවර හෙවත් පා සටහන් ඇත් පියවර ඇතුළතම යම්සේ පිහිටත්ද, ඒ ඇත් පියවර මහත් බැවින් ඒ හැම පියවරට වඩා අග්‍රයයි කියනු ලැබේද, එමෙන්ම මේ අප්පමාද නම් එකම ධර්මය මෙලෝ පරලෝ යන දෙවැදෑරුම් අභිවෘද්ධියම හොඳාකාර දරා සිටී.

4. "ආයුෂද, නිරෝගි බවද, ලක්ෂණද, සැපයෙන් අග්‍ර බවද, උසස් කුලයෙහි ඉපදීමද, කුදුමහත් උදාර සම්පත්තීන්ද පතන්නා විසින් පින්දහම් කිරීමෙහි නොපමාව පුරුදුකළ යුතුයයි (බුද්ධාදි) පණ්ඩිතයෝ පසසා පවසති. (පින් දහම්හි) නොපමාවූ නුවණැත්තේ දෙලෝ වැඩම සිද්ධකර ගනී. මෙලොව යම් අභිවෘද්ධියක් ඇද්ද, පරලොව යම් වැඩකුත් ඇද්ද මෙකී දෙවැඩම අත්කර ගන්නා බැවින් ධෘතිමත් (ස්ථිර) පුද්ගලයා පණ්ඩිතයා යයි කියනු ලැබේ."

---

## 8. දුතිය ප්පමාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල්හි පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්ව හුන්නේය. එකත් පසෙක හුන් පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. "ස්වාමීනි, විවේකීව හුදකලාව හුන් මට මේ සිත විය. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය යහපත්සේ දෙසන ලද්දේය. හෙද යහපත් මිත්‍රයන් ඇත්තාටය. යහපත් යහළුවන් ඇත්තාටය, යහපතට නැමුණු තැනැත්තාටය, පාප මිත්‍රයන් ඇත්තාට නොවේ. පාප යහළුවන් ඇත්තාට නොවේ. පවට නැමුණහට නොවේ"යි කියායි.

3. "මහරජ, ඒ එසේය. මහරජ ඒ එසේය. මහරජ, මවිසින් ධර්මය මනාකොට දෙසන ලදී. හෙද යහපත් මිතුරන් ඇත්තාටය,

යහපත් යහළුවන් ඇත්තාටය, යහපතට නැමුණු තැනැත්තාටය, පාප මිත්‍රයන් ඇත්තාට නොවේ. පාප යහළුවන් ඇත්තාට නොවේ. පවට නැමුණු තැනැත්තාට නොවේ.

**4.** "මහරජ, මම එක්වතාවකදී, ශාක්‍ය ජනපදයෙහි ශාක්‍ය රජ දරුවන්ගේ නාගරක නම් නියම්ගම්හි වාසය කරමි. මහරජ, එවිට ආනන්ද භික්ෂු මා යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ වැඳ එකත්පස්ව හිඳ ආනන්ද භික්ෂුව මෙසේ කීයේය. ස්වාමීනි, යහපත් මිතුරන් ඇති බව යහපත් යහළුවන් ඇති බව යහපතට නැමුණු බව මේ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාවෙන් බාගයක්සේ සලකමියි."

**5.** මහරජ, මෙසේ කියනු ලැබූ මම, ආනන්ද භික්ෂුවට මෙය කීමි. "ආනන්දය, මෙසේ නොකියව, ආනන්දය මෙසේ නොකියව. ආනන්දය, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව එහෙම පිටින්ම යහපත් මිතුරන් ඇති බවය, යහපත් යහළුවන් ඇති බවය. යහපතට නැමුණු බවය. යහපත් මිතුරන් ඇත්තා, යහපත් යහළුවන් ඇත්තා, යහපතට නැමුණු තැනැත්තා ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය භාවනා වශයෙන් වඩන්නේය, නැවත නැවත බහුල වශයෙන් සිත් සතන්හි පුරුදු කරන්නේය. යන මේ කරුණ යහපත් මිතුරන් ඇති භික්ෂුව විසින් බලාපොරොත්තු විය යුත්තකි.

**6.** "ආනන්දයෙනි, යහපත් මිතුරන් ඇති, යහපතට නැමුණු භික්ෂුව කෙසේනම් ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය වඩන්නේ ද? කෙසේ නම් ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය බහුල වශයෙන් දියුණු කරන්නේ ද?"

**7.** "ආනන්දය, මේ ශාසනයෙහි භික්ෂුතෙමේ කෙලෙසුන්ගෙන් වෙන්වීම යයි කියන ලද විවේකය ඇසුරු කළ, කෙලෙසුන් නැති කිරීමයයි කියන ලද නිරෝධය ඇසුරු කළ, කෙලෙසුන් හැරදැමීමයයි කියන ලද නිස්සග්ගය කරා නැමුණු සම්මාදිට්ඨිය යහපත් දැකීම වඩයි. යහපත් කල්පනාව වඩයි, යහපත් වචනය වඩයි, යහපත් කර්ම වඩයි, යහපත් දිවිපැවතුම වඩයි, යහපත් උත්සාහය වඩයි, යහපත් සිහිය වඩයි,

යහපත් සමාධිය (භාවනාව) වඩයි. ආනන්දය, යහපත් මිතුරන් ඇති භික්ෂු මෙසේ ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්ගය වැඩිදියුණු කරන්නේය, භාවනා වශයෙන් නැවත නැවත පුහුණු කරන්නේය."

8. "ආනන්දය, මේ ක්‍රමයෙන්ද මේ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව මුළුමනින්ම යහපත් මිතුරන් ඇති බවය, යහපත් යහළුවන් ඇති බවය, යහපතට නැමුණු බවය යනු දත යුතුයි. ආනන්දය කළණ මිත්වූ මා වෙත පැමිණ උත්පත්තිය ස්වභාවකොට ඇති සත්වයෝ උත්පත්තියෙන් මිදෙති. ජරාව ස්වභාව කොට ඇති සත්වයෝ ජරාවෙන් මිදෙති ලෙඩ ස්වභාව කොට ඇති සත්වයෝ ලෙඩින් මිදෙති. මරණය ස්වභාව කොට ඇති සත්වයෝ මරණින් මිදෙති. ශොක කිරීම්, හැඬීම්, කායික දුක්, මානසික දොම්නස්, දැඩි ආයාස, යන මේ ස්වභාව කොට ඇති සත්වයෝ ශෝකයෙන්, ඇඬීමෙන්, කායික දුකින්, මානසික දොම්නසෙන්, දැඩි ආයාසයෙන් මිදෙති. ආනන්දය, මේ ක්‍රමයෙන් ද ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව මුළු මණින්ම යහපත් මිතුරන් ඇති බවය, යහපත් යහළුවන් ඇති බවය, යහපතට නැමුණු බව යයි දත යුතුයි."

9. "මහරජ, එහෙයින් මේ කරුණෙහිලා ඔබ විසින්ද මෙසේ හික්මිය යුතුයි. 'යහපත් මිතුරන් ඇත්තෙක්, යහපත් යහළුවන් ඇත්තෙක්, යහපත් නැමුනෙක් වෙමි' කියායි, මහරජ, ඔබ විසින් මෙලෙසින්ම හික්මිය යුතුයි. එනම් යහපත් මිතුරන් ඇති, යහපත් යහළුවන් ඇති, යහපතට නැමුණු ඔබ විසින් කුසල් දහම්හි අප්පමාදය යන මේ එකම ධර්මය ඇසුරුකොට වාසය කට යුතුය යනුයි."

10. "මහරජ, නොපමාව අප්පමාදය ඇසුරුකොට වසන ඔබගේ ස්ත්‍රී නිවාසයටද මෙසේ සිත් වන්නේය. "රජ තෙමේ අප්පමාදය ඇසුරුකොට අප්‍රමත්තව වසයි. එබැවින් අපිදු අප්පමාදය ඇසුරුකොට අප්‍රමත්තව වසමු' කියයි

11. "මහරජ, අප්පමාදය ඇසුරුකොට අප්‍රමත්තව වසන ඔබගේ අගනුවර රජුන්ටද මෙසේ සිත් වන්නේය. 'රජ තෙමේ

අප්පමාදය ඇසුරුකොට අප්‍රමත්තව වසයි. එබැවින් අපිදු අප්පමාදය ඇසුරුකොට අප්‍රමිත්තව වසමු." කියායි.

12. "මහරජ, අප්පමාදය ඇසුරුකොට අප්‍රමත්තව වසන ඔබගේ බල සෙනඟටද මෙසේ සිත් වන්නේය. රජ තෙමේ අප්පමාදය ඇසුරුකොට අප්‍රමත්තව වෙසෙයි. එබැවින් අපිදු අප්පමාදය ඇසුරුකොට අප්‍රමත්තව වසමු" කියායි.

13. "මහරජ, නොපමාව වසන ඔබගේ නියම්ගම් දනව් වැස්සන්ටද මෙසේ සිත්වන්නේය. "රජ අප්පමාදය ඇසුරු කොට නොපමාව වසයි. එහෙයින් අපිදු නොපමාව අප්පමාදය ඇසුරුකොට වසමු" කියායි.

14. "මහරජ, අප්පමාදය ඇසුරු කොට නොපමාව වසන ඔබගේ (ආත්මයද) තමා ගෝපිත වූයේ රැකුනේ වෙයි. ස්ත්‍රී නිවාසයද රැකුනේ වෙයි. ධන ගබඩා ධාන්‍ය ගබඩාද රක්ෂිත සුරක්ෂිත වෙති.

> 15. "නොයෙක් ආකාර මහත් භෝග සම්පත් පතන්නා විසින් පින්කම්හි නොපමාව පුහුණු කට යුතු යයි, පණ්ඩිතයෝ පසසා පවසති. කුසල් දහම්හි නොපමාව නුවණැත්තා මෙලෝ වැඩද පරලෝ වැඩද යන දෙයාකාර අභිවෘද්ධිය ලැබගනී. දෙලෝ වැඩම සිද්ධකර ගන්නා කාරණයෙන් ඒ ධීමතා පණ්ඩිතයයි කියනු ලැබේ"

---

## 9. පඨමාපුත්තක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි කලන්දක නිවාප නම්වූ වේළුවනයෙහි වැඩවසන සේක.

2. එකල්හි පසේනදි කොසොල් රජ මැදුම් දවල් භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්ව හුන්නේය. භාග්‍යවතුන්

වහන්සේ, එකත්පස්ව හුන් පසේනදි කොසොල් රජුගෙන් "මහරජ, ඔබ මේ මැදුම් දවල් කොහි සිට එහිදැ"යි ඇසීය.

3. "ස්වාමීනි, මෙහි සැවැත් නුවර සිටු ගෘහපතියා මැරුණේය. මම ඔහුගේ ඒ දරුවන් නැති වස්තුව ඇතුළු නුවරට හැර යවා එමි. ස්වාමීනි, රන් (කහවනු) කාසිම අසූ ලක්ෂයකි. රිදී කාසි ගැන කියනුම කවරේද? ස්වාමීනි, ඒ සිටු ගෘහපතියාගේ බත් කෑම මෙසේ වෙයි. 'මිරිස් හොදි සමග නිවුඩු හාලේ බත කයි. ඇඳුම් හැඳීම මෙසේ වෙයි. තුන් කඩක් එකට මූට්ටු කළ හණවැහැරියක් අඳියි, යාන පරිභෝගය මෙබඳු වූවක් වෙයි. කොළ කුඩයක් (තල අත්තක්) ඉහලමින් දිරාගිය රථයෙන් යයි."

4. මහරජ, ඒ එසේය, මහරජ, ඒ එසේය. මහරජ, අසත්පුරුෂයා වනාහි මහත් වස්තුව ලැබ තමන්ද සැපවත් නොකෙරෙයි. නොම පිණවයි. මව්පියන්ද සැපවත් නොකෙරෙයි. නොම පිණවයි දස් කම්කරු මිනිසුන්ද (වැඩකාරයින්ද) සැපවත් නොකෙරෙයි. නොම පිණවයි. මිත්‍රාමාත්‍යයන්ද (වැඩපොල කරදෙන යහළුවන්ද) සැපවත් නොකරයි. නොම පිණවයි. මහණ බමුණන් විෂයෙහිද මතු සැප ගෙනදෙන, සුගතියට හිතවත්වූ, සැප විපාක ගෙන දෙන, දිව්‍යලෝකයේ උප්පත්තිය ඇතිකරණ දාන නොම පිහිටවයි. මෙසේ හොඳින් පරිභොග නොකරන්නාවූ ඔහුගේ ඒ ධනය රජවරු හෝ පැහැර ගනිති. හොරු හෝ ගෙන යති. ගින්න හෝ දවයි. ජලය හෝ පාකර හරියි. මව්පියන්ද සැපවත් නොකෙරෙයි. නොම පිණවයි; අඹුදරුවන්ද සැපවත් නොකෙරෙයි. නොම පිණවයි. දස් කම්කරු මිනිසුන්ද සැපවත් නොකෙරෙයි. නොම පිණවයි. වැඩපොල කරදෙන යහළුවන්ද අප්‍රිය නෑයෝ හෝ හැරගෙන යති. මහරජ, මෙසේ ඇතිකල්හි හොඳින් පරිභොග නොකරණ වස්තු විනාශයට යති. පරිභෝගයට (පාවිච්චියට) නොයති.

5. "මහරජ, යම්සේ නම් අමනුෂ්‍යාධිගෘහිත ස්ථානයෙක්හිවූ ප්‍රසන්න ජලය ඇති, ශීතල ජලය ඇති, රසවත් ජලය ඇති, සුදු වැලිතලා ඇති, මනාව පිහිටි තොටුපල ඇති මනොඥවූ පොකුණක් වේද, එහි ජලය මහජනයා පරිභෝගයට නොම

ගෙණ යන්නේය, නොබොන්නේය. නොනාන්නේය, ඒ ජලයෙන් රිසිවූ කිසිවක් නොකරන්නේය. මෙසේ ඇතිකල්හි, මහරජ, ඒ ජලය හොඳින් පාවිච්චි නොකරණු ලබන්නේ ක්ෂයව යයි, පරිභෝගයට නොයයි.”

**6.** “මහරජ, එසේම අසත්පුරුෂයා මහත් භෝගවස්තු ලැබ තමන් සැපවත් නොකෙරේ. නොම පිණවයි. මව්පියන්ද සැපවත් නොකෙරෙයි. නොමපිණවයි. අඹුදරුවන්ද සැපවත් නොකෙරෙයි. නොම පිණවයි. දස් කම්කරු මිනිසුන්ද සැපවත් නොකෙරෙයි. නොමපිණවයි. වැඩපොල කරදෙන යහළුවන්ද අප්‍රිය නෑයෝ හෝ හැරගෙන යති. මෙසේ ඇතිකල්හි ඒ වස්තු හොඳින් පාවිච්චි නොකරනු ලබන්නෝ විනාශයට පැමිණෙති. පරිභෝගයට නොපැමිණෙති.”

**7.** “මහරජ, සත්පුරුෂයා වනාහි මහත් භෝග සම්පත් ලැබ තමන් සුවපත් කෙරෙයි. පිනවයි. මව්පියන් සැපවත් කෙරෙයි, පිනවයි අඹුදරුවන් සැපවත් කෙරෙයි, පිනවයි. දස් කම්කරු පුරුෂයන් සැපවත් කෙරෙයි, පිනවයි වැඩපොල කරදෙන යහළුවන් සැපවත් කෙරෙයි, පිනවයි. මහණ බමුණන් විෂයෙහි මතු කල සැප ගෙනදෙන, සුගතියට හිතවත්වූ, සැප විපාක ඇතිකරණ, සඟසැප පිණිස පවත්නා දාන පිහිටවයි. මෙසේ යහපත්ව පරිභෝග කරනු ලබන ඔහුගේ ඒ වස්තු රජවරු හැර නොගනිත්. හොරු නොගෙනියත්. ගින්න නොදවයි. ජලය හෝ පාකොට නොහරියි අප්‍රිය නෑයෝ නොගෙනියත්. මහරජ, මෙසේ ඇතිකල්හි මනා කොට පාවිච්චිකරනු ලබන්නාවූ ඒ සම්පත් පරිභෝගයට පැමිණෙති. (නිකරුණේ) විනාශයට නොපැමිණෙති.

**8.** “මහරජ, යම්සේ නම් ගමක් හෝ නියම්ගමක් සමීපයෙහි පහන් දිය ඇති, සිහිල් දිය ඇති, රසවත් දිය ඇති; සුදු වැලිතලා ඇති, මනාව පිහිටි තොටුපල ඇති, මනොඥවූ පොකුණක් වේද, එහි දිය ජනයා සිත්සේ ගෙණයන්නේද, බොන්නේද, නහන්නේද, රුචිසේ පාවිච්චි කරන්නේද වෙයි. මහරජ, මෙසේ ඒ ජලය මනාව පරිභෝග කරනු ලබන්නේ පරිභෝගයට පැමිණෙයි. නිකරුණේ විනාශයට නොපැමිණෙයි.

9. "මහරජ, එසේම නුවණැති සත්පුරුෂයා මහත් සම්පත් ලැබ තමන් සැපවත් කෙරෙයි. පිනවයි. මව්පියන් සැපවත් කෙරෙයි, පිනවයි. අඹුදරුවන් සැපවත් කෙරෙයි. පිනවයි. දැස් කම්කරු පුරුෂයන් සැපවත් කෙරෙයි, පිනවයි, වැඩපොල කරදෙන යහළුවන් සැපවත් කෙරෙයි පිනවයි. මහණ බමුණන් විෂයෙහි මතුකල සැප ගෙණදෙන, සුගතියට හිතවත්වූ, සැප විපාක ඇතිකරණ, සඟ සැප පිණිස පවත්නා දාන පිහිටවයි. මෙසේ යහපත්ව පරිභෝග කරනු ලබන ඔහුගේ ඒ වස්තු රජවරු හැර නොගනිත්. හොරු නොගෙනියත්. ගින්න නොදවයි. ජලය හෝ පාකොට නොහරියි. අප්‍රිය නෑයෝ නොගෙනියත්. මහරජ, මෙසේ ඇතිකල්හි මනාකොට පාවිච්චිකරනු ලබන්නාවූ ඒ සම්පත් පරිභෝගයට පැමිණෙති. (නිකරුණේ) විනාශයට නොපැමිණෙති. මෙසේ ඇතිකල්හි ඒ භෝගයෝ මනාව පරිභෝග කරනු ලබන්නෝ පරිභෝගයට භුක්තිවිඳීමට පැමිණෙති, නිකරුණේ විනාශයට නොපැමිණෙති.

10. "අමනුෂ්‍යාධිගෘහිත ස්ථානයෙක්හි පිහිටි දිය නොබීම යම්සේ නිකරුණේ වියලීයාද, එමෙන් නින්දිත පුරුෂයා ධනය ලැබ තමනුත් පරිභෝග නොකරති. අනුන්ටත් නොදෙයි. නුවණැති පණ්ඩිත යම් පුද්ගලයෙක් වේද, හෙතෙමේ සම්පත් ලැබ තමනුත් පරිභෝග කෙරෙයි. කටයුතු දේත් කරයි. ඒ උතුම් පුද්ගලයා නෑ සමූහයාද පෝෂණය කොට ප්‍රශංසා ලබා මරණින් පසු සුගතියට පැමිණේ.

---

## 10. දුතියාපුත්තක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල්හි පසේනදි කොසොල්රජ මැදුම් දවල් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ

භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්ව හුන්නේය. එකත්පස්ව හුන් පසේනදි කොසොල් රජුගෙන්, "මහරජ, මේ මැදුම් දවල් ඔබ කොහි සිට එහිදැ"යි භාග්‍යවත්හු විචාළෝය.

3. "ස්වාමීනි, මෙහි සැවැත්නුවර සිටු ගෘහපතියා මැරුණේය. දරුවන් නැති ඔහුගේ ඒ වස්තුව මම ඇතුළු නුවරට යවා එමි. ස්වාමීනි, රන්කාසිම (කහවණු) ලක්ෂ සියයකි. රිදීකාසි ගැන කියනුම කවරේද? ස්වාමීනි, ඒ සිටු ගෘහපතියාගේ බත් කෑම මෙසේය. 'මිරිස් හොදි සහිත නිවුඩුහාලේ බත කයි.' ඇඳුම් ඇඳීම මෙසේයි: තුන්කඩක් එකට මූට්ටුකළ හනවහැරියක් හඳියි. රථ පරිභෝගය මෙසේයි: කොළ කුඩයක් (තල අත්තක්) ඉහලමින් පරණ කරත්ත කබලකින් යයි."

4. "මහරජ, ඒ එසේය. මහරජ, ඒ එසේය. පෙර වූවක් කියමි. මහරජ, ඒ සිටුගැහැවියා තගරසිඛී නම් පසේ බුදුන්ට පිණ්ඩපාත දානයක් දෙවීය. ශ්‍රමණයාට පිණ්ඩදානය දෙවිය කියා හුනස්නෙන් නැගිට ගියේය. එසේ දී පසුව මේ දුන් පිණ්ඩපාතය මගේ දාසයෝ හෝ කම්කරුවෝ කෑවාහු නම් වඩා හොඳයයි සිතමින් පසුතැවිලි වූයේය. සහෝදරයාගේ එකම පුතාද වස්තුව හේතුකොටගෙණම මැරවීය.

5. "මහරජ, සිටු ගෘහපතියා යම්හෙයකින් තගරසිඛී පසේ බුදුන්ට පිණ්ඩපාතය දෙව්ද, ඒ කර්මයාගේ විපාකයෙන් සත්වරක් ස්වර්ගයෙහි උපන්නේය. ඒ කර්මයාගේ ඉතිරි විපාකයෙන් මේ සැවැත්නුවරම සත් වරක් සිටු තනතුර කරවීය.

6. "මහරජ, යම් හෙයකින් පිණ්ඩපාතය දෙවා පසුව දාසයෝ හෝ කම්කරුවෝ හෝ කෑවාහුනම් වඩා හොඳයයි පසුතැවිලි වීද ඒ කර්මයාගේ විපාකයෙන් ප්‍රණීත ආහාර වැළඳීමට ඔහුගේ සිත නොනැමෙයි. වටිනා ඇඳුම් ඇඳීමට ඔහුගේ සිත නොනැමෙයි. ඉතා වටිනා රථ වාහන පරිභෝගයට ඔහුගේ සිත නොනැමෙයි. මන වඩන පස්කම් සැප අනුභවයටද ඔහුගේ සිත නොනැමෙයි,

7. "මහරජ, යම්හෙයකින් ඔහුගේ සහෝදරයාගේ එකම පුතා වස්තුව කරණකොටගෙණ මැරවීද, ඒ කර්මයාගේ

විපාකයෙන් බොහෝ සිය ගණන් බොහෝ දහස් ගණන් බොහෝ සියදහස් ගණන් අවුරුදු නිරයෙහි පැසුණේය. ඒ කර්මයාගේම ඉතිරි විපාකයෙන් දරුවන් නැති ඔහුගේ වස්තුව රාජකෝෂ්ටාගාරයට ගෙණයන සත්වන වාරය මෙයයි. මහරජ, ඒ සිටු ගෘහපතියාගේ පුරාණ පින ගෙවී අවසානය. අළුත් පිනක්ද රැස් නොකෙළේය. මහරජ, අද සිටු ගෘහපතියා රෞරුව නම් නරකාදියෙහි පැසෙන්නේය."

8. "ස්වාමීනි, එසේද? සිටු ගැහැවියා රෞරුව නරකයෙහි උපන්නේද?" "එසේය, මහරජ, සිටු ගැහැවියා රෞරුව නරකයෙහි උපන්නේය."

> "ධාන්‍යය, ධනය, රිදීය, රත්රන්ය, අඹුදරු ආදී අනික් යම්දෙයක් ඇත්නම් එය, දාසයෝ, කම්කරුවෝය, පණිවිඩකරුවෝය, තමන් අනුව ජීවත්වන්නෝය යන මේ සියල්ලම පරලොව යාමේදී ගෙණයා නොහැකිය, ඒ සියල්ලම මෙහි දමා යායුතුයි. කයින් හෝ වචනයෙන් හෝ සිතින් හෝ යම් කර්මයක් කෙරේ නම් එය පමණක් ඔහුට ස්වකීය වස්තුව වේ, එය රැගෙණ පරලොව යන්නේද වේ. ඒම ඔහු නොහැර පසුපස යන සෙවනැල්ල මෙන් ඔහු අනුව යන්නේ වේ. එහෙයින් පරලොව හිත සැප පිණිස රැස්කටයුතු පින්ම කටයුතු වේ, සත්වයන්ට පරලොවදී පින් පිහිට වෙති."

---

## තුන්වෙනි වර්ගය.

### 1. පුග්ගල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලදද ආරාමයෙහි වැඩවසන සේක.

2. එකල්හි ඒ පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ

භාග්‍යවතුන්වහන්සේ වැඳ, එකත්පස්ව හුන්නේය. එකත්පස්ව හුන් පසේනදි කොසොල් රජුට භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළේය. එනම්:- මහරජ මේ ලෝකයෙහි පුද්ගලයෝ සතරදෙනෙක් ඇත්තාහ. විද්‍යමානයහ. කවර සතර දෙනෙක්ද යත්:- අඳුරෙන් අඳුරට යන්නාය, අඳුරෙන් එළියට යන්නාය, එළියෙන් අඳුරට යන්නාය, එළියෙන් එළියට යන්නාය (යන සතරදෙනා වෙත්)

3. "මහරජ, කෙසේනම් පුද්ගලයා අඳුරෙන් අඳුරට යන්නේවේද? මහරජ, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් දිළිඳුවූ, ආහාරපාන දුර්ලභවූ දුෂ්කර පැවැතුම් ඇති, ඉතා දුකසේ කෑම් ඇඳීම් ලබන, සැඩොල් කුලයෙහි හෝ කුළුපොතු කුලයෙහි හෝ, වැදිකුලයෙහි හෝ රියකරු කුලයෙහි හෝ, කසලශෝධක කුලයෙහි හෝ, එබඳු පහත් කුලයෙහි උපන්නේ වේද, හෙතෙමේත් අවලක්ෂණ වූයේ, අප්‍රිය දැකුම් ඇත්තේ, ලකුණ්ටක (මිටි) වූයේ, ලෙඩින් පීඩිතවූයේවේද කණෙක් හෝ අත් කොරෙක් හෝ පා කොරෙක් හෝ නටුවාවූ අඩකය ඇත්තෙක් හෝ වේද, ආහාර, පාන, වස්ත්‍ර, යාන, මල් ගඳ විලවුන්, නිදන තැන්, වසන තැන්, පහන් දල්වන දේ නොලබන්නෙකුත් වේද, හෙතෙමේ කයින්ද දුසිරිතෙහි හැසිරෙයි. වචනයෙන් ද දුසිරිතෙහි හැසිරෙයි. සිතෙන්ද දුසිරිතෙහි හැසිරෙයි. හෙතෙමෙ කයින්ද දුසිරිතෙහි හැසිර වචනයෙන්ද දුසිරිතෙහි හැසිර සිතෙන්ද දුසිරිතෙහි හැසිරී කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් තොරවූ, දුක් පැවතුම් ඇති, වහා වැටීම් ඇති නරකාදියෙහි උපදින්නේය.

මහරජ, යම්සේ නම් පුරුෂයෙක් අන්ධකාරයෙන් අන්ධකාරයට, කළුවරෙන් කළුවරට, ලේ කිලුටෙන් ලේ කිළුටට පැමිණේද, මහරජ, මේ පුද්ගලයාත් එබඳුයයි මම කියමි. මහරජ, අඳුරෙන් අඳුරට යන පුද්ගලයා මෙසේයි.

4. "මහරජ, අඳුරෙන් එළියට යන පුද්ගලයා කෙසේද? මහරජ, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක්, දිළිඳුවූ, දුර්ලභ ආහාරපාන ඇති, දුෂ්කර පැවැතුම් ඇති, දුකසේ කෑම් ඇඳීම් ලබන, සැඩොල් කුලයෙහි හෝ, කුළුපොතු කුලයෙහි හෝ,

වැදි කුලයෙහි හෝ, රියකරු කුලයෙහි හෝ, කසලශොධක කුලයෙහි හෝ, යන මෙබඳු පහත් කුලයෙහි උපන්නේ වේද, හෙතෙමේත් අවලක්ෂණ වූයේ දැකීමට අප්‍රිය වූවෙක් වූයේ, ලකුණ්ටකයෙක් (මිට්ටෙක්) වූයේ නිතර ලෙඩින් පීඩිතයෙක් වූයේ, කණෙක් හෝ, අත් කොරෙක් හෝ, පා කොරෙක් හෝ, පක්ෂඝාතයෙක් හෝ වූයේ, ආහාර, පාන, වස්ත්‍ර, රථ, මල් ගඳ විලවුන්, නිදන හිඳින තැන්, පහන් දල්වන උපකරණ නොලබන්නෙකුත් වේද, හෙතෙමේ කයින් සුසිරිතෙහි හැසිරෙන්නේ වේ. වචනින් සුසිරිතෙහි හැසිරෙන්නේ වේ. සිතින් සුසිරිතෙහි හැසිරෙන්නේ වේ. හෙතෙමේ කයින් සුචරිතයෙහි හැසිර, වචනයෙන් සුසිරිතයෙහි හැසිර සිතෙන් සුසිරිතෙහි හැසිර කය බිඳීමෙන් මරණින් මතු ශොභනගති ඇති, සැපයෙන් අග්‍රවූ දෙව්ලොව උපදියි.

"මහරජ, යම්සේ යම් පුරුෂයෙක් බිමෙන් අසුනකට නගීද, අසුනෙන් අසෙකු පිටට නගීද, අසෙකු පිටින් ඇතෙකු පිටට නගීද, ඇතෙකු පිටින් පහයකට නගීද, මේ පුද්ගලයා එබඳුයයි මම කියමි. මහරජ, මෙසේනම් පුද්ගලයා අඳුරෙන් එළියට යන්නේ වේ.

5. "මහරජ, කෙසේනම් පුද්ගලයා එළියෙන් අඳුරට යන්නේ වේද? මහරජ, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් ධනයෙන් පිරීගිය මහත් ධන ඇති, මහත් භෝග සම්පත් ඇති, බොහෝ රන්රිදී ඇති, මන වඩන බොහෝ උපකරණ ඇති, බොහෝ ධන ධාන්‍ය ඇති, ක්ෂත්‍රිය මහසල් කුලයෙහි හෝ බමුණු මහසල් කුලයෙහි හෝ, ගෘහපති මහසල් කුලයෙහි හෝ එබඳු උසස් කුලයෙහි උපන්නේ වේද? හෙතෙමේත් ඉතා ලක්ෂණ වූයේ, දැකීමට ප්‍රියයෙක් වූයේ, දුටුවන් පහදවන්නෙක් වූයේ, උතුම් සුන්දර රූ සටහනින් යුක්ත වූයේ, කන දේ, බොන දේ, අඳින දේ, යහන්, මල් ගඳ විලවුන්, නිදන වසන තැන්, පහන් දල්වන උපකරණ පහසුවෙන් ලබන්නෙකුත් වේද හෙතෙමේ කයින් දුසිරිතෙහි හැසිරෙයි. වචනයෙන් දුසිරිතෙහි හැසිරෙයි. සිතෙන් දුසිරිතයෙහි හැසිරෙයි, හෙතෙමේ කයින් දුසිරිතෙහි හැසිරී,

වචනයෙන් දුසිරිතෙහි හැසිරී, සිතින් දුසිරිතෙහි හැසිරී කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් තොරවූ දුඃඛිත පැවතුම් ඇති, වහා වැටෙන සුළු නරකයෙහි උපදින්නේය.

"මහරජ, යම්සේ යම් පුරුෂයෙක් පහයෙන් ඇතු පිටට බසින්නේද, ඇතු පිටින් අසු පිටට බසින්නේද, අසු පිටින් අසුනකට බසින්නේද, අසුනකින් බිමට බසින්නේද, මහරජ, මේ පුද්ගලයා එබඳුයයි මම කියමි. මහරජ මෙසේනම් පුද්ගලයා එළියෙන් අඳුරට යන්නේ වෙයි.

**6.** "මහරජ, කෙසේ නම් පුද්ගලයා එළියෙන් එළියට යන්නේ වේද? මහරජ, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක්, ධනයෙන් පිරීගිය මහත් ධන ඇත්තාවූ මහත් භොග සම්පත් ඇත්තාවූ, බොහෝ රන්රිදී ඇත්තාවූ, මනවඩන බොහෝ අබරණ ඈ වස්තූපකරණ ඇත්තාවූ, බොහෝ ධන ධාන්‍ය ඇත්තාවූ, මහාසාර ක්ෂත්‍රිය කුලයෙහි හෝ මහාසාර බ්‍රාහ්මණ කලයෙහි හෝ, මහාසාර ගෘහපති කුලයෙහි හෝ එබඳු උසස් කුලයෙක්හි උපන්නේ වේද, හෙතෙමේත් විශිෂ්ට රූ ඇත්තේ දැකුම් කටයුත්තේ, දුටුවන් පහදවන්නෙක් වූයේ, උත්තම ලක්ෂණ රූ සටහනින් යුක්තවූයේ, ආහාර, පාන, වස්ත්‍ර, යාන, මල් ගඳ විලවුන්, නිදන වසන තැන්, පහන් දල්වන උපකරණ පහසුවෙන් ලබන්නෙක් වේද, හෙතෙමේ කයින් සුසිරිතෙහි හැසිරෙයි, වචනයෙන් සුසිරිතෙහි හැසිරෙයි, සිතෙන් සුසිරිතෙහි හැසිරෙයි. හෙතෙම කයින් සුසිරිතෙහි හැසිර, වචනයෙන් සුසිරිතෙහි හැසිර, සිතෙන් සුසිරිතෙහි හැසිර, කය බිඳීයාමෙන් මරණින් මතු යහපත් ගති ඇති සැපයෙන් අගුවූ දෙව්ලොව උපදී.

මහරජ, යම්සේ යම් පුරුෂයෙක් අසුනෙන් අසුනට මාරුවන්නේද, අසු පිටින් අසු පිටට මාරු වන්නේද, ඇතුපිටින් ඇතු පිටට මාරු වන්නේද, පහයෙන් පහයට මාරු වන්නේද, මහරජ මේ පුද්ගලයා එබඳුයයි මම කියමි. මහරජ එළියෙන් එළියට යන පුද්ගලයා මෙසේයි.

මහරජ මේ පුද්ගලයෝ සතරදෙන ලෝකයෙහි විද්‍යාමාන වෙති.

**7.** "මහරජ, ශ්‍රද්ධා නැත්තාවූ මසුරුවූ, දැඩි ලොභ ඇත්තාවූ ලාමක කල්පනා ඇත්තාවූ, මිසදිටු ගත්තාවූ ආදර නැත්තාවූ, යම්කිසි දිළිඳු පුරුෂයෙක් මහණුන්ටද, බමුණන්ටද, අනික් යාචකයන්ටද, බැණුම් අපහාස කෙරේද? යහපත් ක්‍රියාවන්හි යහපත් විපාක නැත්තේය යන දෘෂ්ටි ඇත්තේ වේද, අනුන්ට ද්වෙෂ කරන්නේ වේද, යාචකයන්ට දෙනු ලබන භොජනය වළකන්නේ වේද, ජනාධිපති රජු, එබඳු පුද්ගලයා මැරෙන්නේ දරුණු නිරයට පැමිණෙයි. මේ අඳුරෙන් අඳුරට යන පුද්ගලයාය.

**8.** "රජුනි, දිළිඳුවූ යම් පුරුෂයෙක් ශ්‍රද්ධා ඇත්තේ මසුරු චේතනා නැත්තේ, උසස් කල්පනා ඇත්තේ, එකඟ සිත් ඇත්තේ දන්දේද, මහණුන්, බමුණන්, තදන්‍ය යාචකයන් දැක හුනස්නෙන් නැගිට වදීද, සම පැවතුම්හි හික්මේද, යාචකයන්ට දෙනු ලබන භොජනය නොවළක්වයිද?

"ජනාධිපති රජුනි, එබඳු පුරුෂයා මැරෙන්නේ දෙව්ලොවට පැමිණෙන්නේය. මේ අඳුරෙන් එළියට යන පුද්ගලයාය.

**9.** "රජුනි, ධනයෙන් පිරීගියාවූ යම්කිසි පුද්ගලයෙක් ඉදින් ශ්‍රද්ධා නැත්තේ, මසුරු චේතනා ඇත්තේ, දැඩි ලොභ ඇත්තේ, ලාමක චේතනා ඇත්තේ, මිසදිටු ගත්තේ, ආදර රහිත වූයේ, මහණුන්, බමුණන්, තදන්‍ය යාචකයන් දැක ආක්‍රොශ පරිභව කෙරේද, නාස්තික දෘෂ්ටි ඇත්තේ වේද, අනුන්ට ද්වෙෂ කරන්නේ වේද, යාචකයන්ට දෙනු ලබන භොජනය වළක්වන්නේ වේද, ජනාධිපති රජුනි, මෙබඳු පුරුෂයා මැරෙන්නේ දරුණු නරකයට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය. මේ එළියෙන් අඳුරට යන පුද්ගලයායි.

**10.** මහරජ, ධනයෙන් පිරීගියාවූ යම් පුරුෂයෙක් ඉදින් ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ, මසුරු චේතනා නැත්තේ, උතුම් චිත්ත සංකල්පනා ඇත්තේ, එකඟ සිතින් යුක්තව දන් දෙන්නේ වේද, මහණුන්, බමුණන් තදන්‍ය යාචකයන්, දැක අසුනෙන් නැගිට වදී ද, සමචරියාවෙහි හික්මේද,

යාචකයන්ට දෙනු ලබන භොජනය නොවළක්වයිද, ජනාධිපති රජුනි, එබඳු පුරුෂයා මිය පරලොව යන්නේ උත්පත්ති පිණිස දෙව්ලොවට යන්නේය. මේ එළියෙන් එළියට යන පුද්ගලයායි.

---

## 2. අය්‍යකා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල්හි පසේනදි කොසොල් රජ මැදුම් දවල්හි භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පස්ව හුන්නේය. එකත්පස්ව හුන් කොසොල් රජුගෙන් 'මහරජ ඔබ මේ මැදුම් දවල් කොහි සිට එහිදැ"යි භාග්‍යවතුන් වහන්සේ විචාළේය.

3. "ස්වාමීනි, මාගේ මුත්තනිය මැරුණාය. ඈ ජරාජීර්ණය, වයොවෘද්ධය, මහළුය, ඉක්මගිය බොහෝ කල් ඇත්තීය, පිළිවෙළින් අන්තිම වයසට පැමිණියාය, උත්පත්තියෙන් එකසිය විසිඅවුරුදු වයස් ඇත්තීය. ස්වාමීනි, මට මේ මුත්තනිය ඉතා ප්‍රිය වූවාය, ඉතා මනාපය. ස්වාමීනි, මගේ හස්ති රත්නය දීමෙන් මුත්තනිය මරණින් මුදා ගතහැකි වීනම් මුත්තනිය නොමැරේවායි හස්තිරත්නය නමුත් දෙමි. අශ්වරත්නය දීමෙන් මුත්තනිය මරණින් මුදාගත හැකි වීනම් අශ්වරත්නය නමුත් දෙමි. ගම් වරයක් දීමෙන් මුත්තනිය මරණින් මුදාගත හැකිවී නම් මුත්තනිය නොමැරේවායි ගම් වරයක් නමුත් දෙමි. දනව්වක් දීමෙන් මුත්තනිය මරණින් මුදාගත හැකිවී නම් මුත්තනිය නොමැරේවායි දනව්වක් නමුත් දෙමි"යි කීයේය.

4. "මහරජ, සියලු සත්හු මරණය ස්වභාවකොට ඇත්තෝය. මරණයෙන් අවසන් වන්නෝය. මරණය නොඉක්ම වූවෝය"යි භගවත්හු වදාළෝය.

"ස්වාමීනි, පුදුමයි ස්වාමීනි, ඉතා පුදුමයි. 'හැම සත්හු මැරෙණ ස්වභාවය. මරණින් අවසන් වන්නෝය. මරණය නොඉක්මවූවෝය'යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්ද කෙතරම් සුභාෂිතයක්ද? කෙතරම් යහපත් කියමනක් දැ?'යි රජ කීයේය.

5. "මහරජ, ඒ එසේය. මහරජ, ඒ එසේය. සියලු සත්හු මරණය ස්වභාවකොට ඇත්තෝය. මරණයෙන් අවසන් වන්නෝය. මරණය නොඉක්ම වූවෝය. මහරජ, යම්සේ නම් කුඹලා විසින් සාදනලද අමුවූද, පුළුස්සන ලද්දා වූද, යම් ඒ බඳුන් වෙත්ද, ඒ සියල්ලම බිඳෙනසුළුද බිඳීමෙන් අවසන් වෙත්ද, බිඳීම් ස්වභාව නොඉක්මවූවාහුද, මහරජ, එසේම හැම සත්තුම මරණය ස්වභාවකොට ඇත්තෝය. මරණය නොඉක්ම වූවෝය.

6. 'හැම සත්හුම මැරෙන්නාහ. ජීවිතය මරණය අවසන්කොට ඇත්තේය. (මරණින් පසු) පින් පව් පල අනුව කම්වූ පරිදි පරලොව යන්නාහ. පව්කම් ඇත්තෝ නිරයටද, පින්කම් ඇත්තෝ සුගතියටද යන්නාහ. එහෙයින් පරලොව පිණිස රැස් කටයුතු කුසල් කම් කරන්නේය. පින් පරලොවදී සත්වයන්ට පිහිට වෙති."

---

## 3. ලොක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල්හි පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය එකත් පසෙක හුන් පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේය. "ස්වාමීනි, උපදින්නාවූ කොතෙක් දහම් ලොකයාට අහිත පිණිස, දුක් පිණිස, අපහසු පිණිස, විහරණය පිණිස උපදිද්ද?

3. "මහරජ, උපදනා දහම් තුනක් ලොකයාට අහිත පිණිස, දුක පිණිස, අපහසු විහරණය පිණිස වෙති. කවර දහම් තුනක්ද යත්? මහරජ, ලොභය ලෝකයට අහිත පිණිස, දුක පිණිස, අපහසු විහරණය පිණිස උපදනේය. ද්වෙෂය ලොකයට අහිත පිණිස, දුක පිණිස, අපහසු විහරණය පිණිස උපදනේය. මෝහය ලොකයට අහිත පිණිස, දුක පිණිස, අපහසු විහරණය පිණිස උපදනේය.

4. "මහරජ, උපදනාවූ මේ දහම් තුන ලෝකයට අහිත පිණිස, දුක පිණිස, අපහසු විහරණය පිණිස උපදනේය.

"ලොභයද, ද්වෙෂයද, මොහයද (තම සන්තානයෙහි පහළවූවෝ) ලාමක අදහස් ඇති පුද්ගලයා පෙළති. කුමක් මෙන්ද යත්? පොත්ත හරයකොට (අරටුවකොට) ඇති ගසක ඵලය එබඳු ගසක් පෙළා වනසන්නාක් මෙනි."

---

## 4. ඉස්සත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි පිහිටි අනේපිඩු සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල්හි පසේනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක හුන්නේය. එකත් පසෙක හුන් පසේනදි කොසොල් රජ භාග්‍යවතුන්වහන්සේට මෙසේ කීවේය. "ස්වාමීනි, කාහට දන් දියයුතුද?"

"මහරජ, යම් කෙනෙකුගේ කෙරෙහි සිත පහදීද ඔවුන්ට දිය යුතුයයි" වදාළේය.

"කාට දුන් දේ මහත්ඵල ඇතිවේද?"

"මහරජ, කාහට දන් දියයුතුද? යන්න අනිකකි. (එක ප්‍රශ්නයකි) කවුරුන්ට දෙන ලද්දේ මහත්ඵල ඇතිවේද? යන්න අනිකකි (වෙන ප්‍රශ්නයකි.)

"මහරජ, සිල්වතාට දෙන ලද්ද මහත්ඵල ඇත්තේ වේ. දුශ්ශීලයාට දෙන ලද්ද එසේ නොවේ. එසේවී නම් මහරජ, මෙහිලා ඔබම පිළිවිසිමි. ඔබට වැටහෙන පරිදි විසඳන්න.

3. "මහරජ, ඒ කුමකැයි හඟනෙහිද? මෙහිදී ඔබට යුද්ධයෙක් එළඹ සිටියේ නම්, යුද සෙනගත් රැස්වූවාහු නම් එකල දුනු ශිල්පයෙහි පුහුණු නොවූ, ශිල්පාභ්‍යාසයෙහි පලපුරුදුකම් නැති. ශිල්ප යෙදීම නොකළ, රජුන් ඉදිරියෙහි ශිල්ප නොදැක්වූ, බියගුලු තැතිගන්නා ගති ඇති, වෙව්ලන ස්වභාව ඇති, පැන යන ගති ඇති, ක්ෂත්‍රිය තරුණයෙක් ඔබ වෙත එන්නේ නම්, ඔබ ඒ පුරුෂයා සංග්‍රහ කිරීමෙන් පොෂණය කරන්නෙහිද? එබඳු පුරුෂයෙකුගෙන් ඔබට ප්‍රයෝජන ඇත්තේද?"

"ස්වාමීනි, මම එබඳු පුරුෂයෙක් පොෂණය නොකරන්නෙමි. එබඳු පුරුෂයෙකුගෙන් මට ප්‍රයෝජන නැත්තේය."

4. ඉක්බිති දුනුශිල්පයෙහි නොපුරුදු දුනු ශිල්පාභ්‍යාසයෙහි පලපුරුදුකම් නැති, ශිල්ප යෙදීම නොකළ, රජුන් ඉදිරියෙහි ශිල්ප නොදැක්වූ, බියගුලු තැතිගන්නා ගති ඇති, වෙව්ලන ස්වභාව ඇති, පැනයන ගති ඇති, බ්‍රාහ්මණ තරුණයෙක් එන්නේ නම්, ඔබ ඒ පුරුෂයා සඞ්ග්‍රහ කිරීමෙන් පොෂණය කරන්නෙහිද?"

'ස්වාමීනි, මම එබඳු පුරුෂයෙක් පොෂණය නොකරන්නෙමි. එබඳු පුරුෂයෙකුගෙන් මට ප්‍රයෝජන නැත්තේය."

5. ඉක්බිති දුනුශිල්පයෙහි නොපුරුදු, දුනුශිල්පාභ්‍යාසයෙහි පලපුදුරුකම් නැති, ශිල්ප යෙදීම නොකළ, රජුන් ඉදිරියෙහි ශිල්ප නොදැක්වූ, බියගුලු තැතිගන්නා ගති ඇති වෙව්ලන ස්වාභාව ඇති, පැනයන ගත ඇති, වෛශ්‍ය තරුණයෙක් එන්නේ නම්, ඔබ ඒ පුරුෂයා සඞ්ග්‍රහ කිරීමෙන් පොෂණය කරන්නෙහිද?"

"ස්වාමීනි, මම එබඳු පුරුෂයෙක් පොෂණය නොකරන්නෙමි. එබඳු පුරුෂයෙකුගෙන් මට ප්‍රයෝජන නැත්තේය."

**6.** ඉක්බිති දුනු ශිල්පයෙහි නොපුරුදු, දුනු ශිල්පාභ්‍යාසයෙහි පලපුරුදුකම් නැති, ශිල්ප යෙදීම නොකළ, රජුන් ඉදිරියෙහි ශිල්ප නොදැක්වූ, බියගුලු තැතිගන්නා ගති ඇති, වෙව්ලන ස්වභාව ඇති, පැනයන ගති ඇති, ශුද්‍ර තරුණයෙක් එන්නේ නම්, ඔබ ඒ පුරුෂයා සඞ්ග්‍රහ කිරීමෙන් පොෂණය කරන්නෙහිද?"

"ස්වාමීනි, මම එබඳු පුරුෂයෙක් පොෂණය නොකරන්නෙමි. එබඳු පුරුෂයෙකුගෙන් මට ප්‍රයෝජන නැත්තේය."

**7.** "මහරජ, ඒ කුමැයි සිතන්නෙහිද? මෙහි ඔබට යුද්ධයක් එළඹ සිටියේ නම්, යුද සෙනගත් රැස්වී නම්, එකල දුනුශිල්පයෙහි හික්මුණාවූ, ශිල්ප දැක්වීම්කොට පලපුරුදුවූ, ශිල්ප දැක්වීමෙහි යෙදී පලපුරුදු, රජුන් ඉදිරියෙහි ශිල්ප දක්වා ඇති, බියගුලු නුවූ, තැතිගැනීම් නැති, නොවෙව්ලන, පැන නොයන, ක්ෂත්‍රිය තරුණයෙක් ඔබ වෙත එන්නේ නම්, ඔබ ඔහු පොෂණය කරන්නෙහිද? එබඳු පුරුෂයෙකුගෙන් ඔබට ප්‍රයෝජනද?"

"ස්වාමීනි, මම එබඳු පුරුෂයෙකු පොෂණය කරන්නෙමි. මට එබඳු පුරුෂයෙකුගෙන් ප්‍රයෝජනය."

**8.** "ඉක්බිති දුනුශිල්පයෙහි හික්මුණාවූ, ශිල්ප දැක්වීම් කොට පලපුරුදුවූ, ශිල්ප දැක්වීමෙහි යෙදී පලපුරුදු, රජුන් ඉදිරියෙහි ශිල්ප දක්වා ඇති, බියගුලු නුවූ, තැතිගැනීම් නැති, නොවෙව්ලන පැන නොයන, බ්‍රාහ්මණ තරුණයෙක් ඔබ වෙත එන්නේ නම්, ඔබ ඔහු පොෂණය කරන්නෙහිද? එබඳු පුරුෂයෙකුගෙන් ඔබට ප්‍රයෝජනද?"

"ස්වාමීනි, මම එබඳු පුරුෂයෙකු පොෂණය කරන්නෙමි. මට එබඳු පුරුෂයෙකුගෙන් ප්‍රයෝජනය."

**9.** ඉක්බිති දුනු ශිල්පයෙහි හික්මුණාවූ, ශිල්ප දැක්වීම් කොට පලපුරුදුවූ, ශිල්ප දැක්වීමෙහි යෙදී පලපුරුදු, රජුන් ඉදිරියෙහි ශිල්ප දක්වා ඇති, බියගුලු නුවූ, තැතිගැනීම් නැති, නොවෙව්ලන, පැන නොයන, වෛශ්‍ය තරුණයෙක් ඔබ වෙත එන්නේ නම්, ඔබ ඔහු පොෂණය කරන්නෙහිද, එබඳු පුරුෂයෙකුගෙන් ඔබට ප්‍රයෝජනද?"

"ස්වාමීනි, මම එබඳු පුරුෂයෙකු පොෂණය කරන්නෙමි. මට එබඳු පුරුෂයකුගෙන් ප්‍රයෝජනය."

10. ඉක්බිති දුනු ශිල්පයෙහි හික්මුණාවූ, ශිල්ප දැක්වීම් කොට පලපුරුදුවූ, ශිල්ප දැක්වීමෙහි යෙදී පලපුරුදු, රජුන් ඉදිරියෙහි ශිල්ප දක්වා ඇති, බියගුලු නුවූ තැතිගැනීම් නැති, නොවෙව්ලන, පැන නොයන, ශුද්‍ර තරුණයෙක් ඔබ වෙත එන්නේ නම්, ඔබ ඔහු පොෂණය කරන්නෙහිද? එබඳු පුරුෂයෙකුගෙන් ඔබට ප්‍රයෝජනද?"

"ස්වාමීනි, එබඳු පුරුෂයෙකු පොෂණය කරන්නෙමි. මට එබඳු පුරුෂයෙකුගෙන් ප්‍රයෝජනය."

11. "මහරජ, එලෙසින්ම යම් ඒ කොයි කුලයකින් නමුත් ගිහිගේ හැර, සස්නෙහි පැවිදිවූ යමෙක් කරුණු පසක් හැර දැමුයේ නම් කරුණු පසකින් යුක්තවූයේ නම්, ඔහුට දුන් දන මහත්ඵල ඇතිවන්නේය."

12. හැර දැමූ ඒ කරුණු පස මොනවාද? ඔහු විසින් කාම ආශාව හැරදැමූයේ වෙයි. අනුන්ට ද්වෙෂ කිරීම හැර දැමුයේ වෙයි. (සිත කය දෙකේ අලසකමයයි කියනලද) ථීනමිද්ධය හැරදැමූයේ වෙයි. සිතෙහි නොසන්සුන්කම හා පසුතැවිල්ල හැරදැමුයේ වෙයි. (බුද්ධාදි අටතන්හි) සැකය හැරදැමුයේ වෙයි. මේ කරුණු පස ඔහු විසින් හැරදමන ලද්දාහු වෙති.

13. "කිනම් කරුණු පසකින් යුක්තවූයේ වේද? රහතුන් පිළිබඳ ශීල රාශියෙන් යුක්තවූයේ වෙයි. රහතුන් පිළිබඳ සමාධි රාශියෙන් යුක්තවූයේ වෙයි. රහතුන් පිළිබඳ ප්‍රඥා රාශියෙන් යුක්තවූයේ වෙයි. රහතුන් පිළිබඳ මිදීම් රාශියෙන් යුක්තවූයේ වෙයි. රහතුන් පිළිබඳ මිදුම් නැණ දසුන් රැසින් යුක්තවූයේ වෙයි. මේ කරුණු පසින් යුක්තවූයේ වෙයි. මෙසේ කරුණු පසක් හැරදැමුවාවූ කරුණු පසකින් යුක්තවූ තැනැත්තාට දුන් දෙය මහත්ඵල ඇතිවන්නේය."

14. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සුගතයන් වහන්සේ මෙය වදාරා නැවත අනායවූ මේ ගාථාද වදාළේය.

"ආයුධ ශිල්පයෙහි දක්ෂකමද, කායික බලය හා මානසික වීර්‍යයද යම් මිනිසෙකු කෙරෙහි ඇත්තේ නම් යුදයෙන් වැඩ ඇති රජ එබඳු මිනිසා පොෂණය කරන්නේය. ශූර නොවන්නා ජාතිය පමණක් සලකා පොෂණය නොකරන්නේය.

"එසේම ඉවසීම් සුරත බැව් යන ගුණ ධර්මයෝ යම් කෙනෙකු කෙරෙහි හොඳින්, පිහිටියාහු නම්, උත්තම පැවතුම් ඇති, නුවණැති එබඳු තැනැත්තා හීනජාතියෙකු වුවද පිදිය යුත්තේය.

"රම්‍යවූ ආශ්‍රම කර විය යුතුයි. උගත් භික්ෂූහු ඒ අසපුවල වැස විය යුතුයි. වෙනෙහි පොකුණු තැනවිය යුතුයි. දුර්ග ප්‍රදෙශවල සම මාර්ග සෑදවිය යුතුයි.

"අවංක පුද්ගලයන්ට (රහතුන්ට) පහන් සිතින් ආහාර පාන, කන දේ, වස්ත්‍ර, සෙනසුන් දිය යුතුයි.

"යම් සේ සිය ගණන් වළාකුළු ඇති, විදුලි පෙළ ඇති මහාමෙඝය ගර්ජනා කරමින් වසින්නේ, උස් පහත් බිම් ඇති මහපොළොව පුරාද,

"එමෙන්ම ශ්‍රද්ධා ඇති දහම් දැනඋගත් නුවණැති පුද්ගලයා දාන වස්තු සකසා රැස්කොට ආහාර පාන වර්ග වලින් යාචකයන් සතප්පවයි. සන්තොෂයෙන් දන් විසුරුවයි. "දෙව්, දෙව්" කියා අනුන්ටත් කියයි.

"ඔහුගේ ඒ කියමන වහින වැස්සේ ගර්ජනාව වැනිය. මහත්වූ ඒ පින් වැහිධාරාව පින් පලදීම් වශයෙන් දායකයා තෙමා ලන්නේය."

---

## 5. පබ්බතූපම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල පසේනදි කොසොල්රජ භාග්‍යවතුන්වහන්සේ යම්තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් පසේනදි කොසොල් රජුගෙන් භාග්‍යවතුන් වහන්සේ, "මහරජ, මේ මැදුම්දවල් කොහි සිට එහිදැයි" ඇසූසේක.

"ස්වාමීනි, ඔටුනු පැළන්දාවූ, ඓශ්වර්‍ය්‍ය මදයෙන් මත්වූ, කාම සම්පතෙහි ගිජුකමින් වැඩුනාවූ, දනව්වල ස්ථිරත්වයට පැමිණි, මහත් මිහිමඬල (පොළොව) දිනා වසන්නාවූ, ක්ෂත්‍රිය රජවරුන් පිළිබඳ යම් ඒ කටයුතු වෙත් නම්, මම දැන් ඒ කාර්‍ය්‍යයන්හි උද්‍යොගවත් බවට පැමිණ සිටිමි."

3. "මහරජ, ඒ කුමැයි සිතනෙහිද? මහරජ, ඇදහිය යුතු වචන ඇති, විශ්වාස කටයුතු වචන ඇති, පුරුෂයෙක් මෙහිදී පෙරදිග සිට ඔබවෙත එන්නේය. ඔහු ඔබ වෙත පැමිණ, මෙසේ කියන්නේය. 'මහරජ, දන්නෙහිද? මම පෙරදිග සිට එමි. මම එහි අහස සම මහපර්වතයක් හැම සතුන් සුනුවිසුනු කරමින් පෙරළී එනු දිටිමි. මහරජ, ඔබ විසින් යමක් කටයුතු නම් ඒ කරනු මැනව.'

4. "නැවත, ඇදහියයුතු වචන ඇති, විශ්වාස කටයුතු වචන ඇති, දෙවෙනි පුරුෂයෙක් මෙහිදී බටහිරදිග සිට ඔබ වෙත එන්නේය. ඔහු ඔබ වෙත පැමිණ මෙසේ කියන්නේය. 'මහරජ, දන්නෙහිද? මම බටහිරදිග සිට එමි. මම එහි අහස සම මහපර්වතයක් හැම සතුන් සුනුවිසුනු කරමින් පෙරළී එනු දිටිමි. මහරජ, ඔබ විසින් යමක් කටයුතු නම් ඒ කරනු මැනව.'

5. "නැවත, ඇදහිය යුතු වචන ඇති, විශ්වාස කටයුතු වචන ඇති, තුන්වෙනි පුරුෂයෙක් මෙහිදී උතුරුදිග සිට ඔබ වෙත එන්නේය. ඔහු ඔබ වෙත පැමිණ, මෙසේ කියන්නේය. 'මහරජ, දන්නෙහිද? මම උතුරුදිග සිට එමි. මම එහි අහස සම මහ පර්වතයක් හැම සතුන් සුනුවිසුනු කරමින් පෙරළී එනු දිටිමි. මහරජ, ඔබ විසින් යමක් කටයුතු නම් ඒ කරනු මැනව.'

6. "නැවත, ඇදහිය යුතු වචන ඇති, විශ්වාස කටයුතු වචන ඇති, හතරවෙනි පුරුෂයෙක් මෙහිදී දකුණුදිග සිට ඔබ

වෙත එන්නේය. ඔහු ඔබ වෙත පැමිණ, මෙසේ කියන්නේය. 'මහරජ, දන්නෙහිද? මම දකුණුදිග සිට එමි මම එහි අහස සම මහ පර්වතයක් හැම සතුන් සුනුවිසුනු කරමින් පෙරළී එනු දිටිමි. මහරජ, ඔබ විසින් යමක් කටයුතු නම් ඒ කරනු මැනව.'

7. "මහරජ, දරුණුවූ, මිනිසුන් වනසන්නාවූ, මහත්වූ, මෙබඳු මහත් භයක් හටගත් කල්හි, දුර්ලභවූ මිනිසත් බැව්හි සිටින ඔබ විසින් කුමක් කටයුතුද?"

"ස්වාමීනි, දරුණුවූ, මිනිසුන් වනසන්නාවූ, මහත්වූ, මෙබඳු මහත් බයක් පැමිණි කල්හි දුර්ලභ මනුෂ්‍යාත්මයෙහි සිටින මවිසින් ධර්මයෙහි හැසිරීම, සම බැව්හි හැසිරීම, කුසල් කිරීම, පින් කිරීම හැර කුමක් කටයුතුද?"

8. "මහරජ, මම ඔබට කියමි. මම ඔබට දන්වමි. මහරජ, ජරා මරණ දෙක ඔබ මැඩගෙන සිටිති. මහරජ, ජරා මරණ දෙක ඔබ මැඩගෙන සිටින කල්හි ඊට කුමක් කටයුතුද?"

"ස්වාමීනි, ජරා මරණ දෙක මා මැඩගෙන සිටින කල්හි, ධර්මයෙහි හැසිරීම, සම බැව්හි හැසිරීම, කුසල් කිරීම, පින් කිරීම හැර මවිසින් කුමක් කටයුතුද? ස්වාමීනි, ඔටුනු පැළැන්දාවූ, ඉසුරුමදින් මත්වූ, කම්සැපෙහි ගිජුකමින් වැඩුනු, දනව්වල ස්ථිරත්වයට පැමිණි, මහපොළොව දිනා වසන, ක්ෂත්‍රිය රජවරුන්ගේ යම් ඒ ඇත් යුද වෙත්ද? ස්වාමීනි, ජරා මරණ දෙක අප මඩින කල ඒ ඇත් යුදවලින්ද පිහිටක් නැත. අප රැකීමට ඒ ඇත් යුදවලට සමත්කමක් නැත. ස්වාමීනි, ඔටුනුපලන් ක්ෂත්‍රිය රජවරුන්ගේ යම් ඒ අශ්ව යුද්ධ වෙත්ද, 'ස්වාමීනි, ජරා මරණ දෙක අප මඩින කල ඒ අශ්ව යුද්ධවලින්ද පිහිටක් නැත. අප රැකීමට ඒ අශ්ව යුද්ධවලට සමත්කමක් නැත. ස්වාමීනි, ඔටුනුපලන් ක්ෂත්‍රිය රජවරුන්ගේ යම් ඒ රථ යුද්ධ වෙත්ද, ස්වාමීනි, ජරා මරණ දෙක අප මඩින කල ඒ රථ යුද්ධවලින්ද පිහිටක් නැත. අප රැකීමට ඒ රථ යුද්ධවලට සමත්කමක් නැත. ස්වාමීනි, ඔටුනුපලන් ක්ෂත්‍රිය රජවරුන්ගේ යම් ඒ පාබල සෙනගින් කරන යුද්ධ වෙත්ද, ජරා මරණ දෙකින් අප මඩින

කල්හි ඒ පාබල යුද්ධවලින්ද, වැඩක් නැත. ඒ යුද්ධවලට අප රැකීමට පුළුවන් කමක් නැත.

9. "ස්වාමීනි, විරුද්ධව පැමිණි සතුරන් මන්ත්‍රණයෙන් බිඳ හැරීමෙහි පොහොසත්වූ, මන්ත්‍රණයෙහි දක්ෂ මහ ඇමතියෝ මේ රාජකුලයෙහි ඇත්තාහ. ස්වාමීනි, ජරා මරණ දෙකින් අප මඩින කල්හි ඒ මන්ත්‍රණ යුද්ධවලින්ද ප්‍රයෝජනයක් නැත. ඒ මන්ත්‍රණ යුද්ධවලින් අප රැකීමට නුපුළුවන.

10. "ස්වාමීනි, පැමිණි පසමිතුරන් ධනයෙන් පොළඹවන්ට සමත්වූ පොළොවෙහි නිදන් කළාවූද, උඩ තැබූවාවූද, බොහෝ රත්රන් මේ රාජකුලයෙහි ඇත්තාහ. ස්වාමීනි, ජරා මරණ දෙකින් අප මඩින කල්හි ඒ ධන යුද්ධවලින්ද වැඩක් නැත. ඒ ධන යුද්ධවලින්ද අප රක්ක නොහැක.

11. "ස්වාමීනි, ජරා මරණ දෙකින් අප මඩිනකල්හි කුසල් දහම්හි හැසිරීම, සම චරියාවෙහි හැසිරීම, කුසල් කිරීම, පින් කිරීම හැර වෙන කුමක් නම් කටයුතුද?"

12. "මහරජ, ඒ එසේය. මහරජ, ඒ එසේය. ජරා මරණ දෙකින් ඔබ මඩින කල්හි ධර්මයෙහි හැසිරීම, සමබැව්හි හැසිරීම, කුසල්කිරීම, පින්කිරීම හැර වෙන කුමක් නම් කටයුතුද?" (නැත්මය.)

13. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. සුගතයන් වහන්සේ මෙය වදාරා නැවත අන්‍යවූ මේ ගාථාවද වදාළේය.

"යම්සේ අහස හැපී සිටි මහත්වූ ශෛලමය පර්වත දෙකක් හාත්පස සිවුදිගින් හැම දෙය මැඩ සුනුවිසුනු කරමින් පෙරළී එත්ද, එසේම ජරාවද මරණයද යන දෙක ක්ෂත්‍රියයන්ද, බ්‍රාහ්මණයන්ද, වෛශ්‍යයන්ද, ශූද්‍රයන්ද, චණ්ඩාලයන්ද, කසල ශොධකයන්ද යන හැම සතුන්ම මැඩගෙණ සිටිති. කිසිවෙකු අත්නොහරියි. හැමදෙනම මැඩලයි.

"එහිදී හෙවත් ජරා මරණ සතුන් මැඩලීමෙහිදී ඇත් සෙනගටද, අස් සෙනගටද, රිය සෙනගටද, පාබල

සෙනගටද, විෂයවූ භූමියක් නැත. මන්ත්‍රණ යුද්ධයෙන්ද, ධනයෙන්ද ඒ ජරා මරණ පරදවන්ට නොහැක්කේය.

"එහෙයින් පණ්ඩිත පුරුෂයා තමහට වැඩකැමැත්තේ ධෘතිසම්පන්නවූයේ බුදුන්, දහම්, සඞ්ඝ යන රත්නත්‍රය විෂයයෙහි ශ්‍රද්ධාව පිහිට වන්නේය.

"යමෙක් කයින්ද, වචනයෙන්ද, නැවත සිතින්ද' ධර්මයෙහිහැසිරේද, ඔහුට මෙලොවදීත් පසසති. පරලොව ස්වර්ගයෙහි සතුටට පත්වේ.

(කොසල සංයුත්තකය සමාප්තයි.)

---

## 4. මාරසංයුත්තය.

## 1. ආයු වර්ගය.

### 1. තපොකම්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ බුදුව පළමු කාලයෙහි (බුදුවූ අළුතම) උරුවේලා ජනපදයෙහි නෙරඤ්ජරා ගං ඉවුරෙහි අජපාල නුගරුක මුල වෙසෙනසේක.

2. එකල වනාහි හුදකලාව චිත්තවිවේකයෙන් හුන් භාග්‍යවතුන්වහන්සේට "ප්‍රීතියෙන් මම් ඒසා දැඩිවූ දුෂ්කර ක්‍රියායෙන් මිදුනෙම් වෙමි. ඒ අවැඩ පිණිසවූ (අවැඩ ඇසුරු කළ) දුෂ්කරක්‍රියායෙන් ඒකාන්තයෙන් මනාව මිදුනෙම් වෙමි. ස්ථිරව එළඹ සිටි සිහි ඇතිව සත්‍යාවබෝධය ලදිමි"යි මෙසේ සිතක් පහළ විය.

3. එකල පවිටුවූ මාරතෙම භාග්‍යවතුන්වහන්සේගේ සිත තම සිතින් දැනගෙන භාග්‍යවතුන්වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ ගාථායෙන් මෙසේ කීය:

"යම් තපසෙකින් සත්වයෝ පිරිසිදු වෙත්ද, එසේවූ ඒ දුෂ්කර ක්‍රියා තපසින් ඉවත්ව, අශුද්ධවම හිඳ, 'ශුද්ධයෙමි'යි සිතන්නෙහිය ශුද්ධියට යන මග වරදවා ගත්තෙහිය."

4. එවිට භාග්‍යවතුන්වහන්සේ මේ පවිටු වසවත් මරු යයි දැන ඔහුට ගාථාවලින් මෙසේ වදාළසේක.

"යම්කිසි අමර තපසක් (ශරීරයට දුක්දීමෙහි යෙදීමක්) වේද, එය අවැඩම පිණිස පවතීයයි. වනයෙහි රිටි පලුපත් ගෙන නැවක් පදවන්නට තැත් කිරීමක් මෙන් සියලු අනර්ථය ගෙන දෙන්නේයයි දැන,

"ශීල-සමාධි-ප්‍රඥා යන මාර්ගය සත්‍යාවබොධය පිණිස වඩා පරම ශුද්ධිය (රහත් බව) අත්පත් කෙළෙමි. මරුව, තෝ පැරදුණෙහිය."

5. එවිට පාපී මාරතෙම, "භාග්‍යවත්තෙම මා දනී, සුගතතෙමේ මා හඳුන"යි සිතා ශෝකීව දොම්නස්ව එහිම අතුරුදන් විය.

---

## 2. නාග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ බුදුව පළමු කාලයෙහි උරුවෙල් දනව්වෙහි නේරඤ්ජරා ගං ඉවුරෙහි අජපාල නුගරුක් මුල වසනසේක. එකල භාග්‍යවතුන්වහන්සේ දැඩි ගනඳුරු රැයෙහි එළි මහනෙක හුන්සේක් වේ. වැහිපොද ද එක දෙක වැටෙයි.

2. එකල පාපී මාරයා භාග්‍යවතුන්වහන්සේට බිය, වෙවුලුම් හා ලොමුදැහැගැන්ම උපදවනු කැමැත්තේ මහ ඇත් රජක්හුගේ වෙස් මවාගෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. ඔහුගේ හිස මහ කළුගලක් වැන්න, ඔහුගේ දත් පිරිසිදු රිදී වැන්න. ඔහුගේ සොඬ මහ නගුල් හිසක් වැන්න.

3. එවිට භාග්‍යවතුන්වහන්සේ 'මේ පාපී මරුය'යි දැන ඔහුට මෙසේ ගාථායෙන් වදාළසේක:

"දික් කලක්ම ප්‍රියවූත් අප්‍රියවූත් වෙස්ගෙන (තෝ) මා වෙත නැවත නැවත එන්නෙහිය. එයින් පව්කාරය, තට වැඩක් නැත. මාරය, තෝ පැරදුණෙහිය."

4. එවිට පාපී මාරතෙමේ 'භගවත් තෙම මා දනී සුගතතෙම මා දනි'යි සිතා දුකට, දොම්නසට පත්ව එහිම අතුරුදන් විය.

---

## 3. සුභ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. භාග්‍යවතුන්වහන්සේ බුදුවූ පළමු කාලයෙහි උරුවෙල්දනව්හි අජපල් නුගරුක මුල වසන සේක. එකල භාග්‍යවතුන් වහන්සේ දිනෙක රෑ ගනඳුරෙහි එළිමහණෙක හුන්සේක. වැසිපොදද එක දෙක වැටෙයි.

2. එකල පාපී මාරතෙම භාග්‍යවතුන් වහන්සේට බිය, වෙවුලුම හා ලොමුදැහැගැන්ම උපදවනු කැමැත්තෙන් භාග්‍යවතුන්වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන්වහන්සේ නොදුරෙහි කුදුමහත් නොයෙක් ආකාර පියකරු බියකරු වෙස් විලස් දැක්වීය.

3. එවිට භාග්‍යවතුන් වහන්සේ 'මේ පාපී මාරයාය'යි දැන, පාපී මාරයාට මෙසේ ගාථායෙන් වදාළසේක:

"දික් කලක්ම ප්‍රියවූත්, අප්‍රියවූත් වෙස් ගෙන තෝ මාවෙත නැවත නැවත එන්නෙහිය. එයින් පව් කාරය, තට වැඩෙක් නැත. තෝ (පැරදුණෙහි) ය."

"යම් කෙනෙක් කයින්, වචනයෙන්, සිතින් මනාව හික්මුණාද මරුව, ඔවුහු තා යටතට නො එන්නාහ. මරුව, ඔහු තගේ බැම්මට අසු නොවන්නාහ.

4 එවිට පාපී මාරයා භාග්‍යවතුන්වහන්සේ තමා දනිතැයි, සුගතයෝ තමා හඳුනතැයි සිතා දුක් දොම්නස් වූයේ එහිම අතුරුදන් විය.

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 4. (පළමුවන) පාස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ බරණැස් නුවර අසල ඉසිපතන නම්වූ මුව වෙනෙහි වසනසේක. එහිදී භාග්‍යවත්හු "මහණෙනි"යි භික්ෂූන්ට කථා කළ සේක. "ස්වාමීන් වහන්සැ"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන්ට උත්තර දුන්හ.

2. භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේකඃ "මහණෙනි, නුවණින්, මෙනෙහි කිරීමෙන්, නුවණින් ප්‍රධාන වීර්‍ය්‍ය වැඩීමෙන්, හැමටම උතුම් (රහත්ඵල) මිදුම මට ලැබිණ, හැමට උතුම් (රහත්ඵල) මිදුම මවිසින් ප්‍රත්‍යක්ෂ කරණ ලදී. තෙපිද මහණෙනි, නුවණින් මෙනෙහි කිරීමෙන්, නුවණින් ප්‍රධාන වීර්‍ය්‍ය වැඩීමෙන් පරම (රහත්ඵල) මිදුම ලබවු, පරම මිදුම පැහැදිලි කරවු."

3. එවිට පාපී මාරයා භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන්ට ගාථායෙන් මෙසේ කීයඃ

"මහණ, තෝ කෙලෙස් මල පුඩුයෙන් බැඳුණෙහි යම් දෙව්සැප කෙනෙක් මිනිස් කම්සැප කෙනෙක් වෙත්ද, ඒ මාර බැම්මෙන් (කෙලෙස් බැම්මෙන්) බැඳුණෙහිය. මහණ, මගෙන් තෝ නොගැලවෙන්නෙහි."

4. "මාරය, මම් කෙලෙස් මලපුඩුයෙන් මිදුණෙමි. යම් දෙව් කම්සැප කෙනෙක් මිනිස්කම් සැප කෙනෙක් වෙද්ද, ඒ හැම මලපුඩුයෙන්ම මිදුනෙමි. මාරය තෝ නැසුණෙහිය."

5. එවිට පාපී මාරතෙම භාග්‍යවතුන්වහන්සේ තමා හඳුනතැයි, දනිතැයි, දැන, දුක් දොම්නස් පත්ව එහිම අතුරුදහන්විය.

---

## 5. (දෙවෙනි) පාස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ බරණැස අසළ ඉසිපතන මුව වෙනෙහි වෙසෙනසේක. එකල වනාහි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි" භික්ෂූන්ට

කථාකළ සේක. "පින්වතුන් වහන්සැ"යි ඒ මහණහු භාග්‍යවතුන්ට පිළිවදන් දුන්හ.

2. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක: 'මහණෙනි, දෙව්කම් සැපද මිනිස් කම්සැපද යන යම් මලපුඩු කෙනෙක් ඇද්ද ඒ හැම මලපුඩුයෙන් ගැලවුණෙමි. මහණනි, යම් ඒ දෙව්සැප මිනිස් සැප යන මලපුඩු ඇත්නම්, තෙපිද ඒ සියල්ලෙන් මිදුනහුය. එබැවින් මහණනි, බොහෝදෙනාට හිත පිණිස, බොහෝදෙනාට සුව පිණිස, අනුකම්පා පිණිස, දෙව් මිනිසුන්ට වැඩ පිණිස, හිත පිණිස, සුව පිණිස, රටින් රට, නුවරින් නුවර, ගමින් ගම සැරිසරවු, එක් පාරින් දෙදෙනෙක් නොයවු. මහණනි, මුල යහපත්, මැද යහපත්, අග යහපත් දහම අරුත් සහිතකොට දෙසවු. අකුරින් පෙදෙන් නොඅඩු කොට සම්පූර්ණකොට දෙසවු. සියලු අයුරින් පිරිපුන්, පිරිසුදු සසුන් බඹසර (බ්‍රහ්මචර්‍ය්‍යාව) හෙළිකොට දක්වවු. ප්‍රඥා ඇස වසා සිටි මඳ කෙලෙස් ඇතිසේවූ සත්හු ඇත්තාහ. දහම් නො අසන බැවින් දහමෙන් ඔහු පිරිහීයෙත්. දහම් දැනගන්නෝ ඇත්තාහ. මහණනි, මමත් දම් දෙසන්නට උරුවෙල් දනව් සේනානි නිගම යම් තැනකද එතැනට යන්නෙමි."

3. එවිට පාපී මාරතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙසේ කීය.

"මහණ, දෙව්සැපද, මිනිස් සැපද, යන මේ මලපුඩු ඇද්ද, සියල්ලෙන් ඔබ බඳනා ලද්දෙහි. මහ කෙලෙස් බැම්මෙන්ම ඔබ බඳනා ලදුයෙහි. ඔබ නොමිදෙන්නෙහිය"යි කීය.

4. "දෙව් සැපද, මිනිස් සැපද, යන මළපුඩුයෙන් මම් මිදී ගතිමි. මහ කෙලෙස් බැම්මෙන් මිදුනෙමි. මාරය තෝ නැසුණෙහිය"යි වදාළසේක.

5. එවිට පාපී මාරයා 'භාග්‍යවතුන් වහන්සේ මා හැඳින ගත්හ, සුගතයෝ මා හැඳින ගත්හ'යි දැන දුක්ව දොම්නස්ව අතුරුදන් විය.

---

## 6. සප්ප සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි කලන්දක නිවාප නම්වූ වේළුවනාරාමයෙහි වැඩ වසනසේක.

2. එකල වනාහි භාග්‍යවතුන් වහන්සේ එක් මහත් අන්ධකාරය ඇති රැයෙක එළිමහණෙහි හුන්සේක. වැහි පොදද එක දෙක වැටෙයි.

3. එකල පාපීවූ මාරයා භාග්‍යවතුන් වහන්සේට බිය, තැතිගැනුම්, ලොමුඩැහැගැනුම් ඇතිකරනු කැමැත්තෙන් මහත් නා රජකුගේ වෙස් ගෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය.

4. තනි රුකෙකින්ම කළ මහ ඔරුවක් යම්සේද ඔහුගේ කඳ එසේම විය. සුරා සාදන්නන්ගේ පිටෙහි අතුරන කළාලය යම් තරම්ද ඔහුගේ පෙණයද එතරම් වේ. කොසොල් රජු ආහාර ගන්නා රන් තලිය යම් පමණද, ඔහුගේ ඇස්ද එපමණම වේ. අහස ගුගුරන කල්හි නික්මෙන විදුලිය යම්සේද එසේම ඔහුගේ දිව මුවතුලින් නික්මෙයි. කඹුරු සම (මයිනහම) සුළඟින් පිරෙන කල ඇතිවන හඬ යම්බඳුද, ඔහු හුස්ම ගන්නා පිටකරනා හඬද එබඳුම වේ.

5. එවිට භාග්‍යවතුන් වහන්සේ 'මේ පාපී මාරයායැ'යි දැන ඔහුට මෙසේ ගාථාවෙන් වදාළ සේක.

> "යමෙක් හිඳීමාදිය පිණිස මිනිසුන්ගෙන් හිස්වූ ගෙවල් සෙව්නේද, ඒ තමා සංවරවූ මුනිතෙම ඔහු ඔහුගේ ආත්මභාවයෙහි ඇල්ම දුරුකොට හැසිරෙන්නේය. එබඳුවූ මුනිරජුන්ට මේ ආත්මයෙහි භයානක සත්තුද, අරමුණුද බොහෝය. තවත් ඇටමැස්සෝද, සර්පයෝද බොහෝය. එහෙත් හිස් ගෙට වන් ඒ මුනි උතුමා ඒ හේතුකොට ගෙන ලොම් ගසක් පමණකුදු නොසෙලෙන්නේය."

"අහස පුපුරතත්, පොළොව සෙලවෙතත්, සියලුම සතුන් තැති ගනිතත්, තියුණු යකඩ උලක් පපුවෙහි ගසතත්, බුදුවරු පඤ්චස්කන්ධයන්හි රැක්මක් නොකෙරෙත්."

6 ඉක්බිති ඒ පාපී මාරයා, 'භාග්‍යවත්හු මා දැනගත්හ, සුගතයෝ මා දැනගත්හ'යි සිතා දුක් දොම්නස් වැද එහිම අතුරුදන් වීය.

---

## 7. සුප්පති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහිවූ කලන්දක නිවාප නම්වූ වේළුවනාරාමයෙහි වැඩ වෙසෙන සේක.

2. එකල භාග්‍යවතුන් වහන්සේ දවසෙක රෑ බොහෝ වේලාවක්ම සක්මන් කොට රෑ ඉතා අලුයම්හි පා සෝදා විහාරයට ඇතුල්වී, දකුණු පය මත වම් පය මඳක් ඉක්මවා තබා, සිහිනුවණ ඇතිව, 'අසුවල් වේලෙහි නැඟී සිටුම්හ'යි අදහස සිත්හි කොට, දකුණු ඇලයෙන් උතුම් සැතපුම (සිංහශය්‍යාව) කළ සේක.

3. එකල්හි පාපී මාරයා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙසේ කීයඃ

"කිමෙක්ද, නිදන්නෙහිද? කුමට නිදන්නෙහිද? මළඑකකු සෙයින් මේ කුමට සැතපෙන්නෙහිද? 'මට හිස් ගෙයක් ලැබිණැ'යි සිතා සැතපෙන්නෙහිද? මේ හිරු නැගි කල්හි කවර හෙයින් නිදන්නෙහිද?"

4. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.) "දැලක් බඳුවූ, ඒ ඒ රූපාදිවූ අරමුණෙහි ඇලෙන තෘෂ්ණාව කිසි අරමුණකට (තමා) පමුණුවන්නට (හැකිසේ) යමකු තුළ නැද්ද, එසේවූ බුදුවරතෙම සියලු උපධි නසා ලීමෙන්

(සුවපත්ව) සැතපෙන්නේය. මරුව, මෙහි ලා තට කවර වැඩෙක්ද?"

5. පාපී මාරයා එය අසා, 'භගවත්හු මා හැඳිනගත්හ, සුගතයෝ මා දැනගත්හ'යි සිතා දුක් දොම්නස් වැද එහිම අතුරුදන් විය.

---

## 8. නන්දන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල්හි පාපී මාරයා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය.

"දරුවන් ඇති තැනැත්තේ දරුවන් කරණකොට සතුටු වේ. එසෙයින්ම ගවයින් ඇති තැනැත්තේ ගවයින් කරණකොට සතුටු වේ. උපධිහු (පස්කම් ගුණයෝ) වනාහි සත්වයන්ට සතුටට කරුණුයහ. යමෙක් උපධි (පස්කම් ගුණයන්) නැතියේ නම්, හේ සතුටක් නොම ලබයි."

3. (එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක:) "දරුවන් ඇත්තේ දරුවන් කරණකොට ශෝක කෙරේ. එසේම ගවයින් ඇත්තේද ගවයින් කරණකොට ශෝක කෙරේ. උපධීහු (කාමවස්තූහු) වනාහි සත්වයන්හට ශෝකයට කරුණුයහ. යමෙක් උපධි (පස්කම්) නැතියේ නම් ඔහු ශෝක නොකෙරේ.

4. ඉක්බිති පාපී මාරයා, 'භාග්‍යවත්හු මා දැනගත්හ, සුගතයෝ දැනගත්හ'යි සිතා එහිම අතුරුදන් විය.

---

## 9. (පළමුවන) ආයු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහිවූ කලන්දක නිවාප නම්වූ වේළුවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි, කියා භික්ෂූන්ට කථාකළ සේක. 'පින්වතුන් වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ.

2. භාග්‍යවතුන් වහන්සේ (ඔවුන්ට) මෙසේ වදාළ සේක. "මහණෙනි, මිනිසුන්ගේ මේ ආයුෂ මඳ එකෙක. පරලොව යා යුතුය. (එබැවින්) කුසල් කළ යුතුය. බ්‍රහ්මචරියාවෙහි හැසිරිය යුතුය. උපන්නහුට නොමැරී සිටීමෙක් නම් නැත. මහණෙනි, යමෙක් වැඩිම කලක් ජීවත්වන්නේ නම්, ඔහු සියක් අවුරුද්දක් හෝ එයට මඳක් වැඩියෙන් හෝ ජීවත් වෙයි."

3. ඉක්බිති පාපී මාරයා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන්ට ගාථාවෙන් මෙය කීය.

> "මිනිසුන්ගේ ආයුෂ දිගය. නුවණැති මිනිසා එය හෙළා නොදක්නේය. කිරිබීම පමණක් ඇති ළදරුවකු මෙන් හැසිරෙන්නේය. මරණය ළංවී ඊමෙක් නැත.'

> 4 (එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක) "මිනිසුන්ගේ ආයු මඳය. නුවණැති පුරුෂයා එය හෙළා දක්නේය. ඉස ගිනි ගත්තකු සේ හැසිරෙන්නේය. මරණය නොඊමෙක් නැත."

5. එවිට පාපී මාරයා, 'භාග්‍යවතුන් වහන්සේ මා දැන ගත්හ, සුගතයෝ මා දැනගත්හ'යි සිතා දුක් දොම්නස් වැද එහිම අතුරුදන් විය.

---

## 10. (දෙවෙනි) ආයු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ රජගහ නුවර සමීපයෙහි කලන්දක නිවාප

නම්වූ වේළුවනාරාමයෙහි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි,' කියා භික්ෂූන්ට කථාකළ සේක. 'පින්වතුන් වහන්සැ'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ.

2. එකල භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. "මහණෙනි, මිනිසුන්ගේ මේ ආයු මඳය. පරලොව යා යුතුය. කුසල් කළ යුතුය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරිය යුතුය. උපන්නහු නොමැරී ඉඳුමෙක් නැත. මහණෙනි, යමෙක් වැඩිම කලක් ජීවත්වන්නේ නම් ඔහු හවුරුදු සියයක් හෝ එයට මඳක් වැඩියෙන් හෝ ජීවත්වෙයි."

3. එවිට පාපී මාරයා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන්ට ගාථාවෙන් මෙය කීයඃ

"රෑ දාවල්හු මිනිසා ඉක්ම නොයත්. ජීවිතය නිරුද්ධ නොවේ. සතුන්ගේ ආයුෂ ඔවුන් අනුවම යයි. ඔවුන් අත්නොහරියි. රියෙහි ඒරියාකඳ අනුව යන නිම්වළල්ල මෙනි."

4. (එවිට භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේක) "රෑ දාවල් මිනිසා ඉක්ම යෙත්. ජීවිතය නිරුද්ධ වේ. මිනිසුන්ගේ ආයුෂ ගෙවේ. කුඩා ඇළදොළවල දිය මෙනි."

5. එවිට පාපී මාරයා 'බුදුහු මා හඳුනති. සුගතයෝ මා දනිතැ'යි දැන දුක්දොම්නස්ව එහිම අතුරුදන් විය.

(පළමු වග නිමියේය.)

---

## 2. රජ්ජ වර්ගය.

### 1. පාසාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර අසළ ගිජ්ඣකූළපව්වෙහි වසන සේක. එකල වනාහි භාග්‍යවතුන් වහන්සේ ඉතා කළුවර රෑයෙහි එළිමහනෙහි වැඩහුන් සේක. වැසි පොදද එක දෙක වැටේ.

2. එකල පාපී මාරයා භාග්‍යවතුන්ට බිය හා වෙවුලුම හා ලොමුදැහැගැන්ම ඇතිකරනු කැමැත්තේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට නොදුරෙහි මහත් මහත් ගල් උගුළුවා පෙරළා ලීය.

3. එවිට භාග්‍යවතුන් වහන්සේ 'මේ පාපී මාරයා'යයි දැන ඔහුට ගාථායෙන් මෙසේ වදාළසේක:

"ඉදින් මේ සියලුම ගිජ්ජකූළපව්ව සොලවන්නෙහි නමුදු මනාව කෙලෙසුන්ගෙන් මිදුනු බුදුවරුන්ගේ සෙලවීමෙක් නැත."

4. එවිට පාපී මාරතෙම 'භාග්‍යවත්හු මා දනිති. සුගතයෝ මා හඳුනති'යි සලකා දුක් දොම්නස්ව එහිම අතුරුදන් වීය.

---

## 2. සීහ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල භාග්‍යවතුන් වහන්සේ මහත් පිරිසක් විසින් පිරිවරණ ලදුව දම් දෙසති.

2. එකල පාපී මාරයාහට "මේ ගෞතම ශ්‍රමණ තෙමේ මහත් පිරිසක් විසින් පිරිවරණ ලද්දේ දහම් දෙසයි. දහම් අසන්නවුන්ගේ නුවණ ඇස කණ කරන්නට ශ්‍රමණ ගෞතමයන් කරා ගියොත් යෙහෙකැ"යි මේ සිත වීය.

3. ඉක්බිති පාපී මාරයා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙසේ කීය:

"කිම? පිරිසෙහි සිංහ රජෙකු නිර්භයව නාද කෙරෙහිද? දනුව. තට සමවූ සතුරෙක් ඇත. 'දිනූයෙකිමි'යි සිතනෙහිද?"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. (එවිට භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේක.) "ලොව ඇල්ම ඇතිකරන තණ්හාව ඉක්මවාලූ, බල (දසය) ලැබූ, මහා වීරවූ, තථාගතවරු පිරිස්හි නොබියව නාද කෙරෙත්මය. (ඉන් තට කිම?)"

5. එවිට පාපී මාරතෙම 'භගවත්හු මා දනිති, සුගතයෝ මා හඳුනති'යි සලකා දුක් දොම්නස්ව එහිම අතුරුදන් වීය.

---

## 3. සකලික සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර අසළ මද්දකුච්ඡි නම් මුව වෙනෙහි වැඩවසන සේක.

2. එකල වනාහි භාග්‍යවතුන් වහන්සේගේ පය ගල් පතුරෙකින් පැහැරුණේ වෙයි. භාග්‍යවතුන් වහන්සේගේ ශරීරයෙහි හටගත් දැඩිවූ, රළුවූ, නොමිහිරිවූ, නොමනාවූ මහත් දුක් වේදනා පැවැත්තේය. එහෙත් භාග්‍යවතුන් වහන්සේ ඒ හැම එළඹසිටි සිහි ඇතිව, නුවණ ඇතිව, නොපෙළමින් ඉවසති. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සඟළ සිවුර හතරට නමා එළා (දකුණු) පය මත (වම්) පය මඳක් ඉක්මවා තබා එළඹසිටි සිහි නුවණ ඇතිව උතුම් සැතපුමෙන් සැතපුණුසේක.

3. එවේලෙහි පාපී මාරයා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙසේ කීයඃ

"සිහි මුළායෙන් නොහොත් කවි බැඳීමට සිත සිතා කවි බැඳුමෙන් මත්ව නිදන කවියෙකු මෙන් මත්ව නිදන්නෙහිද? කළයුතු (අන්) බොහෝ වැඩ යුෂ්මතාට නැද්ද? කිසිවෙකු නැති මේ සස්නෙහි මේ කුමට තනිව නිදිබර මුහුණ ඇතිව නිදන්නෙහිද?"

(එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "මුළායෙකින් නොමනිදමි. කවි බැඳුමට සිත සිතා කවි

බැඳුමෙහි මත්ව නිදනා කවියෙකු මෙන් මත්ව නිදන්නෙක්ද නොවෙමි. අර්ථයට පැමිණෙන එහෙයින්ම පහවූ ශෝක ඇතිව, සියලු සතුන්ට අනුකම්පා ඇතිව, කිසිවකු නැති සෙනස්නෙහි තනිව සැතපෙමි.

"යම් කෙනෙකුන්ගේ පපුවෙහි (කෙලෙස්) හුල ඇනුණේද, එහෙයින්ම සැනෙන් සැනෙන් ළය සැලෙනු යේද, ඒ (කෙලෙස්) හුල් ඇති, ඔහු පවා නිදි ලබත්. එසේ කල්හි පහවූ සියලු හුල් ඇති මේ මම් කවර හෙයින් නොනිදම්ද?

"මම් වූකලී අවදිව ඉඳිමිනුත් සැක බිය නොගනිමි. නිදන්නට වුවද සැක බිය නැතියෙමි. රෑ දාවල්හු මා නොතවත්. ලොව කිසිම තැනෙක (මට) පිරිහීමක් නොදකිමි. එබැවින් සියලු සත් වග කෙරේ දයාවෙන් සැතපෙමි.

5. එවිට පාපී මාරයා 'භගවත්හු මා දනිති. සුගතයෝ මා හඳුනති'යි සලකා දුක් දොම්නස්ව එහිම අතුරුදන් විය.

---

## 4. පතිරූප සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසොල් රට ඒකසාල නම් බමුණු ගමෙහි වැඩවසනසේක. එකල භාග්‍යවතුන්වහන්සේ මහ ගිහි පිරිසක් විසින් පිරිවරණ ලද්දේ දහම් දෙසති.

2. එකල්හි පාපී මාරයාට මේ සිත පහළ විය. "මේ ශ්‍රමණ ගෞතමයා මහ ගිහි පිරිසක් විසින් පිරිවරණ ලද්දේ දහම් දෙසයි. නුවණැස කණ කරනු පිණිස ශ්‍රමණ ගෞතමයා යම් තැනෙකද, එතැනට පැමිණීම යහපති.'

3. ඉක්බිති පාපී මාරයා භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙසේ කීයඃ

"අන්හට අනුශාසනා කෙරුම යුෂ්මත්හට නොවටී. එය කෙරෙමින් රිසිබැව් නොරිසිබැව් දෙක්හි නොඇලෙව.

4. (භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේක.) "බුදුවරයෙක් ලොවට හිත කැමතියේ, දයා පතුරුවනුයේ අන්හට අනුශාසන කෙරේද, තථාගතවූ හෙතෙම රිසි-නොරිසි දෙකින්ම මිදුනෙක."

5. එවිට පාපී මාරයා 'භගවත්හු මා දනිති, සුගතයෝ මා හඳුනති'යි සලකා දුක් දොම්නස් වැද එහිම අතුරුදන් විය.

---

## 5. මානස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අසල අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩ වසනසේක.

2. එකල පාපී මාරයා භාග්‍යවතුන් වෙත පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන්ට ගාථායෙන් මෙසේ කීයඃ

"අහසින් යන්නවුන් පවා බැඳගන්නා, සිත පහළ වන යම් රාග මලපුඩුයෙක් ලොව නැත්තේද, එයින් තා පෙළා බැඳගන්නෙමි. මහණ, තෝ මගෙන් නොමිදෙන්නෙහිය."

3. (භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේක.) "ඇදගන්නාවූ රූප, ශබ්ද ගන්ධ, රස හා කය හැපෙන දේ යන පස්කම් කෙනෙක් වෙද්ද, එහි ඇල්ම පහව ගියේය. මාරය තෝ නැසුණෙහිය."

4. එවිට පාපී මාරයා 'භගවත්හු මා දනිති, සුගතයෝ මා හඳුනති'යි සලකා දුක් දොම්නස් වැද එහිම අතුරුදන් විය.

---

## 6. පත්ත සූත්‍රය.

මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අසල අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

1. එකල භාග්‍යවතුන්වහන්සේ උපාදානස්කන්ධ තණ්හා පස පිළිබඳව භික්ෂූන්ට කරුණු දක්වනසේක, එහි සැටි ආදිය ඔවුන් සිතෙහි ගන්වනසේක, ඔවුන් උනන්දු කරන සේක. ඔවුන් අවබොධකළ ගුණ වර්ණා ඔවුන් සිත ප්‍රීතිකරවන සේක, ඒ භික්ෂූහු එය වැඩ ඇති දෙයක් කොට ගෙන සිතෙහි ලා, මුළු සිතින් එය එක්කොටගෙන යොමු කළ කන් ඇතියෝව බණ අසත්.

2. එකල්හි පාපී මාරයාහට මේ සිත ඇතිවිය. "ශ්‍රමණ ගෞතම තෙම උපාදානස්කන්ධ පස ගැන භික්ෂූන්ට දැහැමි කථායෙන් කරුණු දක්වයි. ඒ ඔවුන් සිතෙහි ගන්වයි, එහි ඔවුන් උනන්දුකරයි. ඔවුන් සිත ප්‍රීතිකරයි. ඒ භික්ෂූහුද එයට කැමතිව ඒ සිත්හි ලා මුළු සිතින් එක්කොටගෙන යොමුකළ කන් ඇතියෝව බණ අසත්, ඔවුන්ගේ නුවණැස කණ කරලන්නට ශ්‍රමණ ගෞතම තෙම කරා ගියොත් යෙහෙක."

3. එකල බොහෝ පාත්‍රා (වේලනු පිණිස) එළිමහණෙහි තබන ලද්දෝය.

4. එවිට පාපී මාරයා ගොන් වෙසක් මවාගෙන ඒ පාත්‍ර තිබුණු තැනට පැමිණියේය.

5. එවිට එක්තරා භික්ෂුවක් අන් භික්ෂුවකට "මහණ, මහණ, අර ගොනා පාත්‍ර බිඳී"යි කීය.

6. එසේ කීකල භාග්‍යවතුන්වහන්සේ ඒ භික්ෂුහට "භික්ෂුව, ඒ ගොනෙක් නොවේ, පාපී මාරයාය, තොප නුවණැස් කණ කරන්නට ආයේය"යි වදාළසේක.

7. ඉක්බිති 'මේ පාපී මාරයා,'යි දැන භාග්‍යවතුන් වහන්සේ ඔහුට ගාථායෙන් මෙසේ වදාළසේකඃ

"රූප, වේදනා, සංඥා, විඥාන සහ යම් සංස්කාර කෙනෙක් ඇද්ද, ඒ මේ පඤ්චස්කන්ධය 'මම් නොවෙමි" 'මෙය මාගේ නොවේයැ'යි නුවණින් දක්නේ මෙසේ එහි ඇල්ම හරී.

"මෙසේ නොඇලුණු, උවදුරින් මිදුණු ආත්මභාවය ඇති, සියලු භව බැඳුම් (සංයෝජන) ඉක්මවා සිටි ඒ රහත්හු මරසෙන් පවා හැම තන්හිම සොයනුයේ නුමුදු ඔහු නොම දක්නේය."

8. එවිට පාපී මාරයා 'භගවත්හු මා දනිති, සුගතයෝ මා හඳුනති'යි සලකා දුක් දොම්නස් වැද එහිම අතුරුදන්විය.

---

## 7. ආයතන සූත්‍රය.

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ විසල්පුර අසල මහා වනයෙහි කූටාගාරශාලා නම් වෙහෙර වැඩවසන සේක.

එකල භාග්‍යවතුන් වහන්සේ ස්පර්ශායතන සය ගැන මහණ සමූහයාට දැහැමි කථායෙන් කරුණු දක්වන සේක. ඒ ඔවුන් සිතෙහි ගන්වන සේක. එහි ඔවුන් උනන්දුකරන සේක. ඔවුන් සිත පහදවන සේක. ඒ මහණ සමූහයාද ඒ වැඩ ඇති දෙයක් කොටගෙන, සිත්හි ලා, මුළු සිතින් ඒ එක් කොටගෙන කන් යොමා බණ අසත්.

2. එකල පාපී මාරයාට මේ සිත විය. "ශ්‍රමණ ගෞතම තෙම ස්පර්ශායතන සය ගැන දහම් කථාවෙන් මහණ සමූහයාට කරුණු දක්වයි. ඒ ඔවුන් සිත්හි ගන්වයි. එහි ඔවුන් උනන්දු කරයි. ඔවුන් සිත ප්‍රීති කරවයි. ඒ භික්ෂූහුද එයට කැමතිව සිත්හි ලා මුළු සිතින් එක්කොටගෙන කන් යොමා අසන්නාහ. ඔවුන් නුවණැස් කණ කරලන්නට ශ්‍රමණ ගෞතමයන් කරා ගියොත් යහපත."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. ඉක්බිති පාපී මාරයා භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් නොදුරෙහි පොළොව පැළී යන කලක් සෙයින් මහ භයානක හඬක් කෙළේය.

4. එවිට එක්තරා මහණෙක් අන් මහණකුට "මහණ මහණ, මේ පොළොව පැළී විවර වන්නා සේය"යි කීය.

5. මෙසේ කී කල්හි භාග්‍යවතුන්වහන්සේ ඒ මහණහට මහණ, මෙය පොළොව පැළීයන්නා නොවේ. මේ පාපී මාරයාය. ඔහු තොප නුවණැස් පියවාලන්නට ආයේය"යි වදාළසේක.

6. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ 'මේ පාපී මාරයාය'යි දැන ඔහුට ගාථායෙන් මෙය වදාළසේකඃ

> "රූපයද, ශබ්දයද, ගන්ධයද, කය හැපෙන දේද, සිතෙහි අරමුණුද, යන මේ හැම ලොව නපුරු ඇමය. ලෝවැස්සා මෙහි දැඩිසේ ඇලී ගියේය."

> "බුදුහුගේ සිහි ඇති ශ්‍රාවක තෙම මේ (ආයතන සයද) ඉක්මවා, මාරයාට ස්ථානයවූ මේ (තුන් භවයද) පසු කොට ලා, සූර්‍ය්‍යයා මෙන් බැබළෙයි."

7. එවිට පාපී මාරයා 'භගවත්හු මා දනිති, සුගතයෝ මා හඳුනති'යි සලකා දුක් දොම්නස් වැද එහිම අතුරුදන් විය.

---

## 8. පිණ්ඩ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ මගධරට පඤ්චසාලා නම් බමුණුගම වැඩවසන සේක.

2. එකල වනාහි පඤ්චසාලා බමුණුගම කුමරුවන්ගේ පඬුරු කෙළියක් වෙත්. (තුටුපඬුරු එළවන සැණකෙළියෙක් වේ.)

3. එකල භාග්‍යවතුන්වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරෙව පාත්‍ර සිවුරු ගෙන එගමට පිඬු පිණිස වන්සේක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

4. එකල පඤ්චසාලා බමුණුගම වැසි බමුණන්ටත් ගෘහපතියන්ටත් පාපී මාරයා ශ්‍රමණ ගෞතම තෙම පිණ්ඩපාතය නොලබාවා'යි සිතා ආවේශ විය.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සේදූ පාත්‍රයෙන් යුතුව යම්සේ එගමට පිඬු පිණිස වැඩිසේක්ද, එසේම සේදූ පමණක්මවූ හිස් පාත්‍රයෙන් යුතුව ආපසු වැඩිසේක.

6 ඉක්බිති පාපී මාරයා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, "මහණ, පිණ්ඩපාතය ලද්දෙහිදැ"යි භාග්‍යවතුන් වහන්සේගෙන් ඇසීය.

7. "පාපී මාරය, මා පිඬු නොලබන ලෙසක් තෝ කෙළෙහි නොවේද?"

8. "ස්වාමීනි, එසේ නම් භාග්‍යවතුන් වහන්සේ දෙවෙනි වරෙකද පඤ්චසාලා බමුණුගමට පිඬු පිණිස පිවිසෙන සේක්වා. යම්සේ භාග්‍යවතුන් වහන්සේ පිඬු ලබනසේක් වන්නෝද, ඒ සැටි කරන්නෙමි."

(එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "මාරතෙම තථාගතයන් වහන්සේ ගටා පව් රැස් කර ගත. පවිට, තෝ 'මට පව් පල නොදෙතැ'යි සිතහිද? එසේ (නොසිතව.)

"බලව, යම්බඳු අපට කිසි හිරිහැරයක් නැද්ද, ඒ අපි ඉතා සුවසේ ජීවත්වම්හ. ආභස්සර දෙවියන්සේ ප්‍රීතියම ආහාර කොටැති වන්නෙමු."

9. එවිට පාපී මාරයා 'භගවත්හු මා දනිති. සුගතයෝ මා හඳුනති'යි සලකා දුක් දොම්නස් වැද, එහිම අතුරුදන් විය.

---

## 9. කස්සක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින්

කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ මහණ සමූහයාට නිවන් පිළිබඳවූ දහම් කථායෙන් කරුණු දක්වනසේක. කරුණු සිතෙහි ගන්වනසේක. එහි ඔවුන් උනන්දු කරවන සේක. ඔවුන් සිත ප්‍රීති කළසේක. ඒ මහණ සමූහයාද එයට කැමැතිව, සිත්හි ලාගෙන, මුළු සිතින්ම එක්කොටගෙන යොමාලූ කන් ඇතිව බණ අසත්.

2. එවිට පාපී මාරයාට මේ අදහස විය. "මේ ශ්‍රමණ ගෞතමයා නිවන් පිළිබඳ දහම් කථායෙන් මහණ සමූහයාට කරුණු දක්වයි. කරුණු සිතෙහි ගන්වයි. එහි ඔවුන් උනන්දු කරවයි. ඔවුන් සිත ප්‍රීති කරවයි. ඒ මහණසමූහයාද එයට කැමතිව සිත්හි ලාගෙන, මුළුසිතින්ම එක්කොටගෙන, යොමු කළ කන් ඇතියෝව බණ අසත්. ඔවුන් නුවණැස් අවුරණු සඳහා මහණ ගොයුම්හු කරා යන්නෙම් නම් යෙහෙක."

3. පාපී මාරයා ගොවි වෙස් ගෙන, මහ නඟුලක් කරෙහි තබාගෙන, දික් කැවිටි ලීයක් අතින් ගෙන, විසිර ගිය කෙස් ඇතිව, ගණ රෙද්දක් පොරවාගෙන, මඩ වැකුණු පයින් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය.

4. "පැමිණ මහණ, මා ගොනුන් දුටුයෙහිදැ"යි භාග්‍යවතුන් වහන්සේගෙන් ඇසීය.

5. පව්කාරය, තට ගොනුන්ගෙන් කවර වැඩෙක්ද?"

6. "මහණ, ඇස මගේමය, රූප මගේමය, ඇස හා රූපයාගේ පහසින් උපදනා විඥ්ඥාණායතනයද මගේමය. එසේ කල මහණ, කොහි ගොස් මගෙන් මිදෙන්නෙහිද? මහණ, කණද මගේමය, හඬද මගේමය, කණ හා හඬෙහි පහසින් උපදනා විඥ්ඥාණායතනයද මගේමය. එසේ කල මහණ, කොහි ගොස් මගෙන් මිදෙන්නෙහිද? නැහැය මගේමය, ගඳද මගේමය, ඒදෙකෙහි පහසින් උපදනා විඥ්ඥාණායතනයද මගේමය. එසේ කල මහණ, කොහි ගොස් මගෙන් මිදෙන්නෙහිද? දිව මගේමය, රසද මගේමය, ඒදෙකෙහි පහසින් උපදනා විඥ්ඥාණායතනයද මගේමය. එසේ කල මහණ, කොහි ගොස් මගෙන්

මිදෙන්නෙහිද? කයද මගේමය, එහි හැපෙන දේත් මගේමය. ඒදෙකෙහි පහසින් උපදනා විඤ්ඤාණයද මගේමය. එසේ කල මහණ, කොහි ගොස් මගෙන් මිදෙන්නෙහිද? මනස මගේමය, දහම් අරමුණුත් මගේමය, ඒදෙකෙහි පහසින් උපදනා විඤ්ඤාණායතනයත් මගේමය. එසේ කල, මහණ, කොහි ගොස් මගෙන් ගැලවෙන්නෙහිද?"

7. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "පවිකාරය, ඇස තගේමය, රූප තගේමය, ඇස හා රූපයෙන් උපදනා විඤ්ඤාණායතනයද තගේමය. පවිකාරය, යම්තැනෙක වනාහි ඇසත් නැත්නම්, රූපයත් නැත්නම්, ඇස් පහසින් උපදනා විඤ්ඤාණයත් නැත්නම්, එහි තාගේ ගමනෙක් නැත.

8. "පවිකාරය, කණද තගේමය, කණ හා ශබ්දයෙන් උපදනා විඤ්ඤාණායතනයද තගේමය. පවිකාරය, යම් තැනෙක වනාහි කණත් නැත්නම්, ශබ්දයත් නැත්නම්, කණේ පහසින් උපදනා විඤ්ඤාණයත් නැත්නම්, එහි තගේ ගමනෙක් නැත.

9. "පවිකාරය, නැහැය තගේමය, ගඳ තගේමය., නැහැය හා ගඳෙන් උපදනා විඤ්ඤාණායතනයද තගේමය. පවිකාරය, යම්තැනෙක වනාහි නැහැයත් නැත්නම්, ගඳත් නැත්නම්, ගඳෙන් උපදනා විඤ්ඤාණයත් නැත්නම්, එහි තගේ ගමනෙක් නැත.

10. "පවිකාරය, දිව තගේමය, රසත් තගේමය, දිව හා රසෙන් උපදනා විඤ්ඤාණායතනයද තගේමය. පවිකාරය, යම් තැනෙක වනාහි දිවත් නැත්නම්, රසත් නැත්නම්, දිවේ පහසින් උපදනා විඤ්ඤාණයත් නැත්නම්, එහි තගේ ගමනෙක් නැත.

11. "පවිකාරය, සිත තගේමය, සිත් අරමුණු තගේමය, සිත හා සිත් අරමුණෙන් උපදනා විඤ්ඤාණායතනයද තගේමය පවිකාරය, යම් තැනෙක වනාහි සිතත් නැත්නම් සිත් අරමුණුත් නැත්නම් සිතේ පහසින් උපදනා විඤ්ඤාණයත් නැත්නම් එහි තාගේ ගමනෙක් නැත.

12. (එවිට මාරයා මෙසේ කීයඃ) "යමෙකුට 'මෙය මගේය'යි කියත්ද, යම් කෙනෙක්, 'මෙය මගේය'යි කියත්ද,

එතන්හි ඉදින් ඔබගේ සිත ඇත්තේ නම්, මහණ, ඔබට මගෙන් මිදීමෙක් නැත.”

13. (බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළසේක:) “යමක් ‘මෙය මගේය’යි කියත්ද, ඒ කිසිත් මගේ නොවේ. යම් කෙනෙක් හෝ ‘මෙය මගේය’යි කියත්ද, මම ඒ කිසිවෙකුත් නොවෙමි. පාපිය, කාරණය මෙසේ දනුව. මා ගිය මාර්ගයවත් තෝ නොදත්තෙහිය.”

14. එවිට පාපී මාරයා ‘භගවත්හු මා දනිති. සුගතයෝ මා හඳුනති’යි සලකා දුක් දොම්නස් වැද, එහිම අතුරුදන් විය.

---

## 10. රජ්ජ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක භාග්‍යවතුන්වහන්සේ කොසොල්රට හිමවත පැත්තේ අරණ්‍ය කුටියක වැඩවසන සේක.

2. එකල්හි තනිව විවේකයෙන් සිටියාවූ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කල්පනාවෙක් විය. “අනුන් නොනසමින්, නොනස්වමින්, නොදිනමින්, නොදිනවමින්, ශෝක නොකරමින්, ශෝක නොකරවමින්, දැහැමෙන්, රජය කරවන හැකිද?”

3. පාපී මාරයා භාග්‍යවතුන් වහන්සේගේ සිතෙහි කල්පනාව තම සිතින් දැන, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට, “ස්වාමීනි, නොනසමින්, නොනස්වමින්, නොදිනමින්, නොදිනවමින්, ශෝක නොකෙරෙමින්, ශෝක නොකරවමින්, භාග්‍යවතුන්වහන්සේ දැහැමින් රජය කරවනසේක්වා.”

4. එවිට භාග්‍යවතුන් වහන්සේ “පාපිය, නොනසමින්, නොනස්වමින්, නොදිනමින්, නොදිනවමින්, ශෝක නොකෙරෙමින්, ශෝක නොකරවමින්, භාග්‍යවතුන්වහන්සේ දැහැමින් රජය කරවනසේක්වා’යි මට මෙසේ කියන්නට තෝ කවර කරුණක් දක්නෙහිදැ?යි කීහ.

5. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් ඍද්ධිපාද සතර වඩන ලදහ, බහුල කරන ලදහ, යෙදූ යානයක්සේ කරන ලදහ, තහවුරු කොට තම සිත පිහිටුවන ලදහ, නොහැර නිතර තමා කෙරෙහි පවත්වන ලදහ, පුරුදුකරන ලදහ, මැනවින් සම්පූර්ණකරන ලදහ. ඉදින් භාග්‍යවතුන් වහන්සේ කැමති නම් 'හිමාලය පර්වතය රන් ගොඩක්ම වේවා'යි සිතුවහොත්, ඒ පර්වතය රන් ගොඩක්ම වන්නේය"යි (මාරයා කීය.)

6. (එවිට භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේක) "රනින්ම නිමියාවූ රන් ගොඩක්මවූ එක පර්වතයක් තබා එමෙන් දෙගුණයක් මහත් පර්වතයක් වූවද, එය එක් පුරුෂයෙකුට සිතට නොසෑහේ. මෙසේ මෙකරුණ දන්නා නුවණැත්තේ සමව හැසිරෙන්නේය.

"යම් පස්කම් හේතුයෙන් දුක් පහළ වේයයි යමෙක් මෙසේ දුක දුටී නම්, ඒ සත්තෙම කෙසේ නම් එකී පස්කම්හි නැමෙන්නේද? නුවණැති පුද්ගල තෙම 'පස්කම් ලෝකයෙහි සිත බැඳෙන දේය'යි දැන එය දුරුකිරීම පිණිස හික්මිය යුතු."

7. එවිට පාපී මාරයා 'බුදුරජහු මා දැනගතී, සුගතයෝ මා දැනගති'යි දුක්ව නොසතුටුව එහිම අතුරුදන් විය.

දෙවෙනි වගයි.

---

## මාර වර්ගය

### 1. සම්බහුල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය රටෙහි සීලාවතී ගමෙහි වැඩවසන සේක.

2. එකල වනාහි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට නොදුරු තැන, එළඹ සිටි සිහි ඇතිව, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, නිවන් කරා මෙහෙයූ සිත් ඇතිව, වෙසෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**3.** එකල්හි පාපී මාරයා බමුණු වෙසක් මවාගෙන, මහත් ජටාවක් බැඳගෙන, අඳුන්දිවි සම් හැඳ පොරවාගෙන, මහලුව වකුටු පරාලයක්සේ වක්වූ ශරීරයක් ඇතිව, සුරු සුරු යන හඬින් හුස්ම පිටකෙරෙමින්, දිඹුල් සැරයටියක්* අතින් ගෙන, ඒ භික්ෂූහු යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, පැවිදිවරු ළපටියහ, තරුණයහ, කළු කෙහෙ ඇතියහ, මනා තරුණ භාවයෙන් යුක්තයහ, කම්සුව නොවිඳියෝහ. භවත්හු මිනිස් කම් සැප විඳිත්වා. දැන් මේ ආත්මයෙහි වින්ද යුතු සැප හැර, කල් ගොසින් වින්ද යුතු සැපක් ඔස්සේ නොදුවත්වා"යි කීය.

**4.** එවිට ඒ භික්ෂූහු, "බමුණ, මේ ආත්මයෙහිදී වින්ද යුතු සුව හැරදමා කල් ගොසින් ලැබෙන සැපක් ඔස්සේ අපි නොදුවමු. බමුණ, කල් ගොසින් ලැබෙන සැප හැරදමා මේ ආත්මයෙහිදීම ලැබිය යුතු සැප ඔස්සේ දුවමු. බමුණ, 'කම්සැප වනාහි කල් ගොසින් ලැබෙන දෙයක, බොහෝ දුක් ඇති එකෙක, දැඩි වෙහෙස ඇති එකෙක, මෙහි දොස් බොහෝයැ'යිද, 'මේ ලොවුතුරා දහම වනාහි මේ ආත්මයෙහිම තමා විසින්ම වින්ද යුතුය, කල් නොයවා සැප පල දෙන ස්වභාව ඇත්තේය. එව බලවයි කියයුතුය, තම සිත්හි පමුණුවාලීමට සුදුසුය, නුවණ ඇත්තන් විසින් තම තමන් කෙරෙහිලා දතයුතුයැ'යිද, භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලදැ"යි කීහ.

**5.** මෙසේ කී කල්හි පාපී මාරයා තම හිස පහතට වනා, දිව දික්කොට ලෙලවා, බැම හකුළුවා, නලළෙහි තුන් රැළි නංවා, සැරයටියට බරව (එබී) නික්ම ගියේය.

**6.** ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියෝය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක උන්හ. එක් පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවාහුය.

* කිසිවකට ආශාවක් නැති බව හැඟවීමට දිඹුල් ලී සැරයටියක් ගනී.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

7. "ස්වාමීනි, අපි මෙහි භාග්‍යවතුන් වහන්සේට නොදුරෙහි නොපමාව එළඹ සිටි සිහි ඇතියෝව, කෙලෙස් තවන වීයඊ ඇතියෝව, නිවන් කරා මෙහෙයූ සිතැතියෝව, විසීමු. එකල එක්තරා මහළුවූ, වකුටු පරාලයක්සේ වක්වූ බමුණෙක් ජටාවක් බැඳගෙන, අඳුන් දිවි සම් හැඳ පෙරවා, සුරු සුරු යන ශබ්දයෙන් හුස්ම හෙලමින්, දිඹුල් ලීයෙන් කළ සැරයටියක් ගෙන, අප කරා පැමිණියේය. පැමිණ, 'භවත් පැවිදිවරු ළපටියහ, තරුණයහ, කළු කෙහෙ ඇතියහ, මනා තරුණ බවෙන් යුක්තයහ, කම්සැප නොවිඳියෝහ, භවත්හු මිනිස් කම් සැප විඳිත්වා. දැන් මේ ආත්මයෙහි වින්දයුතු සැප හැර කල් ගොසින් වින්දයුතු සැපක් ඔස්සේ නොදුවත්ව'යි අපට කීය.

8. "ස්වාමීනි, එසේ කීකල අපි ඔහුට, 'බමුණ, මේ ආත්මයෙහි වින්දයුතු සැප හැරදමා කල් ගොසින් ලැබෙන සැපක් ඔස්සේ අපි නොදුවමු. බමුණ, 'කම්සැප වනාහි කල් ගොසින් ලැබෙන දෙයකි, බොහෝ දුක් ඇති එකෙක, දැඩි වෙහෙසක් ඇති එකෙක, මෙහි දොස් බොහෝය'යිද, 'මේ ලොවුතුරා දහම් වූකලි කල් නොයවා සැප එලදෙන ස්වභාව ඇත්තේය, එව බලවයි කියයුත්තෙක, තම සිත්හි පමුණුවාලීමට සුදුසුය, නුවණ ඇත්තන් විසින් තම තමන් කෙරෙහි ලා දතයුතුය'යිද, භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදැ'යි කීමු.

9. "ස්වාමීනි, මෙසේ කීකල්හි ඒ බමුණුතෙම හිස පහතට වනා, දිව දික්කොට ලෙලවා, බැම හකුළුවා, නලළෙහි තුන් රැළි නංවා, සැරයටියට බරව, නික්ම ගියේය."

10. එවිට භාග්‍යවතුන් වහන්සේ: "මහණෙනි, ඒ බමුණෙක් නොවේ. ඒ පාපී මාරයාය. තොපගේ නුවණඇස් වසාලන්නට ආයේය"යි වදාළ සේක.

11. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණ සලකා එවේලෙහි මේ ගාථාව වදාළ සේක.

"යමෙක් දුක යම් පස්කම් සැපක් මුල්කොට පවතී යයි දිටීද, ඒ සත්වතෙම ඒ කම්සැප කෙරෙහි කෙසේ නම්

නැමිය හැක්කේද? කම්සැප ලොව සතුන් ලැගෙනා දේයයි දැන සත්වතෙම එයම දුරලනු පිණිස හික්මෙන්නේය."

---

## 2. සමිද්ධි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි සීලවතියෙහි වසනසේක.

2. එකල වනාහි ආයුෂ්මත් සමිද්ධි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට නොදුරෙහි නොපමාව, කෙළෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, නිවන් අතට මෙහෙයූ සිතැතිව වෙසෙති.

3. එකල වනාහි තනිව විවේකයෙන් හුන් ආයුෂ්මත් සමිද්ධි තෙරණුවන්ට 'යම් බඳුවූ මාගේ ශාස්තෲන් වහන්සේ අර්හත් සම්‍යක් සම්බුද්ධද, ඉන් මට වූයේ ඒකාන්තයෙන් මහත් ලාභයෙක, මා ආත්මභාවය හොඳාකාර ලදුයේය. යම්බඳු මම් හොඳාකාර දෙසූ දහම් විනයෙහි (සස්නෙහි) පැවිදි වීම්ද, ඒ මට වූයේ මහත් ලාභයෙක, ඒ මා විසින් ආත්මභාවය මැනවින් ලදුයේ වන. යම්බඳු මගේ සබ්‍රහ්මචාරීවරු සිල්වත් වෙත්ද, මනා ස්වභාව ඇතියෝ වෙත්ද, ඒ මට වූයේ මහත් ලාභයෙක. ඒ මා ආත්මභාවය මැනවින් ලදුයේය'යි මෙසේ සිතෙහි කල්පනාවෙක් උපන.

4. එකල පාපී මාරයා, තම සිතින් ආයුෂ්මත් සමිද්ධි තෙරුන්ගේ සිත දැන, සමිද්ධි ආයුෂ්මතුන් යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ සමිද්ධි ආයුෂ්මතුන්ට නොදුරෙහි පොළොව පැළී යන කලෙක සෙයින් බිය උපදවන මහත් භයානක හඬක් කෙළේය.

5. ඉක්බිති ආයුෂ්මත් සමිද්ධි තෙරුණුවෝ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක් පසෙක උන්හ. එසේ එක් පසෙක හුන් ආයුෂ්මත් සමිද්ධි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

6. "ස්වාමීනි, මම මෙහි භාග්‍යවතුන් වහන්සේට නොදුරෙහි නොපමාව, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, නිවන් අතට මෙහෙයූ සිතැතිව, විසීමි. තනිව විවේකයෙන් හුන් ඒ මට යම්බඳුවූ මාගේ ශාස්තෘන්වහන්සේ අර්හත් සම්‍යක් සම්බුද්ධද ඉන් මට වූයේ මහත් ලාභයෙකි, යම්බඳුවූ මම යහපත් කොට දෙසූ ධර්ම විනයෙහි පැවිදි වීම්ද, එයින් මට වූයේ මහත් ලාභයකි, මාගේ බ්‍රහ්මචාර්‍ය්‍යවරු සිල්වත් වෙති, ගුණවත් වෙති, ඉන් මට වූයේ මහත් ලාභයෙක, මෙසේ කල්පනාවෙක් උපන. ස්වාමීනි, ඒ මා නොදුරෙහි පොළොව පැළී යන්නා බඳුවූ බිය උපදවන භයංකාර මහ හඬෙක් වීය"යි.

7. එවිට භාග්‍යවතුන් වහන්සේ: "සමිද්ධිය, ඒ පොළොව පැළීගියා නොවේ. ඒ පාපී මාරයා තොපගේ නුවණ ඇස අඳුරු කරන්නට ආයේය. සමිද්ධියෙනි, තෙපි යව්. එහිම නොපමාව, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, නිවන් කරා මෙහෙයූ සිතැතිව වසවු" යයි වදාළ සේක.

8. "එසේය, ස්වාමීනි,"යි කියා ආයුෂ්මත් සමිද්ධි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට උත්තර දී හුන් අස්නෙන් නැගී සිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණුකොට නික්මීයේය.

9. දෙවෙනි වරද ආයුෂ්මත් සමිද්ධි තෙරණුවෝ එහිම නොපමාවම, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, නිවන් කරා යොමු කළ සිතැතිව විසූහ. දෙවෙනි වරද තනිව ආයුෂ්මත් සමිද්ධි තෙරුන්හට "යම්බඳුවූ මාගේ ශාස්තෘන් වහන්සේ අර්හත් සම්‍යක් සම්බුද්ධද, ඉන් මට වූයේ මහත් ලාභයෙකි. යම්බඳුවූ මම යහපත්කොට දෙසූ ධර්ම විනයෙහි පැවිදි වීම්ද, එයින් මට වූයේ මහත් ලාභයකි, මාගේ සබ්‍රහ්මචාර්‍ය්‍යවරු සිල්වත් වෙති, ගුණවත් වෙති, ඉන් මට වූයේ ලාභයෙක, මා විසින් ආත්මභාවය මැනවින් ලද්දේය'යි මේ කල්පනාව සිතෙහි පහළ විය. දෙවෙනි වරද පාපී මාරතෙම ආයුෂ්මත් සමිද්ධි තෙරුන්ගේ සිතෙහි කල්පනාව තම සිතින් දැන, සමිද්ධි ආයුෂ්මතුන් යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, පොළොව පැළීයන කලෙක සෙයින් බිය උපදවන මහ භයංකාර හඬක් කෙළේය.

**10.** එවිට ආයුෂ්මත් සමිද්ධි තෙරණුවෝ 'මේ පාපී මාරයා'යි දැන, පාපී මාරයාට ගාථායෙන් මෙසේ කීයඃ

"මම් ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම පැවිදිවූයෙමි. ඒ මගේ සිහියත් ප්‍රඥාවත් වැඩුණහ. මගේ සිත මැනවින් පිහිටුවන ලද්දේවේ. තට කැමැතිසේ බිහිසුණු දේ කරව. එහෙත් තෝ මා නොසොලවන්නෙහි."

**11.** එවිට පවිටු මරතෙම 'සමිද්ධි මහණතෙම මා දනීය'යි දුක් ඇතිව, දොම්නස් ඇතිව, එහිම අතුරුදන් විය.

---

## 3. ගෝධික සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර අසළ කලන්දකනිවාප නම්වූ වේළුවනයෙහි වැඩවසන සේක.

**2.** එකල්හි ආයුෂ්මත් ගෝධික තෙරණුවෝ ඉසිගිලි කන්ද පැත්තක කළුගලෙහි වෙසෙති.

**3.** එකල ආයුෂ්මත් ගෝධික තෙරණුවෝ නොපමාව, කෙලෙස් තවන වීයඖ ඇතිව, නිවන් කරා මෙහෙයූ සිතැතිව, වසනුවෝ ලෞකික ධ්‍යාන ලැබූහ. ඉක්බිති ආයුෂ්මත් ගෝධික තෙරණුවෝ ඒ ලෞකික ධ්‍යානයෙන් ලත් චිත්ත විමුක්තියෙන් පිරිහුණහ.

**4.** දෙවෙනි වරද ආයුෂ්මත් ගෝධික තෙරණුවෝ නොපමාව, කෙලෙස් තවන වීයඖ ඇතිව, නිවන් කරා මෙහෙයූ සිතැතිව, වසනුවෝ ලෞකික ධ්‍යාන ලැබූහ. දෙවෙනි වරද ආයුෂ්මත් ගෝධික තෙරණුවෝ ඒ ලෞකික ධ්‍යානයෙන් ලත් චිත්ත විමුක්තියෙන් පිරිහුණහ.

**5.** තුන්වෙනි වරද ආයුෂ්මත් ගෝධික තෙරණුවෝ නොපමාව, කෙලෙස් තවන වීයඖ ඇතිව, නිවන් කරා මෙහෙයූ සිතැතිව, වසනුවෝ ලෞකික ධ්‍යාන ලැබූහ. තුන්වෙනි වරද

ආයුෂ්මත් ගෝධික තෙරණුවෝ ඒ ලෞකික ධ්‍යානයෙන් ලත් චිත්ත විමුක්තියෙන් පිරිහුණහ.

6. සතරවන වරද ආයුෂ්මත් ගෝධික තෙරණුවෝ නොපමාව, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, නිවන් කරා මෙහෙයූ සිතැතිව, වසනුවෝ ලෞකික ධ්‍යාන ලැබූහ. සතරවෙනි වරද ආයුෂ්මත් ගෝධික තෙරණුවෝ ඒ ලෞකික ධ්‍යානයෙන් ලත් චිත්තවිමුක්තියෙන් පිරිහුණහ.

7. පස්වන වරද ආයුෂ්මත් ගෝධික තෙරණුවෝ නොපමාව, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, නිවන් කරා මෙහෙයූ සිතැතිව, වසනුවෝ ලෞකික ධ්‍යාන ලැබූහ. පස්වන වරද ආයුෂ්මත් ගෝධික තෙරණුවෝ ඒ ලෞකික ධ්‍යානයෙන් ලත් චිත්ත විමුක්තියෙන් පිරිහුණහ.

8. හයවන වරද ආයුෂ්මත් ගෝධික තෙරණුවෝ නොපමාව, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, නිවන් කරා මෙහෙයූ සිතැතිව වසනුවෝ ලෞකික ධ්‍යාන ලැබූහ. හයවන වරද ආයුෂ්මත් ගෝධික තෙරණුවෝ ඒ ලෞකික ධ්‍යානයෙන් පිරිහුණහ.

9. සත්වන වරද ආයුෂ්මත් ගෝධික තෙරණුවෝ නොපමාව, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, නිවන් කරා මෙහෙයූ සිතැතිව වසනුවෝ ලෞකික ධ්‍යාන ලදහ.

10. ඉක්බිති ආයුෂ්මත් ගෝධික තෙරුන්හට මේ සිත විය. ‘සත්වන වර දක්වාම මම් ලෞකික ධ්‍යානයෙන් පිරිහිණිමි. ආයුධයෙන් දිවි නසාගන්නෙම් නම් යෙහෙක.’

11. ඉක්බිති පවිටු මරතෙම ආයුෂ්මත් ගෝධික තෙරුන්ගේ සිත තම සිතින් දැන භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, ගාථායෙන් මෙසේ කීයේයඃ

> “මහා වීරයෙනි, මහ පැණැතියෙනි, ඍද්ධියෙන්, යසසින් දිලෙන තැනැත්තෙනි, හැම වෛර හා බිය ඉක්මවූවෙනි, පසැස් ඇතියෙනි, මම් ඔබ දෙපා වඳිමි.

"මහා වීරයාණනි, මාරයා මැඩලූ තැනැත්තෙනි, ඔබේ ශ්‍රාවකයෙක් මැරෙනු කැමැති වෙයි, මැරෙන්න සිතයි. මහ තෙදැතියෙනි, එය වළක්වනු මැනවි.

"ජනයා අතර ප්‍රකටවූ භාග්‍යවතුන් වහන්ස, සස්නෙහි ඇලුණු රහත් බව නොලත්, තවම සිල් ආදිය පුරා නොනිමි, ඔබ ශ්‍රාවකයෙක් කෙසේ නම් මැරෙන්නේද?"

12. එකල වනාහි ආයුෂ්මත් ගෝධික තෙරණුවෝ ආයුධයක් ගෙන උගුරුදණ්ඩ සිඳගත්තේය.

13. එවිටම භාග්‍යවතුන් වහන්සේ 'මේ පාපී මරුය'යි දැන, ගාථායෙන් මෙසේ වදාළසේක:

"නුවණැතියෝ එසේම කෙරෙත්. දිවි නොබලත්. ගෝධික තෙරණුවෝ තෘෂ්ණාව සහමුලින් ඇද දමා පිරිනිවියහ."

14. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට කථාකර, "මහණෙනි, එමු ඉසිගිලි කන්ද පැත්තක ගෝධික කුලපුත්‍ර ආයුධයකින් (උගුරුදණ්ඩ) සිඳගත් තැනවූ කළුගල වෙත පැමිණෙන්නෙමු"යි වදාළසේක.

15. "එසේය, ස්වාමීනි"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

16. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බොහෝ භික්ෂූන් හා ඉසිගිලිය පැත්තක කළුගල යම් තැනෙකද එතැනට පැමිණිසේක. භාග්‍යවතුන් වහන්සේ දුරදීම, පෙරළුණු කඳ ඇතිව ඇඳෙහි හෝනා ආයුෂ්මත් ගෝධිකතෙරුන් දුටුසේක.

17. එකල්හි වනාහි දුම් වලාවක් බඳු, අඳුරු වලාවක් බඳු, දෙයක් නැගෙණහිර දෙසටද යයි, බස්නාහිර දෙසටද යයි, උතුරු දෙසටද යයි, දකුණු දෙසටද යයි, උඩු අතටද, යයි, යට දෙසටද යයි, අනු දිග්වලටද යයි.

18. එකල භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන්ට කථාකර, "මහණෙනි, තෙපි ඔය නැගෙණහිර දෙසටද යන, බස්නාහිර

දෙසටද යන, උතුරු දෙසටද යන, දකුණු දෙසටද යන, උඩ දෙසටද යන, යට අතටද යන දුම් වලාවක් බඳු, අඳුරු වලාවක් බඳු, දෙය දක්නහු දැ?"යි ඇසූසේක. "එසේය, ස්වාමීනි,"යි (භික්ෂූහු උත්තර දුන්හ.)

**19.** මහණෙනි, ඒ පාපී මරුවාය. ඔහු ගෝධික කුල පුතුගේ (ප්‍රතිසන්ධි) විඥානය කොහි පිහිටියේ දැයි සොය සොයා යයි. එහෙත් මහණෙනි, ගෝධික කුලපුතුගේ විඥානය කිසි තැනෙකත් නොපිහිටියේය. කිසි තැනෙක නොපිහිටි (ප්‍රතිසන්ධි) විඥානයෙන් ගෝධික කුලපුත්තෙම පිරිනිවියේය'යි වදාළසේක.

**20.** ඉක්බිති පාපී මාරතෙම බේලුවපණ්ඩුවීණාව ගෙන භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ ගාථායෙන් (මෙසේ) කීය.

"මම උඩද යටද සරසද සිව්දිග හා අනුදිසාද සෙව්යෙම් (ඔහු) නොදක්මි. ඒ ගෝධික තෙම කොහි ගියේද?"

21. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේකඃ) "දිරිමත්වූ ධ්‍යාන වඩන ගති ඇති, හැම විටම ධ්‍යානයෙහි ඇලුණු, දිවි නොතකමින් දිවා රෑ දෙක්හි භාවනාවෙහි යෙදුන ඒ ගෝධිකතෙම මරහුගේ සේනා බිඳ, නැවත ඉපදීමකට නොපැමිණ, තණ්හාව සහමුලින් උපුටා දමා, පිරිනිවීයේය."

**22.** ශෝකයෙන් මැඩුණු ඒ මරහුගේ කිසිල්ලෙන් වීණාව ගිලිහුණේය. ඉක්බිති දුකට පත්වූ ඒ යක්තෙම එහිම අතුරුදන් විය.

---

## 4. සත්තවස්ස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ උරුවෙල්දනව්වෙහි නේරංජරා ගංතෙර අජපල් නුගරුක මුල වසනසේක.

**2.** එකල වනාහි පාපී මාරතෙම සිදුරක් දක්නා කැමැත්තේ, එහෙත් සිදුරක් දක්නට නොලබනුයේ, සත් වසක්ම භාග්‍යවතුන්වහන්සේ පසු පස ගියේ වෙයි.

**3.** ඉක්බිති පාපී මාරතෙම භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ ගාථායෙන් (මෙසේ) කීයඃ

"ශෝකයට පැමිණ වනයෙහි සිතිවිලි සිතහිද? ධනය පැරදුණෙහිද? නැතහොත් ඒ පැරදුණු දේ පතමින් ඉන්නෙහිද? නැතහොත් ගම ඇතුළත කිසි වරදක් කෙළෙහිද? කවර හෙයින් මහජනයා හා යහළු බවක් නොකෙරෙහිද? කිසිවකු හා ඔබේ යහළු බවෙක් ඇති නොවේද?"

**4.** (එවිට භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේකඃ) "පමාවන්නන්ගේ ඥාතියා ශෝකයේ සියලු මුල සාරා උදුරා දමා, නිවැරදිව, ශෝක නොකෙරෙමින්, ධ්‍යානයෙහි යෙදී ඉඳිමි. භවලෝභ යයි කියන ලද සියලු තණ්හාව සිඳ දමා, ආශ්‍රව නැතියෙම්, ධ්‍යාන කෙරෙමි."

**5.** (එවිට මාරයා මෙසේ කීයඃ) "මෙය මගේ යයි යමක් ගැන කියත් නම්, මේ දේ මගේ යයි යම් කෙනෙක් කියත් නම්, මෙ කී තන්හි ඒකාන්තයෙන් යුෂ්මත්හුගේ සිත බැඳී ඇත. (එබැවින්) මහණ, ඔබ මගෙන් නොමිදෙන්නෙහිය."

**6.** (භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේකඃ) "යමක් 'මගේය'යි කියත් නම්, එය මගේ නොවේ. යම් කෙනෙක් කියත් නම්, මම ඔවුන්ගෙන් එකෙකුත් නොවෙමි. පාපිය, මෙසේ දනුව. මා ගිය මගවත් තෝ නොදක්නෙහිය."

**7.** (මාරයා මෙසේ කීයඃ) "ඉදින් බයක් නැති, නිවනට යන මග අවබෝධ කෙළෙහි නම් ඉවත්වෙන්න. ඔබම තනිව යන්න. අන්හට කුමට අනුශාසන කෙරෙහිද?"

**8.** (භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේකඃ) "පරතෙර යනු කැමැති (නිවන් යනු කැමැති) යම් කෙනෙක්

ඇද්ද, ඔවුහු මරුට ඉඩක් නැති නිවන මා (අතින්) විචාරත්. ඔවුන් විසින් විචාරනු ලැබූ මම්, යමක් සියලු කෙලෙස් රහිත නම්, එ නිවන ඔවුන්ට කියමි."

9. (ඉක්බිති මාරතෙම මෙසේ කීයේය:) "ස්වාමීනි, ගමෙක හෝ නියම් ගමෙක හෝ නොදුරෙහි පොකුණෙක් ඇත් නම්, එහි කකුළුවෙක්ද ඉඳී නම්, නැවත බොහෝ දරුවෝ හෝ දැරියෝ හෝ ඒ ගමෙන් හෝ ඒ නියම්ගමෙන් හෝ නික්ම ඒ පොකුණ යම් තැනෙකද එතැනට පැමිණෙන්නාහු නම්, පැමිණ ඒ කකුළුවා යම්සේ දියෙන් ඔසවා ගොඩ තබන්නාහුද, එවිට ඒ කකුළුවා යම් යම් අඬුවක් ඉදිරියට යොමුකරන්නේ නම්, ඒ දරුවෝ හෝ දැරියෝ ඒ ඒ අඬුවම ලීයෙකින් හෝ කැබිලිත්තෙකින් හෝ යම්සේ සිඳ දමන්නාහුද, යම්සේ බිඳ දමන්නාහුද, යම්සේ කැබලි කැබලි කොට දමන්නාහුද, ස්වාමීනි, මෙසේ ඒ කකුළුවා කැඩුණු, බිඳුණු, කැබැලිවී ගිය අඬුවලින් යලිත් ඒ පොකුණට පෙරමෙන් බසින්නට යම්සේ නොහැකි වන්නේද, එසේම ස්වාමීනි, මා කළ යම් විරුද්ධ දේ ඇද්ද, යම් නුසුදුසු දේ ඇද්ද, යම් හැලහොල්මන් ඇද්ද, ඒ සියල්ල භාග්‍යවතුන්වහන්සේ විසින් සිඳින ලදය, බිඳින ලදය, සුණුවිසුණු කරන ලදය, ස්වාමීනි සිව්රු, සොයන අපේක්ෂා ඇතිව නැතිව භාග්‍යවතුන්වහන්සේ වෙත පැමිණෙන්නට දැන් මම් නොහැකියෙමි"යි කීයේය.

10. ඉක්බිති පාපී මාරතෙම භාග්‍යවතුන්වහන්සේ සමීපයෙහි මේ කලකිරුම හඟවන ගාථා කීය:

"කවුඩෙක් මේදතෙල් පාට ඇති ගලක් දැක, 'මෙහි මොළොක් බව විඳ ගත හෙන්නමු නම් ඉතා යෙහෙකැ'යි 'රස විඳ ගැන්මක් වෙතොත් ඉතා යෙහෙකැ'යි ඒ හාත්පස ගැවසෙන්නේය. එහෙත් කවුඩා එහි කිසිදු රස විඳුමක් නොලැබ එයින් ඉවත්ව යන්නේය. ඒ ගල වෙත පැමිණ රස විඳ ගැන්මක් නොලැබ ඉවත්ව යන කවුඩා සේ කලකිරී ගෞතමයන් වහන්සේගෙන් අපිද ඉවත්ව යම්හ."

11. ඉක්බිති පාපී මාරතෙම භාග්‍යවතුන්වහන්සේ ඉදිරියෙහි මේ කලකිරීම හඟවන ගාථා කියා එතැනින් ඉවත්ව

භාග්‍යවතුන්වහන්සේට නොදුරෙහි බිම පළක් බැඳ නිහඬව, තෙද නැතිව, කරබා ගෙන, බිම බලාගෙන, සිතිවිලි සිතමින්, කිසිත් වටහාගත නොහැකිව ලී කැබෙල්ලකින් බිම ඉරි අඳිමින් හුන්නේය.

---

## 5. මාරධීතු (නොහොත් ධීතරෝ) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ උරුවෙල්දනව්වෙහි නේරංජරා ගංතෙර අජපල් නුගරුක මුල වසන සේක.

එකල්හි මරහුගේ දූ වූ, තණ්හාද, අරතිද, රගාද, යන තිදෙන පාපී මාරයා යම් තැනෙකද එතැනට පැමිණියහ. පැමිණ පාපී මාරයාට ගාථායෙකින් (මෙසේ) කීය.

'පියාණනි, කවර හෙයින් නොසතුටුයෙහිද? කවර කවර පුරුෂයෙකු නිසා ශෝක කෙරෙහිද? අපි ඔහු, වනෙහි ඉන්නා ඇතෙකු මෙන්, රාග මලපුඩුයෙන් බැඳ ගෙනෙන්නෙමු. ඔබට යටත් වන්නේය.

2. (ඔහු) "සුගතයෝ ලොව රහත් කෙනෙක. රාගයෙන් බැඳ ගෙනිය නොහැක්ක. මරහුගේ බල පවත්නා සීමාව ඉක්මවූ කෙනෙක. එබැවින් මම් බොහෝසේ ශෝක කෙරෙමි"යි (මාරතෙම කීය.)

3. ඉක්බිති තණ්හාද, අරතිද, රගාද, යන මාරදූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියෝය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට "ශ්‍රමණයාණනි, ඔබට පා මෙහෙවර කරමෝදැ?"යි කීහ. එවිට භාග්‍යවතුන් වහන්සේ සියලු කෙලෙස් ක්ෂයයෙහි මිදුනු සේක්ද, එහෙයින්ම ඔවුන්ගේ වචනය සිතට නොගත් සේක.

4. ඉක්බිති තණ්හාද, අරතිද, රගාද යන මාරදූහු එක් පැත්තකට ඉවත්ව ගොස් "පිරිමින්ගේ අදහස් නොඑක්සැටිය.

අප එකි එකිය එක් සියක් එක් සියක් කුමරියන්ගේ වෙස් මවා ගතහොත් ඉතා යහපත්"යි නිශ්චය කරගත්හ.

**5.** ඉක්බිති තණ්හාද, අරතිද, රගාද යන යන මාරදූහු එකි එකිය එක් සියක් එක් සියක් බැගින් කුමරි වෙස් සියයක් මවාගෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ: "ශ්‍රමණයාණනි, ඔබේ පා මෙහෙවර කරම්හ"යි කීහ. එයද කෙලෙසුන් කෙරෙන් මිදුණු භාග්‍යවතුන් වහන්සේ සිතට නොගත් සේක.

**6.** ඉක්බිති තණ්හාද, අරතිද, රගාද යන මාරදූහු මෙසේ නිශ්චය කරගත්හ. "පිරිමින්ගේ අදහස් නානාවිධය. අප දරුවන් නොවැදූ අඹුවන් සිය දෙනෙකුන්සේ එකි එකියක සියය සියය බැගින් මවා ගතහොත් ඉතා යහපති"යි නිශ්චය කරගත්හ.

**7.** ඉක්බිති තණ්හාද, අරති, රගාද යන මාරදූහු එකි එකියක නොවැදූ අඹුවන් සියයක බැගින් වෙස් මවා ගෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියහ. පැමිණ "මහණ, ඔබට පා මෙහෙවර කරම්හ"යි කීහ. එයද කෙලෙසුන් කෙරෙන් මිදුනු භාග්‍යවතුන් වහන්සේ සිතට නොගත් සේක.

**8.** ඉක්බිති තණ්හාද, අරතිද, රගාද යන මාරදූහු එක් වරක් වරක් වැදූ ස්ත්‍රීන්ගේ වෙස් මවාගෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියහ. පැමිණ "මහණ ඔබට පා මෙහෙවර කරම්හ"යි කීහ. එයද කෙලෙසුන් කෙරෙන් මිදුනු භාග්‍යවතුන් වහන්සේ සිතට නොගත් සේක

**9.** ඉක්බිති, තණ්හාද, අරතිද, රගාද යන මාරදූහු දෙවරක් දරුවන් වැදූ අඹුවන්ගේ වෙස් සියය බැගින් මවාගෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියහ. පැමිණ, "මහණ, ඔබට පා මෙහෙවර කරම්හ"යි කීහ. එයද කෙලෙසුන් කෙරෙන් මිදුනු භාග්‍යවතුන්වහන්සේ සිතට නොගත් සේක.

10. ඉක්බිති තණ්හාද, අරතිද, රගාද යන මාරදූහු මැදුම් වයස් පත් ස්ත්‍රීන්ගේ වෙස් සියය බැගින් මවාගෙන, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියහ. පැමිණ, "මහණ, ඔබට පා මෙහෙවර කරම්හ"යි කීහ. එයද කෙලෙසුන් කෙරෙන් මිදුනු භාග්‍යවතුන් වහන්සේ සිතට නොගත් සේක.

11. ඉක්බිති තණ්හාද, අරතිද, රගාද යන මාරදූහු වයසින් බොහෝ වැඩුණු ස්ත්‍රීන් සිය සිය දෙනෙකුන්ගේ වෙස් මවාගෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියහ. පැමිණ, 'ඔබට පා මෙහෙවර කරම්හ'යි කීහ. එයද කෙලෙසුන් කෙරෙන් මිදුනු භාග්‍යවතුන් වහන්සේ සිතට නොගත් සේක.

12. ඉක්බිති තණ්හාද, අරතිද, රගාද යන මාරදූහු පසෙක ඉවත්ව සිට, 'අප පියා කීයේ ඇත්තක්මය. (එනම්.)

"සුගතයෝ ලොව රහත් කෙනෙක, රාගයෙන් බැඳ ගෙනිය නොහැක්ක, මරහුගේ බල පැවති පෙදෙස ඉක්මවා ලූ කෙනෙක. එබැවින් මම් බොහෝසේ ශෝක කෙරෙමි"යි.

13. "අපි රාගය පහ නොකළ මොනම මහණකු කරා හෝ බමුණකු කරා හෝ මේ උපක්‍රමයෙන් එළඹුණමෝ නම් ඔහුගේ ළය හෝ පැලෙන්නේය, උණු ලේ හෝ ඔහුගේ කටින් පිටවන්නේය, උමතු බවට හෝ පැමිණෙන්නේය, සිත් කැලඹුමට හෝ පැමිණෙන්නේය, සිඳිනු ලැබූ යම් නිල් බටගසක් යම් සේ වියලෙන්නේද, වෙසෙසින් වියලෙන්නේද, මැලවෙන්නේද, එසේම හෙතෙම වියලෙන්නේය, වෙසෙසින් වියලෙන්නේය, මැලවෙන්නේය"යි කීහ.

14. ඉක්බිති තණ්හාද, අරතිද, රගාද යන මාරදූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියහ. පැමිණ පසෙක සිටියහ.

15. පසෙක සිටි තණ්හා මාරදූ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙසේ කීවාය.

"ශොකයට පැමිණ, වෙනෙහි සිතිවිලි සිත සිතා ඉන්නෙහිද? වස්තුවක් පැරදුණෙහිද? නැතහොත් වස්තුවක්

පතමින් ඉන්නෙහිද? ගමෙහි යම් අපරාධයක් හෝ කෙළෙහිද? මහජනයා හා කවර හෙයින් යහළුකම් නොකෙරෙහිද? කිසිවකු හා ඔබේ යහළුබවෙක් ඇති නොවේද?"

16. එවිට භාග්‍යවතුන් වහන්සේ: "මම ප්‍රියවූ, මිහිරි ස්වභාවය ඇති, කෙලෙස් සෙනග පරදවා, තනිව ධ්‍යාන කිරීමෙන් අභිමතාර්ථය ලැබගැන්මවූ, ළය නිවීමවූ, රහත්ඵලය අවබෝධ කෙළෙමි. එබැවින් ජනයා හා යහළුකම් නොකරමි. කිසිවකු හා මගේ යහළුකමෙක් නැත්තේය"යි වදාළ සේක.

17. ඉක්බිති අරති මාරදූතොම භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙසේ කීවාය.

"මෙහි කවර විහරණයක් බහුල කොට ඇති මහණ තෙම පඤ්චද්වාරික (කෙලෙස්) මහවතුර තරණය කෙළේද? මෙලොව සයවැනි (මනෝද්වාරික කෙලෙස්) මහවතුරත් එතර කෙළේද? කාමසංඥාවෝ බොහෝ සෙයින් කෙසේ ධ්‍යාන කරන ඔහු නොලැබ මුළුමනින් බැහැර වෙත්ද?"

18. (එවිට භාග්‍යවතුන් වහන්සේ:) "සන්සුන් කය ඇති, මොනවට මිදුණු සිතැති, කර්ම රැස් නොකරන, සිහියෙන් යුක්තවූ, කාමාදි ආලය නැති රහත්තෙම චතුස්සත්‍යධර්මය දැන, විතර්ක රහිත ධ්‍යාන ඇත්තේ නොකිපෙයි, නොම සිහිකෙරෙයි, නොම හැකුළුනේද වෙයි.'

"එසේ බහුල විහරණ ඇති මහණ තෙම මෙහි තරණය කළ පඤ්චද්වාරික (කෙලෙස්) මහ වතුර ඇතියේ, සයවැනි (මනෝද්වාරික කෙලෙස්) මහ වතුරත් තරණය කෙළේය. කාම සංඥාවෝ මෙසේ බහුල විහරණ ඇති, ධ්‍යාන කරන ඔහු නොලැබ, මුළුමනින් ඔහුගෙන් බැහැර වෙත්ය"යි වදාළ සේක.

19. එවිට රගා නම් මාරදූ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීවාය.

"ගණයා කෙරෙහිත්, සමූහයා කෙරෙහිත් හැසිරෙන මෙතෙම තෘෂ්ණාව සින්දේය. බොහෝ සත්ත්වයෝද ඒකාන්තයෙන් මොහු ගිය මගින් යන්නාහ. ආලය නැති මේ තෙම බොහෝ ජන සමූහයක් මාර රාජයාගෙන් පැහැර ගෙන පරතෙරට (නිවනට) පමුණු වන්නේය."

**20.** (එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.) "මහාවීරවූ තථාගතවරු සද්ධර්මයෙන් සත්වයන් එතෙරට (නිවනට) පමුණුවත්මය. නුවණැතියන් ධර්මයෙන් සත්ත්වයන් එතෙර පමුණුවන කල්හි එයට කවර ඊර්ෂ්‍යාවෙක්ද?"

**21.** ඉක්බිති තණ්හාද, අරතිද, රගාද, යන මාරදූහු පාපී මාරයා යම් තැනෙකද එතැනට පැමිණියහ.

**22.** පාපී මාරයා, එන තණ්හාද, අරතිද, රගාද යන මාරදූන් දුරදීම දිටි. දැක මෙසේ ගාථාවලින් කීය.

"අනුවණයිනි නෙළුම් දඬුයෙන් කන්දක් පළන්නට සිතවූද? නියෙන් පර්වතයක් සාරන්නහුද? දතින් යකඩ විකන්නහුද?

"හිස මතුයෙහි මහ ගලක් තබාගෙන ගැඹුරෙහි පය ගසන්නට තැනක් සොයවූද? ළයෙහි උලක් වැදුණු සෙයින් කලකිරී ගෞතමයන් පසුව එවුද?

**23.** (සංගායනා කළ තෙරහු මෙසේ කීහ:) තණ්හා ද, අරති ද, රගා ද යන මාර දූහු දිලිහි දිලිහී බුදුරජුන් වෙත ආහ. එහෙත් සුළඟ එහෙත් සුළඟ පුළුන්පෙදක් ඉවත ලූවා සේ ශාස්තෘන් වහන්සේ එහිදී ඒ මර දූන් දුරු කළ සේක.

තුන්වෙනි වගයි.
(මාර සංයුත්තය නිමි.)

# 5. භික්ඛුනී සංයුත්තය.

## 1. භික්ඛුනී වර්ගය.

### 1. ආළවිකා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල්හි ආළවිකා මෙහෙණිය පෙරවරුයෙහි හැඳ පෙරෙව පාත්‍රසිවුරු ගෙන සැවැත්නුවරට පිඬු පිණිස ගියාය. සැවැත් නුවරෙහි පිඬු සිඟා හැසිර පසුබත්හි පිණ්ඩපාතයෙන් පෙරළා ආ තැනැත්තී, විවේකය කැමැත්තී, අන්ධවනය කරා පැමිණියාය.

3. එකල්හි පාපී මාරයා ආළවිකා මෙහෙණියට බිය හා තැතිගැන්ම හා ලොමුදැහැන්ම උපදවනු කැමැත්තේ, විවේකයෙන් තොරකරනු කැමැත්තේ, ආළවිකා මෙහෙණිය යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, ආළවිකා මෙහෙණියට ගාථායෙන් මෙසේ කීය:

> "ලොවෙහි එතරවීමෙක් පැමිණ නැත. විවේකයෙන් කවර වැඩක් සිදු කර ගන්නෙහිද? කම්සැප විඳුව. එසේ නොකොට පසුතැවෙන්නියක් නොවව."

4. එවිට ආළවිකා මෙහෙණියට මෙසේ අදහස් විය. "මේ ගාථාව කීයේ කවරෙක්ද? මිනිසෙක්ද නොහොත් නොමිනිසෙක්ද?"

5. ඉක්බිති ආළවිකා මෙහෙණියට, 'මේ පාපීවූ මාරයා මට බිය හා තැතිගැන්ම හා ලොමුදැහැගැන්ම උපදවනු කැමැතිව, විවේකයෙන් තොර කරනු කැමැතිව ගාථාව කීයේය'යි සිත්විය.

6. ඉක්බිති ආළවිකා මෙහෙණිය මේ පාපීවූ මාරයා යයි දැන ඔහුට ගාථාවලින් මෙසේ පෙරළා කීවේය.

"ලොවෙහි එතරවීමෙක් ඇත. මවිසින් එය නුවණින් දැනගන්නා ලදී. පමාවූවන්ගේ නෑ වූ පවිට, තෝ ඒ නිවන හෝ නිවන්මග නොදන්නෙහිය.

"පස්කම් ආයුධ හුල් බඳුය. පඤ්චස්කන්ධය ඔවුන්ට මස්ලොඹු (මස් කපන කොටය) බඳුය. තෝ යම් කාමයෙහි ඇලීමක් කීයෙහිද, එය මට නොඇල්මක් විය.

7. එවිට පවිටු මාරතෙම 'ආළවිකා මෙහෙණි මා දනීය'යි දුක් දොම්නස් ඇතිව එහිම අතුරුදන් විය.

---

## 2. සෝමා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි සෝමා මෙහෙණි පෙරවරුයෙහි හැඳ පෙරෙව පාත්‍ර සිවුරු ගෙන සැවැත් නුවරට පිඬු පිණිස පිවිසියාය.

2. සැවැත් නුවර පිඬු සිඟා වළඳා පසුබත් කල්හි පෙරළා ආ තැනැත්තී, දිවා විහරණය පිණිස අන්ධවනය කරා පැමිණියාය. අන්ධවනයට බැස දාවල් විවේකය පිණිස එක්තරා රුක්මුලෙක උන්නාය.

3. එකල්හි පාපීවූ මාරයා සෝමා මෙහෙණියට බිය, තැති, ලොමුදැහැගැනුම් උපදවනු කැමැත්තේ, සමාධියෙන් තොර කරනු කැමැත්තේ, ඒ මෙහෙණිය යම් තැනකද එතැනට පැමිණියාය. පැමිණ, සෝමා මෙහෙණියට ගාථායෙන් (මෙසේ) කීය:

"ඍෂීන් විසින් ලැබිය යුතු, දුර්ලභවූ, යම් පදවියක් (රහත් බවෙක්) ඇද්ද, එය දෑඟුල් නුවණ ඇති, ස්ත්‍රියක විසින් ලැබිය නොහැක්ක."

4. එවිට සෝමා මෙහෙණියට මෙසේ සිත් විය. "මේ ගාථා කියනුයේ කවරෙක්ද? මිනිසෙක්ද? නොහොත් නොමිනිසෙක්ද?"

5. ඉක්බිති ඇයට 'මේ පාපීවූ මාරයාය. මට බිය, තැති ගැන්ම, ලොමුදැහැගැන්ම උපදවනු කැමැතිව, සමාධියෙන් තොර කරනු කැමැත්තේ ඔහු ගාථා කියායʼයි මේ අදහස විය.

6. ඉක්බිති සෝමා මෙහෙණිය 'මේ පාපීවූ මාරයායʼයි දැන පාපීවූ මාරයාට ගාථාවලින් මෙසේ කීවාය:

"සිත මොනවට සමාධියට පැමිණි කල්හි, නුවණ ඇති කල්හි, දහම් ඇතිසැටියෙන් දක්නහුට ස්ත්‍රීබව කුමක් කරන්නේද?

"මම ස්ත්‍රියකිමʼයි හෝ 'පිරිමියෙකිමʼයි කියා හෝ 'එයින් අන් යම් එකෙකිමʼයි කියා හෝ යමෙකුට මෙබඳු අදහසෙක් ඒකාන්තයෙන් වන්නේ නම්, මාරයා ඔහුට නම් (මට කී දේ) කියන්නට සෑහේ."

7. එවිට පාපීවූ මාරයා 'සෝමා මෙහෙණිය මා දන්නීයʼයි දුක් දොම්නස් වැද එහිම අතුරුදන් විය.

## 3. ගෝතමී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ ජේතවනයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවනලද ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි කිසාගෝතමී මෙහෙණි පෙරවරුයෙහි හැඳ පෙරෙව, පාත්‍ර සිවුරු ගෙන, සැවැත්නුවරට පිඬු පිණිස පිවිසියාය.

2. සැවැත්හි පිඬු සිඟා හැසිර, බතින් පසු පෙරළා අවුත්, දවල් විවේකයට අන්ධවනය යම් තැනෙකද එතැනට පැමිණියාය. අන්ධවනයට බැස දවල් විවේකය පිණිස එක්තරා රුක්මුලෙක උන්නාය.

3. එවිට පාපීවූ මාරයා කිසාගෝතමී මෙහෙණියට බිය, තැති, ලොමුදැහැගැනුම් උපදවනු කැමැත්තේ, සිත එකඟ බැවින් (සමාධියෙන්) තොර කරනු කැමැත්තේ, කිසාගෝතමී මෙහෙණිය

යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, කිසාගෝතමී මෙහෙණියට ගාථායෙන් මෙසේ කීය:

"(තෝ) දරුවා මළ එකියක සෙයින්, අඬන මුහුණ ඇතිව තනිව කුමට ඉන්නෙහිද? වනයට වැද තනිව පුරුෂයෙකුවත් සොයහිද?"

4. "එකල කිසාගෝතමී මෙහෙණියට මේ සිත් විය. 'මේ කවරෙක්ද? ගාථා කියන මෙතෙම මිනිසෙක්ද? නොහොත් නොමිනිසෙක්ද?"

5. ඉක්බිති කිසාගොතමී මෙහෙණියට, 'මේ පාපීවූ මාරයාය. මට බිය, තැතිගැනුම්, ලොමුදැහැගැනුම් උපදවන්නට කැමැතිව, සමාධියෙන් මා තොර කරනු කැමැතිව, ඔහු ගාථා කියාය'යි අදහස් විය.

6. ඉක්බිති කිසාගෝතමී මෙහෙණිය, 'මේ පාපීවූ මාරයා ය'යි දැන පාපීවූ මාරයාට ගාථාවලින් මෙසේ පෙරළා කීවාය:

"(මම) මළාවූ දරුවකු ඇති බව ඉක්මවූ තැනැත්තියක්මි. සැමියෝද එයම කෙළවර කොට ඇත්තෝය. ශෝක නොකරමි, නොහඬමි. ඇවැත්නි, තට බියද නොවෙමි. හැම දැයෙහි ඇල්ම (මා විසින්) නසන ලදී. මොහාන්ධකාරය නුවණින් (මා විසින්) බිඳ දමන ලදී. මරසෙන් පරදවා, ආශ්‍රව නැත්තියක්ව, වෙසෙමි."

7. එවිට පාපීවූ මාරයා 'කිසාගෝතමී මෙහෙණි මා දනීය'යි දුක් දොම්නස් වැද එතනින්ම අතුරුදන් විය.

---

## 4. විජයා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල්හි විජයා මෙහෙණි පෙරවරුයෙහි හැඳ පෙරෙවා පාත්‍ර සිවුරු ගෙන, සැවැත්නුවර පිඬු පිණිස පිවිසියාය. සැවැත්හි

පිඬු සිඟා හැසිර, දන් වළඳා, පෙරළා අවුත්, දවල් විවේකයට අන්ධවනයට පැමිණියාය. අන්ධවනයට පැමිණ එක්තරා රුක්මුලෙක දවල් විවේකය පිණිස උන්නාය.

3. එකල්හි පාපීවූ මාරයා විජයා මෙහෙණියට බිය, තැතිගැනුම්, ලොමුදැහැගැනුම් උපදවනු කැමැත්තේ, සමාධියෙන් තොර කරනු කැමැත්තේ, විජයා මෙහෙණිය යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ විජයා මෙහෙණියට,

"ආයුෂ්මාවෙනි, ඔබ තරුණයහ. මමද නවයොවුන් විය ඇතියෙමි. එන්න, ආයුෂ්මාවෙනි, පසඟතුරුයෙන් (පංචංගිකතූර්‍යයෙන්) අභිරමණය කරමු"යි ගාථායෙන් කීය.

3. එවිට විජයා මෙහෙණියට මෙ සිත් විය. මේ ගාථා කියනුයේ කවරෙක්ද? මිනිසෙක්ද, නොහොත් නො මිනිසෙක්ද,

4. ඉක්බිති විජයා මෙහෙණියට, පාපීවූ මාරයා මා බිය, තැතිගැනුම්, ලොමුදැහැගැනුම් ගන්වනුවට සමාධියෙන් වෙන් කිරීමට කැමැතිව, ගාථා කිය'යි මේ අදහස විය.

5. ඉක්බිති විජයා මෙහෙණි 'මේ පාපී වූ මාරයා'යි දැන, පාපීවූ මාරයාට ගාථාවලින් මෙසේ පෙරළා කීවාය:

"සිත අදනා රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍ය යන යමක් ඇද්ද, තටම ඒවා පවරමි. මාරය, මට ඉන් වැඩෙක් නැත. බිඳෙන සුලු, සුණුවිසුණුවන සුලු මේ කුණුකයින් පීඩිතවෙමි, මෙයට පිළිකුල් කෙරෙමි. කම් සැපෙහි ඇල්ම මා විසින් මුලින් උදුරන ලදය. රූප ලොවට එළඹී යම් සත්ව කෙනෙක් වෙත්ද, අරූප ලොවෙහි සිටින යම් සත්ව කෙනෙක් වෙත්ද, යම් ශාන්තවූ ලෞකික සමාපත්තියෙක් වේද, ඒ සියල්ලෙහි (මුළා බව නමැති) අඳුර මා විසින් නසන ලදී."

6. ඉක්බිති පාපීවූ මාරයා 'විජයා මෙහෙණි මා දනීයැ'යි දුක් දොම්නස්ව එහිම අතුරුදන් විය.

---

## 5. උප්පලවණ්ණා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල්හි උප්පලවණ්ණා මෙහෙණී පෙරවරුයෙහි හැඳ පෙරෙව පාත්‍ර සිවුරුගෙන සැවැත්නුවරට පිඬු පිණිස පිවිසියාය. සැවැත්හි පිඬු පිණිස හැසිර පසුබත්හි පෙරළා අවුත්, දහවල් ගතකරනු සඳහා අන්ධවනය යම් තැනෙකද එතැනට පැමිණියාය. අන්ධවනයට බැස දහවල් ගත කරනු පිණිස එක්තරා පිපී ගිය සල් රුක්මුලෙක සිටියාය.

2. එවිට පාපීවූ මාරයා උප්පලවණ්ණා මෙහෙණියට බිය, තැති, ලොමුදැහැගැනුම් උපදවනු කැමැතිව, සමාධියෙන් තොරකරනු කැමැතිව, උප්පලවණ්ණා මෙහෙණිය යම් තැනෙකද එතැනට පැමිණියේය.

3. පැමිණ, උප්පලවණ්ණා මෙහෙණියට,

"මෙහෙණියනි, ඔබ අග පටන් සුපිපි රුකක් කරා පැමිණ, ඒ සල් රුක්මුල්හි තනිව සිටිති. ඔබට රූපයෙන් ඔබ වැනි දෙවෙනි මෙහෙණියක් (යෙහෙළියක්) ද නැත. මෙහි පැමිණි අන් මෙහෙණියෝද ඔබ බඳු වන්නාහුය. මෙසේ තනිවූ ඔබ සලෙලුවන්ට බිය නැත්තේ ද?"යි ගාථායෙන් කීය.

4. එකල්හි උප්පලවණ්ණා මෙහෙණියට 'මේ ගාථා කියනුයේ කවරෙක් ද? මිනිසෙක් ද? නොහොත් නො මිනිසෙක් දැ?"යි සිත් විය.

5. ඉක්බිති උප්පලවණ්ණා මෙහෙණියට මේ අදහස විය. 'මේ පාපී මාරයාය මට බිය, තැතිගැනුම්, ලොමුදැහැගැනුම්, උපදවනු කැමැතිව, සමාධියෙන් මා තොර කරනු කැමැත්තෙන් ගාථා කියයි.'

6. ඉක්බිති උප්පලවණ්ණා මෙහෙණිය 'මේ පාපීවූ මරුවාය'යිම දැන පාපීවූ මාරයාට ගාථාවලින් මෙසේ කීවාය:

"ධූර්තයන් සිය දහසක් මෙහි ආවත් ඔවුහු තා බඳු වුවත් ඔවුන්ට ලෝමයකුත් නොසලමි, නොම තැති ගනිමි. මරුව, හුදෙකලාවූද මම් තට බය නොවෙමි."

(මාරයා මෙසේ කීයඃ) "මේ මම් අතුරුදන් වෙමි. ඔබ කුසට හෝ පිවිසෙමි. ඔබේ දෙබැම අතුරෙහි හෝ සිටින මා ඔබ නොදක්නෙහි."

(උප්පලවණ්ණා මෙහෙණිය මෙසේ කීවායඃ) "සිතෙහි වශී වූයෙමි. මා විසින් සතර ඍද්ධිපාදයෝ මොනවට වඩන ලදහ. (මම්) සියලු බැම්මෙන් මිදුණෙමි. ඇවත, එබැවින් තට බිය නොවෙමි"

7. එවිට පාපීවූ මාරයා 'උපුල්වන් මෙහෙණිය මා දන්නීයැ'යි දුක් දොම්නස්ව එහිම අතුරුදන් විය.

---

## 6. චාලා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි චාලා මෙහෙණී පෙරවරුයෙහි හැඳ පෙරෙව පාත්‍ර සිවුරු ගෙන, පිඬු පිණිස සැවැත්නුවරට පිවිසියාය. සැවැත්හි පිඬු සිඟා වැඩ, දන් වළඳා, පෙරළා ආ තැනැත්තී, දහවල් ගතකරනු පිණිස අන්ධවනය යම් තැනෙකද, එතැනට පැමිණියාය. අන්ධවනයට බැස දහවල් ගතකරනු පිණිස එක්තරා ගසක්මුල හුන්නාය.

2. එකල්හි පාපීවූ මාරයා, චාලාමෙහෙණිය යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, චාලාමෙහෙණියට මෙසේ කීයඃ "මෙහෙණියනි, ඔබ කුමකට නම් කැමති නොවෙහිදැ?"යි ඇසීය. "ඇවත, මම් වනාහි උත්පත්තියට කැමති නොවෙමි."

(එවිට මාරයා මෙසේ කීය.) උත්පත්තිය කැමති නොවන්නේ ඇයිද? උපන් තැනැත්තේ කම්සුව විඳී.

මෙහෙණියනි, උත්පත්තිය කැමති නොවේවා කවරෙක් නම් ඔබට මේ දෘෂ්ටිය ගැන්වීද?"

2. (එවිට මෙහෙණි මෙසේ කීවාය:) "උපන්නහුට මරණය වේ. උපන් තැනැත්තේ බැඳුම්ද, වධද, උවදුරුද යන දුක් ස්පර්ශ කෙරෙයි. එබැවින් උත්පත්තිය නොකැමැත්තෙමි.

"බුදුරජාණන් වහන්සේ සියලු දුක් නසනු පිණිස උත්පත්තිය ඉක්මවා ලන දහම දෙසූසේක. යම් රූප ලොකයෙහි උපන් සත්වකෙනෙක් ඇද්ද, අරූප ලොකයෙහි සිටිනා යම් සත්වකෙනෙක් ඇද්ද, ඒ සියල්ලෝ නිවන නොදන්නාහු නැවත දෙවැනි භවයක ඉපැද්මට එන්නාහ."

4. එවිට පාපීවූ මාරයා "චාලා මෙහෙණිය මා දන්නීය"යි දුක් දොම්නස්ව එහිම අතුරුදන් විය.

---

## 7. උපචාලා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි උපචාලා මෙහෙණි පෙරවරු කාලයෙහි හැඳ පෙරෙව, පාත්‍ර සිවුරු ගෙන, සැවැත් නුවරට පිඬු පිණිස පිවිසියාය. එහි පිඬු සිඟා වැඩ, පසුබත්හි පෙරළා අවුත්, දහවල් ගතකරනු පිණිස අන්ධවනය යම් තැනෙකද එතැනට පැමිණියාය. අන්ධවනයෙහි බැස දහවල් ගතකරනු පිණිස එක්තරා ගසක්මුල උන්නීය.

2. එවිට පාපීවූ මාරයා උපචාලා මෙහෙණිය යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ, උපචාලා මෙහෙණියට මෙසේ කීය. "මෙහෙණියනි ඔබ කොහි උපදිනු කැමැත්තෝද?"

3. "ඇවැත්නි, මම වනාහි කොහේවත් උපදිනු නොකැමැත්තෙමි"යි (උපචාලා මෙහෙණිය කීවාය.)

4. (එවිට මාරයා මෙසේ කීය.) "තව්තිසා දෙව්ලෝ වැසි දෙවියෝද, යාම දෙව්ලෝ වැසි දෙවියෝද, තුසිත දෙව්ලෝ වැසි දෙවියෝද, නිර්මාණරති දෙව්ලෝ වැසි දෙවියෝද, වශවර්ති දෙව්ලෝ වැසි දෙවියෝද යන යම් කෙනෙක් ඇද්ද, ඔවුන් කෙරෙහි සිත පිහිටුවන්න. එවිට ඔබ එහි සැප විඳින්නෙහිය."

5. (මෙහෙණී මෙසේ පිළිතුරු දුන්නීය.) "තව්තිසා යාම, තුසිත, නිර්මාණරති, වශවර්ති යන දෙව්ලෝ වැසි යම් දෙවිකෙනෙක් ඇද්ද, ඔහු කාම බැම්මෙන් බැඳුණෝ මරහුගේ වශගයට නැවත එන්නාහ.

"(කෙලෙස් ගින්නෙන්) මුළු ලොව ඇවිලගත්තේය, මුළු ලොව තැවුණේය, සියලු ලොව දිලිහී ගියේය. සියලු ලොව සැලී ගියේය.

"යම් තැනෙක මාරයාට පිහිටා සිටිය නොහැකිද, නොසැලුණු, කම්පිත නොවූ, පෘථග්ජන නොවූවන් විසින් (ආර්‍යයන් විසින්) සෙවුනාලද යම් දහමෙක් ඇද්ද එහි (ඒ නිවනෙහි) මා සිත මුළුමනින් ඇලුණේය."

6. එවිට පාපීවූ මාරයා 'උපචාලා මෙහෙණිය මා දන්නීය'යි දුක් දොම්නස්ව එහිම අතුරුදන් විය.

---

## 8. සිසුපචාලා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි සිසුපචාලා මෙහෙණී පෙරවරුයෙහි හැඳ පෙරව පාත්‍ර සිවුරු ගෙන, සැවැත් නුවරට පිඬු පිණිස පිවිසියාය. සැවැත්හි පිඬු පිණිස හැසිර, පසුබත්හි පෙරළා අවුත්, දහවල් ගතකරනු පිණිස අන්ධවනය යම් තැනෙකද එතැනට පැමිණියාය. අන්ධවනයට බැස දහවල් ගතකරනු පිණිස එක්තරා ගසක් මුල උන්නාය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. එකල පාපීවූ මාරයා සිසුපචාලා මෙහෙණිය යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ "මෙහෙණියනි, ඔබ කවරක්හුගේ දෘෂ්ටියක් කැමැත්ත හුදැ"යි කීය.

3. "ඇවැත, මම කිසිම පුද්ගලයෙකුගේ දෘෂ්ටියක් කැමති නොවන්නෙමි"යි (මෙහෙණිය කීවාය.)

4. (එවිට පාපී මාරයා මෙසේ කීයඃ) "ඔබ මෙහෙණියක මෙන් පෙණෙති. ඔබ කවුරු උදෙසා හිස මුඩු කළෝද? (ඔබ) දෘෂ්ටියක් නොකැමැත්තෙහි. ඉතා මුළාව ගිය සෙයින් කුමට හැසිරෙන්නහුද?"

5. (මෙහෙණි මෙසේ පිළිතුරු දුන්නායඃ) "දෘෂ්ටි මේ සස්නෙන් පිටත්හිය. යම් කෙනෙක් ඒ දෘෂ්ටීන්හි ගැලෙත්ද, ඔවුන්ගේ දහම් නොකැමැත්තෙමි. ඔහු ධර්මයට දක්ෂයෝ නොවෙත්.

"ශාක්‍ය කුලයෙහි උපන්, තමහට සම අනෙකෙක් නැති, සියල්ල මැඩගෙන සිටි, මරහු දුරු කළ, හැමතන්හිම දිනූ බුදුවරයෙක් ඇත.

"උන්වහන්සේ හැම තන්හිම මිදුණු කෙනෙක තෘෂ්ණාදෘෂ්ටීන් ඇසුරු නොකළ කෙනෙක. පසැස් ඇති උන්වහන්සේ සියල්ල දක්නා සේක. සියලු කර්මයන්ගේ ක්ෂයට (රහත්බවට) පැමිණි සේක. උපධීන්ගේ කෙලෙස් ක්ෂයයෙහි මිදුණු සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ මගේ ශාස්තෘය. මම් උන්වහන්සේගේ සස්න කැමැත්තෙමි."

6. එවිට පාපීවූ මාරයා 'සිසුපචාලා මෙහෙණිය මා දන්නීය'යි, දුක් දොම්නස් වැද එහිම අතුරුදන් විය.

---

## 9. සේලා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි සේලා මෙහෙණි පෙරවරු කාලයෙහි හැඳ පෙරෙව, පාත්‍ර සිවුරු ගෙන,

සැවැත් නුවරට පිඬු පිණිස පිවිසියාය. සැවැත්හි පිඬු සිඟා වළඳා, පසුබත් කාලයෙහි පෙරළා අවුත්, දහවල් ගතකරන පිණිස අන්ධවනය යම් තැනෙකද එතැනට පැමිණියාය. අන්ධවනයෙහි බැස දහවල් ගතකරන පිණිස එක්තරා ගසක් මුල උන්නීය.

2. එකල්හි පාපීවූ මාරයා සේලා මෙහෙණිය බිය තැතිගැනුම්, ලොමුදැහැගැනුම් උපදවනු රිසිව, සමාධියෙන් ඇය තොරකරනු කැමැත්තේ, සේලා මෙහෙණිය යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ සේලා මෙහෙණියට ගාථායෙන් මෙසේ කීය.

3. "මේ අත්බව කවරකු විසින් උපදවන ලද්දක්ද? මේ ආත්මභාවය කළ තැනැත්තේ කවරේද? කුමක් නිසා ආත්ම භාවය උපන්නේද? මේ ආත්ම භාවය කවර තන්හි නිරුද්ධ වන්නේද?"

4. එවිට සේලා මෙහෙණියට මේ සිත විය: "මේ කවරෙක්ද? මේ ගාථා කියනුයේ මිනිසෙක්ද නැතහොත් නොමිනිසෙක්ද?"

5. ඉක්බිති සේලා මෙහෙණියට මේ අදහස විය. "මේ පාපීවූ මාරයා මට බිය, තැති, ලොමුදැහැනුම්, ඇතිකිරීමට කැමති වූයේ මා සමාධියෙන් තොරකරනු කැමතිව, ගාථා කියයි."

6. ඉක්බිති සේලා මෙහෙණි 'මේ පාපීවූ මාරයා යයි දැන, පාපීවූ මාරයාට ගාථාවලින් මෙය පෙරළා කිවුය.'

"මේ ආත්මභාවය තමා විසින් කරණ ලද්දක්ද නොවේ. දුකට පිහිටි මේ ආත්මභාවය අනෙකෙකු කළ දැයෙකුත් නොවේ මෙය හේතුව නිසා උපන, හේතුව බිඳී යෑමෙන් නිරුද්ධ වේ.'

"යම්සේ කිසියම් බීජයක් කෙතෙහි වපුරන ලද්දේ පෘථිවි රසයත් ජලයත් නිසා පැලවේද,

"එපරිද්දෙන්ම ස්කන්ධද, ධාතුද, ආයතන සයද යන මොහු හේතුප්‍රත්‍යයන් නිසා උපන්නෝ වෙත්, හේතු ප්‍රත්‍යයන්ගේ නිරෝධයෙන් නිරුද්ධ වෙත්."

7. එවිට පාපීවූ මාරයා සේලා මෙහෙණිය මා දන්නී යයි දුක් දොම්නස් වැද එහිම අතුරුදන් විය.

---

## 10. වජිරා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වජිරා මෙහෙණි පෙරවරුයෙහි හැඳ පෙරෙව, පාත්‍ර සිවුරු ගෙන, සැවැත් නුවරට පිඬු පිණිස පිවිසියාය. එහි පිඬු සිඟා ඇවිද, පසුබත් කාලයෙහි පෙරළා අවුත්, දහවල් ගතකරන පිණිස, අන්ධවනය යම් තැනෙකද එතැනට පැමිණියාය. අන්ධවනයට බැස, එක්තරා ගසක් මුල දහවල් ගතකරන පිණිස උන්නීය.

2. එකල්හි පාපීවූ මාරයා වජිරාමෙහෙණියට බිය, තැති ගැනුම්, ලොමුදැහැගැනුම් ඇතිකරනු කැමැත්තේ සමාධියෙන් තොරකරනු කැමැතිව වජිරා මෙහෙණිය යම් තැනෙකද එතැනට පැමිණියේය.

> 3. පැමිණ, වජිරා මෙහෙණියගෙන් ගාථායෙන් මෙසේ ඇසීය. ‘මේ සත්වයා කවුරුන් විසින් මවන ලද්දක්ද? මැවූ තැනැත්තා කොහි ද? සත්වයා කොහි උපදින්නේද? සත්වයා කොහි නිරුද්ධවන්නේද?”

4. එවිට වජිරා මෙහෙණියට මේ සිත විය. මේ කවරෙක්ද? මේ ගාථා කියනුයේ මිනිසෙක්ද? නැතහොත් නො මිනිසෙක් ද?

5. ඉක්බිති වජිරා මෙහෙණියට මේ අදහස විය. මේ මට බිය, තැති ගැනුම්, ලොමුදැහැගැනුම් උපදවනු කැමැත්තේ මා සමාධියෙන් වෙන් කරනු කැමැතිව, පාපීවූ මාරයා ගාථා කිය’යි.

6. ඉක්බිති වජිරා මෙහෙණි ‘මේ පාපීවූ මාරයා’යි දැන ගාථායෙන්ම පාපීවූ මාරයාට මෙසේ උත්තර දුන්නාය.

"මරුව, කිම? 'සත්වයෙකැ'යි. අදහයිද? මාරය, තට දෘෂ්ටියෙක් වීද? මේ තනි සංස්කාර පිඩෙක. මෙහි 'සත්වයැ'යි ගත යුත්තෙක් නොලැබේ.

"අවයව රැස නිසා රථයයි ව්‍යවහාරයක් යම්සේ වේද, එසේම ස්කන්ධයන් ඇති කල්හි සත්වයැයි ව්‍යවහාරය වේ.

"මෙහි දුකෙක්ම පහළ වේ, දුකෙක්ම සිටියි, දුක්ම ක්ෂයවෙයි. දුක් මිස අන් කිසිත් මෙහි පහළ නොවේ. දුකෙන් අන්‍යවූ කිසිත් මෙහි නිරුද්ධ නොවේ"

7. එවිට පාපීවූ මාරයා 'වජිරා මෙහෙණී මා දනීයැ'යි දුක් දොම්නස් ඇතිව එහිම අතුරුදන් විය.

භික්ෂුණී සංයුත්තය නිමියේය.

---

# 6. බ්‍රහ්ම සංයුත්ත.

## 1. ප්‍රථම (කොකලික) වර්ගය

### 1. ආයාචන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. භාග්‍යවතුන් වහන්සේ බුදුවූ පළමු කාලයේම එක් කලෙක උරුවෙල්දනව්වෙහි නේරංජරා ගංග තෙර අජපල් නුගරුකමුල වසනසේක.

2. එකල්හි තනිව චිත්තවිවේකයෙන් හුන් උන්වහන්සේට මෙබඳු කල්පනාවක් ඇතිවිය. 'මා අවබෝධ කළ මේ දහම ගැඹුරුය; දුකසේ දැක්ක යුතුය; දුකසේ අවබෝධ කටයුතුය; ශාන්තය, ප්‍රණීතය, තර්කයෙන් බැස ගත නොහැක්ක. සියුම්ය, පණ්ඩිතයන් විසින්ම දතයුතුය. එහෙත් මේ සත්ව සමූහයා ආලයෙන් බැඳුණෝය, ආලයෙහි ලැගුණෝය, ආලයෙහි සතුටුය. ආලයෙහි ලැගුණු, ආලයෙහි සතුටුවූ සත්ව සමූහයා විසින් මේ හේතුවෙන් මේ ඵලය වන්නේයයි දක්වන පටිච්චසමුප්පාද නම්වූ යම් දහමෙක් ඇද්ද එය දැක්ම දුෂ්කරය සියලු

සංස්කාරයන් නිවීමට කරුණුවූ, සියලු කෙලෙස් දුරලීමට හෙතුවූ, තණ්හාව නැසීමට අරමුණුවූ, රාගය පහකිරීමට අරමුණුවූ, දුක්මුල් සුන්කිරීමට හේතුවූ යම් නිවනෙක් ඇද්ද, එය දැක්ම ඔවුන්ට දුෂ්කරය. මෙසේ ඇතිකල මමත් ඔවුන්ට දහම් දෙසන්නෙම් වීම් නම්, ඒ අනායයෝත් මා දෙසන දේ තේරුම් නොගන්නේ නම්, එය මට මහන්සිය පමණෙකි, එය මා කය වෙහෙසීම පමණෙකි."

3. එපමණක්ද නොව පෙර නොඇසූ මේ ගාථාවෝද භාග්‍යවතුන්වහන්සේගේ සිතට වැටහුණහ.

"මා දුකසේ අවබොධකළ දහම දැන් දෙසීම නිෂ්ඵලය. රාගද්වේෂ දෙකින් මඩනා ලද්දාවුන් විසින් මේ දහම සුවසේ අවබෝධ කට නොහැක්ක. රාගයෙන් රත්වූ, මොහාන්ධකාරයෙන් වැසුණු සත්වයෝ උඩුහොයට යන සියුම්, ගැඹුරු, ඉතා සූක්ෂමවූ මේ ධර්මය නො දක්නාහ;

4. මෙසේ සලකන භාග්‍යවතුන් වහන්සේගේ සිත මන්දෝත්සාහයට, දහම් නො දෙසීමට නැමෙන්නේ විය.

5. එකල්හි භාග්‍යවතුන් වහන්සේටවූ කල්පනාව තම සිතින් දැන් මෙන් සහම්පති බඹහට මෙබඳු අදහසෙක් විය. "යම් තැනෙක අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේගේ සිත මන්දෝත්සාහයට, දහම් නො දෙසීමට නැමේද, ඒ ලොව අහෝ! නැසේ! අහෝ! ඒ ලොව වැනසේ!"

6. ඉක්බිති සහම්පති බ්‍රහ්මතෙම ශක්තිමත් මිනිසෙක් යම්සේ වහා නැමූ අත දික් කරන්නේද, දික් කළ අත හෝ නවන්නේද. එසේම බඹලොව අතුරුදන්ව භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි පහළ විය.

ඉක්බිති සහම්පති බ්‍රහ්මතෙම උතුරු සළුව එකස්කොට දකුණු දණමඬල බිම හැන භාග්‍යවතුන් වහන්සේ දෙසට ඇඳිලි නමා (වැඳ) භාග්‍යවතුන්වහන්සේට මෙසේ කීය. ස්වාමීනි, භාග්‍යවත්හු දහම් දෙසත්වා! සුගතයෝ දහම් දෙසත්වා! මඳ කෙලෙස් ධූලියෙන් වැසුණු, නුවණ ඇස ඇති, සත්වයෝ

ඇත්තෝහ. දහම් නොඅසනු හෙයින් ඔහු පිරිහෙන්නාහ. දහම් අවබෝධ කරන්නෝ ඇති වන්නාහ."

7. සහම්පති බ්‍රහ්මතෙම මෙය කීය. මෙය කියා ඉක්බිති ගාථා වශයෙන් අනායවූ මෙ බස් පැවසීය.

"(කෙලෙස්) මල සහිතයන් විසින් සිතා කියන ලද අශුද්ධ ධර්මයෙක් පෙර මගධ රටෙහි පහළ විය. මේ අමා දොර හරින්න. නිර්මලයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද සත්‍යධර්මය (සත්වයෝ) අසත්වා.

"ශීලාමය පර්වත මුදුනෙහි සිටියෙක් හාත්පස බිම සිටිනා ජන සමූහයා යම්සේ දක්නේද, ප්‍රාඥයන් වහන්ස, සර්වඥවූ, ශෝක දුරු කළ ඔබද එසේවූ ධර්මමය ප්‍රාසාදයට නැග, ජාති ජරාදී දුකින් මැඩුණු, ශෝකයට බට ජනතාව නුවණින් බලා වදාරන්න.

'වීරයන්වහන්ස, සටනින් ජයලත් භාග්‍යවතුන්වහන්ස, නැඟී සිටින්න. ණය නැති සාත්තුනායකයන් වහන්ස, ලොව හැසිරෙන්න. භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසන සේක්වා! එය අසා අවබෝධ කරන්නෝ ඇතිවන්නාහ."

8. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බ්‍රහ්මයාගේ අයදුමක් ලැබ, සත්වයන් කෙරෙහි පතළ කරුණාවත් නිසා බුදු ඇසින් ලොව බැලූසේක.

**10.** භාග්‍යවතුන් වහන්සේ බුදුඇසින් ලොව බලනසේක්, මඳ කෙලෙස් රජසින් වැසුණු ප්‍රඥා ඇස ඇති සත්ත්වයන්ද, බොහෝ කෙලෙස් රජසින් වැසුණු ප්‍රඥා ඇස ඇති සත්ත්වයන්ද, තියුණුවූ (ශ්‍රද්ධාදී) ඉන්ද්‍රියයන් ඇති සත්ත්වයන්ද, (ශ්‍රද්ධාදී) උතුම් ආකාර ඇති සත්ත්වයන්ද, (අශ්‍රද්ධාදී) හීන ආකාර ඇති සත්ත්වයන්ද, සුවසේ කරුණු අවබෝධ කරවිය හැකි සත්ත්වයන්ද, කරුණු අවබෝධ කරවීමට දුෂ්කර සත්ත්වයන්ද, පරලොවත් අකුසලුත් භය වශයෙන් දක්නා ඇතැම් සත්ත්වයන්ද දුටුසේක.

11. යම්සේ වනාහි මහනෙල් විලෙක හෝ රත් පියුම් විලෙක හෝ හෙළ පියුම් විලෙක හෝ ඇතැම් නිල් මහනෙල් කෙනෙක් හෝ රත් පියුම් කෙනෙක් හෝ හෙළ පියුම් කෙනෙක් හෝ දියෙහි උපන්නෝ දියෙහි වැඩුණෝ දියෙන් මතු නොවූවෝ දිය යටම ගිලුණෝව පෝෂිත වෙත්ද, ඇතැම් නෙලුම් රත් පියුම් හෙළ පියුම් කෙනෙක් දියෙහි උපන්නෝ, දියෙහි වැඩුණෝ දිය මතුපිටට සමව සිටියෝ වෙත්ද, ඇතැම් නෙලුම් හෝ රත් පියුම් හෝ හෙළ පියුම් කෙනෙක් දියෙහි උපන්නෝ, දියෙහි වැඩුණෝ, දියෙන් ඉහළ නැග සිටියෝ දියෙන් දිය නොගෑවුණෝද, එසේම (ලොව) අල්ප රජස්කවූ ඇතැම් සතුන්ද, මහා රජස්කවූ ඇතැම් සතුන්ද, තියුණු ඉඳුරන් ඇති ඇතැම් සතුන්ද, නොතියුණු ඉඳුරන් ඇති ඇතැම් සතුන්ද, මනා ආකාර ඇති ඇතැම් සතුන්ද, නොමනා ආකාර ඇති ඇතැම් සතුන්ද, පහසුවෙන් අවබෝධ කළ හැකි ඇතැම් සතුන්ද, පහසුවෙන් අවබෝධ නොකළ හැකි ඇතැම් සතුන්ද, පරලොවත් අකුසලුත් බිය වශයෙන් දක්නා සුලුව වසන ඇතැම් සතුන්ද, බුදුඇසින් ලොව බලන භාග්‍යවතුන් වහන්සේ දුටු සේක.

12. දැක සහම්පති බ්‍රහ්මයාට ගාථායෙන් මෙසේ වදාළ සේකː

"බ්‍රහ්මය, (අවබෝධයට උත්සාහ නැතියන්ට දම් දෙසීම) කය වෙහෙසීම් පමණෙකැ යි යන හැඟීම ඇත්තෙම්, ප්‍රගුණවූ උතුම් ධර්මය මිනිසුන් අතර (මේ තාක්) නොදෙසීමි. කන් ඇති යම් කෙනෙක් වෙත්ද ඔවුහු ශ්‍රද්ධාව විහිදුවත්වා, ඔවුන්ට අමා දොරවල් හරන ලදහ."

13. එවිට සහම්පති බ්‍රහ්මයා 'භාග්‍යවතුන් වහන්සේ විසින් දහම් දෙසීමට කරන ලද අවකාශ ඇතියෙමි'යි සතුටුව භාග්‍යවතුන් වහන්සේට සාදරව නමස්කාර කොට, පැදකුණු කොට එහිම අතුරුදහන් විය.

## 2. ගාරව සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ බුදුව නොබෝ කලකින් උරුවෙල් දනව්වෙහි නේරංජරා ගංතෙර අජපල් නුගරුක මුල වැඩවසනසේක.

2. එකල්හි තනිව චිත්ත විවේකයෙන් හුන් භාග්‍යවතුන් වහන්සේට මේ සංකල්පනාව ඇතිවිය "කිසිවකු ගුරුතන්හි නොතබා, කිසිවකු දෙටුතන්හි නොතබා, ඉන්නා තැනැත්තේ දුකසේ වෙසේ. මම් කවරනම් මහණකුට හෝ බමුණකුට හෝ සත්කාර කොට, ගෞරව කොට, ඇසුරු කොට වෙසෙන්නෙම්ද?"

3 ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට මෙසේ සිතෙක් විය. "පරිපූර්ණ නොවූ ශීලස්කන්ධයක් පුරාලීමට යම් අන් මහණකුට හෝ බමුණකුට හෝ සත්කාර කොට, ගරුකාර කොට, ඇසුරු කොට වසන්නෙම් නම්, එසේවූ මා හට වැඩි තරම් ශීලසම්පන්නවූ, සත්කාර ගරුකාර ලැබිය යුතු, මා විසින් ඇසුරු කටයුතු, කිසිම පුද්ගලයකු දෙවියන් සහිත මරුන් සහිත, බඹුන් සහිත ලොවෙහි, මහණ බඹුණන් සහිත, දෙව් මිනිසුන් සහිත සත්ත්ව සමූහයා අතර නොමදකිමි."

4. "පරිපූර්ණ නොවූ සමාධිස්කන්ධයක් පුරාලීමට යම් අන් මහණකුට හෝ බමුණකුට හෝ සත්කාර කොට, ගරුකාර කොට, ඇසුරු කොට වසන්නෙම් නම්, එසේවූ මාහට වැඩිතරම් ශීලසම්පන්නවූ, සත්කාර ගරුකාර ලැබිය යුතු, මා විසින් ඇසුරු කටයුතු, කිසිම පුද්ගලයකු දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත ලොවෙහි, මහණ බමුණන් සහිත, දෙව් මිනිසුන් සහිත සත්ත්ව සමූහයා අතර නොමදකිමි."

5. "පරිපූර්ණ නොවූ ප්‍රඥාස්කන්ධයක් පුරාලීමට යම් අන් මහණකුට හෝ බමුණකුට හෝ සත්කාර කොට, ගරුකාර කොට, ඇසුරු කොට වසන්නෙම් නම්, එසේවූ මාහට වැඩිතරම් ශීලසම්පන්නවූ, සත්කාර ගරුකාර ලැබිය යුතු, මා විසින් ඇසුරු කටයුතු, කිසිම පුද්ගලයකු දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන්

සහිත ලොවෙහි මහණ බමුණන් සහිත, දෙව් මිනිසුන් සහිත සත්ත්ව සමූහයා අතර නොමදකිමි”

**6.** “පරිපූර්ණ නොවූ විමුක්තිස්කන්ධයක් පුරාලීමට යම් අන් මහණකුට හෝ බමුණකුට හෝ සත්කාර කොට, ගරුකාර කොට, ඇසුරු කොට වසන්නෙම් නම්, එසේවූ මාහට වැඩිතරම් ශීලසම්පන්නවූ, සත්කාර ගරුකාර ලැබිය යුතු, මා විසින් ඇසුරු කටයුතු, කිසිම පුද්ගලයකු දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත ලොවෙහි, මහණ බමුණන් සහිත, දෙව් මිනිසුන් සහිත සත්ත්ව සමූහයා අතර නොමදකිමි.”

**7.** “පරිපූර්ණ නොවූ විමුක්තිඥාන දර්ශනස්කන්ධයක් පුරාලීමට යම් අන් මහණකුට හෝ බමුණකුට සත්කාර ගරුකාර කොට, ඇසුරු කොට වසන්නෙම් නම්, එසේවූ මාහට වැඩිතරම් සමාධි සම්පන්නවූ, වැඩිතරම් ප්‍රඥා සම්පන්නවූ, වැඩිතරම් විමුක්ති සම්පන්නවූ, වැඩිතරම් විමුක්තිඥාන දර්ශන සම්පන්නවූ, මගෙන් සත්කාර ගරුකාර ලැබිය යුතු, මා විසින් ඇසුරු කටයුතු කිසිම පුද්ගලයකු දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත ලොවෙහි, මහණ බමුණන් සහිත, දෙව් මිනිසුන් සහිත සත්ත්ව සමූහයා අතර නොමදකිමි.”

**8.** ‘මා අවබෝධ කළ යම් ධර්මයක් ඇද්ද, ඒ ධර්මයම සත්කාර ගරුකාර කොට, ඒ දහමම ඇසුරු කොට වෙසෙන්නෙම් නම් ඉතා යෙහෙක.”

**9** එකල්හි සහම්පති බ්‍රහ්මතෙම තම සිතින් භාග්‍යවතුන් වහන්සේගේ අදහස දැන ශක්තිමත් මිනිසකු නවා ගත් අත දික්කරන්නේ හෝ දික්කළ අත නවාගන්නේ යම්සේද එසේම (විගසින්) බඹලොවින් අතුරුදහන්ව භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි පහළ විය.

**10.** ඉක්බිති සහම්පතී බ්‍රහ්මතෙම උතුරු සළුව එකස්කොට පෙරව, භාග්‍යවතුන් වහන්සේ දිසාවට ඇඳිලි නමා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. “භාග්‍යවතුන් වහන්ස, ඒ එසේය. සුගතයන්වහන්ස, ඒ එසේය. ස්වාමීනි, අතීත කාලයෙහි යම්

රහත් සම්මාසම්බුදු කෙනෙක් වුහු නම්, ඒ භගවත්හුද ධර්මයටම සත්කාර කොට, ධර්මයටම ගරුකාර කොට, ධර්මයම ඇසුරු කොට විසූහ. ස්වාමීනි, මතු කාලයෙහිද යම් රහත් සම්මාසම්බුදු කෙනෙක් වන්නාහු නම්, ඒ භගවත්හුද ධර්මයටම සත්කාර කොට, ධර්මයටම ගරුකාර කොට, ධර්මයම ඇසුරු කොට වසන්නාහ. ස්වාමීනි, දැන් රහත් සම්මාසම්බුදුවූ භගවත් තෙමේද ධර්මයටම සත්කාර කොට, ධර්මයටම ගරුකාර කොට, ධර්මයම ඇසුරු කොට වෙසේවා."

11. සහම්පති බ්‍රහ්මතෙම මෙය කීය. මෙය කියා නැවත අනෙකක්වූ මෙබස් පැවසීයඃ

"යම් අතීත සම්බුදු කෙනෙක් වූහුද, යම් අනාගත සම්බුදු කෙනෙක් වන්නාහුද, බොහෝ දෙනාගේ ශෝක නසන සම්බුදුවරයෙක් දැන් ඇත්තේද,

"ඒ සියල්ලෝ දහම ම ගුරු කොට ගෙන විසූහ, වසත්, වසන්නාහුද වෙත්. මේ බුදුවරුන්ගේ ධර්මතාවෙකි.

"එබැවින් තමහට වැඩ කැමති, තමාට මහත් බව පතන, බුද්ධානුශාසනය සිහිකරන්නාහු විසින් සද්ධර්මය ගරුතන්හි තබා පිදිය යුතුයි.'

---

## 3. බ්‍රහ්මදේව සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල්හි වනාහි එක්තරා බැමිණියකගේ බ්‍රහ්මදේව නම් පුතෙක් ගිහිගෙන් නික්ම භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදි විය.

3. ඉක්බිති ආයුෂ්මත් බ්‍රහ්මදේවතෙම තනිව සමූහයාගෙන් වෙන්ව, නොපමාව, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, නිවන් කරා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මෙහෙයූ සිතැතිව වෙසෙන්නේ නොබෝ කලෙකින්ම යමක් පිණිස කුලපුත්තු ගිහිගෙන් නික්ම සස්නට වදිත් නම්, මහ බ්‍රහ්මචය්‍ය්‍යාව අවසන්වූ ඒ නිරුත්තර රහත් ඵලය මේ ආත්මභාවයෙහිම, නොබෝ කලෙකින්ම, තෙමේම වෙසෙසින් දැන, පැහැදිලි කොට ලැබ විසීය. 'ජාතිය ක්ෂිණ විය. මාර්ග බ්‍රහ්මචය්‍ය්‍යාව වැස නිමවිණි. කළ යුත්ත කරන ලදී. මේ රහත් බව පිණිස තවත් කළයුතු දෙයක් නැතැ'යි (තෙමේම) වෙසෙසා දැන ගත්තේය. ආයුෂ්මත් බ්‍රහ්මදේව තෙම රහතුන්ගෙන් කෙනෙක් විය.

4. ඉක්බිති ආයුෂ්මත් බ්‍රහ්මදේවතෙම පෙරවරුයෙහි හැඳ පෙරව පාත්‍ර සිවුරුගෙන සැවැත් නුවරට පිඬු පිණිස පිවිසියේය. සැවැත් නුවර ගෙපිළිවෙළින් පිඬු පිණිස හැසිරෙනුයේ සිය මවු නිවෙස යම් තැනෙකද එතැනට පැමිණියේය.

5. එකල වනාහි ආයුෂ්මත් බ්‍රහ්මදේවයන්ගේ මවු බැමිණි බ්‍රහ්මයාහට නිතිපතා හෝම පූජා කෙරෙයි. එකල්හි සහම්පති බ්‍රහ්මයාහට 'ආයුෂ්මත් බ්‍රහ්මදේවයන් වහන්සේගේ මේ මවු බැමිණි බ්‍රහ්මයාහට නිතිපතා හෝමපූජා කෙරෙයි. මම ඇය කරා පැමිණ සංවේගයට පමුණුවන්නෙම් නම් (මනා පිළිවෙත්හි යෙදුයෙම් වීම් නම්) යෙහෙකැ'යි සිත්විය.

6. ඉක්බිති සහම්පති බ්‍රහ්මතෙම ශක්තිමත් මිනිසකු නවාගත් අතක් දික්කරන හෝ දික්කළ අතක් නවන හෝ තරම් විගසින් බඹ ලොවින් අතුරුදහන්ව, බ්‍රහ්මදේවයන්ගේ මවගේ ගෙයි පහළ විය.

7. ඉක්බිති සහම්පති බ්‍රහ්මතෙම අසා සිට ආයුෂ්මත් බ්‍රහ්මදේවයන්ගේ මවු බැමිණියට ගාථාවලින් මෙසේ කීය:

> "බැමිණිය, යමෙකුට (යම් බඹකුට) නිතර හෝම පුදහිද, ඒ බ්‍රහ්මයාගේ බඹලොව මෙයින් ඈත්හිය. බැමිණිය, යමෙකුට (යම් බඹකුට) නිතර හෝම පුදහිද මෙවැනි බඹහු කන දේ නොවේ. බ්‍රහ්මලොක මාර්ගය නොදැන කුමක් දොඩන්නෙහිද?

"බැමිණිය, (කාම ගුණ නමැති) උපධි රහිතව, දිව්‍ය බ්‍රහ්මයනුදු ඉක්මවා සිටි, රාගාදි පලිබොධ නැති, අනෙකක්හු පෝෂිත නොකරන තිගේ මේ බ්‍රහ්මදේව තෙම තිගේ ගෙට පිඬු පිණිස පිවිසියේය.

"ඈත සිට ගෙනෙන ලද පිණ්ඩය පිළිගන්නට සුදුසුවූ, වේදයෙන් (සිවු මගින්) දුක් කෙළවර කළ වඩන ලද සිත් ඇති දෙව් මිනිසුන්ට දක්ෂිණාර්හවූ, පව් දුරුකොට කෙලෙස් නොගෑවුණු තිවීගිය හෙතෙම අහර සෙවීම කෙරෙයි.

"ඔහුට අතීතයද නැත. අනාගතයද නැත. ඔහු ශාන්තය. (ක්‍රොධ) දුම් නැත්තෙක, ආශා නැත්තෙක. පෘථග්ජනයන් හා රහතුන් විෂයයෙහි බහා තැබූ දඬු ඇත්තෙක හෙතෙම තිගේ ආහුතියි කියන ලද අග්‍ර ආහාරය වළඳාවා.

"සතුරු සෙනඟ නැත්තේ, උපශාන්ත වූයේ, දැමුනු ඇතකුමෙන් වාසයකරයි. තණ්හා නැති, සුසිල්වූ, හොඳින් මිදුනු සිත් ඇති ඒ භික්ෂුතෙම තිගේ ආහුතියයි කියූ අග්‍ර ආහාරය වළඳාවා.

"බැමිණිය, උන්වහන්සේ කෙරෙහි පහන් සිතැත්තියක්ව, නොසෙලවෙන ශ්‍රද්ධා ඇත්තියක්ව, දක්ෂිණාර්හවූ උන්වහන්සේ කෙරෙහි දානය දෙව. තරණය කළ (කෙලෙස්) සයුරු ඇති, රහතුන් දැක, මතු සැප ඇති කරන පින් කරව."

8. (සංගීතිකාරයෝ මෙසේ කීහුඃ) ඒ බැමිණි තොමෝ උන්වහන්සේ කෙරෙහි පැහැදුනාවූ සිතැත්තියක්ව, නොසෙලවෙන ශ්‍රද්ධා ඇත්තියක්ව, දක්ෂිණාවට සුදුසු සඟුන් කෙරෙහි දක්ෂිණාව පිහිටෙව්වාය. (කෙලෙස්) සයුර තරණය කළ රහතුන් දැක අනාගත සුව ඵල වන්නාවූ පින් කළාය.

---

## 4. බකබ්‍රහ්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි පිහිටි අනේපිඬු සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල වනාහි බකබ්‍රහ්මයාට "මේ බ්‍රහ්මාත්මභාවය නිත්‍යය, මෙය ස්ථිරය, මෙය සදාකාලිකය, මෙය අඩුවක් නැති සියල්ලය, මින් චුතවීමෙක් නැත. මෙය වනාහි නොහටගනී, නො දිරයි, නො මියෙයි, චුත නොවෙයි. (මින්) චුතව අන් තැනෙක නොඋපදියි, මෙයින් මත්තෙහි සසරින් ගැලවී යායුතු අන් තැනෙක් නැතැ"යි මෙබඳු ලාමක දෘෂ්ටියෙක් උපදින්නේ වෙයි.

3. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ බකබ්‍රහ්මයාගේ අදහස තම සිතින් දැන, ශක්තිමත් පුරුෂයෙක් නැවූ අතක් දික් කරන්නේ හෝ දික් කළ අතක් නවන්නේ හෝ යම්සේද, එසේම (විගසින්) ජේතවනාරාමයෙන් අතුරුදන්ව ඒ බඹලොව පහළවූ සේක.

4. බකබ්‍රහ්මතෙම එහි වඩින භාග්‍යවතුන් වහන්සේ දුරදීම දැක, භාග්‍යවතුන් වහන්සේට 'මෙහි වඩින්න. නිදුකාණනි, බොහෝ කලකට පසු ඔබ මෙහි වැඩියේ, යහපත. නිදුකාණනි, මේ බ්‍රහ්මාත්ම භාවය වනාහි නිත්‍යය, මෙය ස්ථිරය, මෙය සදාකාලිකය, මෙය අඩුවක් නැති සියල්ලය, මින් චුතවීමෙක් නැත, මෙය නොහට ගනී, නොදිරයි, මියෙන්නෙක් නැත, චුතවීමෙක් නැත, මෙයින් චුතව අන් තැනෙක උපදනෙක් නැත. මෙයට වැඩි සසරින් ගැලවෙන අනෙක් තැනෙක් නැතැ'යි කීය.

5. මෙසේ කීකල භාග්‍යවතුන් වහන්සේ බක බ්‍රහ්මයාට, 'අනිත්‍යම වන දේ නිත්‍යයයි කියා නම්, අස්ථිරම වන දේ ස්ථිරයයි කියා නම්, සදාකාලිකම නොවන දේ සදාකාලිකයයි කියා නම්, අඩුවක් ඇති දේ අඩුවක් නැති සියල්ලය කියා නම්, චුතවන ස්වභාව ඇති දෙයක් චුතනොවන ස්වභාව නැති

දෙයක්යයි කියා නම්, යම් තැනෙක වනාහි ජාති ජරා මරණ චුතවීම් ඉපදීම් වේනම්, ඒ පිළිබඳව එහි ජාති ජරා මරණ චුතවීම් ඉපදීම් නැතැයි කියා නම්, එයට වැඩි, සසරින් ගැලවෙන අනෙක් තැනක් ඇති කල එයට වැඩි (ගැලවීමෙක් නැතැයි) කියා නම් එසේවූ මේ බකබ්‍රහ්ම තෙම ඒකාන්තයෙන් අවිද්‍යාවෙන් අන්ධව ගියේ වේයයි' වදාළ සේක.

6. (එවිට බක බ්‍රහ්මතෙම මෙසේ කීයඃ) "ගෞතමයෙනි, (අපි) හැත්තෑදෙනෙක් (කරන ලද) පින් කම් ඇත්තෝ ජාතිය හා ජරාව ඉක්ම ගියෝ වමු, අනුන් තමන් වසඟකොට පවත්වන්නෝ වෙමු, වේදගූ නම් වෙමු. මේ වනාහි කෙළවරවූ බඹලොව උපතයි. අන්‍ය බොහෝ ජනයෝ අප ප්‍රාර්ථනා කෙරෙති."

7. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහඃ) "බක බ්‍රහ්මය, තෝ යම් ආයුෂයක් දීර්ඝායුෂයයි හඟින්නෙහිද, එය දීර්ඝායුෂයෙක් නොවේ. නිරබ්බුද නම් ගණනින් ලක්ෂයක් ආයුෂ යයි මම දනිමි."

8. (බක බ්‍රහ්මතෙම මෙසේ කීයඃ) "භාග්‍යවතුනි, 'මම අනන්තදර්ශී වෙමි'යිද, 'ජාතිය හා ජරාව හා ශෝකය ඉක්ම සිටියෙමි වෙමි'යිද කියන්නෙහිය. මාගේ පුරාතනවූ කුමන නම් ව්‍රත සමාදානයෙක් වීද? කුමන ශීලයෙක් වීද? යමක් මම දනිම්ද එය මට කියව."

9. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහඃ) "ග්‍රීෂ්ම කාලයෙහි පීඩිතවූ පිපාසිතවූ බොහෝ මිනිසුන්ට තෝ පැන් පෙවූයෙහිද, තාගේ ඒ පුරාතනවූ ව්‍රත සමාදානය හා ශීලය නිදා සිට නැගිටියක්හු මෙන් මම සිහිකරමි.

"ඒණිනම් ගංතෙර සොරුන් විසින් අල්ලාගන්නා ලද අතපය බැඳ ගෙන යනු ලබන්නාවූ මිනිසුන් යම් හෙයකින් මිදීද, තාගේ ඒ පුරාතන ව්‍රත සමාදානය හා ශීලය නිදා සිට නැගිටියක්හු මෙන් සිහිකරමි.

"මිනිසුන් විනාශ කරනු කැමැත්තෙන් රෞද්‍රවූ නයා විසින් ගංගා නම් ගඟ දියෙහි ගන්නා ලද නැව බලපා මැඩ මිදුයෙහිය. ඒ තාගේ පුරාතනවූ ව්‍රත සමාදානය හා ශීලය නිදා සිට නැගිටියක්හු මෙන් සිහි කෙරෙමි.

"තට මම කප්ප නම් අතවැස්සෙක් වූයෙමි. (ඒ නුඹ) මනා නුවණැත්තෙකු ලෙසද, ව්‍රත සම්පන්නයකු ලෙසද සිතුයෙමි. එසේවූ තාගේ ව්‍රත සමාදානය හා ශීලය නිදා සිට නැගිටියක්හු මෙන් සිහිකරමි."

10. (බක බ්‍රහ්ම තෙම මෙසේ කීයඃ) "මාගේ මේ ආයුෂ ඒකාන්තයෙන් දන්නෙහිය. සෙසු සියල්ලද දන්නෙහිය. එසේ හෙයින්ම ඔබ බුද්ධ වෙහිය. එහෙයින්ම ඔබගේ මේ දිලිසෙන ආනුභාවය බඹලොව මුළුල්ල බබුළුවමින් සිටී."

## 5. අපරාදිට්ඨි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල වනාහි එක්තරා බ්‍රහ්මයෙකුට 'මේ බඹලොවට ආ හැකි මහණෙක් හෝ බමුණෙක් හෝ නැතැ'යි මෙසේවූ ලාමක දෘෂ්ටියෙක් පහළ වූයේ වේ.

3. එකල්හි භාග්‍යවතුන් වහන්සේ තම සිතින් ඒ බඹහුගේ සිතෙහිවූ කල්පනාව දැන, ශක්තිමත් පුරුෂයෙකු නැවූ අත දික් කරන්නේ හෝ දික්කළ අත නවන්නේ හෝ යම්සේද, එසේ ක්ෂණයෙන් ජේතවනාරාමයෙන් අතුරුදන්ව ඒ බඹලොව පහළවූ සේක.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ තේජෝකසිණ සමාපත්තියට සමවැද ඒ බඹහට උඩින් අහසෙහි පළක් බැඳ හුන්සේක.

5. එකල්හි ආයුෂ්මත් මහමුගලන්තෙර හට 'දැන් භාග්‍යවතුන් වහන්සේ කොහි ඉන්නාසේක් දෝ'යි මේ සිත විය.

6. මහ මුගලන්තෙර තෙම මිනිසුන්ගේ විෂය ඉක්මවා දැක්ක හැකි, පිරිසිදුවූ දිවැසින්, ඒ බඹහු මත්තෙහි තේජෝකසිණ සමාපත්තියට සමවැද අහසෙහි පළඟින් ඉන්නා භාග්‍යවතුන් වහන්සේ දිටීය. දැක ශක්තිමත් පුරුෂයෙක් නැවූ අත දික්කරන්නේ හෝ, දික්කළ අත නවන්නේ හෝ යම්සේද එසේ ජේතවනාරාමයෙන් අතුරුදන්ව ඒ බඹලෙව්හි පහළ විය.

7. ඉක්බිති ආයුෂ්මත් මහමුගලන්තෙර තේජෝකසිණ සමාපත්තියට සමවැද පෙර දිශායෙහි ඒ බඹහට මත්තෙන් භාග්‍යවතුන් වහන්සේට පහතින් අහස්හි පළක් බැඳ හුන්නේය.

8. එකල්හි ආයුෂ්මත් මහාකාශ්‍යප තෙරහට 'දැන් භාග්‍යවතුන් වහන්සේ කොහි ඉන්නා සේක්ද?' මේ සිත විය. ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරතෙම මිනිස් විෂය ඉක්මවූ, පිරිසිදුවූ දිවැසින්, ඒ බඹහු මත්තෙහි තේජෝකසිණ සමාපත්තියෙන් අහස්හි පළඟින් ඉන්නා භාග්‍යවතුන් වහන්සේ දිටීය. දැක ශක්තිමත් පුරුෂයෙක් නැවූ අත දික්කරන්නේ හෝ දික්කළ අත නවන්නේ හෝ යම්සේද එසේ ජේතවනාරාමයෙන් විගසෙකින් අතුරුදන්ව ඒ බඹලොව පහළ විය. ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිර තෙම දකුණු දෙස ඇසුරු කොට ඒ බඹහට මත්තෙන් භාග්‍යවතුන් වහන්සේට පහතින් අහස්හි තේජෝකසිණ සමාපත්තියට සමවැද හුන්නේය.

9. එකල්හි ආයුෂ්මත් මහාකප්පින තෙරහටද 'දැන් භාග්‍යවතුන් වහන්සේ කොහි ඉන්නා සේක්ද?' මේ සිත විය. ආයුෂ්මත් මහාකප්පින ස්ථවිර තෙම මිනිස්විෂය ඉක්මවූ, පිරිසිදුවූ දිවැසින්, ඒ බඹහු මත්තෙහි තේජෝකසිණ සමාපත්තියෙන් අහස්හි පළඟින් ඉන්නා භාග්‍යවතුන් වහන්සේ දිටීය. දැක ශක්තිමත් පුරුෂයෙක් නැවූ අත දික්කරන්නේ හෝ, දික්කළ අත නවන්නේ හෝ යම්සේද එසේ ජේතවනාරාමයෙන් විගසෙකින් අතුරුදන්ව ඒ බඹලෙව්හි පහළ විය. ඉක්බිති

ආයුෂ්මත් මහාකප්පින ස්ථවිරතෙම බටහිරදිග ඇසුරු කොට ඒ බඹහට මත්තෙන් භාග්‍යවතුන් වහන්සේට පහතින් අහස්හි තේජෝකසිණ සමාපත්තියට සමවැද හුන්නේය.

10. එකල්හි ආයුෂ්මත් අනුරුද්ධ තෙරහට මේ සිත විය. 'දැන් භාග්‍යවතුන් වහන්සේ කොහි ඉන්නා සේක්ද?' ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරතෙම මිනිස් විෂය ඉක්මවූ, පිරිසිදුවූ දිවැසින්, ඒ බඹහු මත්තෙන් තේජෝකසිණ සමාපත්තියට සමවැද අහස්හි පළඟින් ඉන්නා භාග්‍යවතුන් වහන්සේ දිටීය. දැක ශක්තිමත් පුරුෂයෙක් නැවූ අත දික්කරන්නේ හෝ, දික්කළ අත නවන්නේ හෝ යම්සේද එසේවූ විගසෙකින් ජේතවනාරාමයෙන් අතුරුදහන්ව ඒ බඹලෙව්හි පහළ විය. ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිර තෙම උතුරුදිග නිසා ඒ බඹහට මත්තෙන් භාග්‍යවතුන් වහන්සේට පහතින් අහස්හි තේජෝකසිණ සමාපත්තියට සමවැද හුන්නේය.

11. ඉක්බිති ආයුෂ්මත් මහමුගලන් තෙරහු බඹුහට මෙසේ ගාථාවෙන් කීහ.

> 'ඇවැත්නි, පෙර තොපගේ යම් දෘෂ්ටියෙක් වීනම් අද දක්වාත් ඒ දෘෂ්ටිය ඇත්තේද? මේ බඹලෙව්හි (අන්‍ය රශ්මීන්) මැඩපවත්වමින් රැස් විහිදුවමින් බබළන (බුදු රදුන්) දකිහිද?"
>
> 12. (බඹතෙම මෙසේ කීය) "නිදුකාණනි, පෙර මට යම් දෘෂ්ටියෙක් වීනම්, එය දැන් නැත. බඹලෙව්හි (අන්‍ය රශ්මීන්) ඉක්මවමින් බබළන (බුදුරදුන්) දකිමි. ඒ මම 'නිත්‍ය, සදාකාලික වෙමි'යි අද මම කෙසේ නම් කියම්ද?"

13. ඉක්බිති බුදුහු ඒ බ්‍රහ්මයා සංවේගකොට ශක්තිමත් පුරුෂයෙක් නැවූ අත දික් කරන්නේ හෝ දික් කළ අත නවන්නේ හෝ යම්සේද එසේ ඒ බඹලොවින් අතුරුදහන්ව ජේතවනාරාමයෙහි පහළවූසේක.

14. ඉක්බිති ඒ බ්‍රහ්මතෙම එක්තරා අතවැසි බ්‍රහ්මයෙකුට කථාකළේය. "එව, නිදුකාණනි, ආයුෂ්මත් මහමුගලන් තෙරුන්

ඉන්නා යම් තැනෙක් වේද එතැනට යව. ගොස්, ආයුෂ්මත් මහමුගලන් තෙරහුට මෙසේ කියව. 'මුගලන් නම්වූ නිදුකාණන් වහන්ස, ඒ භාග්‍යවතුන් වහන්සේගේ මෙසේ මහා ඍද්ධි ඇති, මහා ආනුභාව ඇති, භවත් මුගලන් කාශ්‍යප කප්පින අනුරුද්ධවහන්සේ වැනි අන්‍යවූත් ශ්‍රාවකයන් වහන්සේලා ඇත්ද?"

15. "එසේයි, නිදුකාණනි,"යි ඒ අතවැසි බ්‍රහ්මයා බඹහුට උත්තර දී මහමුගලන්තෙරුන් යම් තැනකද එතැනට පැමිණියේය පැමිණ, මහමුගලන් තෙරුන්ට මෙය කීයේය. 'මුගලන් නිදුකාණන් වහන්ස, ඒ භාග්‍යවතුන් වහන්සේගේ මෙසේ මහා ඍද්ධි මහා ආනුභා ඇති භවත් මුගලන් කාශ්‍යප කප්පින අනුරුද්ධ වහන්සේ යම්සේද එසේවූ අන්‍යවූ ශ්‍රාවකයෝ ඇත්තාහුද?"

16. ඉක්බිති ආයුෂ්මත් මහමුගලන් තෙරහු ඒ අතවැසි බ්‍රහ්මයාට ගාථායෙන් මෙසේ කීහ.

> "ත්‍රිවිද්‍යාවෙන් සමන්විත, ඍද්ධිවිධ ඥානයට පැමිණි, පරසිත් දැනීමෙහි දක්ෂ, ආශ්‍රවයන් ක්ෂයකළ අර්හත්වූ බුද්ධශ්‍රාවකයෝ බොහෝයි."

17. ඉක්බිති ඒ අතවැසි බ්‍රහ්මයා ආයුෂ්මත් මහමුගලන් තෙරුන්ගේ වචනය පිළිගෙන අනුමෝදන්ව ඒ බ්‍රහ්මයා යම් තැනෙකද එතැනට පැමිණියේය.

පැමිණ, ඒ බ්‍රහ්මයාට මෙය කීය. "නිදුකාණනි, ආයුෂ්මත් මහමුගලන්තෙර මෙසේ කීය.

> "ත්‍රිවිද්‍යාසම්පන්න ඍද්ධිවිධඥානයට පැමිණි, පරසිත් දැනීමෙහි දක්ෂ, ආශ්‍රවයන් ක්ෂය කළ අර්හත්වූ බුද්ධ ශ්‍රාවකයෝ බොහෝය."

18. ඒ අතවැසි බ්‍රහ්මයා මෙය කීය. සතුටු සිත් ඇති බ්‍රහ්මතෙම ඒ අතවැසි බ්‍රහ්මයාගේ වචනය සතුටින් පිළිගත්තේය.

---

## 6. පමාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල වනාහි භාග්‍යවතුන්වහන්සේ දහවල් ගතකිරීම පිණිස චිත්තවිවේකයෙන් හුන්සේක.

3. ඉක්බිති ප්‍රත්‍යෙක බ්‍රහ්මවූ සුබ්‍රහ්මද, ප්‍රත්‍යෙක බ්‍රහ්මවූ සුද්ධාවාසද, භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියෝය. පැමිණ, වෙන වෙනම උළුවහු කණු වෙත සිටියහ.

4. ඉක්බිති ප්‍රත්‍යෙක බ්‍රහ්මවූ සුබ්‍රහ්ම, ප්‍රත්‍යෙක බ්‍රහ්මවූ සුද්ධාවාසට මෙය කීය. 'නිදුකාණනි, භාග්‍යවතුන් වහන්සේ බැහැදකින්නට කල් නොවෙයි. භාග්‍යවතුන්වහන්සේ දහවල් ගතකිරීමට වැඩියෝ විවේකී වූ සේක. අසුවල් බ්‍රහ්මලොකය ධ්‍යාන සැපයෙන් සමෘද්ධවූයේ වෙයි. අභිඥාමලින් පිපුණේ වෙයි. එහි බ්‍රහ්මයෙක්ද පමාව වෙසේ. නිදුකාණනි, යමු. ඒ බ්‍රහ්ම ලොකය යම් තැනෙකද එතැනට පැමිණෙමු. පැමිණ, ඒ බඹු උනන්දු ඇත්තකු කරමු."

5. "එසේය, නිදුකාණනි"යි ප්‍රත්‍යෙක බ්‍රහ්මවූ සුද්ධාවාස ප්‍රත්‍යෙක බ්‍රහ්මවූ සුබ්‍රහ්මට උත්තර දුනි.

6. ඉක්බිති ප්‍රත්‍යෙක බ්‍රහ්මවූ සුබ්‍රහ්මද, ප්‍රත්‍යෙක බ්‍රහ්මවූ සුද්ධාවාසද ශක්තිමත් පුරුෂයෙක් නැවුන අත දික්කරන්නේ හෝ දික්කල අත නවන්නේ හෝ යම්සේද, එසේ ක්ෂණයෙන් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙන් අතුරුදහන්ව ඒ බඹලොව පහළවූහ.

7. ඒ බඹතෙම දුරදීම එන ඒ බඹුන් දුටුවේය. දැක ඔවුන්ට මෙසේ කීයඃ "අහ! දුක් නැත්තාහු, නුඹලා කොතැන්හි සිට එන්නහුද?"

8. "නිදුකාණනි, අපි වනාහි අර්හත්වූ, සම්මාසම්බුද්ධවූ, භාග්‍යවතුන්වහන්සේගේ සමීපයෙන් එන්නමු. නිදුකාණනි, ඒ

අර්හත්වූ, සම්මාසම්බුද්ධවූ, භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන පිණිස නුඹත් යන්නෙහිද?"

9. මෙසේ කියනු ලැබූ ඒ බඹතෙම ඒ වචනය නොයිවසන්නේ තමා දහස් දෙනෙකු කොට ප්‍රත්‍යෙක බ්‍රහ්මවූ සුබ්‍රහ්මට මෙසේ කීය. "නිදුකාණනි, නුඹ මෙබඳු ඍද්ධි හා ආනුභා ඇති මා නොදක්නෙහිද?"

10. "නිදුකාණනි, මෙබඳු ඍද්ධි හා ආනුභාව ඇති නුඹ මම ඇත්තෙන්ම දකිමි."

11. "නිදුකාණනි, ඒ මම වනාහි මෙසේ මහත් ඍද්ධි මහත් ආනුභාව ඇත්තෙමි, අන් කවර ශ්‍රමණයෙකුගේ හෝ බ්‍රාහ්මණයෙකුගේ හෝ උපස්ථානයට යන්නෙම්ද?"

12. ඉක්බිති ප්‍රත්‍යෙකබ්‍රහ්මවූ සුබ්‍රහ්මතෙම තමා දෙදහස් දෙනෙකු කොට මවා ඒ බඹහුට මෙසේ කීය. "නිදුකාණනි, මාගේ මෙබඳුවූ ඍද්ධි ආනුභාව නොදක්නෙහිද?",

13. "නිදුකාණනි, මෙබඳු ඍද්ධි ආනුභාව ඇති තොප ඇත්තෙන්ම දක්නෙමි."

14. "නිදුකාණනි, තොපටත් අපටත් වඩා ඒ භාග්‍යවතුන් වහන්සේ වනාහි මහත් ඍද්ධි ඇත්තේද, මහත් ආනුභා ඇත්තේද වනසේක. නිදුකාණනි, ඒ අර්හත්වූ සම්මාසම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන පිණිස තොප යනු මැනවි."

15. ඉක්බිති ඒ බඹතෙම ප්‍රත්‍යෙක බ්‍රහ්මවූ සුබ්‍රහ්මහට ගාථායෙකින් (මෙසේ) කීය.

"සුපර්ණ (ගුරුළු) රූප තුන්සියයක්ද, හංස රූප හාරසියයක්ද, උකුසු රූප පන්සියයක්ද, ධ්‍යානයෙහි යෙදුනු මාගේ (විමනෙහි වෙත්.) බ්‍රහ්මය, මේ විමානය උතුරුදිග්හි ආලෝක කරමින් බබළයි. එසේ ඇති මම කෙසේ නම් අනිකෙකුගේ උපස්ථානයට යන්නෙම්ද?"

16. "නැවත යුෂ්මතුන්ගේ රන් විමානය උතුරු දිග්හි ආලෝක කරමින් බබළාද, රූපයෙහි ජාති, ජරා, මරණ

යන දෝෂයද, හැම කල්හි ශීතාදියෙන් නිතර කම්පාවීම්ද දැක, එහෙයින් මනා නුවණැති තැනැත්තේ රූපයෙහි නොඇලෙයි.”

17. ඉක්බිති ප්‍රත්‍යෙක බ්‍රහ්මවූ සුබ්‍රහ්මද ප්‍රත්‍යෙක බ්‍රහ්මවූ සුද්ධාවාසද ඒ බ්‍රහ්මයා කළකිරවා එහිම අතුරුදහන්වූහ. ඒ බ්‍රහ්මතෙමද පසු කලෙක වනාහි අර්හත්වූ සම්මාසම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේට උපස්ථානය පිණිස ගියේය.

---

## 7. කෝකාලික (හෙවත් කෝකාලිය) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක.

2. එකල වනාහි භාග්‍යවතුන්වහන්සේ දහවල් ගතකිරීම පිණිස චිත්තවිවේකයෙන් හුන්නේය.

3. ඉක්බිති ප්‍රත්‍යෙක බ්‍රහ්මවූ සුබ්‍රහ්මද ප්‍රත්‍යෙක බ්‍රහ්මවූ සුද්ධාවාසද භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියෝය. පැමිණ, වෙන වෙනම උළුවහුකණුව වෙත සිටියහ.

4. එවිට ප්‍රත්‍යෙක බ්‍රහ්මවූ සුබ්‍රහ්මතෙම කෝකාලික භික්ෂුව අරභයා භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීයඃ

“මෙලොව කවර නම් නුවණ ඇත්තෙක් ශීලාදියෙන් ප්‍රමාණයක් නැති රහතන් වහන්සේ ප්‍රමාණය කරමින් කල්පනා කරන්නේද? ශීලාදියෙන් ප්‍රමාණයක් නැති රහතන් වහන්සේ පමණ කරන්නාවූ ඒ පෘථග්ජනයා වැසුණු ප්‍රඥා ඇත්තෙකැයි හඟිමි.”

---

## 8. තිස්සක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල වනාහි භාග්‍යවතුන්වහන්සේ දහවල් ගතකිරීම පිණිස චිත්තවිවේකයෙන් හුන්නේය.

3. ඉක්බිති ප්‍රත්‍යෙක බ්‍රහ්මවූ සුබ්‍රහ්මද ප්‍රත්‍යෙක බ්‍රහ්මවූ සුද්ධාවාසද භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියෝය. පැමිණ, උළුවහු කණුව ඇසුරුකොට වෙන වෙනම සිටියහ. ඉක්බිතිව ප්‍රත්‍යෙක බ්‍රහ්මවූ සුද්ධාවාස තෙම කටමෝරකතිස්සක භික්ෂුව අරභයා භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීයඃ

> "මෙලොව කවර නම් නුවණ ඇත්තෙක් ශීලාදියෙන් ප්‍රමාණයක් නැති රහතන්වහන්සේ ප්‍රමාණ කරමින් විශේෂයෙන් කල්පනා කරන්නේද? අප්‍රමෙය්‍යවූ රහතන් වහන්සේ ප්‍රමාණ කරන්නාවූ පෘථග්ජනයා (වැසුණු ප්‍රඥා ඇත්තෙකැයි) අඥානයෙකැයි හඟිමි."

---

## 9. තුදු බ්‍රහ්මා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

එකල්හි වනාහි කෝකාලික භික්ෂුතෙම හටගත් ආබාධ ඇත්තේ දුක් වූයේද දැඩි ගිලන් වූයේද වී.

2. ඉක්බිති ප්‍රත්‍යෙක බ්‍රහ්මවූ තුදු බ්‍රහ්මතෙම රෑ පෙරයම ඉකුත්වූ කල සියලු දෙව්රම් වෙහෙර තමාගේ ශරීර ආලෝකයෙන් බබුළුවා කෝකාලික භික්ෂුව යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, අහස සිට කෝකාලික භික්ෂුහට මෙසේ කීය.

3. "කෝකාලික, සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ කෙරෙහි සිත පහදව. සැරියුත් මුගලන් තෙරහු ශීලවන්තයෝය."

"ඇවැත්නි, නුඹ කවරෙහිද?"

"මම, තුදු නම් පච්චෙක බ්‍රහ්ම වෙමි."

4. "ඇවැත්නි, නුඹ අනාගාමී (මේ කාම ලොකයට නැවත නොඑන්නේ) යැයි භාග්‍යවතුන්වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද්දේ නොවේද? එසේ කල්හි මෙහි කුමකට ආයෙහිද? නුඹ විසින් කොතරම් අපරාධයෙක් කරන ලදදැයි බලව."
(බ්‍රහ්මතෙම මෙසේ කීය.)

5. "(මෙලොව) උපන් පුද්ගලයාගේ මුඛයෙහි කෙටේරියක් ඇත්තේය. නපුරු වචන කියන අන්ධබාල (දුර්ජන) තෙම ඉන් තමාම නසාගනියි.

"යමෙක් නින්දා කටයුත්තා ප්‍රශංසා කරාද, ප්‍රශංසා කටයුත්තා ගර්හා කෙරේද, ඒ පුද්ගලතෙම මුවින් අපරාධ රැස් කර ගනී. (හෙතෙම) ඒ අපරාධ කරණකොටගෙන සුවයක් නම් නොවිඳී.

"යම් වස්තු අපරාධයෙක් වේද, තමනුත් සමග ස්වකීය සියලු දේ සම්බන්ධ ඒ අපරාධය ස්වල්පයි. යම් කිසිවෙක් යහපත් මගින් ගිය පුද්ගලයන් (රහතුන්) කෙරෙහි සිත දූෂ්‍ය කරන්නේද, මේ වනාහි මහත් අපරාධය වෙයි.

"ලාමකවූ වචනයෙන්ද සිතෙන්ද, ආර්‍යයන්ට ගරහන පුද්ගලතෙම යම් නරකයකට උත්පත්ති වශයෙන් පැමිණේද, (එහි ආයුෂ) නිරබ්බුදයන් සිය දහසෙන් හා (නිරබ්බුද) සතිසෙක්ද, අර්බුද පසෙක්ද වෙත්."

---

## 10. දෙවෙනි කෝකාලික සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින්

කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. ඉක්බිති කෝකාලික භික්ෂුතෙම භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන්නාවූ කෝකාලික භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයඃ "ස්වාමීනි, සැරියුත් මුගලන් තෙරහු ලාමක අදහස් ඇත්තාහු ලාමක අදහස්වලට වසඟවූවාහුය."

2. මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ කෝකාලික භික්ෂුවට මෙසේ වදාළසේක. "එසේ නොකියව, කෝකාලික. එසේ නොකියව, කෝකාලික. කෝකාලික, සැරියුත් මුගලන් දෙනම කෙරෙහි සිත පහදව. සැරියුත් මුගලන් දෙනම ශීලවන්තයෝය."

3. දෙවනුවත් කෝකාලික භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වනාහි විශ්වාස කටහැක්කේය, ඇදහිය යුතු කථා ඇත්තේය. එසේ වුව සැරියුත් මුගලන් තෙරහු පවිටු අදහස් ඇත්තෝය. පවිටු අදහස්වලට වසඟ වූවාහුය."

4. දෙවනුවත් භාග්‍යවතුන් වහන්සේ කෝකාලික භික්ෂුවට මෙසේ කීය. "එසේ නොකියව, කෝකාලික. එසේ නොකියව කෝකාලික. කෝකාලික, සැරියුත් මුගලන් දෙනම කෙරෙහි සිත පහදව. සැරියුත් මුගලන් තෙරහු ශීලවන්තයෝය."

5. තුන්වෙනුවත් කෝකාලික භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වනාහි විශ්වාස කටහැක්කේය, ඇදහිය යුතු කථා ඇත්තේය. එසේ වුව සැරියුත් මුගලන් තෙරහු පවිටු අදහස් ඇත්තෝය."

6. තුන්වෙනුවත් භාග්‍යවතුන් වහන්සේ කෝකාලික භික්ෂුවට මෙය කීය. "එසේ නොකියව, කෝකාලික. එසේ නොකියව, කෝකාලික. කෝකාලික, සැරියුත් මුගලන් දෙනම කෙරෙහි සිත පහදව. සැරියුත් මුගලන් දෙනම ශීලවන්තයෝය."

7. ඉක්බිති කෝකාලික භික්ෂුතෙම අසුනෙන් නැගිට, භාග්‍යවතුන් වහන්සේ වැඳ, ප්‍රදක්ෂිණා කොට ගියේය. එසේ ගොස් නොබෝ වේලාවකින් කෝකාලික භික්ෂුවගේ සකල ශරීරය අබැට පමණවූ පිළිකාවලින් පැතුරුනේ විය. අබ ඇට පමණව, මුං පමණ විය. මුං ඇට පමණව කඩල පමණ විය. කඩල ඇට පමණව ඩෙබර ඇට පමණ විය. ඩෙබර ඇට පමණව නෙල්ලි පමණ විය. නෙල්ලි පමණව නොපැසුණු බෙලි පමණ විය. නොපැසුණු බෙලි පමණව බෙලි පමණ විය. බෙලි පමණව ගැහුණේය. සැරවද ලේද වැගිරිණි.

8. ඉක්බිති කෝකාලික භික්ෂුව ඒ ලෙඩින්ම මැරුණේය මැරුණාවූ කෝකාලික භික්ෂුතෙම සැරියුත් මුගලන් තෙරුන් කෙරෙහි වෛර බැඳ පදුම නිරයෙහි උපන්නේය.

9. ඉක්බිති සහම්පති බඹතෙම රෑ පෙරයම ඉකුත් කල සියලු ශරීර ආලෝකයෙන් ජේතවනය බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවත්හු වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක හුන් සහම්පති බඹතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයඃ "ස්වාමීනි, කෝකාලික භික්ෂුතෙම මැරුණේය. මැරී සැරියුත් මුගලන් දෙතෙරුන් කෙරෙහි වෛර බැඳ පදුම නරකයෙහි උපන්නේය" සහම්පති බ්‍රහ්මතෙම මෙය කීය. මෙසේ කියා භාග්‍යවතුන් වහන්සේ වැඳ ප්‍රදක්ෂිණා කොට එහිම අතුරුදහන් විය.

10. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රාත්‍රිය ඉක්මුණු පසු භික්ෂූන්ට කථාකළ සේක. "මහණෙනි, මේ රාත්‍රියේ සහම්පති බ්‍රහ්මතෙම රෑ පෙරයම ඉකුත්කල සියලු ජේතවනය ශරීර ආලෝකයෙන් බබුළුවා මම යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ මා වැඳ එකත්පස්ව සිටියේය. මහණෙනි, එකත්පස්ව සිටි බ්‍රහ්මතෙම මට මෙය කීයඃ 'ස්වාමීනි, කෝකාලික භික්ෂුතෙම මැරුණේය. ස්වාමීනි මැරී කෝකාලික භික්ෂුතෙම සැරියුත් මුගලන් දෙතෙරුන් කෙරෙහි වෛර බැඳ පදුම නිරයට උත්පත්තිය වශයෙන් පැමිණියේය.' මහණෙනි, සහම්පති

බ්‍රහ්මතෙම මෙය කීය. මෙය කියා මා වැඳ ප්‍රදක්ෂිණාකොට එහිම අතුරුදහන් විය.”

11. මෙසේ කීකල එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. “ස්වාමීනි, පදුම නිරයෙහි ආයුෂ කොපමණ දිගද?” “මහණෙනි, පදුම නිරයෙහි ආයුෂ ප්‍රමාණය දිග්මය. වර්ෂ මෙපමණකැයි හෝ ශත වර්ෂ මෙපමණකැයි හෝ සහස්‍ර වර්ෂ මෙපමණකැයි හෝ සතසහස්‍ර වර්ෂ මෙපමණකැයි හෝ සංඛ්‍යා කිරීමට පහසු නොවේ.”

12. “ස්වාමීනි, උපමා කළ හැකිද?”

13. “හැකිය මහණෙනි”යි භාග්‍යවතුන් වහන්සේ වදාළහ. “මහණෙනි, යම්සේ කොසොල් රට සංඛ්‍යායෙන් වීසතිඛාරිකයෙක් (දෝන තුන්සිය විස්සක්) ඇති තල කරත්තයක් වේ නම් එයින් පුරුෂයෙක් වර්ෂ සියයක් හෝ දාහක් ඇවෑමෙන් එක් තල ඇටයක් බැගින් ඉවත දමන්නේ නම් මහණෙනි, ඒ කොසොල් රට සංඛ්‍යායෙන් වීසතිඛාරිකයක් ඇති තලකරත්තය ඉතා ඉක්මනින් මේ අයුරින් ගෙවීමෙන් අවසානයට යන්නේය, එහෙත් එතරම් ඉක්මණින් එක අර්බුද නරකයෙක ආයුෂ නොගෙවෙන්නේමය. මහණෙනි, අර්බුද නරකයට අයත් කාල ප්‍රමාණයෙන් විසි ගුණයෙන් නිරබ්බුද නරකයෙහි එක් කාලයෙකි. මහණෙනි, නිරබ්බුද නරක ප්‍රමාණයෙන් විසි ගුණයෙක් අබබ නරකයෙහි එක් කාලයෙකි. මහණෙනි අබබ නරක ප්‍රමාණයෙන් විසි ගුණයෙක් එක් අටට නරකයට අයත් කාලයෙකි. මහණෙනි, අටට නරක ප්‍රමාණයෙන් විසි ගුණයෙක් එක් අහහ නරකයට අයත් කාලයකි. මහණෙනි, අහහ නරක ප්‍රමාණයෙන් විසි ගුණයෙක් එක් කුමුදු නරකයකට අයත් කාලයෙකි. මහණෙනි, කුමුදු නරක ප්‍රමාණයෙන් විසි ගුණයෙක් එක් සෝගන්ධික කාලයෙකි. මහණෙනි, සෝගන්ධික නරක ප්‍රමාණයෙන් විංශති ගුණයෙක් එක් උප්පල නරකයට අයත් කාලයෙකි. මහණෙනි, උප්පල නරක ප්‍රමාණයෙන් විසි ගුණයෙක් එක පුණ්ඩරීක නරකයට අයත් කාලයෙකි මහණෙනි, පුණ්ඩරීක නරක ප්‍රමාණයෙන් විසි ගුණයෙක් එක් පදුම නරකයට අයත්

කාලයෙකි. මහණෙනි, කෝකාලික භික්ෂුව සැරියුත් මුගලන් දෙතෙරුන් කෙරෙහි වෛර බැඳ උපන්නේ පදුම නිරයෙහිය.”

14. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. සුගතවූ ශාස්තෲන්වහන්සේ මෙය වදාරා ඉක්බිතිව මෙසේද වදාළ සේක:

“(මෙලොව උපන් තැනැත්තාගේ මුඛයෙහි කෙටේරියක් ඇත්තේය. නපුරු වචන කියන අන්ධබාල දුර්ජන තෙම ඒ කෙටේරියෙන් තමාම වනසයි.

“යමෙක් නින්දා කටයුත්තාට ප්‍රශංසාද, ප්‍රශංසා කටයුත්තාට නින්දා හෝ කෙරේද, හෙතෙම මුඛයෙන් අපරාධ රැස්කර ගනී. ඒ අපරාධ කරණකොට සුවයක් නම් නොවිඳී.

“යම් වස්තු අපරාධයෙක් වේද, තමනුත් සමග ස්වකීය සියලු දේ සම්බන්ධ ඒ අපරාධය ස්වල්පයි. යම් කිසිවෙක් යහපත්ව ගිය පුද්ගලයන් රහතුන් කෙරෙහි සිත දූෂ්‍ය කරන්නේද, ඒ වනාහි (ඊට වඩා) ඉතා විශාලවූ අපරාධයයි.

“ලාමකවූ වචනයෙන්ද, සිතෙන්ද ආර්‍ය්‍යයන්ට ගරහන පුද්ගල තෙම යම් නරකයකට උප්පත්ති වශයෙන් පැමිණේද, (එහි ආයුෂ) නිරබ්බුදයන් සිය දහසෙක් හා (නිරබ්බුද) සතිසෙක්ද අර්බුද පසෙක්ද වේ.”

ප්‍රථම වර්ගයයි.

---

## 11. පරිනිර්වාණ වර්ගය.

### සනංකුමාර (හෙවත් බ්‍රහ්මාසනා) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සප්පිනී (නදී) තෙර වසන සේක.

2. ඉක්බිති සනංකුමාර බ්‍රහ්මතෙම රෑ පෙරයම ඉක්මුණු කල්හි සියලු සප්පිනී (නදී) තීරය තමාගේ ශරීර ආලෝකයෙන්

බබුළුවා භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක සිටියේය.

3. එකත්පසෙක සිටි සනංකුමාර බ්‍රහ්මයා වනාහි භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ ගාථාව කීය:

"මිනිසුන් අතුරෙහි යම් ජනකෙනෙක් වංශය ගැන සලකන්නහුද, (ඔවුනතුරෙන්) ක්ෂත්‍රිය තෙම ශ්‍රෙෂ්ඨයි. (යම් කිසිවෙක්) ත්‍රිවිද්‍යාවෙන් හා (පසළොස්) චරණ ධර්මයන්ගෙන් යුක්තවේ නම් ඒ තෙම දිව්‍ය මනුෂ්‍යයන් අතුරෙන් ශ්‍රෙෂ්ඨයි."

4. සනංකුමාර බ්‍රහ්මයා මෙය කීය. ශාස්තෘන් වහන්සේ එකඟවූසේක. ඉක්බිතිව සනංකුමාර බ්‍රහ්මයා 'ශාස්තෘන් වහන්සේ මා හා එකඟවූ සේකැ'යි (සිතා) භාග්‍යවතුන් වහන්සේ වැඳ ප්‍රදක්ෂිණා කොට එහිම අතුරුදහන් විය.

---

## 2. දේවදත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ දෙව්දත් තෙර සංඝභේදය කොට ගයා සීසයට ගිය නොබෝ කල්හි රජගහ නුවර ගිජුකුළුපව්වෙහි වැඩ වසන සේක.

2. ඉක්බිති සහම්පති බ්‍රහ්මයා මධ්‍යම රාත්‍රිය ඉක්මුණු කල බබළන ශරීර වර්ණ ඇත්තේ සියලු ගිජුකුළුපව්ව බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය.

3. එකත්පසෙක හුන් සහම්පති බ්‍රහ්මයා දෙව්දතුන් ගැන භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය:

"යම්සේ ඵලයතෙම ඒකාන්තයෙන් කෙසෙල් ගස නසාද, ඵලය හුණ ගස නසයිද, ඵලය බට ගස නසයිද, දරුගැබ අශ්වතරිය (කොටලුට දාව වෙළඹ කුස උපන්නිය)

යම්සේ නසන්නේද, (එසේම) සත්කාරය තෙම අධම පුරුෂයා නසයි.”

---

## 3. අන්ධකවින්ද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ මගධරට අන්ධකවින්දගම වැඩවසන සේක.

2. එකල වනාහි භාග්‍යවතුන් වහන්සේ ඝනාන්ධකාරයෙන් අඳුරුවූ රාත්‍රියෙක එළිමහනෙහි හුන්සේක. වැස්සද පොද එක දෙක වැටුනේය.

3. ඉක්බිති සහම්පති බ්‍රහ්මයා මධ්‍යම රාත්‍රිය ඉකුත්වූ කල බබළන ශරීර වර්ණ ඇත්තේ සියලු අන්ධකවින්දගම බබුළුවා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය.

4. එකත්පසෙක සිටි සහම්පති බ්‍රහ්මයා භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මේ ගාථාවන් කීයඃ

(“මනුෂ්‍යාවාසයෙන් දුර පිහිටි සේනාසනයන් සේවනය කරන්නේය) සංයෝජනයන්ගෙන් මිදීම පිණිස හැසිරෙන්නේය. ඒ සෙනසුන් ප්‍රියකළ නොහැකි නම් ආරක්ෂා සහිත ආත්මයක් ඇතිව සිහි ඇතිව සංඝයා මධ්‍යයෙහි වාසය කරන්නේය.

“දමනය කරනලද ඉන්ද්‍රිය ඇත්තාවූ, ප්‍රඥාවත්වූ, ස්මෘතිමත්වූ, කුලයෙන් කුලයට පිඬු පිණිස හැසිරෙන්නේ, (මනුෂ්‍යාවාසයෙන් දුර පිහිටි) වනසෙනසුන් සේවනය කරන්නේය. හෙතෙම සංසාර භයෙන් මිදුනෙක්ව නිර්වානයෙහි නැමුණෙක්ව වාසය කරන්නේය.

“යම් තැනක බියජනක අරමුණු වෙත්ද, දීර්ඝ ජාතික සර්පාදීහු වෙත්ද, විදුලිය පවතීද, මේඝය ගර්ජනය කෙරේද, ඒ ස්ථානයෙහි (යෝගාවචර) මහණ තෙම (භාග්‍යවතුන්

වහන්සේ) ඝනාන්ධකාරයෙන් අඳුරුවූ රාත්‍රියෙහි පහවූ භය ඇතිව හුන්නේය.

"මේ කාරණය වනාහි මා විසින් ඒකාන්තයෙන් දක්නා ලද්දේය. මම මේ කාරණය ප්‍රත්‍යක්ෂ වශයෙන් දැනගෙනම කියමි. එක් ධර්මදේශනාවෙක්හි මාරයා පරදවා සිටින්නාවූ රහතන්වහන්සේලා දහසක් වෙයි.

"බොහොසේ ශෛක්ෂයෝ (රහත් නොවූ ආර්‍ය්‍යයෝ) පන්සියයක්ද, (එක්සිය දසදෙනෙක්) ද වෙති. මේ සියල්ලෝම ආර්‍ය්‍යමාර්ගයට පැමිණියාහු නිරයාදියට නොපැමිණෙන්නාහු වෙති.

"තවද මේ (හැර) අන්‍ය ප්‍රජාතොමෝ පුණ්‍යයට හිමියයි මාගේ කල්පනාවයි. ඔවුන් මෙපමණය කියා ගනින්නට නොහැක්කෙමි." (ගණන වැරදීමෙන්) මෘෂාවාදයට බිය වෙමි."

---

## 4. අරුණවතී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක.

2. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි,'යි භික්ෂූන්ට කථා කළසේක.

3. 'ස්වාමීනි'යි ඒ භික්ෂූහු භාග්‍යවතුන්ට උත්තර දුන්හ.

4. භාග්‍යවතුන් වහන්සේ මෙය කීය. "මහණෙනි, පෙරවූ දෙයක් කියමි. අරුණවා නම් රජෙක් විය. මහණෙනි, අරුණවා රජහට අරුණවතී නම් රාජධානියෙක් විය. මහණෙනි, අරුණවතී රාජධානිය ඇසුරු කොට සිඛී නම් භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ වුසූසේක.

5. "මහණෙනි, සිඛී නම් භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට අභිභූ, සම්භව නම් අග්‍රවූ, උතුම්වූ ශ්‍රාවක දෙදෙනෙක් විය

6. "මහණෙනි, එකල්හි වනාහි සිඛී නම්වූ භාග්‍යවත්වූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ අභිභූ භික්ෂුවට (මෙසේ) වදාළ සේක. 'බ්‍රාහ්මණය, බත් වේලාව පැමිණෙන තුරු කිසියම් බඹලොවකට පැමිණෙමු.'

7. "මහණෙනි, 'එසේය, ස්වාමීනි'යි අභිභූ භික්ෂුතෙම සිඛී භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට උත්තර දුන්නේය.

8. "මහණෙනි, ඉක්බිති ඒ සිඛී නම් භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේත් අභිභූ භික්ෂුවත් ශක්තිමත් පුරුෂයෙක් නැවූ අත දික්කරන්නේ හෝ දික් කළ අත නවන්නේ හෝ යම්සේද එසේ අරුණවතී රාජධානියෙන් අතුරුදහන්ව ඒ බඹලෙව්හි පහළවූහ.

9. "මහණෙනි, ඉක්බිති අර්හත් සම්‍යක් සම්බුද්ධ සිඛී භාග්‍යවතුන් වහන්සේ අභිභූ භික්ෂුවට (මෙසේ) වදාළ සේක. 'බ්‍රාහ්මණය, බ්‍රහ්මයාටද, බ්‍රහ්ම පිරිසටද, බ්‍රහ්ම අතවැසියන්ටද (සුදුසු) කථාවක් තට වැටහේවා. (කථාවක් කෙරේවා.")

10. "මහණෙනි, 'එසේය, ස්වාමීනි'යි අභිභූ භික්ෂුතෙම අර්හත් සම්‍යක් සම්බුද්ධවූ සිඛී භාග්‍යවතුන් වහන්සේට උත්තරදී බ්‍රහ්මයාද, බ්‍රහ්ම පිරිසද, බ්‍රහ්ම අතවැසියන්ටද, ධර්ම කථාවෙන් අවවාද කෙළේය, සමාදන් කරවීය, උත්සාහ වර්ධනය කර වීය, සතුටු කර වීය.

11. "මහණෙනි, එකල වනාහි බ්‍රහ්මතෙමද, බ්‍රහ්ම පිරිසද, බ්‍රහ්ම අතවැසියෝද, (ඒ කථාව) ලාමක කොට සිතත්, ගරහත්, එහි දොස් පහළ කෙරෙත්. 'බලව ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයක හැටි, ඒකාන්තයෙන් අද්භූතයක හැටි. ශාස්තෲන්වහන්සේ හමුයෙහි වූකලී ශ්‍රාවකයෙක් තෙම කෙසේ නම් දහම් දෙසන්නේද?' (කියායි).

12. "මහණෙනි, ඉක්බිති වනාහි අර්හත් සම්‍යක් සම්බුද්ධ සිඛී භාග්‍යවතුන් වහන්සේ අභිභූ භික්ෂුවට මෙසේ වදාළසේක. 'බ්‍රාහ්මණය, බ්‍රහ්ම තෙමේද, බ්‍රහ්ම පිරිසද, බ්‍රහ්ම අතවැසියෝද, (තොපගේ කථාව) ලාමක කොට සිතත්, ගරහත්, එහි දොස් පහළ කෙරෙත්. ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයක හැටි, ඒකාන්තයෙන් අද්භූතයක හැටි! ශාස්තෲන් වහන්සේ හමුයෙහි ශ්‍රාවකයෙක් තෙම කෙසේ නම් ධර්මය දේශනා කරන්නේදැ'යි (කියායි.) එහෙයින් බ්‍රාහ්මණය, තෝ බොහෝ සෙයින් බ්‍රහ්මයාද, බ්‍රහ්ම පිරිසද, බ්‍රහ්ම අතවැසියන්ද සංවේග කරව'යි (වදාළසේක.)

13. "මහණෙනි, 'එසේය, ස්වාමීනි'යි අර්හත් සම්‍යක් සම්බුද්ධ සිඛී භාග්‍යවතුන් වහන්සේට අභිභූ භික්ෂුව උත්තරදී පෙණෙනු ලබන කයින්ද ධර්ම දේශනා කෙළේය. නො පෙනෙනු ලබන කයින්ද ධර්ම දේශනා කෙළේය. පෙණෙනු ලබන යටි භාගය ඇති ශරීරයේ කොටසකින්ද, නොපෙනෙනු ලබන මතු භාගය ඇති ශරීරයේ කොටසකින්ද ධර්ම දේශනා කෙළේය. පෙනෙනු ලබන මතු ශරීරයේ කොටසකින්ද නොපෙනෙනු ලබන යට ශරීරයේ කොටසකින්ද ධර්ම දේශනා කෙළේය.

14. "මහණෙනි, එවිට වනාහි බ්‍රහ්මතෙමේද, බ්‍රහ්ම පිරිසද, බ්‍රහ්ම අතවැසියෝද ආශ්චර්‍ය්‍ය අද්භූත සිතැත්තාහු 'පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයි, පින්වත, ඒකාන්තයෙන් අද්භූතයි, ශ්‍රමණයාගේ මහ ඍද්ධිභාවය හා මහානුභාවය'යි (සිතූහ)

15. "මහණෙනි, ඉක්බිති අභිභූ භික්ෂුව අර්හත් සම්‍යක් සම්බුද්ධ සිඛී භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. 'ස්වාමීනි, භික්ෂු සංඝයා මැද (මවිසින්) මෙබඳු වචනයක් කියන ලද බව ප්‍රකාශ කරමි. (කෙබඳුදයත්) 'ඇවැත්නි, මම බඹ ලොව සිටියෙම් සහශ්‍රී ලෝකධාතුව වචනයෙන් හඟවන්නට හැක්කේ වෙමි'යි (කියායි.)

16. "බ්‍රාහ්මණය, බඹලොව සිටියෙක් යම් සහශ්‍රී ලෝකධාතුවක් වචනයෙන් හඟවන්නෙහි නම් බ්‍රාහ්මණය, මේ එයට සුදුසු කාලයයි. බ්‍රාහ්මණය, මේ එයට සුදුසු කාලයයි.'

17. මහණෙනි, 'එසේය, ස්වාමීනි'යි අභිභූ භික්ෂුතෙම අර්හත් සම්‍යක් සම්බුද්ධ සිබී භාග්‍යවතුන් වහන්සේට උත්තර දී බඹලොව සිටියේ මේ ගාථාවන් කීයෙ:

"බුදු සසුනෙහි ආරම්භ වීර්‍ය්‍යය කරව්, නිෂ්ක්‍රමණ වීර්‍ය්‍යය කරව්, පරාක්‍රම වීර්‍ය්‍යය කරව්. ඇතෙක් බටයෙන් කළ ගෙයක් වනසන්නාක් මෙන් මරසෙනග (ක්ලේශ සේනාව) නසව්.

"යමෙක් මේ ධර්ම විනයයෙහි අප්‍රමත්තව (පමානොව) වාසය කරන්නේද, ඔහු ඉපදීමද, සංසාරයද හැර, සියලු දුක් කෙළවර කරන්නේය.'

18. "මහණෙනි, ඉක්බිති අර්හත් සම්‍යක් සම්බුද්ධ සිඛී භාග්‍යවතුන් වහන්සේද, අභිභූ භික්ෂුතෙමද වනාහි බ්‍රහ්මයාද, බ්‍රහ්ම පිරිසද, බ්‍රහ්ම අතවැසියන්ද, සංවේගකොට ශක්තිමත් පුරුෂයකු නැවූ අත දික් කරන්නේ හෝ දික් කළ අත නවන්නේ හෝ යම්සේද, එසේ ඒ බඹ ලෙව්හි අතුරුදහන්වූ සේක් අරුණවතී රාජධානියෙහි පහළවූසේක.

19. "මහණෙනි, ඉක්බිතිව අර්හත් සම්‍යක් සම්බුද්ධ සිඛී භාග්‍යවතුන් වහන්සේ (මෙසේ) භික්ෂූන්ට වදාළසේක. 'මහණෙනි, බඹ ලොව සිට කියනු ලබන අභිභූ භික්ෂුවගේ ගාථාවන් තෙපි ඇසුහුද?'

"ස්වාමීනි, අපි බඹ ලොව සිට කියනු ලබන අභිභූ භික්ෂුවගේ ගාථාවන් ඇසුවෙමු."

"මහණෙනි, තෙපි බඹලොව සිට කියනු ලබන අභිභූ භික්ෂුවගේ ගාථාවන් කෙබඳු ලෙසින් ඇසූහුද?"

"ස්වාමිනි, අපි බඹලොව සිට කියනු ලබන අභිභූ භික්ෂුවගේ ගාථාවන් මෙසේ ඇසුවෙමු

'බුදුසසුනෙහි ආරම්භ වීර්‍ය්‍යය කරව්, නිෂ්ක්‍රමණ වීර්‍ය්‍යය කරව්, පරාක්‍රම වීර්‍ය්‍ය කරව්. ඇතෙක් බටයෙන් කල ගෙයක් වනසන්නාක් මෙන් මරසෙනඟ (ක්ලේශ සේනාව) නසව්.

'යමෙක් මේ ධර්ම විනයයෙහි අප්‍රමත්තව (පමානොව) වාසය කරන්නේද, ඔහු ඉපදීමද, සංසාරයද හැර සියලු දුක් කෙළවර කරන්නේය (කියායි.)'

**20.** "ස්වාමීනි, බඹලොව සිට කියනු ලබන අභිභූ භික්ෂුවගේ ගාථාවන් අපි මෙසේ වනාහි ඇසූම්හ."

"මහණෙනි, මැනවි මැනවි, මහණෙනි. තෙපි බඹලොව සිට කියනු ලබන අභිභූ භික්ෂුවගේ ගාථාවන් මනාකොට ඇසුවහුය."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇති භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට සතුටු වූහ.

---

## 5. පරිනිබ්බාන සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කුසිනාරා නුවර මල්ල රජුන්ගේ උපවත්තන නම් සල්වෙනෙහි සල්ගස් දෙක අතරෙහි පිරිනිවන් කාලයෙහි වාසය කරනසේක.

**2.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට (මෙසේ) වදාළසේක. "මහණෙනි, දැන් වනාහි තොප අමතමි. සියලු සංස්කාර ධර්මයෝ නැසෙන ස්වභාව ඇත්තෝය. අප්‍රමාදයෙන් ත්‍රිශික්ෂාව සම්පාදනය කරව්." මේ තථාගතයන්ගේ අන්තිම වචනයයි.

**3.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ප්‍රථමධ්‍යානයට සමවැදුණුසේක. ප්‍රථමධ්‍යානයෙන් නැඟිට ද්විතීයධ්‍යානයට සමවැදුණුසේක. ද්විතීයධ්‍යානයෙන් නැඟිට තෘතීයධ්‍යානයට සමවැදුණුසේක. තෘතීයධ්‍යානයෙන් නැඟිට චතුර්ථධ්‍යානයට සමවැදුණුසේක. චතුර්ථධ්‍යානයෙන් නැඟිට ආකාසානඤ්චායතනධ්‍යානයට සමවැදුණුසේක. ආකාසානඤ්චායතනධ්‍යානයෙන් නැඟිට විඤ්ඤානඤ්චායතන ධ්‍යානයට සමවැදුණුසේක. විඤ්ඤාණඤ්චායතනයෙන්

නැඟිට ආකිඤ්චඤ්ඤායතනධ්‍යානයට සමවැදුණුසේක. ආකිඤ්චඤ්ඤායතනයෙන් නැඟිට නේවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවැදුණුසේක. නේවසඤ්ඤානාසඤ්ඤායතනයෙන් නැඟිට සඤ්ඤාවෙදයිත නිරොධසමාපත්තියට සමවැදුණුසේක.

4. සඤ්ඤාවෙදයිත නිරොධසමාපත්තියෙන් නැඟී නේවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියට සමවැදුණුසේක. නේවසඤ්ඤානාසඤ්ඤායතනයෙන් නැඟී ආකිඤ්චඤ්ඤායතනයට සමවැදුණුසේක. ආකිඤ්චඤ්ඤායතනයෙන් නැඟී විඤ්ඤාණඤ්චායතනයට සමවැදුණුසේක. විඤ්ඤාණඤ්චායතනයෙන් නැඟී ආකාසානඤ්චායතනයට සමවැදුණුසේක. ආකාසානඤ්චායතනයෙන් නැඟී චතුර්ථධ්‍යානයට සමවැදුණු සේක. චතුර්ථධ්‍යානයෙන් නැඟිට තෘතීයධ්‍යානයට සමවැදුණු සේක. තෘතීයධ්‍යානයෙන් නැඟිට ද්විතීයධ්‍යානයට සමවැදුණු සේක. ද්විතීයධ්‍යානයෙන් නැඟිට ප්‍රථමධ්‍යානයට සමවැදුණු සේක. ප්‍රථමධ්‍යානයෙන් නැඟිට ද්විතීයධ්‍යානයට සමවැදුණු සේක. ද්විතීයධ්‍යානයෙන් නැඟිට තෘතීයධ්‍යානයට සමවැදුණු සේක. තෘතීයධ්‍යානයෙන් නැඟිට චතුර්ථධ්‍යානයට සමවැදුණු සේක. චතුර්ථධ්‍යානයෙන් නැඟිට ධ්‍යානයෙන් නැඟිටීම සමගම භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑසේක.

5. භාග්‍යවතුන් වහන්සේ පිරිනිවී කල්හි පිරිනිවීමත් සමගම සහම්පතී බඹතෙම මේ ගාථාව කීය.

"ලොව හැම සත්හුම සිරුර ඉවත දමන්නාහුය. ලොව සමකළ නොහැකිවූ, තථාගතවූ, (දශවිධ ඥාන) බලයට පැමිණි, සියලු ධර්මයන් ඉතිරිනොකොට දත්, මෙබඳු ශාස්තෲන්වහන්සේ පවා යම්සේ පිරිනිවිසේක්ද. (එමෙනි.)

6. භාග්‍යවතුන් වහන්සේ පිරිනිවී කල පිරිනිවීමත් සමගම සක්දෙවිඳු මේ ගාථාව කීය.

"සංස්කාරයෝ ඉපදීම නැසීම ස්වභාව කොට ඇත්තාහු ඒකාන්තයෙන් අනිත්‍යයහ. (ඔවුහු) ඉපිද නිරුද්ධ (විනාශ) වෙත්. ඒ සංස්කාරයන්ගේ සංසිඳීම සැපයි."

7. භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල පිරිනිවීමත් සමගම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම මේ ගාථාව කීයඃ

"සියලු උතුම් කරුණුවලින් යුක්තවූ, සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ පිරිනිවී කල (ඒ) පරිනිර්වාණය සමගම භය උපදවන කරුණු (පහළ) විය. එවිට ලොමුඩැහැගැනීම්ද වීය."

8. භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල පිරිනිවීමත් සමගම අනුරුද්ධ ස්ථවිරතෙම මේ ගාථාවන් කීයඃ

"සමාහිත සිත් ඇති, තාදී ගුණවත්, බුදුරජාණන් වහන්සේගේ ආශ්වාස ප්‍රශ්වාසය නොවූයේය (නතරවිය.) තණ්හාව නැත්තාවූ, පසැස් ඇත්තාවූ, සම්බුද්ධයන් වහන්සේ අනුපදිශේෂ නිර්වාණය නිසා ස්කන්ධපරිනිර්වාණයෙන් පිරිනිවිසේක.

"නොහැකුළුණු සිතින් යුක්තව වේදනාව ඉවසූ සේක. චිත්තය සම්බන්ධවූ මිදීම ප්‍රදීපයේ නිවීම මෙන්වීය."

දෙවෙනි වර්ගයයි.

---

# 7. බ්‍රාහ්මණ සංයුත්තය.

## i අරහන්ත වර්ගය.

### 1 ධනඤ්ජානි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දක නිවාප (නම්වූ) වෙළුවනයෙහි වැඩ වසනසේක.

2. එකල වනාහි භාරද්වාජගෝත්‍රයෙහිවූ එක්තරා බමුණකුගේ ධනඤ්ජානී නම්වූ බැමිණිය බුදුන් කෙරෙහිද ධර්මය කෙරෙහිද සංඝයා කෙරෙහිද අතිශයින් සතුටු වූවාය.

3. ඉතිබිති ධනඤ්ජානී බැමිණිය භාරද්වාජගෝත්‍රයෙහිවූ බමුණාහට බත් ලඟට පමුණු වන්නී "භාග්‍යවත්වූ අර්හත්වූ ඒ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේට නමස්කාරය වේවා" "භාග්‍යවත්වූ අර්හත්වූ ඒ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේට නමස්කාරය වේවා" "භාග්‍යවත්වූ අර්හත්වූ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේට නමස්කාරය වේවා" තුන් වරක් වැරෙන් ප්‍රීති වාක්‍ය කීවාය.

4. මෙසේ කී කල්හි භාරද්වාජගෝත්‍රයෙහිවූ බමුණුතෙම ධනඤ්ජානි බැමිණියට මෙය කීය. "මේ වසලිය මෙපරිද්දෙන් වනාහි එතැන මෙතැන ඒ මුඩු මහණහුගේ ගුණ කියයි. වසලිය, දැන් මම තීගේ ඒ ශාස්තෘවරයාට වාදයක් ආරෝපනය කරන්නෙමි."

5. "බ්‍රාහ්මණය, දෙවියන් සහිත, මරුන් සහිත, බ්‍රහ්මුන් සහිත, මහණ බමුණන් සහිත, දෙව් මිනිසුන් සහිත ප්‍රජාව කෙරෙහි යමෙක් ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේට වාදාරොපනය කරන්නේ නම්, එවැන්නකු මම නොදකිමි. එසේවුව, බමුණ, තෝ යව, ගොස් දැන ගනුව"යි (ඕතොම කීවාය.)

6. ඉක්බිති භාරද්වාජගෝත්‍රික බමුණුතෙම කිපීයේ, නොසතුටු සිත් ඇත්තේ, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුසාමීචි කෙළේය සතුටුවිය යුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පසෙක හුන්නේය.

7. එකත්පසෙක හුන් භාරද්වාජගෝත්‍රික බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට ගාථායෙකින් (මෙසේ) කීය.

> "ගෞතමයනි, කුමක් නසා සුවසේ සයනය කෙරේද? කුමක් නසා ශෝක නොකෙරේද? කිනම් එකම ධර්මයක්හුගේ විනාශය නුඹ රුස්නහුද?"

> 8. "බමුණ, ක්‍රෝධය නසා සුවසේ සයනය කෙරෙයි. ක්‍රෝධය නසා ශෝක නොකරෙයි. විෂයට (දුක් විපාකයට)

මුල්වූ මිහිරි අග ඇති ක්‍රෝධය නැසීම (බුද්ධාදී) ආය්‍ය්‍යීයෝ ප්‍රශංසා කරත් ක්‍රෝධය, නසා ඒකාන්තයෙන් ශෝක නොකෙරේ.”

**9.** මෙසේ කීකල භාරද්වාජගෝත්‍රික බමුණුතෙම භාග්‍යවතුන්වහන්සේට මෙය කීය. “පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිමුව කරන ලද්දක් හෝ උඩුමුව කරන්නේද, වැසුන දෙයක් හෝ විවෘත කරන්නේද, මංමුළාවූවකුට හෝ මාර්ගය කියන්නේද, ‘ඇස් ඇත්තෝ රූප දකිත්වා’යි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේද, එසේම පින්වත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය ප්‍රකාශ කරන ලද්දේය. ඒ මම භාග්‍යවත්වූ ගෞතමයන් වහන්සේද, ධර්මයද, භික්ෂු සංඝයාද පිහිටකොට යමි. මම පින්වත් ගෞතමයන් වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලබන්නෙමි උපසම්පදාව ලබන්නෙමි (නම් යෙහෙකැ)”යි කීය.

**10.** ඉක්බිති භාරද්වාජගෝත්‍රික බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිද්ද හා උපසම්පදාව ලදී. උපසපන්වී නොබෝ කල් ඇති ආයුෂ්මත් භාරද්වාජ භික්ෂුව වනාහි තනිවූයේ, වෙන්වූයේ, පමා නොවූයේ කෙලෙස් තවන වීය්‍ය්‍යීය ඇත්තේ, නිවන් පිණිස මෙහෙයූ සිත් ඇත්තේ, නොබෝ කලෙකින්ම, කුලපුත්‍රයෝ යමක් පිණිස ගිහි ගෙයින් නික්ම මනාව ශාසනයට පැවිදිවීම් වශයෙන් පැමිණෙත්ද, ඒ අනුත්තර බ්‍රහ්මචය්‍ය්‍යීයාගේ කෙළවරවූ නිවන මේ ආත්මයෙහිම තෙමේ විශෙෂ ඥානයෙන් අවබෝධ කොට, එයට පැමිණ විසූයේය. ‘ජාතිය ක්ෂයවූවා, බඹසර වැස නිමවන ලදී. සියලු මාර්ග කෘත්‍යය කරන ලදී. මෙයින් අන් ආත්මයෙක් නැතැ’යි (හෙතෙම) නිසැකව දත්තේය. ආයුෂ්මත් භාරද්වාජ භික්ෂුතෙම රහතන් අතුරෙන් එක්තරා කෙනෙක් විය.

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 2. අක්කෝස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දකනිවාප (නම්වූ) වෙළුවනයෙහි වසන සේක.

2. අක්කෝසකභාරද්වාජ බමුණුතෙම (මෙපුවත) ඇසීය. "භාරද්වාජගෝත්‍රික බමුණුතෙම ගිහිගෙයින් නික්ම ශ්‍රමණ ගෞතමයන්ගේ සමීපයෙහි ශාසනයෙහි පැවිදිවේය (කියායි.)

3. (ඔහු) එයින් කිපීයේ, නොසතුටු සිතැත්තේ, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ අසභ්‍ය යහපත් නුවූ පරුෂ බසින් අපහාස කරයි. නින්දා කරයි.

4. මෙසේ බැණ වැදුනු කල්හි භාග්‍යවතුන් වහන්සේ අක්කෝසකභාරද්වාජ බමුණාහට මෙය කීය: "බමුණ, මේ කිමැයි හඟිහිද? තාගේ අසල්වැසිවූ, නෑ වූ, සහ ලේ නෑ වූ ආගන්තුකයෝ (තොප කරා) එන්නෝ වෙත්ද?"

5. "භවත් ගෞතමයනි, සමහර කලෙක මාගේ නෑ වූ සහ ලේ නෑවූ ආගන්තුකයෝ එන්නාහුය."

6. "බමුණ, මේ කුමකැයි හඟිහිද? ඔවුන්ට කෑ යුත්තක් හෝ බුදිය යුත්තක් හෝ රස බැලිය යුත්තක් හෝ දෙන්නෙහිද?"

7. "ගෞතමයිනි, මම සමහර කලෙක ඔවුන්ට කෑ යුත්තක් හෝ බුදිය යුත්තක් හෝ රස බැලිය යුත්තක් හෝ දෙමි."

8. "බමුණ, ඉදින් වනාහි ඔහු (ඒ) නොපිළිගනිත් නම් එය කවරකුහට වේද?"

9. "ගෞතමයිනි, ඉදින් ඔහු (ඒ) නොපිළිගනිත් නම් එය අපට ම වෙයි."

10. "බමුණ, එපරිද්දෙන්ම නුඹ වනාහි ආක්‍රෝශ නොකරන අපට ආක්‍රෝශ කෙළෙහිද, පරුෂ වචන නොකියන අපට පරුෂ වචන කීයෙහිද, නොබණින අපට බැන්නෙහිද, ඒ ආක්‍රෝශාදිය අපි නොපිළිගනිමු. බමුණ, ඒ (සියල්ල) තටම වෙයි. බමුණ,

යමෙක් වනාහි ආක්‍රෝශ කරන්නහුට පෙරළා ආක්‍රෝශ කරයිද, පරුෂ වචන කියන්නහුට පෙරළා පරුෂ වචන කියයිද, බණින්නහුට පෙරළා බණීද, බමුණ, එබඳු තැනැත්තේ එකතුව වළඳන්නේය, කළහු අනුව කරන්නේයයි කියනු ලැබේ. තා බිණූ ඒ ආක්‍රෝශාදිය අපි තා හා (හවුලේ) නොබුදිමු. තා අනුව නොකරමු. බමුණ, මෙය (තා කළ දේ) තටම වෙයි. බමුණ, මෙය (තා කළ දේ) තටම වෙයි."

11. "පින්වත, භවත් ගෞතමයන් (පිළිබඳව) රජු සහිත පිරිස් මෙසේ සලකති. 'ශ්‍රමණ ගෞතමයෝ රහතෙක' එසේ වුව, පින්වත් ගෞතමයෝ කිපුනාහ."

12. "දැමුනාවූ, සමජීවිවූ, සම්‍යක් ප්‍රඥාවෙන් දැන අර්හත් ඵල විමුක්ති වශයෙන් මිදුනු, ශාන්තවූ ශ්‍රෙෂ්ඨත්වයට පැමිණි, ක්‍රෝධ නැති රහතන් වහන්සේට ක්‍රෝධයෙක් නම් කොයින්ද?

"යම් පුද්ගලයෙක් පළමු කිපියහුට පෙරළා කිපේද, ඒ ක්‍රෝධය කරණකොට ඒ පුද්ගලයාටම පව් වේ. පළමු කිපියහුට පෙරළා නොකිපෙන පුද්ගලයා දුකසේ දිනිය හැකි යුද්ධය ජයගනී."

"යම් පුද්ගලයෙක් කිපුණු අන්‍යයකු දැක සිහි ඇතිව ඉවසාද, එතෙම තමහටද, පරහටද යන දෙදෙනාටම යහපතක් සලසයි.

'තමාගේද අනුන්ගේද යන දෙදෙනාගේම ක්‍රොධ ව්‍යාධියට (ඉවසීම නමැති) පිළියම් කරන පුද්ගලයා බාලයෙකැයි ධර්මයට අදක්ෂවූ අන්ධ බාල පෘථග්ජනයෝ හඟිත්."

13. මෙසේ කී කල අක්කෝසකභාරද්වාජ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. "භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිමුව කරන ලද්දක් හෝ උඩුමුව කරන්නේද, වැසුන දෙයක් හෝ විවෘත කරන්නේද, මංමුළාවූවකුට හෝ මාර්ගය කියන්නේද, 'ඇස ඇත්තෝ රූප

දකිත්වා'යි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේද, එසේම පින්වත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය ප්‍රකාශ කරන ලද්දේය. මේ මම භාග්‍යවත් ගෞතමයන් වහන්සේද, ධර්මයද, සංඝයාද සමග පිහිටකොට යමි. භවත් ගෞතමයන් වෙතින් පැවිද්ද ලබන්නෙම් නම් උපසම්පදාවද ලබන්නෙම් නම් යෙහෙක."

14. අක්කෝසකභාරද්වාජ බමුණු තෙම භාග්‍යවතුන් වහන්සේ වෙතින් පැවිද්ද ලැබීය. උපසම්පදාවද ලැබීය. උපසම්පන්නවී නොබෝකල් ඇති ආයුෂ්මත් අක්කෝසකභාරද්වාජ තෙම තනිවූයේ, වෙන්වූයේ, පමා නොවූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, නිවන් පිණිස මෙහෙයූ සිතැත්තේ, යම් අර්ථයක් සඳහා කුලපුත්‍රයෝ ගිහිගෙන් නික්ම මනාව සස්නෙහි පැවිදි වෙත්ද, නොබෝ කලකින්ම ඒ නිරුත්තර බ්‍රහ්මචර්‍ය්‍යයාගේ කෙළවරවූ නිවණ මේ ආත්මයෙහිම තමා විශේෂ ඥානයෙන් අවබෝධ කොට, එයට පැමිණ විසීය. 'ජාතිය ක්ෂය වූවා, බඹසර වැස, නිමවනලදී, මාර්ග කෘත්‍යය කරනලදී, මෙයින් අන් ආත්මයක් නැතැ'යි හෙතෙම නිසැකව දත්තේය. ආයුෂ්මත් භාරද්වාජ භික්ෂුතෙම රහතන් අතුරෙන් එක්තරා කෙනෙක් විය.

---

## 3. අසුරින්ද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහිවූ කලන්දක නිවාප නම්වූ වෙළුවනාරාමයෙහි වැඩවසන සේක.

2. අසුරින්දකභාරද්වාජ බමුණු තෙම 'භාරද්වාජගෝත්‍රික බමුණෙක් ගිහිගෙන් නික්ම ශ්‍රමණ ගෞතමයන් සමීපයෙහි සසුන්හි පැවිදිවීය' යනු ඇසීය.

3. හෙතෙම කිපියේ, නොසතුටු වූයේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට අසභ්‍ය පරුෂ වචනවලින් නින්දා කරයි.

4. එසේ කී කල භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දවූ සේක.

5. ඉක්බිති අසුරින්ද්‍රකභාරද්වාජ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. "ශ්‍රමණය, දිනූයෙහිය, ශ්‍රමණය, දිනූයෙහිය" (කියායි).

6. "අන්ධබාල පෘථග්ජන තෙම පරුෂ වචන කියන්නේ ඒ තමාට ජයකැයි ඒකාන්තයෙන් හඟී. එහෙත් නුවණැත්තහුගේ යම් ඉවසීමෙක් වේනම් ඔහුටම ජයවේ.

"යමෙක් තෙම පළමු කිපියහුට පෙරළා කිපේ නම් ඒ කරණකොට ඒ පුද්ගලයාම පාපියෙක් වේ. පළමු කිපියහුට පෙරළා නොකිපෙන පුද්ගලතෙම දුකසේ දිනිය හැකි (ක්‍රෝධ) යුද්ධය දිනයි.

"යමෙක් තෙම අන්‍යයකු කිපෙනු දැක සිහියෙන් යුතුව ඉවසා නම් (ඒ පුද්ගල තෙම) තමාටද අනුන්ටද යන දෙදෙනාටම යහපතක් සලසයි.

"තමාගේද අනුන්ගේද යන දෙදෙනාගේම කෙලෙස් නමැති රෝගයට පිළියම් කරන ඒ පුද්ගලයා බාලයෙකැයි ධර්මයෙහි අදක්ෂවූ අන්ධබාල පෘථග්ජනයෝ හඟිත්."

7. බුදුන් මෙසේ කීසඳ අසුරින්ද්‍රකභාරද්වාජ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. "පින්වත් ගෞතමයාණන් වහන්ස, යම්සේ යටිමුව කරන ලද්දක් හෝ උඩුමුව කරන්නේද, වැසුන දෙයක් හෝ විවෘතකරන්නේද, මංමුළාවූවකුට හෝ මාර්ගය කියන්නේද, 'ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේද, එසේම පින්වත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය ප්‍රකාශ කරන ලද්දේය. මනාව අවබෝධ කෙළේය."

ඒ මම භාග්‍යවත්වූ ගෞතමයන් වහන්සේද, ධර්මයද, භික්ෂු සංඝයාද පිහිටකොට යමි. මම පින්වත් ගෞතමයන් වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලබන්නෙමි, උපසම්පදාව ලබන්නෙමි (නම් යෙහෙකැ)"යි කීය.

8. ඉක්බිති අසුරින්දකභාරද්වාජ බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිද්ද හා උපසම්පදාව ලදී. උපසපන්වී නොබෝ කල් ඇති ආයුෂ්මත් අසුරින්දකභාරද්වාජ භික්ෂුව වනාහි තනිවූයේ, වෙන්වූයේ, පමානොවූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, නිවන් පිණිස මෙහෙයූ සිත් ඇත්තේ, නොබෝ කලෙකින්ම, කුලපුත්‍රයෝ යමක් පිණිස ගිහි ගෙයින් නික්ම මනාව ශාසනයට පැවිදිවීම් වශයෙන් පැමිණෙත්ද, ඒ අනුත්තර බ්‍රහ්මචර්‍ය්‍යායාගේ කෙළවරවූ නිවන මේ ආත්මයෙහිම තෙමේ විශෙෂ ඥානයෙන් අවබෝධකොට, එයට පැමිණ විසුයේය. 'ජාතිය ක්ෂය වූවා, බඹසර වැස නිමවනලදී. සියලු මාර්ග කෘත්‍යය කරනලදී. මෙයින් අන් ආත්මයෙක් නැතැ'යි (හෙතෙම) නිසැකව දත්තේය.

9. ආයුෂ්මත් අසුරින්දකභාරද්වාජ තෙමේද රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් වීය.

---

## 4. බිලඞ්ගික සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර අසල කලන්දකනිවාප නම්වූ වෙළුවනයෙහි වැඩවසන සේක.

2. බිලඞ්ගිකභාරද්වාජ බමුණු තෙම 'භාරද්වාජගෝත්‍රික බමුණෙක් ගිහිගෙන් නික්ම ශ්‍රමණ ගෞතමයන් වෙත පැවිදි වීය,' යනු ඇසීය. හෙතෙම කිපී නොසතුටුවී භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ නිශ්ශබ්දව එකත්පසෙක සිටියේය.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බිලඞ්ගික නම්වූ භාරද්වාජ ගෝත්‍රික බමුණාගේ සිත්හි කල්පනාව ස්වකීය සිතින් දැන බිලඞ්ගිකභාරද්වාජ බමුණාට ගාථායෙන් මෙසේ වදාළසේක.

"යම් පුද්ගලයෙක් තෙම වරද නැතිවූ, පිරිසිදුවූ, කෙලෙස් නැතිවූ, පුරුෂයකුට අපරාධ කෙරේද, ඒ පාපය

උඩු සුළඟට දමනලද සියුම් ධූලි මෙන් ඒ අඥානයා කරාම ආපසු එයි.”

4. මෙසේ කීකල බිලඞ්ගිකභාරද්වාජ බමුණු තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. “පින්වත් ගෞතමයාණනි, ඉතා මැනවි. පින්වත් ගෞතමයාණනි, ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිමුව කරන ලද්දක් හෝ උඩුමුව කරන්නේද, වැසුන දෙයක් හෝ විවෘතකරන්නේද, මංමුළාවූවකුට හෝ මාර්ගය කියන්නේද, ‘ඇස් ඇත්තෝ රූප දකිත්වා’යි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේද, එසේම පින්වත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය ප්‍රකාශ කරන ලද්දේය. ඒ මම ධර්මයද, සංඝයාද සහිත භවත් ගෞතමයන් වහන්සේ සරණකොට යමි. පින්වත් ගෞතමයන් වහන්සේ වෙතින් පැවිද්ද හා උපසම්පත්තිය ලබන්නෙමි. බිලඞ්ගිකභාරද්වාජ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේ වෙතින් පැවිද්ද ලැබීය, උපසම්පදාවද ලැබීය. උපසපන්වී නොබෝකල් ඇති ආයුෂ්මත් බිලඞ්ගික භාරද්වාජ තෙම තනිවූයේ, වෙන්වූයේ, පමා නොවූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, නිවන් පිණිස මෙහෙයූ සිතැත්තේ, යම් අර්ථයක් සඳහා කුලපුත්‍රයෝ ගිහිගෙන් නික්ම මනාව සස්නෙහි පැවිදිවෙත්ද, නොබෝ කලකින්ම ඒ නිරුත්තරවූ බ්‍රහ්මචර්‍ය්‍යාව කෙළවරවූ නිවණ මේ ආත්මයෙහිම තෙමේම විශෙෂ ඥානයෙන් අවබෝධ කොට එයට පැමිණ විසීය. නැවත නැවත ඉපදීම ක්ෂයවිය. බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි වැස නිමවන ලදී. කළයුතු දේ කරන ලදී. මෙයින් අනික් ආත්මයෙක් නැතැ’යි (හෙතෙම) මනාව දත්තේය.

5. ආයුෂ්මත් බිලඞ්ගික භාරද්වාජ භික්ෂුවද රහතුන් අතුරෙහි එක්තරා කෙනෙක් විය.

---

## 5. අහිංසක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු

සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. ඉක්බිති අහිංසකභාරද්වාජ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ හා, සතුටු සාමීචි කථා කෙළේය. සතුටුවිය යුතුවූ, සිහිකටයුතුවූ කථා නිමවා එකත්පසෙක හුන්නේය.

3. එකත්පසෙක හුන් අහිංසකභාරද්වාජ බමුණු තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. "පින්වත් ගෞතමයන් වහන්ස, මම අහිංසක නමි. පින්වත් ගෞතමයන් වහන්ස, මම අහිංසක නමි."

> 4. "(ස්වකීය) නාමය යම්සේද එසේම වන්නෙහි නම් තොප අහිංසකම වෙහි. යමෙක් කයින්ද, බසින්ද, සිතින්ද, හිංසා නොකෙරේද, යමෙක් අන්‍යයකුත් නො වෙහෙසාද, හෙතෙම ඒකාන්තයෙන් අහිංසකයෙක් වේ."

5. මෙසේ කීකල අහිංසකභාරද්වාජ තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. "පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි." යම්සේ යටිමුව කරන ලද්දක් හෝ උඩුමුව කරන්නේද, වැසුන දෙයක් හෝ විවෘතකරන්නේද, මංමුළාවූවකුට හෝ මාර්ගය කියන්නේද, 'ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේද, එසේම පින්වත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය ප්‍රකාශ කරන ලද්දේය. දැනගත්තේය.

6. ඒ මම ධර්මයද, සංඝයාද සහිත භවත් ගෞතමයන් වහන්සේ සරණකොට යමි. පින්වත් ගෞතමයන් වහන්සේ වෙතින් පැවිද්ද හා උපසම්පත්තිය ලබන්නෙමි. අහිංසක භාරද්වාජ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේ වෙතින් පැවිද්ද ලැබීය, උපසම්පදාවද ලැබීය. උපසපන්වී නොබෝකල් ඇති ආයුෂ්මත් අහිංසකභාරද්වාජ තෙම තනිවූයේ, වෙන්වූයේ, පමා නොවූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, නිවන් පිණිස මෙහෙයූ සිතැත්තේ, යම් අර්ථයක් සඳහා කුලපුත්‍රයෝ ගිහි ගෙන්

නික්ම මනාව සස්නෙහි පැවිදිවෙත්ද, නොබෝ කලකින්ම ඒ නිරුත්තරවූ බ්‍රහ්මචය්‍ර්‍යාව කෙළවරවූ ඒ නිවණ මේ ආත්මයෙහිම තෙමේම විශෙෂ ඥානයෙන් අවබෝධ කොට එයට පැමිණ විසීය. නැවත නැවත ඉපදීම් ක්ෂයවිය. බ්‍රහ්මචය්‍ර්‍යාවෙහි වැස නිමවන ලදී. කළයුතු දේ කරනලදී. මෙයින් අනික් ආත්මයෙක් නැතැ'යි (හෙතෙම) මනාව දත්තේය.

7. ආයුෂ්මත් අහිංසකභාරද්වාජ භික්ෂුවද රහතුන් අතුරෙහි එක්තරා කෙනෙක් විය.

---

## 6. ජටා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක.

2. ඉක්බිති ජටාභාරද්වාජ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ හා සතුටුසාමීචි කථා කෙළේය. සතුටු විය යුතු කථා සිහි කටයුතු කථා කොට නිමවා එකත්පසෙක හුන්නේය.

3. එකත්පසෙක හුන් ජටාභාරද්වාජ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට ගාථාවක් කීයඃ

"ඇතුලතද අවුල් වෙයි. පිටතද අවුල් වෙයි. (සත්ත්වයා) අවුලෙන් වෙළන ලදී. ගෞතමයන්වහන්ස, එහෙයින් මේ කාරණය ඔබගෙන් විචාරමි. කවරෙක් මේ අවුල ලිහන්නේද?"

4. "උත්පත්තියෙන් ඥානවන්තවූ, කෙලෙස් තවන වීය්‍ර්‍ය ඇත්තාවූ, (කටයුතු පිළියෙල කරන) නුවණ ඇතිවූ, (යම්) භික්ෂුවක් ශීලයෙහි පිහිටා සමාධියද, (විදර්ශනා) ප්‍රඥාවද වඩන්නේ වේද, හෙතෙම මේ අවුල ලිහන්නේය.

"යමෙකු විසින් රාගයද, ද්වේෂයද, අවිද්‍යාවද දුරු කරන ලද්දාහුද, ආශ්‍රවයන් නැති කළ ඒ රහත්හු වෙත්. ඔවුන් විසින් (තණ්හා) අවුල ලිහන ලද්දේය.

"යම් තැනෙක නාමයද, රූපයද, කාම භවයද, රූප භවය හා අරූප භවයද සම්පූර්ණයෙන් අතුරුදහන් වේද එහි මේ (තණ්හා) අවුල සිඳෙයි."

**5.** මෙසේ කී කල ජටාභාරද්වාජ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයඃ "පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. යම්සේ යටිමුව කරනලද්දක් හෝ උඩුමුව කරන්නේද, වැසුන දෙයක් හෝ විවෘත කරන්නේද, මංමුළාවූවකුට මාර්ගය කියන්නේද, 'ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේද එසේම පින්වත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය ප්‍රකාශ කරන ලද්දේය." මේ මම භාග්‍යවත් ගෞතමයන් වහන්සේද, ධර්මයද, සංඝයාද, සමග පිහිටකොට යමි. භවත් ගෞතමයන් වෙතින් පැවිද්ද ලබන්නෙම් නම් උපසම්පදාවද ලබන්නෙම් නම් යෙහෙක." (යි කීය)

**6.** ජටාභාරද්වාජ බමුණු තෙම භාග්‍යවතුන් වහන්සේ වෙතින් පැවිද්ද ලැබීය. උපසම්පදාවද ලැබීය. උපසම්පන්නවී නොබෝකල් ඇති ආයුෂ්මත් ජටාභාරද්වාජ තෙම තනිවූයේ, වෙන්වූයේ, පමා නොවූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, නිවන් පිණිස මෙහෙයූ සිතැත්තේ, යම් අර්ථයක් සඳහා කුලපුත්‍රයෝ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වෙත්ද, නොබෝ කලකින්ම ඒ නිරුත්තරවූ බ්‍රහ්මචර්‍ය්‍යාව කෙළවරවූ නිවණ මේ ආත්මයෙහි තමා විශේෂ ඥානයෙන් අවබෝධ කොට, එයට පැමිණ විසීය. 'ජාතිය ක්ෂය වූය. බඹසර වැස නිමවනලදී, මාර්ග කෘත්‍යය කරනලදී, මෙයින් අන් ආත්මයක් නැතැ'යි හෙතෙම නිසැකව දත්තේය.

ආයුෂ්මත් භාරද්වාජගෝත්‍රික ජටා බමුණුතෙම රහතුන් අතුරෙහි එක්තරා කෙනෙක් වීය.

---

## 7. සුද්ධික සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක.

2. ඉක්බිති සුද්ධිකභාරද්වාජ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන්වහන්සේ හා සතුටුසාමීචි කථාකෙළේය. සතුටුවිය යුතු කථා සිහි කටයුතු කථා කොට එකත්පසෙක හුන්නේය.

3. එකත්පසෙක හුන් සුද්ධිකභාරද්වාජ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහිදී මේ ගාථාව කීය.

"ලොව කිසි බමුණෙක් සිල්වත් වේද, තපස්කර්ම කරන්නේද (එපමණින්) පිරිසිදු නොවේ. ඒ තෙම විද්‍යාවෙන් හා චරණයන්ගෙන් යුක්තවූයේම පිරිසිදු වේ. මෙයින් අන්‍යවූ සත්වයා (පිරිසිදු) නොවේ.

4. "බොහෝ ප්‍රලාප කියන්නේ, ඇතුළත කෙලෙස් කසලින් කිලිටිවූයේ, කිලිටි කායකර්මාදිය ඇත්තේ, කුහකවූයේ ජාතියෙන් පමණක් බමුණෙක් නොවේ.

"පටන්ගත් වීර්‍ය්‍ය ඇති, නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති, නිරන්තර දැඩි වීර්‍ය්‍ය ඇති, ක්ෂත්‍රියාද, බ්‍රාහ්මණයාද, වෛශ්‍යයාද, ශුද්‍රයාද, සැඩොලාද, කසල ශොධකයාද නිවණට පැමිණේ. බමුණ, මෙසේ දනුව."

5. මෙසේ කී කල සුද්ධිකභාරද්වාජ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. "පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස ඉතා මැනවි. යම්සේ යටිමුව කරන ලද්දක් හෝ උඩුමුව කරන්නේද, වැසුන දෙයක් හෝ විවෘත කරන්නේද, මංමුළාවූවකුට මාර්ගය කියන්නේද, 'ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේද, එසේම පින්වත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය ප්‍රකාශ කරන ලද්දේය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඒ මම භාග්‍යවතුන් වහන්සේද, ධර්මයද, සංඝයාද, සරණකොට යමි. මම භවත් ගෞතමයන් වහන්සේ වෙතින් පැවිද්ද හා උපසම්පදාව ලබන්නෙමි.”

**6.** භාරද්වාජගෝත්‍රික බමුණුතෙම භාග්‍යවතුන්වහන්සේ වෙතින් පැවිද්ද හා උපසම්පදාව ලැබීය.

**7.** උපසපන්වී නොබෝ කල් ඇති ආයුෂ්මත් සුද්ධික භාරද්වාජ තෙම තනි වූයේ, වෙන් වූයේ පමා නොවූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, නිවන් පිණිස මෙහෙයූ සිතැත්තේ වෙසෙන්නේ, නොබෝ කලෙකින්ම, යම් අර්ථයක් පිණිස කුල පුත්‍රයෝ සසුනෙහි පැවිදි වෙත්ද ඒ බඹසර කෙළවර (වූ නිවන) මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ විසීය, ‘ජාතිය ක්ෂයවූවා බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලදී. සියලු මාර්ගකෘත්‍යය කරවනලදී. මේ ආත්මභාවයෙන් අන් ආත්මයෙක් නැතැ’යි යහපත්කොට අවබෝධ කෙළේය.

**8.** ආයුෂ්මත් සුද්ධිකභාරද්වාජ තෙම රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් වීය.

---

## 8. අග්ගික සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම් වේළුවනයෙහි වැඩවසන සේක.

**2.** එකල අග්ගිකභාරද්වාජ බමුණා විසින් ‘ගිනි පුදන්නෙමි, ගිනිපූජාව සේවනය කරන්නෙමි’යි ගිතෙල්, කිරිබත් පිළියෙළ කරන ලද්දේය.

**3.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරෙව පාත්‍ර සිවුරු ගෙන රජගහනුවරට පිඬුපිණිස වැඩි සේක. රජගහනුවර ගෙපිළිවෙළින් පිඬු සිඟනසේක් අග්ගික භාරද්වාජ බමුණාගේ ගෙදොර යම් තැනෙකද එතැනට වැඩිසේක. වැඩ, එකත්පසෙක සිටිසේක.

**4.** අග්ගිකභාරද්වාජ බමුණුතෙම පිඬු පිණිස වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ දිටීය. දැක, භාග්‍යවතුන් වහන්සේට ගාථාවකින් (මෙසේ) කීය.

"යමෙක් ත්‍රිවේදයෙන් යුක්තද, ජාතිමත්ද, බොහෝ ග්‍රන්ථයන් දන්නේවේද, විද්‍යාවෙන් හා චරණයෙන් යුක්තද, ඒ තෙම මේ කිරිබත් වළඳන්නේය."

**5.** "(යමෙක්) බොහෝවූ ප්‍රලාප කියන්නේ, ඇතුලත කෙලෙස් කසටින් කිලිටිවූයේ, කිලිටි කාය කර්මාදිය ඇත්තේ, කුහකකමින් යුක්තවූයේ වේද, හෙතෙම ජාතියෙන් පමණක් බමුණු නොවේ.

"යමෙක් පෙර වුසූ උත්පත්ති පිළිවෙළ දනීද, ස්වර්ගය හා අපායත් දකීද, නැවත නැවත ඉපදීමක් නැති රහත්බවට පැමිණියේද, චතුස්සත්‍යය දැන නිමියේද, (කායාදි) මෞන (සංවර) ගුණයෙන් යුක්තද,

"මේ ත්‍රිවිද්‍යාවෙන් ත්‍රිවිද්‍යා ඇති බමුණෙක් වේ. විජ්ජාචරණසම්පන්න ඒ තෙම මේ කිරිබත වළඳන්නේය."

**6.** "පින්වත් ගෞතමයන් වහන්ස, වළඳන්න. ඔබ වනාහි බ්‍රාහ්මණයෙකි."

**7.** "බමුණ, 'මම මේ ගාථා කියා ලැබූ කිරිබත නොවළඳන්නෙමි. ආජීවශුද්ධිය දන්නවුන්ගේ එසේ වැළඳීම සිරිතෙක් නොවේ. බුදුවරයෝ ගාථා කියා ලද දෙය බැහැර කෙරෙත්. බමුණ, ධර්මය ඇතිකල්හි මේ ආයචීයන්ගේ පැවැත්මයි.

"සියලු ගුණයෙන් යුතු, මහර්ෂිවූ, ක්ෂය කළ ආශ්‍රව ඇති, සන්සුන් සියලු පසුතැවීම් ඇත්තකු අන්‍යවූ ආහාරයෙන්ද, පානයෙන්ද උපස්ථාන කරව. උන්වහන්සේ පින් කැමැත්තාහට පින් කෙතක් වේ" (යි වදාළහ.)

8. මෙසේ කී කල අග්ගිභාරද්වාජ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. "පින්වත් ගෞතමයන්වහන්ස, ඉතා

මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. යම්සේ යටිමුව කරන ලද්දක් හෝ උඩුමුව කරන්නේද, වැසුන දෙයක් හෝ විවෘත කරන්නේද, මංමුළාවූවකුට මාර්ගය කියන්නේද, 'ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේද එසේම පින්වත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය ප්‍රකාශ කරන ලද්දේය."

ඒ මම භාග්‍යවතුන් වහන්සේද, ධර්මයද, සංඝයාද සරණ කොට යමි. මම භවත් ගෞතමයන් වහන්සේ වෙතින් පැවිද්ද හා උපසම්පදාව ලබන්නෙමි."

**9.** අග්ගි භාරද්වාජගෝත්‍රික බමුණු තෙම භාග්‍යවතුන් වහන්සේ වෙතින් පැවිද්ද හා උපසම්පදාව ලැබීය.

**10.** උපසපන්වී නොබෝකල් ඇති ආයුෂ්මත් භාරද්වාජ තෙම තනිවූයේ වෙන්වූයේ, පමානොවූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, නිවන් පිණිස මෙහෙයූ සිතැත්තේව වෙසෙන්නේ, නොබෝකලෙකින්ම, යම් අර්ථයක් පිණිස කුලපුත්‍රයෝ සසුනෙහි පැවිදි වෙත්ද ඒ බඹසර කෙළවර (වූ නිවන) මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ විසීය. 'ජාතිය ක්ෂයවූවා බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලදී. සියලු මාර්ගකෘත්‍යය කරනලදී. මේ ආත්මභාවයෙන් අන් ආත්මයෙක් නැත'යි යහපත් කොට අවබෝධ කෙළේය.

ආයුෂ්මත් අග්ගිකභාරද්වාජ තෙම රහතුන් අතුරෙහි එක්තරා කෙනෙක් විය.

---

## 9. සුන්දරික සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ කොසොල් දනව්වෙහි සුන්දරිකා නදී තෙර වැඩ වසනසේක.

**2.** එකල සුන්දරිකභාරද්වාජ බමුණුතෙම සුන්දරිකා නදී තෙර ගිනි දෙවියා පුදයි. ගිනි දෙවියා පිදීම සේවනය කරයි.

3. ඉක්බිති සුන්දරිකභාරද්වාජ බමුණුතෙම ගිනි පුදා ගිනි පිදීමෙහි හැසිර හුනස්නෙන් නැගිට 'කවරෙක් මේ ගිනි පුදා ඉතිරි කිරිබත වළඳන්නට සුදුසු වන්නේදැ'යි හාත්පස සිව් දිග පිළිවෙළින් බැලීය.

4. සුන්දරිකභාරද්වාජ බමුණුතෙම හිස සිට පොරොවා ගෙන එක්තරා රුකක් මුල හුන් භාග්‍යවතුන් වහන්සේ දිටීය. දැක, වම් අතින් ගිනි පුදා ඉතිරි කිරිබත ගෙන දකුණතින් කෙණ්ඩිය ගෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සුන්දරික භාරද්වාජ බමුණාගේ පා ශබ්දයෙන් හිස විවෘත කළසේක.

6. ඉක්බිති සුන්දරික බමුණුතෙම 'මේ තැනැත්තේ නීචයෙක, එසේම මුඩු හිස ඇත්තෙකැ'යි එතැනින්ම (වහාම) ආපසු යනු කැමැත්තේ වීය.

7. ඉක්බිති සුන්දරිකභාරද්වාජ බමුණාට මෙබඳු සිතෙක් විය. 'මෙලොව මුඩු කළ හිස් ඇති බමුණෝද වෙත්. මම ඔහු වෙත පැමිණ, (ඔහුගේ) ජාතිය විචාරම් නම් මැනව.'

8 ඉක්බිති සුන්දරිකභාරද්වාජ බමුණා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, පින්වත් තෙම කිනම් ජාති ඇත්තේදැ'යි ඇසීය.

9. "ජාතිය නොවිචාරව. (ශීලාදී ගුණ ඇති) චරණයම විචාරව. ඒකාන්තයෙන් (දරින්) ගිනි හටගනී. නීච කුලයෙහි උපන් පුද්ගල තෙමේද, වීර්‍ය්‍යවත් වූයේ, කාරණාකාරණා දන්නේ, ලජ්ජාවෙන් පව් වළක්වා රහත් මුනිවරයෙක් වෙයි.

"යමෙක් පරමාර්ථ සත්‍යයෙන් දැමුනේද, ඉන්ද්‍රිය දමනයෙන් යුක්තද, සතරමාර්ග වේදයන්ගේ කෙළ පැමිණියේද, වැස නිමවූ මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව ඇත්තේද, එබඳු රහතන් වහන්සේ වෙත පිළියෙළ කළ යාග ඇතිව සුදුසු කල පැමිණ යාගය පිළිගත මැනවයි ආරාධනා කළ යුතුයි. හෙතෙම දීමට සුදුස්සා කෙරෙහි යාග කෙරේ."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

10. යම් හෙයකින් එබඳු ගුණ ඇති, වේද කෙළවරට පැමිණි තථාගතයකු මම දකිම්ද, එහෙයින් මා විසින් මේ යාගය ඒකාන්තයෙන් යහපත්ව කරන ලද්දේ වෙයි, යහපත් සේ හෝම කරන ලදද වෙයි. නුඹවහන්සේ වැන්නවුන් නොදක්නා හෙයින්ම අන්‍ය අඥාන ජනතෙම යාගයෙන් ඉතිරි කොටස අනුභව කරයි.”

“පින්වත් ගෞතමයන් වහන්සේ (මේ) වළඳාවා! පින්වත් තෙම (නියම) බමුණෙක.”

11. බමුණ, ගාථා කියා ලත් කිරිබත මවිසින් නොවැළඳිය යුතුයි. මේ ගාථා කියා ලද දෙය වැළඳීම අර්ථ ධර්මයන් දන්නාවුන්ගේ සිරිතක් නොවේ. තථාගතයෝ ගාථා කියා ලත් භෝජනය බැහැර කෙරෙත්. බමුණ, ධර්මය ඇති කල්හි මේ ආයයීයන්ගේ පැවැත්මයි.

“සියලු ගුණයෙන් යුත්, මහර්ෂිවූ, ක්ෂය කළ සියලු කෙලෙස් ඇති, සන්සුන් සියලු පසුතැවීම් ඇති, රහතන් වෙත ගොස්, මෙයින් අන්‍යවූ ආහාරයෙන්ද පානයෙන්ද උපස්ථාන කරව. ඒ ආයයී සමූහයා පින් කැමැත්තෝහට පින් කෙතක් වේ.’

12. “එසේ නම් පින්වත් ගෞතමයන් වහන්ස, කාහට මේ යාගයෙන් ඉතිරි කොටස දෙම්ද?”

13. “බ්‍රාහ්මණය, දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත, දෙව් මිනිසුන් සහිත, ප්‍රජා සංඛ්‍යාත ලෝකයෙහි යමකු මේ යාගයෙන් ඉතිරි කොටස වැළඳුයේ, මනාව දිරීමට යන්නේද, තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයෙකු හෝ හැර එබඳු වූවකු නොදකිමි. ඒ නිසා බමුණ, එය තණ නැති බිමක හෝ දමව, ප්‍රාණීන් නැති දියක හෝ පාකොට හරුව” (යි වදාළසේක.)

14. ඉක්බිති සුන්දරිකභාරද්වාජ බමුණුතෙම ඒ යාගයෙන් ඉතිරි කොටස ප්‍රාණීන් නැති දියෙහි පාකොට යැවීය.

15. ඉක්බිති ඒ යාගයෙන් ඉතිරි කොටස දියෙහි බහා ලන ලද්දේ චිටි චිටි චිටි චිටි යන ශබ්දයෙන් ශබ්ද කරයි. දුම් නඟියි,

හාත්පසින් දුම් දමයි. දහවල් මනාව රත්වූ නගුල දියෙහි දමන ලද්දේ යම්සේ චිටි චිටි චිටි චිටි යන ශබ්ද කරයිද, දුම් දමයිද, හාත්පසින් දුම් දමයිද එසේම යාගයෙන් ඉතිරි කිරිබත දියෙහි ලන ලද්දේ චිටි චිටි චිටි චිටි යන ශබ්ද කරයි, දුම් දමයි, හාත්පසින් දුම් දමයි.

16. ඉක්බිති සුන්දරිකභාරද්වාජ බමුණුතෙම සංවේගයට පැමිණියේ, ලොමුඩැහැගත්තේ, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, එකත්පසෙක සිටියේය.

17. එකත්පසෙක සිටි සුන්දරිකභාරද්වාජ බමුණාහට භාග්‍යවතුන් වහන්සේ ගාථාවලින් (මෙසේ) වදාළසේක:

"බමුණ, දර දවමින් ශුද්ධියක් වේයයි නොසිතව ආර්‍ය්‍ය ධර්මයෙන් බැහැර පිරිසිදු බව යමෙක් කැමති වේද එයින් ශුද්ධියක් වේයයි ආර්‍ය්‍යයෝ නම් නොකියත්.

"බමුණ, මම දර දැවීම හැර, (ඥාන) ගින්න දල්වමි. අර්හත්වූ මම නිති දැල්වූ (ඥාන) ගින්න ඇතිව, නිති දමනය කරන ලද සිතැතිව බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙමි.

"බමුණ, තාගේ මානය තවුස් පිරිකර දරවේ. ක්‍රෝධය දුමවේ. බොරුකීම අලුවේ, දිව හෝම හැන්දවේ. සත්වයන්ගේ හෘදය ගිනි මොලවන තැනවේ. පුද්ගලයාගේ මනාව දමනය කළ සිත යාග ගින්නවේ.

"බමුණ, ධර්මය ජලාසයවේ. ශීලය තොටවේ. එය නොකැළඹෙන හෙයින් විශේෂයෙන් ප්‍රසන්නය. සත් පුරුෂයන් විසින් සත්පුරුෂයන්ට ප්‍රශංසා කරනු ලැබේ. යම්තැනෙක ස්නානය කළ ආර්‍ය්‍යයෝ නොතෙත් සිරුරු ඇත්තෝව, නිර්වාණ පරතෙරට ඒකාන්තයෙන් යෙත් නම් මාගේ දහම් විල එබඳුවූවකි.

"බමුණ, සත්‍යයද, හික්මීමද, ධර්මයද යන මොවුහු බ්‍රහ්මචර්‍ය්‍යාවයි. ශාස්වත උච්ඡෙද දෘෂ්ටි දෙකම මද්ධ්‍යයෙහි සිටියාවූ (මේ අෂ්ටාංගික මාර්ගය) උතුම් පැමිණීමයි.

එහෙයින් තෝ ඍජුවූ රහතුන්ට නමස්කාර කරව. (එසේ කරන) ඒ පුද්ගලයා ධර්මසාරීයයි මම කියමි"යි (වදාළ සේක.)

18. මෙසේ කීකල සුන්දරික භාරද්වාජ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයඃ "පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි, පින්වත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිමුව කරන ලද්දක් හෝ උඩුමුව කරන්නේද, වැසුනු දෙයක් හෝ විවෘත කරන්නේද, මංමුළාවූවකුට මාර්ගය කියන්නේද, 'ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි අඳුරෙහි තෙල් පහනක් දරන්නේද, එසේම පින්වත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය පවසන ලද්දේය. ඒ මම භාග්‍යවතුන් වහන්සේද, ධර්මයද, සංඝයාද සරණකොට යමි. මම භවත් ගෞතමයන් වහන්සේ වෙතින් පැවිද්ද හා උපසම්පත්තිය ලබන්නෙමි."

19 භාරද්වාජගෝත්‍රික බමුණු තෙම භාග්‍යවතුන් වහන්සේ වෙතින් පැවිද්ද හා උපසම්පත්තිය ලැබීය.

20. උපසපන්වී නොබෝකල් ඇති, ආයුෂ්මත් භාරද්වාජ තෙම තනිවූයේ, වෙන්වූයේ, පමා නොවූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, නිවන් පිණිස මෙහෙයූ සිතැත්තේව වෙසෙන්නේ, නොබෝ කලෙකින්ම, යම් අර්ථයක් පිණිස කුලපුත්‍රයෝ සසුනෙහි පැවිදි වෙත්ද, ඒ බඹසර කෙළවරවූ (නිවන) මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ විසීය. 'ජාතිය ක්ෂයවූවා බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලදී. සියලු මාර්ගකෘත්‍යය කරන ලදී. මේ ආත්ම භාවයෙන් අන් ආත්මයෙක් නැතැ'යි යහපත් කොට අවබෝධ කෙළේය. ආයුෂ්මත් භාරද්වාජතෙමේ රහතුන් අතුරෙහි අන්‍යතරයෙක් විය.

---

## 10. බහුධීති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කොසොල් දනව්වෙහි එක්තරා වන ලැහැබෙක වසනසේක.

2. එකල භාරද්වාජගෝත්‍රික එක්තරා බමුණකුගේ ගොනුන් දහ හතර දෙනෙක් නැතිවූහ.

3. ඉක්බිති භාරද්වාජගෝත්‍රික බමුණු තෙමේ ඒ ගොනුන් සොයමින් වනලැහැබ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, එහි පළක් බැඳ ශරීරය කෙලින් පිහිටුවා සිහිය පරිමුඛ කොට වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දිටීය.

4. දැක භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් සමීපයෙහි මේ ගාථාවන් කීයඃ

"මගේ ගොනුන් දහහතර දෙනෙක් අදට සදවසක් පමණ දක්නට නැත. මේ ශ්‍රමණයන්ට එබන්දක් නැත්තෙන් ඒකාන්තයෙන් ඒ ශ්‍රමණතෙම සැපසේ වාසය කරයි.

"යම් හෙයකින් මේ ශ්‍රමණයන්ට කෙතෙහි කොළ එකක්වත් නැති (ලාමක) තලද, කොළ එකක් දෙකක් පමණ ඉතිරිවූ තලද, ඒකාන්තයෙන් නැත්තාහුද, එහෙයින්ම මේ ශ්‍රමණතෙම සැපසේ වාසය කරයි.

"හිස්වූ ධාන්‍යාගාරයෙහි මීයෝ දැඩි උත්සාහයෙන් නටති. මේ ශ්‍රමණයන්ට ඒකාන්තයෙන් එබන්දක් නැත. එහෙයින් මේ ශ්‍රමණතෙම සැපසේ වාසය කරයි.

"මාගේ තණපත් ඇතිරිය සත් මසක් ඉක්ම ගියේ එහිම උපන් ප්‍රාණීන්ගෙන් ගැවසී ගත්තේය. මේ ශ්‍රමණයන්ට ඒකාන්තයෙන් එවැන්නක් නැත. එහෙයින් මේ ශ්‍රමණතෙම සැපසේ වාසය කරයි.

"එක දරුවකු පමණක් ඇත්තා වූද, (දරුවන්) දෙදෙනෙකු ඇත්තාවූද, වැන්දඹුවූ දූවරු සත්දෙනෙක් මේ ශ්‍රමණයන්ට ඒකාන්තයෙන්ම නැත. එහෙයින් මේ ශ්‍රමණතෙම සැපසේ වාසය කරයි.

"දුඹුරු පාටට තල ඇට වැනි කැලල්වලින් ගැවසුණු ශරීරය ඇති (මාගේ බැමිණි) මා සයනය කළ විට පයින් ගසා (මා) පුබුදුවයි. යම් හේතුවකින් මේ ශ්‍රමණයන්ට

ඒකාන්තයෙන් එබන්දක් නැත්ද, එහෙයින්ම මේ ශ්‍රමණතෙම සැප ඇත්තේ වෙයි.

"උදෑසන ණය හිමියෝ වුත් 'අපට දෙව, අපට දෙව'යි මට චෝදනා කෙරෙති. යම් හෙයකින් මේ ශ්‍රමණයන්ට එබඳු ණය නැත්තේද, එහෙයින්ම මේ ශ්‍රමණ තෙම සුව ඇත්තේ වෙයි."

5. "බමුණ, තාගේ ගොනුන් දහහතර දෙන නැතිවී අදට සදිනක් නොදක්නා ලදී. බමුණ, යම් හෙයකින් මට එබන්දක් නැත්තේද, එහෙයින් මම ඒකාන්තයෙන් සුව ඇත්තෙමි.

"බමුණ, තාගේ කෙතෙහි ලාමකවූ තලද, කොළ එකක් දෙකක් පමණ ඉතිරිව ඇත්තාවූ තලද වෙති. බමුණ යම් හෙයකින් මට එබන්දක් නැත්තෙන් මම ඒකාන්තයෙන් සුව ඇත්තේ වෙමි.

"බමුණ, තාගේ හිස්වූ ධාන්‍යාගාරයෙහි මීයෝ දැඩි උත්සාහයෙන් නටති. බමුණ, එබඳු ධාන්‍යාගාරයක් මට නැත්තෙන් මම ඒකාන්තයෙන් සුව ඇත්තෙම් වෙමි.

"බමුණ, තාගේ තණපත් ඇතිරිය සත්මසක් ඉක්ම ගියේ එහිම උපන් ප්‍රාණීන්ගෙන් ගැවසුනේය. බමුණ, යම් හේතුවකින් මට එවැන්නක් නැත්තේද, එහෙයින් ඒකාන්තයෙන් සුව ඇත්තෙම් වෙමි.

"බමුණ, (තට මෙන්) එක දරුවකු පමණක් ඇත්තාවූද, දරුවන් දෙදෙනෙක් පමණක් ඇත්තාවූද, වැන්දඹුවූ දූන් සත්දෙනෙක් මට නැත. බමුණ, එහෙයින් මම ඒකාන්තයෙන් සුව ඇත්තෙම් වෙමි.

"බමුණ, තල ඇට වැනි කැළල්වලින් ගැවසුණු ශරීරය ඇති තාගේ බැමිණිය නිදිගත් තා පයින් ගසා පුබුදුවයි. බමුණ, මට එවැන්නක් නැත. එහෙයින් මම ඒකාන්තයෙන් සුව ඇත්තෙම් වෙමි.

"බමුණ, උදෑසන ණය හිමියෝ (පැමිණ) 'අපට දෙව, අපට දෙව'යි කියා තට චෝදනා කෙරෙති. බමුණ, මට යම් හේතුවකින්

එබඳු චෝදනාවක් නැත්තේද, එහෙයින් මම ඒකාන්තයෙන් සුව ඇත්තෙම් වෙමි" (යි වදාළහ.)

**6.** මෙසේ කීකල භාරද්වාජගෝත්‍රික බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. "පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි, පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි.

"පින්වත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිමුව කරන ලද්දක් හෝ උඩුමුව කරන්නේද, වසන ලද්දක් විවෘතකරන්නේද, මංමුළාවූවකුට මාර්ගය කියන්නේද, 'ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි අඳුරෙහි තෙල් පහනක් දරන්නේද, එසේම පින්වත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය පවසන ලද්දේය. ඒ මම භාග්‍යවතුන් වහන්සේද ධර්මයද සංඝයාද සරණකොට යමි. මම භවත් ගෞතමයන් වහන්සේ වෙතින් පැවිද්ද හා උපසම්පත්තිය ලබන්නෙමි."

**7.** භාරද්වාජගෝත්‍රික බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේ වෙතින් පැවිද්ද හා උපසම්පත්ති ලැබීය.

**8.** උපසපන්වී නොබෝ කල් ඇති ආයුෂ්මත් භාරද්වාජ තෙම තනිවූයේ, පමා නොවූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, නිවන් පිණිස මෙහෙයූ සිතැත්තේව වෙසෙන්නේ, නොබෝ කලෙකින්ම, යම් අර්ථයක් පිණිස කුලපුත්‍රයෝ සසුනෙහි පැවිදි වෙත්ද, ඒ බඹසර කෙළවර (වූ නිවන) මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ විසීය. 'ජාතිය ක්ෂයවූවා' බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලදී. සියලු මාර්ග කෘත්‍යය කරන ලදී. මේ ආත්මභාවයෙන් අන් ආත්මයෙක් නැතැ'යි යහපත්කොට අවබෝධ කෙළේය.

**9.** ආයුෂ්මත් භාරද්වාජ භික්ෂුව රහතුන් අතුරෙහි එක්තරා කෙනෙක් විය.

පළමුවන අරහන්ත වර්ගයයි.

---

# 2. උපාසක වර්ගය.

## 1. කසි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ මගධ දනව්යෙහි දක්ෂිණාගිරියෙහි එකනාලා බමුණුගම වසනසේක.

2. එකල වනාහි කසිභාරද්වාජ බමුණා විසින් වපුරන කාලයේ පන්සියයක් පමණ නගුල් යොදන ලද්දේ විය.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරව, පාත්‍ර සිවුරු ගෙන කසිභාරද්වාජ බමුණාගේ කර්මාන්ත ස්ථානය යම් තැනෙකද එතැනට වැඩිසේක.

4. එකල කසිභාරද්වාජ බමුණාගේ (අහර) වැළඳවීමෙක් විය.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ වළඳවන ස්ථානය යම් තැනෙකද එතැනට වැඩිසේක. වැඩ එකත්පසෙක සිටිසේක.

6. කසිභාරද්වාජ බමුණුතෙම පිඬු පිණිස වැඩ සිටි භාග්‍යවතුන් වහන්සේ දිටීය. දැක භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. "ශ්‍රමණය, මම් වනාහි (සී) සෑමද කරමි, වැපිරීමද කරමි. (සී) සෑම කොටද, වැපිරීම කොටද වළඳමි. ශ්‍රමණය, නුඹත් සෑමද කරව, වැපිරීමද කරව. සෑමද කොට වැපිරීමද කොට වළඳව" (යි කීය.)

7. "බමුණ, මමත් සෑමද කරමි, වැපිරීමද කරමි. සෑමද කොට වැපිරීමද කොට වළඳමි" (යි වදාළ සේක.)

8. 'පින්වත ගෞතමයන්ගේ වියදණ්ඩක් හෝ නඟුලක් හෝ හීවැලක් හෝ කෙවිටක් හෝ ගොනුන් හෝ අපි නො දකිම්හ. එසේ නමුත් භවත් ගෞතමතෙම මෙසේ කියයි. 'බමුණ, මමත් සෑමද කරමි, වැපිරීමද කරමි. සෑමද කොට වැපිරීමද කොට වළඳමි."

9. ඉක්බිති කසීභාරද්වාජ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට ගාථාවක් කීය.

"ගොවියෙක්මි'යි ඔබ ප්‍රතිඥා කරන්නෙහිය. ඔබගේ (සී) සෑමත් නොදක්නෙමි. අප විසින් විචාරන ලද ඔබ ගොවියෙක් දැයි කියව. ඔබගේ සීය කෙසේ දැන ගන්නෙමුද?"

**10.** "ශ්‍රද්ධාව මගේ බීජය වෙයි. තපස වැස්ස ය. ප්‍රඥාව මාගේ සීයට වියගහ හා නඟුලය. ලජ්ජාව (හා භය) ද මාගේ නඟුල් කඳය. සමාධිය රැහැන් හෙවත් ලණුය. මාගේ සිහිය සීවැල හා කෙවිටය

"කාය සුචරිතයෙන්, වාක් සුචරිතයෙන් රක්නා ලද්දේ වෙයි. ආහාරයෙහි ගන්නා ලද සංවර නමැති ගවයා වූයෙමි, උදරයෙහි සංවර වූයෙමි සත්‍යයෙන් නෙළීම කෙරෙමි. අර්හත්ව ඵල විමුක්තිය මාගේ (සීසෑමෙන්) මිදීමයි."

"බර ඉසිලීමට සමර්ථවූ මාගේ වීර්‍ය්‍යය නිර්වාණයට අභිමුඛව ගමන් කරමින් යම් තැනකට පැමිණ ශෝක නොකරන්නේද, එතැනට නොනවතිමින් යෙයි."

"මෙසේ මේ සීය සාන ලදී. ඒ සීය අමෘත ඵල ඇතිවේ. මේ සීය සා, සකල සංසාර දුඃඛයෙන් මිදේ."

**11.** "පින්වත් ගෞතම තෙම වළඳාවා. පින්වත් ගෞතම තෙම ගොවියෙක්නම් වෙයි. යම් හෙයකින් අමාඵල දෙන්නාවූ යම්බඳු සීයක් පින්වත් ගෞතමතෙම සායිද, එහෙයිනි"යි (කීය.)

**12.** "බමුණ, මා ගාථා කියාලත් කිරිබත් වැළඳිය යුතුනොවේ. (අර්ථධර්මයන්) අර්ථ ධර්ම දෙක දක්නාවූ (සර්වඥවරයන්ගේ) මේ (ගාථා කියා ලද දෙය වැළඳීම) සිරිතක් නොවේ. බුදුවරයෝ ගාථා කියා ලැබූ භෝජනය බැහැර කෙරෙත්. බමුණ, ධර්මය පවත්නා කල, මේ ඔවුන්ගේ පැවැත්මයි.

"සියලු ගුණයෙන් යුතු මහාර්ෂිවූ, සන්සුන් පසු තැවීම් ඇති, රහතන් වහන්සේ අන්‍යවූ ආහාරයකින් පානයකින් උපස්ථාන කරව. ඔහු වනාහි පින් කැමැත්තා හට කෙතක්වේ" (යි වදාළසේක.)

13. මෙසේ වදාළ කල්හි කසීභාරද්වාජ බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. "පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ වැසුනක් විවෘතකරන්නේ හෝ මංමුළාවූවකුට මාර්ගය කියන්නේ හෝ 'ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි තෙල් පහනක් දරන්නේ හෝ යම්සේද, එසේම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය පවසන ලද්දේය. ඒ (ඇසූ) මම භවත් ගෞතමයන් වහන්සේ හා ධර්මයද සංඝයාද සරණ කොට යෙමි, භවත් ගෞතමයන්වහන්සේ මා අද පටන් දිවි කෙළවර කොට සරණ ගිය උපාසකයකු කොට දරණ සේක්වා."

---

## 2. උදය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු සමයෙහි හැඳ පෙරව පාත්‍ර සිවුරු ගෙන උදය බමුණාගේ නිවස යම් තැනෙකද එතැනට වැඩිසේක. ඉක්බිති උදය බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේගේ පාත්‍රය ආහාරයෙන් පිරවිය. දෙවෙනි දිනත් භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරව පාත්‍ර සිවුරු ගෙන උදය බමුණාගේ නිවෙස යම් තැනෙකද එතැනට වැඩිසේක. දෙවෙනි දිනත් උදය බමුණු තෙම ආහාරයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පාත්‍රය පිරවිය. තුන්වෙනි දිනත් භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරව පාත්‍ර සිවුරු ගෙන උදය බමුණාගේ නිවෙස යම් තැනෙකද එතැනට වැඩිසේක. තුන්වෙනි දිනත් භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරව පාත්‍ර සිවුරු ගෙන උදය බමුණාගේ නිවෙස යම් තැනෙකද එතැනට වැඩිසේක. තුන්වෙනි දිනත් බමුණු තෙම

ආහාරයෙන් භාග්‍යවතුන්ගේ පාත්‍රය පුරවා භාග්‍යවතුන් වහන්සේට මෙය කීයඃ "රසට ලොල්වූ මේ ශ්‍රමණ ගෞතම තෙම නැවත නැවතද එයි."

3. (එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) (ගොවියෝ) නැවත නැවත ශස්‍ය බීජ වපුරති. වැස්ස නැවත නැවත වසී. ගොවියෝ නැවත නැවත කෙත සාති. නැවත නැවත ධාන්‍ය රටට පැමිණෙයි.

"යාචකයෝ නැවත නැවත ඉල්වත්. දානපතියෝ නැවත නැවත දෙත්. දානපතියෝ නැවත නැවත දී නැවත නැවත දෙව්ලොවට පැමිණෙති.

"කිරිදොවන්නෝ නැවත නැවත දොවිත්. වසුතෙම නැවත නැවත මවු දෙන කරා පැමිණෙයි. (සත්වතෙම ඒ ඒ ඉරියව්වෙන්) නැවත නැවත පීඩා වෙයි. අඥාන සත්වතෙම නැවත නැවත උත්පත්තියට පැමිණේ.

"නැවත නැවත උපදී, නැවත නැවත මැරෙයි (මළාවූ ඔහු) සොහොනට ගෙන යෙත්. නුවණ ඇති පුද්ගලයා නිර්වාණය පිණිසවූ මාර්ගය ලැබ නැවත නැවත නොඋපදී"යි (වදාළසේක.)

4. මෙසේ වදාළ කල උදය බමුණු තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. "භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවිඃ භවත් ගෞතමයන් වහන්ස, යටිමුව කරන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ වැසුනක් විවෘත කරන්නේ හෝ මංමුළාවූවකුට මාර්ගය කියන්නේ හෝ 'ඇස් ඇත්තෝ රූප දකිතවා'යි තෙල් පහනක් දරන්නේ හෝ යම්සේද, එසේම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය පවසන ලද්දේය. ඒ (ඇසූ) මම භවත් ගෞතමයන් වහන්සේ හා ධර්මයද සංඝයාද සරණකොට යෙමි. භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවි කෙළවර කොට සරණ ගිය උපාසකයකු කොට භවත ගෞතමයන් වහන්සේ දරන සේක්වා"

---

## 3. දෙවහිත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල වනාහි භාග්‍යවතුන් වහන්සේ, කුසයෙහි වාතාබාධයකින් පීඩිතවූසේක. ආයුෂ්මත් උපවාණ තෙමද භාග්‍යවතුන් වහන්සේට උපස්ථානය වෙයි

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් උපවාණ ඇමතූසේක. (අමතා) "බලව, උපවාණය, තෝ මට උණුදිය (ගෙනෙන සැටියක්) දැනුව"යි (කීසේක.)

4. "එසේය ස්වාමීනි"යි ආයුෂ්මත් උපවාණ තෙම භාග්‍යවතුන් වහන්සේට උත්තර දී දේවහිත බමුණාගේ නිවස යම්තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ නිශ්ශබ්දව එකත්පසෙක සිටියේය.

5. එකත්පසෙක සිටි නිශ්ශබ්දවූ ආයුෂ්මත් උපවාණයන් දෙවහිත බමුණා දිටීය. දැක ආයුෂ්මත් උපවාණයන්ට ගාථායෙන් (මෙසේ) කීයඃ

"හිස මුඬුකළ, සඟළ සිවුරු පෙරවූ, පින්වත් තෙම කුමක් පතමින්, කුමක් සොයමින්, නිශ්ශබ්දව සිටින්නෙහිද? කුමක් ඉල්ලන්නට ආයෙහිද?"

6. "ලොව අර්හත්වූ සුගතවූ මුනිතුමා කුසයෙහි ආබාධයකින් පෙළෙන සේක. බමුණ, ඉදින් තා සතු උණුදිය ඇත්නම් ඒ මුනින්ද්‍රියන් වහන්සේට දුන මැනවි."

"පිදිය යුත්තන් විසින් පුදන ලද, සත්කාර කළ යුත්තන් විසින් සත්කාර කරන ලද, ගරුකළ යුත්තන් විසින් ගරු කරන ලද උන්වහන්සේට දෙනු පිණිස ගෙන යන්නට උණුදිය කැමැත්තෙමි"යි (ආයුෂ්මත් උපවාණතෙමු කිය.)

7. ඉක්බිති දේවහිත බමුණු තෙම උණුදිය කදක් පුරුෂයකු ලවා ගෙන්වා ගෙන සකුරුපිඩක්ද ආයුෂ්මත් උපවාණතෙරුන්ට දිනි.

8. ඉක්බිති ආයුෂ්මත් උපවාණ ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ උණු දියෙන් නහවා, උණු දියෙන් සකුරු දියකොට, භාග්‍යවතුන් වහන්සේට දුන්නේය.

9. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේගේ ඒ ආබාධය සංසිඳුනේය. ඉක්බිති දේවහිත බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු සාමීචි කථා කෙළේය. සතුටුවිය යුතුවූ, සිහිකටයුතුවූ, කථාකොට එකත්පසෙක හුන්නේය.

10. එක්පසෙක හුන් දේවහිත බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට ගාථායෙකින් මෙසේ කීය.

> "දානවස්තුව කවරෙකුහට දෙන්නේද (දියයුතුද)? කවරකුහට දුන්දෙය මහත්ඵල ඇතිවේද? කවර ආකාරයෙකින් කොතැනෙක දෙන්නහුගේ දානය සඵලවේද?"

> 11. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "යමෙක් පෙර ජාතිපිළිවෙළ දනීද, ස්වර්ගය හා අපායයත් දකීද, අර්හත්වයට පැමිණියේද, මාර්ගඥානයෙන් (චතුරාර්‍ය්‍ය සත්‍යය) දැන නිමවූ සියලු කටයුතු ඇත්තේද, (කායාදී) මෞන ගුණයෙන් යුක්තද,

> "මෙහි (මෙබඳු තැනැත්තාට) දෙන දෙය දෙන්නේය. (දියයුතු). මෙහි දෙනලද්ද මහත්ඵල ඇතිවේ. මේ ආකරයෙන් දෙන්නහුගේ දානය මහත්ඵල වේ"

12. මෙසේ වදාළකළ දේවහිත බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. "පින්වත් ගෞතමයන්වහන්ස, ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. යම්සේ යටිමුව කරන ලද්දක් හෝ උඩුමුව කරන්නේද, වැසුන දෙයක් හෝ විවෘතකරන්නේද, මංමුළාවූවකුට හෝ මාර්ගය කියන්නේද, 'ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේද, එසේම පින්වත් ගෞතමයන්වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය ප්‍රකාශ කරන ලද්දේය. අද පටන් මා

දිවිහිම් කොට සරණගිය උපාසකයකු සේ භාග්‍යවතුන් වහන්සේ සලකන සේක්වා.”

---

## 4. මහාසාල (නොහොත් ලුඛපාපුරණ) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඩු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. ඉක්බිති එක්තරා මහත් වස්තුව ඇති බ්‍රාහ්මණයෙක් ජරාවට ගියේ (දිරුණු වස්ත්‍ර ඇඳගත්තේ) භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු සාමීචි කථා කෙළේය. සතුටුවියයුතු සිහිකටයුතු කථා කොට නිමවා එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ඒ මහාසාර බ්‍රාහ්මණයාට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. “බමුණ, තෝ කුමක් හෙයින් දිරා ගියේ දිරාගිය පෙරවීම් ඇත්තෙහිද?”

3. “භවත් ගෞතමයන් වහන්ස, මාගේ පුත්තු සතර දෙනෙක් වෙති. ඔහු භාර්‍ය්‍යාවන්ගේ කීමට ගෙයින් එළවති”යි (කීය)

4. “බමුණ, එසේවීනම් මේ ගාථාවන් ඉගෙන මහජනයා රැස්වූ සභායෙහි පුතුන්ද හුන් කල කියව.

“මට දාව උපන් යම් කෙනෙකුන් කරණකොට සතුටුවූයෙම්ද, යම් කෙනෙකුන්ගේ අභිවෘද්ධිය පැතූයෙම්ද, ඔවුහු භාර්‍ය්‍යාවන්ගේ කීමට බල්ලෙකු, ඌරෙකු එළවන්නාක් මෙන් මා එළවා දමති.

‘අසත්පුරුෂවූ, ලාමකවූ, රකුසෝ පුත්‍රයන් මෙන් පෙනී සිටිමින් මට ‘පියාණනි, පියාණනි’යි කියත්. ඔවුහු වයසට ගිය මා අත්හරිත්.’

‘පරිභෝගයට (වැඩගැනීමට) සුදුසු නොවූ, දිරුණු අශ්වයෙක් යම්සේ කෑමෙන් වළකනු ලබන්නේද, බාලයන්ගේ පියවූ මහල්ලා අනුන්ගේ ගෙවල සිඟයි.’

'මේ දණ්ඩම (සැරයටියම) මට උතුම්ය. (ඒ සැරයටිය) නපුරු ගොනෙකුත් වළක්වයි. තවද නපුරු බල්ලන්ද වළක්වයි.'

'(ඒ සැරයටිය) අඳුරෙහි පෙරටුවෙයි. ගැඹුරු ජලයෙහි පිහිට සොයා දෙයි. දණ්ඩෙහි අනුසසින් පැකුළුණු තැනැත්තා නැවත පිහිටා (කෙළින්) සිටියි. "

**5.** ඉක්බිති මහාසාර බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේගෙන් මේ ගාථාවන් ඉගෙන මහජනයා රැස්වූ සභායෙහි පුතුන්ද හුන් කල කීය.

"මට දාව උපන් යම් කෙනකුගේ කරණකොට සතුටුවූයෙම්ද, යම් කෙනකුන්ගේ අභිවෘද්ධිය පැතුයෙම්ද ඔවුහු භාර්‍ය්‍යාවන්ගේ කීම් ගෙන බල්ලෙකු, ඌරෙකු එළවන්නාක් මෙන් මා එළවති.

'අසත්පුරුෂවූ, ලාමකවූ, රකුසෝ පුත්‍රයන් මෙන් පෙනී සිටිමින් මට 'පියාණනි, පියාණනි'යි කියත්. ඔවුහු වයසට ගිය මා අත්හරිත්.'

"පරිභෝගයට (වැඩගැනීමට) නුසුදුසු දිරූ අශ්වයෙක් යම්සේ කෑමෙන් පහකරනු ලබන්නේද, බාලයන්ගේ පියවූ මහල්ලා අනුන්ගේ ගෙවල සිඟයි.

"අකීකරුවූ මාගේ පුත්‍රයන්ට වඩා (සැරයටිය) නපුරු ගොනකුත් වළක්වයි. තවද බල්ලෙකුද වළක්වයි. (ඔවුහු එසේ නොවළහති)"

"ඒ (සැරයටිය) අඳුරෙහි පෙරටු වෙයි. ගැඹුරු ජලයෙහි පිහිට (පතුල) සොයා දෙයි. පැකුළුණු තැනැත්තේ දණ්ඩෙහි ආනුභාවයෙන් නැවත නැගිට සිටියි."

**6.** ඉක්බිති ඒ බමුණු මහසල් පුත්‍රයෝ ගෙට ගෙන ගොස් නාවා වෙන වස්ත්‍ර දෙකක් හැන්දවූහ. ඉක්බිති ඒ බ්‍රාහ්මණ මහාසාල තෙම එක් වස්ත්‍ර යුග්මයක් ගෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන්

වහන්සේ සමග සතුටුසාමීචි කථා කෙළේය. සතුටු වියයුතුවූ සිහි කටයුතුවූ කථාකොට නිමවා එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ඒ බමුණු මහසල් තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයඃ "පින්වත් ගෞතමයන් වහන්ස, අපි බමුණම්හ. ආචාර්‍ය්‍යයන්හට ආචාර්‍ය්‍ය ධනය සොයන්නම්හ. මාගේ ආචාර්‍ය්‍යවූ භවත් ගෞතමයන් වහන්සේ ඇදුරු කොටස (ගුරුවරයාට අයිති කොටස) පිළිගන්නා සේක්වා" භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා උපදවා පිළිගත්සේක.

ඉක්බිති ඒ බ්‍රාහ්මණ මහාසාල තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයඃ "භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ වැසුනක් විවෘත කරන්නේ හෝ මංමුළාවූවකුට මාර්ගය කියන්නේ හෝ 'ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි තෙල් පහනක් දරන්නේ හෝ යම්සේද, එසේම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය පවසන ලද්දේය. ඒ (ඇසූ) මම භවත් ගෞතමයන් වහන්සේ හා ධර්මයද සංඝයාද සරණ කොට යෙමි. භවත් ගෞතමයන් වහන්සේ මා දිවිහිම්කොට සරණ ගිය උපාසකයකු සේ සලකන සේක්වා."

---

## 5. මානත්ථද්ධ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක.

2. එකල වනාහි මානත්ථද්ධ නම් බමුණෙක් සැවැත් නුවර වෙසෙයි. හෙතෙම මවු නොවඳී, පියා නොවඳී, ආචාරීන් නොවඳී, වැඩිමහල් සහෝදරයා නොවඳී.

3. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ මහපිරිසක් විසින් පිරිවරන ලදුව ධර්මදෙශනා කරනසේක. ඉක්බිති මානත්ථද්ධ බමුණාට මෙබඳු සිතෙක් වියඃ 'මේ ශ්‍රමණ ගෞතම තෙම මහ පිරිසක් පිරිවරන ලදුව ධර්මදේශනා කරනසේක. මම ශ්‍රමණ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ගෞතමයන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණෙම් නම් ඒ යෙහෙක. ඉදින් මට ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කථා කළසේක් නම් මමත් උන්වහන්සේට කථාකරමි. ඉදින් කථා නොකළසේක් නම් මමත් කථා නොකරමි" කියායි.

4. ඉක්බිති මානත්ථද්ධ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, නිශ්ශබ්දව එකත්පසෙක සිටියේය. එවිට භාග්‍යවතුන් වහන්සේ ඔහුට කිසිත් නොවදාළසේක. ඉක්බිති මානත්ථද්ධ බමුණුතෙම 'මේ ශ්‍රමණ ගෞතමයා කිසිවක් නොදන්නේය'යි එතැනින්ම නැවත පෙරළා එනු කැමැත්තේ විය.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මානත්ථද්ධ බමුණාගේ සිත තම සිතින් පිරිසිඳ දැන මානත්ථද්ධ බමුණාහට ගාථාවක් වදාළසේකඃ

"බමුණ, මෙලොව වැඩකැමති ජනයාට මානය නොමැනවි. යම් අර්ථයක් කරණකොට ආයෙහි නම් එයම ප්‍රකාශ කරන්න."

6. ඉක්බිති මානත්ථද්ධ බමුණුතෙම 'මාගේ සිත ශ්‍රමණ ගෞතම තෙම දනී'යි එතැන්හිම භාග්‍යවතුන්වහන්සේගේ පාමුල හිසින් වැටී භාග්‍යවතුන්ගේ පාදයන් මුවින් සිඹී, අතින් පිරිමදී, තමාගේ නමද ප්‍රකාශ කරයි. "භවත් ගෞතමයන් වහන්ස, මම මානත්ථද්ධ නමි, පින්වත් ගෞතමයන් වහන්ස, මම මානත්ථද්ධ නමි'යි කියායි.

7. ඉක්බිති ඒ පිරිස අද්භූත සිත් ඇතිව "පින්වත් ගෞතමයන් වහන්ස, පුදුමයෙකි. පින්වත් ගෞතමයන් වහන්ස ඉතා පුදුමයෙකි. මේ මානත්ථද්ධ බමුණුතෙම මවු නොවඳී, පියාත් නොවඳී, ආචාර්‍ය්‍යයන්ද නොවඳී, වැඩිමහල් සොහොයුරා නොවඳී. එසේද වුව ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කෙරෙහි මෙබඳුවූ මහත්ම ගෞරවයක් කරයි" (කියායි.)

8. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ මානත්ථද්ධ බමුණාහට මෙය වදාළසේකඃ "බමුණ (දැන්) ඇත. නැඟිටිනු. ස්වකීය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ආසනයෙහි හිඳිනු. යම් හේතුවකින් මා කෙරෙහි තාගේ සිත පැහැදුනේද එහෙයිනි"

**9.** ඉක්බිති මානත්ථද්ධ බමුණුතෙම සිය අසුනෙහි හිඳ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කීය.

"කවුරුන් කෙරෙහි මානය නොකරන්නේද? කවුරුන් කෙරෙහි ගෞරව සහිතයෙක් වන්නේද? කවරෙක් (මා) විසින් පිදිය යුත්තාහුද? කවරෙක් මනාකොට පිදිය යුත්තෝ වෙත්ද?"

**10.** (එවිට භාග්‍යවතුන්වහන්සේ) "මවු කෙරෙහිද, පියා කෙරෙහිද, තවද වැඩිමහල් සහෝදරයා කෙරෙහිද, සිව්වැනිව ගුරුවරයා කෙරෙහිදැයි යන මොවුන් කෙරෙහි මානය නොකරන්නේය. ඔවුන් කෙරෙහි ගෞරව සහිතයෙක් වන්නේය. ඔහු මේ පුද්ගලයාගේ ගෞරවයට සුදුසු වන්නෝය. ඔහු යහපත් කොට පිදිය යුත්තෝ වෙති.

"සිහිල්වූ, කළාවූ කටයුතු ඇති, (කාමාදී) ආශ්‍රව කෙලෙස් නැති, අනුත්තරවූ ඒ රහතුන් (මානයෙන්) තද නොවී, මානය සම්පූර්ණයෙන් නසා, නමදුව" (යි වදාළ සේක.)

**11.** මෙසේ වදාළ සඳ මානත්ථද්ධ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. භවත් ගෞතමයන්වහන්ස, ඉතා මැනවි. භවත් ගෞතමයෙනි, ඉතා මැනවි. යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ වැසුනක් විවෘත කරන්නේ හෝ මංමුළාවූවෙකුට මාර්ගය කියන්නේ හෝ 'ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි තෙල් පහනක් දරන්නේ හෝ යම්සේද, එසේම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය පවසන ලද්දේය. ඒ (ඇසූ) මම භවත් ගෞතමයන් වහන්සේ හා ධර්මයද සංඝයාද සරණ කොට යෙමි. භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිහිම් කොට සරණගත උපාසකයෙකැයි සලකන සේක්වා."

---

## 6. පච්චනීක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල වනාහි පච්චනීකසාත නම් බමුණු තෙම සැවැත් නුවර වෙසෙති. ඉක්බිති පච්චනිකසාත බමුණාහට මෙබඳු සිතෙක් විය: 'ශ්‍රමණ ගෞතමයන් වහන්සේ වැඩ වෙසෙන තැන යම් තැනෙකද එතැනට පැමිණෙම් නම් මැනවි. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ යමක් යමක් වදාරණ සේක් නම් උන්වහන්සේගේ ඒ ඒ දෙයට මම විරුද්ධවාදියෙක් වන්නෙමි."

3. එකල භාග්‍යවතුන් වහන්සේ අභ්‍යවකාශයෙහි සක්මන් කරනසේක. ඉක්බිති පච්චනීකසාත බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, සක්මන කරන භාග්‍යවතුන් වහන්සේට අනුව සක්මන් කරමින් "ශ්‍රමණය, ධර්මය කියව"යි කීය.

4. (එවිට භාග්‍යවතුන් වහන්සේ) "විරුද්ධ දේ කීමෙන් සතුටු වන්නාවූ, ලෝභාදියෙන් කිලිටි සිත් ඇති, එකටෙක කිරීම බහුලකොට ඇතියකු විසින් (තථාගතයන්ගේ) සුභාෂිත ධර්මය හොඳාකාර නොදත හැක්කේය.

"යමෙක් චිත්තය සම්බන්ධ අප්‍රසාදයද, බද්ධ වෛරයද අත්හැර එකටඑක කිරීම නැති කරන්නේද, හෙතෙම ඒකාන්තයෙන් සුභාෂිත ධර්මය අවබොධ කරන්නේය" (යි වදාළසේක.)

5. මෙසේ වදාළ කළ පච්චනිකසාත බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. යම්සේ යටිමුව කරන ලද්දක් හෝ උඩුමුව කරන්නේද, වැසුන දෙයක් හෝ විවෘතකරන්නේද, මංමුළාවූවකුට හෝ මාර්ගය කියන්නේද, 'ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේද, එසේම පින්වත් ගෞතමයන් වහන්සේ

විසින් නොයෙක් අයුරින් ධර්මය ප්‍රකාශ කරන ලද්දේය. පින්වත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිහිම්කොට සරණගත උපාසකයෙකැයි සලකන සේක්වා.”

---

## 7. නවකම්මික සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කොසොල්රට එක්තරා වනලැහැබෙක වසනසේක.

2. එකල වනාහි නවකම්මිකභාරද්වාජ බමුණුතෙම ඒ වනලැහැබෙහි කර්මාන්ත කරවයි. එක්තරා සල් රුකක් මුල පළක් බැඳ ශරීරය ඍජුව පිහිටුවා සිහිය ඉදිරියට එළවා හුන් භාග්‍යවතුන් වහන්සේ නවකම්මිකභාරද්වාජ බමුණුතෙම දිටීය. දැක ඔහුට මෙබඳු සිතෙක් විය: ‘මම මේ වනලැහැබෙහි කර්මාන්ත කරවමින් සතුටුවෙමි. මේ ශ්‍රමණ ගෞතමයන්වහන්සේ කුමක් කරවමින් සතුටුවන සේක්ද?’

3. ඉක්බිති නවකම්මිකභාරද්වාජ බමුණු තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් (මෙසේ) කීය

> “මහණ, සල් වෙනෙහි නුඹගේ කිනම් කර්මාන්ත කරවනු ලැබෙද්ද? ගෞතමයන් වහන්සේ යම්හෙයෙකින් මේ වෙනෙහි තනිව සතුට විඳිනසේක්ද?”

> 4. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක:) “මට මේ වෙනෙහි කටයුත්තෙක් නැත. මාගේ (ක්ලෙශ) වනය උදුරා දැමූ මුල් ඇත්තේය. එහෙයින්ම පහවගිය කෙලෙස් කටු ඇත්තේය. ඒ මම කෙලෙස් රහිතව කලකිරීම පහව ගිය (රාගාදී) හුල් ඇත්තෙක්ව, විශේෂයෙන් පහකොට තනිව ප්‍රීතිය විඳිමි.”

5 මෙසේ වදාළ කල නවකම්මිකභාරද්වාජ බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය: “පින්වත් ගෞතමයන්

වහන්ස, ඉතා මැනවි පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. යම්සේ යටිමුව කරන ලද්දක් හෝ උඩුමුව කරන්නේද, වැසුන දෙයක් හෝ විවෘතකරන්නේද, මංමුළාවූවකුට හෝ මාර්ගය කියන්නේද, 'ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේද, එසේම පින්වත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය ප්‍රකාශ කරන ලද්දේය. පින්වත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිහිම්කොට සරණගත් උපාසකයෙකැයි සලකන සේක්වා"

---

## 8. කට්ඨහාර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කොසොල් දනව්වෙහි එක්තරා වනලැහැබෙක වසනසේක.

2. එකල වනාහි එක්තරා භාරද්වාජගෝත්‍රික බමුණෙකුගේ අතවැසියන්වූ බොහෝ කට්ඨහාරක නම් මානවකයෝ, වනලැහැබ යම් තැනෙකද එතැනට පැමිණියෝය. පැමිණ ඒ වනලැහැබෙහි පර්යංකයක් බැඳ, කය ඍජුව තබා, සිහිය ඉදිරියට එළවා හුන් භාග්‍යවතුන් වහන්සේ දුටුහු.

3. දැක භාරද්වාජගෝත්‍රික බමුණා යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාරද්වාජගෝත්‍රික බමුණාට මෙය කීය. "අසුවල් වනලැහැබෙහි ශ්‍රමණයෙක් පළක්බැඳ, කය ඍජුව තබා, සිහිය ඉදිරියෙහි එළවා හුන්නේයයි පින්වත්වූ ඔබ දන්නෙහිද?"

4. ඉක්බිති භාරද්වාජගෝත්‍රික බමුණුතෙම ඒ මානවකයන් සමග ඒ වනලැහැබ යම් තැනෙකද එතැනට පැමිණියෝය. පැමිණ ඒ වනලැහැබෙහි පළක් බැඳ, කය ඍජුව තබා, සිහිය ඉදිරියෙහි එළවා වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දුටුයේය. දැක භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට ගාථාවලින් (මෙසේ) කීය.

"මහණ, ඔබ (මිනිස් වාසයෙන්) තොරවූ, ජනයන්ගෙන් හිස්වූ වනයට පැමිණ, ගැඹුරු ස්වභාව ඇති, බොහෝසේ භයංකරවූ මේ වෙනෙහි කම්පා නොවන, නොසැලෙන්නාවූ මනෝඥ ශරීරයකින් යුක්තව, ඉතා යහපත්වූ ධ්‍යාන වඩනසේක.

"යම් තැනෙක ගී කීම් නැද්ද, යම් තැනෙක වාදනයකුත් නැද්ද, (එවැනි) වනයෙහි මුනීන්ද්‍රයන් වහන්සේ තනිව වන සෙනසුන් ඇසුරු කළසේක්, යම් හෙයකින් තනිවම ප්‍රීතිමත් සිතැතිව වෙනෙහි වාසය කරන්නේද මේ කාරණය පුදුමයක්සේ මට වැටහෙයි."

"ලෝකාධිපතියා (මහා බ්‍රහ්මයා) හා එක්ව විසීම ඇති බඹලොව පතමින් ඔබ මේ වෙනෙහි වසනසේකැයි මම හඟිමි. (නොඑසේ නම්) පින්වතුන් වහන්සේ කවර හෙයින් ජනසූන්‍ය වනය ඇසුරුකළ සේක්ද? බ්‍රහ්ම ලෝකයට පැමිණීම පිණිස මෙහි තපස් කරන සේක්ද?"

**5.** (එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක:) "යම්කිසි තණ්හාවක් හෝ ප්‍රාර්ථනාවක් හෝ නොයෙක් ස්වභාවාරම්මණයන්හිවූ නිතර පවත්නා නොයෙක් ප්‍රකාර තණ්හාවක් හෝ සෙසු කෙලෙස් හෝ වේද, අවිද්‍යාව මුල්ව හටගත් නැවත නැවත පැමිණීම් වශයෙන්වූ ඒ සියලුම ක්ලේශයන් මා විසින් සහමුලින් නසන ලද්දාහ"

"බමුණ, ඒ මම තණ්හා රහිත වූයෙමි, තණ්හාව ඇසුරු නොකෙළෙමි, තෘෂ්ණා කරා නොඑළඹෙන්නෙමි. සියලු ධර්මයන්හි පිරිසුදු දැකුම් ඇත්තෙමි, බමුණ, ඒ ඊට වඩා උතුම් දෙයක් නැති, ශාන්තවූ සම්බෝධියට පැමිණ, පහවූ භය ඇත්තෙම් තනිව ධ්‍යානයෙහි යෙදී සිටිමි"

**6.** මෙසේ වදාළකල භාරද්වාජගෝත්‍රික බමුණු තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. "පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. යම්සේ යටිමුව කරන ලද්දක් හෝ උඩුමුව කරන්නේද, වැසුන

දෙයක් හෝ විවෘතකරන්නේද, මංමුළාවූවකුට හෝ මාර්ගය කියන්නේද, ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේද, එසේම පින්වත් ගෞතමයන්වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය ප්‍රකාශ කරන ලද්දේය. භාග්‍යවතුන් වහන්සේ මා අද පටන් දිවිහිම් කොට සරණ ගිය උපාසකයකුසේ සලකන සේක්වා"

---

## 9. මාතුපෝසක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි පිහිටි අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. ඉක්බිති මාතුපෝසක බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු සාමීචි කථා කෙළේය. සතුටුවිය යුතුවූ, සිහිකටයුතුවූ කථාකොට නිමවා එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් මාතුපෝසක බමුණු තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. "භවත් ගෞතමයන්වහන්ස, මම වනාහි දැහැමින් ආහාර සොයමි. දැහැමින් ආහාර සොයා මවුපියන් පෝෂණය කරමි. පින්වත් ගෞතමයන්වහන්ස, කිම? මෙසේ කරන මම යහපත් කටයුතු කරන්නෙක් වෙම්ද?"

3. (එවිට භාග්‍යවතුන් වහන්සේ:) "මෙසේ කරන තෝ ඒකාන්තයෙන් යහපත් කටයුතු ඇත්තෙක් වූයෙහිය. බමුණ, යමෙක් දැහැමින් ආහාර සොයයිද, දැහැමින් ආහාර සොයා මවුපියන් පෝෂණය කෙරේද, හෙතෙම බොහෝ පින් රැස් කරයි.

> "යම් මනුෂ්‍යයෙක් මව හෝ පියා හෝ දැහැමින් පෝෂණය කරයිද, මවුපියන් කෙරෙහි ඒ මෙහෙකිරීම හේතුකොට නුවණැත්තෝ ඔහුට මෙලොවද ප්‍රශංසා කරත්. ඔහු මරණින් මතු ස්වර්ගයෙහිද ඉපිද සතුටු වේ"යි (වදාළසේක)

4. මෙසේ වදාළ කල මාතුපෝසක බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය: "පින්වත් ගෞතමයන්වහන්ස ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි යම්සේ යටිමුව කරන ලද්දක් හෝ උඩුමුව කරන්නේද, වැසුන දෙයක් හෝ විවෘතකරන්නේද, මංමුළාවූවකුට හෝ මාර්ගය කියන්නේද, ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේද, එසේම පින්වත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය ප්‍රකාශ කරන ලද්දේය. භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිහිම් කොට සරණගත උපාසකයකු කොට සලකන සේක්වා"

---

## 10. භික්ඛක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. ඉක්බිති භික්ඛක (සිඟීමෙන් ජීවත්වන) බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු සාමීචි කථා කෙළේය, සතුටුවිය යුතු කථා සිහිකටයුතු කථා කොට නිමවා එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් භික්ඛක බමණුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීය: "මම ආහාර සිඟන්නෙක් වෙමි. පින්වත්වූ ඔබද ආහාර සිඟන්නෙක් වෙහිය. මෙහි අපගේ කවර නම් වෙනසක් වේද?"

3. "යම් පමණෙකින් අනුන් (ගෙන්) සිඟාද, එපමණෙකින් (ඒ තැනැත්තා) භික්ෂූ නම් නොවේ. අකුසල ධර්මය සමාදන්වීම පමණකිනුදු භික්ෂු නම් නොවේ.

"මේ ලෝකයෙහි යමෙක් කුසලයද, අකුසලයද පහකොට, බ්‍රාහ්මචර්‍ය්‍යාව ඇත්තේ, නුවණින් දැන ලොව හැසිරේද, එබඳු තැනැත්තා ඒකාන්තයෙන් භික්ෂුයයි කියනු ලැබේ."

4. මෙසේ වදාළ කල භික්ඛක බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයඃ "භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. භවත් ගෞතමයන් වහන්ස, යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ වැසුනක් විවෘත කරන්නේ හෝ මංමුළාවූවකුට මාර්ගය කියන්නේ හෝ 'ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි තෙල් පහනක් දරන්නේ හෝ යම්සේද, එසේම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය පවසන ලද්දේය. ඒ (ඇසූ) මම භවත් ගෞතමයන් වහන්සේ හා ධර්මයද, සංඝයාද සරණකොට යෙමි. භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවි කෙළවර කොට සරණ ගිය උපාසකයකු කොට දරණ සේක්වා." මා අද පටන් දිවිහිම් කොට සරණ ගිය උපාසකයකු කොට භාග්‍යවතුන් වහන්සේ සලකන සේක්වා."

---

## 11. සඞ්ගාරව සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල වනාහි සඞ්ගාරව බමුණුතෙම සැවැත් නුවර වෙසෙයි. (හෙතෙම) ජලයෙන් ශුද්ධිය ඇත්තේයයි සලකන්නේ ජලයෙන් ශුද්ධිය පතයි. සවස හා උදේ (උදේ සවස) ජලයට බැසීමෙහි මහත්සේ යෙදී වෙසෙයි.

3. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම පෙරවරුයෙහි හැඳ පෙරව පාත්‍ර සිවුරු ගෙන සැවැත්නුවරට පිණ්ඩපාතය පිණිස පිවිසියේය. පිඬු පිණිස හැසිර බතින් පසු පෙරළා පිටත්වූයේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයඃ "ස්වාමීනි, මෙහි සඞ්ගාරව නම්

බමුණුතෙම සැවැත් නුවර වෙසෙයි. (ඔහු) ජලයෙන් ශුද්ධිය ඇත්තේයයි සිතා ජලයෙහි ශුද්ධිය පතයි. උදේ හා සවස ජලයට බැසීමෙහි යෙදුනේව වෙසෙයි. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ සඞ්ගාරව බමුණාගේ නිවෙසට ඔහුට අනුකම්පා උපදවා පැමිණෙන සේක් නම් මැනව." භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දව ඉවසා වදාළසේක.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන සඞ්ගාරව බමුණාගේ නිවෙස යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ පැනවූ අස්නෙහි වැඩහුන් සේක.

5. ඉක්බිති සඞ්ගාරව බමුණුතෙම භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු සාමීචි කථා කෙළේය. සතුටුවිය යුතු සිහිකට යුතු කථා කොට නිමවා එකත්පසෙක හුන්නේය. එකත්පසෙක හුන් සඞ්ගාරව බමුණාහට භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේකඃ "බමුණ, නුඹ ජලයෙන් ශුද්ධිය ඇතිසේ සිතන්නේ ජලයෙන් ශුද්ධිය පතයිලු, සවස හා උදේ ජලයට බැසීමෙහි යෙදුනේව වෙසේලු, ඒ සැබෑද?"

6. "පින්වත් ගෞතමයන්වහන්ස, ඒ එසේය."

7. "බමුණ, නුඹ කවර අර්ථයක් දකිමින් ජලයෙන් ශුද්ධිය ඇත්තේයයි සිතා ජලයෙන් ශුද්ධිය පතයිද? සවස හා උදේ දියට බැසීමෙහි අනුයුක්තව වෙසේද?"

8. "භවත් ගෞතමයන් වහන්ස, මෙහි මා විසින් දවල් යම් පව් කමෙක් කරන ලද්දේ වේද, එය සවස නෑමෙන් පාකර හරිමි. රාත්‍රියෙහි යම් පව් කමෙක් කරන ලද්දේද, එය උදෑසන නෑමෙන් පාකර හරිමි. භවත් ගෞතමයන් වහන්ස, මම මේ ප්‍රයෝජනය දකිමින් ජලයෙන් ශුද්ධි ඇත්තේ යයි සිතා දියෙන් ශුද්ධිය පතමි. සවස හා උදේ දියට බැසීමෙහි නැවත නැවත යෙදී වෙසෙමි."

9. "බමුණ, ධර්මය ගැඹුරු ජලාසයවේ. ශීලය තොට වේ. එය විශේෂයෙන් ප්‍රසන්නය. සාධූන් විසින් හැම කල්හි පසස්නා ලදී. යම් ධර්ම ජලාසයක ස්නානය කළ ඥානවන්තයෝ (ආර්‍ය්‍යයෝ) වෙත්ද, ඔවුහු නොතෙත්වූ සිරුරු ඇත්තෝවම (නිර්වාණ) පරතෙරට ඒකාන්තයෙන් යෙත්."

10. මෙසේ වදාළ සඳ සඞ්ගාරව බමුණුතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයඃ "භවත් ගෞතමයන්වහන්ස, ඉතා මැනවි. භවත් ගෞතමයන්වහන්ස, ඉතා මැනවි. භවත් ගෞතමයන් වහන්ස, යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ වැසුනක් විවෘත කරන්නේ හෝ මංමුළාවූවකුට මාර්ගය කියන්නේ හෝ 'ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි තෙල් පහනක් දරන්නේ හෝ යම්සේද, එසේම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය පවසන ලද්දේය. ඒ (ඇසූ) මම භවත් ගෞතමයන් වහන්සේ හා ධර්මයද සංඝයාද සරණකොට යමි, භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවි කෙළවර කොට සරණ ගිය උපාසකයකු කොට දරණ සේක්වා." භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිහිම් කොට සරණගිය උපාසකයෙකු කොට සලකන සේක්වා."

---

## 12. ඛෝමදුස්ස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යයන්ගේ ඛෝමදුස්ස නම් නියම්ගමෙහි වැඩවසන සේක.

2. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරවා පාත්‍ර සිවුරු ගෙන ඛෝමදුස්ස නම් නියම්ගමට පිඩු පිණිස වැඩිසේක.

3. එසමයෙහි වනාහි ඛෝමදුස්ස වැසි බමුණු ගෘහපතියෝ යම්කිසි කටයුත්තක් පිණිස සභායෙහි රැස්වූවාහු වෙත්. වර්ෂාවද පොදින් පොද වැස්සාය.

4. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ ඒ සභාව යම් තැනෙකද එතැනට පැමිණිසේක. බෝමදුස්සක බමුණු ගෘහපතිහු වඩින්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුරදීම දුටුවාහුය. දැක මෙය කීහ: "මුඬුහු ශ්‍රමණයෝ කවරහුද? සභාධර්මය කවරෙක් දනිත්ද?'

5. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ බෝමදුස්සක බමුණු ගෘහපතීන්ට ගාථායෙන් මෙසේ වදාළසේක.

> "යම් සභායෙක්හි (පණ්ඩිත) සත්පුරුෂයෝ නැත්ද ඒ සභා නොවන්නීය. යම් කෙනෙක් ධර්මය නොකියද්ද, ඔහු සත්පුරුෂයෝ නොවෙති. රාගයද, ද්වෙෂයද, මෝහයද දුරුකොට, ධර්මය (සත්‍යය) කියන්නෝම සත්පුරුෂයෝ වෙති."

6. මෙසේ වදාළ සඳ බෝමදුස්සක බමුණු ගෘහපතිහු භාග්‍යවතුන්වහන්සේට මෙය කීවෝය: "පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. පින්වත් ගෞතමයන් වහන්ස, යටිමුව කරණ ලද්දක් උඩුමුව කරන්නේ හෝ වසන ලද දෙයක් විවෘත කරන්නේ හෝ මංමුළාවූවකුට මග කියන්නේ හෝ 'ඇස් ඇත්තෝ රූප දකිත්වා'යි තෙල් පහනක් දරන්නේ හෝ යම්සේද, එසේම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය පවසන ලද්දේය. මේ අපි සංඝයා හා ධර්මය සහිත භවත් ගෞතමයන් වහන්සේම සරණකොට යමු. භවත් ගෞතමයන් වහන්සේ අප අද පටන් දිවිහිම් කොට සරණගත උපාසකයන් මෙන් සලකන සේක්වා."

දෙවෙනි උපාසක වර්ගයයි.

බ්‍රාහ්මණ සංයුත්තය නිමියේය

---

# 8. වඞ්ගීස සංයුත්තය.

## i වඞ්ගීස වර්ගය.

### 1. නික්ඛන්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරතෙම අලව් නුවර අග්ගාළව චෛත්‍යයෙහි නිග්‍රෝධමූලයෙහි වෙසෙන ස්වකීය උපාධ්‍යාය කප්ප තෙරුන් වෙසෙයි.

2. එකල වනාහි ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරතෙම අලුත පැවිදිවූයේ විහාරය රක්නා පිණිස නවතා යන ලද නවකයෙක් (අලුත පැවිද්දෙක්) විය.

3. ඉක්බිති බොහෝ ස්ත්‍රීහු සැරසීගෙන විහාරය බලනු කැමැත්තාහු ආරාමයට පැමිණියහ.

4. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීසයන්ට ඒ ස්ත්‍රීන් දැක අනභිරතිය කුසල් කිරීමෙහි නොකැමැත්ත උපන. රාගය (ඔහුගේ කුසල්) සිත නැසීය.

5. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීසයන්ට මෙබඳු සිතෙක් විය: යම්බඳුවූ මට නොකැමැත්ත උපදීද, රාගය තෙමේ (මාගේ) කුසල චිත්තය නැසීද, එබඳුවූ මට ඒකාන්තයෙන් අලාභයෙක්ම විය. මට ඒකාන්තයෙන් ලාභයෙක් නම් නොවීය. මා විසින් ඒකාන්තයෙන් නපුරක්ම ලබනලද. ඒකාන්තයෙන් යහපතක් නම් නොලද්දේය. අන්‍යයෙක් මාගේ නොඇල්ම දුරුකොට ඇල්ම උපදවන්නේය යන්නක් කොයින් ලැබිය හැකිද? යම් හෙයකින් මමම මාගේ නොඇල්ම දුරුකොට ඇල්ම උපදවම් නම් ඒ ඉතා මැනව" (කියායි.)

6. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීය ස්ථවිරතෙම තමාම තමාගේ නොඇල්ම දුරුකොට ඇල්ම උපදවා ඒ වේලෙහි ගාථාවන් මෙසේ කීය:

"ගිහිගෙන් නික්මුණාවූ, පැවිද්දට පැමිණියාවූ මා කරා මාරයා වෙතින් නැගුණු බිය සැක නැති ඒ විතර්කයෝ (කල්පනා) ඒකාන්තයෙන් දිව එති.

"උතුම් කුලපුත්‍රවූ, මහත් දුනුගත්තාවූ, දුනු ශිල්පයෙහි මොනවට පුහුණුවූ, උත්තම ප්‍රමාණයෙහි අති විශාල දුනු දරන්නාවූ, (නිර්භීත ධනුර්ධරයන්) දහසක් දෙන (ඔවුන්ගේ ඊතල) හාත්පස විසුරුවත්ද,

"ඒ නමුත් ඊටත් වඩාවූ ස්ත්‍රීන් පැමිණියත් ඔවුහු මා නොපෙළන්නාහුය. මම ස්වකීය ධර්මයෙහි පිහිටියේ වෙමි

"සූර්‍ය්‍යබන්ධුවූ සර්වඥයන් වහන්සේගේ හමුයෙන්ම මේ නිර්වාණ ගමන මාර්ගය මා විසින් අසන ලද්දෙමි. එහි මාගේ සිත ඇලුනේ වේ.

"පවිටු මාරය, ඉදින් මෙසේ වාසය කරන්නාවූ මා කරා තෝ පැමිණෙහිද? මා ගිය මගවත් යම්සේ තෝ නොදක්නෙහිද, එසේ කරන්නෙමි."

---

## 2. අරති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරතෙම අළවිනුවර අග්ගළාව චෛත්‍යයෙහි ස්වකීය උපාද්ධ්‍යායවූ ආයුෂ්මත් නිග්‍රෝධකප්ප ස්ථවිරයන් වහන්සේ සමග වෙසෙයි.

2. එකල වනාහි ආයුෂ්මත් නිග්‍රෝධකප්ප ස්ථවිරයන් වහන්සේ පසුබත්හි පිණ්ඩපාතය ඉක්මවූයේ වෙහෙරට පැමිණෙයි. (එසේ පැමිණ) සවස හෝ පසුවදා පිණ්ඩපාත කාලයෙහි හෝ ඉන් බැහැර යෙති.

3. එකල වනාහි ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරයන්ට ශාසනයෙහි නොඇල්මෙක් උපන්නේ වෙයි. රාගය (කුසල් සිත) විනාශ කරයි.

**4.** ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරයන් වහන්සේට මෙබඳු අදහසෙක් විය: "යම්බඳුවූ මට ශාසනයෙහි නොඇල්ම උපදීද, රාගය කුසල් සිත නසයිද, එබඳුවූ මට ඒකාන්තයෙන් අලාභයෙක්ම විය. ලාභයෙක් නොවීය. මවිසින් ඒකාන්තයෙන් නපුරක් ලබනලදී. යහපතක් නොලද්දේය. අන්‍යයෙක් මාගේ ශාසනයෙහි නොඇල්ම දුරුකොට ඇල්ම උපදවන්නේය යන්නක් කොයින් ලැබිය හැකිද? යම් හේතුවකින් මමම මාගේ නොඇල්ම දුරුකොට ඇල්ම උපදවම් නම් ඒ ඉතා මැනව" (යි කියායි.)

**5.** ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරයන් වහන්සේ තමාම තමාගේ නොඇල්ම දුරුකොට ඇල්ම උපදවා ඒ වේලායෙහි ගාථාවෙන් මෙසේ කීහ:

> **6.** "(ශාසනයෙහි) නොඇල්මද, (කාම ගුණයන්හි) ඇල්මද, කාමගුණ ඇසුරු කළාවූ (ලාමකවූ) විතර්කයද, සියලු ආකාරයෙන් දුරුකොට, කිසි අරමුණෙක ක්ලෙශ නමැති මහා වනය නොකරන්නේ (නොවටින්නේ) ද, කෙලෙස් වන නැති, තණ්හා ඇල්ම නැති, හෙතෙම භික්ෂු නම් වේ.
>
> **7.** "මෙලොව පොළොවෙහි පිහිටි දේද, අහසෙහිවූ දේද, පෘථිවිය තුළවූ දේද, යම්කිසි රූපයෙක් වේ නම් ඒ සියල්ලද, සම්පූර්ණයෙන් දිරයි, අනිත්‍යයි, දැනගන්නාලද ආත්මභාවය ඇති නුවණැත්තෝ මෙසේ අවබෝධකොට වෙසෙත්.
>
> **8.** ලෞකික සත්වයෝ උපධීන්හිද, දක්නාලද රූපයන්හි හා අසනලද ශබ්දයන්හිද, ගන්ධ රස දෙක්හිද, ස්පර්ශයෙහිද, ගැලුණාහු වෙත්. යමෙක් මේ පඤ්චකාමයෙහි ආශාව දුරුකොට, තණ්හාව නැත්තේ, මෙහි නොඇලේ නම්, ඔහු මුනියයි කියත්.
>
> **9.** "තවද රූපාදි අරමුණු සය ඇසුරු කළ බොහෝ අධර්ම විතර්කයෝ සත්ත්වයන් තුළ බැසගනිත්. යමෙක්

කිසි තැනෙකත් ඒ කෙලෙස් වසයට නොපැමිණෙන්නේද, අශිෂ්ට වචන කියන්නෙක් නොවන්නේද, හෙතෙම භික්ෂු නම් වන්නේය.

10. පණ්ඩිතවූ, දීර්ඝ කාලයක් මුලුල්ලෙහි වඩන ලද සමාධි ඇති, කුහක නොවූ, පැසුණු ප්‍රඥා ඇති, තණ්හා නැති, මුනිවරයා නිර්වාණයට පැමිණියේය. එසේ නිර්වාණයට පැමිණ, ක්ලෙශ පරිනිර්වාණයෙන් පිරිනිවියේ පිරිනිවෙන කාලය බලාපොරොත්තු වෙයි."

---

## 3. පේසල අතිමඤ්ඤනා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරතෙම අළවි රට අග්ගළාව චෛත්‍යයෙහි තමන්ගේ උපාද්ධ්‍යායවූ ආයුෂ්මත් නිග්‍රෝධකප්ප ස්ථවිරයන් වහන්සේ සමග වාසය කෙරෙයි.

2. එකල ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරතෙම තමාගේ වැටහෙන ඥානය කරණකොට අනෙක් සිල්වත් භික්ෂූන් අවමන් කරන්නේය.

3. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීසස්ථවිරයන්ට මෙබඳු අදහසෙක් විය: 'මම මාගේ වැටහෙන ඥානය කරණකොට අනෙක් සිල්වත් භික්ෂූන් අවමන් කරන්නෙමි. එබඳුවූ මට ඉන් ඒකාන්තයෙන් අලාභයෝ වන්නාහ. ලාභයෝ නොවන්නාහ. මා විසින් ඒකාන්තයෙන් එයින් නපුරක්ම ලබන ලද්දේය. යහපතක් නොලබන ලද්දේය.'

4. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීසස්ථවිරතෙම තමාම තමා තුළම පසුතැවිල්ල උපදවා ඒ වේලායෙහි මේ ගාථාවන් කීය:

"ගෞතමය මානය සම්පූර්ණයෙන්ම දුරු කරව. මානයේ අරමුණුද, මානය සමග උපදනා ධර්මද, හාත්පසින් බැහැර කරව. මානයාගේ අරමුණු සහ මානය සමග උපදනා

ධර්මයන්හිද මුළාවූ තැනැත්තේ බොහෝ කාලයක් මුලුල්ලෙහි පසුතැවිල්ල ඇත්තෙක් වීය.

"අනුන් ගුණ මකන ස්වභාවයෙන් මැකුනාවූ සත්ත්වයෝ මානයෙන් වැසුනාහු නරකයෙහි වැටෙත්. මානයෙන් වැනසුනු ඒ සත්ත්වයෝ නිරයෙහි ඉපිද දිගුකලක් මුළුල්ලෙහි ශෝක කෙරෙත්.

"ආය්‍ය්‍ර මාර්ගයෙන් කෙලෙස් නැසූ සම්‍යක් ප්‍රතිපදාවෙහි මනාව පිළිපන්නාවූ මහණතෙම, කිසි කලෙකත් ශෝක නොකෙරේමය. හෙතෙම කීර්තියද, සුවයද අනුභව කරයි. ස්ථිර සිත් ඇති උන්වහන්සේ ධර්මය අවබෝධ කළ තැනැත්තේයිද කියත්.

"එහෙයින් මේ ශාසනයෙහි කෙලෙස් බාධාවන් නැත්තාවූ වීය්‍ය්‍රයෙන් යුත් භික්ෂුතෙම නීවරණයන් පහකොට හාත්පසින් පිරිසිදුද වෙයි. සියලු මානය නසා, මාර්ග විද්‍යාවෙන් කෙලෙස් කෙළවර කරන්නෙක්ද වෙයි. කෙලෙසුන් සමනය කරන්නෙක්ද වෙයි."

---

## 4. ආනන්ද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. ඉක්බිති ආයුෂ්මත් ආනන්දස්ථවිර තෙම පෙරවරුයෙහි හැඳ පෙරවා පාත්‍ර සිවුරුගෙන, පසු සමණකු වශයෙන් ආයුෂ්මත් වඞ්ගීසයන් ගෙන, සැවැත්නුවරට පිඬු පිණිස පිවිසියේය.

3. එකල ආයුෂ්මත් වඞ්ගීස තෙරුන්ට ශාසනයෙහි නොඇල්ම උපන්නේ වෙයි, රාගයද (ඔහුගේ) සිත නසයි.

4. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීසතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට ගාථායෙන් (මෙසේ) කීය:

"ගෞතම ගොත්‍රයෙහිවූ ආනන්දයන් වහන්ස, මම කාම රාගයෙන් දැවෙමි. මාගේ සිත හාත්පසින් දැවෙයි. අනුකම්පාකොට (මාහට) එය නිවන ක්‍රමයක් වදාළ මැනව."

5. "සංඥා විපර්‍ය්‍යාස හේතුවෙන් තාගේ සිත දැවෙයි. රාගෝත්පත්තියට හේතුවූ ශුභ වශයෙන් ගන්නා ලද අරමුණ දුරු කරව.

"සියලු සංස්කාරයන් අනිත්‍ය වශයෙන් බලව, දුක් වශයෙන් බලව, ආත්ම වශයෙන් නොබලව. මහා රාග ගින්න නිවව, ඉන් නැවත නැවත නොදැවෙව.

"අශුභ භාවනාවෙන් සිත එකඟ කොට, වඩව. තොපට කය අනුව ගියාවූ සිහිය වේවා. කලකිරීම බහුල කොට ඇතියෙක් වෙව.

"විදර්ශනාවද වඩව. මානානුසය උදුරා හරුව. එසේ මානය නැති කිරීම හේතුකොටගෙන සන්සිඳුනෙක්ව හැසිරෙන්නෙහිය."

---

## 5. සුභාසිත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල වනාහි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන්ට කථාකළ සේක. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂුහු පිළිවදන් දුන්හ.

3. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේකඃ "මහණෙනි කරුණු සතරෙකින් යුක්තවූ වචනය සුභාසිත වෙයි දුර්භාෂිත නොවෙයි, දොස් නැතිද වෙයි, නුවණැත්තන් විසින් වරද නොකියන ලද්දේවෙයි. කවර සතරකින්ද යත්. මහණෙනි, මහණතෙම යහපත් වචනයක්ම කියයිද, අයහපත් වචනයක් නොකියයිද ධර්මයම කියයිද, අධර්මයක් නොකියයිද, ප්‍රිය වූවක්ම

කියයිද, අප්‍රිය වූවක් නොකියයිද, සත්‍යයක්ම කියයිද අසත්‍යයක් නොකියයිද, මහණෙනි, මේ අංග සතරෙන් සමන්විත වචනය සුභාෂිත වෙයි, දුර්භාෂිත නොවෙයි, දොස් නැතිද වෙයි, නුවණැත්තන් විසින් වරද නොකියන ලද්දේද වෙයි.”

**4.** භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේක. ශාස්තෘවූ සුගතයන් වහන්සේ මෙය වදාරා නැවත මේ (ගාථාවන්) වදාළ සේක.

“(බුද්ධාදී) සත්පුරුෂයෝ උතුම් සුභාෂිතයක්ම කියත්. දැහැමිවූවක්ම කියන්නේය. දැහැමි නොවූවක් නොකියන්නේය. එය දෙවෙනි අංගයයි. ප්‍රියවූවක්ම කියන්නේය. අප්‍රිය වූවක් නොකියන්නේය. එය තුන් වෙනි අංගයයි. සත්‍යයක්ම කියන්නේය. බොරු නොකියන්නේය. එය සතරවෙනි අංගයයි.”

**5.** ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිර තෙම අසුනෙන් නැගිට සිවුර ඒකාංශකොට පොරවා භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ මෙය කීය. “භාග්‍යවතුන් වහන්ස, මට (කරුණක්) වැටහෙයි, සුගතයන් වහන්ස, මට වැටහෙයි.”

**6.** වඞ්ගීස, තට වැටහේවා, (ඒ කියව)”යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

**7.** ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි සුදුසු ගාථායෙන් ස්තුති කෙළේය.

“යම් වචනයක් කරණකොට තමාත් නොතැවෙන්නේද, අනුනුත් නොවෙහෙසන්නේද, ඒ මානය ඒකාන්තයෙන් සුභාෂිත නම්වේ. එබඳු වචනම කියන්නේය.

‘යම් වචනයක් ප්‍රියද ඒ ප්‍රිය වචනයම කියන්නේය, යම් හෙයකින් ඒ ලාමක වචන නොගෙන ප්‍රිය බස්ම අනුන්ට කියන්නේය.

“සත්‍ය වචනය ඒකාන්තයෙන් අමෘත වචනයයි. මේ පුරාණ සිරිතයි. සත්පුරුෂයෝ සත්‍යයෙහිද, තමන්ට සහ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

අනුන්ට අප්‍රිය සහිතද, උභයාර්ථයෙහිද, ධර්මයෙහිද පිහිටියෝයයි කියත්.

"බුදුරජාණන් වහන්සේ නිවන් පැමිණීම පිණිස, දුක් කෙළවර කිරීම පිණිස, නිර්භයට හෙතුවූ යම් බසක් වදාරත්ද ඒ වචනය (සියලු) වචනයන් අතුරෙන් ඒකාන්තයෙන් උතුම්වේ.

---

## 6. සාරිපුත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක ආයුෂ්මත් ශාරීපුත්ත ස්ථවිර තෙම සැවැත්නුවර සමීපයේ වූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක.

2. එසමයෙහි ආයුෂ්මත් සාරිපුත්ත ස්ථවිර තෙම සම්පූර්ණවූ, ගොත නොගසන්නාවූ, නිර්දෝෂවූ, නොගිලිහුණු පද ව්‍යඤ්ජන ඇත්තාවූ, අර්ථය හැඟවීමෙහි සමර්ථවූ වචන ඇති, දැහැමි කථායෙන් භික්ෂූන්ට කරුණු දක්වයි. පිළිගැන්වීම අවබෝධ කරවයි, තෙදගන්වයි, සතුටු කරවයි. ඒ භික්ෂූහුද අර්ථවත් කොට, මෙනෙහි කොට, එහි ප්‍රයෝජනය තකා ඒ කරුණු හාත් පසින් සිතට ඇතුළු කොට, කන් යොමු කොට ඒ ධර්මය අසත්.

3. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරයන්ට මෙබඳු අදහසෙක් විය. "මේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිර තෙම සම්පූර්ණවූ, ගොත නොගසන්නාවූ, නිර්දෝෂවූ, නොගිලිහුණු පද ව්‍යඤ්ජන ඇති, අර්ථය හැඟවීමට සමර්ථ වචන ඇති, දැහැමි කථායෙන් භික්ෂූන්ට කරුණු දක්වයි. පිළිගැන්වීම අවබෝධ කරවයි, තෙදගන්වයි, සතුටු කරවයි ඒ භික්ෂූහුද අර්ථවත් කොට, මෙනෙහි කොට, සියල්ල සිතට ඇතුළුකොට, කන් යොමුකොට ධර්මය අසති. මම ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් හමුවෙහි සුදුසු ගාථායෙන් ප්‍රසංශා කරන්නෙම් නම් මැනවැ"යි (කියායි.)

4. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිර තෙම අසුනෙන් නැගිට සිවුර ඒකාංශකොට සැරියුත්තෙරුන් වෙත ඇඳිලිබැඳ (අත් එකට

තබා වැඳ) ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට මෙසේ කීය. "ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, මට (අදහසක්) වැටහේ. ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, මට (කරුණක්) වැටහේ." "ආයුෂ්මත් වඞ්ගීසයෙනි, එය (තොපට) වැටහේවා."

5. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරතෙම ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් හමුයෙහි සුදුසු ගාථායෙන් ප්‍රසංශා කෙළේය.

"ගැඹුරු ප්‍රඥා ඇති, නුවණැති, මාර්ගාමාර්ග දැනීමෙහි දක්ෂ, මහා ප්‍රඥාවත්වූ ශාරීපුත්‍ර ස්ථවිරතෙම භික්ෂූන්ට ධර්ම දෙශනා කරයි.

"(හෙතෙම) සංක්ෂෙපයෙන්ද දේශනා කරයි, විස්තර වශයෙන්ද බණ වදාරයි. මධුරස්වරය සැළලිහිණි හඬ හා සමානය. ප්‍රතිභාණය නගී.

"(භික්ෂූහු) ඇලුම් කටයුතුවූ, ශ්‍රවණය කටයුතුවූ, ප්‍රීතිගෙන දෙන ස්වරයෙන් යුක්තවූ, දහම් දෙසන ඔහුගේ මිහිරි තෙපුල් අසත්. ඔද වැඩි සිත් ඇති, ප්‍රමුදිත සිත් ඇති, ඒ භික්ෂූහු ඔහුගේ වචනයට කන් යොමු කෙරෙත්."

---

## 7. පවාරණ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර පූර්වාරාමයෙහි මිගාරමාතු ප්‍රාසාදයෙහි සියලුදෙනම රහත්වූ පන්සියයක් පමණ භික්ෂුන්ගෙන් යුත් මහත් භික්ෂු සංඝයා සමග වැඩවසනසේක.

2. එකල භාග්‍යවතුන් වහන්සේ එදිනට පැමිණි පසළොස්වක් පොහෝ දිනයෙහි වස්පවාරණය පිණිස භික්ෂු සංඝයා විසින් පිරිවරනලද සේක් එළිමහනෙහි වැඩහුන් සේක.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දවූ සංඝයා බලා භික්ෂූන්ට කථාකළ සේක. "මහණෙනි, දැන් ඉතින් තොපගෙන් විචාරමි. මාගේ කායික හෝ වාචසික කිසිවකට තෙපි ගරහව්ද?"

4. මෙසේ වදාළ කල ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිර තෙම අස්නෙන් නැගිට සිවුර ඒකාංශකොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය: "ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේගේ කායිකවූ හෝ වාචසිකවූ හෝ කිසිවක් නොගරහමු. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වනාහි නොයිපදවූ, ඇති මාර්ගය ඉපිදවූ සේක. (කලින් නොතිබූ) මාර්ගය ඇතිකළ සේක. අන් කෙනෙකු නොදෙසූ මාර්ගය දෙසූසේක. මාර්ගය දත්සේක, මාර්ගය අවබෝධ කළසේක, මාර්ගයෙහි දක්ෂසේක. ස්වාමීනි, දැන් ශ්‍රාවකයෝ (ඔබ) දැක්වූ මාර්ගයට අනුව යමින් වෙසෙත්. (ඔවුහු) ඒ මාර්ගය (ඔබට) පසුව ලබාගත්තෝ වෙති. ස්වාමීනි, මමත් භාග්‍යවතුන් වහන්සේ අතින් විචාරමි. කායිකවූ හෝ වාචසිකවූ හෝ මාගේ කිසිවකට භාග්‍යවතුන් වහන්සේ ගරහත්ද?"

5. "ශාරීපුත්‍රය, තාගේ කායිකවූ හෝ වාචසිකවූ හෝ කිසිවකට මම නොගරහමි. ශාරීපුත්‍රය, තෝ පණ්ඩිතයෙහිය. ශාරීපුත්‍රය, තෝ මහාප්‍රාඥාවෙහිය. ශාරීපුත්‍රය, තෝ පැතිරසිටි ප්‍රඥා ඇත්තෙහිය. ශාරීපුත්‍රය, තෝ බබළන ප්‍රඥා ඇත්තෙහිය. ශාරීපුත්‍රය, තෝ ජවන (වහා ක්‍රියාකරන) ප්‍රඥා ඇත්තෙහිය. ශාරීපුත්‍රය, තෝ තීක්ෂණ ප්‍රාඥයෙහිය. ශාරීපුත්‍රය, තෝ නිර්වෙධික (විනිවිද යන) ප්‍රඥා ඇත්තෙහිය. ශාරීපුත්‍රය, සක්විති රජුගේ වැඩිමහල් පුත්තෙම පියා විසින් පවත්වනලද (ආඥා) චක්‍රය මනාව (ඔහු) අනුව පවත්වන්නේ යම්සේද, ශාරීපුත්‍රය, එසේම මා විසින් පවත්වන ලද ධර්මචක්‍රය තෝ යහපත් ලෙස (මා) අනුව පවත්වන්නෙහිය."

6. "ස්වාමීනි, ඉදින් භාග්‍යවතුන් වහන්සේ මාගේ කය හෝ වචනය පිළිබඳ කිසිවකට නොගරහන සේක් නම්, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මේ පන්සියයක් භික්ෂූන්ගේ කායිකවූ හෝ වාචසිකවූ හෝ කිසිවකටත් නොගරහන සේක්ද?"

7. "ශාරිපුත්‍රය, මම මේ පන්සියයක් භික්ෂූන්ගේද කායිකවූද වාචසිකවූද කිසිවකට නොගරහමි. ශාරීපුත්‍රය, මේ පන්සියයක් භික්ෂූන් අතුරෙන් සැට දෙනෙක් ත්‍රිවිද්‍යාලාභීහුය, සැට දෙනෙක්

ෂඩභිඥා ලාභිහුය, සැට දෙනෙක් උභතො විමුක්තයහ, (අරූප සමාපත්ති අර්හත් මාර්ග යන දෙයාකාරයෙන් මිදුණාහු) නැවත අන්‍යයෝ ප්‍රඥාවිමුක්තයහ” (ප්‍රඥාවෙන් මිදුණාහු.)

8. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරතෙම අස්නෙන් නැගිට සිවුර ඒකාංශකොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ (වැඳ) භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. “භාග්‍යවතුන් වහන්ස, මට අදහසක් වැටහේ. සුගතයන් වහන්ස, මට (අදහසක්) වැටහේ”

9. “වඞ්ගීස, තොට ඒ වැටහේවා”යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

10. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි සුදුසු ගාථාවලින් ප්‍රශංසා කළේය.

“සංයෝජන වූද, බන්ධන වූද කෙලෙස් සිඳදැමූ, දුක් නැත්තා වූ මතු ඉපදීම නැතිකළා වූ, ඍෂි වූ, පන්සියයක් භික්ෂුහු අද පසළොස්වක පොහෝ දින විශුද්ධිය පිණිස රැස්වූහ.

“සක්විති රජ තෙම ඇමති ගණයා විසින් පිරිවරණ ලදුව සාගරය කෙළවර කොට ඇති මේ පෘථිවිය හාත්පස යම් සේ පිළිවෙලින් ගමන් කෙරේද,

“එසේම ත්‍රිවිද්‍යාලාභීවූ, (කෙලෙස්) මරුන් නැසූ ශ්‍රාවකයෝ දිනන ලද (රාග ද්වේෂ මෝහ) යුද්ධ ඇති, නිරුත්තර, (තමාට වඩා උසස් කෙනෙක් නැති) සත්ථවාහයන් (නම් වූ භාග්‍යවතුන්) වහන්සේ ආශ්‍රය කෙරෙත්.

“මේ සියල්ලෝම භාග්‍යවතුන් වහන්සේගේ පුත්‍රයෝ වෙති. මේ පිරිස්හි ඇතුළ හිස් දුශ්ශීලයෙක් නැත. තණ්හා හුල නසන්නාවූ සූර්‍ය්‍යබන්ධුවූ සර්වඥයන් වහන්සේ වඳිමි.”

## 8. පරෝසහස්ස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි එක්දහස් දෙසිය පනසක් පමණ වූ භික්ෂූන් ඇති මහත් භික්ෂු සංඝයා සමග වසනසේක.

2. එකල වනාහි භාග්‍යවතුන් වහන්සේ නිවන් පිළිබඳ ධර්ම කථායෙන් භික්ෂූන්ට කරුණු දක්වන සේක. ඔවුන් එහි අවබොධ කරවන සේක, තෙද ගන්වන සේක. සතුටු කරවන සේක. ඒ භික්ෂූහුද අර්ථවත් කොට, මෙනෙහි කොට, මුළු සිත එහි යොමු කොට, කන්යොමා ධර්මය අසත්.

3. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස තෙරුන්ට මෙබඳු අදහසෙක් වීය: "මේ භාග්‍යවතුන් වහන්සේ නිවන් පිළිබඳ කථායෙන් භික්ෂුන්ට කරුණු දක්වන සේක, ඔවුන්ට අවබෝධ කරවන සේක, තෙද ගන්වන සේක, සතුටු කරවන සේක, ඒ භික්ෂූහු ද අර්ථවත් කොට, මෙනෙහි කොට, සිතට ඇතුළු කොට, කන් යොමා ධර්මය අසති. මම භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි සුදුසු ගාථායෙන් ප්‍රශංසා කරන්නෙම් නම් මැනවැ" (යි කියායි).

4. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරතෙම අස්නෙන් නැගිට සිවුර එකාංශ කොට ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට මෙය කීය: "භාග්‍යවතුන් වහන්ස, මට (අදහසක්) වැටහෙයි. සුගතයන් වහන්ස, මට (අදහසක්) වැටහෙයි."

5. වඞ්ගීසය, තට වැටහේ වා"යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

6. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි සුදුසු ගාථායෙන් ප්‍රශංසාකළේය.

> "දහසකට අධිකවූ භික්ෂු සංඝ තෙම භයෙන් මිදුනු නිර්මල වූ, නිර්වාණධර්මය දේශනා කරන සුගතයන් වහන්සේ ආශ්‍රය කෙරෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"සම්මාසම්බුදුන් විසින් දේශනා කළ නිර්මල ධර්මය (ඔවුහු) අසත්. භික්ෂු සංඝයා විසින් පෙරටුකොට පිහිටුවා ගත් සම්බුද්ධයන් වහන්සේ ඒකාන්තයෙන් හොබනා සේක

"භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ (පව් නොකරන හෙයින්) නාග නම් වන සේක. ඍෂීන් අතුරෙන් ශ්‍රෙෂ්ඨතම ඍෂි වන සේක, මහා මේඝයක් මෙන් ශ්‍රාවකයන් වැස්සෙන් තෙමන සේක.

"මහා වීරයන් වහන්ස, ඔබ වහන්සේගේ ශ්‍රාවකවූ වඞ්ගීස තෙම ශාස්තෲන් වහන්සේ දකිනු කැමැත්තෙන් දිවා විහරණයෙන් නික්ම අවුත් සිරිපා වඳී."

7. "කිමෙක් ද වඞ්ගීස, තා විසින් මේ ගාථා පෙර කල්පනා කොට කරලද්දාහු ද නොහොත් ඒ හිටිවනම තාගේ සිතට නැගුනාහු ද?"

8. "ස්වාමීනි, මේ ගාථා මා විසින් පෙර නොසිතන ලද්දෝය. ප්‍රස්තාවට සුදුසු සේම මට වැටහී ගියහ."

9. "වඞ්ගීසය, එසේ වී නම් පෙර නොසිතන ලද ගාථාවෝ තව බොහෝ සෙයින් තට වැටහෙත්වා."

10. "එසේය, ස්වාමීනි"යි භාග්‍යවතුන් වහන්සේට ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරතෙම උත්තර දී පෙර නොසිතන ලද තව බොහෝ වූ ගාථායෙන් භාග්‍යවතුන් වහන්සේ ප්‍රශංසා කළේය.

"මාරයාගේ උමං මාර්ගයන් මැඩ, ඛීලයන් (බාධාවන්) බිඳ ඔබවහන්සේ හැසිරෙණ සේක. (කෙලෙස්) බැඳුම් මුදන (රාගාදීන්ගේ) ආශ්‍රයෙක් නැති, කොටස් වශයෙන් ධර්මය බෙදන්නා වූ ඒ තථාගතයන් වහන්සේ බලව්. "(කාමාදී) ඕඝය (සැඩපහර) එතරකරන පිණිස නොයෙක් ආකාර මාර්ගය ඔබ වදාළසේක. උන්වහන්සේ විසින් වදාරණ ලද ඒ අමෘතයෙහි ඔවුහු ධර්ම දර්ශීව, රාගාදියෙන් ගෙනයා නොහැක්කේව සිටිත්.

"ඥානාලෝකය පහළකළ ධර්මය අවබෝධ කොට, සකල දෘෂ්ටිස්ථානයන්ගේ ඉක්මවීම (නම් නිර්වාණය) දුටුසේක. දැනද ප්‍රත්‍යක්ෂ කොටද, ඒ උත්තම ධර්මය පස්වග මහණුන්ට දෙසූ සේක.

"මෙසේ සුදේසිත ධර්මය දන්නවුන්ගේ එහි කවර ප්‍රමාදයෙක්ද? එහෙයින් තථාගතයන්ට වඳිමින් හැම කල්හි ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි අප්‍රමාදී ව පිළිවෙළින් හික්මෙන්නේය."

---

## 9. කොණ්ඩඤ්ඤ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දක නිවාපනම්වූ වෙළුවනාරාමයෙහි වැඩ වසන සේක.

2. ඉක්බිති ආයුෂ්මත් අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරතෙම බොහෝ කලෙකින් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ පා මුල සිරසින් වැටී මුවින් පා සිඹීමද අතින් පිරිමැදීමද කෙරෙයි. භවත් ගෞතමයන්, වහන්ස, මම කොණ්ඩඤ්ඤ වෙමි, භවත් සුගතයන් වහන්ස මම කොණ්ඩඤ්ඤ වෙමියි, නමද ප්‍රකාශ කරයි.

3. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරයන්ට මෙබඳු අදහසෙක් විය: "ආයුෂ්මත් අඤ්ඤාකොණ්ඩඤ්ඤා ස්ථවිරතෙම බොහෝ කලෙකින් භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණි භාග්‍යවතුන් වහන්සේගේ පා මුල හිසින් වැටී මුවින් පා සිඹීමද අතින් පිරිමැදීමද කෙරෙයි, භාග්‍යවතුන් වහන්ස, මම කොණ්ඩඤ්ඤවෙමි, සුගතයන් වහන්ස, මම කොණ්ඩඤ්ඤ වෙමි, කියා නමද ප්‍රකාශ කරයි. මම ආයුෂ්මත් අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරුන් භාග්‍යවතුන් වහන්ස හමුයෙහිදී

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සුදුසු ගාථායෙන් ප්‍රශංසා කරන්නෙම් නම් ඉතා මැනව' (යි කියායි).

**4.** ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරතෙම අස්නෙන් නැගිට සිවුර ඒකාංශකොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ මෙසේ කීයඃ "භාග්‍යවතුන් වහන්ස, මට (අදහසක්) වැටහෙයි. සුගතයන් වහන්ස, මට අදහසක් වැටහෙයි."

**5.** "වඞ්ගීසය, තට ඒ වැටහේවා"යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

**6.** ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරතෙම, ආයුෂ්මත් අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්ථවිරයන් භාග්‍යවතුන් වහන්සේ හමුයෙහිදී සුදුසු ගාථායෙන් ප්‍රශංසා කළේය.

"බුද්ධානුබුද්ධවූ, තියුණු වීර්‍ය්‍ය ඇති, ඒ කොණ්ඩඤ්ඤ ස්ථවිරතෙම සැප විහරණ ඇති, චිත්තවිවේකයන් නිතර ලබන්නේ වෙයි.

"ශාස්තෘශාසනකාරීවූ ශ්‍රාවකයකු විසින් යම් මාර්ග ඵලාවබොධයක් වෙත පැමිණිය යුතුද, අප්‍රමාදීව හික්මෙන ඒ කොණ්ඩඤ්ඤ තෙරුන් විසින් ඒ සියලු මාර්ගඵලාවබොධයන් වෙත පැමිණෙන ලදී.

'මහානුභාව ඇති, ත්‍රිවිද්‍යාලාභී, සිත පිළිබඳ සියලු දේ දැනුමෙහි දක්ෂවූ, බුදුන් විසින් දුන් ධර්ම දායාද ඇති, කොණ්ඩඤ්ඤ ස්ථවිරතෙම ශාස්තෘන් වහන්සේගේ (සිරි) පා වදී."

---

## 10. මොග්ගල්ලාන සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ඉසිගිලි පර්වත පාර්ශවයෙහි කාළසිලායෙහි සියලුදෙනම රහත්වූ භික්ෂූන් පන්සියයක් පමණවූ මහත් භික්ෂු සංඝයා සමග වසන සේක. ආයුෂ්මත් මහා

මොග්ගල්ලාන ස්ථවිරතෙම තම සිතින් විශේෂයෙන් මිදුනු, කෙලෙස් රහිත ඔවුන්ගේ සිත් සොයයි. (ප්‍රත්‍යවේක්ෂා කරයි.)

2. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරයන්ට මෙබඳු අදහසෙක් විය. "මේ භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ඉසිගිලි පර්වත පාර්ශවයෙහි කාළශිලායෙහි සියලුදෙනම රහත්වූ භික්ෂූන් පන්සියයක් පමණවූ මහත් භික්ෂුසංඝයා සමග වසනසේක. එහි වනාහි මහාමොග්ගල්ලාන ස්ථවිර තෙම තම සිතින් ඔවුන්ගේ විශේෂයෙන් මිදුනු කෙලෙස් රහිත සිත් සොයයි මම ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් භාග්‍යවතුන් වහන්සේ හමුයෙහිදී සුදුසු ගාථායෙන් ප්‍රශංසා කරන්නෙහි නම් මැනව"

3. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරතෙම අස්නෙන් නැගිට සිවුර එකාංශ කොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලිබැඳ (වැඳ) මෙය කීයඃ "භාග්‍යවතුන් වහන්ස, මට (අදහසක්) වැටහෙයි. සුගතයන්වහන්ස, (මට අදහසක්) වැටහෙයි."

4. "වඞ්ගීසය, තට වැටහේවා"යි භාග්‍යවතුන්වහන්සේ වදාළසේක.

5. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරතෙම ආයුෂ්මත් මහාමොග්ගල්ලාන ස්ථවිරයන් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහිදී සුදුසු ගාථායෙන් ප්‍රශංසා කෙළේය.

'ත්‍රිවිද්‍යාවත්වූ, (කෙලෙස්) මරු නසා සිටි, (බුද්ධ) ශ්‍රාවකයෝ පර්වත පාර්ශ්වයෙහි වැඩහුන්, දුක් කෙළවරට පැමිණි, සම්බුදු මුනිහු ආශ්‍රය කෙරෙත්.

"මහත් ඍද්ධි ඇති මොග්ගල්ලාන ස්ථවිරතෙම ඒ ශ්‍රාවකයන්ගේ සිත් මිදුනේද කෙලෙස් රහිතදැයි සොයමින් සිතින් ඒ ශ්‍රාවකයන් පසුපස්සේ යෙයි.

"මෙසේ (ඒ ශ්‍රාවකයෝද මුගලන් තෙරහුද) සියලු ගුණාංගයෙන් යුක්තවූ, දුකින් මිදී පරතෙරට ගියාවූ, අනේක ගුණයන්ගෙන් යුක්තවූ මුනිතුමන් ආශ්‍රය කෙරෙත්."

## 11. ගග්ගරා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ චම්පානුවර ගර්ගරා පොකුණුතෙර පන්සියයක් භික්ෂූන්ගෙන් යුත් මහත් භික්ෂුසංඝයාද, සත්සියයක් උපාසකයන්ද, නොයෙක් දහස් ගණන් දේවතාවන්ද සමග වසන සේක. එහි වනාහි භාග්‍යවතුන් වහන්සේ ශරීර වර්ණයෙන්ද යසසින්ද ඔවුන් පරදවා බබළන සේක.

2. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරයන්ට මෙබඳු අදහසෙක් වීය. "මේ භාග්‍යවතුන්වහන්සේ චම්පා නුවර ගර්ගරා පොකුණුතෙර පන්සියයක් භික්ෂූන්ගෙන් යුත් මහත් භික්ෂු සංඝයාද, සත්සියයක් උපාසකයන්ද, නොයෙක් දහස් ගණන් දේවතාවන්ද සමග වසනසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ වනාහි ශරීර වර්ණයෙන්ද යසසින්ද ඔවුන් පරදවා බබළනසේක. මම භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි සුදුසු ගාථායෙන් (උන්වහන්සේ) ප්‍රශංසා කරන්නෙම් නම් මැනව."

3. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරතෙම අස්නෙන් නැගිට උතුරුසළු එකස්කොට පොරවා භාග්‍යවතුන්වහන්සේට ඇඳිලිබැඳ (වැඳ) මෙය කීයඃ "භාග්‍යවතුන් වහන්ස, මට (අදහසක්) වැටහෙයි, සුගතයන්වහන්ස, මට (අදහසක්) වැටහෙයි."

4. "වඞ්ගීසය, තට වැටහේවා"යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

5. ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි සුදුසු ගාථායෙන් උන්වහන්සේ ප්‍රශංසා කළේය.

"චන්ද්‍රතෙම වළා පහවූ අහස්හි යම්සේ බබළාද, නිර්මලවූ සූර්‍ය්‍යී තෙමේත් යම්සේ බබළාද' මහා මුනිවූ අංගීරසයන් වහන්ස, නුඹවහන්සේද එසේම යසසින් සියලු ලෝකයා ඉක්මවා බබළනසේක."

---

## 12. වඞ්ගීස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවන ආරාමයෙහි වැඩවසන සේක.

2. එකල ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරතෙම අළුත රහත් වූයේව, අර්හත් ඵල සමාපත්ති සැපය විඳිනුයේ ඒ වේලෙහි ගාථාවෙන් මෙසේ කීය.

"පෙර ගමින් ගමද, නුවරින් නුවරද, කවි කීමෙන් මත්ව හැසුරුනම්හ. ඉක්බිති සම්බුද්ධයන් වහන්සේ දුටුම්හ. එසඳ අපට ශ්‍රද්ධා තොමෝ උපනි.

"ඒ තථාගතයන්වහන්සේ මට ස්කන්ධායතනධාතූන් (ප්‍රකාශ කෙරෙමින්) ධර්මය දෙසූසේක. උන්වහන්සේගේ ධර්මය අසා අනගාරිකවූ ශාසනයෙහි පැවිදිවූයෙමි.

"යම් කෙනෙක් නියත නිර්වාණ මාර්ගයට පැමිණියෝද බොහෝවූ ඒ භික්ෂූන්ටද භික්ෂුණීන්ටද අර්ථ පිණිස මුනිතුමා සම්බොධියට පැමිණිසේක.

"බුදුන්ගේ සමීපයට මාගේ පැමිණීම මට ඒකාන්තයෙන් යහපත් ඊමක් වූයේය. මා විසින් ත්‍රිවිද්‍යාවෝ ලබන ලද්දාහුය. සර්වඥයන්වහන්සේගේ අනුශාසනය මා විසින් (සම්පූර්ණ) කරන ලද්දේය.

"පෙර විසූ ජාති පිළිවෙළ දනිමි. දිවැස විශෙෂයෙන් පිරිසිදු කරන ලද්දේය. (මම දිවැස් ලදිමි) මම ත්‍රිවිද්‍යා ඇත්තෙක්මි. ඍද්ධිවිධ ඥානයට පැමිණියේ වෙමි. සිත පිළිබඳ සියලු දේ දැනුමෙහි දක්ෂවෙමි."

වඞ්ගීස සංයුත්තය නිමියේය.

---

# 9. වන සංයුත්තය.

## i වන වර්ගය.

### 1. විවේක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක එක්තරා භික්ෂුවක් කොසොල් රට එක්තරා වනලැහැබෙක වෙසෙයි.

2. එකල වනාහි ඒ භික්ෂුව දහවල් විවේකයට ගියේ ලාමකවූ පාප චේතනාවන් සිතයි.

3. ඉක්බිති ඒ වනලැහැබෙහි අරක්ගත් යම් දේවතාවෙක් වූයේද, ඒ භික්ෂුව කෙරෙහි අනුකම්පා ඇත්තේ, ඔහුට වැඩ කැමැත්තේ, ඒ භික්ෂුව උනන්දු කරනු කැමැත්තේ, ඒ භික්ෂුව යම් තැනෙකද, එතැනට පැමිණියේය.

4. පැමිණ, ඒ භික්ෂුවට ගාථායෙන් (මෙසේ) කීයඃ

"(ත්‍රිවිධ) විවේකය පතමින් ඔබ මේ වනයට පිවිසියෙහිය. එහෙත් ඔබගේ සිත බාහිරවූ අරමුණු කෙරෙහි හැසිරෙයි. ජනයකුවූ ඔබ (අන්‍ය) ජනයා කෙරෙහි (ඇති) ඡන්ද රාගය නසව. ඉන්පසු පහවූ රාග ඇත්තෙක්ව සුවෙන් කල් යවව.

"(කර්මස්ථාන භාවනා පිරීමෙහි) නොකැමැත්ත බැහැර කරව. සිහි ඇති වෙව. සිහි ඇතිව විසීම සත්පුරුෂයන්ගේ ධර්මයයි. කෙලෙස් දූවිලි සහිත ආශාව තරණයට දුෂ්කරය. මේ කාමරාගය තා (අපායට) නොහෙළාවා.

"පස් තැවැරුණු පක්ෂියෙක් (පියාපත්) සොලොවමින් ශරීරයෙහි ඇලුනු දූවිලි යම්සේ ඉවත හෙළාද, එසේම කෙලෙසුන් තැවීමේ වීර්‍ය්‍යය ඇති සිහි ඇති මහණතෙම ඇලුනු (කෙලෙස්) ධූලි ඉවත හෙළයි."

5. ඉක්බිති ඒ භික්ෂුතෙම ඒ දෙවතාවා විසින් උනන්දු භාවයට පමුණුවනු ලදුයේ උනන්දුභාවයට පැමිණියේය.

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 2. උපට්ඨාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක එක්තරා භික්ෂුවක් කොසොල්රට එක්තරා වනලැහැබෙක වෙසෙයි.

2. එකල වනාහි ඒ භික්ෂුව දහවල් විවේකයට ගියේ නිදයි. ඉක්බිති ඒ වනලැහැබෙහි අරක්ගත් යම් දේවතාවෙක් වූයේද, හෙතෙම ඒ භික්ෂුවට අනුකම්පා සහිතවූයේ, හිත කැමැත්තේ, ඒ භික්ෂුව උනන්දු කරනු කැමැත්තේ ඒ භික්ෂුව යම්තැනෙකද එතැනට පැමිණියේය.

3. පැමිණ, ඒ භික්ෂුවට ගාථායෙන් (මෙසේ) කීයඃ

"මහණ, නැගිටුව. කිම නිදන්නෙහි ද? නින්දෙන් තට කිනම් ප්‍රයෝජනයෙක් ද? ක්ලේශාතුර වූ, තෘෂ්ණා නමැති හුලින් හෘදය විදින ලද්දා වූ, වෙහෙසෙන්නාවූ, යුෂ්මත්හුට කවර නින්දක් ද?

"යම් බඳු ශ්‍රද්ධායෙකින් ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදි වූයෙහි ද, ඒ ශ්‍රද්ධාවට වඩා නින්දට වසඟ නොවව."

1. "යම් කාමයන්හි නුවණ මඳ වූ පෘථග්ජන තෙමේ මුසපත් වූයේ ද, එම කාමයෝ අනිත්‍යයෝය, නස්නා සුලුයහ. බන්ධනයන් කෙරෙන් මිදුනා වූ, තණ්හාවෙන් නොබැඳුනා වූ, ආශ්‍රවයන් නැතිකළ (රහත්) පැවිද්දෙකු (වූ මා) කවර හෙයකින් තවන්නේ ද?

"ඡන්දරාගය වැනසීම නිසාද, අවිද්‍යාව ඉක්ම වූ බැවින්ද, ඒ ඥානය අතිශයින් පිරිසිදුය, (එබඳු නුවණැති) පැවිද්දකු කවර හෙයකින් තවන්නේ ද?

"විද්‍යායෙන් අවිද්‍යාව බිඳ, (කාමාදී) ආශ්‍රවයන් ක්ෂයකිරීම් හේතුවෙන් ශෝක නැත්තා වූ, උපායාස (තද ශෝක) නැත්තා වූ පැවිද්දකු කවර හෙයකින් (නිදිව) තවන්නේ ද? (නොතවන්නේමය.)

"සම්පූර්ණ වීර්‍යය ඇති, නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති, දැඩි පරාක්‍රමයෙන් යුත්, නිවන් පතන්නා වූ පැවිද්දකු කවර හෙයෙකින් නිදීම තවන්නේ ද?"

---

## 3. කස්සපගොත්ත (නොහොත් චේත) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක ආයුෂ්මත් කාශ්‍යපගෝත්‍ර තෙම කොසොල් රට එක්තරා වනලැහැබෙක වෙසෙයි.

2. එසමයෙහි වනාහි ආයුෂ්මත් කාශ්‍යපගෝත්‍ර තෙම දහවල් විවේකයට ගියේ එක්තරා වැද්දෙකුට (මුවන් මරන්නෙකුට) අවවාද කරයි.

3. ඉක්බිති ඒ වනලැහැබෙහි අරක්ගත් දේවතාවා ආයුෂ්මත් කාශ්‍යපගෝත්‍රයාහට අනුකම්පා කරන්නේ, වැඩකැමැත්තේ, ආයුෂ්මත් කාශ්‍යප ගෝත්‍රයන් උනන්දු කරවනු කැමැත්තේ, කාශ්‍යප ගෝත්‍රයන් යම්තැනකද, එතැනට පැමිණියේය.

4. පැමිණ ආයුෂ්මත් කාශ්‍යපගෝත්‍රට ගාථායෙන් (මෙසේ) කීය.

"පර්වත දුර්ගයෙහි (යාමට අපහසු තැනෙහි) හැසිරෙන්නාවූ, නුනුවණ නැත්තාවූ කාරණාකාරණා දැනීමෙහි සමර්ථනොවූ මුව වැද්දෙකුට නොකල්හි අවවාද කරන්නාවූ මහණතෙම අඥාන මෙන් මට වැටහේ.

හෙතෙම අසයි; එහි අර්ථය නොදනී, බලයි; එහෙත් නොදකී, බණ කියන කල්හි ඒ අඥානතෙම අර්ථය අවබොධ නොකෙරෙයි.

"කාශ්‍යපය, තෝ ඉදින් පහන් (ආලෝක) දසයක් දරන්නෙහි නමුත් හෙතෙම (හේතු) රූපයන් නොදකීමය. යම් හේතුවකින් ඕහට (ප්‍රඥා) ඇස නැද්ද, එහෙයිනි."

5. ඉක්බිති ආයුෂ්මත් කාශ්‍යපගෝත්‍ර තෙම ඒ දෙවතාවා විසින් උනන්දු කරන ලද්දේ සංවේගයට පැමිණියේය.

## 4. සම්බහුලා (නොහොත් චාරිකා) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක බොහෝ භික්ෂූහු කොසොල්රට එක්තරා වනලැහැබෙක වසත්.

2. ඉක්බිති ඒ භික්ෂූහු වස් වැසුවා තුන්මාසය ඇවෑමෙන් චාරිකාවට (ගමන් කිරීමට) ගියහ.

3. ඉක්බිති ඒ වන ලැහැබෙහි අරක්ගත් දේවතාවා ඒ භික්ෂූන් නොදක්නේ, ඒ වේලාවෙහි මේ ගාථාව කීයː

"හිස්වූ බොහෝ ආසන දැක මට නොඇල්මක් මෙන් වැටහෙයි. විසිතුරු ධර්ම කථා ඇත්තාවූ, බහුශ්‍රැතවූ ඒ මේ ගෞතම ශ්‍රාවකයෝ කොයි වැඩියෝ ද?"

4. මෙසේ කීකල අනික් දේවතාවෙක් ඒ දේවතාවාට ගාථායෙන් පිළිතුරු කීයː

"(ඇතැම් කෙනෙක්) මගධ දනව්වට ගියෝය. (ඇතැම් කෙනෙක්) කොසොල් දනව්වට ගියෝය. ඇතැම් කෙනෙක් වැදෑ රටට ගියෝය. භික්ෂූහු එකම ස්ථානයෙක ඇල්මක් නැතිව හැසිරෙන්නාහු ගෙවල් නැති මුවන් මෙන් වෙසෙත්."

---

## 5. ආනන්ද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම කොසොල් රට එක්තරා වනලැහැබෙක වෙසෙයි.

2. එකල වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම බොහෝ වේලා ගිහියන් සැනසීමෙහි යෙදී වෙසෙයි.

3. එකල්හි ඒ වනලැහැබ අරක්ගත් දේවතාවෙක් ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්ට අනුකම්පා කරන්නේ, හිතවැඩ කැමැත්තේ, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් සංවේග කරනු කැමැත්තේ, උන්වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට ගාථායෙන් කීය.

"රුක්මුල් සෙනසුන්හි විසීමට පැමිණ, නිර්වාණය හෘදයෙහි බහා ගෙන වසන්නාවූ නුඹවහන්සේට (ගිහියන් සමග කරන) මේ බිළි බිළි කථාව කුමක් කරන්නේ ද? ගෞතම ශ්‍රාවකයන් වහන්ස, ප්‍රමාද නැත්තෙක වව. භාවනාවෙහි යෙදව."

4. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම ඒ දෙවතාවා විසින් සංවේග කරන ලද්දේ මහත් සංවේග බවට පැමිණියේය.

---

## 6. අනුරුද්ධ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරතෙම කොසොල් රට එක්තරා වනලැහැබෙක වෙසෙයි.

2. ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්ගේ පෙර ආත්ම භාවයෙහි භාර්‍ය්‍යාව වූ ජාලිනී නම් වූ එක්තරා තව්තිසා වැසි දෙව්දුවක් ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් යම් තැනෙකද එතැනට පැමිණියේය.

3. පැමිණ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්ට ගාථායෙන් (මෙසේ) කීවාය:

"ඔබ පෙර යම් දෙව් ලොවෙක වුසුයෙහිද එහි සිත පිහිටුවා, (එවිට) සියලු කාමයෙන් සර්වප්‍රකාරයෙන් සමෘද්ධවූ තව්තිසා දෙවියන් කෙරෙහි දෙවඟනන් විසින් පෙරටු කරන ලදුව, පිරිවරණ ලදුව (ඔබ) බබළන්නෙහිය.

4. (අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ මෙසේ කීය.) දිව්‍යාංගනාවෝ දුකට පැමිණියාහුය, පඤ්චස්කන්ධයෙහි පිහිටියාහුය, දිව්‍යාංගනාවන් විසින් පතනලද ඒ සත්වයෝද දුකට පැමිණියාහුය.

5. (දෙව් දූ මෙසේ කීවාය.) "යම් කෙනෙක් ඉසුරු ඇත්තා වූ, තාවතිංස දිව්‍ය පුරුෂයන්ගේ වාසස්ථාන වූ,

නන්දන නම් වූ උද්‍යානවනය නොදකිත් ද, ඔවුහු සැපය නොදකිත්."

6. (අනුරුද්ධ ස්ථවිරයෝ මෙසේ කීය.) "අඥාන වූ නුඹ රහතුන්ගේ වචනය නියම ලෙසින් නොදන්නෙහිය. සියලු සංස්කාරයෝ අනිත්‍යයෝ ය, ඉපදීම හා නැසීම ස්වභාවකොට ඇත්තෝය. ඉපිද නැතිවෙත්. ඒ සංස්කාරයන්ගේ සංසිඳීමය කියන ලද නිවන සැපය.

"ජාලිනිය, දෙවකායයෙහි නැවත මාගේ විසීමෙක් නැත. ඒ ඒ තන්හි ඉපදීමයයි කියන ලද සංසාරය නිමවන ලදී. දැන් නැවත ඉපදීමක් මට නැත."

---

## 7. නාගදත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක ආයුෂ්මත් නාගදත්ත ස්ථවිරතෙම කොසොල්දනව්වෙහි එක්තරා වනලැහැබෙක වෙසෙයි.

2. එකල වනාහි ආයුෂ්මත් නාගදත්ත ස්ථවිරතෙම ඉතා කල් ඇතිව ගමට පිඬු පිණිස පිවිසෙයි. ඉතා දවල් ඉන් නික්මයෙයි.

3. ඉක්බිති ඒ වනලැහැබෙහි අරක්ගත් දේවතාවෙක් ආයුෂ්මත් නාගදත්ත තෙරුන්ට අනුකම්පා ඇත්තේ, වැඩ කැමැත්තේ, ආයුෂ්මත් නාගදත්තයන් සංවේග කරනු කැමැත්තේ නාගදත්තතෙරුන් යම් තැනෙකද එතැනට පැමිණියේය.

4. පැමිණ, ආයුෂ්මත් නාගදත්තයන්ට ගාථායෙන් (මෙසේ) කීය.

"නාගදත්තය, අලුයම්කලම පිඬු පිණිස ගොස්, ඉතා දවල් ආපසු පැමිණ, ගිහියන් හා ගැටුනේ, සමාන සුව දුක් ඇත්තෙක්ව, කාලවේලාදිය ඉක්මවා හැසිරෙන්නෙහිය,

"ඉතා බුහුටිවූ, කුලයන්හි බැඳුනාවූ, ඒ නාගදත්ත ගැන බය ඇත්තෙමි. බලවත්වූ, මරණයට රජවූ, මාරයා ගේ වශයට (හෙතෙම) නොපැමිණේවා."

5. ඉක්බිති ආයුෂ්මත් නාගදත්ත ස්ථවිරතෙම ඒ දේවතාවා විසින් සංවේග කරන ලද්දේ මහත් සංවේග බවට පැමිණියේය.

---

## 8. කුලඝරණී (නොහොත් ඕගාළ්හ) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක එක්තරා භික්ෂුවක් කොසොල්දනව්වෙහි එක්තරා වනලැහැබෙක වෙසෙයි. එකල ඒ මහණතෙම එක්තරා කුලයෙක ඉතා ඇතුළත් බවට පැමිණියේව වෙසෙයි.

2. ඉක්බිති ඒ වනලැහැබෙහි අරක්ගත් යම් දේවතාවෙක් ඒ භික්ෂුවට අනුකම්පා ඇත්තේ, වැඩ කැමැත්තේ ඒ භික්ෂුව සංවේග කරනු කැමැත්තේ ඒ කුලයෙහි යම් කුල ගැහැණියක් ඇද්ද ඇගේ වේශය මවා ඒ භික්ෂුව යම් තැනෙකද එතැනට පැමිණියේය.

3. පැමිණ ඒ භික්ෂුවට ගාථායෙන් (මෙසේ) කීය.

"ගංතෙරවලද, විඩා සංසිඳුවන තැනද, සභාවලද, වීථිවලද ජනයෝ 'මා'යිද 'තා'යිද (එකිනෙකා ගැන) කථා කෙරෙත්. ඒ කුමන කරුණකින්ද?

4. (භික්ෂුව මෙසේ කීය.) "තාපසයන් විසින් ඉවසිය යුතුවූ මේ ස්වභාවයට විරුද්ධ ශබ්දයෝ ලොව බොහෝ වෙති. ඒ කාරණයෙන් දුර්මුඛ නොවිය යුතුයි. තාපසයා ඒ අනුන් කී බසින් කිලිටි නොවේ.

"යම් තාපසයෙක් වෙනෙහි වෘක මෘගයකු මෙන් සුලු ශබ්දයෙන්ද තැතිගන්නේද, හෙතෙම සැහැල්ලු සිත් ඇත්තෙකැයි කියත්. සැහැල්ලු සිත් ඇති මහණහුගේ සීලය සම්පූර්ණ නොවේ."

---

## 9. වජ්ජිපුත්ත (නොහොත් වේසාලී) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක වජ්ජි පුත්‍රක භික්ෂුවක් විසාලා නුවර අසල යම් කිසි වනලැහැබෙක වෙසෙයි. එකල විසාලා නුවර නැකැත් කෙළියෙක් වෙයි.

2. ඉක්බිති ඒ මහණතෙම විසාලානුවර තූර්‍ය්‍යයන්ගේ ගසන වයන ශබ්දය අසා හඬමින්, ඒ වේලායෙහි මේ ගාථාවන් කීය.

"අපි ආරණ්‍යයෙහි තනිව වනෙහි දමන ලද දර කැල්ලක් මෙන් මෙවැනි රාත්‍රියෙහි වාසය කරම්හ. අපට වැඩි අවාසනාවන්තවූ අන් කවරෙක් නම් වේද?"

3. ඉක්බිති ඒ වනලැහැබෙහි අරක්ගත් දේවතාවෙක් ඒ භික්ෂුවට අනුකම්පා ඇත්තේ, වැඩ කැමැත්තේ, සංවේග කරන කැමැත්තේ ඒ භික්ෂුව යම් තැනෙකද එතැනට පැමිණියේය.

4. පැමිණ ඒ භික්ෂුවට ගාථාවෙන් (මෙසේ) කීය.

"නුඹ ආරණ්‍යයෙහි තනිව, වෙනෙහි දමන ලද දර කැල්ලක් මෙන් වෙසෙහිය. ස්වර්ගයට යන්නහු පතන්නාවූ නිරිසතුන්මෙන් එසේවූ යුෂ්මතුන්ද බොහෝ දෙනෙක් පතත්.

5. ඉක්බිති ඒ භික්ෂුතෙම ඒ දේවතාවා විසින් සංවේග කරන ලද්දේ සංවේගයට පැමිණියේය.

---

## 10. සජ්ක්ධාය (නොහොත් ධම්ම) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක එක්තරා භික්ෂුවක් කොසොල් දනව්වෙහි එක්තරා වනලැහැබෙක වසයි.

2. ඒ භික්ෂුව වනාහි පෙර ඉතා බොහෝ වේලා (ධර්මය) සජ්ක්ධායනා කිරීමෙහි යෙදී වාසය කෙළේය. නමුත් හෙතෙම පසු කලෙක උත්සාහය අඩු වූයේ නිශ්ශබ්ද වූයේ එලසමවත් සුවයෙන් කල්යවයි.

3. ඉක්බිති ඒ වනලැහැබෙහි අරක්ගත් දේවතාවා ඒ භික්ෂුවගෙන් ධර්මයක් නොඅසන්නේ ඒ භික්ෂුව යම් තැනකද එතැනට පැමිණියේය.

4. පැමිණ ඒ භික්ෂුවට ගාථායෙන් මෙසේ කීය.

"මහණ, නුඹ භික්ෂුන් සමග වෙසෙමින් කවර හෙයෙකින් ධර්මපදයන් සජ්ක්ධායනා නොකරන්නෙහිද ධර්මය අසා ප්‍රසාදය ලබයි. මේ ආත්මභාවයෙහිම ප්‍රශංසාවද ලබයි."

5. (භික්ෂුව මෙසේ කීවේය.) "යම්තාක් ආයර්‍ය මාර්ගයෙන් (නිවන් අවබෝධයට) නොපැමිණියෙමුද (ඒ තාක්) පෙර ධර්මපදයන්හි ආශාව මා තුළ වූයේය. යම් හේතුවකින් (දැන්) ආයර්‍යමාර්ගයෙන් යුක්ත යෙම්ද, (එහෙයින් ධර්මය සජ්ඣායනා නොකරම්හ.) ඇසින් දුටු රූපයක් හෝ කණින් ඇසූ ශබ්දයක් හෝ කයින් ස්පර්ශකළ ස්පර්ශයක් හෝ වේද, (ඒ සියල්ලම අනිත්‍යාදි වශයෙන්) දැන බැහැරලීම ආයර්‍යයෝ කියත්.

---

## 11. අයෝනිසෝ (නොහොත් විතක්කිත) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක එක්තරා භික්ෂුවක් කොසොල් දනව්වෙහි එක්තරා වනලැහැබෙක වසෙයි. එකල වනාහි ඒ මහණතෙම දහවල් විවේකයට ගියේ ලාමක අකුසල විතර්කයන් සිතයි. ඒ කවරේද? කාමයන් පිළිබඳ කල්පනාය, ව්‍යාපාදය පිළිබඳ කල්පනාය, විහිංසාව පිළිබඳ කල්පනාය යනුයි.

2. ඉක්බිති ඒ වනලැහැබෙහි අරක්ගත් දේවතාවා ඒ භික්ෂුවට අනුකම්පා ඇත්තේ, වැඩ කැමැත්තේ, ඒ භික්ෂුව යම් සංවේගකරනු කැමැත්තේ, ඒ භික්ෂුව යම් තැනෙකද එතනට පැමිණියේය.

3. පැමිණ ඒ භික්ෂුවට ගාථායෙන් (මෙසේ) කීය.

"නුනුවණින් මෙනෙහි කිරීම නිසා පාප විතර්කයන් විසින් පෙළනු ලබන්නෙහිය. මේ අනුවණ කමින් මෙනෙහි

කිරීම බැහැර කරව, නුවණින් මෙනෙහි කිරීමෙන් කල්පනා කරව.

"ශාස්තෲන්වහන්සේද, ධර්මයද, සංඝයාද මෙනෙහි කොට ඒකාන්තයෙන්ම ප්‍රීතියටද බලවත් ප්‍රීතියට හා සැපයටද, පැමිණෙන්නෙහිය. එයින් ප්‍රීතිය බහුල කොට ඇත්තෙක්ව, දුක කෙළවර කරන්නෙහිය."

4. ඉක්බිති ඒ මහණතෙම ඒ දේවතාවා විසින් සංවේග කරන ලද්දේ මහත් සංවේගයට පැමිණියේය.

---

## 12. මජ්ක්ධන්තික (නොහොත් සණික) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක එක්තරා භික්ෂුවක් කොසොල්දනව්වෙහි එක්තරා වනලැහැබෙක වසයි.

2. ඉක්බිති ඒ වනලැහැබ අරක්ගත් දේවතාවා ඒ භික්ෂුව යම් තැනෙකද එතැනට පැමිණියේය.

3. පැමිණ, ඒ භික්ෂුව සමීපයෙහි මේ ගාථාව කීය:

"ඉර මුදුන් කාලය පැමිණි කල්හි පක්ෂීන් සන්සුන්ව හුන් විට මහ වනය මහ හඬ පතුරුවන්නක් මෙනි. එය මට බියක් සේ වැටහෙයි."

4. (භික්ෂුව මෙසේ කීය:) "ඉර මුදුන් කාලය පැමිණි කල්හි, පක්ෂීන් සන්සුන්ව හුන් විට මහා වනය ශබ්ද කරන්නාක් මෙනි. ඒ මට හිතට මහත් සතුටක් සේ වැටහෙයි."

---

## 13. පාකතින්ද්‍රිය (නොහොත් සම්බහුල භික්ඛු) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක බොහෝ භික්ෂූහු උඩඟු වූවෝ, උස්ව නැඟි මාන නළ ඇත්තෝ, චපල වූවෝ, අසංවර වචන ඇත්තෝ, මුළාවූ සිහි ඇත්තෝ, නුවණ නැත්තෝ,

සමාධි නැත්තෝ, නොදැමුණු ඉන්ද්‍රිය ඇත්තෝ කොසොල් දනව්වෙහි එක්තරා වනලැහැබෙක වෙසෙති.

2. ඉක්බිති ඒ වනලැහැබෙහි අරක්ගත් දේවතාවා ඒ භික්ෂූන්ට අනුකම්පා ඇත්තේ, වැඩ කැමැත්තේ, ඒ භික්ෂූන් සංවේග කරනු කැමැත්තේ ඒ භික්ෂූන් යම් තැනෙකද එතැනට පැමිණියේය.

පැමිණ, ඒ භික්ෂූන්ට ගාථායෙන් (මෙසේ) කීය.

"ගෞතම ශ්‍රාවකවූ භික්ෂූහු පෙර සැපවූ ජීවිකා වෘත්ති ඇත්තෝ වූහ. ආසා නැත්තෝව පිඬුසොයන්නෝ වූහ. (ආශා) රහිතයෝව සෙනසුන් සොයන්නෝ වූහ.

"ලෝකයෙහි අනිත්‍ය බව දැන දුක් කෙළවර කළාහුය.

"මම සංඝයාට ඇඳිලිකොට කියමි. ඇතැම් මහණ කෙනෙක් ගමෙහි ගම්මුදලියන් මෙන් තමා පොෂ්‍ය කිරීමට අපහසු වූවෙක් කොට, කකා ක්ලෙශයන් ගෙන් මුසපත්ව, අනුන්ගේ ගෙවල්වල නිදත්. ඔහු (ආචාර්‍ය්‍ය උපාද්ධ්‍යායන් විසින්) බැහැර කරන ලද්දාහුය. පිහිට රහිතයෝය. ඔවුහු මළවුන් මෙනි.

"යම් මහණ කෙනෙක් ප්‍රමාදව වෙසෙත්ද, ඔවුන් සඳහා මා විසින් මෙය කියන ලද්දේය. යම් මහණ කෙනෙක් අප්‍රමාදව වෙසෙත්ද, උන්වහන්සේට මම නමස්කාර කරමි."

4. ඉක්බිති ඒ භික්ෂූහු ඒ දේවතාවා විසින් සංවේග කරන ලද්දේ සංවේගයට පැමිණියෝය.

---

## 14. පදුමපුප්ඵ (නොහොත් පුණ්ඩරීක) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක එක්තරා භික්ෂුවක් කොසොල් දනව්වෙහි එක්තරා වනලැහැබෙක වෙසෙයි.

**2.** එකල වනාහි ඒ භික්ෂුතෙම පිණ්ඩපාතය නිමවා බත් වළඳා පොකුණට බැස පියුමක් සිඹී.

**3.** ඉක්බිති වනාහි ඒ වනලැහැබෙහි අරක්ගත් දේවතාවා ඒ භික්ෂුව කෙරෙහි අනුකම්පා ඇත්තේ, වැඩ කැමැත්තේ, ඒ භික්ෂුව සංවේග කරනු කැමැත්තේ, ඒ භික්ෂුව යම් තැනෙකද එතැනට පැමිණියේය.

**4.** පැමිණ, ඒ භික්ෂුවට ගාථායෙන් (මෙසේ) කීයඃ

"නොදෙන ලද්දාවූ යම් මේ නෙලුම් මලක් සිඹිනෙහිද, ඒ මෙය සොරකම් කිරීම් අතුරෙන් එක් කොට්ඨාසයෙකී, නිදුකාණෙනි, (එහෙයින් ඔබ) සුවඳ සොරෙක් වෙහිය.',

**5.** (භික්ෂුව මෙසේ කීයඃ) "මම මේ නෙලුම් මල ගෙන නොයමි, නොකඩමි, දුර සිට සිඹිමි. එසේ ඇති කල කවර කාරණයෙකින් සුවඳ සොරායයි කියනු ලැබේද?

"යම් තවුසෙක් තෙම නෙලුම් අල හාරාද, පියුම් නෙලයිද, මෙසේ අපිරිසිදු කර්මාන්ත ඇති ඒ තවුස්තෙම කවර හෙයකින් සුවඳ හොරාය කියා හෝ මල් හොරාය කියා හෝ කියනු නොලැබේද?"

**6.** (දේවතාවා මෙසේ කීයඃ) "ඒ පුරුෂතෙම බොහෝ පව් ඇත්තෙකි. හෙතෙම කිරීමවක් හැඳි වස්ත්‍රය (මල මූත්‍රාදියෙන්) ගැවසුනාක්මෙන්, කෙලෙසින් කිලිටිවූයේ වෙයි. එබඳු ඒ පව්ටා කෙරෙහි මාගේ අවවාදයක් නැත. (ඔබට නම්) අවවාදයක් කියන්ට සුදුසු වෙමි.

"බහුල කෙලෙස් නැත්තාවූ, නිරන්තරයෙන් පිරිසිදු භාවය සොයන්නාවූ පුද්ගලයාගේ කෙසඟක් පමණවූ දෝෂයද වළාපටලයක් පමණ වූවක් මෙන් වැටහේ."

**7.** (භික්ෂුව මෙසේ කීයඃ) "යක්ෂය, තෝ මා ඒකාන්තයෙන් දන්නෙහිය. නැවතද මට අනුකම්පා කරන්නෙහිය. යම් කලෙක මෙබන්දක් දක්නෙහිද, යක්ෂය, මට නැවතද ඒ කියව."

8. (දේවතාවා මෙසේ කීය:) "මහණ, මම ඔබ නිසා ජීවත් නොවෙමි. ඔබගේ මෙහෙකරුවෙක්ද නොවෙමි. යම් කර්මයෙකින් සුගතියට යන්නේද, (ඒ කර්මය) ඔබම දනුව."

9. ඉක්බිති ඒ මහණ ඒ දේවතාවා විසින් සංවේග කරන ලද්දේ සංවේගයට පැමිණියේය.

වනසංයුත්තය නිමියේය.

---

# 10. යක්ඛ සංයුත්තය.

## 1. ඉන්දක (හෙවත් යක්ඛ) වර්ගය.

### 1. ඉන්දක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි ඉන්දකූට පර්වතයෙහි ඉන්දක නම් යක්ෂයාගේ භවනයෙහි වැඩවසන සේක.

2. ඉක්බිති ඉන්දක යක්ෂතෙම වනාහි භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන්වහන්සේට ගාථායෙන් (මෙසේ) කීය.

"සම්බුදුවරයෝ රූපය ජීවය නොවේයයි කියති. ඉදින් මේ (සත්ත්වතෙම) මේ සිරුර කෙසේ නම් විඳීද? මේ සත්ත්වයාගේ ඇට හා මස්පිඬු කොයි සිට ඒද? මේ (සත්ත්වතෙම) කවරහෙයකින් මවුකුසෙහි ඇලී සිටීද?

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.) "පළමුව ප්‍රතිසන්ධි විඥානයත් සමග කලලය වේ. ඒ කලලයෙන් අර්බුදය වේ. ඒ අර්බුදයෙන් පේශිය හටගණී, ඒ පේශියෙන් ඝන නම් මස්පිඬක් හටගණී, ඒ ඝන නම්වූ මස්පිඬෙන් පිළික පසක් හටගණී, ඉන්පසු කෙස්ද, ලොම්ද, නියද හටගණී.

"ඔහුගේ මව යම් ආහාරයකුත් යම් පානයකුත් යම් බොජුනකුත් වළඳාද, මව් කුසට පැමිණි ඒ සත්ත්ව තෙම ඒ ආහාර පානාදියෙන් ඒ මව කුසෙහි යැපෙයි."

---

## 2. සක්ක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ගිජුකුළු පව්වෙහි වැඩ වසනසේක.

2. ඉක්බිති සක්ක නම් යක්ෂතෙම භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් (මෙසේ) කීය.

"පැහැ දැමූ සියලු කෙලෙස් ගැට ඇති, සසරින් විශේෂයෙන් මිදුනාවූ, ශාන්තවූ ඔබට අනුන්ට අනුශාසනා කිරීම නොහොබී."

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක:) " සක්කය, යම් කිසි කරුණක් නිසා එක්ව විසීම ඇති වේද, ප්‍රඥාසහිතවූ (සම්බුද්ධ තෙම) එයට සිතින් අනුකම්පා කරන්නට නොවටී.

"එහෙත් ප්‍රසන්න සිතින් යුතුව අනුන්ට යම් අනුශාසනා කිරීමක් වේද, ඒ කාරණයෙන් (බැඳීමක් ඇති නොවේ.) එබඳු අනුශාසනය අනුකම්පාවයි. කරුණාවයි."

---

## 3. සුචිලෝම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ගයාවට නුදුරෙහි සුචිලෝම යක්ෂයාගේ භවනයෙහි ටඞ්කිතමඤ්චයෙහි වැඩවසනසේක. එකල වනාහි ඛර යක්ෂයාද, සුචිලෝම යක්ෂයාද භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි තැනට නුදුරෙහි ගමන් කෙරෙත්.

**2.** ඉක්බිති ඛර යක්ෂතෙම සූචිලෝම යක්ෂයාට මෙය කීයː "මේ තෙම ශ්‍රමණයෙකි."

**3.** "මේ තෙම ශ්‍රමණයෙක් නොවේ, භයින් පලායන ශ්‍රමණ ප්‍රතිරූපකයෙකි. මේ තෙම ශ්‍රමණයෙක්ද, ශ්‍රමණ ප්‍රතිරූපකයෙක්දැයි සොයා බලන්නෙමි."

**4.** ඉක්බිති සූචිලෝම යක්ෂතෙම භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට කය එළවීය. (ඒ දෙසට කය නැමීය)

**5.** ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ ස්වකීය සිරුර ඉවත් කළ සේක.

**6.** සූචිලෝම යක්ෂතෙම භාග්‍යවතුන් වහන්සේගෙන් "ශ්‍රමණය, මට බිය වෙහිදැ"යි ඇසීය.

**7.** "ඇවැත්නි, මම තට බිය නම් නොවෙමි. එසේවුව තාගේ ස්පර්ශය නපුරැ"යි (වදාළසේක.)

**8.** "මහණ, තාගෙන් ප්‍රශ්නයක් අසන්නෙමි. ඉදින් මහණ, මට ඒ නොවිසඳන්නෙහි නම්, තාගේ සිත හෝ කලබල කරන්නෙමි. තාගේ හෘදය හෝ පළා දමන්නෙමි. තා පාදයෙන් හෝ ගෙන ගඟින් එතෙර දමන්නෙමි"යි (කීය.)

**9.** "ඇවැත්නි, දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත, ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිත, දෙවිමිනිසුන් සහිත, ලෝකයෙහි යමෙක් මාගේ සිත හෝ කලබල කරන්නේද, හෘදය හෝ පළන්නේද, පාදයෙන් හෝ ගෙන ගඟෙන් එතර හෝ දමන්නේද, එවැන්නකු මම නොදකිමි. එසේද වුව ඇවැත්නි, තෝ යමක් කැමැත්තෙහි නම් එය අසව."

**10.** ඉක්බිති සූචිලෝම යක්ෂතෙම භාග්‍යවතුන්වහන්සේට ගාථායෙන් (මෙසේ) කීය.

"රාගයත් ද්වෙෂයත් කුමක් මුල් (හේතු) කොට ඇත්තෝද? නොකැමැත්ත හා ඇල්මද, තැතිගැන්මද කිමෙකින් උපන්නෝද? දරුවෝ කවුඩකු අල්වා යම්සේ

දමත්ද, (එමෙන්ම) කාමවිතර්කයෝ කොතැනින් ඉපද (කුසල්) සිත ඒ මේ අත එළවත්ද?"

11. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක:) "රාගයද, ද්වෙෂයද, මේ (ආත්මභාවය) මුල් (හේතු) කොට ඇත්තෝ වෙත්. නොකැමැත්තද, ඇල්මද, තැති ගැන්මද, මෙයින් (මේ ආත්මභාවයෙන්ම) උපන්නෝය. යම්සේ දරුවෝ (තමන් බැඳගත්) කවුඩා ඒ මේ අත ගසා දමත්ද, එමෙන්ම (කාමාදී) පාපවිතර්කයෝ මෙයින් (මේ ආත්මභාවයෙන්) ඉපිද (කුසල් සිත) ඒ මේ අත ගසා දමත්.

"ආත්මභාවයෙන් හටගත් (විතර්කයෝ) තණ්හාව නිසා උපන්නෝය. නුගරුක් කඳින් උපන් නුග අරළු මෙනි. අනේකප්‍රකාර පවිටු විතර්කයෝ කාමවස්තූන්හි ඇලී සිටිත්. වනයෙහි මාලුවා වැලක් ගැවසී ගත්තාක් මෙනි.

"යක්ෂය, මේ අසව, යම් කෙනෙක් ඒ විතර්කයන්ගේ නිදානය කොතැන්හිදැයි දනිත්ද, ඔවුහු ඒ වනසත්. ඔහු ඉතා දුෂ්කරවූ, තරණය නොකළ (කාමාදී) සිවු සැඩ පහර නැවත නොඉපදීම පිණිස තරණය කරත්."

---

## 4. මණිභද්ද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ මගධයෙහි මණිමාලක චෛත්‍යයෙහි මණිභද්ද නම් යකුගේ භවනයෙහි වැඩවසන සේක.

2. ඉක්බිති මණිභද්ද යක්තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ භගවත්හු හමුයෙහි මේ ගාථාව කීය.

"සිහි ඇත්තාට හැම කල්හි යහපත වෙයි. සිහි ඇත්තේ සුවය ලබයි. සිහි ඇත්තහුට හැමසඳ ශ්‍රේෂ්ඨත්වය ලැබෙයි. (හෙතෙම) වෛරයෙන් මිදේ."

3. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "සිහි ඇත්තාට හැම සඳ යහපත වෙයි. සිහි ඇත්තේ සුවය ලබයි. සිහි ඇත්තහුට හැම සඳ ශ්‍රෙෂ්ඨත්වය ලැබෙයි. (එහෙත් හෙතෙම) වෛරයෙන් නොමිදේ.

"යක්ෂය, යමෙකුගේ සිත මුළු රැදාවල් දෙක්හිම අහිංසායෙහි ඇලුනේ ද, හෙතෙම සියලු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රිය (වඩා) ද ඔහට කිසි කෙනෙකු හා වෛරයක් නැත්තේය."

---

## 5. සානු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල වනාහි එක්තරා උපාසිකාවකගේ සානු නම් පුතෙක් යක්ෂයකු විසින් ගන්නා ලද්දේය.

3. ඉක්බිති ඒ උපාසිකාව හඬන්නී ඒ වේලායෙහි මේ ගාථාවන් කීවායඃ

"තුදුස්වක්හි ද, පසළොස්වක්හි ද, අඩමසක් සම්බන්ධවූ යම් අටවකකුත් වේද ඒ අටවක්හිද, ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂයෙහි ද, යම් කෙනෙක් පොහොදා රැක්ක යුතු සිල්රකීද බඹසර රකිත්ද,

"ඔවුන් හා (ඔවුන් අල්ලාගෙන) යක්ෂයෝ ක්‍රීඩා නොකරති යන රහතුන්ගේ බස් මා විසින් අසන ලද්දේය. (නමුත්) මම දැන් ඒ වග දකිමි. සානු සමග යක්ෂයෝ කෙළිත්."

4. "තුදුස්වක්හි ද, පසළොස්වක්හි ද, අඩමසක් සම්බන්ධවූ යම් අටවකකුත් වේද ඒ (අට) වක්හිද, ප්‍රාතිහාර්‍ය්‍ය පක්ෂයෙහි ද, යම් කෙනෙක් පොහොදා රැක්ක යුතු සිල් රකිත්ද, බඹසර රකිත්ද

"ඔවුන් හා යක්ෂයෝ නො කෙළිති යන රහතුන්ගේ බස් මනා කොට තා විසින් අසන ලද්දේය. සානු පිබිදී කල (මෙසේ) කියව: මේ යකුන්ගේ වචනයයි:- 'ලාමක පව්කම් කිසිවකු හමුයෙහි හෝ රහසින් හෝ නොකරව. ඉදින් යම් පාප කර්මයක් (මතුවට) කරන්නෙහි ද, (දැන්) කෙරෙහි ද, තා අහසට පැනනැඟී පලාගියත් තට (දුකින්) මිදීමෙක් නම් නැති."

5. (සානු මෙසේ කීය.) "මෑණියෙනි, (මිනිස්සු) මළ එකකු නිසාම හෝ ජීවත්ව සිටියද දක්නට නැති එකකු නිසා හෝ හඬති. මෑණියනි, ජීවත්වන මා බලන්නි අම්මේ, මා ගැන කුමක් හෙයින් හඬනෙහි ද?"

(උපාසිකාව:) "පුතේ, මිනිස්සු මළ එකකු නිසා හෝ ජීවත්ව සිටියත් දක්නට නැති එකකු නිසා හෝ හඬති. යමෙක් නොයෙක් කාමයන් හැර (පැවිදිව) නැවත මෙහි (මේ ගිහිබවට) පැමිණේ ද, ජීවත්වන්නා වූ හෙතෙම මළ එකෙක් ම වේ. පුතේ, එබන්දකු ගැන ද (මිනිස්සු) හඬති.

"පුත, හුණු අළුයෙන් ගොඩට නගනලද තෝ හුණු අළුයෙහි නැවත වැටෙන්නට කැමැත්තෙහි ද? පුත, නරකයෙන් ගොඩට නඟන ලද්දා වූ තෝ ඒ නිරයෙහි නැවත හෙන්නට කැමැත්තෙහි ද?

"වහා දුවයව. තට යහපතක් වේවා! අපි කවරකුට කෑගසා කියමු ද? ගිනිගත් ගෙයින් බැහැර කළ බඩු නැවත දවනු කැමැත්තෙහි ද?"

---

## 6. පියඞ්කර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරතෙම සැවැත්නුවර සමීපයේ වූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වෙසෙයි.

2. එකල වනාහි ආයුෂ්මත් අනුරුද්ධ තෙම අලුයම නැගිට ධර්මපද කියයි.

3. ඉක්බිති පියඞ්කරමාතා නම් යකින්න පුතු මෙසේ නැලවූවාඃ

"පියඞ්කරය, ශබ්ද නොකර. භික්ෂුතෙම ධර්ම පදයන් කියයි. ඉදින් ධර්මපදයක් දැනගෙන පිළිපදිමු නම් එය අපට හිත පිණිස වන්නේය."

"ප්‍රාණීන්ට හිංසා නොකරමු. දැන දැන මුසාබස් නොකියමු. තමාගේ සුන්දර ශීලයෙහි හික්මෙමු. පිශාච (යක්ෂ) යෝනියෙන් මිදෙන්නෙමු නම් යෙහෙක."

---

## 7. පුනබ්බසු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයේවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක.

2. එකල භාග්‍යවතුන් වහන්සේ නිර්වාණ සම්බන්ධ වූ ධර්ම කථායෙන් භික්ෂූන්ට අවවාද කරන සේක, බාරගන්වන සේක, උනන්දු කරවන සේක, සතුටු කරවන සේක. ඒ භික්ෂුහුද අර්ථවත්කොට මෙනෙහිකොට සියල්ල සිතට ඇතුළුකොට, කන් යොමුකොට, බහනලද කන් ඇත්තේව ධර්මය අසත්.

3. ඉක්බිති පුනබ්බසුමාතා යකින්න පුතු මෙසේ නලවයිඃ

"මම බුද්ධශ්‍රෙෂ්ඨයන්ගේ ධර්මය යම්තාක් අසන්නෙම්ද ඒතාක් උත්තරිකාවෙනි, නිශ්ශබ්ද වෙව. පුනබ්බසුව නිශ්ශබ්ද වෙව.

"භාග්‍යවතුන් වහන්සේ සියලු ගැට මුදන්නාවූ නිර්වාණය වදාරණසේක. මේ ධර්මයෙහි මාගේ පැහැදීම අධික වෙයි.

"ලොවෙහි ස්වකීය පුත්‍රතෙම ප්‍රිය වෙයි. ලොව ස්වකීය ස්වාමිතෙම ප්‍රිය වෙයි. ඒ ප්‍රිය බවටත් වඩා මේ ධර්මය සෙවීම මට ප්‍රියයි.

"සද්ධර්ම ශ්‍රවණය සත්ත්වයා සසර දුකින් යම් සේ මුදා ද ප්‍රිය පුත්‍රතෙම හෝ ප්‍රිය වූ ස්වාමිතෙමේ හෝ සසර දුකින් (එසේ) නොමුදාමැයි.

"දුකින් පීඩිතවූ, ජරාමරණයෙන් යුක්ත වූ මෙලොව ජරාමරණයෙන් මිදීම (නිර්වාණය) පිණිස යම් ධර්මයක් අවබොධ කළසේක් ද, ඒ ධර්මය අසනු කැමැත්තෙමි. පුනබ්බසුව, නිශ්ශබ්ද වෙව."

4. (පුනබ්බසු මෙසේ කීයඃ) "මෑණියනි, මම කථානොකරන්නෙමි. මේ උත්තරාව ද නිශ්ශබ්දව හුන්නීය. (එ හෙයින්) සද්ධර්මයම අසනු මැනවි. ධර්මය ඇසීම සැපයි.

"මෑණියනි, (අපි පෙර) මේ සද්ධර්මය නොදැන දුක් විඳිමින් හැසිරෙමු. ලොවට ආලෝකයක් බඳුවූ පසැස් ඇත්තා වූ, අන්තිම භවයෙහි වූ මේ සර්වඥයන් වහන්සේ අතිශයින් මුළාවූ දෙව් මිනිසුන්ට දහම් දෙසනසේක."

5. (පුනබ්බසු මාතා මෙසේ කීය.) "යහපත, මාගේ ළයෙහි සැතපෙන්නාවූ, මා කෙරෙන් උපන් මේ පුත්‍රයා වනාහි නුවණැත්තෙකි. මගේ පුතා බුද්ධශ්‍රෙෂ්ඨයාණන් වහන්සේගේ පිරිසිදු ධර්මය ප්‍රියකෙරෙයි.

"පුනබ්බසුව, තෝ සැප ඇත්තෙක් වෙහි. මම අද (දැන්) (සසරින්) ගොඩනැගුනා වෙමි. ආර්‍ය්‍යසත්‍යයෝ දක්නාලදහ. (මාගේ දූ) උත්තරාවත් (අප චතුස්සත්‍ය ප්‍රතිවේධ කළබව) අසාවා."

---

## 8. සුදත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහිවූ සීතවනයෙහි වසනසේක.

2. එකල වනාහි අනේපිඬු ගෘහපතියා කිසියම් කටයුත්තෙක් නිසා රජගහනුවරට පැමිණියේය.

3. "බුදුරජාණන් වහන්සේ ලොව පහළවූ සේක්ලු"යි අනේපිඬු ගෘහපතිතෙම ඇසීය. එපමණෙකින්ම භාග්‍යවතුන් වහන්සේ දකිනු පිණිස හෙතෙම පැමිණෙනු කැමැත්තේ වීය.

4. ඉක්බිති ඒ අනේපිඬු ගෘහපතිතෙම "භාග්‍යවතුන් වහන්සේ දකිනු පිණිස පැමිණෙන්නට අද කල් නොවෙයි" යන මේ අදහස විය. "හෙට (කලින්ම) උදෑසන භාග්‍යවතුන් වහන්සේ දකිනු පිණිස යන්නෙමි"යි බුදුන් අනුව ගිය සිහි ඇතිව නින්දට ගියේය. රෑ තුන්වරක්ම අලුයමයයි සිතමින් නැගිට්ටේය.

5 ඉක්බිති අනේපිඬු ගෘහපති තෙම සොහොන් දොරටුව යම් තැනකද එතැනට පැමිණියේය. අමනුෂ්‍යයෝ දොර ඇරියෝය.

6. ඉක්බිති අනේපිඬු ගෘහපතිතෙම නුවරින් නික්මෙත්ම එලිය අතුරුදහන් විය, අඳුර පහළ වීය. බිය තැතිගැනීම් හා ලොමුඩැහැගැනීම් පහළවිය. ඔහු එපමණින්ම නැවත හැරී එන්න කැමැත්තේද විය.

7. ඉක්බිති සීවක නම් යක්තෙම අතුරුදන්වූයේ ශබ්දයක් ඇස්වීය.

"සියක් දහසක් ඇතුන්ද, සියක් දහසක් අශ්වයෝද, සියක් දහසක් අශ්වතරියෝද, සියක් දහසක් රථද, මැණික් කන් අබරණින් සැරසුණු සියක් දහසක් කන්‍යාවෝද (යන මොවුහු) (බුදුන් වැඩසිටින විහාරයට, යන තැනැත්තාගේ) පියවරක සොළොස්වන අන්තකලාව පමණවත් නොවටීත්.

"ගෘහපතිය, ඉදිරියට යව, ගෘහපතිය ඉදිරියට යව. ඉදිරියට යෑම ඔබට යහපති. හැරී ආපසු යෑම අයහපති."

8. ඉක්බිති අනේපිඬු ගෘහපතියාට අඳුර අතුරුදහන් වීය. ආලෝකය පහළවීය. යම් බියෙක් තැතිගැනුමෙක් ලොමුඩැහැගැනුමෙක් වීද, එය සංසිඳිණි.

9. දෙවනුවද අනේපිඬු ගෘහපතියා නුවරින් නික්මෙත්ම එළිය අතුරුදහන් විය, අඳුර පහළ විය. බිය, තැතිගැනීම් හා ලොමු ඩැහැගැනීම් පහළ විය ඔහු එපමණකින්ම නැවත හැරී එන්න කැමැත්තේද විය.

10. ඉක්බිති සීවක නම් යක් තෙම අතුරුදහන් වූයේ ශබ්දයක් ඇස්වීය.

"සියක් දහසක් ඇතුන්ද, සියක් දහසක් අශ්වයෝද, සියක් දහසක් අශ්වතරියෝද, සියක් දහසක් රථද, මැණික් කන් අබරණින් සැරසුන සියක් දහසක් කන්‍යාවෝද (යන මොවුහු) (බුදුන් වැඩසිටින විහාරයට යන තැනැත්තාගේ) පියවරක සොළොස්වන අන්තකලාව පමණවත් නොවටිත්.

"ගෘහපතිය ඉදිරියට යව. ගෘහපතිය ඉදිරියට යව. ඉදිරියට යෑම ඔබට යහපති. හැරී ආපසු යෑම අයහපති"

11. තුන්වෙනුවද අනේපිඬු ගෘහපතියාහට එළිය අතුරුදහන්විය. අඳුර පහළවිය. බියතැති ගැනුම් ලොමුඩැහැගැනුම් ඇතිවිය. (ඔහු) එතනින්ම නැවත හැරී ආපසු යනු කැමැත්තේ විය. තුන්වෙනුවත් සීවක යක්තෙම සැඟවී මේ ශබ්දය ඇස්වීය.

"සියක් දහසක් ඇතුන්ද, සියක් දහසක් අශ්වයෝද, සියක් දහසක් අශ්වතරියෝද, සියක් දහසක් රථද, මැණික් කන් අබරණින් සැරසුණාවූ සියක් දහසක් කන්‍යාවෝද, (විහාරයට යනව තැනැත්තාගේ) එක්පිය වරක සොළොස්වන අන්තකලාව පමණකුදු නොවටිත්.

"ගෘහපතිය ඉදිරියට යව. ගෘහපතිය ඉදිරියට යව. ඉදිරියට යෑම ඔබට යහපති. හැරී ආපසු යෑම අයහපති."

12. ඉක්බිති අනේපිඬු ගෘහපතිහට අඳුර අතුරුදහන් විය. එළිය පහළ විය. යම් බියෙක්, තැති ගැන්මෙක්, ලොමුඩැහැගැන්මෙක් වීද, එය සංසිඳිණි.

13. ඉක්බිති අනේපිඬු ගෘහපතිතෙම සීතවනය වෙත පැමිණියේය.

14. එකල භාග්‍යවතුන් වහන්සේ කැලයෙහි ඉතා අලුයම නැගිට එළිමහනෙහි සක්මන් කරන සේක.

15. භාග්‍යවතුන්වහන්සේ දුරදීම එන අනේපිඬු ගෘහපතියා දුටුසේක. දැක සක්මණින් බැස, පැනවූ අස්නෙහි හුන්සේක හිඳ භාග්‍යවතුන්වහන්සේ අනේපිඬු ගෘහපතිහට "එන්න සුදත්ත"යි වදාළසේක.

16. ඉක්බිති අනේපිඬු ගෘහපතිතෙම, "භාග්‍යවතුන් වහන්සේ මා නමින් අමතනසේකැ"යි (සතුටුව) එහිම භාග්‍යවතුන්වහන්සේගේ පාමුල හිසින් වැටී භාග්‍යවතුන්වහන්සේට මෙය කීය. "කිම ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ සැපසේ සැතපුණු සේක්ද?"

(භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේක.) 'යමෙක් කාමයන්හි නොඇලේද, සීතීභූතද, (කෙලෙස්ගිනි නැත්තේද) උපධි නැත්තේද පිරිනිවියාවූ ඒ (කෙලෙස්) නැත්තාවූ බ්‍රාහ්මණ තෙම හැම කල්හි ඒකාන්තයෙන් සුවසේ සයනය කෙරෙයි.

"සියලු තණ්හාවන් සිඳ, හෘදයෙහිවූ පීඩා මැඩ පවත්වා, සිතෙහි ශාන්තියට පැමිණ සංසුන්වූ තැනැත්තේ සැපසේ සයනය කෙරෙයි."

---

## 9. (පළමුවන) සුක්කා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම්වූ වේළුවනයෙහි වසන සේක.

2. එකල වනාහි සුක්කා භික්ෂුණිය මහ පිරිසක් විසින් පිරිවරණ ලද්දී ධර්මය දේශනා කරයි.

3. ඉක්බිති සුක්කා භික්ෂුණිය කෙරෙහි බොහෝසේ පැහැදුනු යක්ෂයෙක් රජගහනුවර වීථියෙන් වීථියට

මංසන්ධියෙන් මංසන්ධියට පැමිණ, ඒ වේලායෙහි මේ ගාථාවන් කීය.

"අමෘතපදයට (නිර්වාණාධිගමයට) කාරණය වදාරන්නාවූ සුක්කා මෙහෙණින් කරා යම් කෙනෙක් නොඑළඹෙත්ද, රජගහනුවර වසන ඒ මේ මිනිස්සු කුමක් කරද්ද? (ඔව්හු) සුරාපානය කළවුන්සේ නිදාගනිත්.

"ඇසීමෙන් නොපසුබස්නා තෘප්ති ඇති ස්වභාවයෙන්ම සුමධුරවූ, (එසෙයින්ම) ඕජෝගුණවත්වූ ඒ ධර්මය වළාකුළු අතරෙන් නිකුත් ජලය බොනමෙන් මනා නුවණැත්තෝම පානය කෙරෙති'යි හඟිමි."

---

## 10. (දෙවෙනි) සුක්කා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම්වූ වේළුවනයෙහි වසනසේක.

2. එසමයෙහි වනාහි එක්තරා උපාසකයෙක් සුක්කා භික්ෂුණියට ආහාරයක් දුන්නේය.

3. ඉක්බිති සුක්කා භික්ෂුණිය කෙරෙහි බොහොසේ පැහැදුනු යක්ෂයෙක් රජගහනුවර වීථියෙන් වීථියට මංසන්ධියෙන් මංසන්ධියට පැමිණ ඒ වේලායෙහි මේ ගාථාව කීය.

"සියලු බන්ධනවලින් හාත්පසින් මිදුනාවූ සුක්කා මෙහෙණින් වහන්සේට යමෙක් ආහාර දුන්නේද, පණ්ඩිතවූ ඒ මේ උපාසකතෙම බොහෝවූම පිණක් රැස් කෙළේය.

---

## 11. වීරැ (චීරා) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම්වූ වේළුවනයෙහි වැඩ වසනසේක.

2. එකල එක්තරා උපාසකයෙක් චීරා භික්ෂුණියට සිවුරක් දුන්නේය.

3. ඉක්බිති චීරා භික්ෂුණිය කෙරෙහි බොහෝසේ පැහැදුනු යක්ෂයෙක් රජගහනුවර වීථියෙන් වීථියට මංසන්ධියෙන් මංසන්ධියට පැමිණ මේ ගාථාව කීය.

"සියලු (බන්ධන) වලින් මනාව මිදුනාවූ චීරා මෙහෙණින්නට යමෙක් සිවුරක් දිනීද, ඒ මේ උපාසකතෙම ඒකාන්තයෙන් පණ්ඩිතය, ඒකාන්තයෙන් බොහෝවූ පිණක් රැස්කෙළේය."

---

## 12. ආළවක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ අළවිනුවර අළවියකුගේ භවනයෙහි වැඩ වසන සේක.

2. ඉක්බිති ආළවක යක්ෂතෙම භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට "මහණ, නික්මෙව"යි කීය. "මැනවි, ඇවැත්නි"යි භාග්‍යවතුන්වහන්සේ නික්මුණු සේක. "මහණ, ඇතුල්වෙව" (යි ආළවකයා කීය.) "ඇවැත්නි මැනවැ"යි භාග්‍යවතුන් වහන්සේ ඇතුල්වූ සේක.

3. දෙවෙනුවත් ආළවක යක්ෂතෙම භාග්‍යවතුන් වහන්සේට "මහණ, නික්මෙව"යි කීය. "ඇවැත්නි මැනවැ"යි භාග්‍යවතුන්වහන්සේ නික්මුණු සේක. "මහණ, ඇතුල්වෙව"යි (ආළවකයා කීය.) "ඇවැත්නි මැනවැ"යි භාග්‍යවතුන් ඇතුල්වූ සේක.

4. තුන්වෙනුවද ආළවක යක්ෂතෙම භාග්‍යවතුන් වහන්සේට "මහණ, නික්මෙව"යි කීය. "ඇවැත්නි, මැනවැ"යි භාග්‍යවතුන්වහන්සේ නික්මුණු සේක. "මහණ ඇතුල්වෙව"යි (ආළවකයා කීය.) "ඇවැත්නි, මැනවැ"යි භාග්‍යවතුන් වහන්සේ ඇතුල්වූ සේක.

**5.** සතරවෙනුවද ආළවක යක්ෂතෙම භාග්‍යවතුන් වහන්සේට "මහණ, නික්මෙව"යි කීය.

**6.** "ඇවැත්නි, මම නොනික්මෙමි. තා විසින් යමක් කටයුතු නම්, එය කරව" (යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.)

**7.** "මහණ, තා අතින් ප්‍රශ්නයක් අසමි. ඉදින් එය මට නොවිසඳියේ නම් තාගේ සිත හෝ කළඹන්නෙමි. තාගේ හෘදය හෝ පළන්නෙමි, පාදයෙන් අල්ලා ගඟින් එතර හෝ දමන්නෙමි" (යි ආළවකයා කීය).

(භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.)

**8.** "ඇවැත්නි, දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත, බමුණන් සහිත ලොව දේව මනුෂ්‍ය ප්‍රජාවෙහි යමෙක් මාගේ සිත කළඹන්නේ හෝ හෘදය පළන්නේ හෝ පාදයෙන් ගෙන මහ ගඟින් එතර දමන්නේ හෝ වේද, එබන්දක මම නොදකිමි. එසේවුවද, ඇවැත්නි, තෝ යමක් කැමැත්තෙහි, නම් එය අසව."

**9.** ඉක්බිති ආළවක යක්ෂතෙම භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කීයඃ

"මෙලෙව්හිවූ පුද්ගලයාට ශ්‍රෙෂ්ඨ ධනය නම් කුමක්ද? පුරුදුකළාවූ කුමක් සැප ගෙනදෙන්නේද? කෙසේ ජීවත්වන්නකුගේ ජීවිතය ශ්‍රෙෂ්ඨයයි කියනු ලැබේද?"

**10.** (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේකඃ) "මෙලෙව්හි පුද්ගලයාට ශ්‍රෙෂ්ඨ ධනය නම් ශ්‍රද්ධාවයි. පුරුදුකළාවූ ධර්මය සැප දෙයි. රසයන් අතුරෙන් සත්‍යය ඒකාන්තයෙන් සුමිහිරි රසයි. ප්‍රඥාවෙන් ජීවත් වන්නහුගේ ජීවිතය ශ්‍රෙෂ්ඨයයි (ආර්‍ය්‍යයෝ) කියත්."

**11.** (ආළවකයා මෙසේ කීය.) සසර නමැති සැඩපහර කොයිපරිද්දෙකින් තරණය කෙරේද? සසර සයුර කෙසේ තරණය කෙරේද? දුක කෙසේ ඉක්මවාද? (සත්ත්වයා) කෙසේ පිරිසිදු වේද?"

12. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "ශ්‍රද්ධාව කරණකොටගෙණ ඕඝය තරණය කරයි. අප්‍රමාදයෙන් සසර සයුර තරණය කරයි. වීර්‍ය්‍යයෙන් දුක ඉක්මවයි. ප්‍රඥාව කරණකොටගෙණ පිරිසුදුවේ."

13. (ආළවකයා මෙසේ කීය.) ප්‍රඥාව කවරාකාරයෙකින් ලබයිද? ධනය කවර ආකාරයෙකින් ලබයිද? කීර්තියට කවර කාරණයෙකින් පැමිණේද? මිත්‍රයන් කවර කාරණයෙකින් තමා කෙරෙහි බැඳගනීද? මෙලොවින් පරලොවට පැමිණ කවර කාරණයෙකින් ශෝක නොකෙරේද?"

14. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "නුවණැත්තාවූ, ප්‍රමාදනුවූ ජනතෙම, රහතුන්ගේ සද්ධර්මය අදහන්නේ, මනාව ඇසීම හේතුකොටගෙන නිර්වාණයට පැමිණීම පිණිස ප්‍රඥාව ලබයි.

"සුදුසු කටයුත්තෙහි යෙදුනු, ඉසිලියයුතු බර උසුලන වීර්‍ය්‍ය සම්පන්න ජනතෙම ධනය ලබයි. සත්‍යය කරණකොටගෙණ කීර්තියට පැමිණෙයි. ත්‍යාගවත් ජනතෙම මිත්‍රයන් බැඳගනී.

"ගිහිගෙයි වසන්නාවූ ශ්‍රද්ධා ඇති, යම් ගිහියකුහට සත්‍යයත්, ඉන්ද්‍රිය දමනයත්, වීර්‍ය්‍යයත්, ත්‍යාගයත් යන මේ ධර්ම සතර වෙත් නම් හෙතෙම මෙලොවින් පරලොව ගොස් ඒකාන්තයෙන් ශෝක නොකෙරේ.

"එව; සත්‍යයටත්, ඉන්ද්‍රිය දමනයටත්, ත්‍යාගයටත්, ඉවසීමටත් වඩා උසස් වූවක් මෙලොව ඇත්දැයි අන්‍ය බොහෝවූ මහණ බමුණන්ගෙන්ද විචාරව."

15. (ආළවකයා මෙසේ කීය.) "මෙලොව අභිවෘද්ධියද පරලොව සුගතියද පිණිස යමක් වේනම් ඒ කාරණය මම අද පටන් දනිමි. (එහෙයින්) දැන් ඒ මම බොහෝවූ මහණ බමුණන් කුමකට විචාරම්ද?

"යමෙකුහට දෙන ලද දානවස්තුව මහත් අනුසස් ඇත්තේද මම ඒ අද පටන් දනිමි. සර්වඥයන් වහන්සේ

වාසය පිණිස මේ අළවිනුවරට වැඩවදාළේ ඒකාන්තයෙන් මගේම අභිවෘද්ධිය පිණිසය.

"ඒ මම බුදුන්ද, ධර්මයාගේ සුධර්මත්වයද (බුදුන් විසින් මැනවින් වදාරණ ලද ධර්මයද), වඳිමින් ගමින් ගමද නුවරින් නුවරද අවිදින්නෙමි."

යක්ඛසංයුත්තය නිමියේය.

---

# 11 සක්ක (හෙවත් වාසව) සංයුත්තය.

## 1. සුවීර වර්ගය.

### සුවීර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂුන්ට කථාකළ සේක. ඒ භික්ෂූහු "ස්වාමීනි"යි භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ.

3. භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේක. "මහණෙනි, පෙරවූවක් කියමි. අසුරයෝ දෙවියන් ඉදිරියට පැමිණියහ. මහණෙනි, එකල්හි ශක්‍රදේවේන්ද්‍ර තෙම සුවීර දේවපුත්‍රයාට කථා කළේය, පුත සුවීරය මේ අසුරයෝ දෙවියන් ඉදිරියට පැමිණෙති. පුත සුවීර යන්න අසුරයන්ගේ පෙරමුණට පැමිණෙන්න. මහණෙනි, සුවීර, දෙව් පුත් තෙම එසේය, ස්වාමීනි'යි ශක්‍රදේවේන්ද්‍රයාට උත්තරදී (ගමන) ප්‍රමාද කෙළේය.

4. "මහණෙනි, දෙවනුවත් ශක්‍රදේවේන්ද්‍ර තෙම සුවීර දෙව් පුතුට කථා කළේය. 'දරුව සුවීරය, මේ අසුරයෝ දෙවියන් ඉදිරියට පැමිණෙති. යන්න, දරුව සුවීර, අසුරයන්ගේ පෙරමුණට පැමිණෙන්න. මහණෙනි, සුවීර දෙව් පුත් තෙම 'එසේය,

ස්වාමීනි'යි ශක්‍රදේවේන්ද්‍රයාට උත්තර දී දෙවනුවත් (ගමන) ප්‍රමාද කෙළේය.

**5.** "තුන්වෙනුවත් මහණෙනි, ශක්‍රදේවේන්ද්‍රතෙම සුවීර දෙව්පුතුට කථා කළේය. 'දරුව සුවීර, මේ අසුරයෝ දෙවියන් ඉදිරියට පැමිණෙති. දරුව සුවීර යන්න, අසුරයන් පෙරමුණට පැමිණෙන්න'යි (කීය.) මහණෙනි, සුවීර දෙව් පුත්තෙම 'එසේය, ස්වාමීනි'යි ශක්‍රදේවේන්ද්‍රයාට පිළිවදන් දී තුන් වෙනුවද ප්‍රමාද කෙළේය.

**6.** "මහණෙනි, ඉක්බිති ශක්‍රදේවේන්ද්‍ර තෙම සුවීර දෙව් පුතුට ගාථායෙන් (මෙසේ) කීය.

> "නැඟී නොසිටින, වීර්‍ය්‍ය නොකරන තැනැත්තේ යම් තැනෙක සැපතට පැමිණේද, සුවීරය, එහි යව. මාද එහිම පමුණුව.'
>
> **7.** "(සුවීර මෙසේ කීය) 'උට්ඨාන වීර්‍ය්‍ය රහිත වූ තැනැත්තේ අලස වන්නේය. කටයුතු නොකර වන්නේය. (එබන්දෙක්) සියලු කාමයෙන් සමෘද්ධයෙක් වන්නේ නම් ශක්‍රය, (ඔහු සිටින) ඒ උත්තම ස්ථානය මට කිව මැනව.'
>
> **8.** "(ශක්‍ර දෙව්තෙම මෙසේ කීය.) නැඟී සිටින වීර්‍ය්‍ය නැත්තාවූ අලසවූ පුද්ගලයෙක් යම් තැනෙක ඉතා මහත් සුඛයට පැමිණේද, සුවීරය, එහි යව, මාද එහිම පමුණුව."
>
> **9.** "(සුවීර දෙව් පුත් මෙසේ කීය.) 'දේවශ්‍රෙෂ්ඨවූ ශක්‍රය කටයුතු නොකිරීමෙන් යම් උත්තම සැපතක් ලබමුද, ශක්‍රය, ශෝක නැත්තාවූ, දැඩි වෙහෙස නැත්තාවූ ඒ උතුම් මග මට කිව මැනව."
>
> **10.** "(ශක්‍ර දෙව්තෙම මෙසේ කීය.) 'වැඩ නොකිරීමෙන් කිසි පුද්ගලයෙක් තෙම කිසි තැනෙක ජීවත් නොවේද, (එබඳු තැනෙක්) ඉදින් ඇත්තේද, එහි යන මග නම් නිර්වාණමාර්ගයයි. සුවීර, එහි යව. මාද එහිම පමුණුව'යි (දේවේන්ද්‍රතෙම කීය.)

11. "මහණෙනි, තමන්ගේ පුණ්‍යඵලය නිසා ජීවත්වන තාවතිංස දෙවියන්ට අධිපතිව රාජ්‍යය කරවන ඒ ශක්‍ර දේවේන්ද්‍රතෙම වනාහි නැඟී සිටින වීර්‍ය්‍යයෙහි ගුණ කියන්නාවූ කෙනෙකි. මහණෙනි, මේ ශාසනයෙහිද ඒ (ගුණය) හොබවව්. තෙපි මෙසේ හොඳින් දේශනා කරන ලද ධර්ම විනයෙහි පැවිදිවූවාහු, නොපැමිණි දෙයට පැමිණීම පිණිසද, අවබෝධ නොකළ දේ අවබෝධ කිරීම පිණිසද, ප්‍රත්‍යක්ෂ නොකළ දේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිසද උත්සාහ කරව්, වීර්‍ය්‍ය වඩව්, උත්සාහ කරව්"යි (වදාළසේක)

---

## 2. සුසීම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ ජේතවනයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවනලද ආරාමයෙහි වැඩවසන සේක.

2. එකල්හි වනාහි භාග්‍යවතුන්වහන්සේ "මහණෙනි"යි භික්ෂුන්ට කථාකළ සේක. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ."

3. භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක. "මහණෙනි, පෙරවූ දෙයක් කියමි. අසුරයෝ දෙවියන් ඉදිරියට පැමිණියහ. මහණෙනි, එවිට ශක්‍රදේවේන්ද්‍රතෙම සුසීම දෙව් පුතුට කථාකර මෙසේ කීය. 'දරුව සුසීම, මේ අසුරයෝ දෙවියන් ඉදිරියට පැමිණෙති. දරුව, සුසීම, යන්න, අසුරයන් පසු බස්වන්න." මහණෙනි, සුසීම දෙව් පුත් තෙම 'එසේය, ස්වාමීනි'යි ශක්‍රදේවේන්ද්‍රයාට උත්තර දී (ගමන) ප්‍රමාද කෙළේය.

4. "මහණෙනි, දෙවෙනුවත් ශක්‍ර දේවේන්ද්‍ර තෙම සුසීම දෙව්පුතුට කථාකර මෙසේ කීවේය. 'දරුව සුසීම, මේ අසුරයෝ දෙවියන් ඉදිරියට පැමිණෙති. දරුව, සුසීම, යන්න, අසුරයන් පසුබස්වන්න.' මහණෙනි, සුසීම දෙව් පුත් තෙම 'එසේය, ස්වාමීනි'යි ශක්‍ර දේවේන්ද්‍රයාට උත්තරදී (ගමන) ප්‍රමාද කෙළේය. දෙවනුවද හෙතෙම ප්‍රමාද කෙළේය.

5. "මහණෙනි, ශක්‍ර දේවේන්ද්‍ර තෙම තුන්වෙනුවද සුසීම දෙව්පුතුට කථාකර කීවේය. 'දරුව සුසීම, මේ අසුරයෝ දෙවියන් ඉදිරියට පැමිණෙති. දරුව, සුසීම, යන්න, අසුරයන් පසුබස්වන්න,' මහණෙනි, සුසීම දෙව්පුත් තෙම 'එසේය, ස්වාමීනි'යි ශක්‍ර දේවේන්ද්‍රයාට උත්තර දී (ගමන ප්‍රමාද කෙළේය. තුන්වෙනුවද හෙතෙම පමා කෙළේය.

6. "මහණෙනි, ඉක්බිතිව ශක්‍රදේවේන්ද්‍රතෙම සුසීම දෙව්පුතුට ගාථායෙන් මෙසේ කීය.

'නැගී නොසිටින, වීර්‍ය්‍ය නොකරන තැනැත්තේ යම් තැනෙක සැපතට පැමිණේද, සුසීම, එහි යව මාද එහි පමුණුව.'

7. "උට්ඨාන වීර්‍ය්‍ය රහිතවූයේ අලස වන්නේය. කෘත්‍යයන් නොකරන්නේය. (එබන්දෙක් යම්තැනෙක) සියලු කාමයෙන් සම්පූර්ණ වන්නේ නම්, ශක්‍ර දේවේන්ද්‍රය ඒ උත්තමස්ථානය මට කිව මැනව'යි (සුසීම කීය.)

8. "සුසීම, උට්ඨානවීර්‍ය්‍ය නැත්තාවූ, අලසවූ පුද්ගලයෙක් යම් තැනෙක (අතිශයින් සැපසේ වැඩේද,) එහි යව, මාද එහිම පමුණුව'යි (ශක්‍රදේවේන්ද්‍ර) කීය.

9. "දෙවියන්ට ශ්‍රෙෂ්ඨවූ ශක්‍රය, කටයුතු නො කිරීමෙන් යම් උත්තම සැපතක් ලබමුද, ශක්‍රය, ශෝක නැත්තාවූ, දැඩි වෙහෙස නැත්තාවූ ඒ උතුම් මග කිව මැනවැ'යි (සුසීම කීය.)

10. "'කර්ම නොකිරීමෙන් කිසි පුද්ගලයෙක් තෙම කිසි තැනෙක ජීවත් නොවේද, (එබඳු තැනෙක්) ඉදින් ඇත්තේද, එහි යන මග නම් නිර්වාණ මාර්ගයයි. සුසීම එහි යව, මාද එහි පමුණුව'යි (ශක්‍රදේවේන්ද්‍රතෙම කීය.)

11. "මහණෙනි, සිය පින් ඵලය නිසා ජීවත්වන තව්තිසා වැසි දෙවියන්ට සම්පතින් ප්‍රධානවූ අධිපතිව රාජ්‍යය කරවන ඒ ශක්‍ර දේවේන්ද්‍ර තෙම උට්ඨාන වීර්‍ය්‍යය වර්ණනා කරන්නෙකි. මහණෙනි, මෙහි (මේ ශාසනයෙහිද) එය (ඒ ගුණය) හොබවව්.

තෙපි මෙසේ යහපත් කොට දේශනා කරනලද ධර්ම විනයෙහි පැවිදි වූවාහු නොපැමිණි දෙයට පැමිණීම පිණිසද, අවබෝධ නොකළ දේ අවබෝධ කිරීම පිණිසද, ප්‍රත්‍යක්ෂ නොකළක් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිසද වීර්‍ය්‍ය කරව්, ධෛර්‍ය්‍ය වඩව්, වෑයම් කරව්"යි (වදාළ සේක.)

---

## 3. ධජග්ග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල්හි වනාහි භාග්‍යවතුන්වහන්සේ "මහණෙනි'යි භික්ෂූන් ඇමතුසේක. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේක. 'මහණෙනි, පෙර වූ දෙයක් කියමි. දෙවියන් හා අසුරයන් අතර මහත්වූ යුද්ධයක් විය. මහණෙනි, එවිට ශක්‍ර දේවේන්ද්‍ර තෙම තව්තිසා වැසි දෙවියන්ට (මෙසේ) කථාකර කීවේය. 'ඉදින් පින්වතුනි, යුද්ධයට පැමිණි දෙවියන්ට බියක් හෝ තැති ගැන්මක් හෝ ලොමුදැහැගැන්මක් හෝ උපදින්නේ නම්, එකල මාගේම කොඩිය බලව්. මාගේ කොඩිය බලන්නාවූ තොපට වනාහි යම් බියක් හෝ තැතිගැනුමක් හෝ ලොමු දැහැගැනුමක් හෝ වන්නේ නම් එය නැතිවන්නේය.

4. "ඉදින් මාගේ කොඩිය නොබලව් නම්, ප්‍රජාපති දේව රාජයාගේ කොඩිය බලව්. ප්‍රජාපතී දෙව් රජුගේ කොඩිය බලන්නාවූ තොපට වූකලි යම් බියක් හෝ තැතිගැනුමක් හෝ ලොමුදැහැගැනුමක් හෝ වන්නේ නම් එය නැති වන්නේය.

5. "ඉදින් ප්‍රජාපතී දෙව් රජුගේ කොඩිය නොබලන්නාහු නම්, වරුණ දෙව් රජුහුගේ කොඩිය බලව්. වරුණ දෙව්රජහුගේ

කොඩිය බලන්නාවූ තොපට වූකලී යම් බියක් හෝ තැතිගැනුමක් හෝ ලොමුදැහැගැනුමක් හෝ වන්නේද එය නැතිවන්නේය.

**6.** "ඉදින් වරුණ දෙව්රජහුගේ කොඩිය නොබලව් නම් අනතුරුව ඊසාන දෙව් රජහුගේ කොඩිය බලව්. ඊසාන දෙව් රජහුගේ කොඩිය බලන තොපට වූකලී යම් බියක් හෝ තැතිගැනුමක් හෝ ලොමුදැහැගැනුමක් හෝ වන්නේද, එය නැති වන්නේය.'

**7.** "මහණෙනි, ශක්‍ර දේවේන්ද්‍රයාගේ ඒ කොඩිය බලන්නවුන්ට හෝ ප්‍රජාපතී දෙව් රජුගේ ඒ කොඩිය බලන්නවුන්ට හෝ වරුණ දෙව්රජහුගේ ඒ කොඩිය බලන්නවුන්ට හෝ ඊසාන දෙව්රජුගේ ඒ කොඩිය බලන්නවුන්ට හෝ යම් බියෙක් හෝ තැතිගැනුමෙක් හෝ ලොමුදැහැගැනුමෙක් හෝ වන්නේද, ඒ බිය ආදිය දුරුවන්නේ හෝ වෙයි, දුරු නො වන්නේ හෝ වෙයි. එයට කරුණු කිම? මහණෙනි, ශක්‍ර දේවේන්ද්‍ර තෙම වනාහි පහනොවූ රාග ඇත්තේය, පහනොවූද්වෙෂ ඇත්තේය, පහනොවූ මෝහ ඇත්තේය, (හෙතෙම) බියවන ස්වභාව ඇත්තෙක, තැතිගන්නා ස්වභාව ඇත්තෙක, පලායන දුවන ස්වභාව ඇත්තෙක, (එහෙයිනි.)

**8.** 'මහණෙනි, මමද තොපට මෙසේ කියමි: මහණෙනි, ඉදින් වනයට ගියාවූ හෝ වෘක්ෂමූලයට ගියාවූ හෝ මිනිසුන් නොගැවසෙන තැනට ගියාවූ හෝ තොපට බියෙක් හෝ තැති ගැනුමෙක් හෝ ලොමුඩැහැගැනුමෙක් හෝ උපදින්නේ නම් ඒ වේලායෙහි මා ම (මෙසේ) සිහිකරව් 'ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙන් අරහත් වනසේක, සම්මා සම්බුද්ධවනසේක, විජ්ජාචරණසම්පන්න වනසේක, සුගත වනසේක, ලොකවිදූ වනසේක, අනුත්තර පුරිසදම්මසාරථී වනසේක, දෙව්මිනිසුන්ට ශාස්තෘ වනසේක, බුද්ධ වනසේක, භාග්‍යවත් වනසේක' (කියායි) මහණෙනි, (මෙසේ) මා සිහිකරන තොපට යම් බියෙක් හෝ තැතිගැනුමෙක් හෝ ලොමුඩැහැගැනුමෙක් හෝ වන්නේද එය නැතිවන්නේය.

9. "ඉදින් තොපි මා සිහි නොකරන්නාහු නම්, අනතුරුව ධර්මය (මෙසේ) සිහිකරව්. 'භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය යහපත්කොට දේශනා කරන ලද්දේය, (ඒ ධර්මය) තමා විසින්ම දැක්ක යුත්තේය, කල් නොයවා විපාක දෙන්නේය, 'එව බලව'යි කීමට සුදුසුය, (භාවනා වශයෙන්) තම සිත්හි පැමිණවීමට (දරාගැනීමට) සුදුසුය, නුවණැත්තන් විසින් තම තමා කෙරෙහිලා දැක්ක යුතුය' (කියායි.) මහණෙනි, ඉදින් ධර්මය සිහිකරන තොපට මේ බියෙක් හෝ තැතිගැන්මෙක් හෝ ලොමුඩැහැගැන්මෙක් හෝ වන්නේද, එය නැති වන්නේය.

10. "ඉදින් තෙපි ධර්මය සිහි නොකරව් නම්, සඞ්ඝයා (මෙසේ) සිහි කරව්. 'භගවත්හුගේ ශ්‍රාවක සඞ්ඝතෙම මනා පිළිවෙත්හි පිළිපන්නේය, භගවතුන්ගේ ශ්‍රාවක සඞ්ඝතෙම ඍජු පිළිවෙත්හි පිළිපන්නේය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝතෙම සත්‍යමාර්ගයෙහි පිළිපන්නේය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝතෙම සුදුසු පිළිවෙතෙහි පිළිපන්නේය. යම් මේ සතර පුරිසයුගළකෙනෙක් ඇද්ද, පුරිස පුද්ගලයෝ අටදෙනෙක් ඇද්ද, භගවත්හුගේ මේ ශ්‍රාවක සඞ්ඝයා ආහුණෙය්‍යය (කැඳවා සිවුපසය දීමට සුදුසුය), පාහුණෙය්‍යය (අමුතු පඬුරු පිළිගැන්වීමට සුදුසුය), දක්ඛිණෙය්‍යය (පරලොව අදහා දන් දෙන්නට සුදුසුය), අඤ්ජලිකරණීයය (දොහොත් මුදුන්දී නමස්කාරයට සුදුසුය), සියලු ලෝකයාගේ ඉතා උතුම් පින් කෙතය' (යි කියායි.) මහණෙනි, (මෙසේ) සඞ්ඝයා සිහිකරන තොපට යම් බියෙක් හෝ තැති ගැනුමෙක් හෝ ලොමුඩැහැගැනුමෙක් හෝ වන්නේද එය නැතිවන්නේය.

11. "එයට හේතු කුමක්ද? මහණෙනි, තථාගතවූ, අර්හත්වූ, සම්මා සම්බුද්ධයන් වහන්සේ පහවූ රාග ඇතිසේක, පහවූ ද්වේෂ ඇතිසේක, පහවූ මෝහ ඇතිසේක, බිය නොවන ස්වභාව ඇතිසේක, තැති නොගන්නා ස්වභාව ඇතිසේක, ලොමුඩැහැනොගන්නා ස්වභාව ඇතිසේක, පලායන ස්වභාව නැතිසේක (එහෙයිනි.)"

12. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. මෙසේ වදාරා සුගතවූ ශාස්තෘන් වහන්සේ නැවත එයම (මෙසේ) වදාළසේක.

"මහණෙනි, වන සෙනසුනෙක හෝ වෘක්ෂමූල සෙනසුනෙක හෝ මිනිසුන් නොගැවසෙන තැනක හෝ සම්මාසම්බුදුන් සිහි කරව්. තොපට භයක් නොවන්නේය.

"ඉදින්, ලෝකයට ජ්‍යෙෂ්ඨවූ, නරශ්‍රෙෂ්ඨවූ බුදුන් සිහි නොකරන්නාහු නම්, එවිට නිවණට පමුණුවන්නාවූ, යහපත්කොට දේශනා කරන ලද්දාවූ, සද්ධර්මය සිහි කරව්.

"නිවණට පමුණුවන්නාවූ, හොඳින් දේශනා කරන ලද්දාවූ, ධර්මය ඉදින් සිහි නොකරන්නාහු නම්, එවිට පින් කෙතවූ, ඉතා උතුම්වූ සඞ්ඝයා සිහි කරව්.

"මහණෙනි, යම්සේ බුදුන්ද, ධර්මයද, සඞ්ඝයාද සිහි කරන්නාවූ තොපට භයෙක් හෝ තැතිගැනීමෙක් හෝ ලොමුඩැහැගැනුමක් හෝ නොවන්නේය."

---

## 4. වේපචිත්ති (නොහොත් ඛන්ති) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූසේක. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

2. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. 'මහණෙනි, පෙර වූවක් කියමි. දෙවියන්ගේද අසුරයන්ගේද යුද්ධයක් ඇතිවිය.

3. "මහණෙනි, ඉක්බිති වේපචිත්ති අසුරේන්ද්‍රතෙම අසුරයන්ට මෙසේ කීයේය. 'පින්වත්නි, ඉදින් දේව අසුර යුද්ධය වූ කල අසුරයෝ දිනන්නහු නම් දෙවියෝ පරදින්නහු නම් ඒ

ශක්‍රදේවේන්ද්‍රයා කණ්ඨපඤ්චම බැඳුමෙන් (දෙඅත්, දෙපා, බෙල්ල යන මේ පස්තැනින්) බැඳ අසුර පුරයෙහි මා සමීපයට ගෙනෙව්' (යි කීය.)

4. "මහණෙනි, ශක්‍රදේවේන්ද්‍ර තෙමේත් තව්තිසා වැසි දෙවියන්ට මෙසේ කීය. 'පින්වතුනි, ඉදින් දේව අසුර යුද්ධය වූ කල දෙවියෝ දිනන්නාහු නම් අසුරයෝ පරදින්නාහු නම් එවිට ඒ (අසුර රජවූ) වේපචිත්ති අසුරේන්ද්‍රයා කණ්ඨපඤ්චම බන්ධනයෙන් බැඳ සුධර්ම සභායෙහි මා සමීපයට ගෙනෙව් (යි කීය.)

5. "මහණෙනි, ඒ යුද්ධයෙහි දෙවියෝ දිනූහ, අසුරයෝ පැරදුනහ.

6. "මහණෙනි, ඉක්බිතිව තව්තිසා වැසි දෙවියෝ වේපචිත්ති අසුරිඳු කණ්ඨපඤ්චම බැඳුමෙන් බැඳ ශක්‍ර දේවේන්ද්‍රයාගේ සමීපයෙහි සුධර්මා සභාවට ගෙනාහ.

7. "මහණෙනි, එහි වනාහි කණ්ඨපඤ්චම බන්ධනයෙන් බැඳුණු වේපචිත්ති අසුරිඳු තෙම සුධර්මා සභාවට පිවිසෙන විටද, නික්මෙනවිටද ශක්‍ර දේවේන්ද්‍රයාට අසභ්‍ය ඵරුෂ වචනයෙන් ආක්‍රෝෂ කෙරෙයි, පරිභව කෙරෙයි.

8. "මහණෙනි, ඉක්බිති මාතලී රථාචාර්‍ය්‍ය තෙම ශක්‍ර දේවේන්ද්‍රයාට ගාථායෙන් (මෙසේ) කීය.

'ශක්‍රය, වේපචිත්තිගේ පරොස් බස් ඉදිරියෙහි අසමින් ඉවසන්නේ භයින්ද නොහොත් දුබල බැවින්ද?'

"(ශක්‍ර දේවේන්ද්‍ර තෙම මෙසේ කීය:) 'වේපචිත්තිගේ පරොස් බස් ඉවසන්නේ බියෙන් හෝ දුබල බැවින් නොවේ. මා වැනිවූ නුවණැත්තෙක් එබඳු බාලයකු හා කෙසේනම් සටන් කරන්නේද, (එකටෙක කරන්නේද?')

10. "(මාතලී මෙසේ කීය:) 'වළක්වන්නෙක් නොවේ නම්, අඥානයෝ ඉතා බොහොසේ විරුද්ධව ඉදිරියට

එන්නාහුය. එහෙයින් නුවණැති ජනතෙම මහත්වූ දඬුවමින් බාලයා වළක්වන්නේය.'

11. "(ශක්‍ර දේවේන්ද්‍ර තෙම මෙසේ කීයඃ) 'ඉතා කිපියාවූ අනායයකු දැක යමෙක් සිහි ඇතිව සන්සිඳේද, එයම බාලයන්ගේ නියම වැළකීමයයි හඟිමි.'

12. "(මාතලී මෙසේ කීයඃ) 'මෙතෙම මට භයින් ඉවසා' යයි අඥානතෙම යම් හෙයකින් හඟීද, ශක්‍රය, ඉවසීම පිළිබඳවූ මේ දෝෂයම දකිමි. පැන දුවන ගොනෙකු පසුපස්සේ එළවායන්නාවූ ගවමුලක් මෙන් නුවණ මඳ ජන තෙම වැඩියක් පසුපස්සේ එළවා යයි.'

13. "(ශක්‍ර දේවේන්ද්‍ර තෙම මෙසේ කීයඃ) 'හෙතෙම මට භයින් ඉවසාය'යි ඒකාන්තයෙන් හඟනේ හෝ වේවා නොහඟනේ හෝ වේවා සියලු අර්ථයෝ ස්වකීය දියුණුව පරමකොට ඇත්තාහුය. ඉවසීමට වඩා උතුම් වූවක් නැත්තේය,'

"යමෙක් තෙම ඒකාන්තයෙන් බලවත් වූයේ දුර්වලයකුගේ (නින්දා කිරීම්) ඉවසාද, ඔහුගේ ඒ ඉවසීම උතුම් ඉවසීමයයි (ආයඝීයෝ) කියත්. දුර්වල ජනතෙම හැමවිටම ඉවසයි."

"යමෙකුගේ බලය අඥාන බලය නම් ඒ බලය බලයක් නොවේයයි (ආයඝීයෝ) කියති. ධර්මයෙන් සංවර කරන ලද්දාවූ තැනැත්තාගේ බලය නියම බලයම නොවේය'යි කියන්නෙක් නැත.

"යමෙක් පළමු කිපුනහුට පෙරළා කිපේද, ඔහුගේ පෙරළා කිපීම ඊටත් වඩා පාපිෂ්ඨයි. කිපුණහුට පෙරළා නොකිපෙන ජනතෙම දිනීමට ඉතා දුෂ්කරවූ සටනක් දිනයි.'

"අනායයකු කිපුන බව දැන යමෙක් සිහි ඇතිව සන්සිඳේද? (ඉවසාද), හෙතෙම තමහටද පරහටද යන දෙකොටසටම යහපත සලසයි.'

"යම් ජන කෙනෙක් ධර්මයෙහි අදක්ෂද, ඒ අන්ධබාල ජනයෝ තමන්ටද අනුන්ටද යන දෙදෙනාටම පිළියම් කරන්නාවූ පුද්ගලයා අන්ධබාලයෙකැයි හඟිත්.'

13. "මහණෙනි, ඒ ශක්‍ර දේවේන්ද්‍ර තෙම වනාහි ස්වකීය පුණ්‍ය ඵලය නිසා ජීවත්වන්නේ, තව්තිසා වැසි දෙවියන්ගේ අධිපති භාවයෙන් රාජ්‍යය කරවන්නේ, ඉවසීමෙහි හා මෘදු බැව්හි ගුණ කියන්නෙක් වේ.

14. "මහණෙනි, මෙහි (මේ ශාසනයෙහි) ද එය (ඒ ගුණය) හොබවව්. තෙපි මෙසේ හොඳින් දේශනා කරනලද ධර්මවිනයෙහි පැවිදිවූවාහු ඉවසීම ඇත්තෝද, මෘදු බව ඇත්තාහුද වව්."

---

## 5. සුභාෂිත ජය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන්වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූසේක. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

2. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.) "මහණෙනි, පෙරවූ දෙයක් කියමි. දෙවියන්ගේ හා අසුරයන්ගේ යුද්ධයක් ඇතිවිය. මහණෙනි, ඉක්බිති වේපචිත්ති අසුරේන්ද්‍ර තෙම ශක්‍ර දේවේන්ද්‍රයාට, 'දේවේන්ද්‍රය, සුභාෂිතයෙන් ජය වේවා'යි කීය. 'වේපචිත්ති, සුභාෂිතයෙන් ජය වේවා'යි ශක්‍ර දේවේන්ද්‍ර තෙමේද කීය.

3. "මහණෙනි, ඉක්බිති දෙවියෝද අසුරයෝද 'මොවුහු අපගේ යහපත් වචන, අයහපත් වචන දන්නාහු'යි පිරිවර දෙවියන් තැබූහ.

4. "මහණෙනි, ඉක්බිති වේපචිත්ති අසුරේන්ද්‍ර තෙම ශක්‍ර දේවේන්ද්‍රයාට 'දේවේන්ද්‍රය, ගාථායෙක් කියව'යි කීය.

5. "මහණෙනි, මෙසේ කීකල ශක්‍ර දේවේන්ද්‍ර තෙම වේපචිත්ති අසුරිඳුට 'වේපචිත්ති, මෙහි නුඹ පුරාණ දෙව් වෙහි. වේපචිත්ති, ගාථායෙක් කියව'යි කීය.

6. "මහණෙනි, මෙසේ කීකල වේපචිත්ති අසුරිඳු තෙම මේ ගාථාව කීය.

'වළක්වන්නෙක් ඇති නොවේ නම්, අඥානයෝ ඉතා බොහෝ සේ කිපෙත්. එහෙයින් නුවණැති ජන තෙම මහත්වූ දණ්ඩයෙන් බාලයා (නුවණ නැත්තා) වළක්වන්නේය.'

7. "මහණෙනි, වේපචිත්ති අසුරිඳු මේ ගාථාව කීකල අසුරයෝ ඒ මැනවයි පිළිගත්හ. දෙවියෝ නිශ්ශබ්ද වූහ.

8. "මහණෙනි, ඉක්බිති වේපචිත්ති අසුරිඳු ශක්‍ර දේවේන්ද්‍රයාට 'දේවේන්ද්‍රය, ගාථාවක් කියව'යි කීය.

9. "මහණෙනි, මෙසේ කීකල ශක්‍ර දේවේන්ද්‍ර තෙම මේ ගාථාව කීය.

'කිපියාවූ අන්‍යයකු දැක යමෙක් සිහි ඇතිව සන්සිඳේද, මම ඒ (සංසිඳිම) ම බාලයා නියම සේ වැළකීම යයි හඟිමි."

10. "මහණෙනි, ශක්‍ර දේවේන්ද්‍රයා මේ ගාථාව කීකල දෙවියෝ ඒ මැනවයි පිළිගත්හ. අසුරයෝ නිශ්ශබ්ද වූහ.

11. "මහණෙනි, ඉක්බිති ශක්‍රදේවේන්ද්‍ර තෙම වේපචිත්ති අසුරේන්ද්‍රයාට 'වේපචිත්ති අසුරේන්ද්‍රය, ගාථාවක් කියව'යි කීය.

12. "මහණෙනි, මෙසේ කීකල වේපචිත්ති අසුරිඳු මේ ගාථාව කීය.

'මෙතෙම මට භයින් ඉවසාය'යි අඥානතෙම යම් යම් හෙයෙකින් ඒ ඉවසීම හඟීද, වාසවය, ඉවසීම පිළිබඳ මේ දෝෂය මම දකිමි. පැන දුවන තැනැත්තා (ලුහු බඳින්නාවූ)

ගව මුලක් මෙන් නුවණ මඳ ජනතෙම වැඩියක් ලුහුබැඳීම කරයි.'

13. "මහණෙනි, වේපචිත්ති අසුරිඳු මේ ගාථාව කීකල අසුරයෝ ඒ අනුමෝදන් වූහ. දෙවියෝ නිශ්ශබ්ද වූහ.'

14. "මහණෙනි, ඉක්බිති වේපචිත්ති අසුරිඳු ශක්‍ර දේවේන්ද්‍රයාට 'දේවේන්ද්‍රය, ගාථාවක් කියව'යි කීය.

15. "මහණෙනි, මෙසේ කීකල ශක්‍ර දේවේන්ද්‍ර තෙම මේ ගාථා කීය.

"මෙතෙම මට භයින් ඉවසායයි (යමෙක්) ඒකාන්තයෙන් හඟනේ හෝ වේවා, එසේ නොහඟනේ හෝ වේවා, සියලු අර්ථයෝ තමාගේ යහපත පරම කොට ඇත්තාහුය. ඉවසීමට වඩා උතුම්වූ අන්‍ය යහපතක් නැත්තේය.

"යමෙක් තෙම ඒකාන්තයෙන් බලවත් වූයේම දුර්වලයකුගේ (නින්දා කිරීම් ආදිය) ඉවසාද, ඔහුගේ ඒ ඉවසීම උත්තම ක්ෂාන්තියයි (ආර්‍ය්‍යයෝ) කියත්. දුර්වල ජනතෙම නිතරම ඉවසයි.'

"යමෙකුගේ බලය අඥාන බලය නම් ඒ බලයක් නොවේ යයි (ආර්‍ය්‍යයෝ) කියත්. ධර්මයෙන් සංවරවූ තැනැත්තාගේ බලය නියම බලයක් නොවේයයි කියන්නෙක් නැත.'

"යමෙක් පළමු කිපුනෙකුට පෙරළා කිපේද ඔහුගේ පෙරළා කිපීම ඒ පළමු ක්‍රොධයටත් වඩා පාපිෂ්ඨයි. කිපුනෙකුට පෙරළා නොකිපෙන ජනතෙම දිනීමට දුෂ්කරවූ සටන දිනයි.'

"සතුරෙකු කිපුනු බව දැන යමෙක් සිහි ඇතිව සන්සිඳේ නම්, හෙතෙම තමහටද, පරහටද යන දෙකොටසටම යහපත සලසයි.'

"යම් ජන කෙනෙක් ධර්මයෙහි අදක්ෂද, ඒ අන්ධ බාල පෘථග්ජනයා තමන්ටද අනුන්ටද යන දෙදෙනාටම යහපත සලසන්නාවූ පුද්ගලයා අන්ධබාලයෙකු කොට හඟිත්.'

16. "මහණෙනි, ශක්‍ර දේවේන්ද්‍රයා මේ ගාථාවන් කීකල දෙවියෝ ඒ මැනවැයි පිළිගත්හ. අසුරයෝ නිශ්ශබ්ද වූහ.

17. "මහණෙනි, ඉක්බිති දෙවියන්ගේද, අසුරයන්ගේද (පිරිවර ජනයෝ) මෙසේකීහ. 'වේපචිත්ති අසුරේන්ද්‍රයා විසින් ගාථාවෝ කියන ලද්දාහුය. ඒ වූකලී දඬු මුගුරු ආදිය පිළිබඳ වෙති, (කැති පොරෝ ආදිය පිළිබඳ වෙති.) දබර ඇතිකරති, අසමගිය ඇතිකෙරෙති, කලහ ඇතිකෙරෙති. ශක්‍රදේවේන්ද්‍රයා විසින් ගාථාවෝ කියන ලද්දාහුය. ඒ දඬු මුගුරු හා කැති පොරෝ පිළිබඳ නොවේ. දබර, අසමගිකම්, කලහ ඇති නොකෙරේ. ශක්‍රදේවේන්ද්‍රයාට සුභාෂිතයෙන් ජයවේවා'යි (කීහ)

18. "මහණෙනි, මෙසේ වනාහි ශක්‍ර දේවේන්ද්‍රයාට සුභාෂිතයෙන් ජය අත්වූයේය"යි (වදාළසේක.)

---

## 6. කුලාවක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක.

එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූසේක. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. "මහණෙනි, පෙරවූවක් කියමි. දෙවියන් හා අසුරයන්ගේ යුද්ධයක් ඇතිවිය. මහණෙනි, ඒ යුද්ධයෙහි අසුරයෝ දිනූහ. දෙවියෝ පැරදුනහ.

2. "මහණෙනි, පැරැදුන දෙවියෝ උතුරු දෙස බලා පලා ගියහ. අසුරයෝ ඔහු ලුහුබැන්දාහ.

3. "මහණෙනි, ඉක්බිති ශක්‍රදේවේන්ද්‍ර තෙම මාතලි රථාචාර්‍යයාට ගාථයෙන් (මෙසේ කීය.)

"මාතලිය, ඉඹුල් වෙනෙහි (ගුරුළු) කූඩු වෙති. (ඔවුන්) රියදඬු හිසින් පහකරව. අසුරයන් කෙරෙහි ඒකාන්තයෙන් ජීවිතය හරිමු. මේ කුරුල්ලෝ විනාශනුවූ කූඩු ඇත්තෝ වෙත්වා." (කුරුල්ලන්ට හානියක් නොවනසේ වගබලාගනුව යන තේරුමයි.)

4. "මහණෙනි, 'පින්වත, එසේ යහපතැ'යි මාතලි රථාචාර්‍යයා ශක්‍ර දේවේන්ද්‍රයාට උත්තර දී ආජනෳ අශ්වයන් දහසකින් යුත් රථය ආපසු හැරවීය.

5. "මහණෙනි, ඉක්බිතිව අසුරයන්ට මේ අදහස විය. "දැන් ශක්‍ර දේවේන්ද්‍රයාගේ ආජනෳ අශ්වයන් දහසක් යෙදූ රථය ආපසු හරවන ලදී. ඒකාන්තයෙන් දෙවියෝ නැවතත් අසුරයන් සමග යුද්ධයට එන්නාහ.' (මෙසේ සිතා) බිය වූවෝ අසුර පුරයටම (නැවත) ගියහ.

6 "මහණෙනි, මෙසේ වනාහි ශක්‍ර දේවේන්ද්‍රයාට ධර්මයෙන්ම ජය විය"

---

## 7. න දුබ්භිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක.

එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූසේක. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. "මහණෙනි, පෙරවූ දෙයක් කියමි. (වරක්) රහසිගතවූ, හුදෙකලාවූ ශක්‍රදේවේන්ද්‍රයාට මෙසේ සිතිවිල්ලක් පහළවිය. 'යමෙක් මට

සතුරු වන්නේද, ඔහුට වුවද මම විරුද්ධකම් නොකරන්නෙමි' (කියායි.)

2. "මහණෙනි, ඉක්බිති වේපචිත්ති අසුරිඳු තෙම ශක්‍ර දේවේන්ද්‍රයාගේ සිතිවිල්ල තම සිතින් දැන ශක්‍රදේවේන්ද්‍රයා වෙත ගියේය.

3. "මහණෙනි, ශක්‍රදේවේන්ද්‍ර තෙම වේපචිත්ති අසුරේන්ද්‍රයා එන බව දුරදීම දුටුවේය. දැක වේපචිත්ති අසුරේන්ද්‍රයාට මෙසේ කීය. 'සිටින්න, වේපචිත්ති අසුරේන්ද්‍රය තා අල්ලා ගන්නා ලද්දේවෙහිය.

4. "නිදුකාණෙනි, තාගේ යම්බඳුවූම සිතෙක් පෙරවීද, නිදුකාණෙනි, ඔබ එය දැන් දුරු කෙළෙහිද?"

5. "වේපචිත්තිය, මා කෙරෙහි විරුද්ධකම් නොකරන බවට දිවුරව"යි (ශක්‍රයා කීය.)

6 "බොරු කියන්නාහට යම් පාපයක් ඇද්ද, රහතුන්ට නින්දා කරන්නාහට යම් පාපයක් ඇද්ද, මිත්‍රද්‍රෝහියකුට යම් පාපයක් ඇද්ද, කළගුණ නො දත්තාට යම් පාපයක් වේද, සුජම්පතිය, යුෂ්මත්හට යමෙක් විරුද්ධකම් කෙරේ නම් හෙතෙම එවැනිවූ පවක් කරගනී." (වේපචිත්ති කීය.)

---

## 8. විරෝචන් අසුරින්ද (නොහොත් අර්ථ) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එසමයෙහි වනාහි භාග්‍යවතුන් වහන්සේ විවේකීවූ සේක් දහවල් විවේකයට වැඩිසේක.

2. එකල ශක්‍ර දේවේන්ද්‍ර තෙමේද වේරෝචන අසුරේන්ද්‍ර තෙමේද භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමියේය. පැමිණ පිටිපස දොරබා සමීපයෙහි වෙන වෙනම සිටියහ.

3. ඉක්බිති වේරෝචන දෙව්තෙම භාග්‍යවතුන් වහන්සේගේ හමුයෙහි මේ ගාථාව කීය.

"බලාපොරොත්තු ඉටුවීම තෙක් පුරුෂතෙම වෑයම් කරන්නේමය. ව්‍යාපාරයෝ ඉටුවීම නිසා හොබනාහු වෙත්. මේ වේරෝචනගේ වචනයි."

4. (ශක්‍ර තෙම මෙසේ කීය.) බලාපොරොත්තු ඉටු වීම තෙක් පුරුෂතෙම වෑයම් කරන්නේමය. ව්‍යාපාරයෝ ඉටුවීම නිසා හොබනාහ. ඉවසීමට වඩා උතුම් අර්ථයක් නම් නැත්තේය."

5. (වේරෝචන මෙසේ කීය.) "සියලු සත්ත්වයෝ ඒ ඒ තන්හි සුදුසු පරිදි හටගත් කටයුතු ඇත්තෝය. සියලු ප්‍රාණීන්ගේ ආහාරාදිය සියලු දේ නොයෙක් ලෙසින් සකස් කිරීමෙන්ම අනුභවයට සුදුසු වෙති. සියලු කටයුතු ඉටුවීම නිසාම හොබනාහු වෙත්. මෙය වේරෝචනගේ වචනයි."

6. (ශක්‍රතෙම මෙසේ කීය.) "සියලු සත්ත්වයෝ ඒ ඒ තන්හි සුදුසු පරිද්දෙන් හටගත් කටයුතු ඇත්තෝය. සියලු ප්‍රාණීන්ගේ ආහාරාදී සියලු දේ නොයෙක් ලෙසින් සකස් කිරීමෙන්ම අනුභවයට සුදුසු වෙති. සියලු කටයුතු නිසාම හොබනාහු වෙත්. ක්ෂාන්තියට වඩා උතුම් අර්ථයෙක් නම් නැත්තේය."

---

## 9. ඉසයො අරඤ්ඤකා (නොහොත් ගන්ධ) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක.

එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි'යි භික්ෂූන් ඇමතූසේක. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

**2.** (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) "මහණෙනි, පෙරවූ දෙයක් කියමි. සිල්වත් යහපත් දහම් ඇති බොහෝ ඍෂීහු වනයෙහි පන්සල්හි වෙසෙත්. මහණෙනි, ඉක්බිති ශක්‍රදේවේන්ද්‍ර තෙමේද වේපචිත්ති අසුරේන්ද්‍ර තෙමේද සිල්වත් යහපත් දහම් ඇති ඒ ඍෂීන් වෙත පැමිණියාහ.

**3.** "මහණෙනි, එවිට වේපචිත්ති අසුරිඳු තෙම කීප පටකින් යුත් පාවහන් පැළඳ, කඩුව උරෙහි එල්ලා ගෙන, කුඩය දරමින් ප්‍රධාන දොරින් පන්සලට පැමිණ, ඒ සිල්වත් යහපත් දහම් ඇති ඍෂීන්ට ගරුසරු නොදක්වා ඉක්ම ගියෝය.

**4.** "මහණෙනි, ඉක්බිති ශක්‍ර දේවේන්ද්‍රතෙම කීප පටකින් යුත් පාවහන් ඉවත්කොට, කඩුව අන්‍යයන්ට දී, කුඩය අකුළා තබා (කුඩා) දොරින්ම පන්සලට පිවිස ඒ සිල්වත් ගුණවත් ඍෂීන් ඇඳිලි බැඳ නමස්කාර කරමින් සිටියේය.

**5.** "මහණෙනි, ඉක්බිති ඒ සිල්වත් යහපත් දහම් ඇති ඍෂීහු ශක්‍රදේවේන්ද්‍රයාට ගාථායෙන් (මෙසේ) කීය.

> "බොහෝ කලක් මුළුල්ලෙහි සමාදන්වූ වත් ඇති ඍෂීන්ගේ කයින් නික්මෙන්නාවූ ගඳ වාතය කරණ කොට ගෙන හමයි. දහසක් ඇස් ඇති ශක්‍රය, මෙයින් (මේ වාතය හමන දෙසින්) ඉවත් වෙව. දේවේන්ද්‍රය, ඍෂීන් ගේ සිරුරු ගඳ අපිරිසිදුය."

> **6.** (ශක්‍ර තෙම මෙසේ කීය.) "බොහෝ කලක් මුළුල්ලෙහි සමාදන්වූ ව්‍රත ඇති ඍෂීන්ගේ කයින් නික්මෙන ගඳ වාතය කරණකොට ගෙන හමා වා. ස්වාමීනි මේ ගන්ධය අප හිසෙහිවූ විසිතුරු මල් ඇති මල් දමක් මෙන් කැමැත්තෙමු. මෙහි (සීලවන්තයන්ගේ ගන්ධයෙහි) දෙවියෝ පිළිකුල් සංඥා ඇත්තෝ නොවෙත්.

---

## 10. ඉසයො සමුද්දකා (නොහොත් සම්බර) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූසේක. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

2. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක "මහණෙනි, පෙරවූ දෙයක් කියමි. සිල්වත්. යහපත්, දහම් ඇති බොහෝ ඍෂීහු මුහුදු තෙර පන්සල්හි වෙසෙත්.

3. "මහණෙනි, එසමයෙහි වනාහි දෙව් අසුර යුද්ධයක් ඇතිවීය. මහණෙනි, ඉක්බිති ඒ සිල්වත්, යහපත් දහම් ඇති ඍෂීන්ට මේ අදහස වීය. 'දෙවියෝ, ධාර්මිකයෝය, අසුරයෝ අධාර්මිකයෝය. අපට අසුරයන්ගෙන් බියෙක් විය හැකිය. අපි සම්බර අසුරිඳු වෙත පැමිණ අභයදානය (භය නැතිකිරීම) ඉල්ලන්නෙමු නම් මැනව.'

4. "මහණෙනි, ඉක්බිති ඒ සිල්වත්, යහපත් දහම් ඇති ඍෂීහු වීයඝ් ඇත්තෙක් හැකුළුණු අත දික්කරන්නේ හෝ දික්කළ අත හකුළන්නේ හෝ යම්සේද, එසේම මුහුදු තෙරෙහි පන්සලින් අතුරුදන්ව සම්බර අසුරිඳු ඉදිරියෙහි පහළවූහ.

5. "මහණෙනි, ඉක්බිති ඒ සිල්වත් යහපත් දහම් ඇති ඍෂීහු සම්බර අසුරිඳුට ගාථායෙන් මෙසේ කීහඃ

"සම්බර කරා පැමිණි ඍෂීහු අභයදානය ඉල්වත්. ඔවුන්ට භය දෙන්නට හෝ අභය දෙන්නට හෝ හෙතෙම පොහොසති."

6. (සම්බර අසුරයා මෙසේ කීය.) 'අපට විරුද්ධවූ ශක්‍රයා සේවනය කරන්නාවූ මේ ඍෂීන්ට භයක්මුත් අභයක් නැත. නිර්භය ඉල්ලන්නාවූ තොපට බියක්ම දෙමි.'

7. (ඍෂීහු මෙසේ කීහඃ) 'නිර්භය ඉල්ලන්නා අපට භයක්ම දෙන්නෙහිය. තාගේ මේ කීම පිළිගනිමු. තගේ

බිය ක්ෂය නොවේවා (යමෙක්) යම්බඳු බිජුවටක් වපුරාද එබඳුවූම ඵලයක් (හෙතෙම) ලබයි. යහපත් දේ කරන්නා යහපතද, පව්කරන්නා පාප විපාකද ලබයි. දරුව, තා විසින් බීජයක් වපුරණ ලද්දේය. එහි ඵලය විඳින්නෙහිය.'

8. "මහණෙනි, ඉක්බිති ඒ සිල්වත්, යහපත් දහම් ඇති ඍෂීහු සම්බර අසුරිඳුට ශාපකොට වෙර ශක්තිමත් පුගුලෙක් වක්කළ අත දික්කරන්නේ හෝ දික්කළ අත වක්කරන්නේ හෝ යම්සේද, එසේ සම්බර අසුරිඳු හමුයෙන් අතුරුදහන්ව සමුද්‍රතෙර පන්සල් හි පහළවූහ.

9 "මහණෙනි, ඉක්බිති ඒ සම්බර අසුරිඳු තෙම ඒ සිල්වත් යහපත් දහම් ඇති ඍෂීන් විසින් ශාපකරණ ලද්දේ, රෑ තෙවිටක් තැතිගති."

පළමුවන වර්ගයයි.

---

# 2. සත්තවත වර්ගය

## 1. දේවා (නොහොත් වතපද) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක.

2. එකල්හි වනාහි භාග්‍යවතුන්වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූසේක. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේකඃ "මහණෙනි, ශක්‍රදේවේන්ද්‍රයා පෙර මනුෂ්‍යයව සිටකල වත් සතක් සමාදන්වන ලද්දේය. මේ වත් සත සමාදන්වීම නිසා ශක්‍රතෙම ශක්‍ර පදවියට පැමිණියේය.

3. "කවර වත් සතක්ද? යත් දිවි ඇති තෙක් මව්පියන් පෝෂ්‍ය කරන්නෙම්වා. දිවි ඇතිතෙක් කුලදෙටුවන් පුදන්නෙම්වා, දිවිඇතිතෙක් මෘදු වචන ඇත්තේ වන්නෙම්වා.

දිවි ඇතිතෙක් කේළාම් නොකියම්වා, දිවි ඇතිතෙක් පහවූ මසුරු මළ ඇති සිතින්, නිතර දෙන්නේ දෙනු පිණිස හැම කල සේදූ අත් ඇත්තේ, දීමෙහි නිතර ඇලුනේ, අනුන් විසින් ඉල්ලනු ලැබීමට සුදුසුවූයේ, දන් බෙදාදීමෙහි ඇලුනේ වන්නෙම්වා, දිවි ඇතිතෙක් සත්‍යවචන ඇත්තෙම් වෙම්වා. දිවි ඇතිතෙක් ක්‍රොධ නැත්තෙම් වෙම්වා, ඉදින් මට ක්‍රෝධය උපනි නම් වහාම එය දුරුකරන්නෙම්වා (යන මේ සතයි).

4. "මහණෙනි, පෙර මිනිස් බවෙහිවූ සක්දෙවිඳු විසින් මේ වත් සත සමාදන්වූයේ වීය. මේ වත් සත සමාදන්වූ බැවින් ශක්‍රතෙම ශක්‍රත්වයට පැමිණියේය.

5. "මව්පියන් පෝෂණය කරන්නාවූ, කුලදෙටුවන්ට ගරුබුහුමන් කරන්නාවූ, මෘදු වචන කියන්නාවූ, කේළාම්බස් නොකියන්නාවූ, මසුරුමළ දුරුකිරීමෙහි යෙදුනාවූ, සැබෑ තෙපුල් ඇත්තාවූ, ක්‍රෝධය මැඩ පවත්නාවූ, ඒ සත්ත්වයා සත්පුරුෂයකැයි තව්තිසා වැසි දෙවියෝ ඒකාන්තයෙන් කියත්."

---

## 2. දේවා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවෙසෙති.

2. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූසේක. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක: "මහණෙනි ශක්‍ර දේවේන්ද්‍ර තෙම පෙර මිනිස්බවෙහි සිටිකල මඝ නම් මාණවකයෙක් වීය. එහෙයින් 'මඝවා' යයි කියනු ලැබේ.

3. "මහණෙනි, ශක්‍ර දේවේන්ද්‍ර තෙම පෙර මිනිස් බවෙහි සිටි කල පුරයක් පුරයක් පාසා දන් දුන්නේය. එහෙයින් 'පුරින්දද' යයි කියනු ලැබේ.

4. "මහණෙනි, ශක්‍ර දේවේන්ද්‍ර තෙම පෙර මිනිස්බවෙහි සිටිකල සකස්කොට දන්දුනි. එහෙයින් 'ශක්‍ර' යයි කියනු ලැබේ.

5. "මහණෙනි, ශක්‍ර දේවේන්ද්‍ර තෙම පෙර මිනිස් බවෙහි සිටිකල වාසස්ථානයන් දුන්නේය. එහෙයින් 'වාසව' යයි කියනු ලැබේ.

6. "මහණෙනි ශක්‍ර දේවේන්ද්‍ර තෙම කරුණු දහසක් මොහොතින් සිතයි. එහෙයින් 'සහස්සක්ඛ' (දහසක් ඇස් ඇත්තා) යයි කියනු ලැබේ.

7. "මහණෙනි, ශක්‍ර දේවේන්ද්‍රයාට 'සුජා' නම් අසුර කන්‍යාව ප්‍රජාපතී වූවාය. එහෙයින් (ඔහුට) 'සුජම්පතී' යයි කියනු ලැබේ.

8. "මහණෙනි, ශක්‍ර දේවේන්ද්‍රතෙම තව්තිසා වැසි දෙවියන්ගේ ඓශ්වර්‍ය්‍යාධිපති භාවයෙන් රාජ්‍යය කරවිය. එහෙයින් 'දේවානමින්ද' යයි කියනු ලැබේ.

9. "මහණෙනි, ශක්‍ර දේවේන්ද්‍රයා පෙර මිනිස්බවෙහි සිටි කල වත් සතක් සමාදන්වන ලද්දාහුය. ඒ වත් සත සමාදන්වූ බැවින් ශක්‍රතෙම ශක්‍රබවට පැමිණියේය.

"ඒ වත් සත කවරහුද? දිවි ඇතිතෙක් මවුපියන් පෝෂණය කරන්නෙක් වෙම්වා. දිවි ඇතිතෙක් කුලදෙටුවන් පුදන්නෙක් වෙම්වා. දිවි ඇතිතෙක් මෘදුවචන ඇත්තේ වෙම්වා, දිවි ඇතිතෙක් කේළාම් නැත්තේ වෙම්වා, දිවි ඇතිතෙක් පහවූ මසුරුමළ ඇති සිතින්, නිතර දෙන්නේ දීම පිණිස සේදූ අත් ඇත්තේ, දීමෙහි ඇලුනේ, අනුන් විසින් ඉල්ලනු ලැබීමට සුදුසුවූයේ බෙදාදීමෙහි ඇලුනෙක්ව වෙසෙම්වා, දිවි ඇතිතෙක් සත්‍ය වචන ඇත්තෙක් වෙම්වා, දිවි ඇතිතෙක් ක්‍රෝධ නැත්තේ වෙම්වා, ඉදින් මට ක්‍රෝධය උපනී නම් වහාම එය දුරුකෙරෙම්වා, (යන මේ සතයි). මහණෙනි, ශක්‍ර දේවේන්ද්‍රයා පෙර මිනිස් බවෙහි සිටිකල මේ වත් සත සම්පූර්ණ කරන ලද්දාහු වෙති. මේ වත් සත සමාදන්වන බැවින් ශක්‍ර දේවේන්ද්‍රතෙම ශක්‍රබවට පැමිණියේය.

"මවුපියන් පෝෂණය කරන්නාවූ, කුලදෙටුවන්ට ගරුබුහුමන් කරන්නාවූ, මෘදු වචන කියන්නාවූ, කේළාම්බස් නොකියන්නාවූ, මසුරුමළ දුරුකිරීමෙහි යෙදුනාවූ, සැබෑ වචන ඇත්තාවූ, ක්‍රෝධය මැඩපවත්නාවූ, ඒ සත්ත්වයා සත්පුරුෂයෙකැයි තව්තිසාවැසි දෙවියෝ ඒකාන්තයෙන් කියත්."

---

## 3. දේවා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ විශාලානුවර මහවනයෙහි කූටාගාර ශාලායෙහි වසනසේක.

2. ඉක්බිති මහාලි ලිච්ඡවිතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේය.

3. එකත්පසෙක හුන් මහාලි ලිච්ඡවි තෙම භාග්‍යවතුන් වහන්සේගෙන් "ස්වාමීනි, ඔබවහන්සේ විසින් ශක්‍රදේවේන්ද්‍ර තෙම දක්නා ලද්දේදැ?'යි ඇසීය.

4. "මහාලි, මා විසින් ශක්‍රදේවේන්ද්‍රතෙම දක්නා ලද්දේය"

5. "ස්වාමීනි, හෙතෙම වනාහි ඒකාන්තයෙන් ශක්‍රයාමෙන් පෙනීසිටියෙක් විය යුතුයි. ස්වාමීනි, ශක්‍රදේවේන්ද්‍ර තෙම දැකීමට ඉතා දුක්ෂකරය."

6. "මහාලි, මම ශක්‍රයාද ශක්‍රකරණ (ශක්‍රබව ලබා දෙන) ධර්මයන්ද දනිමි. යම් ධර්මයක් සමාදන්වූ බැවින් ශක්‍ර තෙම ශක්‍රබවට පැමිණියේ නම් ඒ ධර්මයන්ද දනිමි.

7. "මහාලි, ශක්‍රදේවේන්ද්‍රතෙම පෙර මිනිස්බවෙහි සිටිකල මඝ නම් මාණවකයෙක් විය. එහෙයින් ඔහු 'මඝවා' යි කියනු ලැබේ. මහාලි, ශක්‍රදේවේන්ද්‍රතෙම පෙර මිනිස්බවෙහි සිටි කල පුරයක් පුරයක් පාසා දන්දුනි. එහෙයින් 'පුරින්දද' යයි කියනු

ලැබේ මහාලි ශක්‍රදේවේන්ද්‍ර තෙම පෙර මිනිස්බවෙහි සිටිකල සකස්කොට දන්දුනි. එහෙයින් 'ශක්‍ර' යයි කියනු ලැබේ. මහාලි, ශක්‍රදේවේන්ද්‍රතෙම පෙර මිනිස්බවෙහි සිටිකල වාසස්ථානයන් දුන්නේය. එහෙයින් 'වාසව' යයි කියනු ලැබේ. මහාලි, ශක්‍රදේවේන්ද්‍රතෙම දහසක් කරුණු මොහොතින් සිතයි. එහෙයින් 'සහස්සක්ඛ' යයි කියනු ලැබේ. මහාලි ශක්‍රදේවේන්ද්‍රයාට 'සුජා' නම් අසුර කන්‍යාවක් ප්‍රජාපතී වූවාය. එහෙයින් 'සුජම්පතී' යයි කියනු ලැබේ. මහාලි, ශක්‍රදේවේන්ද්‍රතෙම තව්තිසා වැසි දෙවියන් කෙරෙහි ඓශ්වර්‍ය්‍යාධිපති භාවයෙන් රජය කරවීය. එහෙයින් 'දේවානමින්ද' යයි කියනු ලැබේ.

8. "මහාලි, ශක්‍රදේවේන්ද්‍රයා පෙර මිනිස්බවෙහි සිටි කල වත් සතක් සමාදන්වන ලද්දාහුය. ශක්‍රතෙම ඒ වත් සත සමාදන්වූ බැවින් ශක්‍රබවට පැමිණියේය.

9. "ඒ වත්සත කවුරහුද? 'දිවි ඇතිතෙක් මව්පියන් පෝෂණය කෙරෙම්වා: දිවි ඇතිතෙක් කුලදෙටුවන් පුදන්නෙම්වා; දිවි ඇතිතෙක් ප්‍රියවචන ඇත්තේ වෙම්වා. දිවි ඇතිතෙක් කේළාම් නැත්තේ වෙම්වා; දිවි ඇතිතෙක් පහවූ මසුරුමළ ඇත්තේ, සිතින් දෙන්නේ දීම පිණිස යෙදූ අත් ඇත්තේ, දීමෙහි ඇලුනේ, දන් ඉල්ලීමට යෝග්‍යවූයේ, වස්තුව බෙදාදීමෙහි ඇලුනේව වසන්නෙම්වා; දිවිතෙක් සත්‍යවචන ඇත්තේ වෙම්වා, දිවි ඇති තෙක් ක්‍රෝධ නැත්තේ වෙම්වා, ඉදින් මට ක්‍රෝධය උපනී නම්, වහාම එය දුරුකෙරෙම්වා' (යනුයි).

10. "මහාලි, සක්දෙව්ඳු පෙර මිනිස්බවෙහි සිටිකල මේ වත්සත සම්පූර්ණ කරන ලද්දාහුය. මේ වත්සත සමාදන්වූ බැවින් ශක්‍රතෙම ශක්‍රබවට පැමිණියේය.

"මවුපියන් පෝෂණය කරන්නාවූ, කුලදෙටුවන්ට ගරුබුහුමන් කරන්නාවූ, මෘදු තෙපුල් කියන්නාවූ කේළාම්බස් නොකියන්නාවූ, මසුරුමළ දුරුකිරීමෙහි යෙදුනාවූ, සැබෑ වචන ඇත්තාවූ, ක්‍රෝධය මැඩපවත්නාවූ, ඒ සත්ත්වයා සත්පුරුෂයෙකැයි තව්තිසා වැසි දෙවියෝ කියත්.

## 4. දළිද්ද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර අසළ කලන්දකනිවාප නම්වූ වෙළුවනයෙහි වසනසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’ ඒ භික්ෂූන්ට කථාකළසේක. ‘ස්වාමීනි’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

2. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක: ‘මහණෙනි, පෙරවූ දෙයක් කියමි. මේ රජගහනුවරම හිඟන්නාවූ නිවටවූ දිළිඳුවූ එක්තරා පුරුෂයෙක් විය.

3. “හෙතෙම තථාගතයන් වදාළ ධර්මවිනයෙහි ශ්‍රද්ධාව පිහිටවීය, සීලය සමාදන්වීය, ධර්මය ඉගෙණීමෙහි යෙදුනේය, ත්‍යාගය සමාදන්විය, ප්‍රඥාව සමාදන්වීය.

4. “හෙතෙම තථාගතයන් වහන්සේ විසින් දේශනා කරනලද ධර්මවිනයෙහි ශ්‍රද්ධා සමාදන්ව, ශීලය සමාදන්ව ධර්මය ඉගෙණගැනීමෙහි යෙදී ත්‍යාගය සමාදන්ව, ප්‍රඥාව සමාදන්ව, මැරී ශරීරය බිඳී ගියපසු තව්තිසාවැසි දෙවියන්ගේ සමාගමයට යහපත් ගති ඇත්තාවූ ස්වර්ග ලෝකයට උප්පත්තිවශයෙන් පැමිණියේය හෙතෙම ශරීර ශෝභාවෙන්ද යසසින්ද අන් දෙවියන් පරදවයි.

5. “මහණෙනි, එහි තව්තිසා වැසි දෙවියෝ (ඒ දෙවියා) ලාමක වශයෙන් සිතත්; (ඒ බව) ප්‍රකාශ කෙරෙත්; ඒ ඒ තැන පතුරවත්: ‘පින්වත්නි, (මේදේ) ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයි; පින්වතුනි, ඒකාන්තයෙන් පුදුමයි. මේ දිව්‍යපුත්‍ර තෙම වනාහි පෙර මිනිස්බවෙහි සිටිකල දිළින්දෙක් වීය, (හිඟන්නෙක්) වීය, නිවටෙක් වීය. හෙතෙම මැරී ශරීරය බිඳීගිය පසු තව්තිසාවැසි දෙවියන්ගේ සමාගමයට, ස්වර්ගලෝකයට, උප්පත්ති වශයෙන් පැමිණියේය. හෙතෙම අන් දෙවියන් වර්ණයෙන්ද යසසින්ද පරදවයි. (කියායි).

6. “මහණෙනි, ඉක්බිති ශක්‍රදේවේන්ද්‍රතෙම තව්තිසා වැසි දෙවියන් (මෙසේ) ඇමතීය. ‘පින්වතුනි, තෙපි මේ දෙව් පුත්‍ර

ලාමක කොට නොසිතව්. පින්වතුනි, මේ දෙව්පුත්තෙම පෙර මිනිස්බවයෙහි සිටිකල තථාගතයන් වහන්සේ විසින් දේශනා කරනලද ධර්මවිනයෙහි ශ්‍රද්ධාව සමාදන්වීය, සීලය සමාදන්වීය, ධර්මය ඉගෙණගැනීමෙහි යෙදුනි, ත්‍යාගය සමාදන්වීය, ප්‍රඥාව සමාදන්විය, හෙතෙම තථාගතයන් වදාළ ධර්මවිනයෙහි ශ්‍රද්ධාව සමාදන්ව, සීලය සමාදන්ව, ශ්‍රැතය සමාදන්ව, ත්‍යාගය සමාදන්ව, ප්‍රඥාව සමාදන්ව, මැරී ශරීරය බිඳිගිය පසු තව්තිසාවැසි දෙවියන්ගේ සමාගමයට සුගති නම්වූ ස්වර්ගලොකයට උප්පත්ති වශයෙන් පැමිණියේය. හෙතෙම අන් දෙවියන් වර්ණයෙන්ද යසසින්ද පරදවයි." (කියායි).

7. "මහණෙනි, එකල සක්දෙවිඳුතෙම තව්තිසාවැසි දෙවියන් සතුටුකරනුයේ, ඒ වේලායෙහි මේ ගාථාවන් කීයඃ

"යමකුට තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ස්ථිරවේද, නිශ්චලව හොඳින් පිහිටියේවේද, යමකුගේ යහපත්වූ ශීලයන් ආය්‍ය්‍යයන් විසින් ප්‍රිය කරන ලද්දේ ඔවුන් විසින් ප්‍රශංසා කරනලද්දේද.

"යමකුට සංඝයා කෙරෙහි පැහැදීම ඇත්තේද, යමකුගේ දර්ශනයත් ඍජුවූයේවේද, ඔහු දිළිඳු නොවූවෙකැයි උතුමෝ කියති. ඔහුගේ ජීවිතය හිස් නොවේ.

"එහෙයින් ප්‍රාඥතෙමේ බුදුවරයන්ගේ ශාසනය සිහිකරන්නේ, ශ්‍රද්ධාවද, ශීලයද, පැහැදීමද, ධර්මය දැකීමද, එහි යෙදීමෙන් පිරිසිදු කරන්නේය."

---

## 5. රාමණෙය්‍යක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක.

2. ඉක්බිති ශක්‍රදේවේන්ද්‍රතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ හොඳාකාර වැඳ එකත්පසෙක සිටියේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. එකත්පෙසක හුන් ශක්‍ර දේවේන්ද්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේගෙන් "ස්වාමීනි, භූමිය පිළිබඳ රමණීය භාවය නම් කිමෙක්දැ"යි ඇසීය.

4. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.) "ආරාම චෛත්‍යයෝද, වන චෛත්‍යයෝද, හොඳාකාර කරනලද පොකුණුද, මනුෂ්‍යරමණීයත්වයෙන් සොළොස් කලාවෙන් කලාවකුත් අගනාහු නොවෙති.

"ගමෙහි වේවා, ඉදින් වනයෙහි හෝ වේවා, පහත් භූමියෙහි හෝ වේවා, ඉදින් ගොඩ බිම හෝ වේවා, යම් තැනෙක්හි රහත්හු වෙසෙත්ද, භූමියෙහි රමණීයභාවය එයයි කියත්."

---

## 6. යජමාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ගිජ්ඣකූළ පව්වෙහි වැඩ වසන සේක.

2. ඉක්බිති ශක්‍ර දේවේන්ද්‍ර තෙම භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ හොඳාකාර වැඳ එකත්පසෙක සිටියේය.

3. එකත් පසෙක සිටි ශක්‍ර දේවේන්ද්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙසේ කීය.

"පින් කැමතිව යාග කරන්නාවූ, මතු භවයන්හි විපාක ගෙනදෙන පින් කරන්නාවූ, මනුෂ්‍ය ප්‍රාණීන් විසින් කවර කෙනකුන්ට දෙන ලද්ද මහත්ඵල වේද?"

4. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.) "සිව්මගට පිළිපන්නෝද, (සෝවාන් ආදි) සිව් පෙලෙහි සිටියෝද, යන මේ (අෂ්ටාර්‍ය්‍යපුද්ගල) සංඝතෙම ඍජුය, ප්‍රඥාශීල සමාධීන් යුක්තය.

"පුණ්‍යාර්ථීව යාගකරන්නාවූ, මතු භවයෙහි විපාක ගෙන දෙන්නාවූ, පින් කරන්නාවූ, මනුෂ්‍ය ප්‍රාණීන් විසින් සංඝයාහට දෙනලද්ද මහත් විපාක ඇත්තේයි."

---

## 7. වන්දනා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. එකල භාග්‍යවතුන්වහන්සේ දහවල් විවේකය පිණිස වැඩිසේක් විවේකීවූ සේක.

3. ඉක්බිති ශක්‍ර දේවේන්ද්‍ර තෙමේද, සහම්පති බඹහුද භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ වෙනවෙන දොරබාව (උළුවහු කණු) ඇසුරුකොට සිටියහ.

4. ඉක්බිති ශක්‍ර දේවේන්ද්‍ර තෙම භාග්‍යවතුන්වහන්සේ සමීපයෙහි මේ ගාථාව කීය.

"දිනනලද (මාර) යුද්ධ ඇත්තාවූ, බහා තබන ලද බර ඇත්තාවූ, ණයගැති නොවූ මහා වීරයන් වහන්ස, නැගිටින්න. ලෝකයෙහි දහම් අමා දිය වස්වමින් ඇවිදින්න. නුඹවහන්සේගේ සිතද, පසළොස්වක් පොහෝරාත්‍රියෙහි සඳ මෙන් මිදුනේය."

5. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.) "දේවේන්ද්‍රය, තථාගතයන් වැන්දයුත්තේ ඔය ලෙසින් නොවේ. දේවේන්ද්‍රය, තථාගතයන් වැන්දයුත්තේ මේ ලෙසයඃ

"දිනනලද මාරයුද්ධ ඇති, බහා තබනලද බර ඇත්තාවූ, ණයෙන් මිදුණාවූ, පින්වතුන් වහන්ස, නැගී සිටිනු මැනවි. ලෙව්හි (දහම් දෙසා නිවන් අමා වස්වමින්) ඇවිද්ද මැනවි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පින්වතුන් වහන්සේ දහම් දෙසන සේක්වා. ඒ අවබෝධකරන සත්වයෝ ඇතිවන්නාහ.”

---

## 8. (පළමුවන) සක්ක නමස්සන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක. ඉක්බිති ශක්‍ර දේවේන්ද්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ හොඳාකාර වැඳ එකත්පසෙක සිටියේය.

2. භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක. “මහණෙනි, පෙර වූ දෙයක් කියමි. ශක්‍ර දේවේන්ද්‍ර තෙම වරක් මාතලී රථාචාර්‍ය්‍යයාට කථා කෙළේය. ‘යහලු මාතලිය, (අසුන්) දහසින් යුත් ආජන්‍ය රථය යොදව. උයන් සිරි දකිනු පිණිස උද්‍යානභූමියට යමු.”

3. “මහණෙනි, මාතලී රථාචාර්‍ය්‍ය තෙම ‘එසේ යහපති ස්වාමීනි’යි ශක්‍ර දේවේන්ද්‍රයාට උත්තරදී සහශ්‍රයුක්ත ආජන්‍යරථය යොදා ශක්‍ර දේවේන්ද්‍රයාට ‘නිදුකාණනි, ඔබ වහන්සේගේ සහශ්‍රයුක්ත ආජන්‍යරථය යොදන ලද්දේය. ගමනට සුදුසු කල් දනුව’යි සැලකෙළේය.

4. “මහණෙනි, ඉක්බිති ශක්‍රදේවේන්ද්‍රතෙම වෛජයන්ත ප්‍රාසාදයෙන් බස්නේ ඇඳිලි බැඳ සියලු දිශාවන් වැන්දේය.

5. “මහණෙනි, ඉක්බිති මාතලී රථාචාර්‍ය්‍යතෙම (ඒ දැක) ශක්‍ර දේවේන්ද්‍රයාට ගාථායෙන් (මෙසේ) කීය.

> “වේදත්‍රය හදාරන්නාවූ සියලු පොළෝතලවාසීහුද ක්ෂත්‍රියයෝද, සතරවරම් මහරජහුද, පිරිවර (සෙසු) දෙවියෝද, ඔබට වඳිති. සක්දෙවිඳුනි, පිරිවර සහිතවූ යමකුට ඔබවහන්සේ වඳනෙහිද, ඒ තෙමේ කිනම් (යකෙක්ද?)

6. "වේදත්‍රය පාරප්‍රාප්තවූ පෘථිවිතලවාසීවූ සියල්ලෝද ක්ෂත්‍රියයෝද, සිවුවරම් මහරජදරුවෝද, පරිවාර සම්පන්නවූ සෙසු දෙවියෝද මට වඳිත්

"ඒ මමද ශීලයෙන් සමෘද්ධවූ, බොහෝ කලක් මුළුල්ලෙහි එකඟකළ සිත් ඇති, (දිවිහිමියෙන්) බ්‍රහ්මචර්‍ය්‍යා වෙහි යෙදී වසන්නාවූ පැවිද්දන් සකසා වඳිමි.

"පින් කරන්නාවූ, සිල්වත්වූ, උපාසක ගුණයෙහි පිහිටියාවූ, යම් ගෘහස්ථකෙනෙක් දැහැමින් අඹුදරුවන් රකිත්ද, එම්බා මාතලිය, මම ඔවුන් වඳිමි."

7. "(මාතලි මෙසේ කීය.) සක්දෙවිඳුනි, යමකුන්ට නුඹවහන්සේ වඳිනෙහිද, (ඔහු) ලෙව්හි ශ්‍රෙෂ්ඨයෝම වෙති. වාසව නම්වූ දෙව් රජුනි, යම් කෙනෙකුන්ට ඔබ වඳිනෙහිද මමත් ඔවුන් වඳිමි'යි.

8. "මෙසේ කියා මඝ යන නම් ඇත්තාවූ, දෙව් ලොව දෙවියන්ට රජවූ, සුජා නම් අසුර දුහිතෘවගේ සැමිවූ, ශක්‍ර දේවේන්ද්‍රතෙම (සතර දිසාවන් හා සතර අනුදිසාවන් වැඳ) දෙවියන් අභිමුඛයෙහි දිව්‍ය රථයට නැංගේය."

---

## 9. (දෙවෙනි) සක්ක නමස්සන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක.

එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන් ඇමතූසේක. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

2. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක. "මහණෙනි, පෙරවූ දෙයක් කියමි. ශක්‍ර දේවේන්ද්‍රතෙම වරක් මාතලී රථාචාර්‍ය්‍යයාට (මෙසේ) කීය. 'යහලු මාතලිය, (අසුන්) දහසින්

යුත් ආජන්‍ය රථය යොදවා; උයන් සිරි දකිනු පිණිස උයනට යමු.'

3. "මාතලි රථාචාර්‍ය්‍යයා 'යහපති, ස්වාමීනි'යි ශක්‍ර දේවේන්ද්‍රයාට උත්තර දී සහශ්‍රයුක්ත ආජන්‍ය රථය යොදා ශක්‍ර දේවේන්ද්‍රයාට 'නිදුකාණෙනි, ඔබවහන්සේගේ සහශ්‍රයුක්ත ආජන්‍ය රථය යොදන ලද්දේය. සුදුසු දේට කල් දනුව'යි සැල කෙළේය.

4. "මහණෙනි, ඉක්බිති සක්දෙවිඳු වෛජයන්ත ප්‍රාසාදයෙන් බැස ඇඳිලි බැඳ භාග්‍යවතුන් නැමදීය. මහණෙනි, මාතලී රථාචාර්‍ය්‍යතෙම එවිට ශක්‍රදේවේන්ද්‍රයාට ගාථායෙන් (මෙසේ) කීය.

"වාසවනම්වූ සක්දෙවිඳුනි, දෙවියෝද මිනිස්සුද යම් හේතුවකින් ඔබට වඳනාහුද, සක්දෙව් රජාණනි, යම් කෙනෙකුන්ට ඔබ වඳනෙහිද, ඒ සත්ත්ව තෙම කවරෙක් නම් වෙයිද?

5. "ශක්‍රතෙම මෙසේ කීය. මාතලිය, දෙවියන් සහිතවූ මේ ලෝකයෙහි යම් සම්‍යක් සම්බුදු කෙනෙක් වෙත්ද, අතිශ්‍රෙෂ්ඨවූ ඒ ශාස්තෘන්වහන්සේ මම වඳිමි.

"යම් කෙනෙකුන්ගේ රාගයත් ද්වෙෂයත් මෝහයත් දුරුවූයේද, ක්ෂයකරණ ලද ආශ්‍රවයන් ඇත්තාහුද පිදීමට සුදුසු වෙත්ද, මාතලිය, මම ඒ (රහතුන්) වඳිමි.

"මාතලිය, යම් කෙනෙක් රාගද්වෙෂයෙන් දුරු කිරීමෙන්, අවිද්‍යාව ඉක්මවීමෙන් නිවන්මගට පිළිපන්නාහු සසර නැසීමෙහි ඇලුනාහු, අප්‍රමාදවූවාහු පිළිවෙලින් හික්මෙත්ද, ඔවුන් වඳිමි.

6. "(මාතලි මෙසේ කීය.) සක්දෙවිඳුනි, යමෙකුන්ට නුඹවහන්සේ වඳින්නෙහිද, (ඔවුහු) ලෙව්හි ශ්‍රෙෂ්ඨයෝම වෙති. වාසවයෙනි, (නුඹවහන්සේ) යම් කෙනෙකුන් වඳනෙහිද, මමත් ඔවුන් වඳිමි."

7. "මේ වචනය කියා මඝ යන නම් ඇති, දෙවියන්ට රජවූ, සුජා නම් අසුරදුවගේ සැමිවූ, ශක්‍ර දේවේන්ද්‍රතෙමේ සියලු දිසාවන් වැඳ දෙවියන් අභිමුඛයෙහි රථයට නැංගේයි."

---

## 10. (තුන්වෙනි) සක්ක නමස්සන සූත්‍රයː

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සේක.

2. එකල්හි වනාහි බුදුහු 'මහණෙනි'යි භික්ෂූන්ට කථාකළසේක. 'ස්වාමීනි'යි ඒ භික්ෂුහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

3. භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේක. "මහණෙනි, පෙරවූ දෙයක් කියමි. ශක්‍රදේවේන්ද්‍රතෙම වරක් මාතලි රථාචාර්‍ය්‍යයාට (මෙසේ) කීය. 'යහලු මාතලිය, සහශ්‍රයුක්ත ආජන්‍ය රථය යොදව, උයන්සිරි දකිනු පිණිස උයනට යමු.'

4. "මහණෙනි, ඉක්බිති මාතලි රථාචාර්‍ය්‍ය තෙම 'යහපති, ස්වාමීනි'යි ශක්‍ර දේවේන්ද්‍රයාට උත්තර දී සහශ්‍රයුක්ත ආජන්‍ය රථය යොදා ශක්‍රදේවේන්ද්‍රයාට 'නිදුකාණනි, ඔබවහන්සේගේ ආජන්‍ය රථය යොදන ලද්දේය. සුදුසු දේට කල් දනුව'යි කීවේය.

5. "මහණෙනි, ඉක්බිති සක්දෙවිඳු තෙම වෛජයන්ත ප්‍රාසාදයෙන් බසින්නේ ඇඳිලි බැඳ භික්ෂු සංඝයා වදී. මහණෙනි, එවිට මාතලි රථාචාර්‍ය්‍ය තෙම ශක්‍රදේවේන්ද්‍රයාට ගාථාවලින් (මෙසේ) කීයː

6. "කුණු සිරුරින් වැතිර සයනය කරන්නාවූ මේ මනුෂ්‍යයෝ වනාහි ඔබවහන්සේ වඳනාහ. මොවුහු මව්කුස නමැති කුණපයෙහි ගිලුනාහ. බඩගින්න හා පිපාසයෙන් මඩනා ලද්දාහ.

"වාසවය, ගිහිගෙයින් වෙන්ව වසන්නාවූ පැවිද්දන්ගේ කිනම් හැසිරීමක් ප්‍රිය කෙරෙහිද? කිව මැනව. අපි ඔබගේ ඒ තෙපුල අසමු.'

7. "මාතලිය, ගෘහවාසරහිතවූ ඔවුන්ගේ මේ ගුණය මම ප්‍රිය කෙරෙමි. (කුමක්ද?) ඔවුහු යම් ගමකින් බැහැර යෙද්ද, එකල්හි සියලු ඇල්මෙන් තොරව යෙත්.

"(උන්වහන්සේ සතු කිසිවක්) ඇතුළුගෙහි නොතබත්, කළයෙහිදු නොබහත්, සැළියෙහිදු නොතබත්. අනුන් නිමවූ බත පිඬු සිඟීම් වශයෙන් සොයන්නෝ වෙත්. යහපත් ව්‍රත (පැවතුම්) ඇත්තාහු එයින් යැපෙත්.

"උන්වහන්සේ යහපත්ලෙස කියන කථා ඇතියහ, ධෛර්‍ය්‍ය සම්පන්නයහ, නිශ්ශබ්ද වූවාහුය, සමවූ හැසුරුම් ඇත්තාහුය. මාතලිය, දෙවියෝ අසුරයන් හා විරුද්ධයහ. (එමෙන්) බොහෝ මනුෂ්‍යයෝද (එකිනෙකා හා විරුද්ධයහ.)

" 'විරුද්ධයන් කෙරෙහි මොව්හු අවිරුද්ධයහ. ගත් දඬු ඇතියන් කෙරෙහි නිවුනාහ. ගැනීම් සහිත සත්ත්වයන් අතුරෙන් මොවුහු (ගැනීම් නැත්තෝය.) මාතලිය, මම උන්වහන්සේ වඳිමි."

8. "(මාතලී මෙසේ කීයඃ 'සක්දෙවිඳුනි, යමෙකුන්ට නුඹවහන්සේ වඳිනෙහිද, ලෙව්හි ශ්‍රෙෂ්ඨයෝ ඔවුහුම වෙති. වාසවය, ඔබවහන්සේ යමෙකුන් වඳනෙහිද, මමත් ඔවුන් වඳිමි.'

9. "මේ වචනය කියා රජවූ, සුජානම් අසුරදුවගේ සැමිවූ, මඝ (ශක්‍රදේවේන්ද්‍ර තෙමේ) සියලු දිසාවන් වැඳ දෙවියන් අභිමුඛයෙහි රථයට නැංගේයි."

දෙවෙනි වර්ගයයි.

---

# 3. තුන්වන වග
## (සක්ක පඤ්චකය.)

### 1. ඣත්වා සූත්‍රයඃ

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. ඉක්බිති ශක්‍ර දේවේන්ද්‍රතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේය.

3. එකත්පස්ව සිටි ශක්‍ර දේවේන්ද්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට ගාථාවෙන් මෙසේ කීයඃ

"ගෞතමයන් වහන්ස, (සත්ත්වතෙම) කුමක් නසා සුවසේ නිදාගනීද? කුමක් නසා ශෝක නොකෙරේද? කිනම් එකම ධර්මයක්හුගේ විනාශය රුචිකරන සේක්ද?"

4. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.) " වාසවය, ක්‍රෝධය නසා (සත්ත්වතෙම) සුවසේ නිදාගැනීම කෙරේ, ක්‍රෝධය නසා ශෝක නොකෙරේ. විෂ මුල් ඇති, (ක්‍රෝධ කරනවිට සතුටු ඇති බැවින්) මිහිරි කරටිය ඇති, ක්‍රෝධය නැසීම ආර්‍ය්‍යයෝ ප්‍රශංසා කරත්. යම් හේතුවකින් ඒ ක්‍රෝධය නසා ශෝක නොකෙරේද (එහෙයිනි)."

---

### 2. දුබ්බණ්ණිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අසළවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

1. එකල්හි භාග්‍යවතුන් වහන්සේ, 'මහණෙනි'යි භික්ෂූන්ට කථාකළ සේක. 'ස්වාමීනි'යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

2. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක:) "මහණෙනි, පෙරවූ දෙයක් කියමි. දුර්වර්ණවූ, මිටිවූ, එක්තරා යකෙක් ශක්‍ර දේවේන්ද්‍රයාගේ අස්නෙහි හුන්නේ විය.

3. "මහණෙනි, එකල්හි වනාහි තව්තිසාවැසි දෙවියෝ 'බලව, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයෙකි, බලව, ඒකාන්තයෙන් අද්භූතයෙකි. මේ දුර්වර්ණවූ, මිටිවූ යක්ෂයා ශක්‍ර දේවේන්ද්‍රයාගේ අස්නෙහි හුන්නේය'යි ඔහු තුච්ඡකොට සිතත්, පිළිකුල් කොට කියත්, ඒ ඒ තැන ඒ ගැන කථාබස් කෙරෙත්, මහණෙනි, තව්තිසාවැසි දෙවියෝ ඔහු යම් පමණ ළාමක කොට සිතත්ද, කියත්ද, ඒ ඒ ගැන කතාබස් කෙරෙත්ද. එපමණටම ඒ යක්ෂයා රූපයෙන් වඩාත් බබළයි, වඩාත් දැකුම්කළු වෙයි, ප්‍රසන්නසේ පෙනෙයි.

4. "මහණෙනි, ඉක්බිති තව්තිසාවැසි දෙවියෝ ශක්‍රදේවේන්ද්‍රයා යම්තැනෙකද එතැනට පැමිණියාහුය. පැමිණ ශක්‍ර දේවේන්ද්‍රයාට මෙසේ කීහ: 'නිදුකාණනි, මෙහි දුර්වර්ණවූ මිටිවූ යකෙක් ඔබවහන්සේගේ අස්නෙහි හුන්නේය. නිදුකාණනි, එකල්හි වනාහි තව්තිසාවැසි දෙවියෝ 'බලව, ඒකාන්තයෙන් පුදුමයෙකි, බලව, ඒකාන්තයෙන් අද්භූතයෙකි. දුර්වර්ණවූ, මිටිවූ මේ යක්තෙම ශක්‍රදේවේන්ද්‍රයාගේ අස්නෙහි හුන්නේය'යි ඒ තුච්ඡකොට සිතත්, පිළිකුල්කොට කියත්, ඒ ඒ තැන ඒ ගැන කථාබස් කෙරෙත්, නිදුකාණනි, තව්තිසා වැසි දෙවියෝ ඒ යම් පමණ තුච්ඡ කොට සිතත්ද, පිළිකුල්කොට සිතත්ද, ඒ ඒ තැන ඒ ගැන කතාබස් කෙරෙත්ද, එපමණටම ඒ යක්තෙම රූපයෙන් වඩාත් බබළයි, වඩාත් දැකුම්කළු වෙයි. ප්‍රසන්නසේ පෙනෙයි. නිදුකාණනි, ඒ යක්ෂතෙම වනාහි ක්‍රෝධය නිසා යැපෙන්නක් වන්නේය.

5. "මහණෙනි, ඉක්බිතිව ශක්‍රදේවේන්ද්‍රතෙම ඒ ක්‍රෝධය නිසා යැපෙන යක්ෂයා යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, උතුරුසළුව එකාංශකොට දකුණු දණමඬල පොළොවෙහි ගසා ඒ ක්‍රොධය නිසා යැපෙන යක්ෂයා වෙත ඇඳිලි බැඳ නමස්කාරකොට 'නිදුකාණනි, මම ශක්‍ර දේවේන්ද්‍ර

වෙමි. නිදුකාණෙනි, මම ශක්‍රදේවේන්ද්‍ර වෙමි'යි තුන්වරක් නම් ප්‍රකාශ කෙළේය.

6. 'මහණෙනි, ශක්‍ර දේවේන්ද්‍රතෙම යම්තාක් නම ප්‍රකාශකරයිද ඒ තාක්ම ඒ යක්තෙම වඩා දුර්වර්ණද වඩා මිටිද විය. වඩාත් අවලක්ෂණද එමෙන්ම වඩාත් මිටිදවී, එහිම අතුරුදහන් වීය.

7. "මහණෙනි, ඉක්බිති ශක්‍ර දේවේන්ද්‍රතෙම ස්වකීය අස්නෙහි හිඳ තව්තිසා වැසි දෙවියන් සනසන්නේ ඒ වේලායෙහි මේ ගාථාවන් කීය:

> 'මම වනාහි නොපෙළුනු සිත් ඇත්තේ වෙමි. ක්‍රෝධ නමැති දියසුළියෙන් පහසුවෙන් ගෙනයා නොහෙමි. මම බොහෝ වේලාවකින් නොකිපෙමි. ක්‍රෝධයතෙම මා කෙරෙහි නොපිහිටයි. මම (කිපී කලද) රළු බස් නොකියමි. දහම් බස්ද පවසමි. ආත්මාර්ථය මොනවට දක්නා මම තමහට අතිශයින් නිගාකරමි."

---

## 3. මායා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අසළවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. ඉක්බිති ශක්‍ර දේවේන්ද්‍රතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය.

(භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක:) "මහණෙනි, පෙර වූවක් කියමි. වේපචිත්ති අසුරේන්ද්‍රතෙම ලෙඩවූයේ, දුකට පත්වූයේ, දැඩි ගිලන්වූයේ වීය.

3 "මහණෙනි, ඉක්බිති ශක්‍ර දේවේන්ද්‍රතෙම සුවදුක් විමසීම පිණිස වේපචිත්ති අසුරේන්ද්‍රයා වෙත ගියේය.

4. "මහණෙනි, වේපචිත්ති අසුරේන්ද්‍රතෙම ශක්‍ර දේවේන්ද්‍රයා තමා වෙතට එනබව දුරදීම දුටුවේය. දැක ශක්‍ර දේවේන්ද්‍රයාට 'දේවේන්ද්‍රය, මට වෙදකම් කරව'යි කීය.

5. "වේපචිත්තිය, මට සම්බරී මායාව උගන්ව'යි (ශක්‍රයා කීය).

6. "නිදුකාණනි, මම යම්තාක් අසුරයන්ගෙන් නොඅසම්ද ඒතාක් මම තට (ඒ මායාව) නොකියමි'යි (වේපචිත්ති කීය).

7. "මහණෙනි, ඉක්බිති වනාහි වේපචිත්ති අසුරේන්ද්‍ර තෙම 'පින්වතුනි, මම ශක්‍ර දේවේන්ද්‍රයාට සම්බරී මායාව කියමි' දැයි අසුරයන්ගෙන් ඇසීය.

8. "නිදුකාණනි, නුඹ ශක්‍ර දේවේන්ද්‍රයාට සම්බරී මායාව නොකියව'යි (අසුරයෝ කීහ).

9. "මහණෙනි, ඉක්බිති වනාහි වේපචිත්ති අසුරේන්ද්‍ර තෙම ශක්‍ර දේවේන්ද්‍රයාට ගාථායෙන් (මෙසේ) කීයඃ

"මඝ නම් ශක්‍රයෙනි, සුජම්පතියෙනි, දේවේන්ද්‍රයෙනි, මායාකාර ජන තෙම සම්බර නම් අසුරිඳු මෙන් අවුරුදු සියයක් පැසෙන්නාවූ දරුණු නිරයට පැමිණේ."

---

## 4. අච්චය (නොහොත් අකෝධන) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක.

2. එකල වනාහි භික්ෂූන් දෙදෙනෙක් කලහ කළහ. එහි එක් භික්ෂුවක් නුසුදුසු වචන ඔහු පිළිබඳ කීයේය. ඉක්බිති ඒ භික්ෂු තෙමේ අනික් භික්ෂුව සමීපයෙහි වරද වරද වශයෙන් පෙන්වයි. ඒ භික්ෂුව (ඒ වරද කීම) නොපිළිගනී.

3. ඉක්බිති බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියෝය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ

වැඳ එකත්පසෙක හුන්හ. එකත්පස්ව උන් ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය කීහ: "ස්වාමීනි, මෙහි භික්ෂූන් දෙදෙනෙක් කලහ කළහ. එහි එක් භික්ෂුවක් නුසුදුසු වචන ඔහු පිළිබඳ කීයේය. ස්වාමීනි, ඉක්බිති ඒ භික්ෂුතෙමේ අනික් භික්ෂුව සමීපයෙහි වරද වරද වශයෙන් කීය. ඒ භික්ෂුතෙමේ ඒ නොපිළිගනී'යි (කීහ.)

4. 'මහණෙනි, මේ බාලයෝ දෙදෙනෙකි. යමෙක් වරද වරද වශයෙන් නොදකීද, යමෙක් වරද කියන්නහු සුදුස්සේ නොපිළිගනීද, මහණෙනි, මේ දෙදෙන බාලයෝ වෙත්.

5. මහණෙනි, මේ දෙදෙනෙක් පණ්ඩිතයෝ වෙති. යමෙක් වරද වරද වශයෙන් දකීද, යමෙක් වරද කීවිට ඒ සුදුස්සෝ පිළිගනීද, මහණෙනි, මේ දෙදෙන පණ්ඩිතයෝ වෙති.

6. "මහණෙනි, පෙර වූවක් කියමි. ශක්‍රදේවේන්ද්‍රතෙමේ සුද්ධර්මාසභායේ තව්තිසා වැසි දෙවියන් සතුටු කරන්නේ ඒ වේලායෙහි මේ ගාථාව කීය.

> "ක්‍රෝධය තොපගේ යටතට පැමිණේවා, මිතුරන් කෙරෙහිතොපගේ කළකිරීමෙක් නොවේවා. නොගැරහිය යුතු පුද්ගලයාට නොගරහව්, කේළාම් නොකියව්, තවද ක්‍රෝධයතෙම පර්වතයක් මෙන් පවිටු (ළාමක) ජනයා හාත්පසින් මැඩලයි.

---

## 5. අක්කොධ (හෙවත් අවිහිංසා) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසන සේක.

2. ඉක්බිති ශක්‍රදේවේන්ද්‍රතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය.

3. (එවිට භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේක.) මහණෙනි, පෙරවූ දැයෙක් කියමි. ශක්‍රදේවේන්ද්‍රතෙම සුධර්මා සභායෙහි තව්තිසා වැසි දෙවියන් සතුටුකරන්නේ ඒ වේලායෙහි මේ ගාථාව කීය.

"ක්‍රෝධය තෙම තොප නොමඩීවා. කිපෙන්නන් කෙරෙහි ක්‍රෝධ නොකිරීම හා අවිහිංසාව ආය්‍ය්‍යීයන් කෙරෙහි හැම කල්හි පවතී. තවද ක්‍රොධය තෙම පර්වතයක් මෙන් පාපී ජනයා සම්පූර්ණයෙන් මඩී."

සක්කපඤ්චකයයි.

එකොළොස්වෙනි සංයුත්තය නිමියේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk